බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා: 4.

විනයපිටකයෙහි

03 වන ග්‍රන්ථය

# මහාවග්ගපාළි

ද්විතීය භාගය

ලංකා බෞද්ධ මණ්ඩලයේ ආරාධනයෙන්

අම්බලම්ගොඩ ශාසනෝදය පරිවෙණාධිපති

පණ්ඩිත

අම්බලම්ගොඩ ධම්මකුසල ස්ථවිරයන් වහන්සේ

විසින් කරණලද

සිංහල පරිවර්තනයෙන් යුක්තයි.

බු. ව. 2550
ක්‍රි. ව. 2006

Free Distribution www.aathaapi.org

Buddha Jayanti Tripitaka Series, Volume 4

The Third Book in the

**Vinaya-Pitaka**

**3**

# MAHĀVAGGAPĀLI (II)

With the Sinhala translation by

**The Venerable Pandita**
**Ambalamgoda Dhammakusala Thera**
Principal of Sāstrodaya Pirivena, Ambalamgoda

Free Distribution www.aathaapi.org

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

## බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා
## පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ
## මහා ධර්ම දානමය පුණ්‍යකර්මය

**"අපාරුතා තේසං අමතස්ස ද්වාරා**
**යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං"**

"කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී"

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්වඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල 'සද්ධා' නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව ("සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං") මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !

බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !

ලෝ සත්නට සෙත් වේවා !

**"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"**

( *යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය* )

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය
මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,
සමින්ද රණසිංහ.
2009.06.28

# විනයපිටකෙ

# මහාවග්ගපාළි

# විනයපිටකයෙහි

# මහවග

“තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො” –

“මහණෙනි,, තථාගතයන්වහන්සේ විසින් දෙශනා කරණලද ධර්මය හා විනය විවෘත වූයේ – ප්‍රකට වූයේ ම බබලයි වැසුනේ නොම බබලයි.”

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 7 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:7 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

# පටුන

# CONTENTS


සඞ්කෙත නිරූපණය . . . . . . . . . . . . . . . . . I
පාළි හෝඩිය . . . . . . . . . . . . . . . . . . . II


## මහාවග්ගපාළියා දුතියො භාගො


**6. භෙසජ්ජක්ඛන්ධකං . . . . . . . . . . . . . . . 520 – 623**

පඤ්චභෙසජ්ජකථා 520. මූලාදිභෙසජ්ජකථා 524. පිලින්දිවච්ඡකථා 530. ගුළාදිඅනුජානනා 542. අනොවුට්ඨාදිපටික්ඛෙපකථා 542. උග්ගහිතපටිග්ගහනං 546. පටිග්ගහිතාදිඅනුජානනා 548. සපාකම්මපටික්ඛෙපකථා 552. මනුස්සමංසපටික්ඛෙපකථා 554. හත්ථිමංසාදිපටික්ඛෙපකථා 558. යාගුමධුගොළකානුජානනා 562. තරුණප්පසන්නමහාමත්තවත්ථු 564. බෙලට්ඨකච්චානවත්ථු 568. පාටලිගාමවත්ථු 572. සුනීධවස්සකාරවත්ථු 574. කොටිගාමෙ සච්චකථා 578. අම්බපාලිවත්ථු 580. ලිච්ඡවීවත්ථු 580. සීහසෙනාපතිවත්ථු 584. කප්පියභූමි අනුජානනා 596. මෙණ්ඩකගහපතිවත්ථු 600. පඤ්චගොරසාදි අනුජානනා 610. කෙණියජටිලවත්ථු 612. රොජමල්ලවත්ථු 616. බුඩ්ඪපබ්බජිතවත්ථු 620. චතුමහාපදෙසකථා 624. උද්දානගාථා 626.

**7. කඨිනක්ඛන්ධකං . . . . . . . . . . . . . . . 628 – 670**

කඨිනානුජානනා 628. ආදායසත්තකං 632. සමාදායසත්තකං 634. ආදායඡක්කං 636. සමාදායඡක්කං 638. ආදායපණ්ණරසකං 640. සමාදායපණ්ණරසකාදීනි 642. විප්පකතසමාදායපණ්ණරසකං 642. අනාසාද්වාදසකං 648. ආසාද්වාදසකං 652. කරණීයද්වාදසකං 656. අපවිලායනනවකං 660. ඵාසුවිහාරපඤ්චකං 664. පලිබොධාපලිබොධකථා 666. උද්දානගාථා 668.

**8. චීවරක්ඛන්ධකං . . . . . . . . . . . . . . . 672 – 754**

ජීවකවත්ථු 674. සෙට්ඨිභරියාවත්ථු 616. බිම්බිසාරරාජවත්ථු 680. රාජගහසෙට්ඨිවත්ථු 682. සෙට්ඨිපුත්තවත්ථු 686. පජ්ජොතරාජවත්ථු 688. සිවෙය්‍යකදුස්සයුගකථා 692. සමතිංසවිරෙචනකථා 692. වරයාචනා 696. කම්බලානුජානනාදිකථා 698. පංසුකූලපරියෙසනං 700. චීවරපටිග්ගාහකසම්මුති 700. භණ්ඩාගාරසම්මුති 702. චීවරරජනං 706. ඡින්නකචීවරානුජානනා 708. තිචීවරානුජානනා 708. අතිරෙකචීවරකථා 710. විසාඛාවත්ථු 714. නිසීදනාදිඅනුජානනා 722. පච්ඡිමවිකප්පනුපගචීවරාදිකථා 726. සඞ්ඝිකචීවරුප්පාදකථා 728. උපනන්දසක්‍යපුත්තවත්ථු 732. ගිලානවත්ථු 734. මතසන්තකකථා 736. නග්ගියපටික්ඛෙපො 740. කුසචීරාදිපටික්ඛෙපො 740. සබ්බනීලකාදිපටික්ඛෙපො 742 වස්සංවුට්ඨානං අනුප්පන්නචීවරකථා 744. සඞ්ඝෙ භින්නෙ චීවරුප්පාදකථා 746. දුග්ගහිතසුග්ගහිතාදිකථා 746. අට්ඨචීවරමාතිකා 748. උද්දානගාථා 752.

**9. චම්පෙය්‍යක්ඛන්ධකං . . . . . . . . . . . . . . 756 – 840**

කස්සපගොත්තවත්ථු 756. අධම්මෙනවග්ගාදිකථා 762. ඤත්තිවිපන්න-කම්මාදිකථා 766. චතුවග්ගකරණාදිකථා 772. පාරිවාසිකාදිකථා 778. ද්වෙනිස්සාරණාදිකථා 780. අධම්මකම්මාදිකථා 784. උපාලි-පුච්ඡා 788. තජ්ජනීයකම්මං 798. නියස්සකම්මං 804. පබ්බාජනීය-කම්මං 804. පටිසාරණීයකම්මං 804. ආපත්තියා අදස්සනෙ උක්ඛෙප-නීයකම්මං 804. ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයකම්මං 806. ආපත්තියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්මං 806. තජ්ජනීයකම්ම පටිප්පස්සද්ධි 808. නියස්සකම්මපටිප්පස්සද්ධි 814. පබ්බාජනීයකම්ම-පටිප්පස්සද්ධි 814. පටිසාරණීයකම්මපටිප්පස්සද්ධි 816. ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්මපටිප්පස්සද්ධි 816. ආපත්තියා අප්පටි-කම්මෙ උක්ඛෙපනීයකම්මපටිප්පස්සද්ධි 81[illegible]. ආපත්තියා අප්පටිනිස්ස-ග්ගෙන උක්ඛෙපනීයකම්මපටිප්පස්සද්ධි 818. තජ්ජනීයකම්මවිවාද-කථා 818. නියස්සකම්මවිවාදකථා 822. පබ්බාජනීයකම්ම විවාදකථා 822. පටිසාරණීයකම්මවිවාදකථා 824. ආපත්තියා අදස්සනෙ උක්ඛෙ-පනීයකම්මවිවාදකථා 824 ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීය-කම්මවිවාද කථා 824. ආපත්තියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීය-කම්ම විවාදකථා 826. තජ්ජනීයකම්මපටිප්පස්සද්ධිවිවාදකථා 826. නියස්සකම්මපටිප්පස්සද්ධිවිවාදකථා 830. පබ්බාජනීයකම්මපටිප්ප-ස්සද්ධි විවාදකථා 830. පටිසාරණීයකම්මපටිප්පස්සද්ධිවිවාදකථා 830. ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්ම පටිප්පස්සද්ධි විවාද-කථා 832. අපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයකම්මපටිප්පස්සද්ධි විවාදකථා 832. ආපත්තියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්ම පටිප්පස්සද්ධිවිවාද කථා 834. උද්දානගාථා 834.

**10. කොසම්බක්ඛන්ධකං . . . . . . . . . . . . . . 842 – 900**

කොසම්බකවිවාදකථා 842. දීඝාවුවත්ථු 858. බාලකලොණකගමන කථා 870. පාචීනවංසදායගමනකථා 872. පාරිලෙය්‍යකගමනකථා 876. අට්ඨාරසවත්ථු 880. ඔසාරණානුජානනා 886. සඞ්ඝසාමග්ගී 888. උපාලි සඞ්ඝසාමග්ගී පුච්ඡා 890. උද්දානගාථා 894.

**ගාථාදිපාදසූචි . . . . . . . . . . . . . . . . . 897 – 900**
**සඤ්ඤානාමසූචි . . . . . . . . . . . . . . . . 901 – 903**
**පදානුක්කමණිකා . . . . . . . . . . . . . . . . 904 – 959**
**ශුද්ධිපත්‍රය . . . . . . . . . . . . . . . . . . 960 – 964**


Free Distribution www.aathaapi.org

# සඞ්කෙතනිරූපණං

# ABBREVIATIONS

| | | |
|---|---|---|
| අවි. | —— | ‘අම්බලම්ගොඩ’-මහාවිහාර-තාලපණ්ණපොත්ථකං |
| ජවි. | —— | ‘තික්කඩු’-ජනානන්දාරාම විහාර-තාලපණ්ණපොත්ථකං |
| තොවි. | —— | ‘තොටගමු’-මහාවිහාර-තාලපණ්ණපොත්ථකං |
| මනුප. | —— | ‘මහනුවර-පත්තිරිප්පු’පොත්ථකාලය-තාලපණ්ණපොත්ථකං |
| සීමු. | —— | සීහලක්ඛර-මුද්දිත පොත්ථකං |
| මඡසං. | —— | මරම්මඡට්ඨසංගීතිපිටක-පොත්ථකං |
| සී. | —— | ස්‍යාමක්ඛර-පොත්ථකං |
| PTS. | —— | Pali Text Society–Mahāvagga |

Free Distribution www.aathaapi.org

# THE PĀLI ALPHABET

## IN SINHALESE CHARACTERS.

## VOWELS

අ a ආ ā ඉ i ඊ ī උ u ඌ ū එ ē ඔ ō

## CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

ය ya ර ra ල la ව va ස sa හ ha ළ ḷa අං aṃ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | = | = | = | = | = | = | = |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ජ්ඣ jjha | ත්ථ ttha | බ්‍ර bra |
| ක්ඛ kkha | ඤ්ඤ ñña | ත්ව tva, ත්‍ර tra | ම්ප mpa |
| ක්‍ය kya | ඤ්හ, ñha | ද්ද dda | ම්ඵ mpha |
| ක්‍රි kri | ඤ්ච, ච ñca | ද්ධ, ඪ ddha | ම්බ, ඹ mba |
| ක්ව kva | ඡ, ඤ්ඡ ñcha | ද්‍ර dra | ම්භ mbha |
| ඛ්‍ය khya | ජ, ඤ්ජ ñja | ව, ද්ව dva | ම්ම mma |
| ඛ්ව khva | ඤ්ඣ ñjha | ධ්ව dhva | ම්හ mha |
| ඞ්ක ṅka | ට්ට ṭṭa | න්ත nta | ය්ය, ය්‍ය yya |
| ඞ්ඛ ṅkha | ට්ඨ, ඨ ṭṭha | න්ථ ntha | ය්හ yha |
| ග්ග gga | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්‍ය lya |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna, | ල්හ lha |
| ඞ්ග ṅga | ණ්ට ṇṭa | න්හ nha | ව්හ wha |
| ඞ්ඝ ṅgha | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ස ssa |
| ච්ච cca | ණ්ඩ, ඬ ṇḍa | ප්ඵ ppha | ස්ම sma |
| ච්ඡ ccha | ණ්හ ṇha | බ්බ bba | ස්ව swa |
| ජ්ජ jja | ත්ත tta | බ්භ bbha | හ්ම hma |
| | හ්ව hva | ළ්හ ḷha | |

ා ā ි i ී ī ු u ූ ū ෙ ē ො ō

## විනයපිටකෙ

# මහාවග්ගපාළියා

## දුතියො භාගො

# විනයපිටකෙ

# මහාවග්ගපාළිය

## දුතියො භාගො

—:—

### නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

## 6

## භෙසජ්ජක්ඛන්ධකං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන භික්ඛූනං සාරදිකෙන ආබාධෙන ඵුට්ඨානං යාගුපි පීතා උග්ගච්ඡති. භත්තම්පි භුත්තං උග්ගච්ඡති. තෙ තෙන කිසා හොන්ති ලූඛා දුබ්බණ්ණා උප්පණ්ඩුප්පණ්ඩුකජාතා ධමනිසන්ථතගත්තා. අද්දසා ඛො භගවා තෙ භික්ඛූ කිසෙ ලූඛෙ දුබ්බණ්ණෙ උප්පණ්ඩුප්පණ්ඩුකජාතෙ ධමනිසන්ථතගත්තෙ. දිස්වාන ආයස්මන්තං **ආනන්දං** ආමන්තෙසි: "කින්නුඛො ආනන්ද එතරහි භික්ඛූ කිසා ලූඛා දුබ්බණ්ණා උප්පණ්ඩුප්පණ්ඩුකජාතා ධමනිසන්ථතගත්තා ?"ති.

2. "එතරහි භන්තෙ භික්ඛූනං සාරදිකෙන ආබාධෙන ඵුට්ඨානං යාගුපි පීතා උග්ගච්ඡති. භත්තම්පි භුත්තං උග්ගච්ඡති. තෙ තෙන කිසා-හොන්ති[1] ලූඛා දුබ්බණ්ණා උප්පණ්ඩුප්පණ්ඩුකජාතා ධමනිසන්ථතගත්තා" ති.

3. අථ ඛො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "එතරහි ඛො භික්ඛූනං සාරදිකෙන ආබාධෙන ඵුට්ඨානං යාගුපි පීතා උග්ගච්ඡති. භත්තම්පි භුත්තං උග්ගච්ඡති. තෙ තෙන කිසා ලූඛා දුබ්බණ්ණා උප්පණ්ඩුප්පණ්ඩුකජාතා ධමනිසන්ථතගත්තා. කින්නු ඛො අහං භික්ඛූනං භෙසජ්ජං අනුජානෙය්‍යං, යං භෙසජ්ජඤ්චෙව අස්ස භෙසජ්ජසම්මතඤ්ච ලොකස්ස. ආහාරත්ථඤ්ච ඵරෙය්‍ය. න ච ඔළාරිකො ආහාරො පඤ්ඤායෙය්‍යා" ති.

---

1. "හොන්ති" ඌනං සී මු.

# විනයපිටකයෙහි

# මහාවග

## ද්විතීය භාගය

———8———

## ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.

———

# 6

# භෙසජ්ජක්ඛන්ධකය

———

1. එකල්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ **සැවැත්නුවර ජෙතවනයෙහි** වූ **අනේපිඬුසිටුහුගේ** ආරාමයෙහි වාසය කරණ සේක. එකල්හි ශරත්කාලයෙහි හටගත් පිත්තරොගයෙන් පහස්නා ලද භික්ෂූන්හට බොන ලද කැඳ ද (නො දිරීමෙන්) නැගෙයි. අනුභව කළ බත් ද (නො දිරීමෙන්) නැගෙයි. ඒ හෙතුවෙන් ඒ භික්ෂූහු වැරැණු රළු සිරුරු ඇත්තාහු දුර්වර්ණ වූවාහු ඉතා පඬුවන් වූවාහු නහර ඉල්පුනු සිරුරු ඇත්තාහු වෙති. භාග්‍යවතුන් වහන්සේ වැරැණු රළු සිරුරු ඇති දුර්වර්ණ වූ ඉතා පඬුවන් වූ නහර ඉල්පුනු සිරුරු ඇති ඒ භික්ෂූන් දුටු සේක. දැක "**ආනන්දය,** දැන් භික්ෂූහු කුමක් හෙයින් වැරැණු රළු සිරුරු ඇත්තාහු දුර්වර්ණ වූවාහු ඉතා පඬුවන් වූවාහු නහර ඉල්පුනු සිරුරු ඇත්තාහු දැ" යි අනඳ-තෙරුන් ඇමතූ සේක.

2. "ස්වාමීනි, දැන් ශරත්කාලයෙහි වූ රොගයෙන් පහස්නා ලද භික්ෂූන්හට බොන ලද කැඳ ද උඩට එයි. අනුභව කළ බත් ද උඩට එයි. ඒ හෙතුවෙන් ඒ භික්ෂූහු වැරැණාහු ය. රළු වූ සිරුරු ඇත්තෝ ය. දුර්වර්ණ වූවෝ ඉතා පඬුවන් වූවෝ ය. නහර ඉල්පුනු සිරුරු ඇත්තෝ ය."

3. ඉක්බිති රහොගත වූ විවෙකයට පැමිණ හුන් භාග්‍යවතුන් වහන්සේගේ සිතෙහි "දැන් ශරත්කාලයෙහි වූ රොගයෙන් පහස්නා ලද භික්ෂූන්හට බොන ලද කැඳ ද උඩට එයි. අනුභව කළ බත් ද උඩට එයි. ඒ හෙතුවෙන් ඒ භික්ෂූහු වැරැණෝ ය. රළු වූවෝ ය. දුර්වර්ණ වූවෝ ඉතා පඬුවන් වූවෝ ය. නහර ඉල්පුනු සිරුරු ඇත්තෝ ය. එහෙයින් යමක් බෙහෙත් වන්නේ ද, ලොකයා විසින් බෙහෙතැ යි සම්මතත් කරණ ලද්දේ ද, අහර කිසක් සපයන්නේ ද, දළ ආහාරයක් සේ නො පෙණෙන්නේ ද, එබඳු වූ බෙහෙදක් මම භික්ෂූන්ට කිම අනුදන්නෙම් දැ"යි අදහසෙක් පහළ වූයේ ය.

Free Distribution www.aathaapi.org

4. අථ ඛො භගවතො එතදහොසි: "ඉමානි ඛො පඤ්ච භෙසජ්ජානි. සෙය්‍යථීදං: සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං භෙසජ්ජානි චෙව භෙසජ්ජසම්මතානි ච ලොකස්ස. ආහාරත්ථඤ්ච ඵරන්ති. න ච ඔළාරිකො ආහාරො පඤ්ඤායති. යන්නූනාහං භික්ඛූනං ඉමානි පඤ්ච භෙසජ්ජානි අනුජානෙය්‍යං කාලෙ පටිග්ගහෙත්වා කාලෙ පරිභුඤ්ජිතු"න්ති.

5. අථ ඛො භගවා සායන්හසමයං* පටිසල්ලානා වුට්ඨිතො එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "ඉධ මය්හං. භික්ඛවෙ, රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'එතරහි ඛො භික්ඛූනං සාරදිකෙන ආබාධෙන ඵුට්ඨානං යාගුපි පීතා උග්ගච්ඡති. භත්තම්පි භුත්තං උග්ගච්ඡති. තෙ තෙන කිසා ලූඛා දුබ්බණ්ණා උප්පණ්ඩුප්පණ්ඩුකජාතා ධමනිසන්ථතගත්තා. කින්නු ඛො අහං භික්ඛූනං භෙසජ්ජං අනුජානෙය්‍යං යං ඛො[1] භෙසජ්ජං චෙව අස්ස, භෙසජ්ජසම්මතඤ්ච ලොකස්ස. ආහාරත්ථඤ්ච ඵරෙය්‍ය. න ච ඔළාරිකො ආහාරො පඤ්ඤායෙය්‍යා"ති.

6. තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: "ඉමානි ඛො පඤ්ච භෙසජ්ජානි. සෙය්‍යථීදං: සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං භෙසජ්ජානි චෙව භෙසජ්ජසම්මතානි ච ලොකස්ස. ආහාරත්ථඤ්ච ඵරන්ති. න ච ඔළාරිකො ආහාරො පඤ්ඤායති. යන්නූනාහං භික්ඛූනං ඉමානි පඤ්ච භෙසජ්ජානි අනුජානෙය්‍යං කාලෙ පටිග්ගහෙත්වා කාලෙ පරිභුඤ්ජිතු"න්ති. "අනුජානාමි භික්ඛවෙ, තානි පඤ්ච භෙසජ්ජානි කාලෙ පටිග්ගහෙත්වා කාලෙ පරිභුඤ්ජිතු"න්ති.

7. තෙන ඛො පන සමයෙන භික්ඛූ තානි පඤ්ච භෙසජ්ජානි කාලෙ පටිග්ගහෙත්වා කාලෙ පරිභුඤ්ජන්ති. තෙසං යානිපි තානි පාකතිකානි ලූඛානි භොජනානි, තානිපි නච්ඡාදෙන්ති. පගෙව සෙනෙසිකානි[2]. තෙ තෙන චෙව සාරදිකෙන ආබාධෙන ඵුට්ඨා ඉමිනා ච භත්තච්ඡාදකෙන[3] තදුභයෙන භිය්‍යොසොමත්තාය කිසා හොන්ති ලූඛා දුබ්බණ්ණා උප්පණ්ඩුප්පණ්ඩුකජාතා ධමනිසන්ථතගත්තා.

8. අද්දසා ඛො භගවා තෙ භික්ඛූ භිය්‍යොසොමත්තාය කිසෙ ලූඛෙ දුබ්බණ්ණෙ උප්පණ්ඩුප්පණ්ඩුකජාතෙ ධමනිසන්ථතගත්තෙ. දිස්වාන ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "කින්නු ඛො ආනන්ද, එතරහි භික්ඛූ භිය්‍යොසොමත්තාය කිසා ලූඛා දුබ්බණ්ණා උප්පණ්ඩුප්පණ්ඩුකජාතා ධමනිසන්ථතගත්තා ?"ති.

9. "එතරහි භන්තෙ භික්ඛූ තානි පඤ්ච භෙසජ්ජානි කාලෙ පටිග්ගහෙත්වා කාලෙ පරිභුඤ්ජන්ති. තෙසං යානිපි තානි පාකතිකානි ලූඛානි භොජනානි තානිපි නච්ඡාදෙන්ති. පගෙව සෙනෙසිකානි. තෙ තෙන චෙව සාරදිකෙන ආබාධෙන ඵුට්ඨා ඉමිනා ච භත්තච්ඡාදකෙන තදුභයෙන භිය්‍යොසො-මත්තාය කිසා ලූඛා දුබ්බණ්ණා උප්පණ්ඩුප්පණ්ඩුකජාතා ධමනිසන්ථත-ගත්තා"ති.

---

1. "ඛො" ඌනං. ම ඡ සං.
2. "සිනෙසිකානි" කත්ථචි "සිනෙයිකානි" ම ඡ සං. (යොජනා)
3. "භත්තාච්ඡාදකෙන, ම ඡ සං. භත්තාවජනකෙන" ඉතිපි.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට "මේ බෙහෙත් පසෙක් වේ. එනම්: ගිතෙල් වෙඬරු තලතෙල් මීපැණි උක්සකුරු යන මේ ය. මොහු බෙහෙත් ද වෙති. ලෝකයා විසින් බෙහෙතැ යි ද සම්මතයහ අහර කිසත් සිදු කෙරෙත්. දළ ආහාරයක් සේ නො පෙණෙත්. මම භික්ෂූන්හට මේ පස් බෙහෙත් සුදුසු කාලයෙහි පිළිගෙණ සුදුසු කාලයෙහි වැළඳීමට අනුදන්නෙම් නම්, යෙහෙකැ" යි මේ සිත් වි ය.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි විවෙකයෙන් නැගී සිටි සේක් මේ නිදානයෙහි මේ කරුණෙහි දැහැමි කතා කොට "මහණෙනි, මෙහි රහොගත ව විවෙකයට පැමිණ හුන් මාගේ සිතෙහි 'දැන් ශරත්කාල-යෙහි වූ රොගයෙන් පහස්නා ලද භික්ෂූන්හට බීපු කැඳ ද උඩට එයි. වැළඳූ බත් ද උඩට එයි. ඒ හේතුවෙන් ඒ භික්ෂුහු වැරුණෝ ය. රළු වූවෝ ය. දුර්වර්ණ වූවෝ ය. ඉතා පඬුවන් වූවෝ නහර ඉල්පුනු සිරුරු ඇත්තෝ ය. (එහෙයින්) යමක් බෙහෙත් වේ ද, ලොකයා විසින් බෙහෙතැ යි සම්මතත් කරණ ලද්දේ ද, අහරකිසත් සිදු කරන්නේ ද, දළ ආහාරයක් සේ නො පෙණෙන්නේ ද, (එබඳු වූ) බෙහෙතක් මම භික්ෂූන්ට කිම අනුදන්නෙම් ද' යි අදහසෙක් උපන.

6. "මහණෙනි, ඒ මට - 'මේ බෙහෙත් පසෙක් වේ. එනම්: ගිතෙල් වෙඬරු තලතෙල් මීපැණි උක්සකුරු යන මේ ය. මොහු බෙහෙත් ද වෙති. ලොකයා විසින් බෙහෙතැ යි ද සම්මතයහ අහර කිසත් සිදු කෙරෙත්. දළ ආහාරයක් සේ නො පෙණෙත්. මම භික්ෂූන්හට මේ පස් බෙහෙත් සුදුසු කාලයෙහි පිළිගෙණ සුදුසු කාලයෙහි වළඳන්නට අනුදන්නෙම් නම්, යෙහෙකැ'යි මේ සිත් වි ය. මහණෙනි, ඒ බෙහෙත් පස සුදුසු කාලයෙහි පිළිගෙණ සුදුසු කාලයෙහි වළඳන්නට අනුදනිමි" යි.

7. එකල්හි භික්ෂුහු ඒ පස් බෙහෙත් සුදුසු කාලයෙහි පිළිගෙණ සුදුසු කාලයෙහි පරිභොග කෙරෙත්. ඒ භික්ෂූන්හට යම් ඒ ස්වාභාවික වූ රළුආහාරයෝ වෙත් ද, ඒ ආහාරයෝ ද රුචි නො වෙත්. සිනිඳු ආහාරයෝ රුචි නොවෙත් යනු කිම? ඒ භික්ෂුහු ශරත්කාලයෙහි හටගත් ඒ රොගයෙන් ද මේ ආහාරඅරුචියෙන් ද යන ඒ දෙකින් පහස්නා ලද්දහු බොහෝ සෙයින් වැරුණෝ ය. රළු වූවෝ ය. දුර්වර්ණ වූවෝ ය. ඉතා පඬුවන් වූ නහර ඉල්පුනු සිරුරු ඇත්තෝ ය.

8 භාග්‍යවතුන් වහන්සේ ඉතා තදින් වැරුණු රළු වූ දුර්වර්ණ වූ ඉතා පඬුවන් වූ නහර ඉල්පුනු සිරුරු ඇති ඒ භික්ෂූන් දුටු සේක. දැක, "ආනන්දය, කුමක් නිසා දැන් භික්ෂුහු ඉතා තදින් වැරුණාහු ද? රළු වූවාහු ද? දුර්වර්ණ වූවාහු ද? ඉතා පඬුවන් වූවාහු ද? නහර ඉල්පුනු සිරුරු ඇත්තාහු දැ" යි අනඳ තෙරුන් ඇමතු සේක.

9. "ස්වාමීනි, භික්ෂුහු දැන් ඒ පස් බෙහෙත් සුදුසු කාලයෙහි පිළිගෙණ සුදුසු කාලයෙහි වළඳත්. ඔවුන්ට යම් ඒ ස්වාභාවික වූ රළු ආහාරයෝ වෙත් ද, ඒ ආහාරයෝ ද රුචි නො වෙත්. සිනිඳු ආහාරයෝ කියනු කිම? ඒ භික්ෂුහු ශරත්කාලයෙහි හටගත් ඒ රොගයෙන් ද මේ ආහාරඅරුචියෙන් ද යන ඒ දෙකින් පහස්නා ලද්දහු බොහෝ සෙයින් වැරුණාහු ය. රළු වූවාහු ය. දුර්වර්ණ වූවාහු පඬුවන් වූවාහු ය. නහර ඉල්පුනු සිරුරු ඇත්තාහු ය" යි.

10. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, තානි පඤ්ච භෙසජ්ජානි පටිග්ගහෙත්වා කාලෙපි විකාලෙපි පරිභුඤ්ජිතු"න්ති.

11. තෙන ඛො පන සමයෙන ගිලානානං භික්ඛූනං වසෙහි භෙසජ්ජෙහි අත්ථො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ වසානි භෙසජ්ජානි: අච්ඡවසං මච්ඡවසං සුසුකාවසං සූකරවසං ගද්‍රභවසං කාලෙ පටිග්ගහිතං කාලෙ නිප්පක්කං[1] කාලෙ සංසත්තං[2] තෙලපරිභොගෙන පරිභුඤ්ජිතුං. විකාලෙ චෙ භික්ඛවෙ, පටිග්ගහිතං විකාලෙ නිප්පක්කං විකාලෙ සංසත්තං, තඤ්චෙ පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති තිණ්ණං දුක්කටානං. කාලෙ චෙ භික්ඛවෙ, පටිග්ගහිතං විකාලෙ නිප්පක්කං විකාලෙ සංසත්තං, තඤ්චෙ පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති ද්වින්නං දුක්කටානං. කාලෙ චෙ භික්ඛවෙ, පටිග්ගහිතං කාලෙ නිප්පක්කං විකාලෙ සංසත්තං, තං චෙ පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. කාලෙ චෙ භික්ඛවෙ, පටිග්ගහිතං කාලෙ නිප්පක්කං කාලෙ සංසත්තං, තඤ්චෙ පරිභුඤ්ජෙය්‍ය, අනාපත්තී"ති.

12. තෙන ඛො පන සමයෙන ගිලානානං භික්ඛූනං මූලෙහි භෙසජ්ජෙහි අත්ථො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, මූලානි භෙසජ්ජානි: හලිද්දිං සිඞ්ගිවෙරං වචං වචත්ථං අතිවිසං කටුකරොහිණිං උසීරං භද්දමුත්තකං. යානි වා පනඤ්ඤානිපි අත්ථි මූලානි භෙසජ්ජානි නෙව ඛාදනීයෙ ඛාදනීයත්ථං ඵරන්ති, න භොජනීයෙ භොජනීයත්ථං ඵරන්ති, තානි පටිග්ගහෙත්වා යාවජීවං පරිහරිතුං, සති පච්චයෙ පරිභුඤ්ජිතුං. අසති පච්චයෙ පරිභුඤ්ජන්තස්ස ආපත්ති දුක්කටස්සා"ති.

13. තෙන ඛො පන සමයෙන ගිලානානං භික්ඛූනං මූලෙහි භෙසජ්ජෙහි පිට්ඨෙහි අත්ථො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, නිසදං නිසදපොතක"න්ති[3]

14. තෙන ඛො පන සමයෙන ගිලානානං භික්ඛූනං කසාවෙහි භෙසජ්ජෙහි අත්ථො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අනුජානාමි භික්ඛවෙ, කසාවානි භෙසජ්ජානි: නිම්බකසාවං කුටජකසාවං පටොලකසාවං ඵග්ගවකසාවං නත්තමාලකසාවං. යානි වා පනඤ්ඤානිපි අත්ථි කසාවානි[4] භෙසජ්ජානි නෙව ඛාදනීයෙ ඛාදනීයත්ථං ඵරන්ති, න භොජනීයෙ භොජනීයත්ථං ඵරන්ති, තානි පටිග්ගහෙත්වා යාවජීවං පරිහරිතුං, සති පච්චයෙ පරිභුඤ්ජිතුං. අසති පච්චයෙ පරිභුඤ්ජන්තස්ස ආපත්ති දුක්කටස්සා'ති.

15. තෙන ඛො පන සමයෙන ගිලානානං භික්ඛූනං පණ්ණෙහි භෙසජ්ජෙහි අත්ථො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පණ්ණානි භෙසජ්ජානි: නිම්බපණ්ණං කුටජපණ්ණං පටොලපණ්ණං සුලසිපණ්ණං කප්පාසිපණ්ණං[5]. යානි වා පනඤ්ඤානිපි අත්ථි පණ්ණානි භෙසජ්ජානි නෙව ඛාදනීයෙ ඛාදනීයත්ථං ඵරන්ති, න භොජනීයෙ භොජනීයත්ථං ඵරන්ති, තානි පටිග්ගහෙත්වා යාවජීවං පරිහරිතුං, සති පච්චයෙ පරිභුඤ්ජිතුං. අසති පච්චයෙ පරිභුඤ්ජන්තස්ස ආපත්ති දුක්කටස්සා"ති.

---

1. "නිපක්කං" ඉතිපි. 2. "සංසට්ඨං" ටීකා.
3. "නිසදපොතකන්ති" අ වි. තො වි. P T S. ජ වි. 4. "කසාව" ම ඡ සං.
5 "කප්පාසපණ්ණං" ම ඡ සං.
,, "කප්පාසිකපණ්ණං" P T S.

10. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි දැහැමි කතා කොට "මහණෙනි, ඒ පස් බෙහෙත් පිළිගෙණ පෙරවරු කාලයෙහි ද පස්වරු කාලයෙහි ද වළඳන්නට අනුදනිමි" යි භික්ෂූන් ඇමතූසේක.

11. එකල්හි ගිලන් භික්ෂූන්ට චුරුණුතෙල්බෙහෙදින් ප්‍රයෝජන වේ. භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළකළහ. "මහණෙනි, චුරුණුතෙල් බෙහෙත්: වලස්තෙල් මත්ස්‍ය තෙල් කිඹුල්තෙල් ඌරුතෙල් කොටළුතෙල් යන තෙල් පෙරවරු කාලයෙහි පිළිගන්නා ලදු ව පෙරවරු කාලයෙහි පැසවන (කකාරණ) ලදු ව පෙරවරු කාලයෙහි (අන්‍යද්‍රව්‍යයන් හා කලතා) පෙරණ ලදු ව තෙල පරිභොගයෙන් වළඳන්නට අනුදනිමි. මහණෙනි, පස්වරු කාලයෙහි පිළිගන්නා ලද, පස්වරු කාලයෙහි පැසවූ, පස්වරු කාලයෙහි පෙරූ එය වළඳන්නේ නම්, දුකුලාඇවැත් තුණක් වේ. මහණෙනි, පෙරවරු කාලයෙහි පිළිගන්නා ලද, පස්වරු කාලයෙහි පැසවූ, පස්වරු කාලයෙහි පෙරූ එය වළඳන්නේ නම්, දුකුලාඇවැත් දෙකක් වේ. මහණෙනි, පෙරවරු කාලයෙහි පිළිගන්නා ලද, පෙරවරු කාලයෙහි පැසවූ, පස්වරු කාලයෙහි පෙරූ එය වළඳන්නේ නම්, දුකුලාඇවැතෙක් වේ. මහණෙනි, පෙරවරු කාලයෙහි පිළිගන්නා ලද, පෙරවරු කාලයෙහි පැසවූ, පෙරවරු කාලයෙහි පෙරූ එය වළඳන්නේ නම්, ඇවැත් නො වේ" යි.

12. එකල්හි ගිලන්මහණුන්ට මුල්බෙහෙදින් ප්‍රයොජන වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. මහණෙනි, කහ ඉඟුරු වදකහ හෙළවදකහ අතිවිඩයන් කුළුරුණ සුවඳහොට වම්මුතු යන මුල් බෙහෙත් ද, යම් අනෙක් මුල් බෙහෙතක් කෑ යුතු දෑයෙහි ලා කෑමෙහි ප්‍රයොජනය නො සපයයි ද, බුදිය යුතු දෑයෙහි ලා බුදීමේ ප්‍රයොජනය නො සපයයි ද, (ඛාද්‍ය භොජ්‍ය වශයෙන් නො ගැණෙන) එබඳු මුල් පිළිගෙණ දිවි ඇති තාක් පරිහරණය කරන්නට ද උපන් පසෙහි (හෙතුවක් ඇති කල්හි) වළඳන්නට ද අනුදනිමි. නූපන් පසෙහි වළඳන්නහුට දුකුලාඇවැත් වේ යි.

13. එකල්හි ගිලන්මහණුන්ට බෙහෙත්මුල්පිටිවලින් ප්‍රයොජන වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, දගල (ඇඹරුම්ගල) ද දරුගල ද අනුදනිමි" යි.

14. එකල්හි ගිලන්මහණුන්ට කසටබෙහෙතින් ප්‍රයොජන වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, කොහොඹකසට කෙළිඳකසට දුම්මැල්ලකසට හඟුලුකසට කරඳකසට යන කසට බෙහෙත් ද, යම් අනෙක් කසටබෙහෙත් කෑ යුතු දෑයෙහි ලා කෑමේ ප්‍රයොජනය නො සපයයි ද, අනුභව කට යුතු දෑයෙහි ලා අනුභව කිරීමේ ප්‍රයොජනය නො සපයයි ද, එබඳු කසටබෙහෙත් පිළිගෙණ දිවි තෙක් පරිහරණය කරන්නට ද හෙතුවක් ඇති කල්හි වැළඳීමට ද අනුදනිමි. හෙතුවක් නැති කල්හි වළඳන්නහුට දුකුලාඇවැත් වේ" යි.

15. එකල්හි ගිලන්මහනුන්ට කොළබෙහෙතින් ප්‍රයොජන වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, කොසඹකොළ කෙළිඳකොළ දුම්මැල්ලකොළ තලාකොළ කපුකොළ යන කොළ බෙහෙත් ද යම් අනෙක් කොළබෙහෙතක් කෑ යුතු දෑයෙහි ලා කෑමෙහි ප්‍රයොජනය නො සපයයි ද, අනුභව කටයුතු දෑයෙහි ලා අනුභව කිරීමේ ප්‍රයොජනය නො සපයයි ද, එබඳු කොළබෙහෙත් පිළිගෙණ දිවි ඇති තාක් පරිහරණය කරන්නට ද හෙතුවක් ඇති කල්හි වැළඳීමට ද අනුදනිමි. හෙතුවක් නැති කල්හි වළඳන්නහුට දුකුලාඇවැත් වේ" යි.

16. තෙන ඛො පන සමයෙන ගිලානානං භික්ඛූනං ඵලෙහි භෙසජ්ජෙහි අත්ථො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ඵලානි භෙසජ්ජානි: විලඞ්ගං පිප්ඵලිං මරිචං හරීතකං විභීතකං ආමලකං ගොට්ඨඵලං[1], යානි වා පනඤ්ඤානි පි අත්ථි ඵලානි භෙසජ්ජානි, නෙව ඛාදනීයෙ ඛාදනීයත්ථං ඵරන්ති, න භොජනීයෙ භොජනීයත්ථං ඵරන්ති, තානි පටිග්ගහෙත්වා යාවජීවං පරිහරිතුං. සති පච්චයෙ පරිභුඤ්ජිතුං. අසති පච්චයෙ පරිභුඤ්ජන්තස්ස ආපත්ති දුක්කටස්සා" ති.

17. තෙන ඛො පන සමයෙන ගිලානානං භික්ඛූනං ජතූහි භෙසජ්ජෙහි අත්ථො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ජතූනි භෙසජ්ජානි: හිංගු හිංගුජතු[2] හිංගුසිපාටිකං තකං තකපත්තිං තකපණ්ණිං සජ්ජුලසං, යානි වා පනඤ්ඤානිපි අත්ථි ජතූනි භෙසජ්ජානි නෙව ඛාදනීයෙ ඛාදනීයත්ථං ඵරන්ති, න භොජනීයෙ භොජනීයත්ථං ඵරන්ති, තානි පටිග්ගහෙත්වා යාවජීවං පරිහරිතුං, සති පච්චයෙ පරිභුඤ්ජිතුං. අසති පච්චයෙ පරිභුඤ්ජන්තස්ස ආපත්ති දුක්කටස්සා" ති.

18. තෙන ඛො පන සමයෙන ගිලානානං භික්ඛූනං ලොණෙහි භෙසජ්ජෙහි අත්ථො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ලොණානි භෙසජ්ජානි: සාමුද්දං කාලලොණං සින්ධවං උබ්භිදං බිලාලං[3], යානි වා පනඤ්ඤානිපි අත්ථි ලොණානි භෙසජ්ජානි, නෙව ඛාදනීයෙ ඛාදනීයත්ථං ඵරන්ති, න භොජනීයෙ භොජනීයත්ථං ඵරන්ති, තානි පටිග්ගහෙත්වා යාවජීවං පරිහරිතුං. සති පච්චයෙ පරිභුඤ්ජිතුං. අසති පච්චයෙ පරිභුඤ්ජන්තස්ස ආපත්ති දුක්කටස්සා" ති.

19. තෙන ඛො පන සමයෙන ආයස්මතො ආනන්දස්ස උපජ්ඣායස්ස ආයස්මතො බෙලට්ඨසීසස්ස[4] ථුල්ලකච්ඡාබාධො හොති. තස්ස ලසිකාය චීවරානි කායෙ ලග්ගන්ති. තානි භික්ඛූ උදකෙන තෙමෙත්වා තෙමෙත්වා අපකඩ්ඪන්ති.

20. අද්දසා ඛො භගවා සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො තෙ භික්ඛූ තානි චීවරානි උදකෙන තෙමෙත්වා තෙමෙත්වා අපකඩ්ඪන්තෙ. දිස්වාන යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: "කිං ඉමස්ස භික්ඛවෙ, භික්ඛුනො ආබාධො" ති. "ඉමස්ස භන්තෙ ආයස්මතො ථුල්ලකච්ඡාබාධො. ලසිකාය චීවරානි කායෙ ලග්ගන්ති. තානි මයං උදකෙන තෙමෙත්වා තෙමෙත්වා අපකඩ්ඪාමා" ති.

21. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, යස්ස කණ්ඩු වා පිළකා වා අස්සාවො වා ථුල්ලකච්ඡු වා ආබාධො, කායො වා දුග්ගන්ධො, චුණ්ණානි භෙසජ්ජානි. අගිලානස්ස ඡකණං මත්තිකං රජනනිප්පක්කං. අනුජානාමි භික්ඛවෙ, උදුක්ඛලමුසල" න්ති.

1. කොට්ඨඵලං ඉතිපි
2. "හිංගුං" "හිංගුජතුං" ජ ම සං.
3. "බිලං" ම ජ සං.
4. "බෙලට්ඨසීසස්ස" ම ජ සං. P T S.

16. එකල්හි ගිලන්මහණුන්ට පලබෙහෙතින් ප්‍රයොජන වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, වලහසාල් තිප්පිලි ගම්මිරිස් අරළු බුළු නෙල්ලි ගොටුපල (කුකුළු පක් = කුකුරුමුවන්) යන පලබෙහෙත් ද, යම් අනෙක් පලබෙහෙත් කෑ යුතු දෑයෙහි ලා කෑමෙහි ප්‍රයොජනය නො සපයයි ද, අනුභව කට යුතු දෑයෙහි ලා අනුභව කිරීමේ ප්‍රයොජනය නො සපයයි ද, එබඳු පලබෙහෙත් පිළිගෙණ දිවි ඇති තාක් පරිහරණය කරන්නට ද හෙතුවක් ඇති කල්හි වළඳන්නට ද අනුදනිමි. හෙතුවක් නැති කල්හි වළඳන්නහුට දුකුළාඇවැත් වේ" යි.

17. එකල්හි ගිලන්මහණුන්ට මැලියම්බෙහෙතින් ප්‍රයොජන වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, හිඞ්ගු (= පෙරුම්කායම්) හිඞ්ගුදඩු තම්බා ගත් මැලියම්, හිඞ්ගුකොළ තම්බා ගත් මැලියම්, රුක් කරටියෙන් වැහෙන මැලියම්, රුක්හි කොළවලින් වැහෙන මැලියම්, රුක්හි මේරූ කොළ තම්බා ගත් මැලියම්, දුම්මල යන මැලියම් බෙහෙත් ද, යම් අනෙක් මැලියම්බෙහෙතක් කෑ යුතු දෑයෙහි ලා කෑමෙහි ප්‍රයොජනය නො සපයයි ද, අනුභව කටයුතු දෑයෙහි ලා අනුභව කිරීමේ ප්‍රයොජනය නො සපයයි ද, එබඳු මැලියම්බෙහෙත් පිළිගෙණ දිවි ඇති තාක් පරිහරණය කරන්නට ද, හෙතුවක් ඇති කල්හි වළඳන්නට ද අනුදනිමි. හෙතුවක් නැති කල්හි වළඳන්නහුට දුකුළාඇවැත් වේ" යි.

18. එකල්හි ගිලන්මහණුන්ට ලුණුබෙහෙතින් ප්‍රයොජන වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මුදුලුණු, කළුලුණු, සින්‍ධුජනපදයෙහි උපන් ලුණු, සුවස ලුණු, බලල් ලුණු යන ලුණුමිශ්‍ර බෙහෙත් ද, යම් අනෙක් ලුණුබෙහෙතක කෑ යුතු දෑයෙහ් ලා කෑමෙහි ඵලය නො සිදු කෙරේ ද, අනුභව කටයුතු දෑයෙහි ලා අනුභව කිරීමේ ඵලය නො සිදු කෙරේ ද, එබඳු ලුණුබෙහෙත් පිළිගෙණ දිවි ඇති තාක් පරිහරණය කරන්නට ද, හෙතුවක් ඇති කල්හි වැළඳීමට ද අනුදනිමි. හෙතුවක් නැති කල්හි වළඳන්නහුට දුකුළාඇවැත් වේ" යි.

19. එකල්හි ආයුෂමත් ආනන්‍ද තෙරුන්ගේ උපාධ්‍යාය වූ ආයුෂමත් බෙලට්ඨසීස ස්ථවිරයන් වහන්සේට මහත් කැසීම් රොගයෙක් වේ. සැරවඕජසින් සිවුරු උන්වහන්සේගේ සිරුරෙහි ඇලෙයි. භික්ෂූහු ඒ සිවුරු දියෙන් තෙමතෙමා බැහැර කෙරෙත්.

20. සෙනාසනචාරිකාවෙහි වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේ ඒ සිවුරු දියෙන් තෙමතෙමා ඉවත් කරන්නා වූ ඒ භික්ෂූන් දුටු සේක. දැක ඒ භික්ෂූන් වෙතට වැඩි සේක. වැඩ ඒ භික්ෂූන්ගෙන් "මහණෙනි, මේ මහණහුගේ ආබාධය කිමැ" යි ඇසූහ. "ස්වාමීනි, මේ ආයුෂමතුන්ට ථුල්ලකච්ඡාබාධය වේ. සැරව ඕජසින් සිවුරු සිරුරෙහි ඇලෙයි. අපි ඒ සිවුරු දියෙන් තෙමතෙමා ඉවත් කරමු" යි.

21. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි දැහැමි කතා කොට "මහණෙනි, යම් මහණකුහට කැසීමෙක් හෝ පොලක් හෝ ඕජස් ගැලීමෙක් හෝ දැඩි කැසීම් ආබාධයෙක් හෝ වේ ද, කය හෝ දුගඳ වේ ද, (ඔහුට) සුණු බෙහෙත් අනුදනිමි" යි භික්ෂූන් ඇමතූ සේක. නො ගිලන්මහණහුට ගොමබෙටි, මැටි, රජනකසට අනුදනිමි. මහණෙනි, වංගෙඩිය හා මොහොල අනුදන්මි" යි.

22. තෙන ඛො පන සමයෙන ගිලානානං භික්ඛූනං චුණ්ණෙහි භෙසජ්ජෙහි චාලිතෙහි අත්ථො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, චුණ්ණචාලිනි" න්ති. සණ්හෙහි අත්ථො හොති. "අනුජානාමි භික්ඛවෙ, දුස්සචාලිනි" න්ති.

23. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො අමනුස්සිකාබාධො හොති. තං ආචරියුපජ්ඣායා උපට්ඨහන්තා නාසක්ඛිංසු අරොගං කාතුං. සො සූකරසූනං ගන්ත්වා ආමකමංසඤ්ච[1] ඛාදි. ආමකලොහිතඤ්ච[2] පිවි. තස්ස සො අමනුස්සිකාබාධො පටිප්පස්සම්භි. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අමනුස්සිකාබාධෙ ආමකමංසං ආමකලොහිත" න්ති.

24. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො චක්ඛුරොගාබාධො හොති. තං භික්ඛූ පරිග්ගහෙත්වා උච්චාරම්පි පස්සාවම්පි නික්ඛාමෙන්ති.

25. අද්දසා ඛො භගවා සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො තෙ භික්ඛූ තං භික්ඛුං පරිග්ගහෙත්වා උච්චාරම්පි පස්සාවම්පි නික්ඛාමෙන්තෙ. දිස්වාන යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: "කිං ඉමස්ස භික්ඛවෙ, භික්ඛුනො ආබාධො" ති. "ඉමස්ස භන්තෙ, ආයස්මතො චක්ඛුරොගාබාධො. ඉමං මයං පරිග්ගහෙත්වා උච්චාරම්පි පස්සාවම්පි නික්ඛාමෙමා" ති.

26. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, අඤ්ජනං: කාළඤ්ජනං රසඤ්ජනං සොතඤ්ජනං ගෙරුකං කපල්ලක"[3] න්ති. අඤ්ජනූපපිංසනෙහි[4] අත්ථො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, චන්දනං තගරං කාළානුසාරියං තාලීසං භද්දමුත්තක" න්ති.

27. තෙන ඛො පන සමයෙන භික්ඛූ පිට්ඨානි අඤ්ජනානි ථාලකෙසුපි[5] සරාවකෙසුපි නික්ඛිපන්ති. තිණචුණ්ණෙහිපි පංසුකෙහිපි ඔකිරීයන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අඤ්ජනි" න්ති.

28. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාවචා අඤ්ජනියො ධාරෙන්ති: සොවණ්ණමයං රූපියමයං. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "සෙය්‍යථාපි ගිහී කාමභොගිනො" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, උච්චාවචා අඤ්ජනියො[6] ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, අට්ඨිමයං දන්තමයං විසාණමයං නළමයං වෙළුමයං කට්ඨමයං ජතුමයං ඵලමයං ලොහමයං සඞ්ඛනාභිමය" න්ති.

29. තෙන ඛො පන සමයෙන අඤ්ජනියො අපාරුතා හොන්ති. තිණචුණ්ණෙහිපි පංසුකෙහිපි ඔකිරීයන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අපිධාන" න්ති. අපිධානං පතති[7]. "අනුජානාමි භික්ඛවෙ, සුත්තකෙන බන්ධිත්වා අඤ්ජනියා බන්ධිතු" න්ති. අඤ්ජනී ඵලති[8]. "අනුජානාමි භික්ඛවෙ, සුත්තකෙන සිබ්බෙතු" න්ති.

---

1. "ආමකමංසං" ම ඡ සං. P T S. 2. "ආමකලොහිතං" ම ඡ සං.
3. "කපල්ලං" ම ඡ සං 4. "අඤ්ජනූපපිසනෙහි" ම ඡ සං P T S.
5. "චරුකෙසුපි" ම ඡ සං. 6. "අඤ්ජනී" ම ඡ සං. P T S.
7. "භගවතො එතමත්ථං ආරොචෙසුං" ම ඡ සං.
8. "භගවතො එතමත්ථං ආරොචෙසුං" P T S.

22. එකල්හි ගිලන්මහණුන්ට සලන ලද බෙහෙත්සුණුවෙන් ප්‍රයොජන වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, සුණු සලන පෙරහනක් අනුදනිමි"යි. සියුම් සුණුවෙන් ප්‍රයොජන වේ. "මහණෙනි, රෙදිපෙරහනක් අනුදනිමි" යි.

23. එකල්හි එක්තරා මහණකුට අමනුෂ්‍යාබාධයෙක් වේ. ආචාය්‍යී-උපාධ්‍යායයෝ ඔහුට උවටැන් කරත්තෝ නීරොග කරන්නට නො හැකි වූහ. ඒ මහණ තෙමේ ඌරන් මරණ තැනකට ගොස් අමුමස් කෑයේ ය. අමුලේ ද බීයේ ය. (ආවිෂ්ට වූ අමනුෂ්‍යයා මස් ලේ කා බී ගියේ ය සියු සේ යි.) ඔහුගේ ඒ අමනුෂ්‍යාබාධය සන්සිඳුනේ ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, අමනුෂ්‍යයන් නිසා හටගත් රොගයෙහි අමුමස් අමුලේ අනුදනිමි" යි.

24. එකල්හි එක්තරා මහණකුහට ඇස්ලෙඩක් වේ. භික්ෂූහු ඔහු අල්වා ඔසොවා ගෙණ මල ද මූත්‍ර ද පහ කරවත්.

25. සෙනාසනචාරිකාවෙහි වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේ ඒ මහණහු අල්වා ඔසොවා ගෙණ මල ද මූත්‍ර ද පහ කරවන්නා වූ ඒ භික්ෂූන් දුටු සේක. දැක ඒ භික්ෂූන් වෙත එළඹි සේක. එළඹ ඒ භික්ෂූන්ගෙන් "මහණෙනි, මේ මහණහුගේ ආබාධය කිමැ" යි පිළිවිසූහ. "සවාමීනි, මේ මහණහුට ඇස්ලෙඩකි. අපි මේ මහණහු අල්වා ගෙණ මල ද මූත්‍ර ද පහ කරවමු" යි.

26. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කරුණෙහි දැහැමි කතා කොට "මහණෙනි, කළුඅඳුන්, රසඳුන්, ගං හෝ ආදියෙහි උපදින අඳුන්, ලොහෝඅඳුන්, සුවත්ගුරුඅඳුන්, පහන්සිළුදලිඅඳුන් යන අඳුන් අනුදනිමි" යි භික්ෂූන් ඇමතූ සේක. අඳුන් පිණිස ගල ගා ගත් බෙහෙතින් ප්‍රයොජන වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, සඳුන්, තුවරලා, කළුඅගිල්, තලිස්. වම්මුතු අනුදනිමි" යි.

27. එකල්හි භික්ෂූහු පිටිඅඳුන් තලු තැටියෙහි ද මලාවෙහි ද බහත්. තණසුන්තෙත් ද පසින් ද ගැවසී ගණිත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, අඳුන්කුලාවක් (නළයක්) අනුදනිමි" යි.

28. එකල්හි සවගමහණෝ රණින් කළ රිදියෙන් කළ උස් පහත් අගය ඇති අඳුන්කුලා දරත්. මිනිස්සු "කාමභොගී ගිහින් සේ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, උසස් පහත් අඳුන්කුලා නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, ඇටෙන් කළ, දතින් කළ, අගින් කළ, බටදඬුවෙන් කළ, උණදඬුවෙන් කළ, ලීයෙන් කළ, ලාකඩින් කළ, පැසුනුඵලයෙන් කළ, ලොහයෙන් කළ, සක්නැබින් කළ අඳුන්කුලා අනුදනිමි" යි.

29. එකල්හි අඳුන්කුලාවෝ නො වසන ලද්දාහු වෙත්. තණසුන්-තෙත් හා පසින් ද ගැවසී ගණිත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, පියනක් අනුදනිමි" යි. පියන වැටේ. "මහණෙනි, හුයකින් පියන බැඳ අඳුන්කුලාවෙහි බඳින්නට අනුදනිමි" යි. කුලාව පැලෙයි. "මහණෙනි, හුයෙන් විදිනට අනුදනිමි" යි.

30. තෙන ඛො පන සමයෙන භික්ඛූ අඞ්ගුලියා අඤ්ජන්ති. අක්ඛීනි දුක්ඛානි හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, අඤ්ජනිසලාක” න්ති .

31. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාවචා අඤ්ජනිසලාකායො ධාරෙන්ති සොවණ්ණමයං රූපිමයං.[1] මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: “සෙය්‍යථාපි ගිහී කාමභොගිනො”ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “න භික්ඛවෙ, උච්චාවචා අඤ්ජනිසලාකා ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, අට්ඨිමයං -පෙ- සඞ්ඛනාභිමය” න්ති.

32. තෙන ඛො පන සමයෙන අඤ්ජනිසලාකා භූමියං පතිතා ඵරුසා හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, සලාකොධානිය” න්ති[2].

33. තෙන ඛො පන සමයෙන භික්ඛූ අඤ්ජනිම්පි අඤ්ජනිසලාකම්පි හත්ථෙන පරිහරන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, අඤ්ජනිත්ථවික” න්ති. අංසවට්ටකො[3] න හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, අංසවට්ටකං[4] බන්ධනසුත්ත”න්ති.

34 තෙන ඛො පන සමයෙන ආයස්මතො **පිලින්දවච්ඡස්ස**[5] සීසාභිතාපො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, මුද්ධනි තෙලක” න්ති. නක්ඛමණීයො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, නත්ථුකම්ම” න්ති. නත්ථු ගලති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, නත්ථුකරණි” න්ති.

35. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාවචා නත්ථුකරණියො ධාරෙන්ති සොවණ්ණමයං රූපිමයං. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: “සෙය්‍යථාපි ගිහී කාමභොගිනො”ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “න භික්ඛවෙ, උච්චාවචා නත්ථුකරණී ධාරෙතබ්බා. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, අට්ඨිමයං -පෙ- සඞ්ඛනාභිමය” න්ති. නත්ථුං විසමං ආසිඤ්චියන්ති[6]. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, යමකං නත්ථුකරණි” න්ති.[7] නක්ඛමණීයො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. ‘අනුජානාමි භික්ඛවෙ, ධූමං පාතු” න්ති. තඤ්ඤෙව වට්ටිං ආලිම්පෙත්වා පිවන්ති. කණ්ඨො[8] ඩහති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, ධූමනෙත්ත”න්ති.

36. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාවචානි ධූමනෙත්තානි, ධාරෙන්ති සොවණ්ණමයං රූපිමයං. මනුස්සා උජ්ඣායන්ති. ඛීයන්ති, විපාචෙන්ති: “සෙය්‍යථාපි ගිහී කාමභොගිනො” ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “න භික්ඛවෙ, උච්චාවචානි ධූමනෙත්තානි ධාරෙතබ්බානි. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. “අනුජානාමි භික්ඛවෙ, අට්ඨිමයං -පෙ- සඞ්ඛනාභිමය”න්ති.

37. තෙන ඛො පන සමයෙන ධූමනෙත්තානි අපාරුතානි හොන්ති. පාණකා පවිසන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, අපිධාන” න්ති.

1. “රූපියමයං” ම ඡ සං.
2. “සලාකඨානියන්ති” ම ඡ සං. “සලාකාධානියන්ති ’ ම නු ප.
3. “අංසබද්ධකො” ම ඡ සං. P T S. 4. “අංසබද්ධකං” ම ඡ සං. P T S.
5. “පිලින්දිවච්ඡස්ස” ම ඡ සං. P T S. අ වි. ථා වි.
6. “ආසිඤ්චන්ති” ම ඡ සං. P T S. 7. “යමක නත්ථුකරණින්ති” ම ඡ සං. P T S.
8. “කණ්ඨං” P T S.

30. එකල්හි භික්ෂූහු ඇඟිල්ලෙන් අඳුන් ගාති. ඇස් පෙළෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අඳුන්කූරු (අඳුන්ලහ) අනුදනිමි" යි.

31. එකල්හි ඡවගමහණෝ රණින් කළ, රිදියෙන් කළ උසස් පහත් අඳුන්කූරු දරත්. මිනිස්සු "කාමභොගී ගිහීන් සේ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, උසස් පහත් අඳුන්කූරු නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, ඇටෙන් කළ -පෙ- සක්නැඹින් කළ අඳුන්කූරු අනුදනිමි" යි.

32. එකල්හි අඳුන්කූරු බිම වැටුනේ රළු වෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අඳුන්කූරු ලන කොපුවක් අනුදනිමි"යි.

33. එකල්හි භික්ෂූහු අඳුන්කුලා ද අඳුන්කූරු ද අතින් පරිහරණය කරත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අඳුන් පසුම්බියක් අනුදනිමි" යි. අංසවට්ටකයෙක් (උරහිස ලන පටියක්) නො වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අස්වටක් බඳිනනූලක් අනුදනිමි" යි.

34. එකල්හි ආයුෂමත් **පිලින්දිවච්ඡ** තෙරුන්ට හිසරුදාවක් වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, හිසෙහි තෙල් ගෑම අනුදනිමි" යි. ඉවසිය හැක්කේ නො වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, නස්‍ය කිරීම අනුදනිමි" යි. නස්‍යය වැගිරේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, නස්‍යකරණියක්= නැහැඹරුවක් අනුදනිමි" යි.

35. එකල්හි ඡවගමහණෝ රණින් කළ, රිදියෙන් කළ උසස් පහත් නස්‍යකරණීන් දරත්. මිනිස්සු "කාමභොගී ගිහීන් සේ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, උසස් පහත් නස්‍යකරණී නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, ඇටෙන් කළ -පෙ- සක්නැඹින් කළ නස්‍යකරණී අනුදනිමි" යි. නස්‍යය විෂම ව වැගිරේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, යමක (සමදෙණි දෙකකින් යුත්) නස්‍යකරණියක් අනුදනිමි" යි. නො ඉවසිය හැකි වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, දුම් බීම අනුදනිමි" යි. ඒ දුන්වැටිය ම දල්වා බොත්. උගුර දැවේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, දුම්කෝවක් (=නළයක්) අනුදනිමි" යි.

36. එකල්හි ඡවගමහණෝ රණින් කළ, රිදියෙන් කළ වටිනා කමින් වැඩි අඩු දුම්කෝව දරත්. මිනිස්සු "කාමභොගී ගිහීන් සේ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, උසස් පහත් දුම්කෝව නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, ඇටෙන් කළ -පෙ- සක්නැඹින් කළ දුම්කෝව අනුදනිමි" යි.

37. එකල්හි දුම්කෝව නො වැසුනේ වේ. සත්තු වදිත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පියනක් අනුදනිමි"යි.

38. තෙන ඛො පන සමයෙන භික්ඛූ ධූමනෙත්තානි හත්ථෙන පරිහරන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ධූමනෙත්තථවික" න්ති. එකතො ඝංසීයන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, යමකථවික" න්ති. අංසවට්ටකො න හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අංසවට්ටකං බන්ධනසුත්ත" න්ති.

39. තෙන ඛො පන සමයෙන ආයස්මතො **පිලින්දවච්ඡස්ස** වාතාබාධො හොති. වෙජ්ජා එවමාහංසු: "තෙලං පචිතබ්බ" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, තෙලපාක" න්ති. තස්මිං ඛො පන තෙලපාකෙ මජ්ජං පක්ඛිපිතබ්බං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, තෙලපාකෙ මජ්ජං පක්ඛිපිතු" න්ති.

40. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අතිපක්ඛිත්තමජ්ජානි තෙලානි පචන්ති. තානි පිවිත්වා මජ්ජන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, අතිපක්ඛිත්තමජ්ජං තෙලං පාතබ්බං. යො පිවෙය්‍ය, යථා ධම්මො කාරෙතබ්බො. අනුජානාමි භික්ඛවෙ, යස්මිං තෙලපාකෙ මජ්ජස්ස න ච වණ්ණො[1] න ච ගන්ධො න ච රසො පඤ්ඤායති, එවරූපං මජ්ජපක්ඛිත්තං තෙලං පාතු" න්ති.

41. තෙන ඛො පන සමයෙන භික්ඛූනං බහුං අතිපක්ඛිත්තමජ්ජං තෙලං පක්කං හොති. අථ ඛො භික්ඛූනං එතදහොසි: "කථන්නු ඛො අතිපක්ඛිත්තමජ්ජෙ තෙලෙ පටිපජ්ජිතබ්බ" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අබ්භඤ්ජනං අධිට්ඨාතු" න්ති.

42. තෙන ඛො පන සමයෙන ආයස්මතො **පිලින්දවච්ඡස්ස** බහුං තෙලං පක්කං හොති. තෙලභාජනං න විජ්ජති[2]. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, තීණි තුම්බානි: ලොහතුම්බං කට්ඨතුම්බං ඵලතුම්බ" න්ති.

43. තෙන ඛො පන සමයෙන ආයස්මතො **පිලින්දවච්ඡස්ස** අඞ්ගවාතො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සෙදකම්ම" න්ති. නක්ඛමනීයො හොති. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, සම්භාරසෙද" න්ති. නක්ඛමනීයො හොති. -පෙ- "අනුජානාමි භික්ඛවෙ මහාසෙද" න්ති. නක්ඛමනීයො හොති. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, භඞ්ගොදක" න්ති. නක්ඛමනීයො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, උදකකොට්ඨක" න්ති.

44. තෙන ඛො පන සමයෙන ආයස්මතො **පිලින්දවච්ඡස්ස** පබ්බවාතො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ලොහිතං මොචෙතු" න්ති. නක්ඛමනීයො හොති. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, ලොහිතං මොචෙත්වා විසාණෙන ගහෙතු" න්ති.[3]

45. තෙන ඛො පන සමයෙන ආයස්මතො **පිලින්දවච්ඡස්ස** පාදා ඵලිතා[4] හොන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පාදබ්භඤ්ජන" න්ති. නක්ඛමනීයො හොති. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, පජ්ජං අභිසඞ්ඛරිතු" න්ති.

1. "මජ්ජස්ස න වණ්ණො" ම ඡ සං. PTS.
2. "සංවිජ්ජති" ම නු ප. PTS.
3. "ගාහෙතුන්ති" ම ඡ සං. ථා වි. අ වි.
4. "ඵාලිතා" සී මු.

38. එකල්හි භික්ෂූහු දුම්කෝව අතින් පරිහරණය කරත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, දුම්කෝව ලන පසුම්බියක් අනුදනිමි" යි. එකට හැපෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, බියලි (කොපු) දෙකක් ඇති පසුම්බියක් අනුදනිමි" යි. අංසවට්ටකයෙක් නො වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අංසවට්ටකයක් බඳිනාහුයක් අනුදනිමි" යි.

39. එකල්හි ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන්ට වාතාබාධයෙක් වේ. වෙද්දු "තෙලක් පිසිය යුතු ය" යි මෙසේ කීහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, බෙහෙත්තෙල් පිසීම අනුදනිමි" යි. ඒ තෙල් පිසීමෙහි මද්‍යය බැහිය යුත්තේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, බෙහෙත් පිණිස පිසන තෙලෙහි මද්‍යය බැහීම අනුදනිමි" යි.

40. එකල්හි ෂඩ්වර්ගමහණෝ වැඩියක් බැහූ මද්‍යය ඇති තෙල් පිසත්. ඒ තෙල් පානය කොට මත් වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, වැඩියක් බැහූ මද්‍යය ඇති තෙල් නො පිය යුතු ය. යමෙක් බොන්නේ නම්, ඇවැත් පරිදි කරවිය යුතු ය. මහණෙනි, යම් තෙල් පිසීමෙක මද්‍යයෙහි පැහැය නො පෙණේ ද, ගඳ නො පෙණේ ද, රසය නො පෙණේ ද, එබඳු වූ මද්‍යය බැහූ තෙල් බීම අනුදනිමි" යි.

41. එකල්හි භික්ෂූන්ට මද්‍යය වැඩියක් බැහූ බොහෝ තෙල් පිසන ලද්දේ වේ. එකල්හි භික්ෂූන්ට "ඉතා වැඩියක් මද්‍යය බැහූ තෙලෙහි කෙසේ පිළිපැදිය යුතු දැ" යි මේ සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ඇඟ ගල්වන තෙලක් කොට ඉටීමට අනුදනිමි"යි.

42. එකල්හි ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන්ට බොහෝ තෙල් පිසන ලද්දේ වේ. තෙල්බඳුනෙක් නැත්තේ ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ලොහොසැළිය, ලීසැළිය, මේරු පලයෙන් කළ සැළිය යන සැළි තුණක් අනුදනිමි" යි.

43. එකල්හි ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන්ට අඞ්ගවාතයෙක් (=ඇඟරුදාවෙක්) වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සෙවදය (ඩහ ගැන්වීම) අනුදනිමි" යි. නො ඉවසිය හැක්කේ වේ. -පෙ- "මහණෙනි, කොළ වගී වලින් සෙවද ගැන්වීම අනුදනිමි" යි. පහසු නො වේ. -පෙ- "මහණෙනි, මහාසෙවද ගැන්වීම* අනුදනිමි" යි. පහසු නො වේ. -පෙ- "මහණෙනි, (සෙවද ගැන්වීමට) කොළ තැම්බූ දිය අනුදනිමි" යි. පහසු නො වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, (සෙවද ගැන්වීමට) දියකොටුවක්* අනුදනිමි" යි.

44. එකල්හි ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන්ට පුරුක්වාතයෙක් (=හන්දිරුදාවක්) වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ලේ ඇරීම අනුදනිමි" යි. පහසු නො වේ. -පෙ- "මහණෙනි, ලේ මුදා අඟකින් ගන්නට අනුදනිමි" යි.

45. එකල්හි ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන්ගේ පාදයෝ පැළුනාහු වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පය ගල්වන තෙලක් අනුදනිමි" යි. පහසු නො වේ. -පෙ- "මහණෙනි, පසට හිත වූ බෙහෙතක් පිළියෙල කරන්නට (පිසන්නට) අනුදනිමි" යි.

* උපග්‍රන්ථය බලනු.

46. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො ගණ්ඩාබාධො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සත්ථකම්ම" න්ති. කසාවොදකෙන අත්ථො හොති. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, කසාවොදක" න්ති. තිලකක්කෙන අත්ථො හොති. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, තිලකක්ක" න්ති. කබලිකාය අත්ථො හොති. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, කබලික" න්ති. වණබන්ධනචොළෙන[1] අත්ථො හොති. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, වණබන්ධනචොළක" න්ති. වණො කණ්ඩුවති. -පෙ- "අනුජානාමි, භික්ඛවෙ, සාසපකුණ්ඩෙන[2] ඵොසිතු" න්ති.[3] වණො කිලිජ්ජිත්ථ[4] -පෙ- "අනුජානාමි භික්ඛවෙ, "ධූමං කාතු" න්ති. වඩ්ඪමංසං[5] වුට්ඨාති. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, ලොණසක්ඛරිකාය ඡින්දිතු" න්ති. වණො න රුහති. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, වණතෙල" න්ති. තෙලං ගලති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, විකාසිකං සබ්බං වණපටිකම්ම" න්ති.

47. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අහිනා දට්ඨො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, චත්තාරි මහාවිකටානි දාතුං: ගූථං මුත්තං ඡාරිකං මත්තික" න්ති. අථ ඛො භික්ඛූනං එතදහොසි: "අප්පටිග්ගහිතානි නු ඛො උදාහු පටිග්ගහෙතබ්බානී" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සති කප්පියකාරකෙ පටිග්ගහාපෙතුං, අසති කප්පියකාරකෙ සාමං ගහෙත්වා පරිභුඤ්ජිතු" න්ති.

48. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙන භික්ඛුනා විසං පීතං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ගූථං පායෙතු" න්ති. අථ ඛො භික්ඛූනං එතදහොසි: "අප්පටිග්ගහිතො නු ඛො උදාහු පටිග්ගහෙතබ්බො" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, යං කරොන්තො පතිගණ්හාති, ස්වෙව පටිග්ගහො කතො හොති. න පුන පටිග්ගහාපෙතබ්බො" ති.

49. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො ඝරදින්නකාබාධො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සීතාලොලිං පායෙතු" න්ති.

50. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු දුට්ඨගහණිකො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ආමිසඛාරං පායෙතු" න්ති.

51. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො පණ්ඩුරොගාබාධො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, මුත්තහරීටකං පායෙතු" න්ති.

52. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො ඡවිදොසාබාධො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ගන්ධාලෙපං කාතු" න්ති.

1. "වණබන්ධනචොළෙන" ම ඡ සං. P T S. අ වි. ජ වි.
2. "සාසපකුඩ්ඩෙන" සී මු. "සාසපකුට්ටෙන" ම ඡ සං. P T S. ජ වි
3. "ඵොසිතුන්ති" ම නු ප. ජ වි 4. "කිලිජ්ජති" සී මු. 5 "වණමංසං" P T S
,, "පොසිතුං" සී. මු. ඵුසිතුං ?

46. එකල්හි එක්තරා මහණකුහට ගණ්ඩාබාධයෙක් වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සැත්කම් අනුදනිමි" යි. කහට වතුරෙන් ප්‍රයොජන වේ. -පෙ- "මහණෙනි, කහටවතුර අනුදනිමි" යි. තලකල්කයෙන් ප්‍රයෝජන වේ. -පෙ- "මහණෙනි, තලකල්කය අනුදනිමි" යි. කබොලුවකින් (පැලැස්තරයකින්) ප්‍රයෝජන වේ. -පෙ- "මහණෙනි, කබොලුවක් අනුදනිමි" යි. වණ බඳින රෙදි කඩකින් ප්‍රයොජන වේ. -පෙ- "මහණෙනි, වණ බඳින රෙදිකඩක් අනුදනිමි" යි. වණය කසයි. -පෙ- "මහණෙනි, අබකුඩුවෙන් උලන්නට අනුදනිමි" යි. වණය තෙත් වි ය. -පෙ- "මහණෙනි, දුම් (වේදු) ඇල්ලීමට අනුදනිමි" යි. වැඩෙන මස්දළු නගී. -පෙ- "මහණෙනි, ලුණුපුපුරකින් සිඳින්නට අනුදනිමි" යි. වණය ගොඩ නො වේ. -පෙ- "මහණෙනි, වණතෙල් අනුදනිමි" යි. තෙල් වැගිරෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, වණවැටියක් (තෙල් රඳවන කඩක්) ද සියලු වණ පිළියම් ද අනුදනිමි" යි.

47. එකල්හි එක්තරා මහණෙක් තෙමේ සර්පයකු විසින් දෂ්ට කරණ ලද්දේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මල, මූත්‍ර, උණුඅළු, මැටි යන සතර මහාවිකටය දෙන්නට අනුදනිමි" යි. එකල්හි භික්ෂූන්ට "නො පිළිගත් මල ආදීහු ද? නොහොත් පිළිගතයුතු මල ආදීහු දැ" යි මේ සිත් වි ය. භාගයවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, කැපකරුවකු ඇති කල්හි පිළිගන්වා ගන්නට ද, කැපකරුවකු නැති කල්හි තමන් ගෙණ වළඳන්නට ද අනුදනිමි" යි.

48. එකල්හි එක්තරා මහණකු විසින් විස බොන ලද්දේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අශුචි පොවන්නට අනුදනිමි" යි. එකල්හි භික්ෂූන්ට නො පිළිගත් මල ද නොහොත් පිළිගත යුතු මල දැ" යි මේ සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පහ කරමින් යමක් පිළිගණී ද, ඒ ම පිළිගැණීම වේ. නැවැත පිළිගන්වා ගත යුත්තේ නො වේ" ය යි අනුදනිමි.

49. එකල්හි එක්තරා මහණකුහට ඝරදින්නකාබාධයෙක් (ඝරණීය =ගෙහිමි දුන් වශීකරණ බෙහෙදක් බීමෙන් හටගත් ආබාධයෙක්) වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සීවිට (නගුලෙහි) ඇලුනු මඩ දියෙන් සැලතා පෙවීමට අනුදනිමි" යි.

50. එකල්හි එක්තරා මහණෙක් තෙමේ නපුරු ග්‍රහණීරොග ඇත්තේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, වියලිබත් පුළුස්සා දිය කොට පෙරා ගත් බත්කාරම පොවන්නට අනුදනිමි" යි.

51. එකල්හි එක්තරා මහණකුහට පණ්ඩුරොගාබාධයෙක් වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ගොමූත්‍රයෙහි ලූ අරළු පොවන්නට අනුදනිමි" යි.

52. එකල්හි එක්තරා මහණකුහට ඡවිදෙෂාබාධයෙක් වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සුගන්ධද්‍රව්‍යය ආලෙප කරන්නට අනුදනිමි" යි.

53. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අභිසන්නකායො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, විරෙචනං පාතු" න්ති. අච්ඡකඤ්ජියා අත්ථො හොති. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, අච්ඡකඤ්ජි" න්ති. අකටයූසෙන අත්ථො හොති. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, අකටයූස" න්ති. කටාකටෙන අත්ථො හොති. -පෙ- "අනුජානාමි භික්ඛවෙ, කටාකට" න්ති පටිච්ඡාදනීයෙන අත්ථො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පටිච්ඡාදනීය" න්ති.

54. තෙන ඛො පන සමයෙන ආයස්මා **පිලින්දිවච්ඡො රාජගහෙ** පබ්භාරං සොධාපෙති ලෙණං කත්තුකාමො. අථ ඛො රාජා මාගධො සෙනියො **බිම්බිසාරො** යෙනායස්මා පිලින්දිවච්ඡො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං පිලින්දිවච්ඡං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො ආයස්මන්තං පිලින්දිවච්ඡං එතදවොච: "කිං භන්තෙ ථෙරො කාරාපෙතී" ති. "පබ්භාරං මහාරාජ, සොධාපෙමි ලෙණං කත්තුකාමො" ති. "අත්ථො භන්තෙ, අය්‍යස්ස ආරාමිකෙනා" ති. "න ඛො මහාරාජ, භගවතා ආරාමිකො අනුඤ්ඤාතො" ති. "තෙන හි භන්තෙ, භගවන්තං පටිපුච්ඡිත්වා මම ආරොචෙය්‍යාථා" ති. "එවං මහාරාජා" ති ඛො ආයස්මා පිලින්දිවච්ඡො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පච්චස්සොසි.

55. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො රාජානං මාගධං සෙනියං බිම්බිසාරං ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො ආයස්මතා පිලින්දිවච්ඡෙන ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා ආයස්මන්තං පිලින්දිවච්ඡං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

56. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො භගවතො සන්තිකෙ දූතං පාහෙසි: "රාජා භන්තෙ, මාගධො සෙනියො බිම්බිසාරො ආරාමිකං දාතුකාමො. කථන්නු ඛො භන්තෙ[1] පටිපජ්ජිතබ්බ" න්ති. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, ආරාමික" න්ති

57. දුතියම්පි ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො යෙනායස්මා පිලින්දිවච්ඡො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං පිලින්දිවච්ඡං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො ආයස්මන්තං පිලින්දිවච්ඡං එතදවොච: "අනුඤ්ඤාතො භන්තෙ, භගවතා ආරාමිකො" ති. "එවං මහාරාජා" ති. "තෙන හි භන්තෙ, අය්‍යස්ස ආරාමිකං දම්මී" ති.

1. "භන්තෙ මයා" ම ජ සං.

53. එකල්හි එක්තරා මහණෙක් තෙමේ දෙස් කිපුනු සිරුරු ඇත්තේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, විරේචනයක් බොන්නට අනුදනිමි" යි. පෙරා ගත් කැඳවතුරෙන් ප්‍රයොජන වේ. -පෙ- "මහණෙනි, බත් නැති කැඳවතුර අනුදනිමි" යි. දුරු මිරිස් නො යෙදූ මුංඇට තැම්බූ වතුරෙන් ප්‍රයොජන වේ. -පෙ- "මහණෙනි, මුං ඇට තැම්බූ වතුර අනුදනිමි" යි. මුංඇට තම්බා ඇට නැති සේ පෙරා ගත් වතුරෙන් ප්‍රයොජන වේ. -පෙ- "මහණෙනි, මුංඇට තම්බා ඇට නැති සේ පෙරා ගත් වතුර අනුදනිමි" යි. මස්රසයෙන් ප්‍රයොජන වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මස්රසය අනුදනිමි"යි.

54. එකල්හි ආයුෂ්මත් පිලින්දිවච්ඡ ස්ථවිර තෙමේ ලෙණක් කරණු කැමැත්තේ රජගහනුවර ගුහාවක් ශුද්ධ කරව යි. ඉක්බිති මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජතෙමේ පිලින්දිවච්ඡ තෙරුන් වෙත ගියේ ය. ගොස් ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන් සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජතෙමේ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන්ගෙන් "ස්වාමීනි, ස්ථවිර තෙමේ කුමක් කරවා ද" යි ඇසී ය. "මහරජ, ලෙණක් කරණු කැමැත්තෙම් ගුහාවක් පිරිසිදු කරවමි" යි. "ස්වාමීනි, ඔබවහන්සේට ආරාමිකයකුගෙන් ප්‍රයොජන වේ ද" යි (ඇසී ය). "මහරජ, භාග්‍යවතුන් වහන්සේ විසින් ආරාමිකයෙක් නො අනුදන්නා ලද්දේ ය" යි. "ස්වාමීනි, එසේ නම් භාග්‍යවතුන් වහන්සේගෙන් පිළිවිස මට දන්වනු මැනවි" යි. ආයුෂ්මත් පිලින්දිවච්ඡ ස්ථවිර තෙමේ "මහරජ, එසේ ය" යි මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජුහට පිළිවදන් දුන්නේ ය.

55. ඉක්බිති ආයුෂ්මත් වූ පිලින්දිවච්ඡ ස්ථවිර තෙමේ මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජු දැහැමිකතාවෙන් කරුණු දැක්වී ය. සමාදන් කරවී ය. තියුණු කරවී ය. සතුටු කරවී ය. ඉක්බිති මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජතෙමේ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන් විසින් දැහැමි කතාවෙන් කරුණු දක්වන ලද්දේ සමාදන් කරවන ලද්දේ තියුණු කරවන ලද්දේ සතුටු කරවන ලද්දේ හුනස්නෙන් නැගිට ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන් සකසා වැඳ පැදකුණු කොට ගියේ ය.

56. ඉක්බිති ආයුෂ්මත් පිලින්දිවච්ඡ ස්ථවිර තෙමේ "ස්වාමීනි, මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජ තෙමේ ආරාමිකයකු දෙනු කැමැත්තේ ය. ස්වාමීනි, එහි දී කෙසේ පිළිපැදිය යුතු ද" යි භාග්‍ය-වතුන් වහන්සේගේ සමීපයට දූතයකු යැවී ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට "මහණෙනි, ආරාමිකයකු අනුදනිමි" යි භික්ෂූන් ඇමතූ සේක.

57. දෙවනු ද මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජ තෙමේ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන් වෙත ගියේ ය. ගොස් ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන් සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජ තෙමේ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන්ගෙන් "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් ආරාමිකයෙක් අනුදන්නා ලද්දේ ද" යි ඇසී ය. "මහරජ, එසේ ය". "ස්වාමීනි, එසේ නම්, ස්වාමීන් වහන්සේට ආරාමිකයකු දෙමි" යි.

58. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො ආයස්මතො පිලින්දිවච්ඡස්ස ආරාමිකං පටිස්සුත්වා විස්සරිත්වා චිරෙන සතිං පටිලභිත්වා අඤ්ඤතරං සබ්බත්ථකං මහාමත්තං ආමන්තෙසි: “යො මයා භණෙ, අය්‍යස්ස ආරාමිකො පටිස්සුතො, දින්නො සො ආරාමිකො” ති. “න ඛො දෙව අය්‍යස්ස ආරාමිකො දින්නො” ති. “කීව චිරන්නු ඛො භණෙ, ඉතො හි[1] තං හොතී” ති. අථ ඛො සො මහාමත්තො රත්තියො විගණෙත්වා [2]රාජානං මාගධං සෙනියං බිම්බිසාරං එතදවොච: “පඤ්ච දෙව රත්තිසතානී” ති. “තෙන හි භණෙ, අය්‍යස්ස පඤ්ච ආරාමිකසතානි දෙහී” ති.[3] “එවං දෙවා” ති ඛො සො මහාමත්තො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පටිස්සුත්වා ආයස්මතො පිලින්දිවච්ඡස්ස පඤ්ච ආරාමිකසතානි පාදාසි. පාටියෙක්කො ගාමො නිවිසි. **ආරාමිකගාමො**තිපි[4] නං ආහංසු. **පිලින්දි-ගාමො**තිපි[5] නං ආහංසු.

59. තෙන ඛො පන සමයෙන ආයස්මා පිලින්දිවච්ඡො තස්මිං ගාමකෙ කුලූපගො හොති. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො **පුබ්බන්හසමයං*** නිවාසෙත්වා පත්තචීවරං ආදාය පිලින්දිගාමං පිණ්ඩාය පාවිසි.

60. තෙන ඛො පන සමයෙන තස්මිං ගාමකෙ උස්සවො හොති. දාරකා අලඞ්කිතා[6] මාලාකිතා කීළන්ති. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො පිලින්දිගාමකෙ සපදානං පිණ්ඩාය චරමානො යෙන අඤ්ඤතරස්ස ආරාමිකස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

61. තෙන ඛො පන සමයෙන තස්සා ආරාමිකිනියා ධීතා අඤ්ඤෙ දාරකෙ අලඞ්කිතෙ මාලාකිතෙ පස්සිත්වා රොදති: “මාලං මෙ දෙථ. අලංකාරං මෙ දෙථා” ති. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො තං ආරාමිකිනිං එතදවොච: “කිස්සායං දාරිකා රොදතී” ති. “අයං භන්තෙ, දාරිකා අඤ්ඤෙ දාරකෙ අලඞ්කිතෙ මාලාකිතෙ පස්සිත්වා රොදති: ‘මාලං මෙ දෙථ. අලඞ්කාරං මෙ දෙථා’ ති. කුතො අම්හාකං දුග්ගතානං මාලා. කුතො අලඞ්කාරො” ති.

62. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො අඤ්ඤතරං තිණණ්ඩුපකං ගහෙත්වා තං ආරාමිකිනිං එතදවොච: “හන්දිමං තිණණ්ඩුපකං තස්සා දාරිකාය සීසෙ පටිමුඤ්චා” ති. අථ ඛො සා ආරාමිකිනී තං තිණණ්ඩුපකං ගහෙත්වා තස්සා දාරිකාය සීසෙ පටිමුඤ්චි. සා අහොසි සුවණ්ණමාලා අභිරූපා දස්සනීයා පාසාදිකා. නත්ථි තාදිසා රඤ්ඤොපි අන්තෙපුරෙ සුවණ්ණමාලා. මනුස්සා රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස ආරොචෙසුං: “අමුකස්ස දෙව, ආරාමිකස්ස ඝරෙ සුවණ්ණමාලා අභිරූපා දස්සනීයා පාසාදිකා. නත්ථි තාදිසා දෙවස්සාපි අන්තෙපුරෙ සුවණ්ණමාලා. කුතො තස්ස දුග්ගතස්ස? නිස්සංසයං චොරිකාය ආභතා” ති. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො තං ආරාමිකකුලං බන්ධාපෙසි.

1. “ඉතො රත්ති” සී. 2. “ගණෙත්වා” ම ඡ සං. 3. “දෙථාති” සීමු.
4. “ආරාමික ගාමකොතිපි” 5. “පිළින්දගාමකොතිපි” ම ඡ සං.
6. “අලඞ්කතා” ම ඡ සං.

Free Distribution www.aathaapi.org

58. ඉක්බිති මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජ තෙමේ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන්ට ආරාමිකයකු ගිවිස සිහි නො කොට කල් ගෙවා සිහි ලැබ සියලුකටයුතුවල අධිපති වූ එක්තරා මහඇමැතියකු අමතා "සගය, මා විසින් ආර්‍ය්‍යයන් වහන්සේට යම් ආරාමිකයෙක් (දීමට) ප්‍රතිඥා කරණ ලද්දේ ද, ඒ ආරාමික තෙමේ දෙන ලද්දේ දැ" යි ඇසී ය. "දෙවයන් වහන්ස, ආරාමිකයෙක් නො දෙන ලද්දේ ය" යි. "සගය, මෙදවසින් එදවස කෙතෙක් කල් දැ" යි (ඇසී ය). ඉක්බිති ඒ මහාමාත්‍ය තෙමේ රෑ ගණන් කොට මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජුට "දෙවයන් වහන්ස, රෑ පන්සියයකැ" යි කීයේ ය. "සගය, එසේ නම් ආර්‍ය්‍යයන් වහන්සේට ආරාමිකයන් පන්සියයක් දෙවු" යි. "දෙවයන් වහන්ස, එසේ ය" යි ඒ මහාමාත්‍ය තෙමේ මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජුහට ගිවිස ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන්ට ආරාමිකයන් පන්සියයක් දුන්නේ ය. වෙන ම (වෙන් වූ) ගමක් පිහිටියේ ය. ඒ ගම **ආරාමිකගම** යි ද කීහ. ඒ ගම **පිලින්දිගම** යි ද කීහ.

59. එකල්හි ආයුෂ්මත් පිලින්දිවච්ඡ ස්ථවිර තෙමේ ඒ ගමෙහි කුලූපග වේ. ඉක්බිති ආයුෂ්මත් පිලින්දිවච්ඡ ස්ථවිර තෙමේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පා සිවුරු ගෙණ පිලින්දිගමට පිඬු පිණිස පිවිසියේ ය.

60. එකල්හි ඒ ගමෙහි උත්සවයෙක් වේ. එහි දරුවෝ අබරණින් සැරසුනෝ පැලඳි මල්මාලා ඇත්තෝ ක්‍රීඩා කෙරෙත්. ඉක්බිති ආයුෂ්මත් පිලින්දිවච්ඡ ස්ථවිර තෙමේ පිලින්දිගමෙහි ගෙපිළිවෙළින් පිඬු සිඟා හැසිරෙන්නේ එක්තරා ආරාමිකයකුගේ ගෙට වැඩියේ ය. වැඩ පැණවූ අසුනෙහි වැඩ හුන්නේ ය.

61. එකල්හි ඒ ආරාමිකබිරින්දෑගේ දුව අබරණින් සැරසුනු පැලඳි මල්මාලා ඇති අන් දරුවන් දැක "මට මල්මාලාවක් දෙවු. මට ආභරණ දෙවු" යි හඬයි. ඉක්බිති ආයුෂ්මත් පිලින්දිවච්ඡ ස්ථවිර තෙමේ "මේ දැරිය කුමක් නිසා හඬා දැ" යි ඒ ආරාමිකබිරින්දෑගෙන් ඇසී ය. "ස්වාමීනි, මේ ලදැරිය අබරණින් සැරසුනු පැලඳි මල්මාලා ඇති අන් දරුවන් දැක "මට මල්මාලාවක් දෙවු. මට ආභරණ දෙවු" යි හඬයි. දුප්පත් වූ අපට මල්මාලා කොයින් ද ? ආභරණ කොයින් දැ" යි (ඔතොමෝ කීවා ය.)

62. ඉක්බිති ආයුෂ්මත් පිලින්දිවච්ඡ ස්ථවිර තෙමේ එක්තරා තණ දරණුවක් ගෙණ ඒ ආරාමිකබිරින්දෑට "එසේ නම් මේ තණදරණුව ඒ ලදැරියගේ හිසෙහි පලඳව" යි කීයේ ය. ඉක්බිති ඒ ආරාමික බිරින්ද ඒ තණදරණුව ගෙණ ඒ ලදැරියගේ හිසෙහි පැලඳුවා ය. ඒ මාලාව මනා රූ ඇති දැකුම් කටයුතු සිත් ගන්නා රන්මාලාවක් වි ය. රජුගේ ද අන්තඃපුරයෙහි එබඳු වූ රන්මාලාවක් නැත. මිනිස්සු "දෙවයන් වහන්ස, අසවල් ආරාමිකයාගේ ගෙයි මනා රූ ඇති දැකුම් කටයුතු සිත් ගන්නා රන්මාලාවක් ඇත. එබඳු වූ රන්මාලයක් දෙවයන් වහන්සේගේ අන්තඃපුරයෙහි ද නැත. ඒ දුප්පතාට (එබඳු රන් මාලයක්) කොයින් ද ? නිසැකයෙන් සොරකමින් ගෙණෙන ලද ය" යි මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජුහට දැන්වූහ. ඉක්බිති මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජ තෙමේ ඒ ආරාමිකකුලය බැඳවී ය. (සිර කරවී ය.)

63. දුතියම්පි ඛො ආයස්මා පිලින්දිවච්ඡො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය පිලින්දිගාමං පිණ්ඩාය පාවිසි. පිලින්දිගාමකෙ සපදානං පිණ්ඩාය චරමානො යෙන තස්ස ආරාමිකස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පටිවිස්සකෙ පුච්ඡි: "කහං ඉමං ආරාමිකකුලං ගත" න්ති. "එතිස්සා භන්තෙ, සුවණ්ණමාලාය කාරණා රඤ්ඤා බන්ධාපිත" න්ති.

64. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො යෙන රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො යෙනායස්මා පිලින්දිවච්ඡො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං පිලින්දිවච්ඡං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො රාජානං මාගධං සෙනියං බිම්බිසාරං ආයස්මා පිලින්දිවච්ඡො එතදවොච: "කිස්ස මහාරාජ ආරාමිකකුලං බන්ධාපිත" න්ති. "තස්ස භන්තෙ, ආරාමිකස්ස ඝරෙ සුවණ්ණමාලා අභිරූපා දස්සනීයා පාසාදිකා. නත්ථි තාදිසා අම්හාකම්පි අන්තෙපුරෙ සුවණ්ණමාලා. කුතො තස්ස දුග්ගතස්ස? නිස්සංසයං චොරිකාය ආභතා" ති.

65. අථ ඛො ආයස්මා පිලින්දිවච්ඡො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පාසාදං සුවණ්ණන්ති අධිමුච්චි. සො අහොසි සබ්බසොවණ්ණ-මයො. "ඉදං පන තෙ මහාරාජ, තාව බහුං සුවණ්ණං කුතො" ති. "අඤ්ඤාතං භන්තෙ, අය්‍යස්ස එසො[1] ඉද්ධානුභාවො" ති තං ආරාමිකකුලං මුඤ්චාපෙසි. මනුස්සා "අය්‍යෙන කිර පිලින්දිවච්ඡෙන සරාජිකාය පරිසාය උත්තරිමනුස්සධම්මා[2] ඉද්ධිපාටිහාරියං දස්සිත" න්ති අත්තමනා අභිප්පසන්නා ආයස්මතො පිලින්දිවච්ඡස්ස පඤ්ච භෙසජ්ජානි අභිහරිංසු. සෙය්‍යථීදං: සප්පි[3] නවනීතං තෙලං මධු[4] ඵාණිත" න්ති.

66. පකතියාපි ච ආයස්මා පිලින්දිවච්ඡො ලාභී හොති පඤ්චන්නං භෙසජ්ජානං. ලද්ධං ලද්ධං පරිසාය විස්සජ්ජෙති. පරිසා චස්ස හොති බාහුලිකා[5]. ලද්ධං ලද්ධං කොලම්බෙපි ඝටෙපි පූරෙත්වා පටිසාමෙති[6]. පරිස්සාවනානිපි ථවිකායොපි පූරෙත්වා වාතපානෙසු ලග්ගෙති. තානි ඔලීනවිලීනානි තිට්ඨන්ති. උන්දූරෙහිපි විහාරා ඔකිණ්ණා විකිණ්ණා හොන්ති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "අන්තොකොට්ඨාගාරිකා ඉමෙ සමණා සක්‍යපුත්තියා සෙය්‍යථාපි රාජා මාගධො සෙනියො බිම්බිසාරො" ති.

67. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම භික්ඛූ එවරූපාය බාහුල්ලාය චෙතෙස්ස-න්තී" ති. අථ ඛො තෙ භික්ඛූ[7] භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ, භික්ඛූ එවරූපාය බාහුල්ලාය චෙතෙන්තී"[8] ති. "සච්චං භගවා". -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "යානි ඛො පන තානි ගිලානානං භික්ඛූනං පටිසායනීයානි භෙසජ්ජානි, සෙය්‍යථීදං: සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං, තානි පටිග්ගහෙත්වා සත්තාහපරමං සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි. තං අතික්කාමයතො යථා ධම්මො කාරෙතබ්බො" ති.

**භෙසජ්ජඅනුඤ්ඤාතභාණවාරො පඨමො**

---

1. "අය්‍යස්සෙවෙසො" ම ඡ සං. 2. "උත්තරිමනුස්ස ධම්මං" ම ඡ සං. PTS.
3. "සප්පිං" ම ඡ සං. PTS. 4. "මධුං" ම ඡ සං.
5. "බාහුල්ලිකා" ම ඡ සං. PTS. 6. "පටිසාමෙන්ති" අ වි. ජ වි.
7. "තෙ අනෙකපරියායෙන විගරහිත්වා" ම ඡ සං. 8. "චෙතෙස්සන්තීති" සී මු.

63. දෙවනු ද ආයුෂ්මත් පිලින්දිවච්ඡ ස්ථවිර තෙමේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාසිවුරු ගෙණ පිලින්දිගමට පිඬු පිණිස ගියේ ය. පිලින්දිගමෙහි ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙන්නේ ඒ ආරාමිකයාගේ ගෙට එළැඹියේ ය. එළැඹ "මේ ආරාමිකකුලය කොහි ගියේ දැ" යි අසල් වැස්සන් අතින් විචාළේ ය. "ස්වාමීනි, ඒ රන්මාලාව හෙතු කොට රජු විසින් බඳවන ලද්දේ ය" යි කීහ.

64. ඉක්බිති ආයුෂ්මත් පිලින්දිවච්ඡ ස්ථවිර තෙමේ මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජුගේ මාලිගාවට ගියේ ය. ගොස් පැණවූ අසුනෙහි හුන්නේ ය. ඉක්බිති මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජ තෙමේ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන් වෙත එළැඹියේ ය. එළැඹ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන් සකසා වැඳ පසෙක හුන්නේ ය. ආයුෂ්මත් පිලින්දිවච්ඡ ස්ථවිර තෙමේ පසෙක හුන් මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජුගෙන් "මහරජ, කුමක් හෙයින් ආරාමිකකුලය බඳවන ලද දැ" යි ඇසී ය. "ස්වාමීනි, ඒ ආරාමිකයාගේ ගෙයි මනා රූ ඇති දැකුම්කලු සිත් ගන්නා රන්මාලයක් තිබේ. එබඳු වූ රන්මාලාවක් අපගේ අන්තඃපුරයෙහි ද නැත. ඒ දුප්පතාට රන්මාලයක් කොයින් ද ? නිසැකයෙන් සොරකමින් ගෙණ එන ලද ය".

65. ඉක්බිති ආයුෂ්මත් පිලින්දිවච්ඡ ස්ථවිර තෙමේ "මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජුගේ ප්‍රාසාදය රන් වේවා"යි ඉටුයේ ය. ඒ ප්‍රාසාදය සියල්ල රන් වි ය. "මහරජ, ඔබට මේ තරම් බොහෝ රන් කොයින් ද ?" "ස්වාමීනි, දැන ගන්නා ලද්දේ ය. ආර්‍ය්‍යයන් වහන්සේගේ මේ ඍද්ධ්‍යනුභාව ය" යි ඒ ආරාමික කුලය නිදහස් කොට හැරියේ ය. මිනිස්සු 'ස්වාමී වූ පිලින්දිවච්ඡ තෙරුන් විසින් රජුන් සහිත වූ පිරිසෙහි උතුරුමිනිස්දම්න් ඉදුපෙළහරක් දක්වන ලද්දේ ල' යි සතුටු සිත් ඇත්තාහු විශෙෂයෙන් පහන් වූවෝ ආයුෂ්මත් පිලින්දිවච්ඡ තෙරුන්ට පස් බෙහෙත් එළවූහ. එනම් ගිතෙල් වෙඬරු තලතෙල් මීපැණි සකුරු යන මේ ය.

66. ආයුෂ්මත් පිලින්දිවච්ඡ ස්ථවිර තෙමේ ප්‍රකෘතියෙන් ම පස් බෙහෙත් ලබනසුලු වේ. ලත් ලත් දෙය පිරිසට පරිත්‍යාග කරයි. උන්වහන්සේගේ පිරිස ද ප්‍රත්‍යයයන්ගේ බහුලත්වය පිණිස පිළිපන්නේ වේ. ලත් ලත් දෙය මහසැළි ද කල ද පුරවා තැන් පත් කරයි. පෙරහන් ද පසුම්බි ද පුරවා වාකවුළුවල එල්ලයි. ඒ වැගිරි වැගිරී තිබේ. මීයන්ගෙන් ද ආවාසයෝ හැම අතින් ගැවසී ගත්තාහු වෙත්. මිනිස්සු විහාරචාරිකාවෙහි ඇවිදින්නෝ (ඒ දැක) "ශාක්‍යපුත්‍රීය වූ මේ ශ්‍රමණයෝ ඇතුළත කොටුගුල් ඇත්තෝ ය. මගධෙශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජු වැනි ය" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්.

67. භික්ෂූහු අවමන් කරණ නින්දා කරණ දොස් කියන ඒ මිනිසුන්ගේ කතාව ඇසූහ. යම් ඒ භික්ෂූහු ආශා රහිත වූවාහු ද, ඒ භික්ෂූහු "කෙසේ නම් භික්ෂූහු මෙබඳු වූ ප්‍රත්‍යයයන්ගේ බහුලභාවය පිණිස (ප්‍රත්‍යයයන් බොහෝ සේ රැස් කිරීමට) සිතුහු දැ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, භික්ෂූහු මෙබඳු වූ ප්‍රත්‍යයයන්ගේ බහුලභාවය පිණිස සිතත් ල, සැබෑ දැ" යි. "භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය". -පෙ- ගර්හා දැහැමි කතා කොට "ගිලන් භික්ෂූන් විසින් වැළඳිය යුතු වූ (රස විඳිය යුතු වූ) යම් ඒ බෙහෙත් එනම් ගිතෙල් වෙඬරු තලතෙල් මීපැණි සකුරු වේ ද, ඒ පිළිගෙණ සතියක් නගා තබා වැළඳිය යුතු ය. ඒ නියමිත කාලය (සතිය) ඉක්මවන්නහුට ඇවැත් පරිදි කරවිය යුතු ය" යි භික්ෂූන් ඇමතූ සේක.

**බෙහෙත් අනුදත් පළමුබණවර නිමි.**

---

1. අථ ඛො භගවා **සාවත්ථියං** යථාභිරන්තං විහරිත්වා යෙන **රාජගහං** තෙන චාරිකං පක්කාමි.

2. අද්දසා ඛො ආයස්මා **කඞ්ඛාරෙවතො** අන්තරාමග්ගෙ ගුළකරණං ඔක්කමිත්වා ගුළෙ පිට්ඨම්පි ඡාරිකම්පි පක්ඛිපන්තෙ. දිස්වාන "අකප්පියො ගුළො. සාමිසො. න කප්පති ගුළො විකාලෙ පරිභුඤ්ජිතු" න්ති කුක්කුච්චායන්තො සපරිසො ගුළං න පරිභුඤ්ජති. යෙපිස්ස සොතබ්බං මඤ්ඤන්ති, තෙපි ගුළං න පරිභුඤ්ජන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "කිමත්ථාය[1] භික්ඛවෙ, ගුළෙ පිට්ඨම්පි ඡාරිකම්පි පක්ඛිපන්තී" ති. "බන්ධනත්ථාය[2] භගවා" ති. "සචෙ භික්ඛවෙ, බන්ධනත්ථාය[3] ගුළෙ පිට්ඨම්පි ඡාරිකම්පි පක්ඛිපන්ති, සො ච ගුළොත්වෙව සඞ්ඛං ගච්ඡති. අනුජානාමි භික්ඛවෙ, යථාසුඛං ගුළං පරිභුඤ්ජිතු" න්ති.

3. අද්දසා ඛො ආයස්මා කඞ්ඛාරෙවතො අන්තරාමග්ගෙ වච්චෙ මුග්ගං ජාතං. පස්සිත්වා "අකප්පියා මුග්ගා. පක්කාපි මුග්ගා ජායන්තී" ති කුක්කුච්චායන්තො සපරිසො මුග්ගං න පරිභුඤ්ජති. යෙපිස්ස සොතබ්බං මඤ්ඤන්ති තෙපි මුග්ගං න පරිභුඤ්ජන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "සචෙ භික්ඛවෙ, පක්කාපි මුග්ගා ජායන්ති, අනුජානාමි භික්ඛවෙ, යථාසුඛං මුග්ගං පරිභුඤ්ජිතු" න්ති.

4. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො උදරවාතාබාධො හොති. සො ලොණසොවීරකං අපායි. තස්ස සො උදරවාතාබාධො පටිප්පස්සම්භි. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ගිලානස්ස ලොණසොවීරකං අගිලානස්ස උදකසම්භින්නං පානපරිභොගෙන පරිභුඤ්ජිතු" න්ති.

5. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන රාජගහං තදවසරි. තත්‍ර සුදං භගවා රාජගහෙ විහරති **වෙළුවනෙ** කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන භගවතො උදරවාතාබාධො හොති.

6. අථ ඛො ආයස්මා **ආනන්දො** "පුබ්බෙපි භගවතො උදරවාතාබාධො තෙකටුලාය[4] යාගුයා ඵාසු හොතී" ති සාමං තිලම්පි තණ්ඩුලම්පි මුග්ගම්පි විඤ්ඤාපෙත්වා අන්තො වාසෙත්වා අන්තො සාමං පචිත්වා භගවතො උපනාමෙසි "පිවතු භගවා තෙකටුලයාගු" න්ති.

7. ජානන්තාපි තථාගතා පුච්ඡන්ති. ජානන්තාපි න පුච්ඡන්ති. කාලං විදිත්වා පුච්ඡන්ති. කාලං විදිත්වා න පුච්ඡන්ති. අත්ථසංහිතං තථාගතා පුච්ඡන්ති. නො අනත්ථසංහිතං. අනත්ථසංහිතෙ සෙතුඝාතො තථාගතානං. ද්වීහි ආකාරෙහි බුද්ධා භගවන්තො භික්ඛූ පටිපුච්ඡන්ති: "ධම්මං වා දෙසිස්සාම සාවකානං වා සික්ඛාපදං පඤ්ඤපෙස්සාමා" ති.

8. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි "කුතො'යං[5] ආනන්ද, යාගූ" ති.

---

1. "කිමත්ථියා" ම ඡ සං. PTS.
2. "බද්ධත්ථාය" ම ඡ සං. ,, "ථද්ධනත්ථාය" PTS.
3. "ථද්ධත්ථාය" ම ඡ සං සීමු - කත්ථ චි
4. "තෙකටුල" ම ඡ සං.
5. "කුතායං" ම ඡ සං PTS.

Free Distribution www.aathaapi.org

1. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **සැවැත්**නුවර කැමති තාක් වාසය කොට **රජගහ**නුවර බලා චාරිකාවෙහි වැඩි සේක.

2. ආයුෂමත් **කඞ්ඛාරෙවත** ස්ථවිර තෙමේ අතරමග උක්හකුරු කරණ තැනකට ඇතුල් ව උක්හකුරුවල පිටි ද අළු ද බහන්නවුන් දුටුයේ ය. දැක "උක්හකුරු අකැප වේ. ආමිස සහිත වේ. නො කල්හි වළඳන්නට උක්හකුරු කැප නො වේ ය" යි කුකුස් කරන්නේ පිරිස් සහිත ව උක්හකුරු නො වළඳයි. උන්වහන්සේගේ වචනය අදහන්නෝ ද උක්හකුරු නො වළඳත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, කුමක් සඳහා උක්හකුරුවල පිටිත් අළුත් බහත් ද ?". "භාග්‍යවතුන් වහන්ස, බඳිනු (කැටි කරණු )සඳහා ය." "මහණෙනි, කැටි කිරීම සඳහා උක්හකුරුවල පිටිත් අළුත් බහත් නම්, එ ද උක්හකුරු ම ය යි සඞ්ඛ්‍යාවට යෙයි. මහණෙනි, උක්හකුරු කැමැති සේ වළඳන්නට අනුදනිමි" යි.

3. ආයුෂමත් කඞ්ඛාරෙවත ස්ථවිර තෙමේ අතර මග දී වර්චස්හි හටගත් මුං (මුංපැළ) දුටුයේ ය. දැක "මුං නො කැප ය. තැම්බූ මුං ද පැළ වේ ය" යි කුකුස් කරමින් පිරිස් සහිත ව මුං නො වළඳයි. උන්වහන්සේගේ වචනය අදහන්නෝ ද මුං නො වළඳත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, තැම්බූ මුං හටගණිතත් මහණෙනි, කැමැති සේ (තැම්බූ) මුං වළඳන්නට අනුදනිමි" යි.

4. එකල්හි එක්තරා මහණකුහට උදරවාතාබාධයෙක් වේ. හෙ තෙමේ ලොණසොවීරකය* බීයේ ය. ඔහුගේ ඒ උදරාබාධය සංසිඳුනේ ය. භාග්‍ය-වතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ගිලනහුට ලොණසොවීරකය අනුදනිමි. නො ගිලනහුට දිය හා මුසු කළ ලොණසොවීරකය පානපරි භොගයෙන් වළඳන්නට අනුදනිමි" යි.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් චාරිකා කරණ සේක් රජගහනුවරට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ එහි රජගහනුවර කලන්දකනිවාපයෙහි වූ **වෙළුවනයෙහි** වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේට උදරවාතාබාධයෙක් වේ.

6. ඉක්බිති ආයුෂමත් **ආනන්ද** ස්ථවිර තෙමේ "පෙරත් භාග්‍යවතුන් වහන්සේගේ උදරවාතාබාධය තිකුළුකැඳෙන් පහසු වූයේ වේ ය" යි තෙමේ තල ද සහල් ද මුං ද විණවා (ඉල්ලා) ගේතුළ තබා ඇතුළත තමා විසින් පිස භාග්‍යවතුන් වහන්සේට "භාග්‍යවතුන් වහන්සේ තිකුළුකැඳ වළඳන සේක්වා" යි එළවී ය.

7. තථාගතවරයෝ දන්නෝ ද විචාරත්. දන්නෝ ද නො විචාරත්. කල් දැන විචාරත්. කල් දැන නො විචාරත්. තථාගතවරයෝ අර්ථ සහිත වූවක් විචාරත්. අනර්ථයෙන් යුක්ත වූවක් නො විචාරත්. තථාගතවරයන්ට අනර්ථයෙන් යුක්ත වූවෙහි හෙතු නැසීම මාර්ගයෙන් සිඳි ය. භාග්‍යවත් බුදුවරයෝ "ධර්මය හෝ දෙසන්නෙමු. ශ්‍රාවකයන්ට ශික්ෂාපද හෝ පණවන්නෙමු"යි දෙඅයුරකින් භික්ෂූන් විචාරත්.

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "ආනන්දය, මේ කැඳ කො තැනින් ලැබුනේ දැ" යි ආයුෂමත් ආනන්දතෙරුන් විචාළ සේක.

* උපග්‍රන්ථය බලනු

9. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි. විගරහි බුද්ධො භගවා "අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම ත්වං ආනන්ද, එවරූපාය බාහුල්ලාය චෙතෙස්සසි ? යදපි ආනන්ද, අන්තො වුත්ථං[1], තදපි අකප්පියං. යදපි අන්තො පක්කං, තදපි අකප්පියං. යදපි සාමං පක්කං, තදපි අකප්පියං. නෙතං ආනන්ද, අප්පසන්නානං වා පසාදාය" -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, අන්තො වුත්ථං අන්තො පක්කං සාමං පක්කං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අන්තො චෙ භික්ඛවෙ, වුත්ථං අන්තො පක්කං සාමං පක්කං. තඤ්චෙ පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති තිණ්ණං දුක්කටානං. අන්තො චෙ භික්ඛවෙ, වුත්ථං අන්තො පක්කං අඤ්ඤෙහි පක්කං, තඤ්චෙ පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති ද්වින්නං දුක්කටානං. අන්තො චෙ භික්ඛවෙ, වුත්ථං බහි පක්කං සාමං පක්කං, තඤ්චෙ පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති ද්වින්නං දුක්කටානං. බහි චෙ භික්ඛවෙ, වුත්ථං අන්තො පක්කං සාමං පක්කං, තඤ්චෙ පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති ද්වින්නං දුක්කටානං. අන්තො චෙ භික්ඛවෙ වුත්ථං බහි පක්කං අඤ්ඤෙහි පක්කං, තඤ්චෙ පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. බහි චෙ භික්ඛවෙ, වුත්ථං අන්තො පක්කං අඤ්ඤෙහි පක්කං, තඤ්චෙ පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. බහි චෙ භික්ඛවෙ, වුත්ථං බහි පක්කං සාමං පක්කං, තඤ්චෙ පරිභුඤ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්ස. බහි චෙ භික්ඛවෙ, වුත්ථං බහි පක්කං අඤ්ඤෙහි පක්කං, තඤ්චෙ පරිභුඤ්ජෙය්‍ය, අනාපත්ති" ති.

10. තෙන ඛො පන සමයෙන භික්ඛූ "භගවතා සාමංපාකො පටික්ඛිත්තො" ති පුන පාකෙ කුක්කුච්චායන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පුන පාකං පචිතු" න්ති.

11. තෙන ඛො පන සමයෙන රාජගහං දුබ්භික්ඛං හොති. මනුස්සා ලොණම්පි තෙලම්පි තණ්ඩුලම්පි ඛාදනීයම්පි ආරාමං ආහරන්ති. තානි භික්ඛූ බහි වාසෙන්ති. උක්කපිණ්ඩිකාපි ඛාදන්ති. චොරාපි • හරන්ති. දමකාපි හරන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අන්තො වාසෙතු" න්ති. අන්තො වාසෙත්වා බහි පාචෙන්ති. දමකා පරිවාරෙන්ති. භික්ඛූ අවිස්සත්ථා[2] පරිභුඤ්ජන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අන්තො පචිතු" න්ති. දුබ්භික්ඛෙ කප්පියකාරකා බහුතරං හරන්ති. අප්පතරං භික්ඛූනං දෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සාමං පචිතුං. අනුජානාමි භික්ඛවෙ, අන්තො වුත්ථං[3] අන්තො පක්කං සාමං පක්ක" න්ති.

12. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ කාසීසු වස්සං වුත්ථා[4] රාජගහං ගච්ඡන්තා භගවන්තං දස්සනාය අන්තරාමග්ගෙ න ලභිංසු ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. බහුඤ්ච ඵලඛාදනීයං අහොසි. කප්පියකාරකො ච න අහොසි අථ ඛො තෙ භික්ඛූ කිලන්තරූපා යෙන රාජගහං වෙළුවනං කලන්දකනිවාපො යෙන භගවා තෙනුපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

---

1. "අන්තොවුට්ඨං" ම ඡ සං.
2. "අවිසට්ඨා" ම ඡ සං PTS.
,, "අවිස්සත්ථාය" තො වි. ම නු ප.
3. "අන්තොවුට්ඨං" ම ඡ සං.
4. "වස්සං වුට්ඨා" ම ඡ සං

9. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ "ආනන්දය, නුසුදුස්සෙක. අනුලෝම් නො වූවෙක. නො ගැලපෙන්නෙක. නො මහණකමෙක. අකැප වූවෙක. නො කටයුත්තෙක. ආනන්දය, කෙසේ නම් තෝ මෙබඳු වූ ප්‍රත්‍යයයන්ගේ බහුලභාවය පිණිස සිතුවෙහි ද?" යි ගැරහූ සේක. "ආනන්දය, යමක් ඇතුළත තුබූයේ ද, එ ද නො කැප ය. යමක් ඇතුළත පිසන ලද්දේ ද, එ ද නො කැප ය. යමක් තමන් විසින් පිසන ලද්දේ ද, එ ද නො කැප ය. ආනන්දය, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ" යි -පෙ- ගරහා දැහැමි කතා කොට "මහණෙනි, ඇතුළත තබන ලද ඇතුළත පිසන ලද තමන් විසින් පිසන ලද දෙය නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, ඇතුළත තබන ලද ඇතුළත පිසන ලද තමන් විසින් පිසන ලද දෙය වළඳන්නේ නම්, දුකුළාඇවැත් තුණක් වේ. මහණෙනි, ඇතුළත තබන ලද ඇතුළත පිසන ලද අනුන් විසින් පිසන ලද දෙය වළඳන්නේ නම්, දුකුළාඇවැත් දෙකක් වේ. මහණෙනි, ඇතුළත තබන ලද පිටත පිසන ලද තමන් විසින් පිසන ලද දෙය වළඳන්නේ නම්, දුකුළාඇවැත් දෙකක් වේ. මහණෙනි, පිටත තබන ලද ඇතුළත පිසන ලද තමන් විසින් පිසන ලද දෙය වළඳන්නේ නම්, දුකුළාඇවැත් දෙකක් වේ. මහණෙනි, ඇතුළත තබන ලද පිටත පිසන ලද අනුන් විසින් පිසන ලද දෙය වළඳන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, පිටත තබන ලද ඇතුළත පිසන ලද අනුන් විසින් පිසන ලද දෙය වළඳන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, පිටත තබන ලද පිටත පිසන ලද තමන් විසින් පිසන ලද දෙය වළඳන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, පිටත තබන ලද පිටත පිසන ලද අන්‍යයන් විසින් පිසන ලද දෙය වළඳන්නේ නම්, ඇවැත් නො වේ ය" යි භික්ෂූන් ඇමතූ සේක.

10. එකල්හි භික්ෂූහු "භාග්‍යවතුන් වහන්සේ විසින් තමන් විසින් පිසීම ප්‍රතික්ෂේප කරණ ලද්දේ ය" යි පිසූ දෙය නැවත පිසීමෙහි කුකුස් කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, නැවත පිසීම අනුදනිමි" යි.

11. එකල්හි රජගහනුවර දුර්භික්ෂ වේ. මිනිස්සු ලුණු ද තෙල් ද සහල් ද කෑ යුතු දෙය ද ආරාමයට ගෙණ එත්. භික්ෂූහු ඒ දෑ පිටත තබවත්. බළල් මී මුගටි ආදීහු ද කත්. සොරු ද පැහැර ගණිත්. ඉදුල් කන්නෝ ද ගෙණ යත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ඇතුළත තබවන්ට අනුදනිමි" යි. ඇතුළත තබවා පිටත පිසවත්. ඉඳුල් කන්නෝ පිරිවරා ගණිත්. භික්ෂූහු විශ්වාස රහිත වූවාහු (සැකඇත්තෝ) වළඳත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ඇතුළත පිසන්නට අනුදනිමි" යි. දුර්භික්ෂයෙහි කැපකරුවෝ ඉතා වැඩියක් ගෙණ යත්. භික්ෂූන්ට ඉතා සවල්පයක් දෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, තමන් විසින් පිසන්නට අනුදනිමි. මහණෙනි, අතුළත තබන ලද්ද, ඇතුළත පිසන ලද්ද, තමන් විසින් පිසන ලද්ද අනුදනිමි" යි.

12. එකල්හි බොහෝ භික්ෂූහු කාසිදනව්වෙහි වස් වැස නිම කළෝ භාග්‍යවතුන් වහන්සේ දක්මට රජගහනුවරට යන්නෝ අතර මග දී රළු වූ හෝ මිහිරි වූ හෝ බොජුන් සෑහෙන පමණ නො ලැබූහ. බොහෝ කෑයුතු ඵලවගී වි ය. කැපකරුවෙක් නො වී ය. ඉක්බිති ඒ භික්ෂූහු ක්ලාන්තසවභාව ඇත්තෝ රජගහ නුවර කලන්දකනිවාපය වූ වෙළුවනයෙහි භාග්‍යවතුන් වහන්සේ හුන් තැනට එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්හ.

13. ආචිණ්ණං ඛො පනෙතං බුද්ධානං භගවන්තානං ආගන්තුකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදිතුං. අථ ඛො භගවා තෙ භික්ඛූ එතදවොච: "කච්චි භික්ඛවෙ, ඛමනීයං? කච්චි යාපනීයං? කච්චිත්ථ අප්පකිලමථෙන අද්ධානං ආගතා? කුතො ච තුම්හෙ භික්ඛවෙ, ආගච්ඡථා?" ති. "ඛමනීයං භගවා. යාපනීයං භගවා. ඉධ මයං භන්තෙ **කාසීසු** වස්සං වුත්ථා **රාජගහං** ආගච්ඡන්තා භගවන්තං දස්සනාය අන්තරාමග්ගෙ න ලභිම්හා ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. බහුඤ්ච ඵලඛාදනීයං අහොසි. කප්පියකාරකො ච න අහොසි. තෙන මයං කිලන්තරූපා අද්ධානං ආගතා" ති.

14. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, යත්ථ ඵලඛාදනීයං පස්සති, කප්පියකාරකො ච න හොති, සාමං ගහෙත්වා හරිත්වා කප්පිය-කාරකං[1] පස්සිත්වා භූමියං නික්ඛිපිත්වා පටිග්ගහාපෙත්වා පරිභුඤ්ජිතුං. අනුජානාමි භික්ඛවෙ, උග්ගහිතපටිග්ගහිත" න්ති[2].

15. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස බ්‍රාහ්මණස්ස නවා ච තිලා නවඤ්ච මධු උප්පන්නා හොන්ති. අථ ඛො තස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි: "යන්නූනාහං නවෙ ච තිලෙ නවං ච මධුං බුද්ධපමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස දදෙය්‍ය" න්ති. අථ ඛො සො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි[3]. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: "අධිවාසෙතු මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා" ති. අධිවාසෙසි භගවා තුණ්හී-භාවෙන. අථ ඛො සො බ්‍රාහ්මණො භගවතො අධිවාසනං විදිත්වා පක්කාමි.

16. අථ ඛො සො බ්‍රාහ්මණො තස්සා රත්තියා අච්චයෙන පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: "කාලො භො ගොතම, නිට්ඨිතං භත්ත" න්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන තස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන.

17. අථ ඛො සො බ්‍රාහ්මණො බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො තං බ්‍රාහ්මණං භගවා ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙ-ජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

18. අථ ඛො තස්ස බ්‍රාහ්මණස්ස අචිරපක්කන්තස්ස භගවතො එතදහොසි: "යෙසං ඛො මයා අත්ථාය බුද්ධපමුඛො භික්ඛුසඞ්ඝො නිමන්තිතො නවෙ ච තිලෙ නවං ච මධුං දස්සාමී" ති තෙ මයා පම්මුට්ඨා[4] දාතුං. යන්නූනාහං නවෙ ච තිලෙ නවඤ්ච මධුං කොලම්බෙහි ච ඝටෙහි ච ආරාමං ආහරා-පෙය්‍ය" න්ති[5].

1. "කප්පියකාරකෙ" ම ඡ සං. 2. "උග්ගහිතං පටිග්ගහිතුන්ති" ම ඡ සං. 3. "පටිසම්මොදි" ම ඡ සං. 4. "පමුට්ඨා" ම ඡ සං. 5. "හරාපෙය්‍යන්ති"

Free Distribution www.aathaapi.org

13. භාග්‍යවත් බුදුරජුන් විසින් ආගන්තුක භික්ෂූන් සමග මේ පිළිසඳර කතා කිරීම පුරුදු කරණ ලද්දේ ම ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, කිම ඉවසිය හැකි ද ? කිම යැපිය හැකි ද ? කිම නිදුකින් අධ්වන් මග ආවාහු ද ? මහණෙනි, තෙපි කොතැනින් එවු ද ?" යි ඒ භික්ෂූන් විචාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, ඉවසිය හැකි ය. භාග්‍යවතුන් වහන්ස, යැපිය හැකි ය. ස්වාමීනි, අපි මෙහි කාසිදනව්වෙහි වුසු වස් ඇත්තමෝ භාග්‍යවතුන් වහන්සේ දක්මට රජගහ නුවරට එන්නමෝ අතර මග දී රළු වූ හෝ මිහිරි වූ හෝ සෑහෙන පමණ බොජුන් නො ලැබීමු. බොහෝ කෑ යුතු එලවගී ද වී ය. කැපකරුවෙක් ද නො වූයේ ය. එයින් අපි ක්ලාන්තස්වභාව ඇත්තමෝ අධ්වන්මග ආවෝ වෙමු" යි.

14. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට "මහණෙනි, යම් තැනෙක කෑ යුතු එලවගී දකී ද, කැපකරුවෙක් නො වේ ද, (එය) තමන් ගෙණ ගොස් කැපකරුවෙකු දැක බිම හෙළා පිළිගන්වා ගෙණ වළඳන්නට අනුදනිමි. මහණෙනි, උග්ගහිතපටිග්ගහිතය (තමා විසින් ගත් එලාදිය වැළඳියටි වුව නැවත පිළිගන්වා ගැණීම) අනුදනිමි" යි භික්ෂූන් ඇමතූ සේක.

15. එකල්හි එක්තරා බමුණකුහට අළුත් තල ද අළුත් මීපැණි ද ලැබුනේ වේ. ඉක්බිති ඒ බමුණාහට "මම අළුත් තලත් අළුත් මී පැණිත් බුද්ධප්‍රමුඛසඞ්ඝයාට දෙන්නෙම් නම් යෙහෙකැ" යි මේ සිත් වි ය. එකල්හි ඒ බ්‍රාහමණ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය යුතුවූ සිත් ගන්නා කතා කොට නිමවා පසෙක සිටියේ ය. පසෙක සිටියා වූ ඒ බ්‍රාහමණ තෙමේ භාග්‍යවතුන් වහන්සේහට "භවත් ගෞතම තෙමේ භික්ෂුසඞ්ඝයා සමග හෙට පිණිස මාගේ බත ඉවසාවා" යි (කී ය). භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසා වදාළ සේක. එකල්හි ඒ බ්‍රාහමණ තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන නික්ම ගියේ ය.

16. ඉක්බිති ඒ බ්‍රාහමණ තෙමේ ඒ රැය ඉක්ම යැමෙන් (පසු) ප්‍රණීත වූ කෑ යුතු දෑ බිදිය යුතු දෑ පිළියෙළ කරවා "භවත් ගෞතමය, දැන් කාල ය යි. බත් නිමියේ ය" යි භාග්‍යවතුන් වහන්සේට කල් දන්වා ලී ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරොවා පා සිවුරු ගෙණ ඒ බ්‍රාහමණයාගේ ගෙට වැඩි සේක. වැඩ භික්ෂුසඞ්ඝයා සමග පැණවූ අසුනෙහි වැඩ හුන් සේක.

17. එවිට ඒ බ්‍රාහමණ තෙමේ බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයා ප්‍රණීත වූ කෑ යුතු දෙයින් බිදිය යුතු දෙයින් සියතින් සතප්වා හොඳින් වළඳවා වළඳා අවසන් කළ, පාත්‍රයෙන් බැහැර කළ අත් ඇති, භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පසෙක හුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් ඒ බ්‍රාහමණයාට දැහැමි කතාවෙන් කරුණු දක්වා සමාදන් කරවා තියුණු කරවා සතුටු කරවා හුනස්නෙන් නැගිට වැඩි සේක.

18. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවක දී ඒ බමුණාහට "අළුත්තල ද අළුත්මී ද දෙන්නෙමි යි මා විසින් යමක් පිණිස බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝ තෙමේ පවරණ ලද්දේ ද, මා විසින් ඒ දෑ දීමට සිහිපත් නො කරණ ලදී. මම අළුත්තලත් අළුත්මීපැණිත් මහසැළිවලින් ද කළවලින් ද ආරාමයට ගෙන්වා ගෙණ යන්නෙම් නම්, යෙහෙකැ" යි මේ සිත් වි ය.

19. අථ ඛො සො බ්‍රාහ්මණො නවෙ ච තිලෙ නවඤ්ච මධුං කොලම්බෙහි ච ඝටෙහි ච ආරාමං ආහරාපෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: "යෙසං ඛො මයා භො ගොතම, අත්ථාය බුද්ධපමුඛො භික්ඛුසංඝො නිමන්තිතො 'නවෙ ච තිලෙ නවඤ්ච මධුං දස්සාමී' ති, තෙ මයා පමුට්ඨා දාතුං. පතිගණ්හාතු මෙ භවං ගොතමො නවෙ ච තිලෙ නවඤ්ච මධු" න්ති. "තෙන හි බ්‍රාහ්මණ, භික්ඛූනං දෙහී" ති.

20. තෙන ඛො පන සමයෙන භික්ඛූ දුබ්භික්ඛෙ අප්පමත්තකෙපි පවාරෙන්ති. පටිසඞ්ඛාපි පටික්ඛිපන්ති. සබ්බො ච සඞ්ඝො පවාරිතො හොති. භික්ඛූ කුක්කුච්චායන්තා න පතිගණ්හන්ති. "පතිගණ්හාථ[1] භික්ඛවෙ, පරිභුඤ්ජථ. අනුජානාමි භික්ඛවෙ, තතො නීහටං භුත්තාවිනා පවාරිතෙන අනතිරිත්තං පරිභුඤ්ජිතු" න්ති.

21. තෙන ඛො පන සමයෙන ආයස්මතො **උපනන්දස්ස** සක්‍යපුත්තස්ස උපට්ඨාකකුලං සඞ්ඝස්ස අත්ථාය ඛාදනීයං පාහෙසි: "ඉදං ඛාදනීයං[2] අය්‍යස්ස උපනන්දස්ස දස්සෙත්වා සඞ්ඝස්ස දාතබ්බ" න්ති.

22. තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො ගාමං පිණ්ඩාය පවිට්ඨො හොති.

23. අථ ඛො තෙ මනුස්සා ආරාමං ගන්ත්වා භික්ඛූ පුච්ඡිංසු: "කහං භන්තෙ, අය්‍යො උපනන්දො" ති. එසාවුසො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො ගාමං පිණ්ඩාය පවිට්ඨො" ති. "ඉදං භන්තෙ ඛාදනීයං අය්‍යස්ස උපනන්දස්ස දස්සෙත්වා සඞ්ඝස්ස දාතබ්බ" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "තෙන හි භික්ඛවෙ, පටිග්ගහෙත්වා නික්ඛිපථ යාව උපනන්දො ආගච්ඡතී" ති.

24. අථ ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පුරෙභත්තං කුලානි පයිරුපාසිත්වා දිවා ආගච්ඡති.

25. තෙන ඛො පන සමයෙන භික්ඛූ දුබ්භික්ඛෙ අප්පමත්තකෙපි පවාරෙන්ති. පටිසඞ්ඛාපි පටික්ඛිපන්ති. සබ්බො ච සඞ්ඝො පවාරිතො හොති. භික්ඛූ කුක්කුච්චායන්තා න පතිගණ්හන්ති. "පතිගණ්හාථ භික්ඛවෙ, පරිභුඤ්ජථ. අනුජානාමි භික්ඛවෙ, පුරෙභත්තං පටිග්ගහිතං භුත්තාවිනා පවාරිතෙන අනතිරිත්තං පරිභුඤ්ජිතු" න්ති.

26. අථ ඛො භගවා **රාජගහෙ** යථාභිරන්තං විහරිත්වා යෙන **සාවත්ථි** තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි තදවසරි. තත්‍ර සුදං භගවා සාවත්ථියං විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

27. තෙන ඛො පන සමයෙන ආයස්මතො **සාරිපුත්තස්ස** කායඩාහාබාධො හොති.

---

1. "පටිගණ්හථ" ම ඡ සං.
2. "ඉදං ඛාදනීයං" ඉති මරම්මක්ඛරපොත්ථකෙ න දිස්සතෙ.

Free Distribution www.aathaapi.org

19. එවිට ඒ බ්‍රාහ්මණ තෙමේ අළුත්තලත් අළුත්මීපැණිත් මහ සැළිවලින් ද කළවලින් ද ආරාමයට ගෙන්වා ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියේ ය. ගොස් එකෙක සිටියේ ය. එකෙක සිටියා වූ ඒ බ්‍රාහ්මණ තෙමේ "භවත් ගෞතමයන් වහන්ස, "අළුත්තලත් අළුත් මීපැණිත් දෙන්නෙමි" යි මා විසින් යමක් පිණිස බුද්ධප්‍රමුඛභික්‍ෂුසඞ්ඝ තෙමේ පවරණ ලද්දේ ද, ඒ දෑ දීමට මා විසින් සිහි නො කරණ ලදී. භවත් ගෞතම තෙමේ මාගේ අළුත්තලත් අළුත්මීපැණිත් පිළිගණීවා" යි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය. "බ්‍රාහ්මණය, එසේ නම් භික්‍ෂූන්ට දෙව".

20. එකල්හි භික්‍ෂූහු දුර්භික්‍ෂයෙහි සුළුදෙයක් දුන් කල්හි ද පවරත්. සලකා ද ප්‍රතික්‍ෂෙප කෙරෙත්. සියලු සඞ්ඝ තෙමේ භොජන (වළඳ) පවාරණය කෙළේ වෙයි. භික්‍ෂූහු කුකුස් කරන්නෝ නො පිළිගණිත්. "මහණෙනි, පිළිගණිවු. වළඳවු. මහණෙනි, වැළඳූ තැනින් ගෙණ එන ලද අතිරිකත නො වූ ආහාරය (පඨම පවාරණා සික්ඛාපදයෙහි කී ලෙසින් අසිරිත් නො කළ ආහාරය) වළඳා අවසන් කළ පැවරූ මහණහු විසින් වළඳන්නට අනුදනිමි" යි.

21. එකල්හි ශාක්‍යපුත්‍ර වූ ආයුෂ්මත් උපනන්ද තෙරුන්ගේ උපස්ථායකකුලයක් සඞ්ඝයා පිණිස "මේ කෑ යුතු දෑ ස්වාමී වූ උපනන්ද තෙරුන්ට පෙන්වා සඞ්ඝයාට දිය යුතු ය" යි කෑමක් යැවී ය.

22. එකල්හි ශාක්‍යපුත්‍ර ආයුෂ්මත් උපනන්ද ස්ථවිර තෙමේ පිඬු පිණිස ගමට පිවිසියේ වේ.

23. ඉක්බිති ඒ මිනිස්සු ආරාමයට ගොස් "ස්වාමීනි, ස්වාමී වූ උපනන්ද ස්ථවිර තෙමේ කොහි ද" යි භික්‍ෂූන් විචාළහ. "ඇවැත්නි, මේ ශාක්‍යපුත්‍ර වූ ආයුෂ්මත් උපනන්ද ස්ථවිර තෙමේ පිඬු පිණිස ගමට පිවිසියේ" යි. "ස්වාමීනි, මේ කෑම ස්වාමී වූ උපනන්ද තෙරුන්ට පෙන්වා සඞ්ඝයාට දිය යුතු ය" යි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, එසේ නම් පිළිගෙණ උපනන්දයන් එන තුරු බහා තබවු".

24. ඉක්බිති ශාක්‍යපුත්‍ර වූ ආයුෂ්මත් උපනන්ද ස්ථවිර තෙමේ පෙරවරු කාලයෙහි කුලයන් ඇසුරු කරමින් සිට ඉතා දහවල් එයි.

25. එකල්හි භික්‍ෂූහු දුර්භික්‍ෂයෙහි සුළුදෙයක් දුන් කල්හි ද පවරත්. සලකා ද ප්‍රතික්‍ෂෙප කෙරෙත්. "සියලු සඞ්ඝ තෙමේ පැවරූයේ වේ ය" යි භික්‍ෂූහු කුකුස් කරන්නෝ නො පිළිගණිත්. "මහණෙනි, පිළිගණිවු. වළඳවු. මහණෙනි, පෙරවරුයෙහි පිළිගන්නා ලද අතිරිකත නො වූ ආහාරය වළඳා අවසන් කළ පැවරූ (=භොජන ප්‍රතික්‍ෂෙප කළ) මහණහු විසින් වළඳන්නට අනුදනිමි" යි.

26 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කැමැති තාක් වාසය කොට සැවැත්නුවර බලා චාරිකාවෙහි වැඩි සේක. පිළිවෙළින් චාරිකා කරණ සේක් සැවැත්නුවරට වැඩියහ. භාග්‍යවතුන් වහන්සේ එහි සැවැත්නුවර ජේතවනයෙහි වූ අනේපිඬුසිටුහුගේ ආරාමයෙහි වසන සේක.

27. එකල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට කායදාහ ආබාධයෙක් (කයදැවිල්ලෙක්) වේ.

28. අථ ඛො ආයස්මා **මහාමොග්ගල්ලානො** යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: "පුබ්බෙ තෙ ආවුසො සාරිපුත්ත, කායඩාහාබාධො කෙන ඵාසු හොතී" ති. "භිසෙහි ච මෙ ආවුසො මුළාලිකාහි චා" ති.

29. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං ජෙතවනෙ අන්තරහිතො **මන්දාකිනියා** පොක්ඛරණියා තීරෙ පාතුරහොසි.

30. අද්දසා ඛො අඤ්ඤතරො නාගො ආයස්මන්තං මහාමොග්ගල්ලානං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: "එතු ඛො භන්තෙ අය්‍යො මහාමොග්ගල්ලානො. ස්වාගතං භන්තෙ අය්‍යස්ස මහාමොග්ගල්ලානස්ස. කෙන භන්තෙ, අය්‍යස්ස අත්ථො ? කිං දම්මී" ති. "භිසෙහි ච මෙ ආවුසො අත්ථො මුළාලිකාහි චා" ති.

31. අථ ඛො සො නාගො අඤ්ඤතරං නාගං ආණාපෙසි: "තෙන හි භණෙ අය්‍යස්ස භිසෙ ච මුළාලිකායො ච යාවදත්ථං දෙහී" ති. අථ ඛො සො නාගො මන්දාකිනිං පොක්ඛරණිං ඔගාහෙත්වා සොණ්ඩාය භිසඤ්ච භිසමුළාලිකඤ්ච[1] අබ්බාහෙත්වා[2] සුවික්ඛාලිතං වික්ඛාලෙත්වා භණ්ඩිකං බන්ධිත්වා යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි.

32. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං මන්දාකිනියා පොක්ඛරණියා තීරෙ අන්තරහිතො ජෙතවනෙ පාතුරහොසි.

33. සොපි ඛො නාගො මන්දාකිනියා පොක්ඛරණියා තීරෙ අන්තරහිතො ජෙතවනෙ පාතුරහොසි. අථ ඛො සො නාගො ආයස්මතො මහාමොග්ගල්ලානස්ස භිසෙ ච මුළාලිකායො ච පටිග්ගහාපෙත්වා ජෙතවනෙ අන්තරහිතො මන්දාකිනියා පොක්ඛරණියා තීරෙ පාතුරහොසි.

34. අථ ඛො ආයස්මා මහාමොග්ගල්ලානො ආයස්මතො සාරිපුත්තස්ස භිසෙ ච මුළාලිකායො ච උපනාමෙසි. අථ ඛො ආයස්මතො සාරිපුත්තස්ස භිසෙ ච මුළාලිකායො ච පරිභුත්තස්ස[3] කායඩාහාබාධො පටිප්පස්සම්භි. බහූ භිසා ච මුළාලිකායො ච අවසිට්ඨා හොන්ති.

35. තෙන ඛො පන සමයෙන භික්ඛූ දුබ්භික්ඛෙ අප්පමත්තකෙපි පවාරෙන්ති. පටිසඞ්ඛාපි පටික්ඛිපන්ති. සබ්බො ච සඞ්ඝො පවාරිතො හොති. භික්ඛූ කුක්කුච්චායන්තා න පතිගණ්හන්ති. "පතිගණ්හාථ භික්ඛවෙ, පරිභුඤ්ජථ. "අනුජානාමි භික්ඛවෙ, වනට්ඨං පොක්ඛරට්ඨං භුත්තාවිනා පවාරිතෙන අනතිරිත්තං පරිභුඤ්ජිතු" න්ති.

1. "භිස මුළාලිං" සී මු.
2. "අග්ගහෙත්වා' ම නු ප. තො වි. "අබ්බාහිත්වා" ම ජ සං. 3. "භුත්තස්ස" ම ජ සං.

Free Distribution www.aathaapi.org

28. ඉක්බිති ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වෙතට එළඹියහ. එළඹ "ඇවැත්නි, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්ස, පෙර ඔබගේ කයදැවිල්ල කුමකින් පහසු වී දැ?" යි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ඇසූහ. "ඇවැත්නි, මාගේ රෝගය නෙළුම්අලයෙන් ද නෙළුම්දළියෙන් ද පහසු වී ය".

29. ඉක්බිති ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ බලවත් පුරුෂයෙක් හැකිළු අත දිගු කරන්නේ යම් සේ ද, දිගු කළ අත හකුළන්නේ යම් සේ ද, එපරිද්දෙන් ජේතවනයෙහි අතුරුදහන් වූ සේක් මන්‍දාකිනී පොකුණු ඉවුරෙහි පහළ වූ සේක.

30. එක්තරා ඇතෙක් එන්නා වූ ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ දුර දී ම දුටුයේ ය. දැක ආයුෂ්මත් මහාමෞද්ගල්‍යා-යන ස්ථවිරයන් වහන්සේට "ස්වාමීනි, ස්වාමී වූ මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ වඩින සේක්වා. ස්වාමීනි, ස්වාමී වූ මහාමෞද්ගල්‍යා-යන ස්ථවිරයන් වහන්සේගේ යහපත් පැමිණීමෙකි. ස්වාමීනි, ස්වාමීන් වහන්සේට කුමකින් ප්‍රයෝජන වේ ද, (මම) කුමක් දෙම් දැ" යි කීයේ ය. "ඇවැත්නි, මට නෙළුම්අලයෙන් ද, නෙළුම්දළියෙන් ද ප්‍රයෝජන වේ".

31. එවිට ඒ ඇත්තෙමේ එක්තරා ඇතකුට "කොල, එසේ නම් ස්වාමීන් වහන්සේට නෙළුම්අල ද නෙළුම්දළි ද සෑහෙන පමණ දෙව" යි අණ කෙළේ ය. ඉක්බිති ඒ ඇත් තෙමේ මන්‍දාකිනීපොකුණට බැස හොඬින් නෙළුම්අලද නෙළුම්දළි ද උපුටා ගෙණ මනා කොට සෝදා මිටියක් බැඳ ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ වෙතට පැමිණියේ ය.

32. ඉක්බිති ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ බලවත් පුරුෂයෙක් හැකිළු අත දිගු කරන්නේ යම් සේ ද, දිගු කළ අත හකුළන්නේ යම් සේ ද, එපරිද්දෙන් වහා මන්‍දාකිනී පොකුණු ඉවුරෙහි අතුරුදහන් වූ සේක් ජේතවනයෙහි පහළ වූ සේක.

33. ඒ ඇත් තෙමේ ද මන්‍දාකිනීපොකුණුඉවුරෙහි අතුරුදහන් ව ජේතවනයෙහි පහළ වූයේ ය. ඉක්බිති ඒ ඇත් තෙමේ ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේට නෙළුම්අල ද නෙළුම්දළි ද පිළිගන්වා ජේතවනයෙහි අතුරුදහන් ව මන්‍දාකිනීපොකුණු ඉවුරෙහි පහළ වූයේ ය.

34. ඉන් පසු ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට නෙළුම්අල ද නෙළුම්දළි ද එළවූහ. නෙළුම්අල ද නෙළුම්දළි ද වැළඳූ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ කයේ දැවිල්ල සංසිඳුනේ ය. බොහෝ නෙළුම්අල ද නෙළුම්-දළි ද ඉතිරි වි ය.

35. එකල්හි භික්ෂූහු දුර්භික්ෂයෙහි ස්වල්පමාත්‍රයක් දුන් කල්හි ද පවරත්. දැන ද ප්‍රතික්ෂෙප කෙරෙත්. සියලු සඞ්ඝ තෙමේ ද පැවරූයේ වේ. භික්ෂූහු කුකුස් කරමින් නො පිළිගණිත්. "මහණෙනි, පිළිගණිවු. වළඳවු. මහණෙනි, වළඳා අවසන් කළ මහණහු විසින් වනයෙහි හටගත් පියුම්ගසෙහි හටගත් අතිරික්ත නො වූ දෑ වළඳන්නට අනුදනිමි".

3

36. තෙන ඛො පන සමයෙන **සාවත්ථියං** බහුං ඵලඛාදනීයං උප්පන්නං[1] හොති. කප්පියකාරකො ච න හොති. භික්ඛූ කුක්කුච්චායන්තා ඵලං න පරිභුඤ්ජන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අබීජං නිබ්බට්ටබීජං[2] අකතකප්පං ඵලං පරිභුඤ්ජිතු" න්ති.

37. අථ ඛො භගවා සාවත්ථියං යථාභිරන්තං විහරිත්වා යෙන **රාජගහං** තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන රාජගහං තදවසරි. තත්‍ර සුදං භගවා රාජගහෙ විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ**.

38. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො භගන්දලාබාධො හොති. **ආකාසගොත්තො** වෙජ්ජො සත්ථකම්මං කරොති. අථ ඛො භගවා සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො යෙන තස්ස භික්ඛුනො විහාරො තෙනුපසඞ්කමි. අද්දසා ඛො ආකාසගොත්තො වෙජ්ජො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන භගවන්තං එතදවොච: "ආගච්ඡතු භවං ගොතමො, ඉමස්ස භික්ඛුනො වච්චමග්ගං පස්සතු සෙය්‍යථාපි ගොධාමුඛ" න්ති.

39. අථ ඛො භගවා "මමං[3] ඛ්වායං මොඝපුරිසො උපවණ්ණෙතී" ති තතොව පටිනිවත්තිත්වා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි: "අත්ථි[4] භික්ඛවෙ, අමුකස්මිං විහාරෙ භික්ඛු ගිලානො?" ති. "අත්ථි භගවා" ති. "කිං තස්ස භික්ඛවෙ, භික්ඛුනො ආබාධො?" ති. "තස්ස භන්තෙ ආයස්මතො භගන්දලාබාධො. ආකාසගොත්තො වෙජ්ජො සත්ථකම්මං කරොතී" ති. විගරහි බුද්ධො භගවා: "අනනුච්ඡවියං භික්ඛවෙ, තස්ස මොඝපුරිසස්ස අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම සො භික්ඛවෙ, මොඝපුරිසො සම්බාධෙ සත්ථකම්මං කාරාපෙස්සති. සම්බාධෙ භික්ඛවෙ, සුඛුමා ඡවි. දුරොපයො වණො. දුප්පරිහාරං සත්ථං. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, සම්බාධෙ සත්ථකම්මං කාරාපෙතබ්බං. යො කාරාපෙය්‍ය, ආපත්ති ථුල්ලච්චයස්සා" ති.

40. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ "භගවතා සත්ථකම්මං පටික්ඛිත්ත" න්ති වත්ථිකම්මං කාරාපෙන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ වත්ථිකම්මං කාරාපෙස්සන්තී" ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

41. "සච්චං කිර භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛූ වත්ථිකම්මං කාරාපෙන්තී" ති. "සච්චං භගවා" -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, සම්බාධස්ස සාමන්තා ද්වඞ්ගුලා සත්ථකම්මං වා වත්ථිකම්මං වා කාරාපෙතබ්බං. යො කාරාපෙය්‍ය, ආපත්ති ථුල්ලච්චයස්සා" ති.

1. "උස්සන්නං" සී මු. 2. "නිබ්බත්තබීජං" ම ඡ සං.
3. "සො මං" ම ඡ සං 4. "අත්ථි කිර" ම ඡ සං. P T S.

36. එකල්හි **සැවැත්නුවර** කැයුතු බොහෝ ඵලවගී උපන්නේ වේ. කැපකරුවෙක් ද නො වේ. භික්ෂූහු කුකුස් කරමින් ඵල නො වළඳත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මුහු කල ඇට නැත්තා වූ ද (පැල වෙන) ඇට ඉවත් කළා වූ ද කැප නො කළා වූ ඵලවගී වළඳන්නට අනුදනිමි" යි.

37. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** කැමැති තාක් කල් වාසය කොට **රජගහනුවර** බලා චාරිකාවෙහි වැඩි සේක. පිළිවෙළින් චාරිකා කරණ සේක් රජගහනුවරට වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ එහි රජගහනුවර **කලන්දකනිවාප**යෙහි වූ **වෙළුවනාරාම**යෙහි වාසය කරණ සේක.

38. එකල්හි එක්තරා මහණකුහට භගන්දරාබාධයෙක් වේ. **ආකාසගොත්ත** වෙද තෙමේ සැත්කම් (ශල්‍යකර්මයක්) කරයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සෙනාසනචාරිකාවෙහි වඩිනා සේක් ඒ මහණහුගේ විහාරයට වැඩි සේක. ආකාසගොත්ත වෙද තෙමේ වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේ දුර දී ම දුටුයේ ය. දැක "භවත් ගෞතම . තෙමේ (මෙහි) ඒවා. මේ මහණහුගේ කලගොයි කට වැනි වූ වසමග බලාවා" යි කීයේ ය.

39. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "මේ හිස් පුරුෂ තෙමේ මට විසුළු බස් බෙණේ ය" යි එයින් ම පෙරළා අවුත් මේ නිදානයෙහි මේ කාරණයෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා "මහණෙනි, අසුවල් වෙහෙර ගිලන් මහණෙක් ඇත්තේ ද" යි භික්ෂූන් විචාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, ඇත්තේ ය." "මහණෙනි, ඒ මහණහුගේ රෝගය කුමක් ද ?" "ස්වාමීනි, ඒ ආයුෂමතුන් හට භගන්දරාබාධයෙකි. ආකාසගොත්ත වෙද තෙමේ ශල්‍යකර්ම කෙරෙයි." භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ගැරහූ සේක. "මහණෙනි, ඒ හිස් පුරුෂයාගේ ක්‍රියාව නො ගැලපෙන්නෙක. අනුලොම් නො වූවෙක. නුසුදුස්සෙක. මහණකමට නො හොබනේ ය. අකැප වූවෙක. නො කටයුත්තෙක. මහණෙනි, ඒ හිස් පුරුෂ තෙමේ කෙසේ නම් සම්බාධ ස්ථානයෙහි (වස මග පස මග අතර) ශල්‍යකර්ම කරවී ද ? මහණෙනි, ලිඞ්ගප්‍රදෙශයෙහි සිවිය සියුම් ය. වණය සුව කරණු අපහසු ය. ආයුධය ක්‍රියා කරවීම දුෂ්කර ය. මහණෙනි, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ ය" යි -පෙ- ගරහා දැහැමි කතා කොට "මහණෙනි, ලිඞ්ගප්‍රදෙශයෙහි ශල්‍යකර්ම නො කරවිය යුතු ය. යමෙක් කරවන්නේ නම්, ථුලසිඇවැත් වේ ය" යි වදාළ සේක.

40. එකල්හි සවගමහණෝ "භාග්‍යවතුන් වහන්සේ විසින් ශල්‍යකර්මය ප්‍රතික්ෂෙප කරණ ලදැ" යි වස්තිකර්මය කරවත්. අල්පෙච්ඡ වූ යම් ඒ භික්ෂූහු වෙත් ද, ඒ භික්ෂූහු "සවගමහණෝ කෙසේ නම් වස්තිකර්ම කරවත් දැ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්. එකල්හි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ.

41. "මහණෙනි, සවගමහණෝ වස්තිකර්ම කරවත් ල යනු සැබෑ ද ?" "භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය." -පෙ- ගරහා දැහැමි කතා කොට "මහණෙනි, ලිඞ්ගප්‍රදෙශය හාත්පස දඟුලකින් ඇතුළත ශල්‍යකර්මය ද (සම්බාධයෙහි) වස්තිකර්මය (වස්තිපීඩනය) ද නො කරවිය යුතු ය. යමෙක් කරවා නම්, ථුලසිඇවැත් වේ ය" යි වදාළ සේක.

42. අථ ඛො භගවා **රාජගහෙ** යථාභිරන්තං විහරිත්වා යෙන **බාරාණසී** තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන බාරාණසී තදවසරි. තත්‍ර සුදං භගවා බාරාණසියං විහරති **ඉසිපතනෙ මිගදායෙ**.

43. තෙන ඛො පන සමයෙන බාරාණසියං **සුප්පියො** ච උපාසකො **සුප්පියා** ච උපාසිකා උභො පසන්නා[1] හොන්ති දායකා කාරකා සඞ්ඝුපට්ඨාකා. අථ ඛො සුප්පියා උපාසිකා ආරාමං ගන්ත්වා විහාරෙන විහාරං පරිවෙණෙන පරිවෙණං උපසඞ්කමිත්වා භික්ඛූ පුච්ඡති: "කො භන්තෙ ගිලානො, කස්ස කිං ආහරීයතූ" ති.

44. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙන භික්ඛුනා විරෙචනං පීතං හොති. අථ ඛො සො භික්ඛු සුප්පියං උපාසිකං එතදවොච: "මයා ඛො භගිනි, විරෙචනං පීතං. අත්ථො මෙ පටිච්ඡාදනීයෙනා" ති. "සුට්ඨු අය්‍ය, ආහරීයිස්සතී" ති. ඝරං ගන්ත්වා අන්තෙවාසිං ආණාපෙසි: "ගච්ඡ භණෙ, පවත්තමංසං ජානාහී" ති. "එවං අය්‍යෙ" ති ඛො සො පුරිසො සුප්පියාය උපාසිකාය පටිස්සුත්වා කෙවලකප්පං **බාරාණසිං** ආහිණ්ඩන්තො න අද්දස පවත්තමංසං. අථ ඛො සො පුරිසො යෙන සුප්පියා උපාසිකා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සුප්පියං උපාසිකං එතදවොච: "නත්ථය්‍යෙ පවත්තමංසං. මාඝාතො අජ්ජා" ති.

45. අථ ඛො සුප්පියාය උපාසිකාය එතදහොසි: "තස්ස ඛො ගිලානස්ස භික්ඛුනො පටිච්ඡාදනීයං අලභන්තස්ස ආබාධො වා අභිවඩ්ඪිස්සති. කාලකිරියා වා භවිස්සති. න ඛො මෙ තං පතිරූපං, යාහං පටිස්සුත්වා න හරාපෙය්‍ය" න්ති. පොත්ථනිකං ගහෙත්වා ඌරුමංසං උක්කන්තිත්වා දාසියා අදාසි: "හන්ද ජෙ ඉමං මංසං සම්පාදෙත්වා, අමුකස්මිං විහාරෙ භික්ඛු ගිලානො, තස්ස දජ්ජෙහි[2]. යො ච මං පුච්ඡති, ගිලානාති පටිවෙදෙහී" ති උත්තරාසඞ්ගෙන ඌරුං පවෙඨෙත්වා[3] ඔවරකං පවිසිත්වා මඤ්චකෙ නිපජ්ජි.

46. අථ ඛො සුප්පියො උපාසකො ඝරං ගන්ත්වා දාසිං පුච්ඡි: "කහං සුප්පියා" ති. "එසය්‍ය[4] ඔවරකෙ නිපන්නා" ති. අථ ඛො සුප්පියො උපාසකො යෙන සුප්පියා උපාසිකා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සුප්පියං උපාසිකං එතදවොච: "කිස්ස නිපන්නාසී" ති. ගිලානම්හී"ති[5]. "කින්තෙ ආබාධො" ති. අථ ඛො සුප්පියා උපාසිකා සුප්පියස්ස උපාසකස්ස එතමත්ථං ආරොචෙසි.

47. අථ ඛො සුප්පියො උපාසකො "අච්ඡරියං වත භො! අබ්භුතං වත භො! යාවසද්ධායං සුප්පියා පසන්නා, යත්‍ර හි නාම අත්තනොපි මංසානි පරිච්චත්තානි, කිම්පනිමාය[6] අඤ්ඤං කිඤ්චි අදෙය්‍යං භවිස්සතී" ති හට්ඨො උදග්ගො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

1. "උභතො පසන්නා" ම ඡ සං. P T S. අ වි. තො වි.
2. "දජ්ජාසි" ම ඡ සං. 3. "වෙඨෙත්වා" ම ඡ සං. 4. "එසාය්‍ය" ම ඡ සං.
5. "ගිලානාම්හීති" ම ඡ සං. 6. "කිම්පිමාය" ම ඡ සං. තො වි.

Free Distribution www.aathaapi.org

42. එකල්හි භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** කැමැති තාක් කල් වාසය කොට **බරණැස්නුවර** බලා චාරිකාවෙහි වැඩි සේක. පිළිවෙළින් චාරිකා කරණ සේක් බරණැස් නුවරට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ එහි බරණැස්නුවර **මෘගදාය** නම් වූ **ඉසිපතනාරාම**යෙහි වසන සේක.

43. එකල්හි බරණැස් නුවර **සුප්පියඋපාසක** තෙමේ ද **සුප්පියා උපාසිකා** තොමෝ ද යන දෙදෙන පැහැදුනෝ වෙත්. දායකයෝ වෙත්. කාරකයෝ වෙත්. සඞ්ඝොපස්ථායකයෝ වෙත්. එකල්හි සුප්පියාඋපාසිකා තොමෝ ආරාමයට ගොස් වෙහෙරෙන් වෙහෙරට පිරිවෙණෙන් පිරිවෙණට එළඹ "ස්වාමීනි, කවරෙක් ගිලන් වේ ද? කවරකුට කුමක් ගෙණෙනු යුතු ද" යි භික්ෂූන් අතින් විචාරයි.

44. එකල්හි එක්තරා මහණකු විසින් විරෙචන බෙහෙතක් බොන ලද්දේ වේ. ඉක්බිති ඒ මහණ තෙමේ "බුහුනනිය, මා විසින් විරෙචන බෙහෙතක් බොන ලදී. මට මස්රසයෙන් ප්‍රයෝජන වේ" යි සුප්පියා උපාසිකාවට කී ය. "ආර්‍ය්‍යයන් වහන්ස, හොඳ යි. ගෙණෙනු **ලබන්නේය** " යි ගෙට ගොස් අතැවැසියකුට "සගය, යව. කඩපිලෙහි විකිණීමට තැබූ මස් දනුව" යි අණ කළා ය. "ආර්‍ය්‍යාවෙනි, එසේ ය" යි ඒ පුරුෂතෙමේ සුප්පියාඋපාසිකාවට පිළිවදන් දී ගොස් මුළු බරණැස ඇවිදින්නේ කඩපිලෙහි විකිණීමට තැබූ මසක් නො දුටුයේ ය. ඉක්බිති ඒ පුරුෂ තෙමේ සුප්පියාඋපාසිකාව වෙතට ගියේ ය. ගොස් "ආර්‍ය්‍යාවෙනි, කඩපිලෙහි විකිණීමට තැබූ මසක් නැත්තේ ය. අද මාඝාත ය" (සතුන් මැරීම තහනම් ය) යි සුප්පියාඋපාසිකාවට දැන්වී ය.

45. එවිට සුප්පියාඋපාසිකාවට "මස්රසය නො ලබන ඒ ගිලන් මහණහුගේ රොගය හෝ වැඩෙන්නේ ය. කලුරිය කිරීම හෝ වන්නේ ය. මම යමක් දීමට පොරොන්දු දී එය නො යවන්නෙම් නම්, එය මට නුසුදුසු ය" යි මෙබඳු සිතෙක් වී ය. මස් කපන කැත්ත ගෙණ කලවා මස් කපා "කෙල්ල, මේ මස පිස සකස් කොට, අසවල් වෙහෙර ගිලන් මහණෙක් වේ. ඒ මහණහුට දෙව" යි දාසියට දුන්නී ය. "යමෙක් මා ගැණ විචාරා නම්, ගිලන් වූවා යි කියව" යි උතුරුසළුවෙන් කලවය වෙළා ගෙණ ඔවරකයට (නිදනගෙට) ඇතුල් ව ඇඳෙහි හොත්තා ය.

46. ඉක්බිති සුප්පියඋපාසක තෙමේ ගෙට ගොස් "සුප්පියාව කොහි දැ"යි දාසිය විචාළේ ය. "ආර්‍ය්‍යය, නිදනගෙයි හෝනී ය". එවිට සුප්පියඋපාසක තෙමේ සුප්පියාඋපාසිකාව වෙතට ගියේ ය. ගොස් "කුමක් හෙයින් හෝනිහි දැ" යි සුප්පියාඋපාසිකාවගෙන් ඇසී ය. "මම ගිලන්මි". "තිගේ ආබාධය කුමක් ද?" එවිට සුප්පියාඋපාසිකා තොමෝ සුප්පිය-උපාසකයාහට මේ කාරණය කී ය.

47. ඉක්බිති සුප්පියඋපාසක තෙමේ "භවත්නි, අරුමයක! භවත්නි, පෙර නො වූවෙක! මේ සුප්පියාඋපාසිකාතොමෝ නිරවශෙෂයෙන් ශ්‍රද්ධාවත් ය. නිරවශෙෂයෙන් ප්‍රසන්න ය. තමන්ගේ ම මස් මෙසේ පරිත්‍යාග කරණ ලද නම්, මැය විසින් නො දිය හැකි වූ අන් කුමක් වන්නේ දැ" යි සතුටු වූයේ ඔදවැඩියේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය.

48. එකමන්තං නිසින්නො ඛො සුප්පියො උපාසකො භගවන්තං එතදවොච: "අධිවාසෙතු මෙ භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා" ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො සුප්පියො උපාසකො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

49. අථ ඛො සුප්පියො උපාසකො තස්සා රත්තියා අච්චයෙන පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: "කාලො භන්තෙ, නිට්ඨිතං භත්ත" න්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන සුප්පියස්ස උපාසකස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන.

50. අථ ඛො සුප්පියො උපාසකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො සුප්පියං උපාසකං භගවා එතදවොච: "කහං සුප්පියා" ති. "ගිලානා භගවා" ති. "තෙන හි ආගච්ඡතූ" ති. "න භගවා උස්සහතී" ති. "තෙන හි පරිග්ගහෙත්වාපි ආනෙථා" ති. අථ ඛො සුප්පියො උපාසකො සුප්පියං උපාසිකං පරිග්ගහෙත්වා ආනෙසි. තස්සා සහදස්සනෙන භගවතො තාව මහාවණො රූළ්හො අහොසි සුච්ඡවි ලොමජාතො.

51. අථ ඛො සුප්පියො ච උපාසකො සුප්පියා ච උපාසිකා "අච්ඡරියං වත භො! අබ්භූතං වත භො! තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා, යත්‍ර හි නාම සහදස්සනෙන භගවතො තාව මහාවණො රූළ්හො භවිස්සති සුච්ඡවි ලොමජාතො" ති හට්ඨා උදග්ගා බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදිංසු. අථ ඛො භගවා සුප්පියං ච උපාසකං සුප්පියං ච උපාසිකං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

52. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි: "කො භික්ඛවෙ, සුප්පියං උපාසිකං මංසං විඤ්ඤාපෙසී" ති. එවං වුත්තෙ සො භික්ඛු භගවන්තං එතදවොච: "අහං ඛො භන්තෙ සුප්පියං උපාසිකං මංසං විඤ්ඤාපෙසි" න්ති. "ආහරියිත්ථ භික්ඛූ" ති. "ආහරියිත්ථ භගවා" ති. "පරිභුඤ්ජි ත්වං භික්ඛූ" ති. "පරිභුඤ්ජාහං[1] භගවා" ති. "පටිවෙක්ඛි ත්වං භික්ඛූ" ති. "නාහං භගවා පටිවෙක්ඛි" න්ති.

53. විගරහි බුද්ධො භගවා -පෙ- "කථං හි නාම ත්වං මොඝපුරිස, අප්පටිවෙක්ඛිත්වා මංසං පරිභුඤ්ජිස්සසි. මනුස්සමංසං ඛො තයා මොඝපුරිස, පරිභුත්තං. නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "සන්ති භික්ඛවෙ, මනුස්සා සද්ධා පසන්නා. තෙහි අත්තනොපි මංසානි පරිච්චත්තානි. න භික්ඛවෙ, මනුස්සමංසං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති ථුල්ලච්චයස්ස. න ච භික්ඛවෙ, අප්පටිවෙක්ඛිත්වා මංසං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

1. "පරිභුඤ්ජාමහං" ම ඡ සං.

Free Distribution www.aathaapi.org

48. පසෙක හුන් සුප්පියඋපාසක තෙමේ "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා සමග හෙටට මාගේ බත ඉවසා වදාරණ සේක්වා" යි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේ ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූ සේක. ඉක්බිති සුප්පියඋපාසක තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට නික්ම ගියේ ය.

49. ඉක්බිති සුප්පියඋපාසක තෙමේ ඒ රැය ඉක්ම යෑමෙන් පසු ප්‍රණීත වූ කෑ යුතු දෙය බිදිය යුතු දෙය පිළියෙල කරවා "ස්වාමීනි, දැන් මේ කාල ය යි, බත නිමියේ ය" යි භාග්‍යවතුන් වහන්සේට සැලකරවී ය. එවිට භාග්‍යවතුන් වහන්සේ පෙරවරුකාලයෙහි හැඳ පොරොවා පා සිවුරු ගෙණ සුප්පියඋපාසකයාගේ ගෙට වැඩි සේක. වැඩ භික්ෂුසඞ්ඝයා සමග පැණවූ අසුනෙහි හුන් සේක.

50. ඉක්බිති සුප්පියඋපාසක තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක සිටියේ ය. භාග්‍යවතුන් වහන්සේ පසෙක සිටි සුප්පිය උපාසකයාගෙන් "සුප්පියාව කොහි දැ" යි අසා වදාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, (ඕ තොමෝ) ගිලන් වූවා ය" යි. "එසේ නම් මෙහි ඒවා" යි. "භාග්‍යවතුන් වහන්ස, නො හැකිය". "එසේ නම් ඔසොවා ගෙණ එවු" යි. ඉක්බිති සුප්පියඋපාසක තෙමේ සුප්පියාඋපාසිකාව ඔසොවා ගෙණායේ ය. භාග්‍යවතුන් වහන්සේගේ දැකීම සමග ම ඇගේ ඒ මහත් වූ වණය ගොඩ වී මනා සිවි ඇත්තේ වි ය. ලොම් හටගත්තේ වි ය.

51. එවිට සුප්පියඋපාසක තෙමේ ද සුප්පියාඋපාසිකා තොමෝ ද "භාග්‍යවතුන්ගේ දැකීම සමග එපමණ මහත් වූ වණය ගොඩ වූයේ මනා සිවි ඇත්තේ හටගත් ලොම් ඇත්තේ වී නම්, තථාගතයන් වහන්සේගේ ඒ මහත් සෘද්ධි ඇති බව මහත් අනුභාව ඇති බව, භවත්නි, අරුමයකි! භවත්නි, පුදුමයකි!" යි සතුටු වූවෝ ඔද වැඩියාහු බුද්ධප්‍රමුඛ භික්ෂුසඞ්ඝයා ප්‍රණීත වූ කෑ යුතු දෙයින් බිදිය යුතු දෙයින් සියතින් සතප්වා පවරා, වළඳා අවසන් කළ පාත්‍රයෙන් බැහැර කළ අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙත පසෙක හුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සුප්පියඋපාසකයා ද සුප්පියාඋපාසිකාව ද දැහැමි කතාවෙන් කරුණු දක්වා සමාදන් කරවා තියුණු කරවා සතුටු කරවා හුනස්නෙන් නැගිට වැඩි සේක.

52. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදනයෙහි මේ කරුණෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා "මහණෙනි, කවරෙක් සුප්පියාඋපාසිකාව මස් විණවූයේ දැ" යි භික්ෂූන් විචාළ සේක. මෙසේ විචාළ කල්හි ඒ මහණ තෙමේ "ස්වාමීනි, මම සුප්පියා උපාසිකාව මස් විණ වූ (ඉල්ලූ)යෙමි" යි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේ ය. "මහණ, ගෙණෙනු ලැබී ද ?" "භාග්‍යවතුන් වහන්ස, ගෙණෙනු ලැබී ය". "මහණ, තෝ වැළඳූයෙහි ද ?" "භාග්‍යවතුන් වහන්ස, මම වැළඳූයෙමි". "මහණ තෝ 'කිනම් මසක් දැ' යි විචාළෙහි (විමසුවෙහි) ද ?" "භාග්‍යවතුන් වහන්ස, මම නො විමසුවෙමි".

53. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ගැරහූ සේක. "හිස් පුරුෂය, තෝ කෙසේ නම් නො විචාරා (පරීක්ෂා නො කොට) මස් වැළඳූයෙහි ද? හිස් පුරුෂය, තා විසින් වළඳන ලද්දේ මනුෂ්‍යමාංසයෙකි. හිස් පුරුෂය මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ" යි -පෙ- ගරහා දැහැමි කතා කොට "මහණෙනි, ශ්‍රද්ධාවත් වූ ප්‍රසන්න වූ මනුෂ්‍යයෝ වෙති. ඔවුන් විසින් තමන්ගේ මස් ද පුදන ලද්දේ ය. මහණෙනි, මිනිස් මස් නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, ථුල්ලච්චය වෙත් වේ" යි භික්ෂූන් ට වදාළ සේක. "මහණෙනි, නො විචාරා මස් නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

54. තෙන ඛො පන සමයෙන රඤ්ඤො හත්ථී මරන්ති. මනුස්සා දුබ්භික්ඛෙ හත්ථිමංසං පරිභුඤ්ජන්ති. භික්ඛූනං පිණ්ඩාය චරන්තානං හත්ථිමංසං දෙන්ති. භික්ඛූ හත්ථිමංසං පරිභුඤ්ජන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා හත්ථිමංසං පරිභුඤ්ජිස්සන්ති. රාජඞ්ගං හත්ථී. සචෙ රාජා ජානෙය්‍ය, න තෙසං[1] අත්තමනො අස්සා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, හත්ථිමංසං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

55. තෙන ඛො පන සමයෙන රඤ්ඤො අස්සා මරන්ති. මනුස්සා දුබ්භික්ඛෙ අස්සමංසං පරිභුඤ්ජන්ති. භික්ඛූනං පිණ්ඩාය චරන්තානං අස්සමංසං දෙන්ති. භික්ඛූ අස්සමංසං පරිභුඤ්ජන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා අස්සමංසං පරිභුඤ්ජිස්සන්ති. රාජඞ්ගං අස්සා. සචෙ රාජා ජානෙය්‍ය, න තෙසං අත්තමනො අස්සා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, අස්සමංසං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

56. තෙන ඛො පන සමයෙන මනුස්සා දුබ්භික්ඛෙ සුනඛමංසං පරිභුඤ්ජන්ති. භික්ඛූනං පිණ්ඩාය චරන්තානං සුනඛමංසං දෙන්ති. භික්ඛූ සුනඛමංසං පරිභුඤ්ජන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා සුනඛමංසං පරිභුඤ්ජිස්සන්ති. ජෙගුච්ඡො සුනඛො පටිකූලො" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, සුනඛමංසං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

57. තෙන ඛො පන සමයෙන මනුස්සා දුබ්භික්ඛෙ අහිමංසං පරිභුඤ්ජන්ති. භික්ඛූනං පිණ්ඩාය චරන්තානං අහිමංසං දෙන්ති. භික්ඛූ අහිමංසං පරිභුඤ්ජන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා අහිමංසං පරිභුඤ්ජිස්සන්ති. ජෙගුච්ඡො අහි පටිකූලො" ති.

58. **සුඵස්සොපි**[2] නාගරාජා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සුඵස්සො නාගරාජා භගවන්තං එතදවොච: "සන්ති හි[3] භන්තෙ, නාගා අස්සද්ධා අප්පසන්නා. තෙ අප්පමත්තකෙහිපි භික්ඛූ විහෙඨෙය්‍යුං. සාධු භන්තෙ අය්‍යා අහිමංසං න පරිභුඤ්ජෙය්‍යු" න්ති.

59. අථ ඛො භගවා සුඵස්සං නාගරාජානං ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි. අථ ඛො සුඵස්සො නාගරාජා භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

60. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, අහිමංසං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

1. "තෙසං" ම ජ සං.
2. "සුපස්සොපි" ම ඡ සං. P T S. 3. "සන්ති" ම ඡ සං. P T S.

54. එකල්හි රජ්ජුගේ ඇත්තු මැරෙත්. මිනිස්සු දුර්භික්ෂයෙහි ඇත් මස් අනුභව කරත්. පිඬු සිඟා හැසිරෙණ භික්ෂූන්ට ඇත්මස් දෙත්. භික්ෂූහු ඇත්මස් වළඳත්. මිනිස්සු "ශාක්‍යපුත්‍රීය වූ ශ්‍රමණයෝ කෙසේ නම් ඇත්මස් වළඳත් ද? ඇත් තෙමේ රජ්ජුගේ සෙනා අවයවයෙකි. රජ තෙමේ දන්නේ නම්, ඔවුන්ට සතුටු සිත් ඇත්තේ නො වන්නේය" යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, ඇත්මස් නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

55. එකල්හි රජ්ජුගේ අශ්වයෝ මැරෙත්. මිනිස්සු දුර්භික්ෂයෙහි අශ්ව-මාංස අනුභව කරත්. පිඬු සිඟා හැසිරෙණ භික්ෂූන්ට අශ්වමාංස දෙත්. භික්ෂූහු අශ්වමාංස වළඳත්. මිනිස්සු "ශාක්‍යපුත්‍රීය වූ ශ්‍රමණයෝ කෙසේ නම් අශ්වමාංස වළඳත් ද? අශ්වයෝ රජ්ජුගේ සේනා අවයවයෙකි. රජ තෙමේ දන්නේ නම්, ඔවුන්ට සතුටු සිත් ඇත්තේ නො වන්නේ ය" යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, අශ්වමාංස නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

56. එකල්හි මිනිස්සු දුර්භික්ෂයෙහි බලුමස් අනුභව කරත්. පිඬු සිඟා හැසිරෙණ භික්ෂූන්ට බලුමස් දෙත්. භික්ෂූහු බලුමස් වළඳත්. මිනිස්සු "ශාක්‍යපුත්‍රීය වූ ශ්‍රමණයෝ කෙසේ නම් බලුමස් වළඳත් ද? බලු තෙමේ නින්දිත ය. පිළිකුල් ය" යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දෙස් කියත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, බලුමස් නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

57. එකල්හි මිනිස්සු දුර්භික්ෂයෙහි සර්පමාංස අනුභව කරත්. පිඬු සිඟා හැසිරෙණ භික්ෂූන්ට සර්පමාංස දෙත්. භික්ෂූහු සර්පමාංස වළඳත්. මිනිස්සු "ශාක්‍යපුත්‍රීය වූ ශ්‍රමණයෝ කෙසේ නම් සර්පමාංස වළඳත් ද? සර්පයා හිරිකිත ය. පිළිකුල් ය" යි අවමන් කෙරෙත්. නිඳා කෙරෙත්. දෙස් කියත්.

58. සුඑස්ස නාරජ තෙමේ ද භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක සිටියේ ය. පසෙක සිටියා වූ සුඑස්ස නාරජ තෙමේ "ස්වාමීනි, ශ්‍රද්ධා නැති නො පහන් නාගයෝ ඇත්තාහ. ඔහු ස්වල්පයකින්දු භික්ෂූන් පෙළන්නාහු ය. ස්වාමීනි, ආයුෂ්මතුන් වහන්සේලා සර්පමාංස නො වළඳන්නාහු නම්, යෙහෙකැ" යි භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළේ ය.

59. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සුඑස්ස නාරජු දැහැමි කතාවෙන් කරුණු දක්වූ සේක. සමාදන් කරවූ සේක. තියුණු කරවූ සේක. සතුටු කරවූ සේක. ඉක්බිති සුඑස්ස නාරජ තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කතාවෙන් කරුණු දක්වන ලද්දේ සමාදන් කරවන ලද්දේ තියුණු කරවන ලද්දේ සතුටු කරවන ලද්දේ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට නික්ම ගියේ ය.

60. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, සර්පමාංස නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

61. තෙන ඛො පන සමයෙන ලුද්දකා සීහං හන්ත්වා සීහමංසං පරිභුඤ්ජන්ති. භික්ඛූනං පිණ්ඩාය චරන්තානං සීහමංසං දෙන්ති. භික්ඛූ සීහමංසං පරිභුඤ්ජිත්වා අරඤ්ඤෙ විහරන්ති. සීහා මංසගන්ධෙන[1] භික්ඛූ පරිපාතෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, සීහමංසං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

62. තෙන ඛො පන සමයෙන ලුද්දකා ව්‍යග්ඝං හන්ත්වා ව්‍යග්ඝ මංසං පරිභුඤ්ජන්ති. භික්ඛූනං පිණ්ඩාය චරන්තානං ව්‍යග්ඝමංසං දෙන්ති. භික්ඛූ ව්‍යග්ඝමංසං පරිභුඤ්ජිත්වා අරඤ්ඤෙ විහරන්ති. ව්‍යග්ඝා මංසගන්ධෙන[2] භික්ඛූ පරිපාතෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, ව්‍යග්ඝමංසං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

63. තෙන ඛො පන සමයෙන ලුද්දකා දීපිං හන්ත්වා දීපිමංසං පරිභුඤ්ජන්ති. භික්ඛූනං පිණ්ඩාය චරන්තානං දීපිමංසං දෙන්ති. භික්ඛූ දීපිමංසං පරිභුඤ්ජිත්වා අරඤ්ඤෙ විහරන්ති. දීපී මංසගන්ධෙන[3] භික්ඛූ පරිපාතෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ දීපිමංසං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

64. තෙන ඛො පන සමයෙන ලුද්දකා අච්ඡං හන්ත්වා අච්ඡමංසං පරිභුඤ්ජන්ති. භික්ඛූනං පිණ්ඩාය චරන්තානං අච්ඡමංසං දෙන්ති. භික්ඛූ අච්ඡමංසං පරිභුඤ්ජිත්වා අරඤ්ඤෙ විහරන්ති. අච්ඡා මංසගන්ධෙන[4] භික්ඛූ පරිපාතෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, අච්ඡමංසං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

65. තෙන ඛො පන සමයෙන ලුද්දකා තරච්ඡං හන්ත්වා තරච්ඡමංසං පරිභුඤ්ජන්ති. භික්ඛූනං පිණ්ඩාය චරන්තානං තරච්ඡමංසං දෙන්ති. භික්ඛූ තරච්ඡමංසං පරිභුඤ්ජිත්වා අරඤ්ඤෙ විහරන්ති. තරච්ඡා මංසගන්ධෙන[5] භික්ඛූ පරිපාතෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, තරච්ඡමංසං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති.

සුප්පියභාණවාරො දුතියො.

---

1. "සීහමංසගන්ධෙන" ම ඡ සං.
2. "ව්‍යග්ඝමංසගන්ධෙන" ,,
3. "දිපිමංසගන්ධෙන" ම ඡ සං.
4. "අච්ඡමංසගන්ධෙන" ,,
5. "තරච්ඡමංසගන්ධෙන" ම ඡ සං

Free Distribution www.aathaapi.org

61. එකල්හි වැද්දෝ සිංහයන් මරා සිංහමස් අනුභව කරත්. පිඬු සිඟා හැසිරෙණ භික්‍ෂූන්ට සිංහමස් දෙත්. භික්‍ෂූහු සිංහමස් වළඳා වනයෙහි වෙසෙත්. සිංහයෝ මස්ගඳින් භික්‍ෂූන් නසත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, සිංහමස් නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

62. එකල්හි වැද්දෝ ව්‍යාඝ්‍රයන් නසා ව්‍යාඝ්‍රමස් අනුභව කරත්. පිඬු සිඟා හැසිරෙණ භික්‍ෂූන්ට ව්‍යාඝ්‍රමස් දෙත්. භික්‍ෂූහු ව්‍යාඝ්‍රමස් වළඳා වනයෙහි වෙසෙත්. ව්‍යාඝ්‍රයෝ මස්ගඳින් භික්‍ෂූන් නසත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, ව්‍යාඝ්‍රමස් නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

63. එකල්හි වැද්දෝ දිවියන් නසා දිවිමස් අනුභව කරත්. පිඬු සිඟා හැසිරෙණ භික්‍ෂූන්ට දිවිමස් දෙත්. භික්‍ෂූහු දිවිමස් වළඳා වනයෙහි වෙසෙත්. දිවියෝ මස්ගඳින් භික්‍ෂූන් නසත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, දිවිමස් නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

64. එකල්හි වැද්දෝ වලසුන් නසා වලස්මස් අනුභව කරත්. පිඬු සිඟා හැසිරෙණ භික්‍ෂූන්ට වලස්මස් දෙත්. භික්‍ෂූහු වලස්මස් වළඳා වනයෙහි වෙසෙත්. වලස්සු මස්ගඳින් භික්‍ෂූන් නසත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, වලස්මස් නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

65. එකල්හි වැද්දෝ කරබානාවලසුන් නසා කරබානාවලස්මස් අනුභව කරත්. පිඬු සිඟා හැසිරෙණ භික්‍ෂූන්ට කරබානාවලස්මස් දෙත්. භික්‍ෂූහු කරබානාවලස්මස් වළඳා වනයෙහි වෙසෙත්. කරබානා වලස්සු මස්ගඳින් භික්‍ෂූන් නසත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, කරබානාවලස්මස් නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි.

**දෙවන සුපපියබණවර.**

---

1. අථ ඛො භගවා **බාරාණසියං** යථාභිරන්තං විහරිත්වා යෙන **අන්ධකවින්දං** තෙන චාරිකං පක්කාමි මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪ-තෙළසෙහි භික්ඛුසතෙහි.

2. තෙන ඛො පන සමයෙන ජානපදා මනුස්සා බහුං ලොණම්පි තෙලම්පි තණ්ඩුලම්පි ඛාදනීයම්පි සකටෙසු ආරොපෙත්වා බුද්ධප්පමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධා[1] හොන්ති "යදා පටිපාටිං ලභිස්සාම, තදා භත්තං කරිස්සාමා" ති. පඤ්චමත්තානි ච විඝාසාදසතානි.

3. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන අන්ධකවින්දං තදවසරි. අථ ඛො අඤ්ඤතරස්ස බ්‍රාහ්මණස්ස පටිපාටිං අලභන්තස්ස එතදහොසි: "අධිකානි[2] ඛො මෙ ද්වෙ මාසානි බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං අනුබන්ධන්තස්ස 'යදා පටිපාටිං ලභිස්සාමි, තදා භත්තං කරිස්සාමී' ති. න ච මෙ පටිපාටි ලබ්භති. අහඤ්චම්හි එකකො[3]. බහු ච මෙ ඝරාවාසත්ථො හායති. යන්නූනාහං භත්තග්ගං ඔලොකෙය්‍යං, යං භත්තග්ගෙ නාස්ස, තං පටියාදෙය්‍ය" න්ති. අථ ඛො සො බ්‍රාහ්මණො භත්තග්ගං ඔලොකෙන්තො ද්වෙ නාද්දස: යාගුඤ්ච මධුගොළකඤ්ච.

4. අථ ඛො සො බ්‍රාහ්මණො යෙනායස්මා **ආනන්දො**, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතදවොච: "ඉධ මෙ භො ආනන්ද, පටිපාටිං අලභන්තස්ස එතදහොසි: 'අධිකානි ඛො මෙ ද්වෙ මාසානි බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං අනුබන්ධන්තස්ස 'යදා පටිපාටිං ලභිස්සාමි තදා භත්තං කරිස්සාමී' ති. න ච මෙ පටිපාටි ලබ්භති. අහඤ්චම්හි එකකො. බහු ච මෙ ඝරාවාසත්ථො හායති. යන්නූනාහං භත්තග්ගං ඔලොකෙය්‍යං, 'යං භත්තග්ගෙ නාස්ස තං පටියාදෙය්‍ය' න්ති සො ඛො අහං භො ආනන්ද, භත්තග්ගං ඔලොකෙන්තො ද්වෙ නාද්දසං: යාගුඤ්ච මධුගොළකඤ්ච. සචාහං භො ආනන්ද, පටියාදෙය්‍යං යාගුඤ්ච මධුගොළකඤ්ච, පටිග්ගණ්හෙය්‍ය මෙ භවං ගොතමො" ති. "තෙන හි බ්‍රාහ්මණ, භගවන්තං පටිපුච්ඡිස්සාමී" ති.

5. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි. "තෙනහානන්ද, පටියාදෙතූ" ති. "තෙන හි බ්‍රාහ්මණ, පටියාදෙහී" ති. අථ ඛො සො බ්‍රාහ්මණො තස්සා රත්තියා අච්චයෙන පහූතං යාගුඤ්ච මධුගොළකඤ්ච පටියාදාපෙත්වා භගවතො උපනාමෙසි: "පටිග්ගණ්හාතු මෙ භවං ගොතමො යාගුඤ්ච මධුගොළකඤ්චා" ති. "තෙන හි බ්‍රාහ්මණ, භික්ඛූනං දෙහී" ති. භික්ඛූ කුක්කුච්චායන්තා න පටිග්ගණ්හන්ති. "පටිග්ගණ්හථ භික්ඛවෙ, පරිභුඤ්ජථා" ති.

6. අථ ඛො සො බ්‍රාහ්මණො බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං පහූතාය යාගුයා ච මධුගොළකෙන ච සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං ධොතහත්ථං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො තං බ්‍රාහ්මණං භගවා එතදවොච: "දස ඉමෙ බ්‍රාහ්මණ, ආනිසංසා යාගුයා,[4] යාගුං දෙන්තො ආයුං දෙති. වණ්ණං දෙති. සුඛං දෙති. බලං දෙති. පටිභාණං දෙති. යාගු පීතා ඛුදං[5] පටිහනති[6]. පිපාසං පටිවිනෙති[7]. වාතං අනුලොමෙති. වත්ථිං සොධෙති. ආමාවසෙසං පාචෙති. ඉමෙ ඛො බ්‍රාහ්මණ, දසානිසංසා යාගුයා" ති.

1. "අනුබන්ධා" සී මු. ම ඡ සං. 2. "අතීතානි" ම ඡ සං. P T S.
3. "එකත්ථො" ම ඡ සං. 4 "කතමෙ දස" ම ඡ සං. P T S.
5. "ඛුද්දං" ම ඡ සං. 6. "පටිහන්ති" ම ඡ සං. P T S. 7. "විනෙති" ම ඡ සං.

1. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බරණැස්නුවර කැමැති තාක් කල් වාසය කොට **අන්ධකවින්දය** බලා **එක්දහස්දෙසියපණසක්** වූ මහත් භික්ෂුසඞ්ඝයා සමග චාරිකාවෙහි වැඩි සේක.

2. එකල්හි දනවුවැසි මිනිස්සු බොහෝ ලුණු ද තෙල් ද සහල් ද කෑ යුතු දෙය ද ගැල්වල නගා "යම් විටෙක පිළිවෙළ වාරය ලබන්නෙමු ද එවිට බත් පිළියෙල කරන්නෙමු" යි බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයාගේ පිටිපස ලුහු බැඳ ගියාහු වෙත්. පන්සියයක් පමණ ඉඳුල් කන්නෝ ( සිඟන්නෝ) ද (මේ පිරිස හා) ගියහ.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් චාරිකා කරණ සේක් අන්ධකවින්දයට වැඩි සේක. එකල්හි (බත්) පිළිවෙළ වාරය නො ලබන්නා වූ එක්තරා බමුණකුහට "යම් විටෙක පිළිවෙළ වාරය ලබන්නෙම් ද, එවිට බත් පිළියෙල කරන්නෙමි යි බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයා ලුහු බඳනා මට දෙමසකට වැඩියක් ඉක්ම ගියේ ය. මාහට බත් පිළිවෙළ වාරය නො ලැබේ. මම ද තනි වූයෙමි. මාගේ බොහෝ වූ ද ගෘහවාසය පිළිබඳ කටයුතු පිරිහෙයි. මම බත්හල බලන්නෙම් නම් යෙහෙක. බත්හලෙහි යමක් නො වන්නේ ද, එය පිළියෙල කරන්නෙමි" යි මෙබඳු සිතක් උපන. එවිට ඒ බ්‍රාහ්මණ තෙමේ බත්හල බලන්නේ දෙකක් - කැඳත් මීපිඬුත් නො දුටුයේ ය.

4. ඉක්බිති ඒ බ්‍රාහ්මණ තෙමේ ආයුෂ්මත් **ආනන්ද** තෙරුන් වෙත ගියේ ය. ගොස් "පින්වත් ආනන්දස්ථවිරයන් වහන්ස, බත්වාරය නො ලබන්නා වූ 'යම් විටෙක බත් වාරය ලබන්නෙම් ද, එවිට බත් පිළියෙල කරන්නෙමි' යි බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයා ලුහු බඳනා මට දෙමසකට වැඩියක් ඉක්ම ගියේ ය. මාහට බත්වාරය නො ලැබේ. මම ද තනි වූයෙමි. මාගේ බොහෝ වූ ගෘහවාසය පිළිබඳ කටයුතු පිරිහෙයි. මම බත්හල බලන්නෙම් නම් යෙහෙක. බත්හලෙහි යමක් නො වන්නේ ද, එය පිළියෙල කරන්නෙමි' යි මෙබඳු සිතක් උපන. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, ඒ මම බත්හල බලන්නෙම් කැඳත් මීපිඬුත් යන දෙක නො දුටුයෙමි. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මම කැඳත් මීපිඬුත් පිළියෙල කරන්නෙම් නම්, භවත් ගෞතම තෙමේ මාගේ කැඳ හා මීපිඬු පිළිගන්නේ ද" යි ආයුෂ්මත් ආනන්ද තෙරුන්ගෙන් විචාළේ ය. "බ්‍රාහ්මණය, එසේ නම් භාග්‍යවතුන් වහන්සේගෙන් විචාරන්නෙමි"යි.

5. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "ආනන්දය, එසේ නම් පිළියෙල කෙරේවා" යි. "බ්‍රාහ්මණය, එසේ නම් පිළියෙල කරව" යි. ඉක්බිති ඒ බ්‍රාහ්මණ තෙමේ ඒ රැය ඉක්ම යැමෙන් පසු බොහෝ වූ කැඳත් මීපිඬුත් පිළියෙල කරවා "පින්වත් ගෞතම තෙමේ මාගේ කැඳත් මීපිඬුත් පිළිගණීවා" යි භාග්‍යවතුන් වහන්සේ වෙත එළවී ය. "බ්‍රාහ්මණය, එසේ නම් භික්ෂූන්ට දෙව"යි. භික්ෂූහු කුකුස් කරන්නෝ නො පිළිගණිත්. "මහණෙනි, පිළිගණිවු. වළඳවු" යි.

6. නැවැත ඒ බ්‍රාහ්මණ තෙමේ බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයා බොහෝ වූ කැඳින් ද මීපිඬුවෙන් ද සියතින් සතප්වා වළඳවා, සේදූ අත් ඇති පාත්‍රයෙන් බැහැර කළ අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙත පසෙක හුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් ඒ බමුණාට "බ්‍රාහ්මණය, කැඳෙහි මේ ආනිසංස දසයෙක් වේ: කැඳ දෙන්නේ ආයුෂ දෙයි. වර්‍ණය දෙයි. සැපය දෙයි. බලය දෙයි. නුවණ දෙයි. පානය කළ කැඳ බඩගිනි නසයි. පිපාසාව දුරු කෙරෙයි. වාතය අනුලොම් කරයි. වස්තිය පිරිසිදු කරයි. නො පැසී ශෙෂ වූ ආහාරය පැසවයි. බ්‍රාහ්මණය, කැඳෙහි මේ ආනිසංස දසය" යි වදාළ සේක.

7. යො සඤ්ඤතානං පරදත්තභොජිනං
කාලෙන සක්කච්ච දදාති යාගුං,
දසස්ස ඨානානි අනුප්පවෙච්ඡති
ආයුඤ්ච වණ්ණඤ්ච සුඛං බලඤ්ච.

8. පටිභාණමස්ස උපජායතෙ තතො
ඛුද්දං පිපාසං[1] ව්‍යපනෙති වාතං,
සොධෙති වත්ථිං පරිණාමෙති භුත්තං[2]
භෙසජ්ජමෙතං සුගතෙන වණ්ණිතං.

9. තස්මා හි යාගුං අලමෙව දාතුං
නිච්චං මනුස්සෙන සුඛත්ථිකෙන,
දිබ්බානි වා පත්ථයතා[3] සුඛානි
මනුස්සසොභග්‍යතමිච්ඡතා[4] වාති.

10. අථ ඛො භගවා තං බ්‍රාහ්මණං ඉමාහි ගාථාහි අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො භගවා එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: ''අනුජානාමි භික්ඛවෙ, යාගුඤ්ච මධුගොළකඤ්චා''ති.

11. අස්සොසුං ඛො මනුස්සා ''භගවතා කිර භික්ඛූනං[5] යාගු අනුඤ්ඤාතා මධුගොළකඤ්චා'' ති. තෙ කාලස්සෙව භොජ්ජයාගුං පටියාදෙන්ති මධුගොළකඤ්ච. භික්ඛූ කාලස්සෙව භොජ්ජාය යාගුයා[6] ධාතා මධුගොළකෙන ච භත්තග්ගෙ න චිත්තරූපං භුඤ්ජන්ති.[7]

12. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙන තරුණප්පසන්නෙන[8] මහාමත්තෙන ස්වාතනාය බුද්ධප්පමුඛො භික්ඛුසඞ්ඝො නිමන්තිතො හොති. අථ ඛො තස්ස තරුණප්පසන්නස්ස මහාමත්තස්ස එතදහොසි: ''යන්නූනාහං අඩ්ඪතෙළසන්නං භික්ඛුසතානං අඩ්ඪතෙළසානි මංසපාතිසතානි පටියාදෙය්‍යං, එකමෙකස්ස භික්ඛුනො එකමෙකං මංසපාතිං උපනාමෙය්‍ය'' න්ති. අථ ඛො සො තරුණප්පසන්නො මහාමත්තො තස්සා රත්තියා අච්චයෙන පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා අඩ්ඪතෙළසානි ච මංසපාතිසතානි භගවතො කාලං ආරොචාපෙසි: ''කාලො භන්තෙ, නිට්ඨිතං භත්ත'' න්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන තස්ස තරුණප්පසන්නස්ස මහාමත්තස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන.

13. අථ ඛො සො තරුණප්පසන්නො මහාමත්තො භත්තග්ගෙ භික්ඛූ පරිවිසති. භික්ඛූ එවමාහංසු: ''ථොකං ආවුසො දෙහී'' ති. ''මා ඛො තුම්හෙ භන්තෙ, 'අයං තරුණප්පසන්නො මහාමත්තො' ති ථොකං ථොකං පතිගණ්හිත්ථ[9]. බහුං මෙ ඛාදනීයං භොජනීයං පටියත්තං අඩ්ඪතෙළසානි[10] මංසපාතිසතානි. එකමෙකං මංසපාතිං උපනාමෙස්සාමි[11]. පතිගණ්හථ භන්තෙ යාවදත්ථ'' න්ති. ''න ඛො මයං ආවුසො එතංකාරණා ථොකං ථොකං පතිගණ්හාම. අපි ච මයං කාලස්සෙව භොජ්ජාය යාගුයා ධාතා මධුගොළකෙන ච. තෙන මයං ථොකං ථොකං පතිගණ්හාමා'' ති.

1. ''පිපාසඤ්ච'' ම ඡ සං. PTS 2. ''භත්තං'' ම ඡ සං. ජ වි තො වි. ම නු ප තො වි.
3. ''පත්ථයතං'' - 4. ''ඉච්ඡිතං'' අට්ඨකථා.
5. ''භගවතා කිර යාගු'' ම ඡ සං 6 ''භොජ්ජයාගුයා'' ම ඡ සං. PTS.
7 ''පරිභුඤ්ජන්ති'' ම ඡ සං 8. ''තරුණපසන්නෙන'' ම ඡ සං.
9 ''පතිගණ්හථ'' ම ඡ සං. PTS. 10 ''අඩ්ඪතෙලසානි ච'' ම ඡ සං
11. ''උපනාමෙස්සාමීති'' ම ඡ සං. තො වි.

7. යමෙක් කායසංයමාදියෙන් යුත් අනුන් විසින් දුන්දෙය වළඳනසුලුවූවන්ට සුදුසු කාලයෙහි සකස් කොට කැඳ දේ ද, හෙතෙමේ ඔහුට අනුසස් (කරුණු) දසයක් දෙයි. ආයුෂය ද වර්ණය ද සැපය ද බලය ද (දෙයි.)

8. ඔහුට එයින් නුවණ උපදියි. (කැඳ) බඩසය හා පවස ද දුරු කෙරෙයි. වාතය දුරු කෙරෙයි. වස්තිය ශුද්ධ කෙරෙයි. වැළඳූදය දිරවයි. මේ බුදුරජුන් විසින් වර්ණිනා කරණ ලද බෙහෙතකි.

9. එබැවින් සුව කැමැති වූ දිව්‍යසම්පත් හෝ පතන්නාවූ මනුෂ්‍ය සම්පත් හෝ කැමැත්තා වූ මිනිසා විසින් නිති කැඳ දන් දීම සුදුසු වේ ම ය.

10. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ බමුණාට මේ ගාථාවන්ගෙන් අනුමෝදන් කොට හුනස්නෙන් නැඟී වැඩි සේක. අනතුරු ව භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූ සේක: “මහණෙනි, කැඳත් මීපිඩුත් අනුදනිමි” යි.

11. මිනිස්සු “භාග්‍යවතුන් වහන්සේ විසින් කැඳත් මීපිඩුත් අනුදන්නා ලදැ” යි ඇසූහ. ඔහු බුදිනකැඳ ද මීපිඩු ද උදෑසන ම පිළියෙල කෙරෙත්. භික්ෂූහු කලින් ම බුදිනකැඳින් ද මීපිඩුවෙන් ද තෘප්ත වූවෝ බත් (බොජුන්)හලෙහි දී සිත් සේ බත් නො වළඳත්.

12. එකල්හි එක්තරා අළුත පැහැදුනු මහඇමතියකු විසින් බුද්ධප්‍රමුඛ භික්ෂුසඞ්ඝ තෙමේ පවරණ ලද්දේ වේ. ඉක්බිති අළුත පැහැදුනු ඒ මහ ඇමතියාහට “මම එක්දහස්දෙසියපණසක් භික්ෂූන්ට එක්දහස්දෙසිය පණසක් මස්තලි පිළියෙල කරන්නෙම් නම්, එක එක මහණනුට එක එක මස්තලිය එළවන්නෙම් නම්, යෙහෙකැ” යි සිත් වි ය. ඉක්බිති අළුත පැහැදුනු ඒ මහඇමති තෙමේ ඒ රැය ඉක්ම යැමෙන් පසු ප්‍රණීත වූ කෑ යුතු දෑ බිදිය යුතු දෑ එක්දහස්දෙසියපණසක් මස්තලි ද පිළියෙල කරවා “සවාමීනි, මේ කාලය යි. බත් නිමියේ ” යි භාග්‍යවතුන් වහන්සේට කල් දැන්වී ය. එවිට භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරොවා පා සිවුරු ගෙණ අළුත පැහැදුනු ඒ මහඇමතියාගේ ගෙට වැඩි සේක. වැඩ භික්ෂුසඞ්ඝයා සමග පැණ වූ අසුනෙහි වැඩ හුන් සේක.

13. ඉක්බිති අළුත පැහැදුනු ඒ මහඇමති තෙමේ බත්හලෙහි භික්ෂූන් වළඳවයි. භික්ෂූහු “ඇවැත්නි, ටිකක් දෙව. ඇවැත, ටිකක් දෙව” යි මෙසේ කීහ. “සවාමීනි, නුඹ වහන්සේලා ‘මේ තෙමේ අළුත පැහැදුනු මහඇමතියෙකැ’ යි ටික ටික නො පිළිගන්නා සේක්වා. මා විසින් බොහෝ කෑ යුතු දෙය ද බිදිය යුතු දෙය ද පිළියෙල කරණ ලද්දේ ය. එක්දහස් දෙසියපණසක් මස්තලි එක එක එළවන්නෙමි. සවාමීනි, සෑහෙන පමණ පිළිගන්නා සේක්වා. “ඇවැත්නි. මේ කරුණෙන් අපි ටික ටික පිළිගන්නමෝ නො වෙමු. අපි උදෑසන ම භොජ්ජයාගුවෙන් ද මීපිඩුවෙන් ද සෑහුනෝ වම්හ. එහෙයින් අපි ටික ටික පිළිගණිමු”යි.

14. අථ ඛො සො තරුණප්පසන්නො මහාමත්තො උජ්ඣායති, ඛීයති, විපාචෙති: "කථං හි නාම භදන්තා මයා නිමන්තිතා අඤ්ඤස්ස භොජ්ජයාගුං පරිභුඤ්ජිස්සන්ති. න චාහං පටිබලො යාවදත්ථං දාතු'' න්ති කුපිතො අනත්තමනො ආසාදනාපෙක්ඛො භික්ඛූනං පත්තෙ පූරෙන්තො ආගමාසි "භුඤ්ජථ වා. හරථ වා'' ති.

15. අථ ඛො සො තරුණප්පසන්නො මහාමත්තො බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො තං තරුණප්පසන්නං මහාමත්තං භගවා ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

16. අථ ඛො තස්ස තරුණප්පසන්නස්ස මහාමත්තස්ස අචිරපක්කන්තස්ස භගවතො අහුදෙව කුක්කුච්චං. අහු විප්පටිසාරො: "අලාභා වත මෙ, න වත මෙ ලාභා, දුල්ලද්ධං වත මෙ, න වත මෙ සුලද්ධං, යොහං කුපිතො අනත්තමනො ආසාදනාපෙක්ඛො භික්ඛූනං පත්තෙ පූරෙන්තො අගමාසිං 'භුඤ්ජථ වා හරථ වා' ති. කින්නු ඛො මයා බහුං පසුතං පුඤ්ඤං වා අපුඤ්ඤං වා ?'' ති.

17. අථ ඛො සො තරුණප්පසන්නො මහාමත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො තරුණප්පසන්නො මහාමත්තො භගවන්තං එතදවොච: "ඉධ මය්හං භන්තෙ අචිරපක්කන්තස්ස භගවතො අහුදෙව කුක්කුච්චං. අහු විප්පටිසාරො: 'අලාභා වත මෙ, න වත මෙ ලාභා, දුල්ලද්ධං වත මෙ, න වත මෙ සුලද්ධං, යොහං කුපිතො අනත්තමනො ආසාදනාපෙක්ඛො භික්ඛූනං පත්තෙ පූරෙන්තො අගමාසිං 'භුඤ්ජථ වා හරථ වා' ති. කින්නු ඛො මයා බහුං පසුතං පුඤ්ඤං වා අපුඤ්ඤං වා ?'' ති. කින්නු ඛො මයා භන්තෙ බහුං පසුතං පුඤ්ඤං වා අපුඤ්ඤං වා ?'' ති. "යදග්ගෙන තයා ආවුසො, ස්වාතනාය බුද්ධපමුඛො භික්ඛුසඞ්ඝො නිමන්තිතො, තදග්ගෙන තෙ බහුං පුඤ්ඤං පසුතං. යදග්ගෙන තෙ එකමෙකෙන භික්ඛුනා එකමෙකං සිත්ථං පටිග්ගහිතං, තදග්ගෙන තෙ බහුං පුඤ්ඤං පසුතං. සග්ගා තෙ ආරද්ධා'' ති.

18. අථ ඛො සො තරුණප්පසන්නො මහාමත්තො "ලාභා කිර මෙ. සුලද්ධං කිර මෙ. බහුං කිර මයා පුඤ්ඤං පසුතං. සග්ගා කිර මෙ ආරද්ධා''ති හට්ඨො උදග්ගො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි: "සච්චං කිර භික්ඛවෙ භික්ඛූ අඤ්ඤත්‍ර නිමන්තිතා අඤ්ඤස්ස භොජ්ජයාගුං පරිභුඤ්ජන්තී'' ති. "සච්චං භගවා''ති. විගරහි බුද්ධො භගවා: "කථං හි නාම තෙ භික්ඛවෙ, මොඝපුරිසා අඤ්ඤත්‍ර නිමන්තිතා අඤ්ඤස්ස භොජ්ජයාගුං පරිභුඤ්ජිස්සන්ති. නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය'' -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, අඤ්ඤත්‍ර නිමන්තිතෙන අඤ්ඤස්ස භොජ්ජයාගු පරිභුඤ්ජිතබ්බා. යො පරිභුඤ්ජෙය්‍ය, යථා ධම්මො කාරෙතබ්බො'' ති.

Free Distribution www.aathaapi.org

14. ඉක්බිති තුරුණුපහත් ඒ මහඇමති තෙමේ "කෙසේ නම් ස්වාමීන් වහන්සේලා මා විසින් පවරණ ලද්දෝ අන්‍යයකුගේ බුදිනකැඳ වැළඳූහු ද ? මම සෑහෙන පමණ දෙන්නට අපොහොසත් වෙම් දැ" යි අවමන් කෙරෙයි. නින්දා කෙරෙයි. දොස් කියයි. (මෙසේ) කිපියේ නො සතුටු සිත් ඇත්තේ චෝදනාවෙන් පෙළනු කැමැත්තේ "වළඳවු, නැතහොත් ගෙණ යවු" යි භික්ෂූන්ගේ පාත්‍ර පුරවමින් ගියේ ය.

15. ඉක්බිති තුරුණුපහත් ඒ මහඇමති තෙමේ බුද්ධප්‍රමුඛභික්ෂු සංඝයා ප්‍රණීත වූ කෑ යුතු දෙයින් ද බිදිය යුතු දෙයින් ද සියතින් සතප්වා වළඳවා, වළඳා අවසන් කළ පාත්‍රයෙන් බැහැර කළ අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙත පසෙක හුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් තුරුණුපහත් ඒ මහඇමතියා දැහැමි කතාවෙන් කරුණු දක්වා සමාදන් කරවා තියුණු කරවා සතුටු කරවා හුනස්නෙන් නැගිට වැඩි සේක.

16. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වැඩ නො බෝ වේලාවක දී තුරුණුපහත් ඒ මහඇමතියාහට "ඒ මම කිපියෙම් නො සතුටු සිත් ඇත්තෙම් චෝදනා කරණු කැමැත්තෙම් 'වළඳවු, නැතහොත් ගෙණ යවු' යි භික්ෂූන්ගේ පාත්‍ර පුරවමින් ගියෙම් ද, ඒ මාහට අලාභ ය. මාහට ලාභයෙක් නො වේ. මා විසින් අයහපතක් ලද්දේ ය. මා විසින් යහපතක් නො ලද්දේ ය. කිමෙක් ද, මා විසින් බොහෝ කුසල් හෝ අකුසල් හෝ රැස් කරණ ලද්දේ දැ?" යි කුකුසෙක් වූයේ ය. විපිළිසරෙක් වූයේ ය.

17. ඉක්බිති තුරුණුපහත් ඒ මහඇමති තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් තුරුණුපහත් ඒ මහඇමති තෙමේ "ස්වාමීනි, මෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩ නො බෝ වේලාවකින් මට - 'යම්සේ මම කිපියෙම් නො සතුටු සිත් ඇත්තෙම් නින්දා කිරීම බලාපොරොත්තු වන්නෙම් 'වළඳවු, නැත් නම් ගෙණ යවු' යි භික්ෂූන්ගේ පාත්‍ර පුරවමින් ගියෙම් ද, ඒ මාහට අලාභ ය. මාහට ලාභයෙක් නො වේ. මා විසින් අයහපතක් ලද්දේ ය. මා විසින් යහපතක් නො ලද්දේ ය. කිමෙක් ද, මා විසින් බොහෝ කුසල් හෝ අකුසල් හෝ රැස් කරණ ලද්දේ දැ ?' යි කුකුසෙක් වූයේ ය. විපිළිසරෙක් වූයේ ය. "ස්වාමීනි, කිම මා විසින් බොහෝ පින් හෝ පව් හෝ රැස් කරණ ලද දැ ?" යි විචාළේ ය. ඇවැත, යම් දිනෙක පටන් තා විසින් හෙටට බුද්ධප්‍රමුඛ භික්ෂුසඞ්ඝ තෙමේ පවරණ ලද්දේ ද, එදින පටන් තා විසින් බොහෝ පින් රැස් කරණ ලද්දේ ය. යම් වේලක පටන් එක එක මහණහු විසින් තොපගේ එක එක බත්තුළ පිළිගත්තා ලද්දේ ද, එවේලෙහි පටන් තොප විසින් බොහෝ පින් රැස් කරණ ලද්දේ ය. තොප විසින් ස්වර්ගයෝ සතුටු කරණ ලද්දාහ" යි.

18. ඉක්බිති තුරුණුපහත් ඒ මහඇමති තෙමේ "මට ලාභයෙක් ල. මා විසින් මොනවට ලද්දේ ල. මා විසින් බොහෝ පින් රැස් කරණ ලද්දේ ල. මා විසින් ස්වර්ගයෝ සතුටු කරණ ලද්දෝ ල" යි සතුටු වූයේ ඔදවැඩියේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට නික්ම ගියේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා "මහණෙනි, අන් තැනක පවරණ ලද්දෝ අනෙකකුගේ බුදිනකැඳ වළඳත් ල යනු සැබෑ දැ" යි භික්ෂූන් විචාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය". භාග්‍යවත් බුදුරජානන් වහන්සේ "මහණෙනි, කෙසේ නම් ඒ හිස් පුරුෂයෝ අන් තැනක පවරණ (ආරාධනා) ලද්දෝ අන්‍යයකුගේ බුදිනකැඳ **වැළඳුවාහුදැයි** ගැරහූ සේක. "මහණෙනි, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ" යි -පෙ- ගරහා දැහැමි කතා කොට "මහණෙනි, අන් තැනක පවරණ ලද්දහු විසින්, අනෙකකුගේ බුදිනකැඳ නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, ඇවැත් පරිදි කර විය යුතු ය" යි වදාළ සේක.

19. අථ ඛො භගවා **අන්ධකවින්දෙ** යථාභිරන්තං විහරිත්වා යෙන **රාජගහං** තෙන චාරිකං පක්කාමි මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි.

20. තෙන ඛො පන සමයෙන **බෙලට්ඨො කච්චානො** රාජගහා අන්ධකවින්දං අද්ධානමග්ගප්පටිපන්නො හොති පඤ්චමත්තෙහි සකටසතෙහි සබ්බෙහෙව ගුළකුම්භපූරෙහි. අද්දසා ඛො භගවා බෙලට්ඨං කච්චානං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන මග්ගා ඔක්කම්ම අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසීදි.

21. අථ ඛො **බෙලට්ඨො කච්චානො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො බෙලට්ඨො කච්චානො භගවන්තං එතදවොච: “ඉච්ඡාමහං භන්තෙ එකමෙකස්ස භික්ඛුනො එකමෙකං ගුළකුම්භං දාතු” න්ති. “තෙන හි ත්වං කච්චාන, එකංයෙව ගුළකුම්භං ආහරා” ති. “එවං භන්තෙ” ති ඛො බෙලට්ඨො කච්චානො භගවතො පටිස්සුත්වා එකංයෙව ගුළකුම්භං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: “ආභතො[1] භන්තෙ, ගුළකුම්භො. කථාහං භන්තෙ, පටිපජ්ජාමී” ති. “තෙන හි ත්වං කච්චාන, භික්ඛූනං ගුළං දෙහී” ති. “එවං භන්තෙ” ති ඛො බෙලට්ඨො කච්චානො භගවතො පටිස්සුත්වා භික්ඛූනං ගුළං දත්වා භගවන්තං එතදවොච: “දින්නො භන්තෙ, භික්ඛූනං ගුළො. බහු චායං ගුළො අවසිට්ඨො. කථාහං භන්තෙ, පටිපජ්ජාමී” ති. “තෙන හි ත්වං කච්චාන, භික්ඛූනං ගුළං යාවදත්ථං දෙහී” ති. “එවං භන්තෙ” ති ඛො බෙලට්ඨො කච්චානො භගවතො පටිස්සුත්වා භික්ඛූනං ගුළං යාවදත්ථං දත්වා භගවන්තං එතදවොච: “දින්නො භන්තෙ, භික්ඛූනං ගුළො යාවදත්ථො. බහු චායං ගුළො අවසිට්ඨො. කථාහං භන්තෙ, පටිපජ්ජාමී” ති. “තෙන හි ත්වං කච්චාන, භික්ඛූ ගුළෙහි සන්තප්පෙහී” ති. “එවං භන්තෙ” ති ඛො බෙලට්ඨො කච්චානො භගවතො පටිස්සුත්වා භික්ඛූ ගුළෙහි සන්තප්පෙසි. එකච්චෙ භික්ඛූ පත්තෙපි පූරෙසුං. පරිස්සාවනානිපි ථවිකායොපි පූරෙසුං.

22. අථ ඛො බෙලට්ඨො කච්චානො භික්ඛූ ගුළෙහි සන්තප්පෙත්වා භගවන්තං එතදවොච: “සන්තප්පිතා භන්තෙ භික්ඛූ ගුළෙහි. බහු චායං ගුළො අවසිට්ඨො. කථාහං භන්තෙ, පටිපජ්ජාමී” ති. “තෙන හි ත්වං කච්චාන විඝාසාදානං ගුළං දෙහී” ති. “එවං භන්තෙ” ති ඛො බෙලට්ඨො කච්චානො භගවතො පටිස්සුත්වා විඝාසාදානං ගුළං දත්වා භගවන්තං එතදවොච: “දින්නො භන්තෙ, විඝාසාදානං ගුළො. බහු චායං ගුළො අවසිට්ඨො. කථාහං භන්තෙ, පටිපජ්ජාමී” ති. “තෙන හි ත්වං කච්චාන, විඝාසාදානං ගුළං යාවදත්ථං දෙහී” ති “එවං භන්තෙ” ති ඛො බෙලට්ඨො කච්චානො භගවතො පටිස්සුත්වා විඝාසාදානං ගුළං යාවදත්ථං දත්වා භගවන්තං එතදවොච: “දින්නො භන්තෙ, විඝාසාදානං ගුළො යාවදත්ථො. බහු චායං ගුළො අවසිට්ඨො. කථාහං භන්තෙ, පටිපජ්ජාමී” ති. “තෙන හි ත්වං කච්චාන, විඝාසාදෙ ගුළෙහි සන්තප්පෙහී” ති. “එවං භන්තෙ” ති ඛො බෙලට්ඨො කච්චානො භගවතො පටිස්සුත්වා විඝාසාදෙ ගුළෙහි සන්තප්පෙසි. එකච්චෙ විඝාසාදා කොළම්බෙපි ඝටෙපි පූරෙසුං. පිටකානිපි උච්ඡඞ්ගෙපි පූරෙසුං.

1. “ආභතො” ම ඡ සං.

19. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අන්ධකවින්දයෙහි කැමැති තාක් වාසය කොට භික්ෂූන්එක් දහස් දෙසිය පණසක් වූ මහාභික්ෂුසඞ්ඝයා සමග රජගහනුවර බලා චාරිකාවෙහි වැඩි සේක.

20. එකල්හි බෙලට්ඨකච්චාන තෙමේ රජගහනුවරින් අන්ධකවින්දය බලා උක්හකුරුකළවලින් ම පිරුණු පන්සියයක් පමණ ගැල් සමග දීඝීමාර්ගයට පිළිපන්නේ වේ. භාග්‍යවතුන් වහන්සේ එන්නා වූ බෙලට්ඨකච්චානයා දුර දීම දුටු සේක. දැක මාර්ගයෙන් ඉවත් ව එක්තරා ගසක් මුල වැඩ හුන් සේක.

21. එවිට බෙලට්ඨකච්චාන තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක සිටියේ ය. පසෙක සිටියා වූ බෙලට්ඨකච්චාන තෙමේ "සවාමීනි, මම එක එක මහණහුට එක එක උක්සකුරුකළයක් දීමට කැමැත්තෙමි" යි භාග්‍යවතුන් වහන්සේට සැලකෙළේ ය. "කච්චානය, එසේ නම්, තෝ එක ම උක්හකුරු කළයක් ගෙණ එව." "සවාමීනි, එසේ ය" යි බෙලට්ඨකච්චාන තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී එක ම උක්හකුරුකළයක් ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ "සවාමීනි, උක්හකුරු කළයක් ගෙණ එන ලද්දේ ය. සවාමීනි, මම කෙසේ පිළිපදිම් දැ" යි භාග්‍යවතුන් වහන්සේට සැලකෙළේ ය. "කච්චානය, එසේ නම්, තෝ භික්ෂූන්ට උක්හකුරු දෙව". "සවාමීනි එසේ ය" යි බෙලට්ඨකච්චාන තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී භික්ෂූන්ට උක්හකුරු දී "සවාමීනි, භික්ෂූන්ට උක්හකුරු දෙන ලද්දේ ය. මේ බොහෝ උක්හකුරු ඉතිරි වූයේ ය. සවාමීනි, මම කුමක් කරම් දැ" යි භාග්‍යවතුන් වහන්සේට සැළකෙළේ ය. "කච්චානය, එසේ නම්, තෝ භික්ෂූන්ට උක්හකුරු සෑහෙන පමණ දෙව". "සවාමීනි, එසේ ය" යි බෙලට්ඨකච්චාන තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී, භික්ෂූන්ට සෑහෙන පමණ උක්හකුරු දී "සවාමීනි, භික්ෂූන්ට සෑහෙන පමණ උක්හකුරු දෙන ලද්දේ ය. මේ බොහෝ උක්හකුරු ඉතිරි වූයේ ය. සවාමීනි, මම කුමක් කරම් දැ" යි භාග්‍යවතුන් වහන්සේට සැලකෙළේ ය. "කච්චානය, එසේ නම්, තෝ භික්ෂූන් උක්හකුරු වලින් සතප්පව". "සවාමීනි එසේ ය" යි බෙලට්ඨකච්චාන තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී භික්ෂූන් උක්හකුරුවලින් සැතැප්වී ය. ඇතැම් භික්ෂූහු පාත්‍ර ද පිරවූහ. පෙරහන් ද පසුම්බි ද පිරවූහ.

22. ඉක්බිති බෙලට්ඨකච්චාන තෙමේ භික්ෂූන් උක්හකුරුවලින් සතප්වා "සවාමීනි, භික්ෂූහු උක්හකුරුවලින් සතප්පන ලද්දාහු ය. මේ බොහෝ උක්හකුරු ඉතිරි වූයේ ය. සවාමීනි මම කුමක් කරම් දැ" යි භාග්‍යවතුන් වහන්සේට සැලකෙළේ ය. "කච්චානය එසේ නම්, තෝ ඉඳුල් කන්නන්ට (යාචකයන්ට) උක්හකුරු දෙව". "සවාමීනි, එසේ ය" යි බෙලට්ඨකච්චාන තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී යාචකයන්ට උක්හකුරු දී "සවාමීනි, යාචකයන්ට උක්හකුරු දෙන ලද්දේ ය. මේ බොහෝ උක්හකුරු ඉතිරි වූයේ ය. සවාමීනි, මම කුමක් කරම් දැ" යි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසී ය. "කච්චානය, එසේ නම්, තෝ යාචකයන්ට උක්හකුරු සෑහෙන පමණ දෙව." "සවාමීනි, එසේ ය" යි බෙලට්ඨකච්චාන තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී යාචකයන්ට උක්හකුරු සෑහෙන පමණ දී "සවාමීනි, යාචකයන්ට උක්හකුරු සෑහෙන පමණ දෙන ලද්දේ ය. මේ බොහෝ උක් හකුරු ඉතිරි වූයේ ය. සවාමීනි, මම කුමක් කරම් දැ" යි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසී ය. "කච්චානය, එසේ නම් තෝ යාචකයන් උක්හකුරුවලින් සතප්පව". "සවාමීනි, එසේ ය" යි බෙලට්ඨකච්චාන තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී යාචකයන් උක්හකුරුවලින් සැතැප්වී ය. ඇතැම් යාචකයෝ මහසැළි ද කළ ද පැස් ද පුරවාගත්හ. ඔඩොක්කු ද පුරවාගත්හ.

23. අථ ඛො **බෙලට්ඨො කච්චානො** විසාසාදෙ ගුළෙහි සන්තප්පෙත්වා භගවන්තං එතදවොච: "සන්තප්පිතා භන්තෙ විසාසාදා ගුළෙහි. බහු චායං ගුළො අවසිට්ඨො. කථාහං භන්තෙ පටිපජ්ජාමී" ති. "නාහං තං කච්චාන, පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යස්සසො ගුළො[1] පරිභුත්තො සම්මා පරිණාමං ගච්ඡෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතස්ස වා තථාගතසාවකස්ස වා. තෙන හි ත්වං කච්චාන, තං ගුළං අප්පහරිතෙ වා ඡඩ්ඩෙහි. අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙහී" ති. "එවං භන්තෙ" ති ඛො බෙලට්ඨො කච්චානො භගවතො පටිස්සුත්වා තං ගුළං අප්පාණකෙ උදකෙ ඔපිලාපෙසි[2]. අථ ඛො සො ගුළො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති. චිටිචිටායති. සන්ධූපායති[3]. සම්පධූපායති. සෙය්‍යථාපි නාම ඵාලො දිවසසන්තත්තො[4] උදකෙ පක්ඛිත්තො චිච්චිටායති, චිටිචිටායති, සන්ධූපායති, සම්පධූපායති, එවමෙව සො ගුළො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති. චිටිචිටායති. සන්ධූපායති. සම්පධූපායති.

24. අථ ඛො **බෙලට්ඨො කච්චානො** සංවිග්ගො ලොමහට්ඨජාතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නස්ස ඛො බෙලට්ඨස්ස කච්චානස්ස භගවා ආනුපුබ්බීකථං කථෙසි. සෙය්‍යථිදං: දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි. යදා භගවා අඤ්ඤාසි බෙලට්ඨං කච්චානං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා, තං පකාසෙසි. [සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය,] එවමෙව බෙලට්ඨස්ස කච්චානස්ස තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: "යං කිඤ්චි සමුදයධම්මං, සබ්බන්තං නිරොධධම්ම" න්ති.

25. අථ ඛො **බෙලට්ඨො කච්චානො** දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච: "අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය: චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී ති, එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගත" න්ති.

---

1. "යස්ස සො ගුළො" ම ඡ සං. P T S. 2. "ඔපිලාපෙති" ම ඡ සං.
3. "පධූපායති" ම ඡ සං.
4. "දිවසංසන්තත්තො" ම ඡ සං.

23. ඉක්බිති **බෙලට්ඨකච්චාන** තෙමේ යාවකයන් උක්හකුරුවලින් සතප්වා "ස්වාමීනි, යාවකයෝ උක්හකුරුවලින් සතප්පන ලද්දුහ. මේ බොහෝ උක්හකුරු ඉතිරි වූයේ ය. ස්වාමීනි, කුමක් කරම් දැ" යි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසී ය. "කච්චානය, මම, යමකු විසින් මේ උක්හකුරු අනුභව කරණ ලද්දේ මැනවින් දිරවීමට යන්නේ ද, තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයකු හෝ හැර එබන්දකු දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ලොකයෙහි ද, මහණබමුණන් සහිත වූ දෙවිමිනිසුන් සහිත වූ ප්‍රජාවෙහි ද, මම නො දක්මි. කච්චානය, එසේ නම්, තෝ ඒ උක්හකුරු තණකොළ නැති තැනක හෝ දමව. සතුන් නැති දියෙහි හෝ පා කොට හරුව". "ස්වාමීනි, එසේ ය" යි බෙලට්ඨකච්චාන තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී ඒ උක්හකුරු සතුන් නැති දියෙහි පා කොට හැරියේ ය. දියෙහි ලූ ඒ උක්හකුරු චිට චිට යන හඬ නගයි. චිටි චිටි යන හඬ නගයි. හැම අතින් දුමයි. හැම අතින් වැඩියක් දුමයි. දවසක් රත් කළ සීවැලක් (නගුල් තලයක්) දියෙහි ලන ලද්දේ යම් සේ චිට චිට යන හඬ නගා ද, චිටි චිටි යන හඬ නගා ද, හාත්පසින් දුමා යේ ද, හාත්පසින් වැඩියක් දුමා යේ ද, එපරිද්දෙන් ම ඒ උක්හකුරු දියෙහි ලන ලද්දේ චිට චිට යන හඬ නගයි. චිටි චිටි යන හඬ නගයි. හාත්පසින් දුමයි. හාත්පසින් වැඩියක් දුමයි.

24. ඉක්බිති හටගත් බිය ඇති හටගත් ලොමුදහගැණීම් ඇති බෙලට්ඨකච්චාන තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් බෙලට්ඨකච්චානයාහට පිළිවෙළකතාව වදාළ සේක. එනම්: දානකථාව සීලකථාව ස්වර්‍ගකථාව ද කාමයන් දුක්ඛව ලාමකබව කෙලෙසීමට හෙතුවන බව ද, පැවිද්දෙහි අනුසස් ද ප්‍රකාශ කළ සේක. යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ බෙලට්ඨකච්චානයා සුදුසු සිත් ඇත්තෙක, මොලොක් වූ සිත් ඇත්තෙක, නො හැකුළුනු සිත් ඇත්තෙක, ඔදවැඩි සිත් ඇත්තෙක, පහන් සිත් ඇත්තෙකැ යි දත් සේක් ද, එකල්හි බුදුවරයන්ගේ සාමුක්කංසික වූ යම් ධර්‍මදෙශනාවක් වේ ද, දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍යය මාර්‍ගසත්‍යය යන ඒ චතුරාර්‍ය-සත්‍යය ප්‍රකාශ කළ සේක. [පිරිසිදු වූ පහ වූ කිලිටු ඇති වස්ත්‍රයක් මනා ව සායම් ගන්නේ යම් සේ ද,] එපරිද්දෙන් ම බෙලට්ඨකච්චානයාහට ඒ අසුනෙහි දී ම "හටගැණීම ස්වභාවය කොට ඇති යම් කිසිවක් වේ ද, ඒ සියල්ල නිරුද්ධ වීම ස්වභාවය කොට ඇතැ" යි රාගාදීරජස් රහිත වූ පහ වූ කෙලෙස්මල ඇති සොතාපත්තිමග්ගඥාණය පහළ වූයේ ය.

25. ඉක්බිති බෙලට්ඨකච්චාන තෙමේ දක්නා ලද දහම් ඇත්තේ පැමිණි දහම් ඇත්තේ අවබොධ කළ දහම් ඇත්තේ වෙසෙසින් බැස ගත් දහම් ඇත්තේ දුරු කළ සැක ඇත්තේ පහ වූ කෙසේ කෙසේ දැ යි පැවැති සැක ඇත්තේ විශාරදභාවයට පැමිණියේ බුදුසස්නෙහි (අවබොධය සඳහා) අනුන්ගේ උපකාරයක් (ඕනෑ) නැත්තේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, යටිකුරු කරණ ලද්දක් යම් සේ උඩුකුරු කරන්නේ ද, වසන ලද්දක් යම් සේ විදහා පාන්නේ ද, මංමුළා වූවහුට යම් සේ මග කියන්නේ ද, 'ඇස් ඇත්තෝ රූප දක්නාහු' යි ගනඳුරෙහි තෙල්පහනක් යම් සේ දරන්නේ ද, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්‍මය තෙමේ ප්‍රකාශ කරණ ලද්දේ ය. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ ද නවලොකොත්තරධර්‍මය ද අෂ්ටාර්‍ය්‍යපුද්ගලභික්ෂුසඞ්ඝයා ද සරණ කොට යමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවිහිම් කොට සරණ ගියා වූ මා උපාසකයකු කොට දරණ සේක්වා" යි සැළකෙළේ ය.

26. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන රාජගහං තදවසරි. තත්‍ර සුදං භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ.** තෙන ඛො පන සමයෙන රාජගහෙ ගුළො උස්සන්නො හොති. භික්ඛූ "ගිලානස්සෙව භගවතා ගුළො අනුඤ්ඤාතො. නො අගිලානස්සා" ති කුක්කුච්චායන්තා ගුළං න පරිභුඤ්ජන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ගිලානස්ස ගුළං. අගිලානස්ස ගුළොදක" න්ති.

27. අථ ඛො භගවා රාජගහෙ යථාභිරන්තං විහරිත්වා යෙන **පාටලිගාමො** තෙන චාරිකං පක්කාමි මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන පාටලිගාමො තදවසරි. අස්සොසුං ඛො පාටලිගාමිකා උපාසකා "භගවා කිර පාටලිගාමං අනුප්පත්තො" ති. අථ ඛො පාටලිගාමිකා උපාසකා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො පාටලිගාමිකෙ උපාසකෙ භගවා ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි. අථ ඛො පාටලිගාමිකා උපාසකා භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා භගවන්තං එතදවොචුං: "අධිවාසෙතු නො භන්තෙ භගවා ආවසථාගාරං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා" ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

28. අථ ඛො පාටලිගාමිකා උපාසකා භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන ආවසථාගාරං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සබ්බසන්ථරිං ආවසථාගාරං සන්ථරිත්වා ආසනානි පඤ්ඤාපෙත්වා උදකමණිකං පතිට්ඨාපෙත්වා තෙලප්පදීපං ආරොපෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො පාටලිගාමිකා උපාසකා භගවන්තං එතදවොචුං: "සබ්බසන්ථරිං සන්ථතං[1] භන්තෙ, ආවසථාගාරං. ආසනානි පඤ්ඤත්තානි. උදකමණිකො පතිට්ඨාපිතො. තෙලප්පදීපො ආරොපිතො. යස්සදානි භන්තෙ, භගවා කාලං මඤ්ඤතී" ති. අථ ඛො භගවා නිවාසෙත්වා පත්තචීවරං ආදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන ආවසථාගාරං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පාදෙ පක්ඛාලෙත්වා ආවසථාගාරං පවිසිත්වා මජ්ඣිමං ථම්භං නිස්සාය පුරත්ථාභිමුඛො නිසීදි. භික්ඛුසඞ්ඝොපි ඛො පාදෙ පක්ඛාලෙත්වා ආවසථාගාරං පවිසිත්වා පච්ඡිමං භිත්තිං නිස්සාය පුරත්ථාභිමුඛො නිසීදි භගවන්තංයෙව පුරක්ඛත්වා. පාටලිගාමිකාපි ඛො උපාසකා පාදෙ පක්ඛාලෙත්වා ආවසථාගාරං පවිසිත්වා පුරත්ථිමං භිත්තිං නිස්සාය පච්ඡිමාභිමුඛා නිසීදිංසු භගවන්තංයෙව පුරක්ඛත්වා.

---

1. සබ්බසන්ථරිසන්ථතං" ම ඡ සං.

26. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් චාරිකාවෙහි වඩිනා සේක් **රජගහ**නුවරට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ එහි රජගහ නුවර **කලන්දකනිවාප**යෙහි වූ **වෙළුවනාරාම**යෙහි වසන සේක. එකල්හි රජගහනුවර උක්හකුරු බහුල වේ. භික්ෂූහු "භාග්‍යවතුන් වහන්සේ විසින් ගිලනහුට ම උක්හකුරු අනුදන්නා ලද්දේ ය. නොගිලන් වූවහුට නො අනුදන්නා ලද්දේ ය" යි කුකුස් කරමින් උක්හකුරු නො වළඳත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ගිලන් වූවහුට උක්හකුරු ද, නො ගිලන් වූවහුට උක්හකුරුදිය (උක්හකුරු කලතා ගත් දිය) ද අනුදනිමි" යි.

27. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කැමැති තාක් කල් වාසය කොට **පාටලිග්‍රාමය** බලා එක්දහස්දෙසියපණසක් වූ මහාභික්ෂු සඞ්ඝයා සමග චාරිකාවෙහි වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් චාරිකා කරණ සේක් පාටලිගමට වැඩි සේක. පාටලිගම්වැසි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේ පාටලිගමට වැඩිසේක් ල" යි ඇසූහ. එවිට පාටලිගම් වැසි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්හ. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් පාටලිගම්වැසි උපාසකයන් දහැමි කතාවෙන් කරුණු දක්වූහ. සමාදන් කරවූහ. තියුණු කර වූහ. සතුටු කරවූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් දහැමි කතාවෙන් කරුණු දක්වන ලද සමාදන් කරවන ලද තියුණු කරවන ලද සතුටු කරවන ලද පාටලිගම්වැසි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භික්ෂුසඞ්ඝයා සමග භාග්‍යවතුන් වහන්සේ අපගේ ආගන්තුකාගාරය පිළිගන්නා සේක්වා" යි (කීහ). භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූ සේක.

28. ඉක්බිති පාටලිගම්වැසි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ආගන්තුකාගාරයට ගියහ. ගොස් ආගන්තුකාගාරය සියලු තැන අතුරා අසුන් පණවා මහදියබඳුනක් පිහිටුවා තෙල්පහන් නගා භාග්‍යවතුන් වහන්සේ වෙත ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක සිටියහ. පසෙක සිටි පාටලිගම්වැසි උපාසකයෝ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, ආගන්තුකාගාරය සියලු තැන අතුරණ ලදී. අසුන් පණවන ලදී. දිය බඳුනක් තබන ලදී. තෙල්පහන් නගන ලදී. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ දැන් යමකට කල් බලාපොරොත්තු වන සේක් නම්, මේ ඊට කාල ය" යි සැලකළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හැඳ පොරොවා පාසිවුරු ගෙණ භික්ෂුසඞ්ඝයා සමග ආගන්තුකාගාරයට වැඩි සේක. වැඩ පා සෝදා ආගන්තුකාගාරයට පිවිස මැදකණුව නිසා පෙරදිගට මුහුණ දී වැඩ හුන් සේක. භික්ෂුසඞ්ඝ තෙමේ ද පා සෝදා ආගන්තුකාගාරයට පිවිස පැසුළු බිත්තිය නිසා පෙරදිගට මුහුණ දී භාග්‍යවතුන් වහන්සේ ම පෙරටු කොට හුන්නේ ය. පාටලිගම්වැසි උපාසකයෝ ද පා සෝදා ආගන්තුකාගාරයට ඇතුල් ව පෙරදිග බිත්තිය නිසා පැසුළු දිගට මුහුණ දී භාග්‍යවතුන් වහන්සේ ම පෙරටු කොට හුන්හ.

29. අථ ඛො භගවා පාටලිගාමිකෙ උපාසකෙ ආමන්තෙසි: "පඤ්චිමෙ ගහපතයො, ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා. කතමෙ පඤ්ච? ඉධ ගහපතයො, දුස්සීලො සීලවිපන්නො පමාදාධිකරණං මහතිං භොගජානිං නිගච්ඡති. අයං පඨමො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා. පුනචපරං ගහපතයො, දුස්සීලස්ස සීලවිපන්නස්ස පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති. අයං දුතියො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා. පුනචපරං ගහපතයො, දුස්සීලො සීලවිපන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති: යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං, අවිසාරදො උපසඞ්කමති මඞ්කුභූතො. අයං තතියො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා. පුනචපරං ගහපතයො, දුස්සීලො සීලවිපන්නො සම්මූළ්හො කාලං කරොති. අයං චතුත්ථො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා. පුනචපරං ගහපතයො, දුස්සීලො සීලවිපන්නො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. අයං පඤ්චමො ආදීනවො දුස්සීලස්ස සීලවිපත්තියා. ඉමෙ ඛො ගහපතයො, පඤ්ච ආදීනවා දුස්සීලස්ස සීලවිපත්තියා.

30. පඤ්චිමෙ ගහපතයො, ආනිසංසා සීලවතො සීලසම්පදාය. කතමෙ පඤ්ච? ඉධ ගහපතයො, සීලවා සීලසම්පන්නො අප්පමාදාධිකරණං මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡති. අයං පඨමො ආනිසංසො සීලවතො සීලසම්පදාය. පුනචපරං ගහපතයො, සීලවතො සීලසම්පන්නස්ස කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති. අයං දුතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය. පුනචපරං ගහපතයො, සීලවා සීලසම්පන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති: යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං, විසාරදො උපසඞ්කමති අමඞ්කුභූතො. අයං තතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය. පුනචපරං ගහපතයො, සීලවා සීලසම්පන්නො අසම්මූළ්හො කාලං කරොති. අයං චතුත්ථො ආනිසංසො සීලවතො සීලසම්පදාය. පුනචපරං ගහපතයො, සීලවා සීලසම්පන්නො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. අයං පඤ්චමො ආනිසංසො සීලවතො සීලසම්පදාය. ඉමෙ ඛො ගහපතයො, පඤ්ච ආනිසංසා සීලවතො සීලසම්පදායා" ති.

31. අථ ඛො භගවා **පාටලි**ගාමිකෙ උපාසකෙ බහුදෙව රත්තිං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උය්‍යොජෙසි "අභික්කන්තා ඛො ගහපතයො, රත්ති. යස්සදානි කාලං මඤ්ඤථා" ති. "එවං භන්තෙ" ති ඛො පාටලිගාමිකා උපාසකා භගවතො පටිස්සුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු. අථ ඛො භගවා අචිරපක්කන්තෙසු පාටලිගාමිකෙසු උපාසකෙසු සුඤ්ඤාගාරං පාවිසි.

32. තෙන ඛො පන සමයෙන **සුනිධවස්සකාරා** මගධමහාමත්තා පාටලිගාමෙ නගරං මාපෙන්ති වජ්ජීනං පටිබාහාය. අද්දසා ඛො භගවා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සම්බහුලා දෙවතායො පාටලිගාමෙ වත්ථූනි පරිග්ගණ්හන්තියො. යස්මිං පදෙසෙ මහෙසක්ඛා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, මහෙසක්ඛානං තත්ථ රාජූනං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ මජ්ඣිමා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, මජ්ඣිමානං තත්ථ රාජූනං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ නීචා දෙවතා වත්ථූනි පරිග්ගණ්හන්ති, නීචානං තත්ථ රාජූනං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං.

29. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පාටලිගම්වැසි උපාසකයන් ඇමතූ සේක: "ගෘහපතියෙනි, දුශ්ශීලයාගේ ශීලවිපත්තියෙහි මේ දොස් පසෙක් වේ. **කවරපසෙක්ද ?යත්** ගෘහපතියෙනි, මෙහි දුශ්ශීල තෙමේ ශීලවිපත්තියට පැමිණියේ ප්‍රමාදහෙතුවෙන් මහත් භොගහානියට පැමිණේ. මේ දුශ්ශීලයාගේ ශීලවිපත්තියෙහි පළමුවන දෙස වේ. නැවැත ද ගෘහපතියෙනි, සිල්විපතට පැමිණි දුශ්ශීලයා පිළිබඳ අයහපත් කීර්තිරාවයෙක් පැන නගියි. මේ දුශ්ශීලයාගේ ශීලවිපත්තියෙහි දෙවන දෙස වේ. නැවැත ද ගෘහපතියෙනි, සිල්විපතට පැමිණි දුශ්ශීල තෙමේ ක්‍ෂත්‍රිය පිරිස බමුණුපිරිස ගැහැවි පිරිස මහණපිරිස යන යම් යම් පිරිසක් වෙතට එළඹේ ද, බිය ඇති ව තෙද රහිත ව එළඹෙයි. මේ දුශ්ශීලයාගේ ශීලවිපත්තියෙහි තෙවන දෙස වේ. නැවැත ද ගෘහපතියෙනි, සිල්විපතට පැමිණි දුශ්ශීල තෙමේ මුළා වූයේ කළුරිය කරයි. මේ දුශ්ශීලයාගේ ශීලවිපත්තියෙහි සිවුවන දෙස වේ. නැවැත ද ගෘහපතියෙනි, සිල්විපතට පැමිණි දුශ්ශීල තෙමේ ජීවිතෙන්ද්‍රියවිනාශයෙන් මරණින් පසු සැපයෙන් පහ වූ දුකට පිහිට වූ අකමැත්තෙන් ම (දුබල ව) පතිත වන්නා වූ නරකයෙහි උපදී. මේ දුශ්ශීලයාගේ ශීලවිපත්තියෙහි පස්වන දෙස වේ. ගෘහපතියෙනි, මේ දුශ්ශීලයාගේ ශීලවිපත්තියෙහි දොස් පස ය."

30. "ගෘහපතියෙනි, සිල්වත්හුගේ සීලසම්පත්තියෙහි මේ අනුසස් පසෙක් වේ. කවර පසෙක් ද ? ගෘහපතියෙනි, මෙහි සිල් ඇත්තේ සීලයෙන් යුක්ත වූයේ අප්‍රමාදහෙතුවෙන් මහත් වූ භොගරාශියක් ලබයි. මේ සිල්වත්හුගේ සීලසම්පත්තියෙහි පළමුවන ආනිසංසය වේ. නැවැත ද ගෘහපතියෙනි, සිල්වත් වූ සීලයෙන් යුක්ත වූවහුගේ යහපත් කීර්තිරාවයෙක් පැන නගියි. මේ සිල්වත්හුගේ සීලසම්පත්තියෙහි දෙවන ආනිසංසය වේ. නැවැත ද ගෘහපතියෙනි, සිල් ඇත්තේ සීලයෙන් යුක්ත වූයේ ක්‍ෂත්‍රියපිරිස බමුණුපිරිස ගැහැවිපිරිස මහණපිරිස යන යම් යම් පිරිසක් වෙතට එළඹේ ද, නිර්භය ව තෙද සහිත ව එළඹේ. මේ සිල්වත්හුගේ සීලසම්පත්තියෙහි තෙවන ආනිසංසය වේ. නැවැත ද ගෘහපතියෙනි, සිල් ඇත්තේ සීලයෙන් යුක්ත වූයේ නො මුළා ව කළුරිය කෙරේ. මේ සිල්වත්හුගේ සීලසම්පත්තියෙහි සිවුවන ආනිසංසය වේ. නැවැත ද ගෘහපතියෙනි, සිල් ඇත්තේ සීලයෙන් යුක්ත වූයේ ජීවිතෙන්ද්‍රිය විනාශයෙන් මරණින් පසු මනා ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදී. මේ සිල්වත්හුගේ සීලසම්පත්තියෙහි පස්වන ආනිසංසය වේ. ගෘහපතියෙනි, මේ සිල්වත්හුගේ සීලසම්පත්තියෙහි අනුසස් පස ය."

31. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **පාටලි**ගම්වැසි උපාසකයන් රෑ බොහෝ වේලාවක් ම දැහැමි කතාවෙන් කරුණු දක්වා සමාදන් කරවා තියුණු කරවා සතුටු කරවා "ගෘහපතියෙනි, රාත්‍රිතොමෝ ඉක්ම ගියා ය. දැන් යම් ගමනකට බලාපොරොත්තු වන්නහු නම්, එයට කාලය දනිවු" යි වදාළහ. පාටලිගම්වැසි උපාසකයෝ "ස්වාමීනි, එසේ ය" යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ගියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පාටලිගම්වැසි උපාසකයන් ගිය නොබෝ වේලාවකින් ශූන්‍යාගාරයට පිවිසි සේක.

32. එකල්හි **සුනීධ-වස්සකාර** නම් මගධමහාමාත්‍යයෝ වජ්ජීන් වළකනු පිණිස පාටලිගම්හි නුවරක් ගොඩ නගත්. භාග්‍යවතුන් වහන්සේ රෑ අලුයම් වේලෙහි නැගී සිට පාටලිගම්හි ගෙබිම් පරිග්‍රහණ කරන්නා වූ (=අරක් ගන්නා වූ) බොහෝ දෙවියන් මිනිසැස ඉක්ම වූ පිරිසිදුවූ දිවැසින් දුටුසේක. මහෙශාඛ්‍ය දෙවියෝ යම් පෙදෙසක ගෙබිම් පරිග්‍රහණ කෙරෙත් (=දෘෂ්ටි හෙළීම් වසයෙන් ගණිත්) ද, එහි ගෙවල් ගොඩ නගන්නට මහෙශාඛ්‍ය වූ රජුන්ගේ ද රජමහ ඇමැතියන්ගේ ද සිත් නැමේ. මධ්‍යම වූ දෙවියෝ යම් පෙදෙසක ගෙබිම් පරිග්‍රහණ කෙරෙත් ද, එහි ගෙවල් ගොඩ නගන්නට මධ්‍යම වූ රජුන්ගේ ද රජමහඇමැතියන්ගේ ද සිත් නැමේ. පහත් වූ දෙවියෝ යම් පෙදෙසක ගෙබිම් පරිග්‍රහණය කෙරෙත් ද, එහි ගෙවල් ගොඩ නගන්නට පහත් රජුන්ගේ ද රජමහඇමැතියන්ගේ ද සිත් නැමේ.

33. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "කො නු ඛො තෙ ආනන්ද, පාටලිගාමෙ නගරං මාපෙන්තී" ති. "**සුනිධවස්සකාරා** භන්තෙ, මගධමහාමත්තා පාටලිගාමෙ නගරං මාපෙන්ති වජ්ජීනං පටිබාහායා" ති. "සෙය්‍යථාපි ආනන්ද, දෙවෙහි තාවතිංසෙහි සද්ධිං මන්තෙත්වා, එවමෙව ඛො ආනන්ද, සුනිධවස්සකාරා මගධමහාමත්තා පාටලිගාමෙ නගරං මාපෙන්ති වජ්ජීනං පටිබාහාය. ඉධාහං ආනන්ද, රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය අද්දසං දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සම්බහුලා දෙවතායො පාටලිගාමෙ වත්ථූනි පරිගණ්හන්තියො. යස්මිං පදෙසෙ මහෙසක්ඛා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති, මහෙසක්ඛානං තත්ථ රාඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ මජ්ඣිමා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති, මජ්ඣිමානං තත්ථ රාඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ නීචා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති, නීචානං තත්ථ රාඤ්ඤං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යාවතා ආනන්ද, අරියං ආයතනං, යාවතා වණිප්පථො, ඉදං අග්ගනගරං භවිස්සති පාටලිපුත්තං පුටභෙදනං. පාටලිපුත්තස්ස ඛො ආනන්ද, තයො අන්තරායා භවිස්සන්ති අග්ගිතො වා උදකතො වා අබ්භන්තරතො වා මිථුභෙදා" ති.

34. අථ ඛො **සුනිධවස්සකාරා** මගධමහාමත්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො සුනිධවස්සකාරා මගධමහාමත්තා භගවන්තං එතදවොචුං: "අධිවාසෙතු නො භවං ගොතමො අජ්ජතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා" ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො සුනිධවස්සකාරා මගධමහාමත්තා භගවතො අධිවාසනං විදිත්වා පක්කමිංසු.

35. අථ ඛො සුනිධවස්සකාරා මගධමහාමත්තා පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසුං: "කාලො භො ගොතම, නිට්ඨිතං භත්ත" න්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන සුනිධවස්සකාරානං මගධමහාමත්තානං පරිවෙසනා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන.

36. අථ ඛො සුනිධවස්සකාරා මගධමහාමත්තා බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො සුනිධවස්සකාරෙ මගධමහාමත්තෙ භගවා ඉමාහි ගාථාහි අනුමොදි:

37. "යස්මිං පදෙසෙ කප්පෙති වාසං පණ්ඩිතජාතියො,
සීලවන්තෙත්ථ භොජෙත්වා සඤ්ඤතෙ බ්‍රහ්මචාරයො[2].

38. යා තත්ථ දෙවතා ආසුං තාසං දක්ඛිණමාදිසෙ,
තා පූජිතා පූජයන්ති මානිතා මානයන්ති නං.

39. තතො නං අනුකම්පන්ති මාතා පුත්තංව ඔරසං,
දෙවතානුකම්පිතො පොසො සදා භද්‍රානි පස්සතී" ති.

1. වණ්ණිප්පථො - කත්ථචි. 2. "බ්‍රහ්මචාරිනො" සී.

33 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "ආනන්දය, ඒ කවර කෙනෙක් පාටලිගම්හි නුවරක් ගොඩ නගත් ද" යි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගෙන් ඇසූ සේක. "ස්වාමීනි, සුනීධ ය, වස්සකාර ය යන මගධ-මහාමාත්‍යයෝ වජ්ජීන් පිළිබඳහනු (=වළක්වනු) පිණිස පාටලිගම්හි නුවරක් ගොඩනගත්" යි (සැලකෙළේය.) "ආනන්දය, සුනීධ-වස්සකාරමගධමහාමාත්‍යයෝ තව්තිසාවැසි දෙවියන් හා මන්ත්‍රණය කොට ගෙණ (කරන්නා) සේ, ආනන්දය, වජ්ජීන් වළක්වනු පිණිස පාටලිගම්හි නුවරක් ඉදි කෙරෙත්. ආනන්දය, මම මෙහි රෑ අලුයම් වේලෙහි නැගී සිට පාටලිගම්හි ගෙබිම් පරිග්‍රහණය කරන්නා වූ බොහෝ දෙවියන් මිනිසැස ඉක්ම වූ පිරිසිදු වූ දිවැසින් දුටුවෙමි. මහේශාඛ්‍යදෙවියෝ යම් පෙදෙසක ගෙබිම් පරිග්‍රහණ කෙරෙත් ද, එහි ගෙවල් ගොඩ නගන්නට මහේශාඛ්‍යරජුන්ගේ හා රජමහ-ඇමැතියන්ගේ ද සිත් නැමේ. මධ්‍යම වූ දෙවියෝ යම් පෙදෙසක ගෙබිම් පරිග්‍රහණ කෙරෙත් ද, එහි ගෙවල් ගොඩ නගන්නට මධ්‍යම වූ රජුන්ගේ හා රජමහඇමැතියන්ගේ සිත් නැමේ. පහත් වූ දෙවියෝ යම් පෙදෙසක ගෙබිම් පරිග්‍රහණ කෙරෙත් ද, එහි ගෙවල් ගොඩ නගන්නට පහත් වූ රජුන්ගේ හා රජමහඇමැතියන්ගේ සිත් නැමේ. ආනන්දය, ආයතීායතනය (=ආයතීාවාසය - ආයතී මිනිසුන් ගැවසෙන තැන්) යම් තාක් ද, වණික්පථය (=වෙළඳ මග - වෙළෙඳුන් බඩු විකුණන හෝ වසන තැන්) යම් තාක් ද, එහි (නන් දෙසින් ගෙණෙන වෙළෙඳ) බඩු පොදි ලිහන මේ පාටලිපුත්‍රය අග්‍රනගරය වන්නේ ය. ආනන්දය, පාටලිපුත්‍ර නගරයට ගින්නෙන් ද ජලයෙන් ද (රටවැස්සන්) උනුන් බිඳීමෙන් ඇතුළතින් ද යි අන්තරාය තුණෙක් වන්නේ ය" යි වදාළසේක.

34. එකල්හි සුනීධ-වස්සකාරමගධමහාමාත්‍යයෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වූහ. සතුටු විය යුතු සිත් ඇලවිය යුතු වූ කතා කොට නිමවා පසෙක සිටියහ. පසෙක සිටි සුනීධ-වස්සකාර මගධමහාමාත්‍යයෝ භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතම තෙමේ භික්‍ෂුසඞ්ඝයාත් සමග අදට අපගේ බත ඉවසාවා" යි සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසා වදාළ සේක.

35. ඉක්බිති සුනීධ-වස්සකාරමගධමහාමාත්‍යයෝ භාග්‍යවතුන් වහන්-සේගේ ඉවසීම දැන ඉන් නික්ම ගියහ. අනතුරු ව සුනීධ-වස්සකාර මගධමහාමාත්‍යයෝ ප්‍රණීත වූ කෑ යුතු බිදිය යුතු දේ පිළියෙළ කරවා "භවත් ගෞතමයන් වහන්ස, මේ කාලය වේ. බත් නිමියේ" යි භාග්‍යවතුන් වහන්සේට කල් සැලකරවූහ. භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරොවා පාසිවුරු ගෙණ සුනීධ-වස්සකාරමගධමහාමාත්‍යයන්ගේ පරිවෙසනයට (=වළඳවන තැනට) වැඩි සේක. වැඩ පණවා තුබූ අසුනෙහි භික්‍ෂුසඞ්ඝයාත් සමග වැඩ හුන් සේක.

36. එවිට සුනීධ-වස්සකාරමගධමහාමාත්‍යයෝ බුද්ධප්‍රමුඛභික්‍ෂුසඞ්ඝයා ප්‍රණීත වූ කෑ යුතු බිදිය යුතු දෙයින් සියතින් සතප්වා පවරා, වළඳා අවසන් කළ පාත්‍රයෙන් බැහැරට ගත් අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙත පසෙක හුන්හ. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් සුනීධ-වස්සකාර-මගධමහාමාත්‍යයන් මේ ගාථාවලින් අනුමෝදනා කළ සේක.

37. "යම් පෙදෙසක පණ්ඩිත වූවෙක් වාසය කෙරේ නම්, එහි සිල්වත් සංයත වූ බ්‍රහ්මචාරීන් වළඳවා-

38. එහි යම් දේවතාවෝ වූවාහු ද, ඔවුනට පින් දෙන්නේ ය. (මෙසේ) පුදන ලද දෙවියෝ ඔහු ද පුදත්. බුහුමන් කරණ ලද දෙවියෝ ඔහුට බුහුමන් කරත්.

39. එයින්, මවු තොමෝ ලෙහි හොවා වඩන පුතුට මෙන්, ඔහුට අනුකම්පා කෙරෙත්. දෙවියන් විසින් අනුකම්පා කරණ ලද පුරුෂ තෙමේ සියලු කල්හි යහපත දකී යි.

40. අථ ඛො භගවා සුනීධවස්සකාරෙ මගධමහාමත්තෙ ඉමාහි ගාථාහි අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි. තෙන ඛො පන සමයෙන සුනීධවස්සකාරා මගධමහාමත්තා භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධා හොන්ති: "යෙන අජ්ජ සමණො ගොතමො ද්වාරෙන නික්ඛමිස්සති, තං **ගොතමද්වාරං** නාම භවිස්සති. යෙන තිත්ථෙන ගඞ්ගං නදිං උත්තරිස්සති, තං **ගොතමතිත්ථං** නාම භවිස්සතී" ති. අථ ඛො භගවා යෙන ද්වාරෙන නික්ඛමි, තං ගොතමද්වාරං නාම අහොසි. අථ ඛො භගවා යෙන ගඞ්ගා නදී, තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන ගඞ්ගානදී පූරා හොති සමතිත්තිකා කාකපෙය්‍යා. මනුස්සා අඤ්ඤෙ නාවං පරියෙසන්ති; අඤ්ඤෙ උළුම්පං පරියෙසන්ති, අඤ්ඤෙ කුල්ලං බන්ධන්ති ඔරා පාරං ගන්තුකාමා.

41. අද්දසා ඛො භගවා තෙ මනුස්සෙ අඤ්ඤෙ නාවං පරියෙසන්තෙ අඤ්ඤෙ උළුම්පං පරියෙසන්තෙ අඤ්ඤෙ කුල්ලං බන්ධන්තෙ ඔරා පාරං ගන්තුකාමෙ. දිස්වාන සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව[1] භගවා ගඞ්ගාය නදියා ඔරිමතීරෙ අන්තරහිතො පාරිමතීරෙ පච්චුට්ඨාසි සද්ධිං භික්ඛුසඞ්ඝෙන. අථ ඛො භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

42. "යෙ තරන්ති අණ්ණවං සරං සෙතුං කත්වාන විසජ්ජ පල්ලලානි,
කුල්ලං හි ජනො පබන්ධති[2] තිණ්ණා මෙධාවිනො ජනා"ති.

43. අථ ඛො භගවා යෙන **කොටිගාමො** තෙනුපසඞ්කමි. තත්‍ර සුදං භගවා කොටිගාමෙ විහරති. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "චතුන්නං භික්ඛවෙ, අරියසච්චානං අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. කතමෙසං චතුන්නං:? දුක්ඛස්ස භික්ඛවෙ, අරියසච්චස්ස අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස -පෙ- දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස -පෙ- දුක්ඛනිරොධගාමිනියා පටිපදාය[3] අරියසච්චස්ස අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකඤ්ච. තයිදං භික්ඛවෙ, දුක්ඛං අරිසච්චං අනුබුද්ධං පටිවිද්ධං. දුක්ඛසමුදයං අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං. දුක්ඛනිරොධං අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං. දුක්ඛනිරොධගාමිනීපටිපදං අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං. උච්ඡින්නා භවතණ්හා. ඛීණා භවනෙත්ති. නත්ථිදානි පුනබ්භවො" ති.

44. "චතුන්නං අරියසච්චානං යථාභූතං අදස්සනා,
සංසිතං[4] දීඝමද්ධානං තාසු තාසෙව ජාතිසු.

45. තානි එතානි දිට්ඨානි භවනෙත්ති සමූහතා,
උච්ඡින්නං මූලං[5] දුක්ඛස්ස නත්ථිදානි පුනබ්භවොති.

---

1. "එවමෙව ඛො භගවා" ම ඡ සං. 2. "බන්ධති" ම ඡ සං.
3. "දුක්ඛනිරොධගාමිනීපටිපදා" සී මු. 4. "සාසිතං" සී මු.
5. "උච්ඡින්නමූලං" සී මු. තො වි. ජ වි. ම නු ප.

Free Distribution www.aathaapi.org

40. භාග්‍යවතුන් වහන්සේ සුනීධ-වස්සකාරමගධමහාමාත්‍යයන් මේ ගාථාවලින් අනුමෝදනා කොට හුනස්නෙන් නැගිට වැඩි සේක. එකල්හි සුනීධ-වස්සකාරමගධමහාමාත්‍යයෝ "අද ශ්‍රමණ ගෞතම තෙමේ යම් දොරකින් නික්මෙන්නේ ද, ඒ දොර **ගෞතමද්වාර** නම් වන්නේ ය. යම් තොටකින් ගඞ්ගානදිය තරණය කරන්නේ ද, ඒ තොට **ගෞතමතීර්ථ** නම් වන්නේ ය" යි භාග්‍යවතුන් වහන්සේගේ පිටිපස ලුහු බැන්දහු වෙත්. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ යම් දොරකින් නික්මුනු සේක් ද, ඒ දොර **ගෞතමද්වාර** නම් වි ය. භාග්‍යවතුන් වහන්සේ ගඞ්ගානදිය වෙතට එළඹි සේක. එකල්හි ගඞ්ගානදිය ගංඉවුර සම ව පිරුණේ වෙයි. කවුඩන් විසින් පිව හැකි වේ. මෙ ගොඩින් එ ගොඩට යනු කැමැති වූ මිනිස්සු සමහරු නැව් සොයත්. සමහරු (දඬු) පහුරු සොයත්. සමහරු (උණ බට ආදියෙන්) පහුරු බඳිත්.

41. භාග්‍යවතුන් වහන්සේ මෙ ගොඩින් එ ගොඩට යනු කැමැති වූ මිනිසුන්, නැව් සොයන සමහරුන්, පහුරු සොයන සමහරුන්, පහුරු බඳින සමහරුන් දුටු සේක. දැක, බලවත් පුරුෂයෙක් හැකිළු අත යම් සේ දිගු කරන්නේ හෝ වේ ද, දිගු කළ අත යම් සේ හකුළන්නේ හෝ වේ ද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ ගඞ්ගානදියෙහි මෙ ගොඩ ඉවුරෙහි අතුරුදහන් වූ සේක් එ ගොඩ ඉවුරෙහි භික්ෂුසඞ්ඝයා සමග පහළ වූ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන ඒ වේලෙහි මේ උදන් ඇනූසේක.

42. "යම් කෙනෙක් දියවතුරු හැර ගැඹුරු වූ (තෘෂ්ණා) නදිය ම තරණය කෙරෙත් ද, ඔහු ආර්‍ය්‍යමාර්ගය හෙය කොට එය තරණය කෙරෙත්. මහාජන තෙමේ දියත්තක් තරණය කිරීමට ද පහුරු බඳියි. නුවණැති බුද්ධාදිජනයෝ පහුරක් නැති ව ම එතෙර වූවාහු ය."

43. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **කොටිග්‍රාමයට** වැඩි සේක. භාග්‍ය-වතුන් වහන්සේ එහි කොටිග්‍රාමයෙහි වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, මා විසින් ද තොප විසින් ද චතුරාර්‍ය්‍යසත්‍යධර්මය අවබෝධ නො කිරීමෙන් ප්‍රතිවෙධ නො කිරීමෙන් මේ දිගු කලක් මෙසේ ධාවනය කරණ ලද්දේ ය. සැරිසරණ ලද්දේ ය. කවර සතරක් අවබෝධ ප්‍රතිවෙධ නො කිරීමෙන් ද ? යත්: 'මහණෙනි, මා විසින් ද, තොප විසින් ද දුඃඛාර්‍ය්‍යසත්‍යය අවබෝධ නො කිරීමෙන් ප්‍රතිවෙධ නො කිරීමෙන් මේ දිගුකලක් මෙසේ ධාවනය කරණ ලද්දේ ය. සැරි සරණ ලද්දේ ය. මා විසින් ද තොප විසින් ද දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යය -පෙ- දුඃඛනිරෝධාර්‍ය්‍යසත්‍යය -පෙ- දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය අවබෝධ නො කිරීමෙන් ප්‍රතිවෙධ නො කිරීමෙන් මේ දිගු කලක් මෙසේ ධාවනය කරණ ලද්දේ ය. සැරි සරණ ලද්දේ ය. මහණෙනි, ඒ මේ දුඃඛාර්‍ය්‍යසත්‍යය අවබෝධ කරණ ලද්දේ ය. ප්‍රතිවෙධ කරණ ලද්දේ ය. දුඃඛසමුදයාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කරණ ලද්දේ ය. ප්‍රතිවෙධ කරණ ලද්දේ ය. දුඃඛ නිරෝධාර්‍ය්‍යසත්‍යය අවබෝධ කරණ ලද්දේ ය. ප්‍රතිවෙධ කරණ ලද්දේ ය. දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය අවබෝධ කරණ ලද්දේ ය. ප්‍රතිවෙධ කරණ ලද්දේ ය. භවතෘෂ්ණාව සිඳින ලද්දී ය. භවනෙත්තිය ක්‍ෂය කරණ ලද්දී ය. දැන් පුනර්භවයෙක් නැත්තේ ය" යි භික්ෂූන්ට වදාළ සේක:

44. "චතුරාර්‍ය්‍යසත්‍යයන් තත් වූ පරිදි නො දැක්මෙන් ම දිගු කලක් ඒ ඒ ජාතීන්හි සැරිසරණ ලද්දේ ය.

45. ඒ මේ චතුරාර්‍ය්‍යසත්‍යධර්මයෝ දක්නා ලදහ. භවනෙත්තිය නසන ලද්දී ය. දුකෙහි මුල් සිඳින ලද්දේ ය. දැන් නැවත ඉපැත්මෙක් නැත්තේ ය."

46. අස්සොසි ඛො **අම්බපාලී** ගණිකා “භගවා කිර කොටිගාමං අනුප්පත්තො” ති. අථ ඛො අම්බපාලී ගණිකා භද්‍රානි භද්‍රානි යානානි යොජාපෙත්වා භද්‍රං යානං[1] අභිරූහිත්වා භද්‍රෙහි භද්‍රෙහි යානෙහි වෙසාලියා නිය්‍යාසි භගවන්තං දස්සනාය. යාවතිකා යානස්ස භූමි, යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකාව යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අම්බපාලිං ගණිකං භගවා ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි. අථ ඛො අම්බපාලී ගණිකා භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා භගවන්තං එතදවොච: “අධිවාසෙතු මෙ භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා” ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො අම්බපාලී ගණිකා භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

47. අස්සොසුං ඛො **වෙසාලිකා ලිච්ඡවී** “භගවා කිර කොටිගාමං අනුප්පත්තො” ති. අථ ඛො වෙසාලිකා ලිච්ඡවී භද්‍රානි භද්‍රානි යානානි යොජාපෙත්වා භද්‍රං භද්‍රං යානං අභිරූහිත්වා භද්‍රෙහි භද්‍රෙහි යානෙහි වෙසාලියා නීයිංසු[2] භගවන්තං දස්සනාය. අප්පෙකච්චෙ ලිච්ඡවී නීලා හොන්ති නීලවණ්ණා නීලවත්ථා නීලාලඞ්කාරා. අප්පෙකච්චෙ ලිච්ඡවී පීතා හොන්ති පීතවණ්ණා පීතවත්ථා පීතාලඞ්කාරා. අප්පෙකච්චෙ ලිච්ඡවී ලොහිතකා හොන්ති ලොහිතකවණ්ණා[3] ලොහිතකවත්ථා ලොහිතකාලඞ්කාරා. අප්පෙකච්චෙ ලිච්ඡවී ඔදාතා හොන්ති ඔදාතවණ්ණා ඔදාතවත්ථා ඔදාතාලඞ්කාරා.

48. අථ ඛො අම්බපාලී ගණිකා දහරානං දහරානං ලිච්ඡවීනං ඊසාය ඊසං යුගෙන යුගං චක්කෙන චක්කං අක්ඛෙන අක්ඛං පටිවට්ටෙසි. අථ ඛො තෙ ලිච්ඡවී අම්බපාලිං ගණිකං එතදවොචුං: “කිස්ස ජෙ අම්බපාලි, අම්හාකං[4] දහරානං දහරානං ලිච්ඡවීනං ඊසාය ඊසං යුගෙන යුගං චක්කෙන චක්කං අක්ඛෙන අක්ඛං පටිවට්ටෙසී” ති. “තථා හි පන මයා අය්‍යපුත්තා, ස්වාතනාය බුද්ධප්පමුඛො භික්ඛුසඞ්ඝො නිමන්තිතො” ති. “දෙහි ජෙ අම්බපාලි, අම්හාකං එතං භත්තං සතසහස්සෙනා” ති. “සචෙපි මෙ අය්‍යපුත්තා වෙසාලිං සාහාරං දජ්ජෙය්‍යාථ, නෙව දජ්ජා. භත්ත” න්ති.

49. අථ ඛො තෙ ලිච්ඡවී අඞ්ගුලිං පොඨෙසුං: “පරාජිතම්හ[5] වත භො අම්බකාය. පරාජිතම්හ වත භො අම්බකායා” ති.

50. අථ ඛො තෙ ලිච්ඡවී යෙන භගවා තෙනුපසඞ්කමිංසු. අද්දසා ඛො භගවා තෙ ලිච්ඡවී දූරතොව ආගච්ඡන්තෙ. දිස්වාන භික්ඛූ ආමන්තෙසි: “යෙහි භික්ඛවෙ, භික්ඛූහි දෙවා තාවතිංසා අදිට්ඨපුබ්බා, ඔලොකෙථ භික්ඛවෙ, ලිච්ඡවිපරිසං. අපලොකෙථ භික්ඛවෙ, ලිච්ඡවිපරිසං. උපසංහරථ භික්ඛවෙ, ලිච්ඡවිපරිසං තාවතිංසපරිස” න්ති.

---

1. “භද්‍රං භද්‍රං යානං” තොවි. ම ඡු ප. 2. “නීයාසු” ම ඡ සං. P T S.
3. “ලොහිතවණ්ණා” ම ඡ සං. P T S. 4 “අම්බපාලි දහරානං” ම ඡ සං.
5. “ජිතම්හ” ම ඡ සං. අ වි තො වි.

Free Distribution www.aathaapi.org

46. **අම්බපාලී** නම් ගණිකා තොමෝ "භාග්‍යවතුන් වහන්සේ කොටිග්‍රාමයට වැඩි සේක් ල" යි ඇසූ ය. ඉක්බිති අම්බපාලී ගණිකා තොමෝ හොඳ හොඳ යානයන් යොදවා හොඳ යානයකට නැගී හොඳ හොඳ යානාවලින් යුක්ත ව භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස විශාලාමහනුවරින් නික්ම ගියා ය. යානයෙන් යා හැකි බිම යම් පමණ ද, එපමණ තැන් යානයෙන් ගොස් යානයෙන් බැස පාගමනින් ම භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියා ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නී ය. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් අම්බපාලී ගණිකාව දැහැමි කතාවෙන් කරුණු දක්වූහ. සමාදන් කරවූහ. තියුණු කරවූහ. සතුටු කරවූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කතාවෙන් කරුණු දක්වන ලද සමාදන් කරවන ලද තියුණු කරවන ලද සතුටු කරවන ලද අම්බපාලී ගණිකා තොමෝ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා සමග හෙටට මාගේ බත පිළිගන්නා සේක්වා" යි සැලකළා ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණිම්භාවයෙන් ඉවසා වදාළ සේක. ඉක්බිති අම්බපාලී ගණිකා තොමෝ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට සකසා වැඳ පැදකුණු කොට ගියා ය.

47. **විශාලාමහනුවර** වැසි **ලිච්ඡවීහු** "භාග්‍යවතුන් වහන්සේ කොටිග්‍රාමයට වැඩි සේක් ල" යි ඇසූහ. ඉක්බිති විශාලාමහනුවර වැසි ලිච්ඡවීහු හොඳ හොඳ යානයන් යොදවා හොඳ හොඳ යානයන්ට නැගී හොඳ හොඳ යානයන්ගෙන් යුක්ත ව භාග්‍යවතුන් වහන්සේ දක්නට විශාලාමහනුවරින් නික්ම ගියහ. ඇතැම් ලිච්ඡවීහු නිල් වෙත්. නිල්පැහැ ඇත්තෝ වෙත්. නිල්වත් ඇත්තෝ වෙත්. නිල්අබරණ ඇත්තෝ වෙත්. ඇතැම් ලිච්ඡවීහු රන්වන් වෙත්. රන්වන් පැහැ ඇත්තෝ වෙත්. රන් වන් වත් ඇත්තෝ වෙත්. රන්වන් අබරණ ඇත්තෝ වෙත්. ඇතැම් ලිච්ඡවීහු රතු වෙත්. රතුපැහැ ඇත්තෝ වෙත්. රතුවත් ඇත්තෝ වෙත්. රතුඅබරණ ඇත්තෝ වෙත්. ඇතැම් ලිච්ඡවීහු සුදු වෙත්. සුදුපැහැ ඇත්තෝ වෙත්. සුදුවත් ඇත්තෝ වෙත්. සුදුඅබරණ ඇත්තෝ වෙත්.

48. ඉක්බිති අම්බපාලීගණිකා තොමෝ තරුණලිච්ඡවීන්ගේ රියහිස රියහිසෙන් ද වියදණ්ඩ වියදණ්ඩෙන් ද චක්‍රය චක්‍රයෙන් ද අකුර අකුරෙන් ද ගැටුවා ය. ඉක්බිති ඒ ලිච්ඡවීහු අම්බපාලී ගණිකාවට "කෙල්ල අම්බපාලි, කුමක් හෙයින් අපගේ ලිච්ඡවී තරුණයන්ගේ රියහිස රියහිසෙන් වියදණ්ඩ වියදණ්ඩෙන් චක්‍රය චක්‍රයෙන් අකුර අකුරෙන් ගැටුවා ද" යි ඇසූහ. "ආර්‍ය්‍යපුත්‍රයෙනි, එසේ ම ය. මා විසින් හෙට බතට බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝ තෙමේ පවරණ ලද්දේ" යි. "කෙල්ල, අම්බපාලි, ලක්ෂයකින් (ලක්ෂයක් ගෙණ) මේ බත අපට දෙව". "ආර්‍ය්‍යපුත්‍රයෙනි, ඉදින් ජනපද සහිත වූ විශාලාමහානගරය මට දෙන්නහු ද, මම ඒ බත නො ම දෙන්නෙමි" යි.

49. ඉක්බිති ඒ ලිච්ඡවීහු "භවත්නි, ගැහැණියක විසින් පරදවන ලද්දෝ වෙමු. භවත්නි, ගැහැණියක විසින් පරදවන ලද්දෝ වෙමු" යි අසුර ගැසූහ.

50. ඒ ලිච්ඡවීහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. භාග්‍යවතුන් වහන්සේ එන්නා වූ ඒ ලිච්ඡවීන් දුර දී ම දුටු සේක. දැක භික්ෂූන් අමතා "මහණෙනි, යම් භික්ෂූන් විසින් තව්තිසාවැසි දෙවියෝ පෙර නො දක්නා ලද්දෝ ද, මහණෙනි, (ඒ තෙපි) ලිච්ඡවීපිරිස බලවූ. මහණෙනි, ලිච්ඡවීපිරිස බලවූ. ලිච්ඡවීපිරිස තව්තිසාපිරිස ය යි සලකවූ" යි වදාළ සේක.

51. අථ ඛො තෙ ලිච්ඡවී යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකාව යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ ලිච්ඡවී භගවා ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි. අථ ඛො තෙ ලිච්ඡවී භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා භගවන්තං එතදවොචුං: "අධිවාසෙතු නො භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා"ති. "අධිවුත්ථොම්හි ලිච්ඡවී, ස්වාතනාය අම්බපාලියා ගණිකාය භත්ත" න්ති. අථ ඛො තෙ ලිච්ඡවී අඞ්ගුලිං පොඨෙසුං: "පරාජිතම්හ වත භො අම්බකාය. පරාජිතම්හ වත භො අම්බකායා" ති. අථ ඛො තෙ ලිච්ඡවී භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු.

52. අථ ඛො භගවා කොටිගාමෙ යථාභිරන්තං විහරිත්වා යෙන **නාතිකා**[1] තෙනුපසඞ්කමි. තත්‍ර සුදං භගවා නාතිකෙ විහරති **ගිඤ්ජකාවසථෙ**. අථ ඛො අම්බපාලි ගණිකා තස්සා රත්තියා අච්චයෙන සකෙ ආරාමෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: "කාලො භන්තෙ, නිට්ඨිතං භත්ත" න්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන අම්බපාලියා ගණිකාය පරිවෙසනා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන.

53. අථ ඛො අම්බපාලී ගණිකා බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො අම්බපාලී ගණිකා භගවන්තං එතදවොච: "ඉමාහං භන්තෙ, අම්බවනං බුද්ධපමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස දම්මී" ති. පටිග්ගහෙසි භගවා ආරාමං.

54. අථ ඛො භගවා අම්බපාලිං ගණිකං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා යෙන **මහාවනං** තෙනුපසඞ්කමි. තත්‍ර සුදං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං.

**ලිච්ඡවිභාණවාරො තතියො.**

---

1. 'නාදිකා" සී මු. "ඤාතිකා" P T S.

51. ඉක්බිති ඒ **ලිච්ඡවීහු** යානයෙන් යා හැකි බිම යම් පමණ ද, එපමණ යානයෙන් ගොස් යානයෙන් බැස පාගමනින් ම භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්හ. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් ඒ ලිච්ඡවීන්ට දැහැමි කතාවෙන් කරුණු දැක්වූහ. (එහි ඔවුන්) සමාදන් කරවූහ. තියුණු කරවූහ. සතුටු කරවූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කතාවෙන් කරුණු දක්වන ලද සමාදන් කරවන ලද තියුණු කරවන ලද සතුටු කරවන ලද ඒ ලිච්ඡවීහු භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සඞ්ඝයා සමග හෙට අපේ බත ඉවසන සේක්වා" යි සැළකළහ. "ලිච්ඡවීනි, අම්බපාලිගණිකාව විසින් හෙට බත පිණිස ආරාධිත වෙමි" යි (වදාළසේක). ඉක්බිති ඒ ලිච්ඡවීහු "භවත්නි, ගැහැණියක විසින් පරදවන ලද්දෝ වෙමු. භවත්නි, ගැහැණියක විසින් පරදවන ලද්දෝ වෙමු" යි අසුර ගැසූහ. එකල්හි ඒ ලිච්ඡවීහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙණ අනුමෝදන් ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ගියහ.

52. භාග්‍යවතුන් වහන්සේ **කොටිග්‍රාම**යෙහි කැමැති තාක් කල් වාසය කොට **නාතිකා**ගමට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ එහි නාතිකාගමෙහි ගඩොළින් කළ හෙයින් **ගිඤ්ජකාවසථ** නම් වූ ගෙඩිගෙයි වැඩ වසන සේක.

53. ඉක්බිති අම්බපාලිගණිකාව ඒ රෑ ඉක්ම යැමෙන් පසු සිය අරමෙහි ප්‍රණීත වූ කෑ යුතු බිදිය යුතු දෙය පිළියෙල කරවා "ස්වාමීනි, කාලය වේ. බත් නිමියේ" යි භාග්‍යවතුන් වහන්සේට කල් සැළකරවූ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරොවා පාසිවුරු ගෙණ අම්බපාලිගණිකාවගේ පරිවෙසනයට (බොජුන්හලට) වැඩි සේක. වැඩ භික්ෂුසඞ්ඝයා සමග පැණවූ අසුනෙහි වැඩ හුන් සේක.

54. ඉක්බිති අම්බපාලිගණිකාව බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයා ප්‍රණීත වූ කෑ යුතු දෙයින් බිදිය යුතු දෙයින් සියතින් සතප්පා පවරා, වළඳා අවසන් කළ පාත්‍රයෙන් බැහැර කළ අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙත පසෙක හුන්නී ය. පසෙක හුන් අම්බපාලිගණිකාව භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, මම මේ අඹඋයන බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝාට දෙමි" යි සැළකළා ය. භාග්‍යවතුන් වහන්සේ ආරාමය පිළිගත් සේක.

55. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අම්බපාලිගණිකාව දැහැමි කතාවෙන් කරුණු දක්වා සමාදන් කරවා තියුණු කරවා සතුටු කරවා හුනස්නෙන් නැගිට **මහාවනයට** වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ එහි **විශාලාමහනුවර** මහාවනයෙහි වූ කූටාගාරශාලාවෙහි වැඩ වසන සේක.

**ලිච්ඡවීඛණ්ඩවර නෙවැනි ය.**

———

5

1. තෙන ඛො පන සමයෙන අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී සන්ථාගාරෙ[1] සන්නිසින්නා සන්නිපතිතා අනෙකපරියායෙන බුද්ධස්ස වණ්ණං භාසන්ති. ධම්මස්ස වණ්ණං භාසන්ති. සඞ්ඝස්ස වණ්ණං භාසන්ති.

2. තෙන ඛො පන සමයෙන සීහො සෙනාපති නිගණ්ඨසාවකො තස්සං පරිසායං නිසින්නො හොති. අථ ඛො සීහස්ස සෙනාපතිස්ස එතදහොසි: "නිස්සංසයං ඛො සො භගවා අරහං සම්මාසම්බුද්ධො භවිස්සති. තථා හි මෙ අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී සන්ථාගාරෙ සන්නිසින්නා සන්නිපතිතා අනෙකපරියායෙන බුද්ධස්ස වණ්ණං භාසන්ති. ධම්මස්ස වණ්ණං භාසන්ති. සඞ්ඝස්ස වණ්ණං භාසන්ති. යන්නූනාහං තං භගවන්තං දස්සනාය උපසඞ්කමෙය්‍යං අරහන්තං සම්මාසම්බුද්ධ" න්ති.

3. අථ ඛො සීහො සෙනාපති යෙන නිගණ්ඨො නාතපුත්තො[2] තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා නිගණ්ඨං නාතපුත්තං අභිවාදෙත්වා[3] එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සීහො සෙනාපති නිගණ්ඨං නාතපුත්තං එතදවොච: "ඉච්ඡාමහං භන්තෙ, සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතු"න්ති. "කිං පන ත්වං සීහ, කිරියවාදො සමානො අකිරියවාදං සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සසි? සමණො හි සීහ, ගොතමො අකිරියවාදො, අකිරියාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී" ති. අථ ඛො සීහස්ස සෙනාපතිස්ස යො අහොසි ගමිකාභිසඞ්ඛාරො[4] භගවන්තං දස්සනාය සො පටිප්පස්සම්භි.

4. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී සන්ථාගාරෙ සන්නිසින්නා සන්නිපතිතා අනෙකපරියායෙන බුද්ධස්ස වණ්ණං භාසන්ති. ධම්මස්ස වණ්ණං භාසන්ති. සඞ්ඝස්ස වණ්ණං භාසන්ති. තතියම්පි ඛො සීහස්ස සෙනාපතිස්ස එතදහොසි: "නිස්සංසයං ඛො සො භගවා අරහං සම්මාසම්බුද්ධො භවිස්සති. තථා හි මෙ අභිඤ්ඤාතා අභිඤ්ඤාතා ලිච්ඡවී සන්ථාගාරෙ සන්නිසින්නා සන්නිපතිතා අනෙකපරියායෙන බුද්ධස්ස වණ්ණං භාසන්ති. ධම්මස්ස වණ්ණං භාසන්ති. සඞ්ඝස්ස වණ්ණං භාසන්ති. කිං හි මෙ කරිස්සන්ති නිගණ්ඨා අපලොකිතා වා අනපලොකිතා වා? යන්නූනාහං අනපලොකෙත්වාව නිගණ්ඨෙ තං භගවන්තං දස්සනාය උපසඞ්කමෙය්‍යං අරහන්තං සම්මාසම්බුද්ධ" න්ති.

5. අථ ඛො සීහො සෙනාපති පඤ්චහි රථසතෙහි දිවාදිවස්ස වෙසාලියා නිය්‍යාසි භගවන්තං දස්සනාය. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකොව යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සීහො සෙනාපති භගවන්තං එතදවොච: "සුතමෙතං භන්තෙ, අකිරියවාදො සමණො ගොතමො අකිරියාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතීති. යෙ තෙ භන්තෙ එවමාහංසු: 'අකිරියවාදො සමණො ගොතමො අකිරියාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති. කච්චි තෙ භන්තෙ, භගවතො වුත්තවාදිනො? න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛන්ති? ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොන්ති? න ච කොචි සහධම්මිකො වාදානුවාදො[5] ගාරය්හං ඨානං ආගච්ඡති? අනබ්භක්ඛාතුකාමා හි මයං භන්තෙ භගවන්ත" න්ති.

1. "සන්ධාගාරෙ" ම ඡ සං. 2 "නිගණ්ඨනාථ" සී. සී මු. "නිගණ්ඨනාට" ම ඡ සං.
3. "අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සීහො සෙනාපති නිගණ්ඨං නාතපුත්තං" ඉති අයං පාඨො න දිස්සතෙ මරම්මක්ඛරපොත්ථකෙ.
4 "ගමියාභිසඞ්ඛාරො" 5. "වාදනුපාතො" සබ්බත්ථ.

1. එකල්හි ඉතා ප්‍රසිද්ධ වූ (වැදගත්) ලිච්ඡවීහු සන්ථාගාර (රැස්වීම්) සාලාවෙහි රැස් ව නොයෙක් කරුණෙන් බුදුන්ගේ ගුණ කියත්. ධර්මයෙහි ගුණ කියත්. සඞ්ඝයාගේ ගුණ කියත්.

2. එවේලෙහි නිර්ග්‍රන්ථශ්‍රාවක වූ සීහසෙනාපති තෙමේ ඒ පිරිසෙහි හුන්නේ වේ. ඉක්බිති සීහසෙනාපතිහුහට "නිසැකයෙන් ම ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් සම්‍යක් සම්බුද්ධ වෙති. එහෙයින් ම මේ ඉතා ප්‍රසිද්ධ ලිච්ඡවීහු සන්ථාගාරයෙහි රැස් ව හුන්නෝ නොයෙක් අයුරින් බුදුන්ගේ ගුණ කියත්. ධර්මයේ ගුණ කියත්. සඞ්ඝයාගේ ගුණ කියත්. මම රහත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ දක්නට එළඹෙන්නෙම් නම්, යෙහෙකැ" යි සිතෙක් වි ය.

3. ඉක්බිති සීහසෙනාපති තෙමේ නිර්ග්‍රන්ථඥාත පුත්‍රයා වෙත ගියේ ය. ගොස් නිර්ග්‍රන්ථඥාතපුත්‍රයා සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් සීහසෙනාපති තෙමේ නිර්ග්‍රන්ථඥාතපුත්‍රයාහට "ස්වාමීනි, මම ශ්‍රමණ ගෞතමයන් දක්නට යැමට කැමැත්තෙමි" යි කීයේ ය. "සීහය, ක්‍රියාවාදී වූ තෝ අක්‍රියාවාදී වූ ශ්‍රමණ ගෞතමයන් දක්නට කුමක් නිසා එළඹෙන්-නෙහි ද ? සීහය, ශ්‍රමණ ගෞතම තෙමේ අක්‍රියාවාදී ය. නො කිරීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවයි". එකල්හි සීහසෙනාපතිහුහට භාග්‍යවතුන් වහන්සේ දැකීමට යැමෙහි යම් උත්සාහයෙක් වී ද, එය සංහිඳී ගියේ ය.

4. දෙවනු ද -පෙ- තෙවනු ද ඉතා ප්‍රසිද්ධ වූ ලිච්ඡවීහු සන්ථාගාරයෙහි රැස් ව හුන්නාහු නොයෙක් කරුණෙන් බුදුන්ගේ ගුණ කියත්. ධර්මයෙහි ගුණ කියත්. සඞ්ඝයාගේ ගුණ කියත්. තෙවනු ද සීහසෙනාපතියාහට "ඒ භාග්‍යවතුන් වහන්සේ නිසැකයෙන් ම අර්හත් සම්‍යක් සම්බුද්ධ වෙති. එබැවින් ම මේ ඉතා ප්‍රසිද්ධ වූ ලිච්ඡවීහු සන්ථාගාරයෙහි රැස් ව හුන්නාහු නොයෙක් අයුරින් බුදුන්ගේ ගුණ කියත්. ධර්මයෙහි ගුණ කියත්. සඞ්ඝයාගේ ගුණ කියත්. නිගණ්ඨයෝ විචාරණ ලද්දෝ හෝ නො විචාරණ ලද්දෝ හෝ මාහට කුමක් කරන්නාහු ද ? මම නිගණ්ඨයන් නො විචාරා ම රහත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස යන්නෙම් නම්, යෙහෙකැ" යි සිත් වි ය.

5. ඉක්බිති සීහසෙනාපති තෙමේ රිය පන්සියයකින් යුක්ත ව ඉර-මුදුන් දවල් භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස විශාලාමහානගරයෙන් නික්ම ගියේ ය. යානයෙන් යා යුතු සීමාව යම් පමණ ද, (එපමණ) යානයෙන් ගොස් යානයෙන් බැස පාගමනින් ම භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් සීහසෙනාපති තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, 'ශ්‍රමණ ගෞතම තෙමේ අක්‍රියාවාදී වේ. නො කිරීම පිණිස දහම් දෙසයි. එයින් ශ්‍රාවකයන් ද හික්මවා' යි මා විසින් මෙය අසන ලද්දේ ය. ස්වාමීනි, යම් ඒ කෙනෙක් 'ශ්‍රමණ ගෞතම තෙමේ අක්‍රියවාදී වේ. නො කිරීම පිණිස දහම් දෙසයි. එයින් ශ්‍රාවකයන් ද හික්මවා' යි මෙසේ කීහු ද, ස්වාමීනි, කිමෙක් ද, ඔහු භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද්දක් කියන්නාහු ද ? භාග්‍යවතුන් වහන්සේ බොරුවෙන් ගටා නො කියත් ද ? කාරණයට එකඟ වූවක් ප්‍රකාශ කෙරෙත් ද ? (එයින්) කරුණු සහිත වූ කිසියම් වාදයෙක් හෝ අනුවාදයෙක් ගැරහිය යුතු තැනට නො පැමිණේ ද ? ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් ගටා චොදනා නො කරනු කැමැත්තෝ ම වෙමු" යි (සැලකෙළේ ය).

6. "අත්ථි සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'අකිරියවාදෙ සමණො ගොතමො අකිරියාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති.

7. "අත්ථි සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'කිරියවාදෙ සමණො ගොතමො කිරියාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති.

8. "අත්ථි සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'උච්ඡෙදවාදෙ සමණො ගොතමො උච්ඡෙදාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති.

9. "අත්ථි සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'ජෙගුච්ඡී සමණො ගොතමො ජෙගුච්ඡිතාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති.

10. "අත්ථි සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'වෙනයිකො සමණො ගොතමො විනයාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති.

11. "අත්ථි සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'තපස්සී සමණො ගොතමො තපස්සිතාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති.

12. "අත්ථි සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'අපගබ්භො සමණො ගොතමො අපගබ්භතාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති.

13. "අත්ථි සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'අස්සත්ථො සමණො ගොතමො අස්සාසාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති.

14. "කතමො ච සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'අකිරියවාදෙ සමණො ගොතමො අකිරියාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති. අහං හි සීහ, අකිරියං වදාමි කායදුච්චරිතස්ස වචීදුච්චරිතස්ස මනොදුච්චරිතස්ස. අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං අකිරියං වදාමි. අයං ඛො සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'අකිරියවාදෙ සමණො ගොතමො අකිරියාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති.

15. "කතමො ච සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'කිරියවාදෙ සමණො ගොතමො කිරියාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති. අහං හි සීහ, කිරියං වදාමි කායසුචරිතස්ස වචීසුචරිතස්ස මනොසුචරිතස්ස. අනෙකවිහිතානං කුසලානං ධම්මානං කිරියං වදාමි. අයං ඛො සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'කිරියවාදෙ සමණො ගොතමො. කිරියාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති.

6. "සීහය, මැනවින් (ඇතිසැටි) කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ අක්‍රියාවාද ඇත්තේ නො කිරීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, එබඳු ක්‍රමයෙක් ඇත්තේ ය.

7. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ ක්‍රියාවාද ඇත්තේ කිරීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, එබඳු ක්‍රමයෙක් ඇත්තේ ය.

8. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ උච්ඡේදවාද ඇත්තේ සිඳ ලීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, එබඳු ක්‍රමයෙක් ඇත්තේ ය.

9. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ පිළිකුල් කරන්නේ පිළිකුල්බව පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, එබඳු ක්‍රමයෙක් ඇත්තේ ය.

10. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ විනාශ කරන්නේ විනාශය පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, එබඳු ක්‍රමයෙක් ඇත්තේ ය.

11. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ තපස් ඇත්තේ (තවන්නේ) තැවීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, එබඳු ක්‍රමයෙක් ඇත්තේ ය.

12. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ හීන වූ ගැබ් ඇත්තේ (ගබ්භාවාස - ඉපදීම් නැත්තේ) ගැබ් (ඉපදීම) පහ කිරීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, එබඳු ක්‍රමයෙක් ඇත්තේ ය.

13. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ අස්වැසුනේ අස්වැසුම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, එබඳු ක්‍රමයෙක් ඇත්තේ ය.

14. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ අක්‍රියාවාද ඇත්තේ නො කිරීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, ඒ ක්‍රමය කවරේ ද ? සීහය, මම කායදුච්චරිතය වචීදුච්චරිතය මනොදුච්චරිතය නො කිරීම කියමි. (සෙසු) නානාවිධ ලාමක අකුශල ධර්මයන් නො කිරීම කියමි. සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ අක්‍රියාවාද ඇත්තේ නො කිරීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, මේ ඒ ක්‍රමය වේ."

15. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ ක්‍රියාවාද ඇත්තේ කිරීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, ඒ ක්‍රමය කවරේ ද ? සීහය, මම කායසුචරිතය වචීසුචරිතය මනොසුචරිතය කිරීම කියමි. නානාවිධ කුශලධර්මයන්ගේ කිරීම කියමි. සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ ක්‍රියාවාද ඇත්තේ කිරීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, මේ ඒ ක්‍රමය වේ".

16. "කතමො ච සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'උච්ඡෙදවාදො සමණො ගොතමො උච්ඡෙදාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති. අහං හි සීහ, උච්ඡෙදං වදාමි රාගස්ස දොසස්ස මොහස්ස. අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං උච්ඡෙදං වදාමි. අයං ඛො සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'උච්ඡෙදවාදො සමණො ගොතමො උච්ඡෙදාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති.

17. "කතමො ච සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'ජෙගුච්ඡී සමණො ගොතමො ජෙගුච්ඡිතාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති. අහං හි සීහ, ජිගුච්ඡාමි කායදුච්චරිතෙන වචීදුච්චරිතෙන මනොදුච්චරිතෙන. අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා ජිගුච්ඡාමි. අයං ඛො සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: "ජෙගුච්ඡී සමණො ගොතමො ජෙගුච්ඡිතාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති.

18. "කතමො ච සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'වෙනයිකො සමණො ගොතමො විනයාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති. අහං හි සීහ, විනයාය ධම්මං දෙසෙමි රාගස්ස දොසස්ස මොහස්ස. අනෙකවිහිතානං පාපකානං අකුසලානං ධම්මානං විනයාය ධම්මං දෙසෙමි. අයං ඛො සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'වෙනයිකො සමණො ගොතමො විනයාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති.

19. "කතමො ච සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'තපස්සී සමණො ගොතමො තපස්සිතාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති. තපනීයාහං සීහ, පාපකෙ අකුසලෙ ධම්මෙ වදාමි කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං. යස්ස ඛො සීහ, තපනීයා පාපකා අකුසලා ධම්මා පහීණා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[1] ආයතිං අනුප්පාදධම්මා, තමහං තපස්සීති වදාමි. තථාගතස්ස ඛො සීහ, තපනීයා පාපකා අකුසලා ධම්මා පහීණා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. අයං ඛො සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: තපස්සී සමණො ගොතමො තපස්සිතාය ධම්මං දෙසෙතී. තෙන ච සාවකෙ විනෙතී' ති.

1. "අනභාවං කතා" ම ඡ සං. P T S.

16. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ උච්ඡේදවාද ඇත්තේ සිඳ ලීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, ඒ ක්‍රමය කවරේ ද? සීහය, මම රාගයාගේ ද්වේෂයාගේ මෝහයාගේ සිඳීම කියමි. නානාවිධ ලාමක අකුශලධර්මයන්ගේ සිඳීම කියමි. සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ උච්ඡේදවාද ඇත්තේ සිඳ ලීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, මේ ඒ ක්‍රමය වේ."

17. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ පිළිකුල් කරන්නේ පිළිකුල්බව පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, ඒ ක්‍රමය කවරේ ද? සීහය, මම කායදුච්චරිතය වචීදුච්චරිතය මනෝදුච්චරිතය පිළිකුල් කරමි. නානාවිධ ලාමක වූ අකුශලධර්මයන්ගේ ඉපදීම පිළිකුල් කරමි. සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ පිළිකුල් කරන්නේ පිළිකුල්බව පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, මේ ඒ ක්‍රමය වේ."

18. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ විනාශ කරන්නේ විනාශය පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, ඒ ක්‍රමය කවරේ ද? සීහය, මම රාගය ද්වේෂය මෝහය වැනසීම පිණිස දහම් දෙසමි. නානාවිධ ලාමක අකුශලධර්මයන්ගේ විනාශය පිණිස දහම් දෙසමි. සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ විනාශකාර වූයේ විනාශය පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, මේ ඒ ක්‍රමය වේ".

19. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ තවන්නේ තැවීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, ඒ ක්‍රමය කවරේ ද? සීහය, මම කායදුච්චරිතය වචීදුච්චරිතය මනෝදුච්චරිතය තැවිය යුතු වූ ලාමක අකුශලධර්මය යි කියමි. සීහය, යමකුගේ තැවිය යුතු වූ ලාමක අකුශලධර්මයෝ ප්‍රහීණ වූවාහු ද, සිඳින ලද මුල් ඇත්තාහු ද, මුදුන සිඳ දැමූ (නැවත නො වැඩෙන) තල්ගසක් සේ කරණ ලද්දාහු ද, පසු ව නූපදනා සේ විනාශයට පමුණුවන ලද්දාහු ද, මත්තෙහි නූපදනා සවභාවය ඇත්තාහු ද, මම ඔහු තපස්සී යි කියමි. සීහය තථාගතයන් වහන්සේගේ තැවිය යුතු වූ ලාමක වූ අකුශලධර්මයෝ ප්‍රහීණ වූහ. සිඳින ලද මුල් ඇත්තාහ. මුදුන සිඳ දැමූ තල්ගසක් සේ කරණ ලදහ. නැවත නූපදනා සේ විනාශයට පමුණුවන ලදහ. මත්තෙහි නූපදනා සවභාවය ඇත්තාහ. සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ තවන්නේ තැවීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, මේ ඒ ක්‍රමය වේ."

20. "කතමො ච සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'අපගබ්භො සමණො ගොතමො අපගබ්භතාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති. යස්ස ඛො සීහ, ආයතිං ගබ්භසෙය්‍යා පුනබ්භවාභිනිබ්බත්ති පහීණා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තමහං අපගබ්භොති වදාමි. තථාගතස්ස ඛො සීහ, ආයතිං ගබ්භසෙය්‍යා පුනබ්භවාභිනිබ්බත්ති පහීණා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. අයං ඛො සීහ, පරියායො යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'අපගබ්භො සමණො ගොතමො අපගබ්භතාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති.

21. "කතමො ච සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'අස්සත්ථො සමණො ගොතමො අස්සාසාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී' ති. අහං හි සීහ, අස්සත්ථො පරමෙන අස්සාසෙන. අස්සාසාය ච[1] ධම්මං දෙසෙමි. තෙන ච සාවකෙ විනෙමි. අයං ඛො සීහ, පරියායො, යෙන මං පරියායෙන සම්මා වදමානො වදෙය්‍ය: 'අස්සත්ථො සමණො ගොතමො අස්සාසාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී'' ති.

22. එවං වුත්තෙ සීහො සෙනාපති භගවන්තං එතදවොච: "අභික්කන්තං භන්තෙ. අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය: 'චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී' ති, එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ, භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගත"න්ති.

23. අනුවිච්චකාරං ඛො සීහ, කරොහි. අනුවිච්චකාරො තුම්හාදිසානං ඤාතමනුස්සානං සාධු හොතී ති. ඉමිනාපහං භන්තෙ භගවතො වචනෙන භිය්‍යොසොමත්තාය[2] අත්තමනො අභිරද්ධො, යං මං භගවා එවමාහ: "අනුවිච්චකාරං ඛො සීහ, කාරොහි. අනුවිච්චකාරො තුම්හාදිසානං ඤාතමනුස්සානං සාධු හොතී"ති. මමං හි භන්තෙ අඤ්ඤතිත්ථියා සාවකං ලභිත්වා කෙවලකප්පං වෙසාලිං පටාකං පරිහරෙය්‍යුං: 'සීහො[3] අම්හාකං සෙනාපති සාවකත්තං උපගතො' ති. අථ ච පන මං භගවා එවමාහ: "අනුවිච්චකාරං ඛො සීහ, කරොහි. අනුවිච්චකාරො තුම්හාදිසානං ඤාතමනුස්සානං සාධු හොතී" ති. එසාහං භන්තෙ දුතියම්පි භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගත" න්ති.

1. "අස්සාසාය" ම ඡ සං.
2. "භගවතො භිය්‍යොසොමත්තාය" ම ඡ සං
3. "සීහො ඛො" ම ඡ සං.

20. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ ගැබ් නැත්තේ ගැබ් නැසීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, ඒ ක්‍රමය කවරේ ද? සීහය, යමකුගේ මතු ගැබෙක හොවීම (මවුකුස විසීම) නැවැත භවයක ඉපදීම ප්‍රහීණ වී ද, සිඳ දැමූ මුල් ඇත්තේ ද, මුදුන සිඳ දැමූ නැවත හට නො ගන්නා තල්ගසක් සේ කරණ ලද්දේ ද, අභාවයට පමුණුවන ලද්දේ ද, මත්තෙහි නූපදනා ස්වභාවය ඇත්තේ ද, මම ඔහු අපගබ්භ ය යි කියමි. සීහය, තථාගතයන්ගේ මතු මවුකුස විසීම නැවැත භවයෙක ඉපදීම ප්‍රහීණ වී ය. සිඳින ලද මුල් ඇත්තේ ය. මුදුන සිඳ දැමූ තල්ගසක් සේ කරණ ලද්දේ ය. අභාවයට පමුණුවන ලද්දේ ය. මත්තෙහි නූපදනා ස්වභාවය ඇත්තේ ය. සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ ගැබ් නැත්තේ ගැබ් නසනු පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, මේ ඒ ක්‍රමය වේ".

21. "සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණ ගෞතම තෙමේ අස්වැසුනේ අස්වැසීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, ඒ ක්‍රමය කවරේ ද? සීහය, මම උතුම් වූ (සිවුමගපල) අස්වැසීමෙන් සැනසුනේ වෙමි. අස්වැසීම පිණිස දහම් දෙසමි. එයින් ම ශ්‍රාවකයන් හික්මවමි. සීහය, මැනවින් කියන්නෙක් යම් ක්‍රමයකින් 'ශ්‍රමණගෞතමතෙමේ අස්වැසුනේ අස්වැසීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවා' යි මට කියන්නේ නම්, මේ ඒ ක්‍රමය වේ."

22. මෙසේ වදාළ කල්හි සීහසෙනාපති තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, ඉතා යහපත් ය. ස්වාමීනි, ඉතා යහපත් ය. ස්වාමීනි, යටිකුරු කරණ ලද්දක් යම් සේ උඩුකුරු කරන්නේ ද, වසන ලද්දක් යම් සේ විවෘත කරන්නේ ද, මං මුළා වූවකුට යම් සේ මග කියන්නේ ද, 'ඇස් ඇත්තෝ රූප දකින්නාහු ය' යි ගනඳුරෙහි තෙල්පහනක් යම් සේ දරන්නේ ද, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් දහම් දෙසන ලද්දේ ය. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ ද, නව ලොකොත්තර ධර්මය ද, අෂ්ටාර්‍ය්‍යපුද්ගල භික්ෂුසඞ්ඝයා ද සරණ කොට යමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවි හිමි කොට සරණ ගියා වූ උපාසකයකු කොට මා දරණ සේක්වා" යි සැළ කෙළේය.

23. සීහය, දැන (සිතා බලා) ක්‍රියා කරව, තොප වැනි ප්‍රසිද්ධ මිනිසුන්ට සලකා බලා ක්‍රියා කිරීම සුදුසු වේ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ "සීහය, දැන ක්‍රියා කරව. තොප වැනි ප්‍රසිද්ධ මිනිසුන්ට සලකා බලා කිරීම සුදුසු වේ" යි මෙසේ මට යම් වචනයක් වදාළ සේක් ද, මම භාග්‍යවතුන් වහන්සේගේ මේ වචනයෙන් ඉතා බොහෝ සේ සතුටු වූයෙම් ඇලුනෙම් වෙමි. "ස්වාමීනි, අන්‍යතීර්ථකයෝ (නම්) මා වැනි ශ්‍රාවකයකු ලැබ 'සීහසෙනාපති තෙමේ අපගේ ශ්‍රාවකභාවයට පැමිණියේ' යි මුළු විශාලා මහනුවර දද නංවා (හඬ නගා) ඇවිදින්නාහු ය. එහෙත් භාග්‍යවතුන් වහන්සේ 'සීහය, දැන ක්‍රියා කරව. තොප වැනි ප්‍රසිද්ධ මිනිසුන්ට දැන කිරීම සුදුසු වේ' යි මට මෙසේ වදාළ සේක. ස්වාමීනි, මේ මම දෙවනු ද භාග්‍යවතුන් වහන්සේ ද, නවලොකොත්තරධර්මය ද, අෂ්ටාර්‍ය්‍යපුද්ගලභික්ෂුසඞ්ඝයා ද සරණ කොට යමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවි හිමි කොට සරණ ගියා වූ උපාසකයකු කොට මා දරණ සේක්වා."

24. දීඝරත්තං බො තෙ සීහ, නිගණ්ඨානං ඔපානභූතං කුලං, යෙන තෙසං උපගතානං පිණ්ඩකං[1] දාතබ්බං මඤ්ඤෙය්‍යාසී ති. ඉමිනාපහං භන්තෙ, භගවතො වචනෙන භීයොසොමත්තාය අත්තමනො අභිරද්ධො, යං මං භගවා එවමාහ: "දීඝරත්තං බො තෙ සීහ, නිගණ්ඨානං ඔපානභූතං කුලං, යෙන තෙසං උපගතානං පිණ්ඩකං දාතබ්බං මඤ්ඤෙය්‍යාසී" ති.

25. සුතං මෙතං භන්තෙ, "සමණො ගොතමො එවමාහ: මය්හමෙව දානං දාතබ්බං. න අඤ්ඤෙසං දානං දාතබ්බං. මය්හමෙව සාවකානං දානං දාතබ්බං. න අඤ්ඤෙසං සාවකානං දානං දාතබ්බං. මය්හමෙව දින්නං මහප්ඵලං. න අඤ්ඤෙසං දින්නං මහප්ඵලං. මය්හමෙව සාවකානං දින්නං මහප්ඵලං. න අඤ්ඤෙසං සාවකානං දින්නං මහප්ඵල" න්ති. අථ ච පන මං භගවා නිගණ්ඨෙසුපි දානෙ සමාදපෙති. අපි ච භන්තෙ, මයමෙත්ථ කාලං ජානිස්සාම. එසාහං භන්තෙ, තතියම්පි භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගත න්ති.

26. අථ බො භගවා සීහස්ස සෙනාපතිස්ස ආනුපුබ්බිකථං කථෙසි සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං, කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං. නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි. යදා භගවා අඤ්ඤාසි සීහ සෙනාපතිං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා, තං පකාසෙසි: දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පතිග්ගණ්හෙය්‍ය, එවමෙව සීහස්ස සෙනාපතිස්ස තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: "යංකිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම" න්ති.

27. අථ බො සීහො සෙනාපති දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච: "අධිවාසෙතු මෙ භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා" ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ බො සීහො සෙනාපති භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

28. අථ බො සීහො සෙනාපති අඤ්ඤතරං පුරිසං ආණාපෙසි: "ගච්ඡ භණෙ, පවත්තමංසං ජානාහී" ති. අථ බො සීහො සෙනාපති තස්සා රත්තියා අච්චයෙන පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: "කාලො භන්තෙ, නිට්ඨිතං භත්ත" න්ති. අථ බො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන සීහස්ස සෙනාපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන.

1. "පිණ්ඩපාතං" ම ජ සං.

24. සීහය, තොපගේ කුලය (නිවෙස) බොහෝ කලක් නිඝණ්ඨයන්ට පැන් පොකුණක් සේ සිටියේ ය. එහෙයින් (තොප) වෙත පැමිණි නිඝණ්ඨයන්ට පිණ්ඩාහාරය දිය යුතු ය යි සිතව''. (බුදුන් සරණ ගිය මුත් නිඝණ්ඨයන් පැමිණි කල ඔවුන්ට දෙන දෑ නො සිඳ දිය යුතු ම ය යි යු සේ යි.) ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, 'සීහය, තොපගේ කුලය බොහෝ කලක් නිඝණ්ඨයන්ට පැන්පොකුණක් සේ විය. එහෙයින් වෙත පැමිණි නිඝණ්ඨයන්ට පිඬු දිය යුතු ය යි සිතව' යි මට යම් වචනයක් වදාළ සේක් ද, මම භාග්‍යවතුන් වහන්සේගේ මේ වචනයෙන් ද ඉතා බොහෝ සේ සතුටු වූයෙම් ඇලුනෙම් වෙමි.

25. ස්වාමීනි, ''ශ්‍රමණ ගෞතම තෙමේ 'මට ම දන් දිය යුතු ය. අන්හට දන් නො දිය යුතු ය. මාගේ ම ශ්‍රාවකයන්ට දන් දිය යුතු ය. අන්‍යයන්ගේ ශ්‍රාවකයන්ට දන් නො දිය යුතු ය. මට ම දෙන ලද්ද මහත්ඵල ඇත්තේ ය. අන්හට දෙන ලද්ද මහත්ඵල ඇත්තේ නො වේ. මාගේ ම ශ්‍රාවකයන්ට දෙන ලද්ද මහත්ඵල ඇත්තේ ය. අන්‍යයන්ගේ ශ්‍රාවකයන්ට දෙන ලද්ද මහත්ඵල ඇත්තේ නො වේ' යි මෙසේ වදාරන්නේ ය'' යි මා විසින් අසන ලද්දේ ය. එහෙත් භාග්‍යවතුන් වහන්සේ නිගණ්ඨයන් කෙරෙහි ද දීමෙහි මා සමාදන් කරවන සේක. (මෙහෙයවන සේක). ස්වාමීනි, වේවා; අපි මෙහි කල් දන්නෙමු. ස්වාමීනි, මේ මම තෙවනු ද භාග්‍යවතුන් වහන්සේ ද, නවලොකොත්තරධර්ම ය ද අෂ්ටාර්‍ය්‍ය-පුද්ගලභික්ෂුසඞ්ඝයා ද, සරණ කොට යමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවි හිමි කොට සරණ ගියා වූ උපාසකයකු කොට මා දරණ සේක්වායි.

26. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සීහසෙනාපතිහුහට දානකථාව සීලකථාව ස්වර්ගකථාව කාමයන් දුක්ඛව ලාමකබව කෙලෙසීමට හෙතු වන බව යන පිළිවෙලකථාව වදාළසේක. පැවිද්දෙහි අනුසස් ද ප්‍රකාශ කළ සේක. භාග්‍යවතුන් වහන්සේ යම් විටෙක සීහසෙනාපතියා සුදුසු සිත් ඇතැ යි, මොලොක් සිත් ඇතැ යි, නීවරණ රහිත වූ සිත් ඇතැ යි, ඔදවැඩි සිත් ඇතැ යි, පහන් සිත් ඇතැ යි, දත් සේක් ද, එකල බුදුවරුන්ගේ තමන් (=ස්වභාවයෙන්) ම උත්කෘෂ්ට වූ ධර්මදෙශනාව - දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍යය මාර්‍ගසත්‍යය යන මේ චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශ කළ සේක. පහ වූ කිලුටු ඇති පිරිසිදු වස්ත්‍රයෙක් යම් සේ මනා කොට සායම් ගන්නේ ද, එසේ ම සීහසෙනාපතිහුහට ඒ ආසනයෙහි දී ම ''යම් කිසිවක් හටගැණීම ස්වභාවය කොට ඇත්තේ ද, ඒ සියල්ල නිරුද්ධ වීම ස්වභාවය කොට ඇතැ'' යි පහ වූ රාගාදි රජස් ඇති පහ වූ කෙලෙස්මල ඇති සොතාපත්ති-මග්ගඥානය පහළ වූයේ ය.

27. ඉක්බිති දක්නා ලද දහම් ඇති පැමිණි දහම් ඇති අවබොධ කළ දහම් ඇති වෙසෙසින් බැස ගත් දහම් ඇති තරණය කළ විචිකිච්ඡා ඇති පහ වූ කෙසේ කෙසේ දෑ යි පැවැති සැක ඇති විශාරදභාවයට පැමිණි, බුදුදහමෙහි අනුන්ගේ උපකාරයක් නො වුව මනා වූ සීහසෙනාපති තෙමේ භාග්‍යවතුන් වහන්සේට ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු-සඞ්ඝයා සමග හෙට මාගේ බත ඉවසන සේක්වා'' යි සැලකෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූ සේක. අනතුරු ව සීහ සෙනාපති තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ගියේ ය.

28. ඉක්බිති සීහසෙනාපති තෙමේ ''සගය, යව. ප්‍රවෘත්තමාංස (විකුණන මස්) තිබේ දැ යි දනුව'' යි එක්තරා පුරුෂයකුට අණවී ය. නැවැත සීහසෙනා-පති තෙමේ ඒ රැය ඉක්ම යැමෙන් පසු ප්‍රණීත වූ කෑ යුතු වූ බිදිය යුතු වූ දෙය පිළියෙල කරවා භාග්‍යවතුන් වහන්සේට ''ස්වාමීනි, මේ කාල ය යි. බත් නිමියේ'' යි කල් සැලකරවී ය. භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලෙහි හැඳ පොරොවා පාසිවුරු ගෙණ සීහසෙනාපතියාගේ නිවෙසට වැඩි සේක. වැඩ භික්ෂුසඞ්ඝයා සමග පැණවූ අසුනෙහි වැඩ හුන් සේක.

29. තෙන ඛො පන සමයෙන සම්බහුලා නිගණ්ඨා වෙසාලියං රථියා රථියං[1] සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං බාහා පග්ගය්හ කන්දන්ති: "අජ්ජ සීහෙන සෙනාපතිනා ථූලං පසුං[2] වධිත්වා සමණස්ස ගොතමස්ස භත්තං කතං. තං සමණො ගොතමො ජානං උද්දිස්සකටං මංසං පරිභුඤ්ජති පටිච්චකම්ම" න්ති.

30. අථ ඛො අඤ්ඤතරො පුරිසො යෙන සීහො සෙනාපති තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සීහස්ස සෙනාපතිස්ස උපකණ්ණකෙ ආරොචෙසි: "යග්ඝෙ භන්තෙ, ජානෙය්‍යාසි ? එතෙ සම්බහුලා නිගණ්ඨා වෙසාලියං රථියා රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං බාහා පග්ගය්හ කන්දන්ති: අජ්ජ සීහෙන සෙනාපතිනා ථූලං පසුං වධිත්වා සමණස්ස ගොතමස්ස භත්තං කතං. තං සමණො ගොතමො ජානං උද්දිස්සකටං මංසං පරිභුඤ්ජති පටිච්චකම්ම" න්ති.

31. "අලං අය්‍යො, දීඝරත්තම්පි තෙ ආයස්මන්තා අවණ්ණකාමා බුද්ධස්ස. අවණ්ණකාමා ධම්මස්ස. අවණ්ණකාමා සඞ්ඝස්ස. න ච පන තෙ ආයස්මන්තා ජීරන්ති[3] තං භගවන්තං අසතා තුච්ඡා මුසා අභූතෙන අබ්භාචික්ඛන්තා. න ච මයං ජීවිතහෙතුපි සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍යාමා" ති.

32. අථ ඛො සීහො සෙනාපති බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො සීහං සෙනාපතිං භගවා ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

33. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, ජානං උද්දිස්සකටං මංසං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, තිකොටිපරිසුද්ධං මච්ඡමංසං: අදිට්ඨං අසුතං අපරිසඞ්කිත" න්ති.

34. තෙන ඛො පන සමයෙන වෙසාලී සුභික්ඛා හොති සුසස්සා[4] සුලභපිණ්ඩා. සුකරා උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං.

35. අථ ඛො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "යානි තානි මයා භික්ඛූනං අනුඤ්ඤාතානි දුබ්භික්ඛෙ දුස්සස්සෙ දුල්ලභපිණ්ඩෙ අන්තොවුත්ථං අන්තොපක්කං සාමංපක්කං, උග්ගහිතපටිග්ගහිතකං, තතො නීහටං, පුරෙභත්තං පටිග්ගහිතං, වනට්ඨං, පොක්ඛරට්ඨං, අජ්ජාපි නු ඛො තානි භික්ඛූ පරිභුඤ්ජන්තී" ති.

1. "රථිකාය රථිකං" ම ඡ සං
2. "ථූලං පසුං" ම ඡ සං.
3. "ජිරිදන්ති" ම ඡ සං.
4. "සුසයස්සා" සී මු.

Free Distribution www.aathaapi.org

29. එසමයෙහි බොහෝ නිගණ්ඨයෝ විශාලාමහනුවර වීථියෙන් වීථියෙහි සතරමංසන්ධියෙන් සතරමංසන්ධියෙහි (සිටගෙණ) දෙඅත් ඔසොවා ගෙණ "අද සීහසෙනාපතියා විසින් තරබාරු සිවුපාවකු මරා ශ්‍රමණ ගෞතමයාට බත් කරණ ලද්දේ ය. ශ්‍රමණ ගෞතම තෙමේ තමන් උදෙසා කළ (මරණ ලද) තමන් නිමිති කොට (කන්නා විසින් ද ස්පර්ශ කරණ ප්‍රාණඝාතකර්‍මී) ඇති ඒ මස් දැන ගෙණ වළඳා" යි විලාප (අඬෝනා) කියත්.

30. එවිට එක්තරා පුරුෂයෙක් සීහසෙනාපතියා වෙතට ගියේ ය. ගොස් සීහසෙනාපතියාට "ස්වාමීනි, දන්නෙහි ද ? මේ බොහෝ නිගණ්ඨයෝ විශාලාමහනුවර වීථියෙන් වීථියට සතරමංසන්ධියෙන් සතරමංසන්ධියට පැමිණ 'අද සීහසෙනාපතියා විසින් තරබාරු සිවුපාවකු මරා ශ්‍රමණ ගෞතමයාහට බත් කරණ ලද්දේ ය. ශ්‍රමණ ගෞතම තෙමේ තමන් උදෙසා කළ තමන් නිමිති කොට ඇති ඒ මස් දැන ගෙණ වළඳා' යි දෙඅත් ඔසොවා ගෙණ අඬෝනා කියත්" යි කණ ලඟ (කොඳුරා) දැන්වී ය.

31. "පින්වත, කම් නැත. ඒ ආයුෂමත්හු බොහෝ කලක් ම බුදුන්ගේ අගුණ කියනු කැමැත්තෝ ය. ධර්‍මයෙහි අගුණ කියනු කැමැත්තෝ ය. සඞ්ඝයාගේ අගුණ කියනු කැමැත්තෝ ය. ඒ භාග්‍යවතුන් වහන්සේට නැත්තා වූ හිස් වූ බොරු වූ අවිද්‍යමාන වූ කරුණකින් ගටා කියන්නා වූ ඒ ආයුෂමත්හු නො දිරත්. (චෝදනාවෙහි කෙළවරට නො පැමිණෙත්.) අපි ජීවිතහෙතුවෙන් වත් දැන දැන ප්‍රාණියකු ජීවිතයෙන් තොර නො කරන්නෙමු."

32. ඉක්බිති සීහසෙනාපති තෙමේ බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයා ප්‍රණීත වූ කෑ යුතු දෙයින් බිදිය යුතු දෙයින් සියතින් සතප්පා පවරා, වළඳා අවසන් කළ පාත්‍රයෙන් බැහැරට ගත් අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙත පසෙක හුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් සීහසෙනාපතියා දැහැමි කතාවෙන් කරුණු දක්වා සමාදන් කරවා තියුණු කරවා සතුටු කරවා හුනස්නෙන් නැගිට වැඩි සේක.

33. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් අමතා "මහණෙනි, දැන දැන තමන් උදෙසා කළ මස් නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම් දුකුලා-ඇවැත් වේ" යි වදාළ සේක. "මහණෙනි, තමන් විසින් නො දුටු, නො ඇසූ, සැක නො කළ, ත්‍රිකොටිපරිශුද්ධ මත්ස්‍යමාංස අනුදනිමි".

34. එකල්හි විශාලාමහනුවර සුලභ වූ භික්ෂා ඇත්තේ යහපත් සස්‍ය ඇත්තේ සුව සේ ලැබිය හැකි ආහාර ඇත්තේ පාත්‍රය ගෙණ පිඬු සිඟා යැමෙන් යැපීමට පහසු වූයේ වේ.

35. ඉක්බිති රහොගත වූ විවේකයට පැමිණ හුන් භාග්‍යවතුන් වහන්-සේගේ සිතෙහි මෙබඳු කල්පනාවෙක් පහළ වි ය: "භික්ෂා නැති සස්‍ය නැති දුර්ලභ වූ පිඬු ඇති කාලයෙහි - ඇතුළත තබන ලද ඇතුළත පිසන ලද තමන් විසින් පිසන ලද්ද, පෙර පිළිගන්නා ලද නැවැත පිළිගත් දෙය, වැළඳූ තැනින් ගෙණෙන ලද්ද, පෙරවරුයෙහි පිළිගන්නා ලද්ද, වනයෙහි හටගත් දෙය, පියුම්ගසෙහි හටගත් දෙය යන යම් ඒ දෑ මා විසින් භික්ෂූන්ට අනුදන්නා ලද ද භික්ෂූහු ඒ දෑ අදත් පරිභොග කෙරෙත්ද" යි (කියායි).

36. අථ ඛො භගවා සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "යානි තානි ආනන්ද, මයා භික්ඛූනං අනුඤ්ඤාතානි දුබ්භික්ඛෙ දුස්සස්සෙ දුල්ලභපිණ්ඩෙ අන්තො වුත්ථං අන්තො පක්කං සාමං පක්කං, උග්ගහිතපටිග්ගහිතකං, තතො නීහටං, පුරෙභත්තං පටිග්ගහිතං, වනට්ඨං, පොක්ඛරට්ඨං, අජ්ජාපි නු ඛො තානි භික්ඛූ පරිභුඤ්ජන්තී" ති. "පරිභුඤ්ජන්ති භගවා" ති.

37. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "යානි තානි භික්ඛවෙ, මයා භික්ඛූනං අනුඤ්ඤාතානි දුබ්භික්ඛෙ දුස්සස්සෙ දුල්ලභපිණ්ඩෙ අන්තො වුත්ථං අන්තො පක්කං සාමං පක්කං, උග්ගහිතපටිග්ගහිතකං, තතො නීහටං, පුරෙභත්තං පටිග්ගහිතං, වනට්ඨං, පොක්ඛරට්ඨං, තානාහං අජ්ජතග්ගෙ පටික්ඛිපාමි. න භික්ඛවෙ, අන්තො වුත්ථං අන්තො පක්කං සාමං පක්කං, උග්ගහිතපටිග්ගහිතකං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. න ච භික්ඛවෙ, තතො නීහටං, පුරෙභත්තං පටිග්ගහිතං, වනට්ඨං, පොක්ඛරට්ඨං භුත්තාවිනා පවාරිතෙන අනතිරිත්තං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය, යථා ධම්මො කාරෙතබ්බො" ති.

38. තෙන ඛො පන සමයෙන ජානපදා මනුස්සා බහුං ලොණම්පි තෙලම්පි තණ්ඩුලම්පි ඛාදනීයම්පි සකටෙසු ආරොපෙත්වා බහාරාමකොට්ඨකෙ සකටපරිවත්තං කරිත්වා අච්ඡන්ති: "යදා පටිපාටිං ලභිස්සාම, තදා භත්තං කරිස්සාමා" ති. මහා ච මෙඝො උග්ගතො හොති.

39. අථ ඛො තෙ මනුස්සා යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතදවොචුං: "ඉධ භන්තෙ ආනන්ද, බහුං ලොණම්පි තෙලම්පි තණ්ඩුලම්පි ඛාදනීයම්පි සකටෙසු ආරොපිතා[1] තිට්ඨන්ති. මහා ච මෙඝො උග්ගතො. කථන්නු ඛො භන්තෙ ආනන්ද,[2] පටිපජ්ජිතබ්බ" න්ති.

40. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි. "තෙනහානන්ද, සඞ්ඝො පච්චන්තිමං විහාරං කප්පියභූමිං සම්මන්නිත්වා තත්ථ වාසෙතු, යං සඞ්ඝො ආකඞ්ඛති විහාරං වා අඩ්ඪයොගං වා පාසාදං වා හම්මියං වා ගුහං වා. එවඤ්ච පන භික්ඛවෙ, සම්මන්නිතබ්බො[3]- ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: "සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං විහාරං කප්පියභූමිං සම්මන්නෙය්‍ය, එසා ඤත්ති. සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං විහාරං කප්පියභූමිං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස විහාරස්ස කප්පියභූමියා සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය. සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො විහාරො කප්පියභූමි. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

1. "ආරොපෙත්වා" සී මු. 2 "භන්තෙ" ම ඡ සං.
3. "සම්මන්නිතබ්බා" ම ඡ සං.

36. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි විවේකයෙන් නැඟී සිටි සේක් "ආනන්දය, භික්ෂා නැති සස්‍ය නැති පිඬු දුර්ලභ වූ කාලයෙහි- ඇතුළත තබන ලද ඇතුළත පිසන ලද තමන් විසින් පිසන ලද දෙය, පෙර පිළිගන්නා ලද නැවැත පිළිගත් දෙය, වැළඳූ තැනින් ගෙණෙන ලද්ද, පෙරවරු පිළිගන්නා ලද්ද, වනයෙහි හටගත් දෙය පියුම්ගසෙහි හටගත් දෙය යන යම් ඒ දෑ මා විසින් භික්ෂූන්ට අනුදන්නා ලද ද භික්ෂූහු ඒ දෑ අදත් වළඳත් ද" යි ආයුෂ්මත් ආනන්ද තෙරුන් විචාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, වළඳත්" යි ආනන්ද තෙරහු සැලකළහ.

37. අනතුරු ව භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට "මහණෙනි, භික්ෂා නැති සස්‍ය නැති දුර්ලභ වූ පිඬු ඇති කාලයෙහි - ඇතුළත තබන ලද ඇතුළත පිසන ලද තමන් විසින් පිසන ලද දෙය, පෙර පිළිගන්නා ලද නැවැත පිළිගත් දෙය, වැළඳූ තැනින් ගෙණෙන ලද්ද, පෙරවරුයෙහි පිළිගන්නා ලද්ද, වනයෙහි හටගත් දෙය, පියුම්ගසෙහි හටගත් දෙය යන යම් ඒ දෑ මා විසින් භික්ෂූන්ට අනුදන්නා ලද ද, මම අද පටන් ඒ දෑ ප්‍රතික්ෂෙප කරමි. මහණෙනි, ඇතුළත තබන ලද ඇතුළත පිසන ලද තමන් විසින් පිසන ලද දෙය, පෙර පිළිගන්නා ලද නැවැත පිළිගත් දෙය, නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, දුකුලාඇවැත් වේ. මහණෙනි, වළඳා අවසන් කළ පවාරණය කළ මහණහු විසින් වැළඳූ තැනින් ගෙණෙන ලද, පෙරවරුයෙහි පිළිගන්නා ලද, වනයෙහි හටගත් පියුම්ගසෙහි හටගත් අනතිරිකත වූ, දෙය නො වැළඳිය යුතු ය. යමෙක් වළඳන්නේ නම්, ඇවැත් පරිදි කරවිය යුතු ය" යි.

38. එකල්හි දනවුවැසි මිනිස්සු බොහෝ ලුණු ද තෙල් ද සහල් ද කෑ යුතු දෑ ද ගැල්වල පටවා ආරාමකොටුවෙන් පිටත ගැල්වට තබා "යම් විටෙක පිළිවෙල වාරය ලබන්නෙමු ද එවිට බත් පිළියෙල කරන්නෙමු" යි බලා සිටිත්. මහාමේඝයෙක් ද නැගුනේ වෙයි.

39. ඉක්බිති ඒ මිනිස්සු ආයුෂ්මත් ආනන්ද තෙරුන් වෙතට ගියහ. ගොස් "ස්වාමීනි, ආනන්දස්ථවිරයන් වහන්ස, මෙහි බොහෝ ලුණු ද තෙල් ද සහල් ද කෑ යුතු දෑ ද ගැල්වල පටවා තිබේ. මහා මේඝයෙක් ද නැංගේ ය. ස්වාමීනි, ආනන්දස්ථවිරයන් වහන්ස, කුමක් කළ යුතු ද" යි ආයුෂ්මත් ආනන්ද තෙරුන් විචාළහ.

40. එවිට ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "ආනන්දය, එසේ නම් සඞ්ඝ තෙමේ යම් වෙහෙරක් හෝ අඩපියසි ඇති ගෙයක් හෝ පහයක් හෝ සඳලු සහිත ගෙයක් හෝ ගුහාවක් හෝ යන යම් තැනක් කැපබිමක් කිරීමට කැමැති වේ ද, එබඳු පසු පසෙක පිහිටි විහාරයක් කැපබිම සේ සම්මත කොට එහි තැන්පත් කෙරේවා. මහණෙනි, මෙසේ සම්මත කළ යුතු ය: ව්‍යක්ත වූ ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය: "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ මෙනම් විහාරය කැපබිම කොට සම්මත කරන්නේ ය. මේ දැන්වීම ය. ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ මෙනම් විහාරය කැප බිම කොට සම්මත කරයි. යම් ආයුෂ්මතකුහට මෙනම් විහාරය කැපබිමක් කොට සම්මත කිරීම රුචි වේ නම්, හෙ තෙමේ නිශ්ශබ්ද වේවා. යමකුහට රුචි නො වේ නම්, හෙ තෙමේ කියාවා. සඞ්ඝ තෙමේ මෙනම් විහාරය කැපබිම කොට සම්මත කරණ ලද්දේ ය. සඞ්ඝයාට (එය) රුචි වේ. එහෙයින් නිශ්ශබ්ද වේ. මෙය මෙසේ දරමි" යි.

41. තෙන ඛො පන සමයෙන මනුස්සා තත්‍ථෙව සම්මුතියා[1] කප්පියභූමියා යාගුයො පචන්ති. භත්තානි පචන්ති. සූපානි සම්පාදෙන්ති. මංසානි කොට්ටෙන්ති. කට්ඨානි ඵාලෙන්ති.

42. අස්සොසි ඛො භගවා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය උච්චාසද්දං මහාසද්දං කාකොරවසද්දං. සුත්වාන ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: “කින්නු ඛො සො ආනන්ද, උච්චාසද්දො මහාසද්දො කාකොරවසද්දො”? ති. “එතරහි භන්තෙ, මනුස්සා තත්‍ථෙව සම්මුතියා කප්පියභූමියා යාගුයො පචන්ති. සූපානි සම්පාදෙන්ති. මංසානි කොට්ටෙන්ති. කට්ඨානි ඵාලෙන්ති. සො එසො භගවා උච්චාසද්දො, මහාසද්දො, කාකොරවසද්දො” ති.

43. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: “න භික්ඛවෙ, සම්මුතිකප්පියභූමි පරිභුඤ්ජිතබ්බා.. යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ, තිස්සො කප්පියභූමියො: උස්සාවනන්තිකං ගොනිසාදිකං ගහපති” න්ති.

44. තෙන ඛො පන සමයෙන ආයස්මා **යසොජො** ගිලානො හොති. තස්සත්‍ථාය භෙසජ්ජානි ආහරීයන්ති. තානි භික්ඛූ බහි වාසෙන්ති. උක්කපිණ්ඩකාපි ඛාදන්ති. චොරාපි හරන්ති. භගවතො එතමත්‍ථං ආරොචෙසුං. “අනුජානාමි භික්ඛවෙ, සම්මුතිං කප්පියභූමිං පරිභුඤ්ජිතුං. අනුජානාමි භික්ඛවෙ, චතස්සො කප්පියභූමියො: උස්සාවනන්තිකං ගොනිසාදිකං ගහපතිං සම්මුති” න්ති.

**සීහභාණවාරො චතුත්‍ථො.**

---

1 “සම්මතිකාය සී.

41. එකල්හි මිනිස්සු එහි ම - සම්මත කරණ ලද කැපකිරීමෙහි කැඳ පිසත්. බත් පිසත්. ව්‍යඤ්ජන සපයත්. මස් කපත්. දර පළත්.

42. භාග්‍යවතුන් වහන්සේ රෑ අලුයම්හි නැඟී සිට උස්හඬ මහහඬ කවුඩුහඬ ඇසූ සේක. අසා "ආනන්දය, ඒ උස්හඬ මහහඬ කවුඩුහඬ කිමැ" යි ආයුෂ්මත් ආනන්දතෙරුන් විචාළ සේක. "ස්වාමීනි, මිනිස්සු දැන් සම්මත භූමියෙහි ම කැඳ පිසත්. බත් පිසත්. ව්‍යඤ්ජන සපයත්. මස් කපත්. දර පළත්. භාග්‍යවතුන් වහන්ස, මේ ඒ උස්හඬ මහහඬ කවුඩුහඬ ය".

43. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූ සේක. "මහණෙනි, සම්මත කළ කැපකිරීම පරිභොග නො කට යුතු ය. යමෙක් පරිභොග කරන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, උස්සාවනන්තිකා කිළිය, ගොනිසාදි කිළිය, ගහපති කිළිය යි කැපකිරීම් තුණක් අනුදනිමි".

44. එකල්හි ආයුෂ්මත් යශොජසථවිර තෙමේ ගිලන් වේ. උන්වහන්සේ පිණිස බෙහෙත් ගෙණෙනු ලැබේ. භික්ෂූහු ඒ බෙහෙත් බැහැර තබවත්. බලල් මී ආදී සත්තු ද කත්. සොරු ද ගෙණ යත්. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැළකළහ. "මහණෙනි, සම්මත කළ කැපකිරීම පරිභොග කරන්නට අනුදනිමි. මහණෙනි, උස්සාවනන්තිකා ගොනිසාදිකා ගහපති සම්මුති යි කැපකිරීම් සතරක් අනුදනිමි".*

**සිහබණවර සිවුවැනි වේ.**

---

* උපග්‍රන්ථය බලනු.

1. තෙන ඛො පන සමයෙන **භද්දියනගරෙ** **මෙණ්ඩකො** ගහපති පටිවසති. තස්ස එවරූපො ඉද්ධානුභාවො හොති: සීසං නහායිත්වා ධඤ්ඤාගාරං සම්මජ්ජාපෙත්වා ද්වාරෙ[1] නිසීදති. අන්තලික්ඛා ධඤ්ඤස්ස ධාරා ඔපතිත්වා ධඤ්ඤාගාරං පූරෙති.

2. භරියාය එවරූපො ඉද්ධානුභාවො හොති: එකඤ්ඤෙව ආළ්හකථාලිකං උපනිසීදිත්වා එකඤ්ච සූපභිඤ්ජරකං[2] දාසකම්මකරපොරිසං භත්තෙන පරිවිසති. න තාව තං ඛීයති[3], යාව සා න වුට්ඨාති.

3. පුත්තස්ස එවරූපො ඉද්ධානුභාවො හොති: එකංයෙව සහස්සත්ථවිකං ගහෙත්වා දාසකම්මකරපොරිසස්ස ඡම්මාසිකං[4] වෙතනං දෙති. න තාව තං ඛීයති, යාවස්ස හත්ථගතා.

4. සුණිසාය එවරූපො ඉද්ධානුභාවො හොති: එකඤ්ඤෙව චතුදොණිකං පිටකං උපනිසීදිත්වා දාසකම්මකරපොරිසස්ස ඡම්මාසිකං බීජභත්තං[5] දෙති. න තාව තං ඛීයති, යාව සා න වුට්ඨාති.

5. දාසස්ස එවරූපො ඉද්ධානුභාවො හොති: එකෙන නඞ්ගලෙන කසන්තස්ස සත්ත සීතායො ගච්ඡන්ති.

6. අස්සොසි ඛො රාජා මාගධො සෙනියො **බිම්බිසාරො** "අම්හාකං කිර විජිතෙ භද්දියනගරෙ මෙණ්ඩකො ගහපති පටිවසති. තස්ස එවරූපො ඉද්ධානුභාවො: සීසං නහායිත්වා ධඤ්ඤාගාරං සම්මජ්ජාපෙත්වා ද්වාරෙ[1] නිසීදති. අන්තලික්ඛා ධඤ්ඤස්ස ධාරා ඔපතිත්වා ධඤ්ඤාගාරං පූරෙති. භරියාය එවරූපො ඉද්ධානුභාවො: එකංයෙව ආළ්හකථාලිකං උපනිසීදිත්වා එකඤ්ච සූපභිඤ්ජරකං[2] දාසකම්මකරපොරිසං භත්තෙන පරිවිසති. න තාව තං ඛීයති, යාව සා න වුට්ඨාති. පුත්තස්ස එවරූපො ඉද්ධානුභාවො: එකංයෙව සහස්සත්ථවිකං ගහෙත්වා දාසකම්මකරපොරිසස්ස ඡම්මාසිකං වෙතනං දෙති. න තාව තං ඛීයති, යාවස්ස හත්ථගතා. සුණිසාය එවරූපො ඉද්ධානුභාවො: එකංයෙව චතුදොණිකං පිටකං උපනිසීදිත්වා දාසකම්මකරපොරිසස්ස ඡම්මාසිකං බීජභත්තං[5] දෙති. න තාව තං ඛීයති, යාව සා න වුට්ඨාති. දාසස්ස එවරූපො ඉද්ධානුභාවො: එකෙන නඞ්ගලෙන කසන්තස්ස සත්ත සීතායො ගච්ඡන්තී" ති.

7. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො අඤ්ඤතරං සබ්බත්ථකං මහාමත්තං ආමන්තෙසි: "අම්හාකං කිර භණෙ විජිතෙ භද්දියනගරෙ මෙණ්ඩකො ගහපති පටිවසති. තස්ස එවරූපො ඉද්ධානුභාවො: සීසං නහායිත්වා ධඤ්ඤාගාරං සම්මජ්ජාපෙත්වා ද්වාරෙ නිසීදති. අන්තලික්ඛා ධඤ්ඤස්ස ධාරා ඔපතිත්වා ධඤ්ඤාගාරං පූරෙති. භරියාය -පෙ- පුත්තස්ස -පෙ- සුණිසාය -පෙ- දාසස්ස එවරූපො ඉද්ධානුභාවො: එකෙන නඞ්ගලෙන කසන්තස්ස සත්ත සීතායො ගච්ඡන්ති. ගච්ඡ භණෙ. ජානාහි යථා මයා සාමං දිට්ඨො, එවං තව දිට්ඨො භවිස්සතී" ති.

---

1. "බහිද්වාරෙ" ම ඡ සං.

2. "සූපභිඤ්ජනකං" ම ඡ සං.

,, "සූපව්‍යඤ්ජනකං" P T S.

3. "ඛිය්‍යති" ම ඡ සං. ම නු ප.

4. "ඡමාසිකං" ම ඡ සං.

5. "බීජභත්තං" - එත්ථ "බීජ" ඉති ඌනං සබ්බ පොත්ථකෙසු. ධම්මපදට්ඨකථායං චෙව තංසීහලානුවාදෙ සද්ධම්මරත්නාවලීනාමසීහලගන්ථෙ "බත් බිජුවට" ඉති ච දිස්සමානත්තා තං ඉධ යොජිතං.

1 එකල්හි භද්දිය නගරයෙහි මෙණ්ඩක නම් (සිටු) ගැහැවියෙක් වෙසෙයි. ඒ සිටුහුගේ මෙබඳු සෘද්ධ්‍යනුභාවයෙක් වේ: ඉස් සෝධා නා කොටුගෙය හමදවා ප්‍රාග්ද්වාරයෙහි (අක් දෙරියෙහි - ගෘහය අභිමුඛයෙහි) හිඳියි. අහසින් ධාන්‍යධාරා (=රත්හැල් වී කඳු) වැටී කොටුගෙය පුරවයි.

2. බිරින්දගේ මෙබඳු සෘද්ධ්‍යනුභාවයෙක් වේ: සිවු නැළියක් ගන්නා එක ම බත්තලියක් හා එක ම ව්‍යඤ්ජන ඇතිළියක් ළඟ හිඳගෙණ දස්කම්කරු පිරිසට බත් වළඳවයි. ඕ තොමෝ යම් තාක් (එතැනින්) නො නැගිටී ද, ඒ තාක් එය හිස් නො වේ.

3. පුත්‍රයාගේ මෙබඳු සෘද්ධ්‍යනුභාවයෙක් වේ: දහසින් බැඳි එක ම පියල්ලක් ගෙණ දස්කම්කරු පුරුෂයන්ට සමසක වැටුප් දෙයි. යම් තාක් (ඒ පසුම්බිය) ඔහුගේ අතෙහි වේ ද, ඒ තාක් එය හිස් නො වේ.

4. යෙහෙළියගේ මෙබඳු සෘද්ධ්‍යනුභාවයෙක් වේ: ද්‍රෝණ (ලාස්) සතරක් ගන්නා එක ම වී පැස ළඟ හිඳ දස්කම්කරු පුරුෂයන්ට සමසක බත් බිජුවට (= වී) දෙයි. යම් තාක් ඕ තොමෝ (එතැනින්) නො නැගිටී ද, ඒ තාක් එය හිස් නො වේ.

5. දාසයාගේ මෙබඳු සෘද්ධ්‍යනුභාවයෙක් වේ: එක් නඟුලකින් සාන්නහුට හීවිටි (නඟුල්පාර) සතක් (සෑ‍වී) යෙයි.

6. මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජ තෙමේ - "අපගේ රටෙහි භද්දියනගරයෙහි මෙණ්ඩක නම් ගැහැවියෙක් වෙසේ. ඔහුගේ මෙබඳු සෘද්ධ්‍යනුභාවයෙක් වේ: හිස් සෝදා නහා කොටුගෙය හමදවා ඉදිරිදෙරටු-වෙහි හිඳියි. අහසින් වී ධාරා වැටී කොටුගෙය පුරවයි. බිරින්දගේ මෙබඳු 'සෘද්ධ්‍යනුභාවයෙක් වේ: සිවු නැළියක් ගන්නා එක ම බත්තලියක් හා එක ම ව්‍යඤ්ජනඇතිළියක් ළඟ හිඳ ගෙණ දස්කම්කරුපිරිසට බත් වළඳවයි. යම් තාක් ඕ තොමෝ නො නැගිටී ද, ඒ තාක් එය හිස් නො වේ. පුත්‍රයාගේ මෙබඳු සෘද්ධ්‍යනුභාවයෙක් වේ. දහසින් බැඳි එක ම පියල්ලක් ගෙණ දස්කම්කරු පුරුෂයන්ට සමසක වැටුප් දෙයි. යම් තාක් (ඒ පසුම්බිය) ඔහුගේ අතෙහි වේ ද, ඒ තාක් එය හිස් නො වේ'. ලේළියගේ මෙබඳු සෘද්ධ්‍යනුභාවයෙක් වේ. සතර ද්‍රෝණයක් ගන්නා එක ම පෙට්ටියක් ළඟ හිඳ දස්කම්කරු පුරුෂයන්ට සමසක බත් බිජුවට දෙයි. යම් තාක් ඕ තොමෝ නො නැගිටී ද, ඒ තාක් එය හිස් නො වේ. දාසයාගේ මෙබඳු සෘද්ධ්‍යනුභාවයෙක් වේ. එක් නඟුලකින් සාන්නහුට හීවිටි සතක් (සෑවී) යේ ය" යි ඇසී ය.

7. ඉක්බිති මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජ තෙමේ සියලු කටයුතුවල යෙදෙන එක්තරා මහඇමැතියකු ඇමතූයේ ය: "සගය, අපගේ රටෙහි භද්දියනගරයෙහි මෙණ්ඩක නම් ගැහැවියෙක් වෙසෙයි. ඔහුගේ මෙබඳු සෘද්ධ්‍යනුභාවයෙක් වේ: හිස සෝධා නා කොටුගෙය හමදවා අගදෙරකඩ හිඳියි. අහසින් ධාන්‍යධාරා වැටී කොටුගෙය පුරවයි. බිරින්දගේ -පෙ- පුත්‍රයාගේ -පෙ- යේළනියන්ගේ -පෙ- දාසයාගේ මෙබඳු සෘද්ධ්‍යනුභාවයෙක් වේ. එක් නඟුලකින් සාන්නහුට හීවිටි සතක් යෙ යි. සගය, යව. දනුව. තා විසින් දක්නා ලද්ද මා විසින් ම දක්නා ලද්දක් මෙන් වන්නේ ය."

8. "එවං දෙවා" ති ඛො සො මහාමත්තො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පටිස්සුත්වා චතුරඞ්ගිනියා සෙනාය යෙන භද්දියං තෙන පායාසි. අනුපුබ්බෙන යෙන භද්දියං යෙන මෙණ්ඩකො ගහපති තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මෙණ්ඩකං ගහපතිං එතදවොච: "අහං හි ගහපති, රඤ්ඤා ආණත්තො 'අම්හාකං කිර භණෙ, විජිතෙ භද්දිය නගරෙ මෙණ්ඩකො ගහපති පටිවසති. තස්ස එවරූපො ඉද්ධානුභාවො: සීසං නහායිත්වා ධඤ්ඤාගාරං සම්මජ්ජාපෙත්වා පද්වාරෙ නිසීදති. අන්තලික්ඛා ධඤ්ඤස්ස ධාරා ඔපතිත්වා ධඤ්ඤාගාරං පූරෙති. -පෙ- දාසස්ස එවරූපො ඉද්ධානුභාවො: එකෙන නඞ්ගලෙන කසන්තස්ස සත්ත සීතායො ගච්ඡන්ති.' ගච්ඡ භණෙ, ජානාහි. යථා මයා සාමං දිට්ඨො, එවං තව දිට්ඨො භවිස්සතී" ති. පස්සාම තෙ ගහපති, ඉද්ධානුභාවන්ති.

9. අථ ඛො මෙණ්ඩකො ගහපති සීසං නහායිත්වා ධඤ්ඤාගාරං සම්මජ්ජාපෙත්වා පද්වාරෙ නිසීදි. අන්තලික්ඛා ධඤ්ඤස්ස ධාරා ඔපතිත්වා ධඤ්ඤාගාරං පූරෙසි.

10. "දිට්ඨො තෙ ගහපති, ඉද්ධානුභාවො. භරියාය තෙ ඉද්ධානුභාවං පස්සාමා" ති[1]. අථ ඛො මෙණ්ඩකො ගහපති භරියං ආණාපෙසි: "තෙන හි චතුරඞ්ගිනිං සෙනං භත්තෙන පරිවිසා" ති. අථ ඛො මෙණ්ඩකස්ස ගහපතිස්ස භරියා එකංයෙව ආළ්හකථාලිකං උපනිසීදිත්වා එකඤ්ච සූපභිඤ්ජරකං චතුරඞ්ගිනිං සෙනං භත්තෙන පරිවිසි. න තාව තං ඛීයි.[2] යාව සා න වුට්ඨාසි.[3]

11. "දිට්ඨො තෙ ගහපති භරියායපි ඉද්ධානුභාවො. පුත්තස්ස තෙ ඉද්ධානුභාවං පස්සාමා" ති. අථ ඛො මෙණ්ඩකො ගහපති පුත්තං ආණාපෙසි: "තෙන හි චතුරඞ්ගිනියා සෙනාය ඡම්මාසිකං වෙතනං දෙහී" ති. අථ ඛො මෙණ්ඩකස්ස ගහපතිස්ස පුත්තො එකංයෙව සහස්සත්ථවිකං ගහෙත්වා චතුරඞ්ගිනියා සෙනාය ඡම්මාසිකං වෙතනං අදාසි. න තාව තං ඛීයි, යාවස්ස හත්ථගතා.

12. "දිට්ඨො තෙ ගහපති, පුත්තස්සපි ඉද්ධානුභාවො. සුණිසාය තෙ ඉද්ධානුභාවං පස්සාමා" ති. අථ ඛො මෙණ්ඩකො ගහපති සුණිසං ආණාපෙසි: "තෙන හි චතුරඞ්ගිනියා සෙනාය ඡම්මාසිකං බීජභත්තං දෙහී" ති. අථ ඛො මෙණ්ඩකස්ස ගහපතිස්ස සුණිසා එකංයෙව චතුදොණිකං පිටකං උපනිසීදිත්වා චතුරඞ්ගිනියා සෙනාය ඡම්මාසිකං බීජභත්තං අදාසි. න තාව තං ඛීයි, යාව සා න වුට්ඨාසි.

13. "දිට්ඨො තෙ ගහපති, සුණිසායපි ඉද්ධානුභාවො. දාසස්ස තෙ ඉද්ධානුභාවං පස්සාමා" ති. "මය්හං ඛො සාමි, දාසස්ස ඉද්ධානුභාවො ඛෙත්තෙ පස්සිතබ්බො" ති. "අලං ගහපති, දිට්ඨො තෙ දාසස්සපි ඉද්ධානුභාවො" ති.

14. අථ ඛො සො මහාමත්තො චතුරඞ්ගිනියා සෙනාය පුනදෙව රාජගහං පච්චාගඤ්ඡි. යෙන රාජා මාගධො සෙනියො බිම්බිසාරො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස එතමත්ථං ආරොචෙසි.

1. "පස්සිස්සාමාති" මජසං. PTS. 2. "ඛියති" මජසං. PTS.
3. "න වුට්ඨාති" මජසං. PTS.

8. ඒ මහාමාත්‍ය තෙමේ "දේවයන් වහන්ස, එසේ ය" යි මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජුහට පිළිවදන් දී සිවුරඟසෙනඟින් යුක්ත ව භද්දිය නගරයට ගියේ ය. පිළිවෙළින් (ගොස්) භද්දියනුවර මෙණ්ඩක ගැහැවියා වෙතට පැමිණියේ ය. පැමිණ මෙණ්ඩක ගැහැවියාහට මෙය කී ය: "ගැහැවිය, මම - අපගේ රටෙහි භද්දියනගරයෙහි මෙණ්ඩක නම් ගැහැවියෙක් වෙසෙයි. ඔහුගේ මෙබඳු සෘද්ධ්‍යනුභාවයෙක් වේ: හිස සෝදා නා කොටුගෙය හමදවා ඉදිරිදෙර හිඳියි. අහසින් ධාන්‍ය ධාරා වැටී කොටුගෙය පුරවයි. -පෙ- දසයාගේ මෙබඳු සෘද්ධ්‍යනුභාවයෙක් වේ: එක් නඟුලකින් සාන්නහුට හිවිටි සතක් යේ ය' යි. සගය, යව. දකුව. තා විසින් දක්නා ලද්ද මා විසින් ම දක්නා ලද්දක් මෙන් වන්නේ ය යි රජු විසින් අණවන ලද්දෙම් වෙමි. ගෘහපතිය, තාගේ සෘද්ධ්‍යනුභාවය බලන්නෙමු."

9. ඉක්බිති මෙණ්ඩක ගැහැවි තෙමේ හිස සෝදා නා කොටුගෙය හමදවා ඉදිරි දෙරටුවෙහි හුන්නේ ය. අහසින් ධාන්‍යධාරා වැටී කොටුගෙය පිරවී ය.

10. "ගැහැවිය, තාගේ සෘද්ධ්‍යනුභාවය දක්නා ලද්දේ ය. තාගේ බිරින්දගේ සෘද්ධ්‍යනුභාවය බලන්නෙමු". ඉක්බිති මෙණ්ඩක ගැහැවි තෙමේ "එසේ නම් සිවුරඟසෙනඟට බත් කව" යි බිරින්දට අණ කෙළේ ය. එවිට මෙණ්ඩක ගැහැවිහුගේ බිරින්ද සතර නැළියක් ගන්නා එක ම බත් තලියක් ලඟ හිඳ එක ම ව්‍යඤ්ජනඇතිලියක් ගෙණ සිවුරඟසෙනගට බත් කැවී ය. යම් තාක් ඕ තොමෝ නො නැඟී සිටියා ද, ඒ තාක් එය හිස් නො වී ය.

11. "ගැහැවිය, තාගේ බිරින්දගේ සෘද්ධ්‍යනුභාවය දක්නා ලද්දේ ය. තාගේ පුත්‍රයාගේ සෘද්ධ්‍යනුභාවය බලන්නෙමු" යි. එවිට මෙණ්ඩක ගැහැවි තෙමේ "එසේ නම් සිවුරඟසෙනඟට සමසක වැටුප් දෙව" යි පුත්‍රයාට අණ කෙළේ ය. ඉක්බිති මෙණ්ඩක ගැහැවිහුගේ පුත්‍ර තෙමේ දහසින් බැඳි එක ම පියල්ලක් ගෙණ සිවුරඟසෙනඟට සමසක වැටුප් දුන්නේ ය. යම් තාක් ඒ පසුම්බිය ඔහුගේ අතෙහි වී ද, ඒ තාක් එය හිස් නො වී ය.

12. "ගැහැවිය, තාගේ පුත්‍රයාගේ සෘද්ධ්‍යනුභාවය දක්නා ලද්දේ ය. තාගේ යෙහෙළියගේ සෘද්ධ්‍යනුභාවය බලන්නෙමු" යි. එවිට මෙණ්ඩක ගැහැවි තෙමේ "එසේ නම් සිවුරඟසෙනඟට සමසක බත්බිජු දෙව" යි යෙහෙළියට අණ කෙළේ ය. ඉක්බිති මෙණ්ඩක ගැහැවිහුගේ යෙහෙළි තොමෝ ද්‍රෝණසතරක් ගන්නා එක ම වී පෙට්ටියක් ලඟ හිඳ සිවුරඟ-සෙනඟට සමසක බත්බිජු දුන්නී ය. යම් තාක් ඕ තොමෝ නො නැඟී සිටියා ද, ඒ තාක් එය අවසන් නො වී ය.

13. "ගැහැවිය, තාගේ යෙහෙළියගේ සෘද්ධ්‍යනුභාවය දක්නා ලද්දේ ය. තාගේ දසයාගේ සෘද්ධ්‍යනුභාවය බලන්නෙමු" යි. "හිමියෙනි, මාගේ දසයාගේ සෘද්ධ්‍යනුභාවය කෙතෙහි දී දක්ක යුතු ය". "ගැහැවිය, කම් නැත. තාගේ දසයාගේ සෘද්ධ්‍යනුභාවය ද දක්නා ලද්දේ ය".

14. ඉක්බිති ඒ මහාමාත්‍ය තෙමේ සිවුරඟසෙනඟින් යුක්ත ව නැවැත රජගහනුවරට පෙරළා ගියේ ය. (එහි) මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජු වෙතට එළඹියේ ය. එළඹ මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජුට මෙ පවත් දැන්වී ය.

15. අථ ඛො භගවා වෙසාලියං යථාභිරන්තං විහරිත්වා යෙන භද්දියං තෙන චාරිකං පක්කාමි මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි.

16. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන භද්දියං තදවසරි. තත්‍රසුදං භගවා භද්දියෙ විහරති **ජාතියාවනෙ**.

17. අස්සොසි ඛො මෙණ්ඩකො ගහපති "සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො භද්දියං අනුප්පත්තො භද්දියෙ විහරති ජාතියාවනෙ. තං ඛො පන භගවන්තං ගොතමං එවංකල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: 'ඉතිපි සො භගවා අරහං, සම්මාසම්බුද්ධො, විජ්ජාචරණසම්පන්නො, සුගතො, ලොකවිදූ, අනුත්තරො පුරිසදම්මසාරථි, සත්ථා දෙවමනුස්සානං, බුද්ධො, භගවා.[1] සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං, සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං, සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං. කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී" ති.

18. අථ ඛො මෙණ්ඩකො ගහපති භද්‍රානි භද්‍රානි යානානි යොජාපෙත්වා භද්‍රං යානං අභිරූහිත්වා භද්‍රෙහි භද්‍රෙහි යානෙහි භද්දියා නීය්‍යාසි භගවන්තං දස්සනාය.

19. අද්දසංසු ඛො සම්බහුලා තිත්ථියා මෙණ්ඩකං ගහපතිං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන මෙණ්ඩකං ගහපතිං එතදවොචුං: කහං ත්වං ගහපති, ගච්ඡසී"ති. "ගච්ඡාමහං භන්තෙ, භගවන්තං සමණං ගොතමං[2] දස්සනායා" ති. "කිං පන ත්වං ගහපති, කිරියවාදො සමානො අකිරියවාදං සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සසි ?. සමණො හි ගහපති, ගොතමො අකිරියවාදො අකිරියාය ධම්මං දෙසෙති. තෙන ච සාවකෙ විනෙතී" ති.

20. අථ ඛො මෙණ්ඩකස්ස ගහපතිස්ස එතදහොසි: "නිස්සංසයං ඛො සො භගවා අරහං සම්මා සම්බුද්ධො භවිස්සති, යථායිමෙ[3] තිත්ථියා උසූයන්තී" ති. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකොව යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නස්ස ඛො මෙණ්ඩකස්ස ගහපතිස්ස භගවා ආනුපුබ්බිකථං කථෙසි සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං, කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං, නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි.

---

1. "භගවාති" ම ඡ සං. ජවි. අ වි. තො වි.
2. "භන්තෙ සමණං ගොතමං" සී මු. 3. "යථඉමෙ" ම ඡ සං.

15. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විශාලාමහානගරයෙහි කැමැති තාක් කල් වාසය කොට එක්දහස්දෙසියපණසක් වූ මහාභික්ෂුසඞ්ඝයා සමග භද්දියනුවර බලා චාරිකාවෙහි වැඩි සේක.

16. එකල භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් චාරිකාවෙහි වඩිනා සේක් භද්දියනගරයට පැමිණියහ. භාග්‍යවතුන් වහන්සේ එහි භද්දිය නගරයෙහි **ජාතියාවනයෙහි** (සමන්මල් වනයෙහි) වැඩ වාසය කරණ සේක.

17. මෙණ්ඩක ගැහැවි තෙමේ "ශාක්‍යපුත්‍ර වූ ශාක්‍යකුලයෙන් පැවිදි වූ ශ්‍රමණ භවත් ගෞතම තෙමේ භද්දියනගරයට පැමිණියේ භද්දියනගරයෙහි ජාතියා වනයෙහි වාසය කෙරේ. ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේගේ කල්‍යාණ වූ කීර්තිඝොෂයෙක් පැන නැංගේ ය. ඒ භාග්‍යවතුන් වහන්සේ 'මේ මේ කරුණෙන් රහත් සේක. මේ මේ කරුණෙන් සම්‍යක් සම්බුද්ධ සේක. මේ මේ කරුණෙන් අෂ්ටවිද්‍යාවෙන් හා පසළොස්චරණධර්මයෙන් යුක්ත සේක. මේ මේ කරුණෙන් සුගත් සේක. මේ මේ කරුණෙන් ලොකවිදූ සේක. මේ මේ කරුණෙන් පුරුෂයන් දමනය කිරීමෙහි නිරුත්තර වූ සාරථි සේක. මේ මේ කරුණෙන් දෙව්මිනිසුන්ට ශාස්තෘ සේක. මේ මේ කරුණෙන් බුද්ධ සේක. මේ මේ කරුණෙන් භාග්‍යවත් සේක. උන්වහන්සේ දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ මේ අවකාශලොකය ද, මහණ බමුණන් සහිත වූ, දෙව් මිනිසුන් සහිත වූ සත්ත්වලොකය ද තමන්වහන්සේ ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරණ සේක. උන්වහන්සේ මුල මැද අග යහපත් වූ අර්ථ-සම්පත්තියෙන් යුක්ත වූ පදසම්පත්තියෙන් යුක්ත වූ දහම් දෙසන සේක. සර්වප්‍රකාරයෙන් සම්පූර්ණ වූ පිරිසිදු වූ ශාසනමාර්ගබ්‍රහ්මචර්යය ප්‍රකාශ කරණ සේක'. එබඳු වූ රහතුන්ගේ දැකීම යහපත් වේ" ය යි ඇසී ය.

18. ඉක්බිති මෙණ්ඩක ගැහැවි තෙමේ හොඳ හොඳ යානයන් යොදවා හොඳ යානයකට නැගී හොඳ හොඳ යානයන්ගෙන් යුක්ත ව භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස භද්දියනුවරින් පිටත් ව ගියේ ය.

19. බොහෝ තීර්ථකයෝ එන්නා වූ මෙණ්ඩක ගැහැවියා දුර දී ම දුටුවාහු ය. දැක මෙණ්ඩක ගැහැවියාට "ගැහැවිය, තෝ කොහි යෙහි ද ?"යි කීහ. ස්වාමීනි, මම භාග්‍යවත් ශ්‍රමණගෞතමයන් දැකීමට යමි". "ගැහැවිය, තෝ ක්‍රියාවාදී වෙහි. කුමක් හෙයින් අක්‍රියාවාදී ශ්‍රමණ ගෞතමයා දැකීමට යෙහි ද? ගැහැවිය, ශ්‍රමණගෞතම තෙමේ අක්‍රියාවාදී වූයේ නො කිරීම පිණිස දහම් දෙසයි. එයින් ම ශ්‍රාවකයන් හික්මවයි".

20. ඉක්බිති මෙණ්ඩක ගැහැවියාහට "මේ තීර්ථකයෝ යම් කරුණකින් ඊර්ෂ්‍යා කෙරෙත් ද, ඒ කරුණෙන් ම ඒ භාග්‍යවතුන් වහන්සේ නිසැක යෙන් ම රහත් වෙති. සම්‍යක්සම්බුද්ධ වෙති" යි මෙබඳු සිතෙක් විය. (ගැහැවි තෙමේ) යානයෙන් යා හැකි බිම යම් පමණවී ද, එපමණ තැන් යානයෙන් ගොස් යානයෙන් බැස පාගමනින් ම භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් මෙණ්ඩක ගැහැවියාහට භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළ කතාව එනම්: දානකථාව සීලකථාව ස්වර්ගකථාව, කාමයන් දුක්බව ලාමකබව කෙලෙසීම ඇතිබව වදාළ සේක. පැවිද්දෙහි අනුසස් ද ප්‍රකාශ කළ සේක.

21. යදා භගවා අඤ්ඤාසි මෙණ්ඩකං ගහපතිං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා, තං පකාසෙසි - දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව ඛො මෙණ්ඩකස්ස ගහපතිස්ස තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: “යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම” න්ති.

22. අථ ඛො මෙණ්ඩකො ගහපති දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච: “අභික්කන්තං භන්තෙ. අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය: ‘චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී’ ති, එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ, භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. අධිවාසෙතු ච මෙ භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා” ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො මෙණ්ඩකො ගහපති භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

23. අථ ඛො මෙණ්ඩකො ගහපති තස්සා රත්තියා අච්චයෙන පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: “කාලො භන්තෙ, නිට්ඨිතං භත්ත” න්ති.

24. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන මෙණ්ඩකස්ස ගහපතිස්ස නිවෙසනං, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන.

25. අථ ඛො මෙණ්ඩකස්ස ගහපතිස්ස භරියා ච පුත්තො ච සුණිසා ච දාසො ච යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. තෙසං භගවා ආනුපුබ්බිකථං කථෙසි සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං, කාමානං ආදීනවං ඔකාරං සඞ්කිලෙසං, නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි.

26. යදා තෙ භගවා අඤ්ඤාසි කල්ලචිත්තෙ මුදුචිත්තෙ විනීවරණචිත්තෙ උදග්ගචිත්තෙ පසන්නචිත්තෙ, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා, තං පකාසෙසි - දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව තෙසං තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: “යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම” න්ති.

Free Distribution www.aathaapi.org

21. යම් විටෙක භාග්‍යවතුන් වහන්සේ මෙණ්ඩක ගෘහපතියා සුදුසු සිත් ඇතැ යි මොළොක් සිත් ඇතැ යි නීවරණ රහිත වූ සිත් ඇතැ යි ඔදවැඩි සිත් ඇතැ යි පහන් සිත් ඇතැ යි දත් සේක් ද එකල්හි බුදුවරුන්ගේ තමන් ම (සවභාවයෙන් ම) උත්කෘෂ්ට වූ ධර්මදෙශනාව - දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍යය මාර්ගසත්‍යය යන ඒ චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශ කළ සේක. පහ වූ කිලුටු ඇති පිරිසිදු වස්ත්‍රයෙක් යම් සේ මනා කොට සායම් ගන්නේ ද, එසේ ම මෙණ්ඩක ගෘහපතියාහට ඒ ආසනයෙහි දී ම "යම් කිසිවක් හටගැණීම සවභාවය කොට ඇත්තේ ද, ඒ සියල්ල නිරුද්ධ වීම සවභාවය කොට ඇතැ" යි පහ වූ රාගාදිරජස් ඇති පහ වූ කෙලෙස් මල ඇති සොතාපත්තිමග්ගඥණය පහළ වූයේ ය.

22. ඉක්බිති දක්නා ලද දහම් ඇති පැමිණි දහම් ඇති අවබොධ කළ දහම් ඇති වෙසෙසින් බැස ගත් දහම් ඇති තරණය කළ විචිකිච්ඡා ඇති පහ වූ 'කෙසේ කෙසේ දැ' යි පැවැති සැක ඇති විශාරදභාවයට පැමිණි බුද්ධදහම්හි (අවබොධය පිණිස) අනුන්ගේ උපකාරයක් නො වුව මනා වූ මෙණ්ඩක ගෘහපති තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය. "සවාමීනි, ඉතා යහපත. සවාමීනි, ඉතා යහපත. සවාමීනි, යටිකුරු කරණ ලද්දක් යම් සේ උඩුකුරු කරන්නේ ද, වසන ලද්දක් යම් සේ විදහා පාන්නේ ද, මංමුළා වූවකුට යම් සේ මාර්ගය කියන්නේ ද, 'ඇස් ඇත්තෝ රූප දකින්නාහු ය' යි අන්ධකාරයෙහි තෙල්පහනක් යම් සේ දරන්නේ ද එපරිද්දෙන් ම, භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රම යෙන් ධර්මය දෙශනා කරණ ලද්දේ ය. සවාමීනි, මේ මම භාග්‍යවතුන් වහන්සේ ද නවලොකොත්තරධර්මය ද අෂ්ටාර්‍ය්‍යපුද්ගලභික්ෂුසඞ්ඝයා ද සරණ කොට යමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් මා දිවි හිමි කොට සරණ ගියා වූ උපාසකයකු කොට දරණ සේක්වා. සවාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා සමග හෙට මාගේ බත ද ඉවසන සේක්වා". භාග්‍යවතුන් වහන්සේ තූෂ්ණිම්භාවයෙන් ඉවසූ සේක. ඉක්බිති මෙණ්ඩක ගෘහපති තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට සකසා වැඳ පැදකුණු කොට ගියේ ය.

23. එකල්හි මෙණ්ඩක ගෘහපති තෙමේ ඒ රෑ ඉක්ම යෑමෙන් පසු ප්‍රණීත වූ කෑ යුතු බිදිය යුතු දේ පිළියෙල කරවා භාග්‍යවතුන් වහන්සේට "සවාමීනි, මේ කාලය යි. බත් නිමියේ ය" යි කල් සැල කරවී ය.

24. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙණ මෙණ්ඩක ගෘහපතියාගේ නිවෙසට වැඩි සේක. වැඩ භික්ෂු සඞ්ඝයා සමග පැණවූ අසුනෙහි හුන් සේක.

25. එකල්හි මෙණ්ඩක ගෘහපතියාගේ බිරින්දෑ ද පුත්‍රයා ද ලේලිය ද දසයා ද භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්හ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට පිළිවෙළකතාව එනම්: දානකථාව සීලකථාව සවර්ගකථාව, කාමයන් දුක් බව ලාමකබව කෙලෙසීම ඇති බව වදාළ සේක. පැවිද්දෙහි අනුසස් ද ප්‍රකාශ කළ සේක.

26. යම් විටෙක භාග්‍යවතුන් වහන්සේ ඔවුන් සුදුසු සිත් ඇත්තන් මොළොක් සිත් ඇත්තන් නීවරණ රහිත වූ සිත් ඇත්තන් ඔදවැඩි සිත් ඇත්තන් පහන් සිත් ඇත්තන් යි දත් සේක් ද, එකල්හි බුදුවරුන්ගේ සාමුක්කංසික වූ ධර්මදෙශනාව - දුඃඛසත්‍යය සමුදසත්‍යය නිරොධසත්‍යය මාර්ගසත්‍යය යන ඒ චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශ කළ සේක. පහ වූ කිලුටු ඇති පිරිසිදු වස්ත්‍රයෙක් යම් සේ මනා කොට සායම් ගන්නේ ද, එපරිද්දෙන් ම ඔවුන්ට ඒ ආසනයෙහි දී ම "යම් කිසිවක් හටගැණීම සවභාවය කොට ඇත්තේ ද, ඒ සියල්ල නිරුද්ධ වීම සවභාවය කොට ඇතැ" යි පහ වූ රාගාදිරජස් ඇති පහ වූ කෙලෙස්මල ඇති සොතාපත්තිමග්ගඥණය පහළ වූයේ ය.

27. තෙ දිට්ඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හධම්මා තිණ්ණවිචිකිච්ඡා විගතකථඞ්කථා වෙසාරජ්ජප්පත්තා අපරප්පච්චයා සත්ථුසාසනෙ භගවන්තං එතදවොචුං: අභික්කන්තං භන්තෙ. අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය - 'චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී' ති, එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එතෙ මයං භන්තෙ, භගවන්තං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකෙ නො භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතෙ'' ති.

28. අථ ඛො මෙණ්ඩකො ගහපති බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා, භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මෙණ්ඩකො ගහපති භගවන්තං එතදවොච: ''යාව භන්තෙ භගවා භද්දියෙ විහරති තාව අහං බුද්ධපමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස ධුවභත්තෙනා'' ති. අථ ඛො භගවා මෙණ්ඩකං ගහපතිං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

29. අථ ඛො භගවා භද්දියෙ යථාභිරන්තං විහරිත්වා මෙණ්ඩකං ගහපතිං අනාපුච්ඡා යෙන අඞ්ගුත්තරාපො තෙන චාරිකං පක්කාමි මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි.

30. අස්සොසි ඛො මෙණ්ඩකො ගහපති ''භගවා කිර යෙන අඞ්ගුත්තරාපො තෙන චාරිකං පක්කන්තො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහී'' ති.

31. අථ ඛො මෙණ්ඩකො ගහපති දාසෙ ච කම්මකරෙ ච ආණාපෙසි: ''තෙන හි භණෙ, බහුං ලොණම්පි තෙලම්පි මධුම්පි තණ්ඩුලම්පි ඛාදනීයම්පි සකටෙසු ආරොපෙත්වා ආගච්ඡථ. අඩ්ඪතෙළසානි ච ගොපාලකසතානි අඩ්ඪතෙළසානි ච ධෙනුසතානි ආදාය ආගච්ඡන්තු. යත්ථ මයං භගවන්තං[1] පස්සිස්සාම, ධාරුණ්හෙන[2] ඛීරෙන භොජෙස්සාමා'' ති.

32. අථ ඛො මෙණ්ඩකො ගහපති භගවන්තං අන්තරාමග්ගෙ කන්තාරෙ සම්භාවෙසි. අථ ඛො මෙණ්ඩකො ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො මෙණ්ඩකො ගහපති භගවන්තං එතදවොච: ''අධිවාසෙතු මෙ භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'' ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො මෙණ්ඩකො ගහපති භගවතො අධිවාසනං විදිත්වා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

---

1. ''යත්ථ භගවන්තං'' ම ඡ සං. 2. 'තරුණ්හෙන'. ම ඡ සං.

27. දක්නා ලද දහම් ඇති පැමිණි දහම් ඇති අවබොධ කළ දහම් ඇති වෙසෙසින් බැස ගත් දහම් ඇති තරණය කළ විචිකිච්ඡා ඇති පහ වූ 'කෙසේ කෙසේ ද' යි පැවැති සැක ඇති විශාරදභාවයට පැමිණි බුදුදහම්හි (අවබොධය පිණිස) අනුන්ගේ උපකාරයක් නො වුව මනා වූ ඔහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: "ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, යටිකුරු කරණ ලද්දක් යම් සේ උඩුකුරු කරන්නේ ද, වසන ලද්දක් යම් සේ විදහා පාන්නේ ද, මං මුළා වූවකුට යම් සේ මග කියන්නේ ද, 'ඇස් ඇත්තෝ රූප දකින්නාහු ය' යි අන්ධකාරයෙහි තෙල්පහනක් යම් සේ දරන්නේ ද, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය දෙශනා කරණ ලද්දේ ය. ස්වාමීනි, මේ අපි භාග්‍යවතුන් වහන්සේ ද නවලොකොත්තර ධර්මය ද අෂ්ටාර්‍ය්‍යපුද්ගල භික්ෂු සඞ්ඝයා ද සරණ කොට යමු. භාග්‍යවතුන් වහන්සේ අප අද පටන් දිවි හිම් කොට සරණ ගියා වූ උපාසකයන් කොට දරණ සේක්වා" යි.

28. ඉක්බිති මෙණ්ඩක ගැහැවි තෙමේ බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයා ප්‍රණීත වූ කෑ යුතු බිදිය යුතු දෙයින් සියතින් සතප්පා පවරා, වළඳා අවසන් කළ පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙත පසෙක හුන්නේ ය. පසෙක හුන් මෙණ්ඩක ගැහැවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම් තාක් කල් භද්දියනගරයෙහි වාසය කරණ සේක් ද, ඒ තාක් කල් මම බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයාහට නිති බතින් උපස්ථාන කරමි" යි සැලකෙළේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙණ්ඩක ගැහැවියා දැහැමිකතාවෙන් කරුණු දක්වා සමාදන් කරවා තියුණු කරවා සතුටු කරවා හුනස්නෙන් නැගිට වැඩි සේක.

29. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ කැමැති තාක් කල් භද්දියනගරයෙහි වාසය කොට මෙණ්ඩකගැහැවියා නො විචාරා භික්ෂූන් එක් දහස්දෙසියපණසක් වූ මහාභික්ෂුසඞ්ඝයා සමග **අඞ්ගුත්තරාපය** බලා චාරිකාවෙහි වැඩි සේක.

30. මෙණ්ඩක ගැහැවි තෙමේ "භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් එක් දහස්දෙසියපණසක් වූ මහාභික්ෂුසඞ්ඝා සමග අඞ්ගුත්තරාපය බලා වැඩි සේක් ල" යි ඇසී ය.

31. ඉක්බිති මෙණ්ඩක ගැහැවි තෙමේ "කොලෙනි, එසේ නම් බොහෝ ලුණු ද තෙල් ද මී ද සහල් ද කෑ යුතු දේ ද ගැල්වල පටවා ගෙණ එවූ. එක්දහස්දෙසියපණසක් ගොපල්ලන් ද එක්දහස්දෙසියපණසක් දෙනුන් ද ගෙණ එත්වා. අපි යම් තැනෙක දී භාග්‍යවතුන් වහන්සේ දකින්නෙමු ද, එහි දී එකෙණෙහි දෙවූ උණුසුම් කිරි වළඳවන්නෙමු" යි දාසයන්ට ද කම්කරුවන්ට ද අණ කෙළේ ය.

32. එකල මෙණ්ඩක ගැහැවි තෙමේ අතරමග කාන්තාරයෙහි දී භාග්‍යවතුන් වහන්සේට හමු වි ය. එහි දී මෙණ්ඩක ගැහැවි තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙතට එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක සිටියේ ය. පසෙක සිටි මෙණ්ඩක ගැහැවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා සමග හෙට මාගේ බත ඉවසන සේක්වා" යි සැලකෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූ සේක. ඉක්බිති මෙණ්ඩක ගැහැවි තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ගියේ ය.

33. අථ ඛො මෙණ්ඩකො ගහපති තස්සා රත්තියා අච්චයෙන පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: "කාලො භන්තෙ, නිට්ඨිතං භත්ත"න්ති.

34. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන මෙණ්ඩකස්ස ගහපතිස්ස පරිවෙසනා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන.

35. අථ ඛො මෙණ්ඩකො ගහපති අඩ්ඪතෙළසානි ගොපාලකසතානි ආණාපෙසි: "තෙන හි භණෙ, එකමෙකං ධෙනුං ගහෙත්වා එකමෙකස්ස භික්ඛුනො උපතිට්ඨථ. ධාරුණ්හෙන ඛීරෙන භොජෙස්සාමා"ති.

36. අථ ඛො මෙණ්ඩකො ගහපති බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි. සම්පවාරෙසි ධාරුණ්හෙන ච ඛීරෙන. භික්ඛූ කුක්කුච්චායන්තා ඛීරං න පටිග්ගණ්හන්ති. "පටිග්ගණ්හථ භික්ඛවෙ පරිභුඤ්ජථා"ති.

37. අථ ඛො මෙණ්ඩකො ගහපති බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා ධාරුණ්හෙන ච ඛීරෙන, භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මෙණ්ඩකො ගහපති භගවන්තං එතදවොච: "සන්ති භන්තෙ, මග්ගා කන්තාරා අප්පොදකා අප්පභක්ඛා න සුකරා අපාථෙය්‍යෙන ගන්තුං. සාධු භන්තෙ, භගවා භික්ඛූනං පාථෙය්‍යං අනුජානාතූ"ති. අථ ඛො භගවා මෙණ්ඩකං ගහපතිං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

38. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, පඤ්ච ගොරසෙ- ඛීරං දධි තක්කං නවනීතං සප්පි. සන්ති භික්ඛවෙ, මග්ගා කන්තාරා අප්පොදකා අප්පභක්ඛා න සුකරා අපාථෙය්‍යෙන ගන්තුං. අනුජානාමි. භික්ඛවෙ, පාථෙය්‍යං පරියෙසිතුං. තණ්ඩුලො තණ්ඩුලත්ථිකෙන. මුග්ගො මුග්ගත්ථිකෙන. මාසො මාසත්ථිකෙන. ලොණං ලොණත්ථිකෙන. ගුළො ගුළත්ථිකෙන. තෙලං තෙලත්ථිකෙන. සප්පි සප්පිත්ථිකෙන. සන්ති භික්ඛවෙ, මනුස්සා සද්ධා පසන්නා. තෙ කප්පියකාරකානං හත්ථෙ හිරඤ්ඤං උපනික්ඛිපන්ති: 'ඉමිනා යං අය්‍යස්ස කප්පියං, තං දෙථා'ති. අනුජානාමි. භික්ඛවෙ, යං තතො කප්පියං, තං සාදියිතුං.[1] න ත්වෙවාහං භික්ඛවෙ, කෙනචි පරියායෙන ජාතරූපරජතං සාදිතබ්බං[2] පරියෙසිතබ්බන්ති. වදාමී"ති.

1. "සාදිතුං" ම ඡ සං. තො. වි.   2 "සාදිතබ්බං" ම ඡ සං. PTS

33. ඉක්බිති මෙණ්ඩක ගැහැවි තෙමේ ඒ රෑ ඉක්ම ගිය පසු ප්‍රණීත වූ කෑ යුතු බිදිය යුතු දෙය පිළියෙල කරවා භාග්‍යවතුන් වහන්සේට “ස්වාමීනි, මේ කාලය යි. බත නිමියේ ය” යි කල් දැන්වී ය.

34. ඉත් පසු භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරොවා පාසිවුරු ගෙණ මෙණ්ඩක ගැහැවියාගේ පරිවෙසනයට වැඩි සේක. වැඩ භික්ෂුසඞ්ඝයා ත් සමග පැණවූ අසුනෙහි වැඩ හුන් සේක.

35. එවිට මෙණ්ඩක ගැහැවි තෙමේ එක්දහස්දෙසියපණසක් ගොපල්ලන්ට “කොලෙනි, ‘දෙවූ කෙණෙහි උණුසුම් කිරි වළඳවන්නෙමු’ යි එක එක දෙන ගෙණ එක එක මහණහු වෙතට එළඹ සිටිවූ” යි අණ කෙළේ ය.

36. එකල්හි මෙණ්ඩක ගැහැවි තෙමේ බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයා ප්‍රණීත වූ කෑ යුතු දෙයින් ද බිදිය යුතු දෙයින් ද සියතින් සැතැප්වී ය. දෙවූ කෙණෙහි උණුසුම් වූ කිරෙන් ද පැවරී ය. භික්ෂූහු කුකුස් කරන්නෝ කිරි නො පිළිගණිත්. “මහණෙනි, පිළිගණිවු. වළඳවු.”

37. ඉක්බිති මෙණ්ඩක ගැහැවි තෙමේ බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයා ප්‍රණීත වූ කෑ යුතු දෙයින් ද බිදිය යුතු දෙයින් ද එකෙණෙහි දෙවූ කිරෙන් ද සියතින් සතප්පා පවරා, වළඳා අවසන් කළ පාත්‍රයෙන් බැහැර කළ අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙත පසෙක හුන්නේ ය. පසෙක හුන් මෙණ්ඩක ගැහැවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට “ස්වාමීනි, දිය නැත්තා වූ ආහාර නැත්තා වූ පාථෙය (මාර්ගෝපකරණ) රහිත ව නො යා හැකි (යෑමට අපහසු වූ) කාන්තාරමාර්ගයෝ ඇත්තාහ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට මාර්ගෝපකරණ අනුදන්නා සේක්වා. ඒ යහපති” යි සැලකෙළේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙණ්ඩක ගැහැවියාට දැහැමි කතාවෙන් මොනවට කරුණු දක්වා එහි ඔහු සමාදන් කරවා තියුණු කරවා සතුටු කරවා හුනස්නෙන් නැගිට වැඩි සේක.

38. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූ සේක. “මහණෙනි, කිරි දිහි මෝරු වෙඬරු ගිතෙල් යන පස්ගෝරසය අනුදනිමි. මහණෙනි, දිය නැත්තා වූ ආහාර නැත්තා වූ මග වියදම් රහිත ව යෑමට අපහසු වූ කාන්තාරමාර්ගයෝ ඇත්තාහ. මහණෙනි, මාර්ගෝපකරණ සොයන්නට අනුදනිමි. සහල් කැමැත්තහු විසින් සහල්, මුං කැමැත්තහු විසින් මුං, මෑඇට කැමැත්තහු විසින් මෑඇට, ලුණු කැමැත්තහු විසින් ලුණු, උක්සකුරු කැමැත්තහු විසින් උක්සකුරු, තෙල් කැමැත්තහු විසින් තෙල්, ගිතෙල් කැමැත්තහු විසින් ගිතෙල් සෙවිය යුතු ය යි අනුදනිමි. මහණෙනි, සැදැහැති පහන් වූ මිනිස්සු ඇත්තාහ. ඔහු ‘මෙයින් ස්වාමීන් වහන්සේට කැප වූ දෙයක් ගෙණ දෙවූ’ යි කැපකරුවන්ගේ අත මසුරන් (මුදල්) තබත්. මහණෙනි, එයින් කැප වූ දෙයක් ඉවසන්නට අනුදනිමි. මහණෙනි, කිසි ලෙසකින් රන් රිදී ඉවසිය යුතු ය යි සෙවිය යුතු ය යි මම නො කියමි” යි වදාළ සේක.

39. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන **ආපණං**, තදවසරි. අස්සොසි ඛො **කෙණියො** ජටිලො "සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො ආපණං අනුප්පත්තො ආපණෙ විහරති.[1] තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං, සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. -පෙ- සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී" ති.

40. අථ ඛො කෙණියස්ස ජටිලස්ස එතදහොසි: "කිං නු ඛො අහං සමණස්ස ගොතමස්ස හරාපෙය්‍ය" න්ති. අථ ඛො කෙණියස්ස ජටිලස්ස එතදහොසි: "යෙපි ඛො තෙ බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො, යෙසමිදං එතරහි බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති, තදනුභාසන්ති, භාසිතමනුභාසන්ති, වාචිතමනුවාචෙන්ති. සෙය්‍යථීදං: **අට්ඨකො, වාමකො, වාමදෙවො, වෙස්සාමිත්තො, යමතග්ගි**[2]**, අඞ්ගීරසො, භාරද්වාජො, වාසෙට්ඨො, කස්සපො**, භගු, රත්තූපරතා විරතා විකාලභොජනා. තෙ එවරූපානි පානානි සාදියිංසු. "සමණොපි ගොතමො රත්තූපරතො විරතො විකාලභොජනා. අරහති සමණොපි ගොතමො එවරූපානි පානානි සාදියිතු" න්ති. පහූතං පානං පටියාදාපෙත්වා කාජෙහි ගාහාපෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො කෙණියො ජටිලො භගවන්තං එතදවොච: "පතිගණ්හාතු මෙ භවං ගොතමො පාන" න්ති. "තෙන හි කෙණිය, භික්ඛූනං දෙහී" ති. භික්ඛූ කුක්කුච්චායන්තා න පතිගණ්හන්ති. "පතිගණ්හථ භික්ඛවෙ, පරිභුඤ්ජථා" ති.

41. අථ ඛො කෙණියො ජටිලො බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං පහූතෙහි පානෙහි සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා, භගවන්තං ධොතහත්ථං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො කෙණියං ජටිලං භගවා ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි.

1. "ආපණෙ විහරතී" ති නත්ථි මරම්මක්ඛර පොත්ථකෙ
2. "යමදග්ගි" ඉත්‍යපි.

Free Distribution www.aathaapi.org

39. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් චාරිකා කරණ සේක් **ආපණයට** වැඩි සේක. කෙණිය ජටිල තෙමේ "ශාක්‍යපුත්‍ර වූ ශාක්‍ය කුලයෙන් පැවිදි වූ ශ්‍රමණ භවත් ගෞතම තෙමේ ආපණයට පැමිණියේ ආපණයෙහි වෙසේ. ඒ භාග්‍යවත් ගෞතමයන්ගේ යහපත් කීර්තිරාවයෙක් පැන නැංගේ ය. 'ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණෙන් ද රහත් සේක. මේ මේ කරුණෙන් ද සම්‍යක් සම්බුද්ධ සේක. මේ මේ කරුණෙන් ද අෂ්ටවිද්‍යාවෙන් හා පසළොස්චරණධර්මයෙන් යුක්ත සේක. මේ මේ කරුණෙන් ද සුගත සේක. මේ මේ කරුණෙන් ද ලොකවිදූ සේක. මේ මේ කරුණෙන් ද පුරුෂයන් දමනය කිරීමෙහි නිරුත්තර වූ සාරථි සේක. මේ මේ කරුණෙන් ද දෙව් මිනිසුන්ට ශාස්තෘ සේක. මේ මේ කරුණෙන් ද බුද්ධ සේක. මේ මේ කරුණෙන් ද භාග්‍යවත් සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ මේ අවකාශලොකය ද, මහණබමුණන් සහිත වූ දෙව් මිනිසුන් සහිත වූ සත්ත්වලොකය ද තමන්වහන්සේ ම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරණ සේක. -පෙ- එබඳු වූ රහතුන්ගේ දැකීම යහපත් වේ ය" යි ඇසී ය.

40. ඉක්බිති කෙණිය ජටිලයාහට "මම ශ්‍රමණ භවත් ගෞතමයන්ට කුමක් යවත්නෙම් ද" යි සිත් වි ය. නැවත කෙණිය ජටිලයාහට මෙසේ සිතුනේ ය: "බමුණන්ගේ මන්ත්‍ර (වේද) සැලා වූ පැවැත්වූ යම් ඒ පූර්ව ඍෂීහු වූවාහු ද, යම්කෙනෙකුන් සතු වූ ඒ පැරණි වෙද මන්ත්‍ර දැන් බමුණෝ (පෙර බමුණන්) ගැයූ කියූ රැස් කොට තැබූ පරිදි ගයත් ද, කියත් ද, හඬල පරිදි හඬරත් ද, කියවූ පරිදි කියවත් (උගන්වත්) ද, ඒ ඍෂීහු - එනම්: **අට්ඨක**, **වාමක**, **වාමදෙව**, **වෙස්සාමිත්ත**, **යමතග්ගි**, **අඞ්ගිරස**, **භාරද්වාජ**, **වාසෙට්ඨ**, **කස්සප**, **භගු** යන මොහු රාත්‍රිභොජනයෙන් වැලකුනෝ ය. විකල්බොජුනෙන් තොර වූවෝ ය. ඔහු මෙබඳු පැන් ඉවසූහ. ශ්‍රමණගෞතම තෙමේ ද රාත්‍රිභොජනයෙන් වැලකුනේ ය. විකල්බොජුනෙන් වෙන් වූයේ ය. ශ්‍රමණගෞතම තෙමේ ද මෙබඳු පැන් ඉවසීමට සුදුසු වේ" යි (මෙසේ සිතූ කෙණිය ජටිල තෙමේ) බොහෝ පැන්[1] පිළියෙළ කරවා කත්වලින් ගෙන්වා ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වි ය. සතුටු විය යුතු වූ සිත් ඇලවිය යුතු වූ කතා කොට නිමවා පසෙක සිටියේ ය. පසෙක සිටි කෙණිය ජටිල තෙමේ භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතම තෙමේ මාගේ පැන් පිළිගණීවා" යි සැලකෙළේ ය. "කෙණිය, එසේ නම් භික්ෂූන්ට දෙව". භික්ෂූහු කුකුස් කරන්නෝ නො පිළිගණිත්. "මහණෙනි, පිළිගණිවු, වළඳවු".

41. ඉක්බිති කෙණිය ජටිල තෙමේ බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයා බොහෝ පැනින් සියතින් සතප්පා පවරා, සේදූ අත් ඇති පාත්‍රයෙන් බැහැර කළ අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙත පසෙක හුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් කෙණිය ජටිලයාට දැහැමි කතාවෙන් කරුණු දක්වූ සේක. එහි ඔහු සමාදන් කරවූ සේක. සතුටු කරවූ සේක. තියුණු කරවූ සේක.

1. "බදරපානස්ස කුටසහස්සං = ඩෙබරපැන්කළ දහසක්". අඨකථා.

42. අථ ඛො කෙණියො ජටිලො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො භගවන්තං එතදවොච: "අධිවාසෙතු මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා"ති. "මහා ඛො කෙණිය, භික්ඛුසඞ්ඝො. අඩ්ඪතෙළසානි භික්ඛුසතානි. ත්වඤ්ච බ්‍රාහ්මණෙසු අභිප්පසන්නො"ති. දුතියම්පි ඛො කෙණියො ජටිලො භගවන්තං එතදවොච: "කිඤ්චාපි භො[1] ගොතම, මහා භික්ඛුසඞ්ඝො අඩ්ඪතෙළසානි භික්ඛුසතානි, අහං ච බ්‍රාහ්මණෙසු අභිප්පසන්නො, අධිවාසෙතු මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා"ති. "මහා ඛො කෙණිය, භික්ඛුසඞ්ඝො. අඩ්ඪතෙළසානි භික්ඛුසතානි. ත්වං ච බ්‍රාහ්මණෙසු අභිප්පසන්නො"ති. තතියම්පි ඛො කෙණියො ජටිලො භගවන්තං එතදවොච: "කිඤ්චාපි භො ගොතම, මහා භික්ඛුසඞ්ඝො අඩ්ඪතෙළසානි භික්ඛුසතානි, අහං ච බ්‍රාහ්මණෙසු අභිප්පසන්නො, අධිවාසෙතු මෙ භවං[2] ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා"ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො කෙණියො ජටිලො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා පක්කාමි.

43. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, අට්ඨ පානානි: අම්බපානං ජම්බුපානං චොචපානං මොචපානං මධුපානං[3] මුද්දිකපානං සාලූකපානං ඵාරුසකපානං. අනුජානාමි භික්ඛවෙ, සබ්බං ඵලරසං ඨපෙත්වා ධඤ්ඤඵලරසං. අනුජානාමි භික්ඛවෙ, සබ්බං පත්තරසං ඨපෙත්වා ඩාකරසං. අනුජානාමි භික්ඛවෙ, සබ්බං පුප්ඵරසං ඨපෙත්වා මධුකපුප්ඵරසං. අනුජානාමි භික්ඛවෙ උච්ඡුරස"න්ති.

44. අථ ඛො කෙණියො ජටිලො තස්සා රත්තියා අච්චයෙන සකෙ අස්සමෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: "කාලො භො ගොතම, නිට්ඨිතං භත්ත"න්ති. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන කෙණියස්ස ජටිලස්ස අස්සමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි සද්ධිං භික්ඛුසඞ්ඝෙන.

45. අථ ඛො කෙණියො ජටිලො බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා, භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො කෙණියං ජටිලං භගවා ඉමාහි ගාථාහි අනුමොදි:-

i. "අග්ගිහුත්තමුඛා යඤ්ඤා සාවිත්තී ඡන්දසො මුඛං,
රාජා මුඛං මනුස්සානං නදීනං සාගරො මුඛං.

ii. නක්ඛත්තානං මුඛං චන්දො ආදිච්චො තපතං මුඛං,
පුඤ්ඤමාකඞ්ඛමානානං[4] සඞ්ඝො වෙ යජතං මුඛ"න්ති.

---

1. "කිඤ්චාපි ඛො" ම ඡ සං. 2. අධිවාසෙතු භවං. ම ඡ සං.
3. "මධුකපානං" ම ඡ සං.
4. "පුඤ්ඤං ආකඞ්ඛමානානං" ම ඡ සං. P T S. තො වි. ජ වි.

42. භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කතාවෙන් කරුණු දක්වූ සමාදන් කරවූ තියුණු කරවූ සතුටු කරවූ කෙණිය ජටිල තෙමේ "භවත් ගෞතම තෙමේ භික්ෂුසඞ්ඝයා සමග හෙට මාගේ බත ඉවසාවා" යි සැලකෙළේ ය "කෙණිය, භික්ෂුසඞ්ඝ තෙමේ මහත් වේ. එක්දහස් දෙසියපණසෙකි. තෝ ද බමුණන් කෙරෙහි වෙසෙසින් පැහැදුනෙකැ" යි (බුදුහු වදාළහ.) දෙවනු ද කෙණිය ජටිල තෙමේ භාග්‍යවතුන් වහන්සේහට භවත් ගෞතමයන් වහන්ස, භික්ෂුසඞ්ඝයා කෙසේ මහත් වුවත් එක්-දහස්දෙසියපණසක් වුවත් මා ද බමුණන් කෙරෙහි වෙසෙසින් පැහැදුනත් භවත් ගෞතම තෙමේ භික්ෂුසඞ්ඝයා සමග හෙට මාගේ බත ඉවසාවා" යි සැලකෙළේ ය. "කෙණිය, භික්ෂුසඞ්ඝ තෙමේ මහත් වේ. එක්දහස්දෙසිය පණසෙකි. තෝ ද බමුණන් කෙරෙහි වෙසෙසින් පැහැදුනෙක". තෙවනු ද කෙණිය ජටිල තෙමේ භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, භික්ෂුසඞ්ඝයා කෙසේ මහත් වුවත් එක්දහස්දෙසියපණසක් වුවත් මා ද බමුණන් කෙරෙහි පැහැදුනත් භවත් ගෞතම තෙමේ භික්ෂුසඞ්ඝයා සමග හෙට මාගේ බත ඉවසාවා" යි සැලකෙළේ ය. භාග්‍ය-වතුන් වහන්සේ තුෂ්ණිම්භාවයෙන් ඉවසූ සේක. ඉක්බිති කෙණිය ජටිල තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට ගියේ ය.

43. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූසේක: "මහණෙනි, අඹපැන් දඹපැන් ඇටකෙසෙල්පැන් මස් කෙසෙල්පැන් මීපැන් මිදිපැන් ඕලුපැන් බොරලු-දමුනුපැන් යන අට වැදෑරුම් පැන් අනුදනිමි. මහණෙනි, ධාන්‍යඵලරසය හැර සියලු ඵලරසය අනුදනිමි. මහණෙනි, පිසූ පලාකොළරසය හැර දිය හා මුසු කොට මිරිකාගත් සියලු කොළරස අනුදනිමි. මහණෙනි, මීපුප්රසය හැර සියලු මල්රස අනුදනිමි. මහණෙනි, උක් රසය (උක් ඉස්ම) අනුදනිමි" යි වදාළ සේක.

44. එකල්හි කෙණිය ජටිල තෙමේ ඒ රැ ඉක්ම ගිය පසු සිය අසපුවෙහි ප්‍රණීත වූ කෑ යුතු බිදිය යුතු දෑ පිළියෙල කරවා භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, මේ කාලය යි. බත් නිමියේ ය" යි කල් සැලකරවී ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරොවා පාසිවුරු ගෙණ කෙණිය ජටිලයාගේ අසපුවට වැඩි සේක. වැඩ භික්ෂුසඞ්ඝයා සමග පැණවූ අසුනෙහි වැඩ හුන් සේක.

45. එවිට කෙණිය ජටිල තෙමේ බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයා ප්‍රණීත වූ කෑ යුතු දෙයින් බිදිය යුතු දෙයින් සියතින් සතප්පා පවරා, වළඳා අවසන් කළ පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙත පසෙක හුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් කෙණිය ජටිලයාට මේ ගාථාවන්ගෙන් අනුමෝදන් කළ සේකා:-

i. "යාගයෝ ගිනිපිදීම ප්‍රධාන කොට ඇත්තාහ. සාවිත්‍රීඡන්දස* වේදයට ප්‍රධාන වේ. රජ තෙමේ මිනිසුන්ට ප්‍රධාන වේ. සාගරය නදීන්ට ප්‍රධාන වේ.

ii. චන්ද්‍ර තෙමේ තාරකාවන්ට ප්‍රධාන වේ. බබලන්නන් අතුරෙන් සූර්‍ය්‍ය තෙමේ ප්‍රධාන වේ. පින් කැමැත්තා වූ දන් දෙන්නන්ට සඞ්ඝ තෙමේ ඒකාන්තයෙන් ප්‍රධාන වේ".

* උපග්‍රන්ථය බලනු.



Free Distribution www.aathaapi.org

46. අථ ඛො භගවා කෙණියං ජටිලං ඉමාහි ගාථාහි අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො භගවා **ආපණෙ** යථාභිරන්තං විහරිත්වා යෙන **කුසිනාරා,** තෙන චාරිකං පක්කාමි මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි.

47. අස්සොසුං ඛො **කොසිනාරකා මල්ලා** "භගවා කිර කුසිනාරං ආගච්ඡති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහී" ති. තෙ සඞ්ගරං අකංසු: "යො භගවතො පච්චුග්ගමනං න කරිස්සති, පඤ්චසතානිස්ස දණ්ඩො" ති.

48. තෙන ඛො පන සමයෙන **රොජො මල්ලො** ආයස්මතො **ආනන්දස්ස** සහායො හොති. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන කුසිනාරා, තදවසරි. අථ ඛො කොසිනාරකා මල්ලා භගවතො පච්චුග්ගමනං අකංසු.

49. අථ ඛො රොජො මල්ලො භගවතො පච්චුග්ගමනං කරිත්වා යෙනායස්මා ආනන්දො, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො රොජං මල්ලං ආයස්මා ආනන්දො එතදවොච: "උළාරං ඛො තෙ ඉමං ආවුසො රොජ, යං ත්වං භගවතො පච්චුග්ගමනං අකාසී" ති. "නාහං භන්තෙ ආනන්ද, බහුකතො බුද්ධෙ වා ධම්මෙ වා සඞ්ඝෙ වා[1]. අපි ච ඤාතීහි සඞ්ගරො කතො: 'යො භගවතො පච්චුග්ගමනං න කරිස්සති, පඤ්චසතානිස්ස දණ්ඩො'ති. සො ඛො අහං භන්තෙ ආනන්ද, ඤාතීනං දණ්ඩභයා එවාහං භගවතො පච්චුග්ගමනං අකාසි" න්ති.

50. අථ ඛො ආයස්මා ආනන්දො අනත්තමනො අහොසි: "කථං හි නාම රොජො මල්ලො එවං වක්ඛතී" ති. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "අයං භන්තෙ රොජො මල්ලො අභිඤ්ඤාතො ඤාතමනුස්සො. මහිද්ධියො[2] ඛො පන එවරූපානං ඤාතමනුස්සානං ඉමස්මිං ධම්මවිනයෙ පසාදො. සාධු භන්තෙ, භගවා තථා කරොතු, යථා රොජො මල්ලො ඉමස්මිං ධම්මවිනයෙ පසීදෙය්‍යා" ති. "න ඛො තං ආනන්ද, දුක්කරං තථාගතෙන යථා රොජො මල්ලො ඉමස්මිං ධම්මවිනයෙ පසීදෙය්‍යා" ති.

51. අථ ඛො භගවා රොජං මල්ලං මෙත්තෙන චිත්තෙන ඵරිත්වා උට්ඨායාසනා විහාරං පාවිසි. අථ ඛො රොජො මල්ලො භගවතා[3] මෙත්තෙන චිත්තෙන ඵුට්ඨො, සෙය්‍යථාපි නාම ගාවී තරුණවච්ඡා[4], එවමෙව විහාරෙන විහාරං පරිවෙණෙන පරිවෙණං උපසඞ්කමිත්වා භික්ඛූ පුච්ඡති: "කහං නු ඛො භන්තෙ එතරහි සො භගවා විහරති අරහං සම්මාසම්බුද්ධො? දස්සනකාමා හි මයං තං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධ" න්ති. "එසාවුසො රොජ, විහාරො සංවුතද්වාරො. තෙන අප්පසද්දො උපසඞ්කමිත්වා අතරමානො ආළින්දං පවිසිත්වා උක්කාසිත්වා අග්ගළං ආකොටෙහි. විවරිස්සති තෙ භගවා ද්වාර" න්ති

1. "බුද්ධෙන වා ධම්මෙන වා සඞ්ඝෙන වා" සී මු 1
2. "මහිද්ධිකො" ම ඡ සං. "මහද්ධිකො" සී මු. 2.
3. "භගවතො" ම ඡ සං. තො වි.
4. "ගාවිං තරුණවච්ඡො" ම ඡ සං.

46. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කෙණියජටිලයාට මේ ගාථාවන් ගෙන් අනුමෝදනා කොට හුනස්නෙන් නැගිට වැඩි සේක. නැවත භාග්‍යවතුන් වහන්සේ එක්දහස්දෙසියපණසක් වූ මහාභික්ෂුසඞ්ඝයා සමග **ආපණයෙහි** කැමැති තාක් කල් වාසය කොට **කුසිනාරාව** බලා චාරිකාවෙහි වැඩි සේක.

47. **කුසිනාරා**නුවරවැසි මල්ලයෝ "භාග්‍යවතුන් වහන්සේ එක් දහස්දෙසියපණසක් වූ මහාභික්ෂුසඞ්ඝයා සමග කුසිනාරාවට එත් ල" යි ඇසූහ. ඔහු "යමෙක් භාග්‍යවතුන් වහන්සේට පෙරගමන් නො කරන්නේ ද, ඔහුට පන්සියයක් දඬු" යි ගිවිසුමක් කළහ.

48. එකල්හි **රොජමල්ල** තෙමේ **අනඳ**තෙරුන්ගේ සහායයෙක් වේ. භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් චාරිකාවෙහි වඩනා සේක් කුසිනාරාවට පැමිණියහ. එකල්හි කුසිනාරානුවරවැසි මල්ලයෝ භාග්‍යවතුන් වහන්සේට පෙරගමන් කළහ.

49. රොජමල්ල තෙමේ භාග්‍යවතුන් වහන්සේට පෙරගමන් කොට ආයුෂ්මත් අනඳතෙරුන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් අනඳ තෙරුන් සකසා වැඳ පසෙක සිටියේ ය. ආයුෂ්මත් ආනන්‍දස්ථවිර තෙමේ පසෙක හුන් රොජමල්ලයාට "ඇවැත, රොජය, තෝ භාග්‍යවතුන් වහන්සේට යම් පෙරගමනක් කෙළෙහි ද, තාගේ මේ ගමන ඉතා උසස් ය" යි කී ය. "ස්වාමීනි, ආනන්‍දස්ථවිරයන් වහන්ස, මම බුදුන් කෙරෙහි හෝ ධර්මය කෙරෙහි හෝ සඞ්ඝයා කෙරෙහි හෝ බොහෝ උපකාර කෙළෙම් නො වෙමි. එහෙත් 'යමෙක් භාග්‍යවතුන් වහන්සේට පෙරගමන් නො කරන්නේ ද, ඔහුට පන්සියයක් දඬු' යි නෑයන් විසින් සම්මතයක් කරණ ලද්දේ ය. ස්වාමීනි, ආනන්‍දස්ථවිරයන් වහන්ස, ඒ මම නෑයන්ගේ දඬයට බියෙන් භාග්‍යවතුන් වහන්සේට පෙරගමන් කෙළෙමි" යි.

50. එකල්හි ආයුෂ්මත් ආනන්‍දස්ථවිර තෙමේ "කෙසේ නම් රොජ-මල්ල තෙමෙ මෙසේ කීයේ දැ" යි නො සතුටු සිත් ඇත්තේ වී ය. ඉක්බිති ආයුෂ්මත් ආනන්‍දස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් ආයුෂ්මත් ආනන්‍දස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, මේ රොජමල්ල තෙමේ ප්‍රකට වූවෙකි. බොහෝ දෙනා විසින් දන්නා ලද මිනිසෙකි. මෙබඳු ප්‍රකට මිනිසුන් මේ සසුනෙහි පැහැදීම මහත් දියුණුවෙක. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ, රොජමල්ල තෙමේ මේ සසුනෙහි යම් සේ පහදින්නේ නම්, එසේ කරණ සේක්වා" යි සැළ කෙළේ ය. "ආනන්‍දය, රොජමල්ල තෙමේ මේ සසුනෙහි යම් සේ පහදින්නේ නම් එසේ කිරීම තථාගතයන් විසින් දුෂ්කර නො වේ" යි.

51. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රොජමල්ලයාහට මෛත්‍රිසිත පතුරුවා හුනස්නෙන් නැගිට විහාරයට පිවිසි සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ විසින් මෛත්‍රිසිතින් පහස්නා ලද රොජමල්ල තෙමේ ළදරු-වස්සකු ඇති දෙනක මෙන් වෙහෙරෙන් වෙහෙරට පිරිවෙණෙන් පිරිවෙණට ගොස් "ස්වාමීනි, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ දැන් කොහි වැඩ වසන සේක් ද ? අපි අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ දක්නු කැමැත්තම්හ" යි භික්ෂූන් විචාරයි. "ඇවැත, රොජය, තෙල වැසූ දොර ඇති විහාරය වෙයි. නිශ්ශබ්ද ව එහි එළඹ ඉක්මන් නො වී ආලින්දයට පිවිස කාරා අගුළට තට්ටු කරව. භාග්‍යවතුන් වහන්සේ තට දොර අරින්නාහු ය" යි භික්ෂූහු කීහ.

52. අථ ඛො රොජො මල්ලො යෙන සො විහාරො සංවුතද්වාරො, තෙන අප්පසද්දො උපසඞ්කමිත්වා අතරමානො ආලින්දං පවිසිත්වා උක්කාසිත්වා අග්ගළං ආකොටෙසි. විවරි භගවා ද්වාරං. අථ ඛො රොජො මල්ලො විහාරං පවිසිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නස්ස ඛො රොජස්ස මල්ලස්ස භගවා ආනුපුබ්බිකථං කථෙසි; සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං, කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං, නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි.

53. යදා භගවා අඤ්ඤාසි රොජං මල්ලං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා, තං පකාසෙසි: දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පතිගණ්හෙය්‍ය, එවමෙව ඛො රොජස්ස මල්ලස්ස තස්මිංයෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: "යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම" න්ති.

54. අථ ඛො රොජො මල්ලො දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජපත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච: "සාධු භන්තෙ අය්‍යා මමඤ්ඤෙව පතිගණ්හෙය්‍යුං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං, නො අඤ්ඤෙස" න්ති. "යෙසං ඛො රොජ, සෙඛෙන ඤාණෙන සෙඛෙන දස්සනෙන ධම්මො දිට්ඨො සෙය්‍යථාපි තයා, තෙසම්පි එවං හොති: 'අහො නූන අය්‍යා අම්හාකඤ්ඤෙව පතිගණ්හෙය්‍යුං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං, නො අඤ්ඤෙස'න්ති. තෙන හි රොජ, තව චෙව පටිග්ගහෙස්සන්ති අඤ්ඤෙසඤ්චා" ති.

55. තෙන ඛො පන සමයෙන කුසිනාරායං පණීතානං භත්තානං භත්තපටිපාටි අට්ඨිතා හොති. අථ ඛො රොජස්ස මල්ලස්ස පටිපාටිං අලභන්තස්ස එතදහොසි: "යංනූනාහං භත්තග්ගං ඔලොකෙය්‍යං, යං භත්තග්ගෙ නාස්ස, තං පටියාදෙය්‍ය" න්ති. අථ ඛො රොජො මල්ලො භත්තග්ගං ඔලොකෙන්තො ද්වෙ නාද්දස ඩාකඤ්ච පිට්ඨඛාදනීයඤ්ච. අථ ඛො රොජො මල්ලො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතදවොච: "ඉධ මෙ භන්තෙ ආනන්ද, පටිපාටිං අලභන්තස්ස එතදහොසි: 'යංනූනාහං භත්තග්ගං ඔලොකෙය්‍යං, යං භත්තග්ගෙ නාස්ස, තං පටියාදෙය්‍ය'න්ති. සො ඛො අහං භන්තෙ ආනන්ද, භත්තග්ගං ඔලොකෙන්තො ද්වෙ නාද්දසං ඩාකඤ්ච පිට්ඨඛාදනීයඤ්ච. සචාහං භන්තෙ ආනන්ද, පටියාදෙය්‍යං ඩාකඤ්ච පිට්ඨඛාදනීයඤ්ච, පතිගණ්හෙය්‍ය මෙ භගවා" ති. "තෙන හි රොජ, භගවන්තං පටිපුච්ඡිස්සාමී" ති.

56. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි. "තෙනහානන්ද, පටියාදෙතූ" ති. "තෙන හි රොජ, පටියාදෙහී" ති.

52. ඉක්බිති රෝජමල්ල තෙමේ වැසූ දොර ඇති ඒ වෙහෙරට නිශ්ශබ්ද ව පැමිණ ඉක්මන් නො වී ආලින්දයට පිවිස කාරා අගුලට තට්ටු කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ දොර ඇළ සේක. එවිට රෝජ මල්ල තෙමේ වෙහෙරට පිවිස භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් රෝජමල්ලයාහට පිළිවෙළ කතාව එනම්: දානකථාව ශීලකථාව ස්වර්ගකථාව, කාමයන් දුක්බව ලාමකබව කෙලෙසීම ඇති බව වදාළ සේක. පැවිද්දෙහි අනුසස් ද ප්‍රකාශ කළ සේක.

53. භාග්‍යවතුන් වහන්සේ යම් විටෙක රෝජමල්ලයා සුදුසු සිත් ඇතැ යි මොළොක් සිත් ඇතැ යි නීවරණ රහිත සිත් ඇතැ යි ඔදවැඩි සිත් ඇතැ යි පහන් සිත් ඇතැ යි දත් සේක් ද, එකල්හි බුදුවරුන්ගේ සාමුක්කර්ෂිකධර්මදෙශනාව - දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍යය මාර්ගසත්‍යය යන චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශ කළ සේක. පහ වූ කිලුටු ඇති පිරිසිදු වස්ත්‍රයෙක් යම් සේ මනා කොට සායම් ගන්නේ ද, එපරිද්-දෙන් ම රෝජමල්ලයාහට ඒ ආසනයෙහි දී ම ''යමක් හටගැණීම ස්වභාවය කොට ඇත්තේ ද, ඒ සියල්ල නිරුද්ධ වීම ස්වභාවය කොට ඇතැ'' යි යන පහ වූ රාගාදිරජස් ඇති පහ වූ කෙලෙස්මල ඇති සෝතාපත්ති-මග්ගඤාණය පහළ වූයේ ය.

54. ඉක්බිති දක්නා ලද දහම් ඇති අවබොධ කළ දහම් ඇති බැස ගත් දහම් ඇති තරණය කළ විචිකිච්ඡා ඇති පහ වූ කෙසේ කෙසේ දැ යි පැවැති සැක ඇති විශාරදභාවයට පැමිණි බුදුදහම්හි අනුන්ගේ උපකාරයක් නො වුව මනා වූ රෝජමල්ල තෙමේ භාග්‍යවතුන් වහන්සේට ''ස්වාමීනි, ආර්‍ය්‍යයන් වහන්සේලා මාගෙන් ම සිවුරු, පිඬු, සෙනසුන්, ගිලන්පස බෙහෙත්පිරිකර පිළිගන්නාහු නම්, අනුන්ගෙන් නො පිළිගන්නාහු නම්, යෙහෙකැ'' යි සැළකෙළේ ය ''රෝජය, තා විසින් දක්නා ලද පරිදි යම් කෙනෙකුන් විසින් සෙඛඤාණයෙන් සෙඛදස්සනයෙන් නිර්‍වාණධර්මය දක්නා ලද්දේ නම්, ඔවුන්ට ද 'ආර්‍ය්‍යයන් වහන්සේලා අපගෙන් ම සිවුරු අහර සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර පිළිගන්න හු නම්, අනුන්ගෙන් නො පිළිගන්නාහු නම්, යෙහෙකැ' යි මෙසේ අදහස් වේ. රෝජය, එසේ නම්, තාගේ සිවුරු - පිරිකර ද අනුන්ගේ සිවුරු - පිරිකර ද, පිළිගන්නාහු ය'' යි (වදාළ සේක).

55. එකල්හි කුසිනාරානුවර පිණි වූ බත් පිළිවෙළක් පැවැත්තේ ය. එකල්හි පිළිවෙළ (දන් දීමට දිනක්) නො ලබන්නා වූ රෝජමල්ලයාහට ''මම බත්හල බලන්නෙම් නම් යෙහෙක. බත්හලෙහි යමක් නො වන්නේ නම්, එය පිළියෙල කරන්නෙමි'' යි සිත් වි ය. ඉන් පසු බත්හල බලන්නා වූ රෝජමල්ල තෙමේ පලා ද පිටිකැවිලි ද යන දෙක නො දුටුයේ ය. එවිට රෝජමල්ල තෙමේ ආයුෂමත් ආනන්දතෙරුන් වෙතට ගියේ ය. ගොස් ආයුෂමත් ආනන්දතෙරුන්ට ''ස්වාමීනි, ආනන්දස්ථවිරයන් වහන්ස, මෙහි දන් දීමට දිනක් නො ලබන්නා වූ මට 'මම බත්හල බලන්නෙම් නම්, යෙහෙක. බත්හලෙහි යමක් නො වන්නේ නම්, එය පිළියෙල කරන්නෙමි' යි සිත් වි ය. ස්වාමීනි, ආනන්දස්ථවිරයන් වහන්ස, ඒ මම බත්හල බලන්නෙම් පලාකොළ ද පිටිකැවුම් ද යන දෙක නො දුටුවෙමි. ස්වාමීනි, ආනන්දස්ථවිරයන් වහන්ස, ඒ මම පලාකොළත් පිටිකැමත් පිළියෙල කරන්නෙම් නම්, භාග්‍යවතුන් වහන්සේ මාගේ පලාකොළත් පිටිකැමත් පිළිගන්නා සේක් දැ'' යි විචාළේ ය. ''රෝජය, එසේ නම් භාග්‍යවතුන් වහන්සේ විචාරන්නෙමි'' යි.

56. ඉක්බිති ආනන්දස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළකළහ: ''ආනන්දය, එසේ නම් පිළියෙල කෙරේවා'' යි. ''රෝජය, එසේ නම් පිළියෙල කරන්නැ'' යි (ආනන්දස්ථවිරයන් වහන්සේ රෙජයාහට දැන්වූහ).

57. අථ ඛො රොජො මල්ලො තස්සා රත්තියා අච්චයෙන පහූතං ඩාකඤ්ච පිට්ඨඛාදනීයඤ්ච පටියාදාපෙත්වා භගවතො උපනාමෙසි "පටිග්ගණ්හාතු මෙ භන්තෙ භගවා ඩාකඤ්ච පිට්ඨඛාදනීයඤ්චා" ති. "තෙන හි රොජ, භික්ඛූනං දෙහී"ති*. භික්ඛූ කුක්කුච්චායන්තා න පටිග්ගණ්හන්ති. "පටිග්ගණ්හාථ භික්ඛවෙ, පරිභුඤ්ජථා" ති.

58. අථ ඛො රොජො මල්ලො බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පහූතෙහි ඩාකෙහි ච පිට්ඨඛාදනීයෙහි ච සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං ධොතහත්ථං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො රොජං මල්ලං භගවා ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

59. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, සබ්බඤ්ච ඩාකං සබ්බඤ්ච පිට්ඨඛාදනීය" න්ති.

60. අථ ඛො භගවා කුසිනාරායං යථාභිරන්තං විහරිත්වා යෙන **ආතුමා,** තෙන චාරිකං පක්කාමි මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි.

61. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො වුඩ්ඪපබ්බජිතො ආතුමායං පටිවසති නහාපිතපුබ්බො. තස්ස ද්වෙ දාරකා හොන්ති මඤ්ජුකා පටි-භාණෙය්‍යකා දක්ඛා පරියොදාතසිප්පා සකෙ ආචරියකෙ නහාපිතකම්මෙ. අස්සොසි ඛො සො වුඩ්ඪපබ්බජිතො "භගවා කිර ආතුමං ආගච්ඡති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහී" ති.

62. අථ ඛො සො වුඩ්ඪපබ්බජිතො තෙ දාරකෙ එතදවොච: "භගවා කිර තාතා, ආතුමං ආගච්ඡති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි. ගච්ඡථ තුම්හෙ තාතා, ඛුරභණ්ඩං ආදාය. නාළියාවාපකෙන අනුඝරකං[1] ආහිණ්ඩථ. ලොණම්පි තෙලම්පි තණ්ඩුලම්පි ඛාදනීයම්පි සංහරථ. භගවතො ආගතස්ස යාගුදානං[2] කරිස්සාමා" ති. "එවං තාතා" ති ඛො තෙ දාරකා තස්ස වුඩ්ඪපබ්බජිතස්ස පටිස්සුත්වා ඛුරභණ්ඩං ආදාය නාළියා ආවාපකෙන අනුඝරකං ආහිණ්ඩන්ති ලොණම්පි තෙලම්පි තණ්ඩුලම්පි ඛාදනීයම්පි සංහරන්තා. මනුස්සා තෙ දාරකෙ මඤ්ජුකෙ පටිභාණෙය්‍යකෙ පස්සිත්වා යෙපි න කාරාපෙතුකාමා, තෙපි කාරාපෙන්ති. කාරාපෙත්වාපි බහුං දෙන්ති. අථ ඛො තෙ දාරකා බහුං ලොණම්පි තෙලම්පි තණ්ඩුලම්පි ඛාදනීයම්පි සංහරිංසු.

63. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන ආතුමා තදවසරි. තත්‍ර සුදං භගවා ආතුමායං විහරති භුසාගාරෙ.

---

*. "අථ ඛො රොජො මල්ලපුත්තො භික්ඛූනං දෙති" ම ඡ සං. අයං පාඨො සීහලක්ඛරපොත්ථකෙසු න දිස්සතෙ.

1. "අනුඝරකං අනුඝරකං" ම ඡ සං. P T S. තො වි අ වි.

2. "යාගුපානං" ම ඡ සං. P T S. තො වි.

Free Distribution www.aathaapi.org

57. ඉක්බිති රෝජමල්ල තෙමේ ඒ රෑ ඉක්ම ගිය පසු බොහෝ පලා ද පිටිකෑම ද පිළියෙල කරවා "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මාගේ පලාත් පිටිකෑමත් පිළිගන්නා සේක්වා" යි භාග්‍යවතුන් වහන්සේ වෙතට එළවී ය. "රෝජය, එසේ නම් භික්ෂූන්ට දෙව" යි. භික්ෂූහු කුකුස් කරන්නෝ නො පිළිගණිත්. "මහණෙනි, පිළිගණිවු. වළඳවූ" යි.

58. ඉක්බිති රෝජමල්ල තෙමේ බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයා බොහෝ පලාවලින් හා පිටිකෑමෙන් ද සියතින් සතප්පා, සේදූ අත් ඇති පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙත පසෙක හුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් රෝජමල්ලයාට දැහැමිකතාවෙන් කරුණු දක්වා සමාදන් කරවා තියුණු කරවා සතුටු කරවා හුනස්නෙන් නැගිට වැඩි සේක.

59. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමිකතා කොට භික්ෂූන් ඇමතූ සේක. "මහණෙනි, පිසූ නො පිසූ සියලු පලා ද සියලු පිටිකෑම ද අනුදනිමි" යි

60. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කැමැති තාක් කල් කුසිනාරාවෙහි වාසය කොට එක්දහස්දෙසියපණසක් වූ මහාභික්ෂුසඞ්ඝයා සමග ආතුමා-නගරය බලා චාරිකාවෙහි වැඩි සේක.

61. එකල්හි පෙර කරනෑවැමියෙක් වූ එක්තරා මහලු පැවිද්දෙක් ආතුමානගරයෙහි වෙසෙයි. ඔහුට මිහිරිබස් කියන සියසිප්හි වැටහෙන නුවණැති දක්ෂ වූ සියඇදුරන් අයත් කරනෑවිකම්හි නිදෙස් වූ ශිල්ප ඇත්තා වූ දරු දෙදෙනෙක් වෙත්. ඒ මහලු පැවිදි තෙමේ "භාග්‍යවතුන් වහන්සේ එක්දහස්දෙසියපණසක් වූ මහාභික්ෂුසඞ්ඝයා සමග ආතුමානගරයට එත් ල" යි ඇසී ය.

62. ඉක්බිති ඒ මහලු පැවිදි තෙමේ "දරුවෙනි, භාග්‍යවතුන් වහන්සේ එක්දහස්දෙසියපණසක් වූ මහාභික්ෂුසඞ්ඝයා සමග ආතුමානගරයට එත් ල" යි ඒ දරුවන්ට කී ය. "දරුවෙනි, තෙපි කරනෑවිබඩු ගෙණ නැළියක් හා ආචාපක= පසුම්බියක් ද ඇතු ව යවු. ගෙයක් පාසා ඇවිදිවූ. වැඩියා වූ භාග්‍යවතුන්ට කැඳදනක් දෙන්නෙමු. ලුණු ද තෙල් ද සහල් ද කෑ යුතු දේ ද රැස් කරවු" යි. "පියේ, එසේ ය" යි ඒ දරුවෝ මහලු පැවිද්දාට පිළිවදන් දී කරනෑවිබඩු ගෙණ නැළියකින් හා පසුම්-බියකින් යුක්ත ව ලුණු ද තෙල් ද සහල් ද කෑ යුතු දේ ද රැස් කරමින් ගෙයක් පාසා ඇවිදිත්. මිනිස්සු මිහිරිබස් කියන සියසිප්හි ප්‍රතිභා සම්පන්න වූ ඒ දරුවන් දැක, යම් කෙනෙක් (කරකම්) නො කරවනු කැමැත්තාහු ද, ඔහු ද කරවත්. කරවා ගෙණ ද බොහෝ දෙත්. ඉක්බිති ඒ දරුවෝ බොහෝ ලුණු ද තෙල් ද සහල් ද කෑ යුතු දේ ද රැස් කළහ.

63. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් චාරිකා කරණ සේක් ආතුමානගරයට පැමිණියහ. භාග්‍යවතුන් වහන්සේ එහි පිදුරු (සෙවෙනි කළ) ගෙයක වැඩ වසන සේක.

64. අථ ඛො සො බුඩ්ඪපබ්බජිතො තස්සා රත්තියා අච්චයෙන පහූතං යාගුං පටියාදාපෙත්වා භගවතො උපනාමෙසි: "පටිග්ගණ්හාතු මෙ භන්තෙ භගවා යාගු"න්ති.

65. ජානන්තාපි තථාගතා පුච්ඡන්ති. ජානන්තාපි න පුච්ඡන්ති. කාලං විදිත්වා පුච්ඡන්ති. කාලං විදිත්වා න පුච්ඡන්ති. අත්ථසංහිතං තථාගතා පුච්ඡන්ති නො අනත්ථසංහිතං. අනත්ථසංහිතෙ සෙතුඝාතො තථාගතානං. ද්වීහාකාරෙහි බුද්ධා භගවන්තො භික්ඛූ පටිපුච්ඡන්ති: "ධම්මං වා දෙසෙස්සාම. සාවකානං වා සික්ඛාපදං පඤ්ඤාපෙස්සාමා"ති.

66 අථ ඛො භගවා තං බුඩ්ඪපබ්බජිතං එතදවොච: "කුතායං භික්ඛු, යාගූ"ති අථ ඛො සො බුඩ්ඪපබ්බජිතො භගවතො එතමත්ථං ආරොචෙසි. විගරහි බුද්ධො භගවා 'අනනුච්ඡවියං මොඝපුරිස, අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම ත්වං මොඝපුරිස, පබ්බජිතෙ[1] අකප්පියෙ සමාදපෙස්සසි[2]. නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, පබ්බජිතා අකප්පියෙ සමාදපෙතබ්බා[3]. යො සමාදපෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. න ච භික්ඛවෙ, නහාපිතපුබ්බෙන ඛුරභණ්ඩං පරිහරිතබ්බං. යො පරිහරෙය්‍ය ආපත්ති දුක්කටස්සා" ති.

67. අථ ඛො භගවා ආතුමායං යථාභිරන්තං විහරිත්වා යෙන සාවත්ථි, තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි, තදවසරි. තත්‍ර සුදං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

68. තෙන ඛො පන සමයෙන සාවත්ථියං බහුං ඵලඛාදනීයං උප්පන්නං හොති[4]. අථ ඛො භික්ඛූනං එතදහොසි: "කින්නු ඛො භගවතා ඵලඛාදනීය අනුඤ්ඤාතං? කිං අනනුඤ්ඤාත"න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සබ්බං ඵලඛාදනීය"න්ති.

69. තෙන ඛො පන සමයෙන සඞ්ඝිකානි බීජානි පුග්ගලිකාය භූමියා රොපීයන්ති. පුග්ගලිකානි බීජානි සඞ්ඝිකාය භූමියා රොපීයන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "සඞ්ඝිකානි භික්ඛවෙ, බීජානි පුග්ගලිකාය භූමියා රොපිතානි භාගං දත්වා පරිභුඤ්ජිතබ්බානි. පුග්ගලිකානි බීජානි සඞ්ඝිකාය භූමියා රොපිතානි භාගං දත්වා පරිභුඤ්ජිතබ්බානී" ති.

---

1. "පබ්බජිතො" ම ඡ සං. P T S. තො වි. සී මු. ඉමස්ස බුඩ්ඪපබ්බජිතස්ස ද්වෙ දාරකාපි පබ්බජිතා සාමණෙරභූමියං ඨිතානි දීඝනිකායට්ඨකථායං වුත්තං. තස්මා එත්ථ "පබ්බජිතෙ"ති පදං යුත්තමෙව.
2. "සමාදපෙසි" ම ඡ සං
3. "පබ්බජිතෙන සමාදපෙතබ්බා" ම ඡ සං. P T S. තො වි. තො වි. ජ. වි
,, පබ්බජිතෙ " සී මු. 1 "පබ්බජිතෙන" සමාදපෙතබ්බා. සී මු 2.
4. "උස්සන්නං" ම ඡ සං.

64. ඉක්බිති ඒ මහලු පැවිදිතෙමේ ඒ රෑ ඉක්ම ගිය පසු බොහෝ කැඳ පිළියෙල කරවා "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කැඳ පිළිගන්නා සේක්වා" යි භාග්‍යවතුන් වහන්සේ වෙතට එළැවී ය.

65. තථාගතවරු දන්නෝ ම විචාරත්. දන්නෝ ම නො විචාරත්. කල් දැන විචාරත්. කල් දැන නො විචාරත්. තථාගතවරු අර්ථයෙන් යුක්ත වූවක් විචාරත්. අනර්ථ සහිත වූවක් නො විචාරත්. අනර්ථයෙන් යුක්ත වචනයෙහි සේතු නැසීම තථාගතයන් වහන්සේලාට මාර්ගයෙන් ම සිද්ධ ය. භාග්‍යවත් බුදුරජහු "ධර්මය හෝ දෙසන්නෙමු. ශ්‍රාවකයන්ට ශික්ෂාපද හෝ පණවන්නෙමු" යි යන දෙ කරුණින් භික්ෂූන් පිළිවිසිත්.

66. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මහලු පැවිද්දහු "මහණ, මේ කැඳ කොයින් ද?" යි අසා වදාළ සේක. එවිට ඒ මහලු පැවිදිතෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකෙළේ ය. ඉන් පසු භාග්‍යවත් බුදුරජානන් වහන්සේ "හිස් පුරුෂය, නුසුදුස්සෙක. අනුලෝම් නො වන්නෙක. නො ගැළපෙන්නෙක. මහණකමට නුසුදුසු ය. නො කැප වූවෙක. නො කට යුත්තෙක. හිස් පුරුෂය, කෙසේ නම් තෝ පැවිද්දන් නො කැප කරුණෙහි සමාදන් කරවූයෙහි ද, හිස් පුරුෂය, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ" යි ගැරහූ සේක. -පෙ- ගරහා දැහැමිකතා කොට භික්ෂූන් ඇමතූ සේක. "මහණෙනි, පැවිද්දෝ නො කැප කරුණෙහි සමාදන් නො කරවිය යුත්තාහු ය. යමෙක් සමාදන් කරවන්නේ නම්, දුකුළාඇවැත් වේ. මහණෙනි, පෙර කරනැවැමි වූ මහණහු විසින් කරබඩු පරිහරණය නො කළ යුතු ය. යමෙක් පරිහරණය කරන්නේ නම්, දුකුළාඇවැත් වේ" යි.

67. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කැමැති තාක් කල් ආතුමානගර යෙහි වැඩ වාසය කොට සැවැත්නුවර බලා චාරිකාවෙහි වැඩි සේක. පිළිවෙළින් චාරිකාවෙහි වඩිනා සේක් සැවැත්නුවරට පැමිණියහ. භාග්‍යවතුන් වහන්සේ එහි සැවැත්නුවර ජේතවනයෙහි අනේපිඩුසිටුහුගේ ආරාමයෙහි වසන සේක.

68. එකල්හි සැවැත්නුවර බොහෝ කෑ යුතු පල උපන්නේ වේ. එකල භික්ෂූන්ට "කිම, භාග්‍යවතුන් වහන්සේ විසින් කෑ යුතු පල අනුදන්නාලද ද ? කිම, නො අනුදන්නා ලද ද" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, කෑ යුතු සියලු පල අනුදනිමි" යි.

69. ඒ කාලයෙහි සඟුන් අයත් බිජුවට පුද්ගලයන් අයත් බිම්හි රොපණය කරණු ලැබේ. පුද්ගලයන් අයත් බිජුවට සඟුන් අයත් බිම්හි රොපණය කරණු ලැබේ. භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැලකළහ. "මහණෙනි, සඟුන් අයත් බිජුවට පුද්ගලයන් අයත් බිම්හි රොපණය කරණ ලද්දේ නම්, (දහයෙන්) කොටසක් දී වැළඳිය යුතු ය. පුද්ගලයන් අයත් බිජුවට සඟුන් අයත් බිම්හි රොපණය කරණ ලද්දේ නම්, (දහයෙන්) කොටසක් දී වැළඳිය යුතු ය" යි.

70. තෙන බො පන සමයෙන භික්ඛූනං කිස්මිඤ්චි කිස්මිඤ්චි ඨානෙ කුක්කුච්චං උප්පජ්ජති: "කින්නු බො භගවතා අනුඤ්ඤාතං? කිං අනනුඤ්ඤාත" 'න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "යං භික්ඛවෙ, මයා 'ඉදං න කප්පතී'ති අපටික්ඛිත්තං, තං චෙ අකප්පියං අනුලොමෙති, කප්පියං පටිබාහති, තං වො න කප්පති. යං භික්ඛවෙ, මයා 'ඉදං න කප්පතී'ති අපටික්ඛිත්තං, තං චෙ කප්පියං අනුලොමෙති, අකප්පියං පටිබාහති, තං වො කප්පති. යං භික්ඛවෙ, මයා 'ඉදං කප්පතීති අනනුඤ්ඤාතං, තං චෙ අකප්පියං අනුලොමෙති, කප්පියං පටිබාහති, තං වො න කප්පති. යං භික්ඛවෙ, මයා 'ඉදං කප්පතී'ති අනනුඤ්ඤාතං, තං චෙ කප්පියං අනුලොමෙති, අකප්පියං පටිබාහති, තං වො කප්පතී" ති.

71. අථ බො භික්ඛූනං එතදහොසි: "කප්පති නු බො යාවකාලිකෙන යාමකාලිකං? න නු බො කප්පති? කප්පති නු බො යාවකාලිකෙන සත්තාහකාලිකං? න නු බො කප්පති? කප්පති නු බො යාවකාලිකෙන යාවජීවිකං? න නු බො කප්පති? කප්පති නු බො යාමකාලිකෙන සත්තාහකාලිකං? න නු බො කප්පති? කප්පති නු බො යාමකාලිකෙන යාවජීවිකං? න නු බො කප්පති? කප්පති නු බො සත්තාහකාලිකෙන යාවජීවිකං? න නු බො කප්පතී?" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "යාවකාලිකෙන භික්ඛවෙ, යාමකාලිකං තදහු පටිග්ගහිතං කාලෙ කප්පති. විකාලෙ න කප්පති. යාවකාලිකෙන භික්ඛවෙ, සත්තාහකාලිකං තදහු පටිග්ගහිතං කාලෙ කප්පති. විකාලෙ න කප්පති. යාවකාලිකෙන භික්ඛවෙ, යාවජීවිකං තදහු පටිග්ගහිතං කාලෙ කප්පති. විකාලෙ න කප්පති. යාමකාලිකෙන භික්ඛවෙ, සත්තාහකාලිකං තදහු පටිග්ගහිතං යාමෙ කප්පති. යාමාතික්කන්තෙන න කප්පති. යාමකාලිකෙන භික්ඛවෙ, යාවජීවිකං තදහු පටිග්ගහිතං යාමෙ කප්පති. යාමාතික්කන්තෙන න කප්පති. සත්තාහකාලිකෙන භික්ඛවෙ යාවජීවිකං තදහු පටිග්ගහිතං සත්තාහං කප්පති. සත්තාහාතික්කන්තෙන න කප්පතී" ති.

**භෙසජ්ජක්ඛන්ධකො නිට්ඨිතො ඡට්ඨො.**

---

70. ඒ කාලයෙහි භික්ෂූන්ට ඇතැම් කරුණෙහි "කිම, භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදන්නා ලද ද? කිම, නො අනුදන්නා ලද දැ" යි කුකුස් උපදී. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මා විසින් 'මේ නො කැපැ' යි යමක් ප්‍රතික්ෂෙප නො කරණ ලද්දේ ද, ඉදින් එය නො කැපයට අනුලොම් වේ ද, කැපය වළකා ද, තොපට එය නො කැප වේ. මහණෙනි, මා විසින් 'මේ නො කැපැ' යි යමක් ප්‍රතික්ෂෙප නො කරණ ලද්දේ ද, ඉදින් එය කැපයට අනුලොම් වේ ද, නො කැපය වළකා ද, තොපට එය කැප වේ. මහණෙනි, මා විසින් මේ කැපැ යි යමක් නො අනුදන්නා ලද්දේ ද, ඉදින් එය නො කැපයට අනුලොම් වේ ද, කැපය වළකා ද, තොපට එය නො කැප වේ. මහණෙනි, මා විසින් මේ කැපැ යි නො අනුදන්නා ලද්දේ ද, ඉදින් එය කැපයට අනුලොම් වේ ද, නො කැපය වළකා ද, තොපට එය කැප වේ" යි.

71. එකල්හි භික්ෂූන්ට "යාවකාලිකය හා මිශ්‍ර වූ යාමකාලිකය කැප වේ ද? නො කැප වේ ද? යාවකාලිකය හා මිශ්‍ර වූ සත්තාහකාලිකය කැප වේ ද? නො කැප වේ ද? යාවකාලිකය හා මිශ්‍ර වූ යාවජීවිකය කැප වේ ද? නො කැප වේ ද? යාමකාලිකය හා මිශ්‍ර වූ සත්තාහකාලිකය කැප වේ ද? නො කැප වේ ද? යාමකාලිකය හා මිශ්‍ර වූ යාවජීවිකය කැප වේ ද? නො කැප වේ ද? සත්තාහකාලිකය හා මිශ්‍ර වූ යාවජීවිකය කැප වේ ද? නො කැප වේ දැ" යි අදහස් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, එදවස පිළිගන්නා ලද යාවකාලිකය හා මිශ්‍ර වූ යාමකාලිකය කාලයෙහි (පෙරවරුයෙහි) කැප වේ. නො කල්හි (පස්වරු-යෙහි) නො කැප වේ. මහණෙනි, එදවස පිළිගත් යාවකාලිකය හා මිශ්‍ර වූ සත්තාහකාලිකය කාලයෙහි කැප වේ. නො කල්හි නො කැප වේ. මහණෙනි, එදවස පිළිගත් යාවකාලිකය හා මිශ්‍ර වූ යාවජීවිකය කාලයෙහි කැප වේ. නො කල්හි නො කැප වේ. මහණෙනි, එදවස පිළිගත් යාමකාලිකය හා මිශ්‍ර වූ සත්තාහකාලිකය පැසුළුයම අවසන තෙක් කැප වේ. පැසුළුයම ඉක්මුනු කල්හි නො කැප වේ. මහණෙනි, එදවස පිළිගත් යාමකාලිකය හා මිශ්‍ර වූ යාවජීවිකය පැසුළුයම අවසන තෙක් කැප වේ. පැසුළුයම ඉක්මුනු කල්හි නො කැප වේ. මහණෙනි, එ දවස පිළිගත් සත්තාහකාලිකය හා මිශ්‍ර වූ යාවජීවිකය සතියක් කැප වේ. සතිය ඉක්මුනු කල්හි නො කැප වේ" යි.

**සවන භෙසජ්ජක්ඛන්ධකය නිමි.**

---

## ඉමම්හි ඛන්ධකෙ වත්ථූ එකසතං ඡ වත්ථූ.

තස්ස උද්දානං:

සාරදිකෙ විකාලෙපි වසං මූලෙ පිට්ඨෙහි ච,
කසාවෙහි පණ්ණං ඵලං ජතු ලොණං ඡකනඤ්ච.

චුණ්ණං චාලිනී මංසඤ්ච අඤ්ජනී[1] උපපිංසනී[2],
අඤ්ජනී උච්ච[3]පාරුතා සලාකා සලාකොධනී[4].

ථවිකං සවට්ටකං[5] සුත්තං මුද්ධනි තෙල[6]නත්ථු ච,
නත්ථුකරණී ධූම[7] නෙත්තඤ්ච පිධානං යමකත්ථවි[8].

තෙලපාකෙසු මජ්ජඤ්ච අතික්ඛිත්තං අබ්භඤ්ජනං,
තුම්බං සෙදං සම්භාරඤ්ච මහාභඞ්ගොදකං තථා.

දකකොට්ඨං ලොහිතඤ්ච විසාණං පාදබ්භඤ්ජනං,
පජ්ජං සත්ථං කසාවඤ්ච තිලකක්කං කබලිකං.

චොලං සාසපකුඩ්ඩඤ්ච[9] ධූමසක්ඛරිකාය ච,
වණතෙලං විකාසිකං විකටඤ්ච පටිග්ගහං.

ගූථං කරොන්තො රොළිඤ්ච ඛාරං මුත්තහරිටකී[10]
ගන්ධා විරෙචනඤ්චෙව අච්ඡාකට[11] කටාකටං.

පටිච්ඡාදනී පබ්භාරා ආරාමා සත්තා පඤ්චහි[12]
ගුළං මුග්ගං සොවීරඤ්ච සාමපාකා[13] පුනා පචෙ.

පුනානුඤ්ඤාසි දුබ්භික්ඛෙ ඵලඤ්ච තිලඛාදනී,
පුරෙභත්තං කායඩාහො නිබ්බට්ටඤ්ච භගන්දලං.

වත්ථිකම්මඤ්ච සුප්පි ච[14] මනුස්සමංසමෙව ච,
හත්ථි අස්සා සුනඛාහි[15] සීහව්‍යග්ඝං ච දීපිකං.[16]

අච්ඡ තරච්ඡ මංසඤ්ච පටිපාටි ච යාගු ච,
තරුණං අඤ්ඤත්‍ර ගුළං සුනීධාවසථාගාරං.[17]

ගඞ්ගා කොටි සච්චකථා අම්බපාලී ච ලිච්ඡවී,
උද්දිස්ස කටං සුභික්ඛං පුනදෙව පටික්ඛිපි.

මෙඝො යසො මෙණ්ඩකො ච ගොරසං පාථෙය්‍යකෙන ච,
කෙණි අම්බො ජම්බුචොච මොචමධුමුද්දිකසාලුකං.

ඵාරුසකා[18] ඩාකපිට්ඨං ආතුමායං නහාපිතො,
සාවත්ථියං ඵලං බීජං කිස්මිං ඨානෙ ච කාලිකෙති.

---

1. "අඤ්ජනං" ම ඡ සං. P T S. 2. "උපපීසනී" ම ඡ සං. "උපපිංසනං" සි. P T S.
3. "උච්ච," ම ඡ සං. නො වි. 4. "සලාකඨානි" ම ඡ සං
5. "සබන්ධකං" ම ඡ සං "බන්ධකං" P T S. 6. "තෙලං" P T S.
7. "ධූමඤ්ච" ම ඡ සං. P T S.
8. "නෙත්තඤ්චාපිධ නත්ථවි" ම ඡ සං. "නෙත්තඤ්චා පිධානං ථවි" P T S.
9. "සාසපකුට්ටඤ්ඤාසඤ්ච" ම ඡ සං. P T S. "සාසපකුණ්ඩංච" අ වි. නො වි.
10. "හරිතකං" ම ඡ සං.
11. "අච්ඡාකටං" ම ඡ සං. 12. "ආරාමසත්ථාහෙනච" ම ඡ සං.
13. "සාමංපාකා" ම ඡ සං. 14 "සුප්පිඤ්ච" ම ඡ සං. ජ වි. අ වි.
15. "සුනඛොච" ම ඡ සං. P T S. ම නු ප.
16. "අහිසීහඤ්චදීපිකා," ම ඡ සං ජ වි. ම නු ප.
17. "වසථාගාරං" ම ඡ සං අ වි. P T S. ජ වි. 18. "ථාරුසකා" ම ඡ සං. සී මු.

මේ ඛන්ධකයෙහි වස්තු එක්සියසයෙකි.

එහි උද්දානය (වස්තුනාමාවලිය) මෙසේ යː-

ශරද්ඍතුවෙහි ලෙඩ, නො කල්හි ගිතෙල් ඈ බෙහෙත්, චූරුණුතෙල්, මුල් හා මුලින් කළ පිටි, කසට හා කොළ, පල ලාටු, ලුණු, අස්බෙටි ද,

සුණු පෙණේරය, අමුමස්, අඳුන්, අඳුන් සාදන ද්‍රව්‍යය, අඳුන්කුලා, රත් ආදියෙන් කළ උසස් අඳුන්කූරු, අඳුන්කූරුකොපු,

ඵවිකය, අංසවට්ටකය, හුය, හිසෙහි ලන තෙල්, නස්‍යය, නස්‍යය කරණ ඔරු, ධූමනෙත්තය, පියන, යමකඵවිකය,

මද්‍ය මිශ්‍ර තෙල් පිසීම, අධිකමද්‍යතෙල්බීම, තෙල් ඇඟ ගෑම, සැළි, ඩහගැන්වීම, සම්භාරසෙදය, මහාසෙදය, එසේ ම භඞ්ගෝදකය,

දියකොටුව, ලේ බැහැර කිරීම, වක්කම් ඇල්ලීම, පාතෙල් ගැල්වීම, පාදයට හිත තෙල් පිසීම, සැත්කම් කිරීම, කසාවොදකය, තිලකක්කය, කබලිකය,

වණ බඳින රෙදිකඩ, අබපිටි, දුම් දීම, ලුණුපුපුරෙන් කැපීම, වණතෙල්, වණවැටිය, විකට පිළිගැණීම,

මල පෙවීම, සීතාලෙලිය, ක්ෂාරය, ගොමූත්‍රයෙහි ලූ අරළු, ගන්ධාලෙපය, විරෙචනය, අච්ඡකඤ්ජිය, නො කළ යූෂය, කළ නො කළ යූෂය,

මස්රසය, ගුහා පිරිසිදු කිරීම, ආරාමිකයන් පන්සියයක් දීම, උක්සකුරු, මුංඇට, ලුණුකාඩි, සාම්පාකය, පුනපාකය,

දුර්භික්ෂයෙහි නැවත අනුදැනීම, පල, තල, කැයුතු දෙය, පෙරබත, කායදාහය, උපුටා හළ බීජ ඇති පල, භගන්දරාරොගය,

වස්තිකර්මය, සුප්පියාඋපාසිකාව, මිනිමස්, ඇත්මස්, අස්මස්, බල්ලුමස්, සර්පමස්, සිංහමස්, ව්‍යාඝ්‍රමස්, දිවිමස්.,

වලස්මස්, කරබානාවලස්මස්, පටිපාටිය, කැඳ, තරුණමහාමාත්‍ය, අත් තැනෙක නො වැළඳීම, උක්සකුරු, සුනීධ-වස්සකාර දෙදෙන, ආවසථාගාරය,

ගඞ්ගානදිය, කොටිග්‍රාමය, චතුස්සත්‍යකථා, අම්බපාලිගණිකාව, ලිච්ඡවීහු, උදෙසා කළ මත්ස්‍යමාංසය, සුභික්ෂයෙහි නැවත තහනම් කිරීම,

මෙණ්ඩය, යසොජසප්පිර, මෙණ්ඩක, මාගෝපකරණය හා පස්ගෝරසය, කෙණිය, අම්බජම්බු චොච මොච මධු මුද්දික සාලුක ඵාරුසක යන අෂ්ටපාන වර්ග, පලාකොළ හා පිටි, ආතුමාතුවර, කරනැවැමි, සැවැත්නුවර දී කැයුතු පල අනුදැනීම, බීජරොපණය, ඇතැම් කරුණෙහි සැකය, කාලිකයෙහි විනිශ්චය ද වේ.

# 7

# කඨිනක්ඛන්ධකං

---

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

2. තෙන ඛො පන සමයෙන තිංසමත්තා **පාවෙය්‍යකා**[1] භික්ඛූ සබ්බෙ ආරඤ්ඤකා[2] සබ්බෙ පිණ්ඩපාතිකා සබ්බෙ පංසුකූලිකා සබ්බෙ තෙචීවරිකා **සාවත්ථිං** ගච්ඡන්තා[3] භගවන්තං දස්සනාය උපකට්ඨාය වස්සූපනායිකාය නාසක්ඛිංසු සාවත්ථියං වස්සූපනායිකං සම්භාවෙතුං. අන්තරාමග්ගෙ **සාකෙතෙ** වස්සං උපගච්ඡිංසු.

3. තෙ උක්කණ්ඨිතරූපා වස්සං වසිංසු "ආසන්නෙව නො භගවා විහරති ඉතො ඡසු යොජනෙසු. න ච මයං ලභාම භගවන්තං දස්සනායා" ති.

4. අථ ඛො තෙ භික්ඛූ වස්සං වුත්ථා තෙමාසච්චයෙන කතාය පවාරණාය දෙවෙ වස්සන්තෙ උදකසඞ්ගහෙ උදකචික්ඛල්ලෙ ඔකපුණ්ණෙහි චීවරෙහි කිලන්තරූපා, යෙන සාවත්ථි ජෙතවනං අනාථපිණ්ඩිකස්ස ආරාමො, යෙන භගවා, තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

5. ආචිණ්ණං ඛො පනෙතං බුද්ධානං භගවන්තානං ආගන්තුකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදිතුං. අථ ඛො භගවා තෙ භික්ඛූ එතදවොච: "කච්චි භික්ඛවෙ, ඛමනීයං ? කච්චි යාපනීයං ? කච්චි සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිත්ථ ? න ච පිණ්ඩකෙන කිලමිත්ථා?" ති.

6. "ඛමනීයං භගවා. යාපනීයං භගවා. සමග්ගා ච මයං භන්තෙ, සම්මොදමානා අවිවදමානා වස්සං වසිම්හ. න ච පිණ්ඩකෙන කිලමිම්හ. ඉධ මයං භන්තෙ තිංසමත්තා පාවෙය්‍යකා භික්ඛූ සාවත්ථිං ආගච්ඡන්තා භගවන්තං දස්සනාය උපකට්ඨාය වස්සූපනායිකාය නාසක්ඛිම්හ සාවත්ථියං වස්සූපනායිකං සම්භාවෙතුං. අන්තරාමග්ගෙ සාකෙතෙ වස්සං උපගච්ඡිම්හ. තෙ මයං භන්තෙ උක්කණ්ඨිතරූපා වස්සං වසිම්හ 'ආසන්නෙව නො භගවා විහරති ඉතො ඡසු යොජනෙසු. න ච මයං ලභාම භගවන්තං දස්සනායා' ති. අථ ඛො මයං භන්තෙ වස්සං වුත්ථා තෙමාසච්චයෙන කතාය පවාරණාය දෙවෙ වස්සන්තෙ උදකසඞ්ගහෙ උදකචික්ඛල්ලෙ ඔකපුණ්ණෙහි චීවරෙහි කිලන්තරූපා අද්ධානං ආගතා" ති.

7. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, වස්සං වුත්ථානං භික්ඛූනං කඨිනං[4] අත්ථරිතුං. අත්ථතකඨිනානං වො භික්ඛවෙ, පඤ්ච කප්පිස්සන්ති: අනාමන්තචාරො, අසමාදානචාරො, ගණභොජනං, යාවදත්ථචීවරං, යො ච තත්ථ චීවරුප්පාදො, සො නෙසං භවිස්සති.[5] අත්ථතකඨිනානං වො භික්ඛවෙ, ඉමානි පඤ්ච කප්පිස්සන්ති."

---

1. "පාථෙය්‍යකා" අට්ඨකථා. "පාඨෙය්‍යකා" ජ වි. ම නු ප. තො වි.
2. "ආරඤ්ඤිකා" ම ඡ සං. 3. "ආගච්ඡන්තා" ම ඡ සං.
4. "කඨිනං" ම ඡ සං. 5. "භවිස්සතීති"

# 7
# කඨිනක්ඛන්ධකය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ **සැවැත්නුවර ජේතවනයෙහි** වූ **අනේපිඩුසිටුහුගේ** ආරාමයෙහි වැඩ වසන සේක.

2. එකල්හි **පාවානුවරවැසි** තිසක් පමණ භික්ෂූහු සියල්ලෝ ආරණ්‍යක වූවාහු සියල්ලෝ පිණ්ඩපාතික වූවාහු සියල්ලෝ පංසුකූලික වූවාහු සියල්ලෝ තෙචීවරික වූවාහු භාග්‍යවතුන් වහන්සේ දක්නට සැවැත් නුවරට යන්නාහු වස් එළඹීම ලං වූ කල්හි සැවැත්නුවර වස් එළඹෙන්නට යැමට නො හැකි වූහ. අතරමග **සාකේතනුවර** වස් එළඹියහ.

3. ඔහු "භාග්‍යවතුන් වහන්සේ අපගේ සමීපයෙහි ම මෙයින් සයොදුනක් ගිය තැන්හි වැඩ වසන සේක. අපි භාග්‍යවතුන් වහන්සේ දක්නට නො ලබමු" යි කලකිරුණෝ ම වස් විසූහ.

4. ඉක්බිති වස් වැස නිම කල ඒ භික්ෂූහු තෙමසක් ඇවෑමෙන් පවාරණය කල කල්හි වැසි වසිද්දී දිය ගැල්මෙන් (වල ගොඩ) පිරුණු කල්හි ගොහොරු මඩෙහි දියෙන් පිරුණු (තෙමුනු) සිවුරුවලින් යුක්ත ව ක්ලාන්තසවභාව ඇත්තෝ සැවැත්නුවර ජේතවනයෙහි වූ අනේපිඩුසිටුහුගේ ආරාමයෙහි භාග්‍යවතුන් වහන්සේ වෙතට ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්හ.

5. භාග්‍යවත් බුදුවරුන්ට ආගන්තුක භික්ෂූන් සමග සතුටු වීම පුරුදු ම ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ගෙන් "මහණෙනි, කිම, ඉවසිය හැකි ද? කිම, යැපිය හැකි ද ? කිම, සමගි වූවහු සතුටු වූවහු විවාද නො කරන්නහු පහසුවෙන් වස් වුසුහු ද? ආහාරයෙන් වෙහෙසට පත් නො වූවහු දැ" යි අසා වදාළ සේක.

1. "ආගාරිකා" ම ඡ සං. ජ වි. 2. "ආරොගාඨිතාති" ම ඡ සං. P T S.
3. "අභයස්ස රාජකුමාරස්ස අන්තෙපුරෙ නිවෙසනං" ම ඡ සං.
4 "නචිරස්සෙව" සී. P T S. 5. "මං දිස්වා" ම ඡ සං. P T S

Free Distribution www.aathaapi.org

19. ඉක්බිති ඒ සිටුබිරිඳ ජීවක කොමාරභච්චයාගේ විකාරය (කළ-කිරීම) සලකා "ආචාර්යයෙනි, ඔබ කුමක් නිසා නො සතුටු ද?" යි ජීවක කොමාරභච්චයා විචාළා ය. "පුදුමයෙකි! මේ ගෙහබුව ඉතා ලොභ ඇත්තී ය. යම් හෙයකින් මැ මේ හළයුතු ගිතෙල පුලුන් රොදෙකින් ගන්වා ලූ ද, එහෙයිනි. මාගේ ඉතා අගනා බොහෝ බෙහෙත් ද (මැට) වැය විය. මෝ මට යම්කිසි දෙයධර්මයක් (මිලක්) කිම දෙන්නී දැ යි මෙහි මට මේ. අදහස වී ය"යි හෙතෙමේ කී ය. "ඇදුර, අපි ගිහි ගෙයි වසන්නමෝ සකසුරුවමේ (රැක්මේ) අනුසස් දනුම්හ. මේ ගිතෙල් දසයන්ගේ ද කම්කරුවන්ගේ ද පය ගැල්වීමට හෝ පහනක් දැල්වීමේ දී වත් කරණ ලද්දේ හෝ යහපත් ය. ඇදුර, ඔබ නො සතුටු නො වන්න. ඔබට දියයුතු දේ නො අඩු වන්නේ ය" යි ඕ තොමෝ කීය.

20. එකල්හි ජීවක කොමාරභච්ච තෙමේ සිටුබිරිඳගේ සත් වසක් පැවැති හිසරුදව එක ම නස්‍යකර්මයෙන් දුරු කෙළේ ය. ඉක්බිති සිටුබිරිඳ සුවපත් වූවා ජීවක කොමාරභච්චයාහට සාරදහසක් දුන්නී ය. පුත්‍රයා ද "මාගේ මවු නීරොග කරණ ලද" යි සාරදහසක් දුන්නේ ය. යෙහෙළිය "මගේ නැන්දා නීරොග කරණ ලද" යි සාරදහසක් දුන්නී ය. සිටුගැහැවි තෙමේ "මගේ බිරිඳ නීරොග කරණ ලද" යි සාරදහසක් ද දසයකු ද දසියක ද අශ්වරථයක් ද දුන්නේ ය.

21. ඉක්බිති ජීවක කොමාරභච්ච තෙමේ ඒ සොළොස් දහසත් දසයාත් දසියත් අශ්වරථයත් ගෙණ රජගහනුවර බලා නික්ම ගියේ ය. පිළිවෙළින් රජගහනුවරට ගොස් අභය රාජකුමාරයා වෙත එළඹියේ ය. එළඹ "දේවයන් වහන්ස, රන් සොළොස් දහසක් ද දසයෙක් ද දසියක් ද අශ්වරථයක් ද යන මෙතෙක් මගේ පළමු වෙදකමෙන් ලැබුනේ ය. දෙවයන් වහන්සේ මා වැඩූ පොසාවනික මිලයට මෙය පිළිගන්නා සේක්වා" යි අභයරාජකුමාරයාහට කීයේ ය. "සගය ජීවකය, කම් නැත. මේ තට ම වේවා. අපගේ ම නුවර තුළ ගෙයක් ගොඩ නගව" යි. "දෙවයන් වහන්ස, එසේ ය" යි ජීවක කොමාරභච්ච තෙමේ අභයරාජකුමාරයාහට පිළිවදන් දී ඇතුල්නුවර ගෙයක් ගොඩ නැංවී ය.

22. ඒ කාලයෙහි මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජුහට භගන්දරා-බාධය වේ. සළු ලෙයින් තැවරුණේ වේ. බිසෝවරු දැක "දැන් රජ තෙමේ උතුනී වේ. රජුට ඔසප් උපන. නො බෝ කලකින් රජ තෙමේ වදන්නේ ය" යි වෙහෙසත්. (කවටබස් කියත්.) එයින් රජ තෙමේ මංකු (=තෙද රහිත ව ලජ්ජිත) වේ.

23. එකල්හි මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජ තෙමේ අභයරාජ-කුමාරයාහට "සගය අභය, මට මෙබඳු රොගයෙක් වේ. සළු ලෙයින් වැකී යයි. බිසෝවරු දැක 'දැන් රජ තෙමේ මල්වර ඇත්තේ වේ. රජුට ඔසප් උපන. රජ තෙමේ නොබෝ කලකින් වදන්නේ ය'යි කවටකම් කෙරෙත්. "සගය, අභය, යමෙක් මට පිළියම් කරන්නේ ද, එබඳු වෙදකු දනුව" යි රජතෙමේ කීයේ ය. "දේවයන් වහන්ස, අපගේ මේ ජීවක වෙද තෙමේ තරුණ ය. භද්‍ර ය. කලණ ගුණ ඇත්තේ ය.) හෙතෙමේ දෙවයන් වහන්සේට පිළියම් කරන්නේ ය." (රජතෙමේ) "සගය අභය, එසේ නම් ජීවක වෙදුට අණ කරව. හෙතෙමේ මට පිළියම් කරන්නේ ය"යි කී ය.

24. අථ ඛො අභයො රාජකුමාරො ජීවකං කොමාරභච්චං ආණාපෙසි: "ගච්ඡ භණෙ ජීවක, රාජානං තිකිච්ඡාහී" ති. "එවං දෙවා" ති ඛො ජීවකො කොමාරභච්චො අභයස්ස රාජකුමාරස්ස පටිස්සුත්වා නඛෙන භෙසජ්ජං ආදාය යෙන රාජා මාගධො සෙනියො බිම්බිසාරො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රාජානං මාගධං සෙනියං බිම්බිසාරං එතදවොච: "ආබාධං[1] දෙව, පස්සාමා" ති.

25. අථ ඛො ජීවකො කොමාරභච්චො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස භගන්දලාබාධං එකෙනෙව ආලෙපෙන අපකඩ්ඪි. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො අරොගො සමානො පඤ්ච ඉත්ථිසතානි සබ්බාලඞ්කාරං භූසාපෙත්වා[2] ඔමුඤ්චාපෙත්වා පුඤ්ජං කාරාපෙත්වා ජීවකං කොමාරභච්චං එතදවොච: "එතං භණෙ ජීවක, පඤ්චන්නං ඉත්ථිසතානං සබ්බාලඞ්කාරං තුය්හං හොතූ" ති. "අලං දෙව, අධිකාරං මෙ දෙවො සරතූ" ති. "තෙන හි භණෙ ජීවක, මං උපට්ඨහ. ඉත්ථාගාරඤ්ච බුද්ධපමුඛඤ්ච සඞ්ඝ" න්ති[3]. "එවං දෙවා" ති ඛො ජීවකො කොමාරභච්චො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පච්චස්සොසි.

26. තෙන ඛො පන සමයෙන රාජගහිකස්ස සෙට්ඨිස්ස සත්තවස්සිකො සීසාබාධො හොති. බහූ මහන්තා මහන්තා දිසාපාමොක්ඛා වෙජ්ජා ආගන්ත්වා නාසක්ඛිංසු අරොගං කාතුං. බහුං හිරඤ්ඤං ආදාය අගමංසු. අපි ච වෙජ්ජෙහි පච්චක්ඛාතො හොති. එකච්චෙ වෙජ්ජා එවමාහංසු: "පඤ්චමං දිවසං සෙට්ඨි ගහපති කාලං කරිස්සතී" ති. එකච්චෙ වෙජ්ජා එවමාහංසු: "සත්තමං දිවසං සෙට්ඨිගහපති කාලං කරිස්සතී" ති.

27. අථ ඛො රාජගහිකස්ස නෙගමස්ස එතදහොසි: "අයං ඛො සෙට්ඨිගහපති බහුකාරො[4] රඤ්ඤො චෙව නෙගමස්ස ච. අපි ච වෙජ්ජෙහි පච්චක්ඛාතො. එකච්චෙ වෙජ්ජා එවමාහංසු: 'පඤ්චමං දිවසං සෙට්ඨිගහපති කාලං කරිස්සතී' ති. එකච්චෙ වෙජ්ජා එවමාහංසු: 'සත්තමං දිවසං සෙට්ඨිගහපති කාලං කරිස්සතී' ති. අයඤ්ච රඤ්ඤො ජීවකො වෙජ්ජො තරුණො භද්‍රකො. යන්නූන මයං රාජානං ජීවකං වෙජ්ජං යාචෙය්‍යාම සෙට්ඨිං ගහපතිං තිකිච්ඡිතු" න්ති.

28. අථ ඛො රාජගහිකො නෙගමො යෙන රාජා මාගධො සෙනියො බිම්බිසාරො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රාජානං මාගධං සෙනියං බිම්බිසාරං එතදවොච: "අයං දෙව, සෙට්ඨිගහපති බහුකාරො දෙවස්ස චෙව නෙගමස්ස ච. අපි ච වෙජ්ජෙහි පච්චක්ඛාතො. එකච්චෙ වෙජ්ජා එවමාහංසු: 'පඤ්චමං දිවසං සෙට්ඨිගහපති කාලං කරිස්සතී' ති. එකච්චෙ වෙජ්ජා එවමාහංසු: 'සත්තමං දිවසං සෙට්ඨිගහපති කාලං කරිස්සතී' ති. සාධු දෙවො ජීවකං වෙජ්ජං ආණාපෙතු සෙට්ඨිං ගහපතිං තිකිච්ඡිතූ" න්ති. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො ජීවකං කොමාරභච්චං ආණාපෙසි: "ගච්ඡ භණෙ ජීවක, සෙට්ඨිං ගහපතිං තිකිච්ඡාහී" ති.

---

1. "ආබාධං තෙ" ම ඡ සං. 2. "භූසාපෙත්වා" ම ඡ සං. P T S. ජ වි.
3. "භික්ඛුසඞ්ඝන්ති" ම ඡ සං. P T S.
4. "බහූපකාරො" ම ඡ සං. P T S.

24. ඉක්බිති අභයරාජකුමාර තෙමේ "සගය, ජීවකය, රජුට පිළියම් කරව" යි ජීවක කොමාරභච්චයාට අණ කෙළේ ය. "දෙවයන් වහන්ස, එසේ ය" යි ජීවක කොමාරභච්ච තෙමේ අභයරාජකුමාරයාට පිළිවදන් දී බෙහෙතක් නියතුල බහා ගෙණ මගධේශ්වර වූ සේනිය බිම්බිසාර රජු වෙත ගියේ ය. ගොස් මගධේශ්වර වූ සේනිය බිම්බිසාර රජුට "දෙවයන් වහන්ස, රෝගය බලමු" යි කීයේ ය.

25. ඉක්බිති ජීවක කොමාරභච්ච තෙමේ මගධේශ්වර වූ සේනිය බිම්බිසාර රජුගේ භගන්දරාබාධය එක ම ආලේපයකින් බැහැර කෙළේ ය. එකල්හි මගධේශ්වර වූ සේනිය බිම්බිසාර රජ තෙමේ නීරෝග වූයේ පන්සියයක් අඟනන් සියලු අබරණින් සරසවා, (නැවත) මුදවා පොට්ටනියක් කරවා ජීවකකොමාරභච්ච හට "සගය ජීවකය, මේ පන්සියයක් අඟනන්ගේ සියලු අබරණ තට වේවා" යි කීයේ ය. ජීවක තෙමේ "දෙවයන් වහන්ස, (මෙයින් මට) සාම් නැත. දෙවයන් වහන්සේ මාගේ අධිකාරය (ශ්‍රෙෂ්ඨ) ක්‍රියාව සිහි කෙරෙත්වා" යි කී ය. "ජීවකය, එසේ නම් මටත් බුද්ධප්‍රමුඛ-සඞ්ඝයාටත් උපස්ථාන කරව". දෙවයන් වහන්ස, එසේ ය" යි ජීවක කොමාරභච්ච තෙමේ මගධේශ්වර වූ සේනිය බිම්බිසාර රජුට පිළිවදන් දුන්නේ ය.

26. එකල්හි රජගහනුවර වැසි සිටුහු හට සත් අවුරුද්දක සිට පැවැති හිස රුදාවෙක් වේ. ඉතා උසස් වූ බොහෝ දිසාපාමොක් වෙදවරු අවුත් සුවපත් කරන්නට නො හැකි වූහ. බොහෝ අමුරන් ගෙණ ගියහ. තව ද වෙදුන් විසින් ප්‍රතික්ෂෙප කරණ ලද්දේ වේ. ඇතැම් වෙද්දු "සිටුගැහැවි තෙමේ පස්වන දිනයෙහි කලුරිය කරන්නේ ය" යි මෙසේ කීහ. සමහර වෙද්දු "සිටුගැහැවි තෙමේ සත්වන දින කලුරිය කරන්නේ ය" යි මෙසේ කීහ.

27. ඉන් පසු රජගහනුවර වැසි කෙළෙඹි සමූහයාට "මේ සිටුගැහැවි තෙමේ රජුට ද කෙළෙඹි සමූහයාට ද බොහෝ උපකාර ඇත්තේ වේ. එහෙත් වෙදුන් විසින් හරණා ලද්දේ ය. සමහර වෙද්දු 'සිටු ගැහැවි තෙමේ පස්වන දිනයෙහි කලුරිය කරන්නේ ය' යි මෙසේ කීහ. සමහර වෙද්දු 'සිටුගැහැවි තෙමේ සත්වන දින කලුරිය කරන්නේ ය' යි මෙසේ කීහ. රජුගේ මේ ජීවක වෙද තෙමේ තරුණ ය. භද්‍ර ය. අපි සිටු ගැහැවියාහට පිළියම් කරන්නට රජුගෙන් ජීවක වෙදු ඉල්ලන්නෙමු නම් යෙහෙකැ" යි සිත් වි ය.

28. ඉක්බිති රජගහනුවර වැසි කෙළෙඹි ගණයා මගධේශ්වර වූ සේනිය බිම්බිසාර රජු වෙත ගියේ ය. ගොස්, "දෙවයන් වහන්ස, මේ සිටු ගැහැවී තෙමේ දෙවයන් වහන්සේට ද කෙළෙඹි ගණයාට ද බොහෝ උපකාර ඇත්තේ වේ. තවද වෙදුන් විසින් හරණා ලද්දේ ය. සමහර වෙද්දු 'සිටුගැහැවි තෙමේ පස්වන දිනයෙහි කලුරිය කරන්නේ ය' යි මෙසේ කීහ. සමහර වෙද්දු 'සිටුගැහැවි තෙමේ සත්වන දිනයෙහි කලුරිය කරන්නේ ය' යි මෙසේ කීහ. දෙවයන් වහන්සේ සිටුගැහැවියාට පිළියම් කරන්නට ජීවක වෙදුට අණ කෙරෙත්වා" යි මගධේශ්වර වූ සේනිය බිම්බිසාර රජුහට කී ය. එකල්හි මගධේශ්වර වූ සේනිය බිම්බිසාර රජ තෙමේ "සගය ජීවකය, යව. සිටුගැහැවියාහට පිළියම් කරව" යි ජීවක කොමාරභච්චහට අණ කෙළේ ය.

29. "එවං දෙවා" ති ඛො ජීවකො කොමාරභච්චො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පටිස්සුත්වා යෙන සෙට්ඨී ගහපති තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සෙට්ඨිස්ස ගහපතිස්ස විකාරං සල්ලක්ඛෙත්වා සෙට්ඨිං ගහපතිං එතදවොච: "සචාහං තං ගහපති, අරොගාපෙය්‍යං[1], කිං මෙ අස්ස දෙය්‍යධම්මො" ති. "සබ්බං සාපතෙය්‍යඤ්ච තෙ ආචරිය, හොතු. අහඤ්ච තෙ දාසො" ති. "සක්ඛිස්සසි පන ත්වං ගහපති, එකෙන පස්සෙන සත්තමාසෙ නිපජ්ජිතු" න්ති. "සක්කොමහං ආචරිය, එකෙන පස්සෙන සත්තමාසෙ නිපජ්ජිතු" න්ති. "සක්ඛිස්සසි පන ත්වං ගහපති, දුතියෙන පස්සෙන සත්තමාසෙ නිපජ්ජිතු" න්ති. "සක්කොමහං ආචරිය, දුතියෙන පස්සෙන සත්තමාසෙ නිපජ්ජිතු" න්ති. "සක්ඛිස්සසි පන ත්වං ගහපති, උත්තානො සත්තමාසෙ නිපජ්ජිතු" න්ති. "සක්කොමහං ආචරිය, උත්තානො සත්තමාසෙ නිපජ්ජිතු" න්ති.

30. අථ ඛො ජීවකො කොමාරභච්චො සෙට්ඨිං ගහපතිං මඤ්චකෙ නිපජ්ජාපෙත්වා මඤ්චකෙන[2] සම්බන්ධිත්වා සීසච්ඡවිං ඵාලෙත්වා[3] සිබ්බනිං[4] විනාමෙත්වා ද්වෙ පාණකෙ නීහරිත්වා ජනස්ස[5] දස්සෙසි: "පස්සෙය්‍යාථ[6] ඉමෙ ද්වෙ පාණකෙ එකං ඛුද්දකං එකං මහල්ලකං. යෙ තෙ ආචරියා එවමාහංසු: 'පඤ්චමං දිවසං සෙට්ඨි ගහපති කාලං කරිස්සති' ති, තෙනායං මහල්ලකො පාණකො දිට්ඨො. පඤ්චමං දිවසං සෙට්ඨිස්ස ගහපතිස්ස මත්ථලුඞ්ගං පරියාදියිස්සති. මත්ථලුඞ්ගස්ස පරියාදානා සෙට්ඨි ගහපති කාලං කරිස්සති. සුදිට්ඨො තෙහි ආචරියෙහි. යෙපි තෙ ආචරියා එවමාහංසු: 'සත්තමං දිවසං සෙට්ඨි ගහපති කාලං කරිස්සති' ති, තෙනායං ඛුද්දකො පාණකො දිට්ඨො. සත්තමං දිවසං සෙට්ඨිස්ස ගහපතිස්ස මත්ථලුඞ්ගං පරියාදියිස්සති. මත්ථලුඞ්ගස්ස පරියාදානා සෙට්ඨි ගහපති කාලං කරිස්සති. සුදිට්ඨො තෙහි ආචරියෙහී" ති. සිබ්බනිං සම්පටිපාදෙත්වා[7] සීසච්ඡවිං සිබ්බෙත්වා[8] ආලෙපං අදාසි.

31. අථ ඛො සෙට්ඨිගහපති සත්තාහස්ස අච්චයෙන ජීවකං කොමාරභච්චං එතදවොච: "නාහං ආචරිය, සක්කොමි එකෙන පස්සෙන සත්තමාසෙ නිපජ්ජිතු" න්ති. නනු මෙ ත්වං ගහපති, පටිස්සුණි: "සක්කොමහං ආචරිය, එකෙන පස්සෙන සත්තමාසෙ නිපජ්ජිතු" න්ති. "සච්චාහං ආචරිය, පටිස්සුණිං. අපාහං මරිස්සාමි, නාහං සක්කොමි එකෙන පස්සෙන සත්තමාසෙ නිපජ්ජිතු" න්ති. "තෙන හි ත්වං ගහපති, දුතියෙන පස්සෙන සත්තමාසෙ නිපජ්ජාහී" ති.

32. අථ ඛො සෙට්ඨී ගහපති සත්තාහස්ස අච්චයෙන ජීවකං කොමාරභච්චං එතදවොච: "නාහං ආචරිය, සක්කොමි දුතියෙන පස්සෙන සත්තමාසෙ නිපජ්ජිතු" න්ති. නනු මෙ ත්වං ගහපති, පටිස්සුණි: "සක්කොමහං ආචරිය, දුතියෙන පස්සෙන සත්තමාසෙ නිපජ්ජිතු" න්ති. "සච්චාහං ආචරිය, පටිස්සුණිං. අපාහං මරිස්සාමි, නාහං[9] සක්කොමි දුතියෙන පස්සෙන සත්තමාසෙ නිපජ්ජිතු" න්ති. "තෙන හි ත්වං ගහපති, උත්තානො සත්තමාසෙ නිපජ්ජාහී" ති.

---

1. "සචෙ ත්වං ගහපති අරොගො භවෙය්‍යාසි" ම ඡ සං.
,, "සචාහං තං ගහපති අරොගං කරෙය්‍යං" සි.
2. 'මඤ්චකෙ" ම ඡ සං PTS.
3. "උප්පාටෙත්වා" ම ඡ සං
,, "උප්පලෙත්වා" PTS.
4. "සිබ්බිනිං" ම ඡ සං PTS.
5. "මහාජනස්ස" ම ඡ සං.
6. "පස්සථයෙය්‍ය" ම ඡ සං.
6. "ප[illegible]ථයෙය්‍ය" PTS.
6. "පස්සථ" සි
7. "සම්පටිපාටෙත්වා" ම ඡ සං.
8. "සිබ්බිත්වා" ම ඡ සං.
9. "නාහං ආචරිය" ම ඡ සං. PTS.

29. "දෙවයන් වහන්ස එසේ ය" යි ජීවක කොමාරභච්ච තෙමේ මගධේශ්වර වූ සෙනිය බිම්බිසාර රජුහට පිළිවදන් දී සිටුගැහැවියා වෙත ගියේ ය. ගොස් සිටුගැහැවියාගේ රෝගය සලකා "ගැහැවිය, ඉදින් මම ඔබ නීරෝග කරන්නෙම් නම්, මට දිය යුතු දෙය කුමක් වන්නේ දැ" යි සිටුගැහැවියාට කීයේ ය. "ඇදුර, සියලු සම්පත් ඔබට වේවා. මමත් ඔබට දාසයෙක් වෙමි". "ගැහැවිය, සත්මසක් එක් ඇළයකින් හොවින්ට ඔබ සමත් ද ?" "ඇදුර, සත්මසක් එක් ඇළයකින් හොවින්ට මම සමත් වෙමි". "ගැහැවිය, සත්මසක් දෙවන ඇළයෙන් හොවින්ට ඔබ සමත් ද ?" ඇදුර, සත්මසක් දෙවන ඇළයෙන් හොවින්ට මම සමත් වෙමි." "ගැහැවිය, සත්මසක් උඩුකුරු ව හොවින්ට ඔබ සමත් ද ?" "ඇදුර, සත්මසක් උඩුකුරු ව හොවින්ට මම පොහොසත් වෙමි".

30. ඉක්බිති ජීවක කොමාරභච්ච තෙමේ සිටුගැහැවියා ඇඳක හොවා ඇඳ හා බැඳ හිසෙහි සිවිය පළා හිස් බැඳුම (තුන් සන්ධිය) වෙන් කොට (හිස් කබල ගලවා) පණුවන් දෙදෙනකුන් බැහැර කොට ජනයාට දැක්වී ය: "එකකු කුඩා වූ ද එකකු මහත් වූ ද මේ පණුවන් දෙදෙනා බලවු. යම් ඒ ඇදුරු කෙනෙක් 'සිටුගැහැවි තෙමේ පස්වන දිනයෙහි කළුරිය කරන්නේ ය' යි මෙසේ කීවාහු ද, ඔවුන් විසින් දක්නා ලද මේ මහත පණුවා පස්වන දිනයෙහි සිටුගැහැවියාගේ හිස්මුල් (මොළය) කා නිම වන්නේ ය. හිස්මුල් කා නිමවීමෙන් සිටුගැහැවි තෙමේ කළුරිය කරන්නේ ය. ඒ ඇදුරන් විසින් මැනවින් දක්නා ලද්දේ ය. යම් ඒ ඇදුරු කෙනෙක් 'සිටුගැහැවි තෙමේ සත්වන දිනයෙහි කළුරිය කරන්නේ ය" යි මෙසේ කීවාහු ද, ඔවුන් විසින් දක්නා ලද මේ කුඩා පණුවා සත්වන දිනයෙහි සිටුගැහැවියාගේ හිස්මුල් කා නිම වන්නේ ය. හිස්මුල් කා නිමවීමෙන් සිටුගැහැවි තෙමේ කළුරිය කරන්නේ ය. ඒ ඇදුරන් විසින් මැනවින් දක්නා ලද්දේ ය" යි හිස්මැස්ම (හිස්කබල පෙර සේ ම) සන්ධි කොට හිසේ සිවිය මසා ආලේපයක් දුන්නේ ය.

31. ඉක්බිති සිටුගැහැවි තෙමේ සත්දවසක් ඉක්ම ගිය පසු ජීවක කොමාරභච්චයාහට "ඇදුර සත්මසක් එක්ඇළයකින් හොවින්ට මම අසමත් වෙමි" යි කීයේ ය. "ගැහැවිය, තෙපි මට 'ඇදුර, සත්මසක් එක්ඇළයකින් හොවින්ට මම සමත් වෙමි" යි ප්‍රතිඥා නො කළහු ද "? "ඇදුර, සැබව. මම ප්‍රතිඥා කෙළෙමි. එහෙත් මම මැරෙන්නෙම් නමුත් සත්මසක් එක් ඇළයකින් හොවින්ට මම අසමත් වෙමි. "එසේ නම්, ගැහැවිය, ඔබ දෙවන ඇළයෙන් සත්මසක් හොවිනු මැනවැ"යි කී ය.

32. ඉක්බිති සිටු ගැහැවි තෙමේ සත්දවසක් ඉක්ම ගිය පසු ජීවක කොමාරභච්චයාහට "ඇදුර, සත්මසක් දෙවන ඇළයෙන් හොවින්ට මම අසමත් වෙමි" යි කීයේ ය. "ගැහැවිය, තෙපි මට ඇදුර, මම සත්මසක් දෙවන ඇළයෙන් හොවින්ට හැක්කෙමි' යි ප්‍රතිඥා නුදුනාහුද ,?" "ඇදුර, සැබව. මම ප්‍රතිඥා දුනිමි. එහෙත් මම මැරෙන්නෙම් නමුත් දෙවන ඇළයෙන් සත්මසක් හොවින්ට මම අසමත් වෙමි". "එසේ නම්, ගැහැවිය ඔබ උඩුකුරු ව සත්මසක් හොවිනු මැනවැ" යි කීය.

33. අථ ඛො සෙට්ඨි ගහපති සත්තාහස්ස අච්චයෙන ජීවකං කොමාරභච්චං එතදවොච: "නාහං ආචරිය, සක්කොමි උත්තානො සත්තමාසෙ නිපජ්ජිතු" න්ති. "නනු මෙ ත්වං ගහපති පටිස්සුණි: සක්කොමහං ආචරිය, උත්තානො සත්තමාසෙ නිපජ්ජිතු" න්ති. "සච්චාහං ආචරිය පටිස්සුණිං. අපාහං මරිස්සාමි, නාහං සක්කොමි උත්තානො සත්තමාසෙ නිපජ්ජිතු" න්ති. "අහඤ්චෙතං ගහපති, න වදෙය්‍යං, එත්තකම්පි ත්වං න නිපජ්ජෙය්‍යාසි. අපි ච පටිගච්චෙවාසි මයා ඤාතො: 'තීහි සත්තාහෙහි සෙට්ඨි ගහපති අරොගො භවිස්සතී' ති. උට්ඨෙහි ගහපති, අරොගො'සි. ජානාහි[1] කිං මෙ දෙය්‍යධම්මො" ති. "සබ්බං සාපතෙය්‍යඤ්ච තෙ ආචරිය, හොතු. අහං ච තෙ දාසො" ති. "අලං ගහපති, මා මෙ ත්වං සබ්බං සාපතෙය්‍යං අදාසි. මා ච මෙ දාසො. රඤ්ඤො සතසහස්සං දෙහි මය්හං සතසහස්ස" න්ති. අථ ඛො සෙට්ඨි ගහපති අරොගො සමානො රඤ්ඤො සතසහස්සං අදාසි ජීවකස්ස කොමාරභච්චස්ස සතසහස්සං.

34. තෙන ඛො පන සමයෙන බාරාණසෙය්‍යකස්ස සෙට්ඨිපුත්තස්ස මොක්ඛචිකාය කීළන්තස්ස අන්තගණ්ඨාබාධො හොති, යෙන යාගු'පි පීතා න සම්මා පරිණාමං ගච්ඡති. භත්තම්පි භුත්තං න සම්මා පරිණාමං ගච්ඡති. උච්චාරොපි පස්සාවොපි න පගුණො. සො තෙන කිසො හොති ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො.

35. අථ ඛො බාරාණසෙය්‍යකස්ස සෙට්ඨිස්ස එතදහොසි: "මය්හං ඛො පුත්තස්ස තාදිසො[2] ආබාධො යෙන යාගු'පි පීතා න සම්මා පරිණාමං ගච්ඡති. භත්තම්පි භුත්තං න සම්මා පරිණාමං ගච්ඡති. උච්චාරො'පි පස්සාවො'පි න පගුණො. සො තෙන කිසො ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො. යන්නූනාහං රාජගහං ගන්ත්වා රාජානං ජීවකං වෙජ්ජං යාචෙය්‍යං පුත්තං මෙ තිකිච්ඡිතු" න්ති.

36. අථ ඛො බාරාණසෙය්‍යකො සෙට්ඨි රාජගහං ගන්ත්වා යෙන රාජා මාගධො සෙනියො බිම්බිසාරො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රාජානං මාගධං සෙනියං බිම්බිසාරං එතදවොච: "මය්හං ඛො දෙව, පුත්තස්ස තාදිසො ආබාධො, යෙන යාගු'පි[3] පීතා න සම්මා පරිණාමං ගච්ඡති. භත්ත'ම්පි භුත්තං න සම්මා පරිණාමං ගච්ඡති. උච්චාරො'පි පස්සාවො'පි න පගුණො. සො තෙන කිසො ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො. සාධු දෙවො ජීවකං වෙජ්ජං ආණාපෙතු පුත්තං මෙ තිකිච්ඡිතු" න්ති.

37. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො ජීවකං කොමාරභච්චං ආණාපෙසි: "ගච්ඡ භණෙ ජීවක, බාරාණසිං. ගන්ත්වා බාරාණසෙය්‍යකං සෙට්ඨිපුත්තං තිකිච්ඡාහී" ති. "එවං දෙවා" ති ඛො ජීවකො කොමාරභච්චො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පටිස්සුත්වා බාරාණසිං ගන්ත්වා යෙන බාරාණසෙය්‍යකො සෙට්ඨිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා බාරාණසෙය්‍යකස්ස සෙට්ඨිපුත්තස්ස විකාරං සල්ලක්ඛෙත්වා ජනං උස්සාරෙත්වා තිරොකරණිං[4] පරික්ඛිපිත්වා ථම්භෙ උපනිබන්ධිත්වා[5] භරියං පුරතො ඨපෙත්වා උදරච්ඡවිං උප්පාටෙත්වා අන්තගණ්ඨිං නීහරිත්වා භරියාය දස්සෙසි: "පස්ස තෙ සාමිකස්ස ආබාධං. ඉමිනා යාගු'පි පීතා න සම්මා පරිණාමං ගච්ඡති. භත්ත'ම්පි භුත්තං න සම්මා පරිණාමං ගච්ඡති. උච්චාරො'පි පස්සාවො'පි න පගුණො. ඉමිනා'යං කිසො ලූඛො දුබ්බණ්ණො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො" ති. අන්තගණ්ඨිං විනිවෙඨෙත්වා අන්තානි පටිපවෙසෙත්වා උදරච්ඡවිං සිබ්බෙත්වා ආලෙපං අදාසි.

---

1. ජානාසි. ම ඡ සං. 2. "කිදිසො" PTS. 3. "යාගුපි" PTS.
4. "තිරොකරණියං" PTS. ම ඡ සං. ජ වි. ම නු ප.
5. "උබ්බන්ධිත්වා" PTS. ම ඡ සං.

33. ඉක්බිති සිටුගැහැවි තෙමේ සත්දවසක් ඉක්ම ගිය පසු ජීවක කොමාරභච්චයාහට "ඇදුර, සත්මසක් උඩුකුරු ව හොවින්ට මම අසමත් වෙමි" යි කීයේ ය. "ගැහැවිය, තෙපි මට 'ඇදුර, සත්මසක් උඩුකුරු ව හොවින්ට මම සමත් වෙමි' යි පිළිත කෙළෙහි ද නො කෙළෙහි ද" ? "ඇදුර, සැබව. මම පිළිත කෙළෙමි. එහෙත් මම මැරෙන්නෙම් නමුත් මම සත් මසක් උඩුකුරු ව හොවින්ට අසමත් වෙමි". "ගැහැවිය, මම මෙය නො කීයෙම් නම්, තෙපි මෙපමණකුත් නො හොවින්නහු ය. එසේ නමුත් 'සති තුණකින් සිටුගැහැවි තෙමේ නීරොග වන්නේ ය' යි මා විසින් පළමු කොට ම දන්නා ලද්දෙහි ය. ගැහැවිය, නැඟී සිටුව. නීරොග වෙහි ය. මාහට දිය යුතු දේ කිමැ යි දනුව". "ඇදුර, සියලු සම්පත් ඔබට වේවා. මම ද ඔබගේ දසයෙක් වෙමි". "ගැහැවිය, කම් නැත. මාහට සියලු සම්පත් නො දෙව. මා හට දසයෙක් ද නො වෙව. රජුට ලක්‍ෂයක් ද මට ලක්‍ෂයක් ද දෙව" යි. කී ය. එකල්හි සිටු ගැහැවි තෙමේ නීරොග වූයේ රජුට ලක්‍ෂයක් ද ජීවක කොමාරභච්චයාට ලක්‍ෂයක් ද දුන්නේ ය.

34. එකල්හි බරණැස්නුවර සිටුපුතුහට කරණම් පැනීමෙන් ක්‍රීඩා කරද්දී බඩවැල ගැට ගැසීමෙන් හටගත් රෝගයෙක් වේ. ඒ ආබාධය කරණ කොට (ඔහු) පානය කළ කැඳ ද මනා කොට දිරවීමට නො යෙ යි. අනුභව කල බත් ද මනා කොට නො දිරයි. මලමූත්‍ර ද සවභාවයෙන් පහ වීමෙක් (ඔහුට) නැත. එයින් හෙතෙමේ වැරුණේ වියලුනේ දුර්‍වර්‍ණ වූයේ හටගත් පඬුවන්පැහැ ඇත්තේ නහර ඉල්පුනු සිරුරු ඇත්තේ වෙයි.

35. ඉක්බිති බරණැස් සිටුහට "යම් ආබාධයක් කරණ කොට පානය කළ කැඳ මනා කොට නො දිරා ද, අනුභව කළ බත් මනා කොට නො දිරා ද, මලමූත්‍ර ද සවභාවයෙන් පහ නො වේ ද, මාගේ පුත්‍රයාට එබඳු රෝගයෙක් වේ. හෙතෙමේ එයින් වැරුණේ වියලුනේ දුර්‍වර්‍ණ ඇත්තේ උපන් පඬුවන්පැහැ ඇත්තේ නහර ඉල්පුනු සිරුරු ඇත්තේ වෙයි. මම රජගහ-නුවරට ගොස් මාගේ පුතුට පිළියම් කරන්නට ජීවක වෙදු රජුගෙන් ඉල්ලන්නෙම් නම්, යෙහෙකැ" යි සිත් වි ය.

36. ඉක්බිති බරණැස් සිටු තෙමේ රජගහනුවරට ගොස් මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජු වෙත එළඹියේ ය. එළඹ මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජුට "දෙවයන් වහන්ස, යම් ආබාධයක් කරණ කොට පානය කළ කැඳ මනා කොට නො දිරා ද, අනුභව කළ බත් මනා කොට නො දිරා ද, මලමූත්‍රත් පහ නො වේ ද, මාගේ පුතුට එබඳු වූ රෝගයෙක් වේ. හෙතෙමේ එයින් වැරුණේ වියලුනේ දුර්‍වර්‍ණ ඇත්තේ උපන් පඬුපැහැ ඇත්තේ නහර ඉල්පුනු සිරුරු ඇත්තේ වේ. දෙවයන් වහන්සේ මාගේ පුතුට පිළියම් කරන්නට ජීවක වෙදුට අණ කෙරෙත්වා" යි කීය.

37. එකල්හි මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජ තෙමේ "සගය ජීවකය, බරණැසට යව. ගොස් බරණැස්සිටුපුතුට පිළියම් කරව" යි ජීවක කොමාරභච්චයාහට අණ කෙළේ ය. "දෙවයන් වහන්ස, එසේ ය" යි ජීවක කොමාරභච්ච තෙමේ මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජුට පිළිවදන් දී බරණැසට ගොස් බරණැස්සිටුපුත් වෙත එළඹියේ ය. එළඹ බරණැස්-සිටුපුතුගේ රෝගය සලකා ජනයා බැහැර කරවා තිරයකින් වට කොට ඔහු කණුවක බැඳ බිරිඳ ඉදිරියෙහි සිටුවා බඩ සිවිය උපුටා අතුණුගැටය බැහැර කොට "තීගේ සැමියාගේ රෝගය බලව" යි බිරිඳට දක්වී ය. "මේ රෝගයෙන් පානය කළ කැඳ ද මනා කොට නො දිරයි. අනුභව කළ බත් ද මනාකොට නො දිරයි. මලමූත්‍රත් පහ නො වේ. මෙයින් මෙතෙමේ වැරුණේ වියලුනේ දුර්‍වර්‍ණ ඇත්තේ උපන් පඬු පැහැ ඇත්තේ නහර ඉල්පුනු සිරුරු ඇත්තේ වේ" යි (කියා) අතුණුගැටය උනා හැර නැවත අතුණු ඇතුල් කොට බඩසිවිය මසා ආලෙපයක් දුන්නේ ය.

38. අථ බො බාරාණසෙය්‍යකො සෙට්ඨිපුත්තො න චිරස්සෙව අරොගො අහොසි. අථ බො බාරාණසෙය්‍යකො සෙට්ඨි "පුත්තො මෙ අරොගාපිතො" ති ජීවකස්ස කොමාරභච්චස්ස සොළසසහස්සානි පාදාසි. අථ බො ජීවකො කොමාරභච්චො තානි සොළසසහස්සානි ආදාය පුනදෙව රාජගහං පච්චාගඤ්ඡි.

39. තෙන බො පන සමයෙන රඤ්ඤො[1] පජ්ජොතස්ස පණ්ඩුරොගාබාධො හොති. බහූ මහන්තා මහන්තා දිසාපාමොක්ඛා වෙජ්ජා ආගන්ත්වා නාසක්ඛිංසු අරොගං කාතුං. බහුං හිරඤ්ඤං ආදාය අගමංසු. අථ බො රාජා පජ්ජොතො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස සන්තිකෙ දූතං පාහෙසි: "මය්හං බො තාදිසො ආබාධො. සාධු දෙවො ජීවකං වෙජ්ජං ආණාපෙතු. සො මං තිකිච්ඡිස්සතී" ති.

40. අථ බො රාජා මාගධො සෙනියො බිම්බිසාරො ජීවකං කොමාරභච්චං ආණාපෙසි: "ගච්ඡ භණෙ ජීවක, උජ්ජෙනිං ගන්ත්වා රාජානං පජ්ජොතං තිකිච්ඡාහී"ති. "එවං දෙවා"ති ජීවකො කොමාරභච්චො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පටිස්සුත්වා උජ්ජෙනිං ගන්ත්වා යෙන රාජා පජ්ජොතො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රඤ්ඤො පජ්ජොතස්ස විකාරං සල්ලක්ඛෙත්වා රාජානං පජ්ජොතං එතදවොච: "සප්පිං දෙව, නිප්පචිස්සාමි[2]. තං දෙවො පිවිස්සතී" ති. "අලං භණෙ ජීවක, යං තෙ සක්කා විනා සප්පිනා අරොගං කාතුං, තං කරොහි. ජෙගුච්ඡං මෙ සප්පි. පටික්කූල" න්ති.

41. අථ බො ජීවකස්ස කොමාරභච්චස්ස එතදහොසි: "ඉමස්ස බො රඤ්ඤො තාදිසො ආබාධො න සක්කා විනා සප්පිනා අරොගං කාතුං. යන්නූනාහං සප්පිං නිප්පචෙය්‍යං කසාවවණ්ණං කසාවගන්ධං කසාවරස"න්ති. අථ බො ජීවකො කොමාරභච්චො නානාභෙසජ්ජෙහි සප්පිං නිප්පචි කසාවවණ්ණං කසාවගන්ධං කසාවරසං.

42. අථ බො ජීවකස්ස කොමාරභච්චස්ස එතදහොසි: "ඉමස්ස බො රඤ්ඤො සප්පි පීතං පරිණාමෙන්තං උද්දෙකං දස්සති. චණ්ඩො'යං රාජා ඝාතාපෙය්‍යාපි[3] මං. යන්නූනාහං පටිගච්චෙව ආපුච්ඡෙය්‍ය" න්ති.

43. අථ බො ජීවකො කොමාරභච්චො යෙන රාජා පජ්ජොතො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රාජානං පජ්ජොතං එතදවොච: "මයං බො දෙව, වෙජ්ජා නාම තාදිසෙන මුහුත්තෙන මූලානි උද්ධරාම. භෙසජ්ජානි සංහරාම. සාධු දෙවො[4] වාහනාගාරෙසු ච ද්වාරෙසු ච ආණාපෙතු: 'යෙන වාහනෙන ජීවකො ඉච්ඡති, තෙන වාහනෙන ගච්ඡතු. යෙන ද්වාරෙන ඉච්ඡති, තෙන ද්වාරෙන ගච්ඡතු. යං කාලං ඉච්ඡති, තං කාලං ගච්ඡතු. යං කාලං ඉච්ඡති තං කාලං පවිසතූ" ති.

44. අථ බො රාජා පජ්ජොතො වාහනාගාරෙසු ච ද්වාරෙසු ච ආණාපෙසි: "යෙන වාහනෙන ජීවකො ඉච්ඡති, තෙන වාහනෙන ගච්ඡතු. යෙන ද්වාරෙන ඉච්ඡති, තෙන ද්වාරෙන ගච්ඡතු. යං කාලං ඉච්ඡති, තං කාලං ගච්ඡතු. යං කාලං ඉච්ඡති, තං කාලං පවිසතූ" ති.

---

1. සී. "උජ්ජෙනියං රඤ්ඤො"
2. "සප්පිං දෙහි. සප්පිං දෙව නිප්පචිස්සාමි" ම ඡ සං.
3. "ඝාතාපෙය්‍යාසි" P T S.
4. සාධු මෙ දෙවො සී මු.

Free Distribution www.aathaapi.org

38. ඉක්බිති බරණැස්සිටුපුත් තෙමේ නොබෝ කලකින් ම නීරෝග වූයේ ය. අනතුරු ව බරණැස්සිටු තෙමේ "මාගේ පුත්‍රයා නීරෝග කරණ ලද්දේය" යි ජීවක කොමාරභච්චයාහට සොළොස් දහසක් දුන්නේ ය. ජීවක කොමාරභච්ච තෙමේ ඒ සොළොස් දහස ගෙණ නැවත රජගහ නුවරට පෙරළා ගියේ ය.

39. එකල්හි **පජ්ජෝත** රජහට පාණ්ඩුරෝගාබාධයෙක් වේ. ඉතා උසස් බොහෝ දිසාපාමොක් වෙදවරු අවුත් නීරෝග කරන්නට නො හැකි වූහ. බොහෝ අමුරන් ගෙණ ගියහ. ඉක්බිති පජ්ජෝත රජතෙමේ "මට මෙබඳු ආබාධයෙක් වේ. දෙව තෙමේ ජීවක වෙදුට අණ කෙරේවා. හෙතෙමේ මට පිළියම් කරන්නේ ය" යි මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජු වෙත දූතයකු යැවී ය.

40. ඉක්බිති මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජතෙමේ "සගය ජීවකය, **උදෙනියට** යව ගොස් පජ්ජෝත රජුට පිළියම් කරව" යි ජීවක කොමාරභච්චයාහට අණ කෙළේ ය. "දෙවයන් වහන්ස, එසේ ය" යි ජීවක කොමාරභච්ච තෙමේ මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජුට පිළිවදන් දී උදෙනියට ගොස් පජ්ජෝත රජු වෙත එළඹියේ ය. එළඹ පජ්ජෝත රජුගේ රෝගය සලකා "දෙවයන් වහන්ස, ගිතෙල් මුසු බෙහෙතක් පිසන්නෙමි. රජතෙමේ එය පානය කරන්නේ ද" යි පජ්ජෝතරජුගෙන් ඇසී ය. "සගය ජීවකය, තම් නැත. යම් ලෙසකින් ගිතෙල් නැති ව නීරෝග කරන්නට ඔබට හැක්කේ නම් එසේ කරව. මාහට ගිතෙල් අප්‍රිය ය. පිළිකුල් ය".

41. එකල්හි ජීවක කොමාරභච්චයාහට "ගිතෙල් නැති ව නීරෝග කරන්නට නො හැක්කේ ය. මේ රජුට (ඇත්තේ) එබඳු ආබාධයෙකි. මම කසට පැහැ ඇති කසට ගඳ ඇති කසටරස ඇති ගිතෙල් බෙහෙතක් පිසන්නෙමි නම් යෙහෙකැ" යි සිත් වි ය. ඉක්බිති ජීවක කොමාරභච්ච තෙමේ නොයෙක් බෙහෙතින් යුත් කසාවන් වූ කසට ගඳ ඇති කසට රස ඇති ගිතෙල් බෙහෙතක් පිසී ය.

42. අනතුරු ව ජීවක කොමාරභච්චයාහට "මේ රජුට පානය කළ ගිතෙල් පැසවන්නේ තැලි (ඔක්කාරය) උපදවන්නේ ය. මේ රජ තෙමේ චණ්ඩ ය. මා මැරවිය හැක්කේ ය. මම පළමු කොට ම විචාරන්නෙම් නම්, යෙහෙකැ"යි සිත් වි ය.

43. ඉක්බිති ජීවක කොමාරභච්ච තෙමේ පජ්ජෝත රජු වෙත එළඹි-යේ ය. එළඹ "දෙවයන් වහන්ස, අපි වෙදනු වූ කලී (යම් බඳු නැකැත් සුදුසු නම්) එබඳු නැකතින් මුල් උදුරා ගණුම්හ. බෙහෙත් එකතු කරම්හ. එහෙයින් වාහනාගාරයන්හි ද, ද්වාරයන්හි ද "ජීවකයා යම් වාහනයකින් (යනු) කැමැති ද, ඒ වාහනයෙන් යේවා. යම් ද්වාරයකින් (යනු) කැමැති ද, ඒ ද්වාරයෙන් යේවා. යම් කලෙක (යනු) කැමැති ද, එකල්හි යේවා. යම් කලෙක පිවිසෙනු කැමැති ද එකල්හි පිවිසේවා" යි දෙවයන් වහන්සේ අණ කෙරෙත්වා" යි පජ්ජෝතරජුට කී ය.

44. ඉන් පසු පජ්ජෝත රජ තෙම "යම් වාහනයකින් ජීවක තෙමේ යනු කැමැති වේ ද, ඒ වාහනයෙන් යේවා. යම් දොරටුවකින් (යනු) කැමැති වේ ද, ඒ දොරටුවෙන් යේවා. යම් කාලෙක (යනු) කැමැති වේ ද, එකල්හි යේවා. යම්කාලෙක (පිවිසෙනු) කැමැති වේ ද, එකල්හි පිවිසේවා" යි වාහනාගාරයන්හි ද ද්වාරයන්හි ද අණ කරවී ය.

45. තෙන ඛො පන සමයෙන රඤ්ඤො පජ්ජොතස්ස **භද්දවතිකා** නාම හත්ථිනිකා පඤ්ඤාසයොජනිකා හොති. අථ ඛො ජීවකො කොමාරභච්චො රඤ්ඤො පජ්ජොතස්ස සප්පිං[1] උපනාමෙසි: "කසාවං දෙවො පිවතූ" ති. අථ ඛො ජීවකො කොමාරභච්චො රාජානං පජ්ජොතං සප්පිං පායෙත්වා හත්ථිසාලං ගන්ත්වා භද්දවතිකාය හත්ථිනිකාය නගරම්හා නිප්පති.

46. අථ ඛො රඤ්ඤො පජ්ජොතස්ස තං සප්පි පීතං පරිණාමෙන්තං උද්දෙකං අදාසි. අථ ඛො රාජා පජ්ජොතො මනුස්සෙ එතදවොච: "දුට්ඨෙන භණෙ, ජීවකෙන සප්පි පායිතො'ම්හි. තෙන හි භණෙ, ජීවකං වෙජ්ජං විචිනථා" ති. "භද්දවතිකාය දෙව, හත්ථිනිකාය නගරම්හා නිප්පතිතො"ති.

47. තෙන ඛො පන සමයෙන රඤ්ඤො පජ්ජොතස්ස **කාකො** නාම දාසො සට්ඨියොජනිකො හොති අමනුස්සෙන ජාතො[2]. අථ ඛො රාජා පජ්ජොතො කාකං දාසං ආණාපෙසි. "ගච්ඡ භණෙ කාක, ජීවකං වෙජ්ජං නිවත්තෙහි: 'රාජා තං ආචරිය නිවත්තාපෙතී' ති. එතෙ ඛො භණෙ කාක, වෙජ්ජා නාම බහුමායා. මා චස්ස කිඤ්චි පටිග්ගහෙසී" ති.

48. අථ ඛො කාකො දාසො ජීවකං කොමාරභච්චං අන්තරාමග්ගෙ **කොසම්බියං** සම්භාවෙසි පාතරාසං කරොන්තං. අථ ඛො කාකො දාසො ජීවකං කොමාරභච්චං එතදවොච: "රාජා තං ආචරිය, නිවත්තාපෙතී" ති "ආගමෙහි භණෙ කාක, යාව භුඤ්ජාමි[3]. හන්ද භණෙ කාක, භුඤ්ජස්සූ"ති. "අලං ආචරිය, රඤ්ඤොම්හි ආණත්තො, 'එතෙ ඛො භණෙ කාක, වෙජ්ජා නාම බහුමායා. මා චස්ස කිඤ්චි පටිග්ගහෙසී" ති.

49. තෙන ඛො පන සමයෙන ජීවකො කොමාරභච්චො නඛෙන භෙසජ්ජං ඔලුම්පෙත්වා ආමලකඤ්ච ඛාදති. පානීයඤ්ච පිවති. අථ ඛො ජීවකො කොමාරභච්චො කාකං දාසං එතදවොච: "හන්ද භණෙ කාක, ආමලකඤ්ච ඛාද. පානීයඤ්ච පිවස්සූ" ති. අථ ඛො කාකො දාසො "අයඤ්ච ඛො වෙජ්ජො ආමලකඤ්ච ඛාදති. පානීයඤ්ච පිවති. න අරහති කිඤ්චි පාපකං හොතූ" න්ති උපඩ්ඪාමලකඤ්ච ඛාදි. පානීයඤ්ච අපායි. තස්ස තං උපඩ්ඪාමලකං ඛායිතං තත්ථෙව නිච්ඡාරෙසි.

50. අථ ඛො කාකො දාසො ජීවකං කොමාරභච්චං එතදවොච: "අත්ථි මෙ ආචරිය, ජීවිත" න්ති. "මා භණෙ කාක, භායි. ත්වඤ්චෙව අරොගො භවිස්සසි. රාජා ච. චණ්ඩො සො රාජා ඝාතාපෙය්‍යාපි මං. තෙනාහං න නිවත්තාමී" ති භද්දවතිකං හත්ථිනිකං කාකස්ස නිය්‍යාදෙත්වා යෙන රාජගහං තෙන පක්කාමි. අනුපුබ්බෙන යෙන රාජගහං[4] යෙන රාජා මාගධො සෙනියො බිම්බිසාරො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස එතමත්ථං ආරොචෙසි. "සුට්ඨු භණෙ ජීවක, අකාසි යං සි[5] න නිවත්තො'. චණ්ඩො සො රාජා ඝාතාපෙය්‍යාපි ත"න්ති.

51. අථ ඛො රාජා පජ්ජොතො අරොගො සමානො ජීවකස්ස කොමාරභච්චස්ස සන්තිකෙ දූතං පාහෙසි: "ආගච්ඡතු ජීවකො. වරං දස්සාමී" ති. "අලං අය්‍යො[6]. අධිකාරං මෙ දෙවො සරතූ"ති.

1. "තං සප්පිං" 2. "පටිච්චජාතො" ම ඡ සං. P T S.
3. "යාව භුඤ්ජාම." ම ඡ සං. P T S. 4. "යෙන රාජා" ම ඡ සං.
5. "යම්පි" ම ඡ සං. P T S 6. "අලං දෙව" සී.

45. එකල්හි පජ්ජෝත රජුගේ භද්දවතිකා නම් ඇතින්න දවසකට පණස් යොදුනක් යන ගමන් වේග ඇත්තී ය. ඉක්බිති ජීවක කොමාරභච්ච තෙමේ පජ්ජෝත රජුට "දෙවයන් වහන්සේ කෂාය පානය කරණ සේක්වා" යි කසට පැහැති ගිතෙල් බෙහෙත එළවී ය. ජීවක කොමාරභච්ච තෙමේ පජ්ජෝත රජුට ගිතෙල් බෙහෙත පොවා ඇත්හලට ගොස් භද්දවතී ඇතින්න පිට නැඟී නුවරින් පලා ගියේ ය.

46. එවිට පජ්ජෝත රජුට පානය කළ ඒ ගිතෙල් බෙහෙත පැසවත්තේ තැලි ඉපදවී ය. ඉක්බිති පජ්ජෝත රජ තෙමේ "සගයෙනි, දුෂ්ට වූ ජීවකයා විසින් ගිතෙල් පොවන ලද්දේ වෙමි. සගයෙනි, එබැවින් ජීවක වෙදු සොයවූ" යි මිනිසුන්ට කියේ ය. "දෙවයන් වහන්ස, භද්දවතී ඇතින්න පිට නැඟී නුවරින් පැන ගියේ ය" යි ඔහු කීහ.

47. එකල්හි පජ්ජෝත රජුගේ අමනුෂ්‍යයකු නිසා උපන් කාක නම් දාස තෙමේ දවසකට සැට යොදුන් යන ගමන් වේග ඇත්තේ වේ. ඉක්බිති පජ්ජෝත රජ තෙමේ "කොල කාකය, 'ආචාර්‍ය්‍යයෙනි, රජ තෙමේ ඔබ නවත්වා'ය යි ජීවක වෙදු නවතව. කොල කාකය, මේ වෙද්දු නම් බොහෝ මායා ඇත්තාහු ය. ඔහු දෙන කිසිවක් නො පිළිගණුව" යි කාකදාසයාහට අණ කෙළේ ය.

48. ඉක්බිති කාක දාස තෙමේ අතරමග කොසඹෑ නුවර දී උදෑසන අහර ගන්නා ජීවකයා දුටුයේ ය. එකල්හි කාක දාස තෙමේ "ආචාර්‍ය්‍යයෙනි, රජ තෙමේ ඔබ නවත්වා" යයි ජීවක කොමාරභච්චයාහට කීයේ ය. "කොල කාකය, අනුභව කරමි. ඒ තාක් බලාපොරොත්තු වෙව. කොල කාකය, තෝ ද අනුභව කරව". ආචාර්‍ය්‍යයෙනි, කම් නැත. 'කාකය මේ වෙද්දු නම් බොහෝ මයා ඇත්තාහු ය. ඔහු දෙන කිසිවක් නො පිළිගණුව'යි රජු විසින් අණ කරණ ලද්දෙම් වෙමි"යි කාකදාසයා කී ය.

49. එකල්හි ජීවක කොමාරභච්ච තෙමේ නියගින් බෙහෙතක් ඔබා ගෙණ නෙල්ලි ද කයි. පැන් ද බොයි. එකල්හි ජීවක කොමාරභච්චතෙමේ "කොල කාකය, නෙල්ලි ද කව. පැන් ද බොව"යි කාකදාසයාට කී ය. ඉක්බිති කාක දාස තෙමේ "මේ වෙදු නෙල්ලි ද කයි. පැන් ද බොයි. කිසි නපුරක් වන්නට යුතු නො වේ ය"යි නෙල්ලි ගෙඩියෙන් අඩක් ද කෑයේ ය. පැන් ද බිවේ ය. ඔහු විසින් කන ලද ඒ නෙල්ලි පලුව එ වෙලේම ඔහුට විරේක කෙළේ ය.

50. එවිට කාකදාස තෙමේ "ආචාර්‍ය්‍යයන් වහන්ස, මාගේ ජීවිතය රැකේද්ද"යි ජීවකකොමාරභච්චයාගෙන් ඇසී ය. "කොල, කාකය, බිය පත් නොව. තෝත් නීරොග වන්නෙහි ය. රජ තෙමේ ද නීරොග වන්නේ ය. චණ්ඩ වූ ඒ රජතෙමේ මා මරවන්නේ ද වේ. එහෙයින් මම නො නවතිමි" යි භද්දවතිකා ඇතින්න කාකදාසයාට භාර දී රජගහ නුවර බලා නික්ම ගියේ ය. පිළිවෙළින් රජගහනුවරට ගියේ මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජු වෙත එළඹියේ ය. එළඹ මගධෙශ්වර වූ සෙනිය බිම්බිසාර රජුට මේ වග සැළකෙළේ ය. රජ තෙමේ "සගය ජීවකය, යම් හෙයකින් නො නැවතුනෙහි ද එහෙයින් යහපතක් කෙළෙහි ය. (නැවතුනෙහි නම්) චණ්ඩ වූ ඒ රජතෙමේ තා මරවන්නේ ය."යි කී ය.

51. ඉක්බිති පජ්ජෝත රජ තෙමේ නීරොග වූයේ "ජීවක තෙමේ පැමිණේවා. වරයක් දෙන්නෙමි" යි ජීවක කොමරාභච්චයා වෙත දූතයකු යැවී ය. "ආර්‍ය්‍යය, කම් නැත. දෙවයන් වහන්සේ මාගේ අධිකාරය (=ශුශ්‍රෂා ක්‍රියාව) සිහි කෙරෙත්වා" යි කියා යැවී ය.

52. තෙන ඛො පන සමයෙන රඤ්ඤො පජ්ජොතස්ස සීවෙය්‍යකං දුස්සයුගං උප්පන්නං හොති බහුන්නං[1] දුස්සානං බහුන්නං දුස්සයුගානං බහුන්නං දුස්සයුගසතානං බහුන්නං දුස්සයුගසහස්සානං බහුන්නං දුස්සයුගසතසහස්සානං අග්ගඤ්ච සෙට්ඨඤ්ච මොක්ඛඤ්ච උත්තමඤ්ච පවරඤ්ච. අථ ඛො රාජා පජ්ජොතො තං සීවෙය්‍යකං දුස්සයුගං ජීවකස්ස කොමාරභච්චස්ස පාහෙසි.

53. අථ ඛො ජීවකස්ස කොමාරභච්චස්ස එතදහොසි: "ඉදං ඛො මෙ සීවෙය්‍යකං දුස්සයුගං රඤ්ඤා පජ්ජොතෙන පහිතං බහුන්නං දුස්සානං බහුන්නං දුස්සයුගානං බහුන්නං දුස්සයුගසතානං බහුන්නං දුස්සයුගසහස්සානං බහුන්නං දුස්සයුගසතසහස්සානං අග්ගඤ්ච සෙට්ඨඤ්ච මොක්ඛඤ්ච උත්තමඤ්ච පවරඤ්ච. නයිමං[2] අඤ්ඤො කොචි පච්චාරහති අඤ්ඤත්‍ර තෙන භගවතා අරහතා සම්මා සම්බුද්ධෙන, රඤ්ඤා වා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙනා"ති.

54. තෙන ඛො පන සමයෙන භගවතො කායො දොසාභිසන්නො හොති. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "දොසාභිසන්නො ඛො ආනන්ද තථාගතස්ස කායො. ඉච්ඡති තථාගතො විරෙචනං පාතු"න්ති.

55. අථ ඛො ආයස්මා ආනන්දො යෙන ජීවකො කොමාරභච්චො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ජීවකං කොමාරභච්චං එතදවොච: "දොසාභිසන්නො ඛො ආවුසො ජීවක, තථාගතස්ස කායො. ඉච්ඡති තථාගතො විරෙචනං පාතු"න්ති. "තෙන හි භන්තෙ ආනන්ද, භගවතො කායං කතිපාහං සිනෙහෙථා" ති.

56. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො කායං කතිපාහං සිනෙහෙත්වා යෙන ජීවකො කොමාරභච්චො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ජීවකං කොමාරභච්චං එතදවොච "සිනිද්ධො ඛො ආවුසො ජීවක, තථාගතස්ස කායො, යස්ස'දානි කාලං මඤ්ඤසී" ති.

57. අථ ඛො ජීවකස්ස කොමාරභච්චස්ස එතදහොසි: "න ඛො මෙ තං පතිරූපං, යො'හං භගවතො ඔළාරිකං විරෙචනං දදෙය්‍ය"න්ති. තීණි උප්පලහත්ථානි නානාභෙසජ්ජෙහි පරිභාවෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකං උප්පලහත්ථං භගවතො උපනාමෙසි: "ඉමං භන්තෙ භගවා පඨමං උප්පලහත්ථං උපසිඞ්ඝතු. ඉදං භගවන්තං දසක්ඛත්තුං විරෙචෙස්සති" ති. දුතියං උප්පලහත්ථං භගවතො උපනාමෙසි: "ඉමං භන්තෙ භගවා දුතියං උප්පලහත්ථං උපසිඞ්ඝතු. ඉදං භගවන්තං දසක්ඛත්තුං විරෙචෙස්සතී"ති. තතියං උප්පලහත්ථං භගවතො උපනාමෙසි: "ඉමං භන්තෙ භගවා තතියං උප්පලහත්ථං උපසිඞ්ඝතු. ඉදං භගවන්තං දසක්ඛත්තුං විරෙචෙස්සතී ති එවං භගවතො සමතිංසාය විරෙචනං භවිස්සති" ති. අථ ඛො ජීවකො කොමාරභච්චො භගවතො සමතිංසාය විරෙචනං දත්වා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

1. "බහූනං" ම ඡ සං. 2. "නයිදං" ම ඡ සං.

Free Distribution www.aathaapi.org

52. එකල්හි පජ්ජෝතරජුහට බොහෝ වස්ත්‍රයන්ට බොහෝ වස්ත්‍ර යුග්මයන්ට බොහෝ සිය ගණන් වස්ත්‍රයුග්මයන්ට බොහෝ දහස් ගණන් වස්ත්‍රයුග්මයන්ට බොහෝ ලක්‍ෂගණන් වස්ත්‍රයුග්මයන්ට අග්‍ර වූ ද ශ්‍රේෂ්ඨ වූ ද මුඛ්‍ය වූ ද උතුම් වූ ද ප්‍රවර වූ ද සීවෙය්‍යකවස්ත්‍රයුග්මයක් ලැබුනේ වේ. ඉක්බිති පජ්ජෝත රජතෙමේ ඒ සීවෙය්‍යකවස්ත්‍රයුග්මය ජීවක කොමාර-භච්චහට යැවී ය.

53. එකල්හි ජීවක කොමාරභච්චයාහට ''පජ්ජෝත රජු විසින් මා වෙත එවූ සීවෙය්‍යකවස්ත්‍රයුග්මය බොහෝ වස්ත්‍රයන්ට බොහෝ වස්ත්‍ර යුග්මයන්ට බොහෝ සියගණන් වස්ත්‍රයුග්මයන්ට බොහෝ දහස්ගණන් වස්ත්‍රයුග්මයන්ට බොහෝ ලක්‍ෂගණන් වස්ත්‍රයුග්මයන්ට අග්‍ර ද වේ. ශ්‍රේෂ්ඨ ද වේ. මුඛ්‍ය ද වේ. උතුම් ද වේ. ප්‍රවර ද වේ. භාග්‍යවත් වූ අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ තථාගතයන් වහන්සේ හෝ මගධේශ්වර වූ සෙනා ඇති බිම්බිසාර රජු හෝ හැර අන් කිසිවෙක් මේ වස්ත්‍රයුග්මයට සුදුසු නො වේ''යි මේ සිත විය.

54. එකල්හි භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය දොස් කිපීමෙන් පිඩිත වේ. භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනඳ තෙරුන් ඇමතූ සේක: ''ආනන්දය, තථාගතයන්ගේ ශරීරය දොස් අධික වූයේ වේ. තථාගත තෙමේ විරේක බෙහෙතක් පානය කරන්නට කැමැති''යි වදාළ සේක.

55. ඉක්බිති ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේ ජීවක කොමාර-භච්චයා වෙත ගියහ. ගොස් ඇවැත ජීවකය, තථාගතයන් වහන්සේගේ ශරීරය දොස් කිපීමෙන් පීඩිත වේ. තථාගතයන් වහන්සේ විරේක බෙහෙතක් පානය කරන්නට කැමැති සේකැ''යි ජීවක කොමාරභච්චයාහට කීහ. ''ආනන්ද ස්ථවිරයන් වහන්ස, එසේ නම් භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය කිහිප දිනක් තෙල් පොවා මොලොක් කරණ සේක්වා''යි හෙතෙම කී ය.

56. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කිහිප දිනක් භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය මොලොක් කොට ජීවක කොමාරභච්චයා වෙත ගියහ. ගොස් ''ඇවැත, ජීවකය, තථාගතයන් වහන්සේගේ ශරීරය මොලොක් වූයේය. දැන් යමකට කල් සලකන්නෙහි නම් වේ ඒ විරේක බෙහෙත දීමට කල් වේ යැ යි ජීවකකොමාරභච්චයාහට දැන්වූහ.

57. එවිට ජීවක කොමාරභච්චයාහට ''මම භාග්‍යවතුන් වහන්සේට දැඩි වූ විරේක බෙහෙතක් දෙන්නෙම් නම්, මට ඒ සුදුසු නො වේ''යි සිත් වි ය. එසේ සිතා උපුල්මිටි තුණක් නොයෙක් බෙහෙත් ගල්වා ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මේ පළමුවන උපුල්මිටිය සිඹිනා සේක්වා. මෙය භාග්‍යවතුන් වහන්සේට දස-වරක් විරේක කරන්නේ ය'' යි එක් උපුල් මිටියක් භාග්‍යවතුන් වහන්සේට එළවූයේ ය. ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මේ දෙවන උපුල් මිටිය සිඹිනා සේක් වා. මෙය භාග්‍යවතුන් වහන්සේට දසවරක් විරේක කරන්නේය.'යි දෙවන උපුල් මිටිය භාග්‍යවතුන් වහන්සේට එළවූයේ ය. ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මේ තෙවන උපුල්මිටිය සිඹිනා සේක්වා. මෙය භාග්‍යවතුන් වහන්සේට දසවරක් විරේක කරන්නේ ය'' යි තෙවන උපුල් මිටිය භාග්‍යවතුන් වහන්සේට එළවූයේ ය. ඉක්බිති ජීවක කොමාරභච්ච තෙමේ භාග්‍යවතුන් වහන්සේට තිස් වරක් විරේක වන්නට බෙහෙත් දී භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට නික්ම ගියේ ය.

58. අථ ඛො ජීවකස්ස කොමාරභච්චස්ස බහිද්වාරකොට්ඨකා නික්ඛ-න්තස්ස එතදහොසි: "මයා ඛො භගවතො සමතිංසාය විරෙචනං දින්නං. දෙසාභිසන්නො තථාගතස්ස කායො. න භගවන්තං සමතිංසක්ඛත්තුං විරෙචෙස්සති. එකූනතිංසක්ඛත්තුං භගවන්තං විරෙචෙස්සති. අපි ච භගවා විරිත්තො නහායිස්සති. නහාතං භගවන්තං සකිං විරෙචෙස්සති. එවං භගවතො සමතිංසාය විරෙචනං භවිස්සතී"ති.

59. අථ ඛො භගවා ජීවකස්ස කොමාරභච්චස්ස චෙතසා චෙතො-පරිවිතක්කමඤ්ඤාය ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "ඉධානන්ද, ජීවකස්ස කොමාරභච්චස්ස බහිද්වාරකොට්ඨකා නික්ඛන්තස්ස එතදහොසි: 'මයා ඛො භගවතො සමතිංසාය විරෙචනං දින්නං. දෙසාභිසන්නො තථාගතස්ස කායො. න භගවන්තං සමතිංසක්ඛත්තුං විරෙචෙස්සති. එකූනතිංසක්ඛත්තුං භගවන්තං විරෙචෙස්සති. අපිච භගවා විරිත්තො නහායිස්සති. නහාතං භගවන්තං සකිං විරෙචෙස්සති. එවං භගවතො සමතිංසාය විරෙචනං භවිස්සතී' ති. තෙනහානන්ද, උණ්හොදකං පටියාදෙහී" ති. "එවං භන්තෙ" ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා උණ්හොදකං පටියාදෙසි.

60. අථ ඛො ජීවකො කොමාරභච්චො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජීවකො කොමාරභච්චො භගවන්තං එතදවොච: "විරිත්තො භන්තෙ භගවා"ති. "විරිත්තොම්හි ජීවකා"ති. "ඉධ මය්හං භන්තෙ බහිද්වාර-කොට්ඨකා නික්ඛන්තස්ස එතදහොසි: "මයා ඛො භගවතො සමතිංසාය විරෙචනං දින්නං. දෙසාභිසන්නො තථාගතස්ස කායො. න භගවන්තං සමතිංසක්ඛත්තුං විරෙචෙස්සති. එකූනතිංසක්ඛත්තුං භගවන්තං විරෙ-චෙස්සති. අපි ච භගවා විරිත්තො නහායිස්සති. නහාතං භගවන්තං සකිං විරෙචෙස්සති. එවං භගවතො සමතිංසාය විරෙචනං භවිස්සතී' ති. නහායතු භන්තෙ භගවා. නහායතු සුගතො" ති. අථ ඛො භගවා උණ්හොදකං නහායි. නහාතං භගවන්තං සකිං විරෙචෙසි. එවං භගවතො සමතිංසාය විරෙචනං අහොසි.

61. අථ ඛො ජීවකො කොමාරභච්චො භගවන්තං එතදවොච: "යාව භන්තෙ භගවතො කායො පකතත්තො හොති, අලං තාව යූසපිණ්ඩ-පාතෙනා"ති[1].

1. "අහං තාව යූස පිණ්ඩපාතෙනාති" සී මු.
,, "අලං යූස පිණ්ඩපාතෙනාති" සි.

58. ඉක්බිති බිහිදෙරොටුවෙන් නික්මෙන්නා වූ ජීවක කොමාරභච්චනට "මා විසින් භාග්‍යවතුන් වහන්සේට තිස්වරක් විරේක වන බෙහෙතක් දෙන ලද්දේ ය. තථාගතයන් වහන්සේගේ ශරීරය දෙස් අධික වූයේ වේ. භාග්‍යවතුන් වහන්සේට තිස්වරක් විරේක නො වන්නේ ය. එකුන් තිස්වරක් භාග්‍යවතුන් වහන්සේට විරේක වන්නේ ය. එහෙත් විරේචනය කළා වූ භාග්‍යවතුන් වහන්සේ ස්නානය කරන්නාහ. ස්නානය කළා වූ භාග්‍යවතුන් වහන්සේට වරක් විරේචනය වන්නේ ය. මෙසේ භාග්‍යවතුන් වහන්සේට තිස් වරක් විරේචනය වන්නේය" යි මෙ සිත විය.

59. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ජීවක කොමාරභච්චයාගේ අදහස (තමන්) සිතින් දැන "ආනන්දය, මෙහි බිහිදොරටුවෙන් නික්මෙන්නා වූ ජීවක කොමාරභච්චයාහට 'මා විසින් භාග්‍යවතුන් වහන්සේට තිස්වරක් විරේක වන බෙහෙතක් දෙන ලද්දේ ය. තථාගතයන් වහන්සේගේ ශරීරය උත්සන්න වූ දෙස් ඇත්තේ ය. භාග්‍යවතුන් වහන්සේට තිස් වරක් විරේචනය නො වන්නේ ය. එකුන්තිස්වරක් භාග්‍යවතුන් වහන්සේට විරේචනය වන්නේ ය. එහෙත් විරේචනය කළා වූ භාග්‍යවතුන් වහන්සේ ස්නානය කරණ සේක. ස්නානය කළ භාග්‍යවතුන් වහන්සේට වරක් විරේචනය වන්නේ ය. මෙසේ භාග්‍යවතුන් වහන්සේට තිස් වරක් විරේචනය වන්නේ ය" යන සිත් වී ය යි වදාරා ආයුෂ්මත් අනඳතෙරුන් ඇමතූ සේක: "ආනන්දය, එසේ නම් උණුදිය පිළියෙළ කරව"යි. "ස්වාමීනි, එසේය"යි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී උණුදිය පිළියෙල කළහ.

60. ඉක්බිති ජීවක කොමාරභච්ච තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන්නා වූ ජීවක කොමාරභච්ච තෙමේ "ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ විරේක කළ සේක් දැ" යි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසී ය. "ජීවකය විරේක කළෙම් වෙමි." "ස්වාමීනි, මෙහි පිටදෙරටුවෙන් නික්මෙන්නාවූ මට "මා විසින් භාග්‍යවතුන් වහන්සේට තිස්වරක් විරේක වන බෙහෙතක් දෙන ලද්දේ ය. තථාගතයන් වහන්සේගේ ශරීරය උත්සන්න වූ දෙස් ඇත්තේ ය. භාග්‍යවතුන් වහන්සේට තිස් වරක් විරේචනය නො වන්නේ ය. එකුන්තිස්වරක් භාග්‍යවතුන් වහන්සේට විරේචනය වන්නේ ය. එහෙත් විරේචනය කළා වූ භාග්‍යවතුන් වහන්සේ ස්නානය කරණ සේක. ස්නානය කළා වූ භාග්‍යවතුන් වහන්සේට වරක් විරේචනය වන්නේ ය. මෙසේ භාග්‍යවතුන් වහන්සේට තිස්වරක් විරේචනය වන්නේ ය'යි මේ අදහස වී ය. භාග්‍යවතුන් වහන්සේ ස්නානය කරණ සේක්වා. සුගතයන් වහන්සේ ස්නානය කරණ සේක්වා"යි භාග්‍යවතුන් වහන්සේට සැළ-කෙළේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උණුදිය ස්නානය කළ සේක. ස්නානය කළා වූ භාග්‍යවතුන් වහන්සේට වරක් විරේචනය වි ය. මෙසේ භාග්‍යවතුන් වහන්සේට සමතිස් විරේචනයෙක් විය.

61. අනතුරුව ජීවක කොමාරභච්චතෙමේ "ස්වාමීනි, යම්තාක් කලකින් භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය ප්‍රකෘතිස්වභාවය ඇත්තේ වේ ද, ඒ තාක් කල් සිනිඳු වූ ආහාර සුදුසු ය"යි භාග්‍යවතුන් වහන්සේට සැළ කෙළේ ය.

62. අථ ඛො භගවතො කායො න චිරස්සෙව පකතත්තො අහොසි. අථ ඛො **ජීවකො** කොමාරභච්චො තං සිවෙය්‍යකං දුස්සයුගං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජීවකො කොමාරභච්චො භගවන්තං එතදවොච: "එකාහං භන්තෙ, භගවන්තං වරං යාචාමී" ති. "අතික්කන්තවරා ඛො ජීවක, තථාගතා" ති. "යඤ්ච භන්තෙ, කප්පති යඤ්ච අනවජ්ජ"න්ති. "වදෙහි ජීවකා"ති. "භගවා භන්තෙ, පංසුකූලිකො භික්ඛුසඞ්ඝො ච. ඉදං මෙ භන්තෙ, 'සිවෙය්‍යකං දුස්සයුගං රඤ්ඤා **පජ්ජොතෙන** පහිතං බහූනං දුස්සානං බහූනං දුස්සයුගානං බහූනං දුස්සයුගසතානං බහූනං දුස්සයුගසහස්සානං බහූනං දුස්සයුගසතසහස්සානං අග්ගඤ්ච සෙට්ඨඤ්ච මොක්ඛඤ්ච උත්තමඤ්ච පවරඤ්ච. පටිග්ගණ්හාතු මෙ භන්තෙ, භගවා සිවෙය්‍යකං දුස්සයුගං. භික්ඛුසඞ්ඝස්ස ච ගහපති චීවරං අනුජානාතූ"ති. පටිග්ගහෙසි භගවා සිවෙය්‍යකං දුස්සයුගං.

63. අථ ඛො භගවා ජීවකං කොමාරභච්චං ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි. අථ ඛො ජීවකො කොමාරභච්චො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

64. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, ගහපතිචීවරං. යො ඉච්ඡති, පංසුකූලිකො හොතු. යො ඉච්ඡති, ගහපතිචීවරං සාදියතු. ඉතරීතරෙනපහං[1] භික්ඛවෙ, සන්තුට්ඨිං වණ්ණෙමී" ති.

65. අස්සොසුං ඛො රාජගහෙ මනුස්සා "භගවතා කිර භික්ඛූනං ගහපතිචීවරං අනුඤ්ඤාත" න්ති. තෙ ච මනුස්සා හට්ඨා අහෙසුං උදග්ගා: "ඉදානි ඛො මයං දානානි දස්සාම, පුඤ්ඤානි කරිස්සාම, යතො භගවතා භික්ඛූනං ගහපතිචීවරං අනුඤ්ඤාත"න්ති. එකාහෙනෙව රාජගහෙ බහූනි චීවරසහස්සානි උප්පජ්ජිංසු.

66. අස්සොසුං ඛො ජානපදා මනුස්සා "භගවතා කිර භික්ඛූනං ගහපති චීවරං අනුඤ්ඤාත"න්ති. තෙ ච මනුස්සා හට්ඨා අහෙසුං උදග්ගා: "ඉදානි ඛො මයං දානානි දස්සාම, පුඤ්ඤානි කරිස්සාම, යතො භගවතා භික්ඛූනං ගහපතිචීවරං අනුඤ්ඤාත"න්ති. ජනපදෙපි එකාහෙනෙව බහූනි චීවරසහස්සානි උප්පජ්ජිංසු.

67. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස පාවාරො උප්පන්නො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පාවාර"න්ති. කොසෙය්‍යපාවාරො උප්පන්නො හොති[2]. "අනුජානාමි භික්ඛවෙ, කොසෙය්‍ය පාවාර"න්ති. කොජවං උප්පන්නං හොති. "අනුජානාමි භික්ඛවෙ, කොජව"න්ති.

**පඨමකභාණවාරො නිට්ඨිතො**

---

1. "ඉතරීතරෙනපාහං" ම ඡ සං. P T S. "ඉතරීතරෙනචාහං" සි
2. "භගවතො එතමත්ථං ආරොචෙසුං" ම ඡ සං. P T S. අ වි. ජ වි.

Free Distribution www.aathaapi.org

62. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය නොබෝ කලකින් ම ප්‍රකෘති ස්වභාව ඇත්තේ වි ය. නැවත **ජීවක** කොමාරභච්ච තෙමේ ඒ සිවෙය්‍යකවස්ත්‍රයුග්මය ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් ජීවකකොමාරභච්ච තෙමේ "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගෙන් එක් වරයක් ඉල්ලමි"යි භාග්‍යවතුන් වහන්සේට සැළකෙළේ ය. "ජීවකය, තථාගතවරයෝ වර ඉක්මවූවාහු ය". "ස්වාමීනි, යමක් කැප වේ ද, යමක් නිදෙස් වේ ද, (එබඳු වරයක් ඉල්ලමි)"යි. "ජීවකය, කියව". "ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ පංසුකූලික වන සේක. භික්ෂුසඞ්ඝ තෙමේත් පංසුකූලික වේ. ස්වාමීනි, මේ සිවෙය්‍යකවස්ත්‍රයුග්මය **පජ්ජෝත** රජු විසින් මට එවන ලද්දේ ය. බොහෝ වස්ත්‍රයන්ට බොහෝ වස්ත්‍රයුග්මයන්ට බොහෝ සියගණන් වස්ත්‍රයුග්මයන්ට බොහෝ දහස්ගණන් වස්ත්‍රයුග්මයන්ට බොහෝ ලක්‍ෂගණන් වස්ත්‍රයුග්මයන්ට අග්‍ර ද ශ්‍රේෂ්ඨ ද මුඛ්‍ය ද උත්තම ද පුවර ද වේ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මාගේ සිවෙය්‍යකවස්ත්‍රයුග්මය පිළිගන්නා සේක් වා. භික්ෂුසඞ්ඝයාට ද ගෘහපතිචීවරය අනුදන්නා සේක්වා" යි සැළකෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ සිවෙය්‍යකවස්ත්‍රයුග්මය පිළිගත් සේක.

63. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ජීවක කොමාරභච්චයාට දැහැමි කතාවෙන් කරුණු දක්වූ සේක (එහි ඔහු) සමාදන් කරවූ සේක. තියුණු කරවූ සේක. සතුටු කරවූ සේක. භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කතාවෙන් කරුණු දක්වන ලද සමාදන් කරවන ලද තියුණු කරවන ලද සතුටු කරවන ලද ජීවක කොමාරභච්චතෙමේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට නික්ම ගියේ ය.

64. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට "මහණෙනි, ගෘහපතිචීවරය අනුදනිමි. යමෙක් කැමැති නම්, පංසුකූලික වේවා. යමෙක් කැමැති නම්, ගෘහපතිචීවරය ඉවසාවා. මහණෙනි, මම කුදු මහත් අගය ඇති යම්කිසිවකින් (ලද්දෙයින්) ම සතුටු වීම වර්‍ණනා කරමි" යි භික්ෂූන් ඇමතූ සේක.

65. රජගහනුවර වැසි මිනිස්සු "භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට ගෘහපතිචීවරය අනුදන්නා ලද්දේ ල"යි ඇසූහ. "යම්හෙයකින් භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට ගෘහපතිචීවරය අනුදන්නා ලද්දේ ද, (එහෙයින්) අපි දුන් දන් දෙන්නෙමු. පින් කරන්නෙමු"යි ඒ මිනිස්සු ද සතුටු වූහ. ඔද වැඩියෝ වූහ. එක දවසින් ම රජගහ නුවර දී (භික්ෂූන්ට) බොහෝ දහස්ගණන් සිවුරු උපන.

66 දනවුවැසි මිනිස්සු "භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට ගෘහපතිචීවරය අනුදන්නා ලද්දේ ල"යි ඇසූහ. "යම් හෙයකින් භාග්‍ය-වතුන් වහන්සේ විසින් භික්ෂූන්ට ගෘහපතිචීවරය අනුදන්නා ලද්දේ ද, (එහෙයින්) අපි දුන් දන් දෙන්නෙමු. පින් කරන්නෙමු"යි ඒ මිනිස්සු ද සතුටු වූහ. ඔද වැඩියෝ වූහ. එක දවසින් ම ජනපදයෙහි ද බොහෝ දහස් ගණන් සිවුරු උපන.

67. එකල්හි සඞ්ඝයාහට පොරෝණා සළුවක් ලැබුනේ ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ. "මහණෙනි, පොරෝණා සළුව අනුදනිමි.' පටපණුහුසින් වියූ පොරෝණා සළුවක් ලැබුනේ ය. "මහණෙනි, පටපණු හුසින් වියූ පොරෝණා සළුව අනුදනිමි." කොඳුපලසක් ලැබුනේ ය. "මහණෙනි, කොඳුපලස අනුදනිමි"යි වදාළසේක.

**පළමු බණවර නිමි.**

---

1. තෙන ඛො පන සමයෙන **කාසිරාජා** ජීවකස්ස කොමාරභච්චස්ස අඩ්ඪකාසියං[1] කම්බලං පාහෙසි උපඩ්ඪකාසීනං ඛමමානං. අථ ඛො ජීවකො කොමාරභච්චො තං අඩ්ඪකාසියං කම්බලං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජීවකො කොමාරභච්චො භගවන්තං එතදවොච: "අයමෙම භන්තෙ, අඩ්ඪකාසියො කම්බලො කාසිරඤ්ඤා පහිතො උපඩ්ඪකාසිනං ඛමමානො. පතිගණ්හාතු මෙ භන්තෙ, භගවා කම්බලං, යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායා" ති. පටිග්ගහෙසි භගවා කම්බලං.

2. අථ ඛො භගවා ජීවකං කොමාරභච්චං ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි. අථ ඛො ජීවකො කොමාරභච්චො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

3. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, කම්බල" න්ති.

4. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස උච්චාවචානි චීවරානි උප්පජ්ජන්ති.[2] අථ ඛො භික්ඛූනං එතදහොසි: "කින්නු ඛො භගවතා චීවරං අනුඤ්ඤාතං කිං අනනුඤ්ඤාත" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ඡ චීවරානි: ඛොමං කප්පාසිකං කොසෙය්‍යං කම්බලං සාණං භඞ්ග" න්ති.

5. තෙන ඛො පන සමයෙන යෙ තෙ භික්ඛූ[3] ගහපතිචීවරං සාදියන්ති, තෙ කුක්කුච්චායන්තා පංසුකූලං න සාදියන්ති: "එකංයෙව භගවතා චීවරං අනුඤ්ඤාතං . න ද්වෙ"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ගහපතිචීවරං සාදියන්තෙන පංසුකූලම්පි සාදිසිතුං. තදුභයෙනපහං භික්ඛවෙ, සන්තුට්ඨිං වණ්ණෙමී" ති.

6. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ **කොසලෙසු** ජනපදෙසු අද්ධානමග්ගපටිපන්නා හොන්ති. එකච්චෙ භික්ඛූ සුසානං ඔක්කමිංසු පංසුකූලාය. එකච්චෙ භික්ඛූ නාගමෙසුං[4]. යෙ තෙ භික්ඛූ සුසානං ඔක්කමිංසු පංසුකූලාය, තෙ පංසුකූලානි ලභිංසු. යෙ තෙ භික්ඛූ නාගමෙසුං, තෙ එවමාහංසු: "අම්හාකම්පි ආවුසො භාගං දෙථා" ති. තෙ එවමාහංසු: "න මයං ආවුසො තුම්හාකං භාගං දස්සාම. කිස්ස තුම්හෙ නාගමිත්ථා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, නාගමෙන්තානං න අකාමා[5] භාගං දාතු" න්ති.

1. "අඩ්ඪකාසිකා" ම ඡ සං. P T S. ජ වි. අ වි. ම නු ප. නො වි.
2. "උප්පන්නානි හොන්ති" ම ඡ සං.
3. "තෙ භික්ඛූ" P T S. ම නු ප
4. "නාගමිංසු" ම නු ප. නො වි.
5. "ආකාමා" ම ඡ සං.

1. එකල්හි කසීරජ තෙමේ **ජීවක** කොමාරභච්චහට අඩදහසකට පොහොනා වූ (පන්සියයක් අගනා වූ) කම්බිලියක් යැවී ය. ඉක්බිති ජීවක කොමාරභච්ච තෙමේ පන්සියයක් අගනා වූ ඒ කම්බිලිය ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන්නා වූ ජීවක කොමාරභච්චතෙමේ "ස්වාමීනි, මාගේ අඩ දහසකට පොහොනා වූ (පන්සියයක් අගනා වූ) මේ කම්බිලිය කාසිරජු විසින් එවන ලද්දේ ය. යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේගේ පිළිගැණීම මට බොහෝ කාලයක් හිත සැප පිණිස වන්නේ ද, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මාගේ මේ කම්බිලිය පිළිගන්නා සේක්වා" යි භාග්‍යවතුන් වහන්සේට සැල කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේ කම්බිලිය පිළිගත්සේක.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ජීවක කොමාරභච්චයාට දහැමි කතාවෙන් කරුණු දක්වූ සේක. (එහි ඔහු) සමාදන් කරවූ සේක. තියුණු කරවූ සේක. සතුටු කරවූ සේක. එකල්හි ජීවක කොමාරභච්ච තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් දහැමිකතාවෙන් කරුණු දක්වන ලද්දේ සමාදන් කරවන ලද්දේ තියුණු කරවන ලද්දේ සතුටු කරවන ලද්දේ හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට නික්ම ගියේ ය.

3. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දහැමි කතා කොට භික්ෂූන් අමතා "මහණෙනි, කම්බිලිය අනුදනිමි" යි වදාළසේක.

4. එකල්හි සඞ්ඝයාට අගය ඇති නැති සිවුරු ලැබෙයි. එකල භික්ෂූන්ට 'කවර භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට සිවුරු අනුදන්නා ලද ද !කවර නො අනුදන්නා ලද ද ?"යි සිත් විය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, කොමු පිළී, කපු පිළී, පට පිළී, කම්බිලි, හණවැහරි පිළී, මේ පස් නූලෙන් මුසු පිළී යන සිවුරු* සයක් අනුදනිමි".

5. එකල්හි "භාග්‍යවතුන් වහන්සේ විසින් එක ම සිවුරක් අනුදන්නා ලද ය. සිවුරු දෙකක් නො අනුදන්නා ලද"යි යම් ඒ භික්ෂූහු ගෘහපතී චීවරය ඉවසත් ද, ඒ භික්ෂූහු කුකුස් කරන්නෝ පංසුකූලය නො ඉවසත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, ගෘහපති චීවරය ඉවසන්නහු විසින් පංසුකූලයත් ඉවසන්නට අනුදනිමි. මහණෙනි, මම ඒ දෙකින් ම සතුටු වීම වණීනා කරමි".

6. එකල්හි බොහෝ භික්ෂූහු කොසොල් දනව්වෙහි දීඝීමාගීයට පිළිපන්නාහු වෙත්. ඇතැම් භික්ෂූහු පංසුකූල වස්ත්‍ර පිණිස සොහොනට පිවිසියාහු ය. ඇතැම් භික්ෂූහු එය බලාපොරොත්තු නො වූවාහු ය. යම් ඒ භික්ෂූහු පංසුකූල පිණිස සොහොනට පිවිසියාහු ද, ඒ භික්ෂූහු පංසුකූල ලැබූහ. යම් ඒ භික්ෂූහු බලාපොරොත්තු නො වූවාහු ද, ඒ භික්ෂූහු "ඇවැත්නි, අපටත් කොටසක් දෙවු" යි මෙසේ කීහ. ඒ භික්ෂූහු "ඇවැත්නි, අපි තොපට කොටසක් නො දෙන්නෙමු. කුමක් නිසා තෙපි බලාපොරොත්තු නො වූවහු ද" යි මෙසේ කීහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, (බලාපොරොත්තු නො වන්නවුන්ට) අකමැත්තෙන් කොටස නො දෙන්නට අනුදනිමි" යි.

* මෙහි "සිවුරු" යනු 'වස්ත්‍රය, එයින් කළ සිවුර' යන අර්ථ දෙක්හි ම යෙදේ.

7. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ කොසලෙසු ජනපදෙසු අද්ධානමග්ගපටිපන්නා හොන්ති. එකච්චෙ භික්ඛූ සුසානං ඔක්කමිංසු පංසුකූලාය. එකච්චෙ භික්ඛූ ආගමෙසුං. යෙ තෙ භික්ඛූ සුසානං ඔක්කමිංසු පංසුකූලාය, තෙ පංසුකූලානි ලභිංසු. යෙ තෙ භික්ඛූ ආගමෙසුං, තෙ එවමාහංසු: "අම්හාකම්පි ආවුසො භාගං දෙථා" ති. තෙ එවමාහංසු: "න මයං ආවුසො තුම්හාකං භාගං දස්සාම. කිස්ස තුම්හෙ න ඔක්කමිත්ථා" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ආගමෙන්තානං අකාමා භාගං දාතු"න්ති.

8. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ කොසලෙසු ජනපදෙසු අද්ධානමග්ගපටිපන්නා හොන්ති. එකච්චෙ භික්ඛූ පඨමං සුසානං ඔක්කමිංසු පංසුකූලාය. එකච්චෙ භික්ඛූ පච්ඡා ඔක්කමිංසු. යෙ තෙ භික්ඛූ පඨමං සුසානං ඔක්කමිංසු පංසුකූලාය, තෙ පංසුකූලානි ලභිංසු. යෙ තෙ භික්ඛූ පච්ඡා ඔක්කමිංසු, තෙ න ලභිංසු. තෙ එවමාහංසු: "අම්හාකම්පි ආවුසො භාගං දෙථා"ති. තෙ එවමාහංසු: "න මයං ආවුසො තුම්හාකං භාගං දස්සාම. කිස්ස තුම්හෙ පච්ඡා ඔක්කමිත්ථා"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පච්ඡා ඔක්කමන්තානං[1] න අකාමා භාගං දාතු"න්ති.

9. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ කොසලෙසු ජනපදෙසු අද්ධානමග්ගපටිපන්නා හොන්ති. තෙ සදිසා සුසානං ඔක්කමිංසු පංසුකූලාය. එකච්චෙ භික්ඛූ පංසුකූලානි ලභිංසු. එකච්චෙ භික්ඛූ න ලභිංසු. යෙ තෙ භික්ඛූ න ලභිංසු, තෙ එවමාහංසු: "අම්හාකම්පි ආවුසො භාගං දෙථා"ති. තෙ එවමාහංසු: "න මයං ආවුසො තුම්හාකං භාගං දස්සාම. කිස්ස තුම්හෙ න ලභිත්ථා"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ සදිසානං ඔක්කමන්තානං අකාමා භාගං දාතු"න්ති.

10. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ කොසලෙසු ජනපදෙසු අද්ධානමග්ගපටිපන්නා හොන්ති. තෙ කතිකං කත්වා සුසානං ඔක්කමිංසු පංසුකූලාය. එකච්චෙ භික්ඛූ පංසුකූලානි ලභිංසු. එකච්චෙ භික්ඛූ න ලභිංසු. යෙ තෙ භික්ඛූ න ලභිංසු, තෙ එවමාහංසු: "අම්හාකම්පි ආවුසො භාගං දෙථා" ති. තෙ එවමාහංසු: "න මයං ආවුසො තුම්හාකං භාගං දස්සාම. කිස්ස තුම්හෙ න ලභිත්ථා"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, කතිකං කත්වා ඔක්කමන්තානං අකාමා භාගං දාතු'න්ති.

11. තෙන ඛො පන සමයෙන මනුස්සා චීවරං ආදාය ආරාමං ආගච්ඡන්ති. තෙ පටිග්ගාහකං අලභමානා පටිහරන්ති. චීවරං පරිත්තං උප්පජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං චීවරපටිග්ගාහකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය, න දොසාගතිං ගච්ඡෙය්‍ය, න මොහාගතිං ගච්ඡෙය්‍ය, න භයාගතිං ගච්ඡෙය්‍ය, ගහිතාගහිතඤ්ච ජානෙය්‍ය."

1. "ඔක්කන්තානං" ම ඡ සං. P T S.

7. එකල්හි බොහෝ භික්ෂූහු කොසොල් දනව්වෙහි දීඝීමාගීයට පිළිපන්නාහු වෙත්. ඇතැම් භික්ෂූහු පංසුකූල පිණිස සොහොනට පිවිසියාහු ය. ඇතැම් භික්ෂූහු බලාපොරොත්තු ව සිටියහ. යම් ඒ භික්ෂූහු පංසුකූල පිණිස සොහොනට පිවිසියාහු ද, ඒ භික්ෂූහු පංසුකූල ලැබූහ. යම් ඒ භික්ෂූහු බලා-පොරොත්තු ව සිටියාහු ද, ඒ භික්ෂූහු "ඇවැත්නි, අපටත් කොටස දෙවූ" යි මෙසේ කීහ. ඒ භික්ෂූහු "ඇවැත්නි, අපි තොපට කොටස නො දෙන්නෙමු. කුමක් හෙයින් තෙපි නො පැමිණියහු ද" යි මෙසේ කීහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකළහ. "මහණෙනි, බලාපොරොත්තු ව සිටින්නවුන්ට නො කැමැත්තෙන් කොටස දෙන්නට අනුදනිමි".

8. එකල්හි බොහෝ භික්ෂූහු කොසොල්දනව්වෙහි දීඝීමාගීයට පිළිපන්නාහු වෙත්. ඇතැම් භික්ෂූහු පංසුකූල පිණිස පළමු කොට සොහොනට පිවිසියාහු ය. ඇතැම් භික්ෂූහු පසු ව පිවිසියාහු ය. යම් ඒ භික්ෂූහු පංසුකූල පිණිස පළමු කොට සොහොනට පිවිසියාහු ද, ඒ භික්ෂූහු පංසුකූල ලැබූහ. යම් ඒ භික්ෂූහු පසු ව පිවිසියාහු ද, ඒ භික්ෂූහු නො ලැබූහ. ඒ භික්ෂූහු "ඇවැත්නි, අපටත් කොටස දෙවූ" යි මෙසේ කීහ. ඒ භික්ෂූහු "ඇවැත්නි, අපි තොපට කොටස නො දෙන්නෙමු. කුමක් හෙයින් තෙපි පසු ව පැමිණියහු ද" යි මෙසේ කීහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, පසු ව පැමිණෙන්නවුන්ට අකමැත්තෙන් කොටස නො දෙන්නට අනුදනිමි".

9. එකල්හි බොහෝ භික්ෂූහු කොසොල්දනව්වෙහි දීඝීමාගීයට පිළිපන්නාහු වෙත්. ඒ භික්ෂූහු සම ව (එක් විට) පංසුකූල පිණිස සොහොනට පිවිසියාහු ය. ඇතැම් භික්ෂූහු පංසුකූල ලැබූහ. ඇතැම් භික්ෂූහු නො ලැබූහ. යම් ඒ භික්ෂූහු නො ලැබූහු ද, ඒ භික්ෂූහු "ඇවැත්නි, අපටත් කොටස දෙවූ" යි මෙසේ කීහ. ඒ භික්ෂූහු "ඇවැත්නි, අපි තොපට කොටස නො දෙන්නෙමු. කුමක් හෙයින් තෙපි නො ලැබූවහු ද" යි මෙසේ කීහ. භාග්‍ය-වතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, සම ව පැමිණෙන්නවුන්ට නො කැමැත්තෙන් කොටස දෙන්නට අනුදනිමි".

10. එකල්හි බොහෝ භික්ෂූහු කොසොල්දනව්වෙහි දීඝීමාගීයට පිළිපන්නාහු වෙත්. ඒ භික්ෂූහු කතිකා කොට පංසුකූල පිණිස සොහොනට පිවිසියාහු ය. ඇතැම් භික්ෂූහු පංසුකූල ලැබූහ. ඇතැම් භික්ෂූහු නො ලැබූහ. යම් ඒ භික්ෂූහු නො ලැබූවාහු ද, ඒ භික්ෂූහු "ඇවැත්නි, අපටත් කොටස දෙවූ"යි මෙසේ කීහ. ඒ භික්ෂූහු "ඇවැත්නි, අපි තොපට කොටස නො දෙන්නෙමු. කුමක් හෙයින් තෙපි නො ලැබූවහු ද" යි මෙසේ කීහ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, කතිකා කොට පැමිණෙන්නවුන්ට නො කැමැත්තෙන් කොටස දෙන්නට අනුදනිමි".

11. එකල්හි මිනිස්සු සිවුරු ගෙණ ආරාමයට එත්. ඒ මිනිස්සු පිළිගන්නකු නො ලබන්නෝ පෙරලා ගෙණයත්. සිවුරු සවල්පවශයෙන් ලැබේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, යම් මහණෙක් ඡන්ද-යෙන් අගතියට නො යන්නේ ද, ද්වේෂයෙන් අගතියට නො යන්නේ ද, මොහයෙන් අගතියට නො යන්නේ ද, බියෙන් අගතියට නො යන්නේ ද, ගත් නො ගත් දෙය දන්නේ ද, එබඳු පසඟින් යුත් මහණකු සිවුරු පිළිගන්නහු කොට සම්මත කරන්නට අනුදනිමි" යි වදාළ සේක.

12. එවඤ්ච පන භික්ඛවෙ, සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං චීවරපටිග්ගාහකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං චීවරපටිග්ගාහකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො චීවරපටිග්ගාහකස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු චීවරපටිග්ගාහකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති.

13. තෙන ඛො පන සමයෙන චීවරපටිග්ගාහකා භික්ඛූ චීවරං පටිග්ගහෙත්වා තත්ථෙව උජ්ඣිත්වා පක්කමන්ති. චීවරං නස්සති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං චීවරනිදහකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය, න දොසාගතිං ගච්ඡෙය්‍ය, න මොහාගතිං ගච්ඡෙය්‍ය, න භයාගතිං ගච්ඡෙය්‍ය, නිහිතානිහිතඤ්ච ජානෙය්‍ය."

14. එවඤ්ච පන භික්ඛවෙ, සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: "සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං චීවරනිදහකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති. සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං චීවරනිදහකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො චීවරනිදහකස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය. සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු චීවරනිදහකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

15. තෙන ඛො පන සමයෙන චීවරනිදහකා[1] භික්ඛූ මණ්ඩපෙපි රුක්ඛමූලෙපි නිම්බකොසෙපි චීවරං නිදහන්ති[2]. උන්දූරෙහිපි උපචිකාහිපි ඛජ්ජන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ භණ්ඩාගාරං සම්මන්නිතුං, යං සඞ්ඝො ආකඞ්ඛති විහාරං වා අඩ්ඪයොගං වා පාසාදං වා හම්මියං වා ගුහං වා."

16. එවඤ්ච පන භික්ඛවෙ, සම්මන්නිතබ්බො: ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: "සුණාතු මෙ භන්තෙ, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං විහාරං භණ්ඩාගාරං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං විහාරං භණ්ඩාගාරං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස විහාරස්ස භණ්ඩාගාරස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය. සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො විහාරො භණ්ඩාගාරං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

1. "නිදහකො" ම ඡ සං. 2 "නිදහති" ම ඡ සං.

12. මහණෙනි, මෙසේ සම්මත කළ යුතු ය: පළමු කොට මහණ තෙමේ ඉල්විය යුත්තේ ය. ඉල්වා ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය: "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ මෙ නම් ඇති මහණහු සිවුරු පිළිගන්නහු කොට සම්මත කරන්නේ ය. මේ දැන්වීම ය. ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ මෙ නම් ඇති මහණහු සිවුරු පිළිගන්නහු කොට සම්මත කරයි. යම් ආයුෂ්මතකු හට මෙ නම් ඇති මහණහුගේ චීවරප්‍රතිග්‍රාහකසම්මුතිය රුචි වේ නම්, හෙතෙමේ තුෂ්ණීම්-භූත වන්නේ ය. යමකුට රුචි නො වේ නම් හෙතෙමේ කියන්නේ ය. සඞ්ඝයා විසින් මෙ නම් ඇති මහණ තෙමේ චීවරප්‍රතිග්‍රාහකයා යි සම්මත කරණ ලද්දේ ය. සඞ්ඝයාට රුචි වේ. එහෙයින් තුෂ්ණීම්භූත වේ. මෙය මෙසේ දරමි"යි කියා යි.

13. එකල්හි චීවරප්‍රතිග්‍රාහකභික්ෂූහු සිවුරු පිළිගෙණ එහි ම හැරදමා බැහැර යෙත්. සිවුරු නැසේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ. "මහණෙනි, යමෙක් ඡන්දයෙන් අගතියට නො යන්නේ ද, ද්වෙෂයෙන් අගතියට නො යන්නේ ද, මොහයෙන් අගතියට නො යන්නේ ද, බියෙන් අගතියට නො යන්නේ ද, තැන්පත් කළ නො කළ දෙය දන්නේ ද යන පසඟින් යුත් මහණකු සිවුරු තැන්පත් කරන්නහු කොට සම්මත කරන්නට අනුදනිමි".

14. මහණෙනි, මෙසේ සම්මත කළ යුතු ය: පළමු කොට මහණ තෙමේ ඉල්විය යුත්තේ ය. ඉල්වා ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය: "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ මෙ නම් ඇති මහණහු සිවුරු තැන්පත් කරන්නහු කොට සම්මත කරන්නේ ය. මේ දැන්වීම ය. ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ මෙ නම් ඇති මහණහු සිවුරු තැන්පත් කරන්නහු කොට සම්මත කරයි. යම් ආයුෂ්මතකු-හට මෙ නම් ඇති මහණහුගේ සිවුරු තැන්පත් කිරීමේ සම්මුතිය රුචි වේ නම්, ඒ මහණ තෙමේ තුෂ්ණීම්භූත වන්නේ ය. යම් මහණකුහට රුචි නො වේ නම්, හෙතෙමේ කියන්නේ ය. සඞ්ඝයා විසින් මෙ නම් ඇති මහණ තෙමේ සිවුරු තැන්පත් කරන්නේ යි සම්මත කරණ ලද්දේ ය. සඞ්ඝයාහට රුචි වේ. එහෙයින් තුෂ්ණීම්භූත වේ. මෙය මෙසේ දරමි".

15. එකල්හි සිවුරු තැන්පත් කරණ භික්ෂූහු මණ්ඩපයෙහි ද රුක්මුලෙහි ද අගුවෙහි ද සිවුරු තැන්පත් කෙරෙත්. මීයන් විසින් ද වේයන් විසින් ද කනු ලැබෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ. "මහණෙනි, සඞ්ඝතෙමේ වෙහෙරක් හෝ අඩ පියසි ගෙයක් හෝ සිවුරුස් ගෙයක් හෝ සඳලු සහිත ගෙයක් හෝ ගුහාවක් හෝ යමක් කැමැති නම්, එය භාණ්ඩාගාරයක් කොට සම්මත කරන්නට අනුදනිමි".

16. මහණෙනි, මෙසේ සම්මත කළ යුතු ය: ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය: "ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. ඉදින් සඞ්ඝයාහට පැමිණිකල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ මෙ නම් ඇති විහාරය භාණ්ඩාගාරයක් කොට සම්මත කරන්නේ ය. මේ දැන්වීම ය. ස්වාමීනි, සඞ්ඝතෙමේ මාගේ වචනය අසාවා. සඞ්ඝ තෙමේ මෙ නම් ඇති විහාරය භාණ්ඩාගාරයක් කොට සම්මත කරයි. යම් ආයුෂමතකුහට මෙ නම් විහාරයාගේ භාණ්ඩාගාරසම්මුතිය රුචි වේ නම්, හෙතෙමේ තුෂණීම්භූත වන්නේ ය. යමකුහට රුචි නො වේ නම්, හෙතෙමේ කියන්නේ ය. සඞ්ඝයා විසින් මෙ නම් ඇති විහාරය භාණ්ඩාගාරයක් කොට සම්මත කරණ ලද්දේ ය. සඞ්ඝයාට රුචි වේ. එහෙයින් තුෂණීම්භූත වේ. මෙය මෙසේ දරමි".

17. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස භණ්ඩාගාරෙ චීවරං අගුත්තං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං භණ්ඩාගාරිකං[1] සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය, න දොසාගතිං ගච්ඡෙය්‍ය, න මොහාගතිං ගච්ඡෙය්‍ය, න භයාගතිං ගච්ඡෙය්‍ය, ගුත්තාගුත්තඤ්ච ජානෙය්‍ය." එවඤ්ච පන භික්ඛවෙ, සම්මන්නිතබ්බො: -පෙ- සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු භණ්ඩාගාරිකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

18. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ භණ්ඩාගාරිකං වුට්ඨාපෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං: "න භික්ඛවෙ, භණ්ඩාගාරිකො වුට්ඨාපෙතබ්බො. යො වුට්ඨාපෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති.

19. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස භණ්ඩාගාරෙ චීවරං උස්සන්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සම්මුඛීභූතෙන සඞ්ඝෙන භාජෙතු" න්ති.

20. තෙන ඛො පන සමයෙන සබ්බො සඞ්ඝො[2] චීවරං භාජෙන්තො කොලාහලං අකාසි. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං චීවරභාජකං සම්මන්නිතුං: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය න දොසාගතිං ගච්ඡෙය්‍ය, න මොහාගතිං ගච්ඡෙය්‍ය, න භයාගතිං ගච්ඡෙය්‍ය, භාජිතාභාජිතඤ්ච ජානෙය්‍ය. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: -පෙ- සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු චීවරභාජකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

21. අථ ඛො චීවරභාජකානං භික්ඛූනං එතදහොසි: "කථන්නු ඛො චීවරං භාජෙතබ්බ"න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පඨමං උච්චිනිත්වා තුලයිත්වා වණ්ණාවණ්ණං කත්වා භික්ඛූ ගණෙත්වා වග්ගං බන්ධිත්වා චීවරපටිවිංසං ඨපෙතු"න්ති.

22. අථ ඛො චීවරභාජකානං භික්ඛූනං එතදහොසි: "කථන්නු ඛො සාමණෙරානං චීවරපටිවිංසො දාතබ්බො" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සාමණෙරානං උපඩ්ඪපටිවිංසං දාතු"න්ති.

23. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සකෙන භාගෙන උත්තරිතුකාමො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, උත්තරන්තස්ස සකං භාගං දාතු"න්ති.

24. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අතිරෙකභාගෙන උත්තරිතුකාමො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අනුක්ඛෙපෙ දින්නෙ අතිරෙකභාගං දාතු"න්ති.

25. අථ ඛො චීවරභාජකානං භික්ඛූනං එතදහොසි: "කථන්නු ඛො චීවරපටිවිංසො දාතබ්බො ආගතපටිපාටියා නු ඛො උදාහු යථාබුඩ්ඪ"න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අනුජානාමි භික්ඛවෙ, විකලකෙ තොසෙත්වා කුසපාතං කාතු"න්ති.

---

1. "භණ්ඩාගාරියං" ම නු ප. තො වි. අ වි.
2. "සඞ්ඝො" ම ඡ සං.

Free Distribution www.aathaapi.org

17. එකල්හි සඞ්ඝයාගේ භාණ්ඩාගාරයෙහි සිවුරු නො රැකුණේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, යමෙක් ඡන්දයෙන් අගතියට නො යන්නේ ද, ද්වේෂයෙන් අගතියට නො යන්නේ ද, මෝහයෙන් අගතියට නො යන්නේ ද, බියෙන් අගතියට නො යන්නේ ද, රකිත නො රකිත ලද්ද දන්නේ ද යන පසඟින් යුත් මහණකු භාණ්ඩාගාරික කොට සම්මත කරන්නට අනුදනිමි. මහණෙනි, මෙසේ සම්මත කළ යුතු ය: -පෙ- සඞ්ඝයා විසින් මෙ නම් ඇති මහණ තෙමේ භාණ්ඩාගාරික ය යි සම්මත කරණ ලද්දේ ය. සඞ්ඝයාට රුචි වේ. එහෙයින් තුෂ්ණිම්භූත වේ. මෙය මෙසේ දරමි".

18. එකල්හි ෂඩ්වර්ගමහණෝ භාණ්ඩාගාරිකයා පහ කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, භාණ්ඩාගාරික තෙමේ පහ නො කට යුතු ය. යමෙක් පහකරන්නේ නම්, දුකුළා ඇවැත් වේ" යි.

19. එකල්හි සඞ්ඝයාගේ භාණ්ඩාගාරයෙහි සිවුරු බොහෝ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, හමු වූ සඞ්ඝයා විසින් බෙදා ගන්නට අනුදනිමි".

20. එකල්හි සියලු සඞ්ඝ තෙමේ සිවුරු බෙදන්නේ කලහ කෙළේ ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, යමෙක් ඡන්දයෙන් අගතියට නො යන්නේ ද, ද්වේෂයෙන් අගතියට නො යන්නේ ද, මෝහයෙන් අගතියට නො යන්නේ ද, බියෙන් අගතියට නො යන්නේ ද, බෙදූ නො බෙදූ දෙය දන්නේ ද යන මේ පසඟින් යුත් මහණකු සිවුරු බෙදන්නකු කොට සම්මත කරන්නට අනුදනිමි". මහණෙනි, මෙසේ සම්මත කළ යුතු ය: -පෙ- සඞ්ඝයා විසින් මෙ නම් ඇති මහණ තෙමේ සිවුරු බෙදන්නේ ය යි සම්මත කරණ ලද්දේ ය. සඞ්ඝයාහට රුචි වේ. එහෙයින් තුෂ්ණිම්භූත වේ. මෙය මෙසේ දරමි".

21. එකල්හි සිවුරු බෙදන මහණුන්හට "කෙසේ සිවුරු බෙදිය යුතු දැ"යි සිත් විය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පළමු කොට තෝරා, වටිනාකම් පිරිසිඳ, සම කොටස් කොට, භික්ෂූන් ගණන් කොට, පොදි බැඳ, සිවුරු කොටස් තබන්නට අනුදනිමි".

22. එකල්හි සිවුරු බෙදන මහණුන්හට "කෙසේ නම් හෙරණුන්ට සිවුරු කොටස් දිය යුතු දැ"යි සිත් විය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, හෙරණුන්ට කොටස් භාගයක් දෙන්නට අනුදනිමි".

23. එකල්හි එක්තරා මහණෙක් සිය කොටස ගෙණ එතෙර ව යනු කැමැත්තේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, එතෙර යනු කැමැත්තහුට සිය කොටස දෙන්නට අනුදනිමි".

24. එකල්හි එක්තරා මහණෙක් වැඩි කොටසකින් යුක්තව එතෙර යනු කැමැත්තේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, කොටසෙහි වැඩි වටිනා ගණන වෙනුවට දිය යුතු කැප පිරිකර දුන්* කල්හි වැඩි කොටසක් දෙන්නට අනුදනිමි".

25. එකල්හි සිවුරු බෙදන මහණුන්හට "සිවුරු කොටස කෙසේ නම් දිය යුතු ද ? ආ පිළිවෙළින් දිය යුතු ද ? නොහොත් වැඩිමහලු පිළිවෙළින් දිය යුතු දැ"යි සිත් විය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, ඌන ව සිටි කල්හි (සම සේ බෙදීමට සිවුරු හෝ පුද්ගලයන් නො පොහොනා කල්හි)* සතුටු කරවා කුසපත් හෙළීම කරන්නට අනුදනිමි"යි වදාළසේක.

* උපග්‍රන්ථය බලනු.

26. තෙන ඛො පන සමයෙන භික්ඛූ ඡකණෙනපි පණ්ඩුමත්තිකායපි චීවරං රජෙන්ති. චීවරං දුබ්බණ්ණං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ඡ රජනානි: මූලරජනං ඛන්ධරජනං තචරජනං පත්තරජනං පුප්ඵරජනං ඵලරජන" න්ති.

27. තෙන ඛො පන සමයෙන භික්ඛූ සීතුන්දිකාය[1] චීවරං රජෙන්ති. චීවරං දුග්ගන්ධං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, රජනං පචිතුං චුල්ලිං[2] රජනකුම්භි"න්ති. රජනං උත්තරීයති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, උත්තරාලුම්පං[3] බන්ධිතු" න්ති.

28. තෙන ඛො පන සමයෙන භික්ඛූ න ජානන්ති රජනං පක්කං වා අපක්කං වා. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, උදකෙ වා නඛපිට්ඨිකාය වා ථෙවකං දාතු"න්ති.

29. තෙන ඛො පන සමයෙන භික්ඛූ රජනං ඔරොපෙන්තා කුම්භිං ආවිඤ්ඡන්ති[4]. කුම්භී භිජ්ජති[5]. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, රජනුළුඞ්කං දණ්ඩකථාලික"න්ති[6].

30. තෙන ඛො පන සමයෙන භික්ඛූනං රජනභාජනං න සංවිජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, රජනකොලම්බං[7] රජනඝට"න්ති.

31. තෙන ඛො පන සමයෙන භික්ඛූ පාතියාපි පත්තෙපි චීවරං සම්මද්දන්ති[8]. චීවරං පරිභිජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං: "අනුජානාමි භික්ඛවෙ, රජනදොණික"න්ති.

32. තෙන ඛො පන සමයෙන භික්ඛූ ඡමාය චීවරං පත්ථරන්ති. චීවරං පංසුකිතං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, තිණසන්ථාරක"න්ති[9]. තිණසන්ථාරකො උපචිකාහි ඛජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, චීවරවංසං චීවරරජ්ජු"න්ති. මජ්ඣෙන ලග්ගෙන්ති. රජනං උභතො ගලති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, කණ්ණෙ බන්ධිතු"න්ති. කණ්ණො ජීරති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, කණ්ණසුත්තක"න්ති. රජනං එකතො ගලති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සම්පරිවත්තකං සම්පරිවත්තකං රජෙතුං. න ච අච්ඡින්නෙ ථෙවෙ පක්කමිතු"න්ති.

33. තෙන ඛො පන සමයෙන චීවරං පත්ථින්නං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, උදකෙ ඔසාදෙතු" න්ති.[10]

34. තෙන ඛො පන සමයෙන චීවරං ඵරුසං හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පාණිනා ආකොටෙතු"න්ති.

---

1. "සීතුදකාය" ම ඡ සං. "සීතුන්නකාය" PTS "සීතුදිකාය" සි
2. "චුල්ලං" සී මු. 3. "උත්තරාළුවං" සි. "උත්තරළුම්පියං" අ වි. ජ වි.
4 "ආවජ්ජන්ති" ම නු ප. තො වි. ජ වි. අ වි. PTS. "ආවට්ටන්ති" සි.
5. "භිජ්ජති" ම ඡ සං PTS 6. "දණ්ඩකථාලකං" ම ඡ සං.
7. "රජනකොලුම්බං" අට්ඨකථා; "රජනකොලුම්පං" සී මු. 8. "ඔමද්දන්ති" ම ඡ සං.
9. "සන්ථාරකන්ති" ම ඡ සං. 10. "ඔසාරෙතුන්ති" ම ඡ සං. PTS.

26. එකල්හි භික්ෂූහු ගොම්න් ද පඬුවන් මැටියෙන් ද සිවුරු පඬු පොවත්. සිවුරු දුර්වර්ණ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මුල්පඬු, දඬුපඬු, පොතුපඬු, කොළපඬු, මල්පඬු, පලපඬු යන පඬු (වර්ග) සයක් අනුදනිමි".

27. එකල්හි භික්ෂූහු නො පැසුනු පඬුයෙන් සිවුරු පඬු පොවත්. සිවුරු දුගඳ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පඬු පිසන්නට උදුනක් ද පඬුසැළියක් ද අනුදනිමි." පඬු උතුරා යෙයි. භාග්‍ය-වතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, වටඅළුවක් (වට ආධාරයක්) බඳින්නට අනුදනිමි".

28. එකල්හි භික්ෂූහු "පඬු පැසුනේ ද නො පැසුනේ දැ" යි නො දනිත්. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, දියෙහි හෝ නිය පිට හෝ පඬු බින්දුවක් හෙළන්නට අනුදනිමි".

29. එකල්හි භික්ෂූහු (සැළියෙන්) පඬු බාන්නාහු සැළිය නමත්. සැළිය බිඳේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පඬු කිණිස්සක්, දඬුයෙන් කළ හැන්දක්, අනුදනිමි".

30. එකල්හි භික්ෂූන්ට පඬු (බැහීමට) බඳුනක් නැත්තේ ය. භාග්‍ය-වතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මහපඬුසැළියක් ද පඬු කළයක් ද අනුදනිමි".

31. එකල්හි භික්ෂූහු තැටියෙහි ද පාත්‍රයෙහි ද සිවුරු මඬිත්. සිවුර ඉරෙයි. භාග්‍යතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පඬුඔරුවක් අනුදනිමි".

32. එකල්හි භික්ෂූහු සිවුරු බිම එළත්. සිවුරු පස් තැවරුණේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, තණඇතිරියක් අනුදනිමි". තණඇතිරිය වේයන් විසින් කනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි සිවුරු ලන උණදණ්ඩක් ද සිවුරු ලන රැහැනක් ද අනුදනිමි". මැදින් එල්බේ. පඬු දෙකොණින් වැගිරෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, කොන් බඳින්නට අනුදනිමි". කොණ දිරයි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, කොන්හි බඳින හුයක් අනුදනිමි". පඬු එක් කොණකින් වැගිරෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පෙරළ පෙරළා පඬු පොවන්නට ද දියබින්දු නො සිඳුනු තෙක් බැහැර නො යන්නට ද අනුදනිමි".

33. එකල්හි සිවුරු (අතිරජනයෙන්) තද වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, දියෙහි ගිල්වා තබාන්නට අනුදනිමි".

34. එකල්හි සිවුරු රළු වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල-කළහ. "මහණෙනි, අතින් පෙළන්නට (පොඩි කරන්නට) අනුදනිමි".

35. තෙන ඛො පන සමයෙන භික්ඛූ අච්ඡින්නකානි ධාරෙන්ති[1] දන්තකාසාවානි. [මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: “සෙය්‍යථාපි ගිහී කාමභොගිනො” ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. “න භික්ඛවෙ අච්ඡින්නකානි චීවරානි ධාරෙතබ්බානි. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා”ති.][2]

36. අථ ඛො භගවා **රාජගහෙ යථාභිරන්තං*** විහරිත්වා යෙන **දක්ඛිණාගිරි** තෙන චාරිකං පක්කාමි. අද්දසා ඛො භගවා **මගධක්ඛෙත්තං** අච්චිබද්ධං[3] පාළිබද්ධං මරියාදබද්ධං සිඞ්ඝාටකබද්ධං. දිස්වාන ආයස්මන්තං **ආනන්දං** ආමන්තෙසි: “පස්සසි නො ත්වං ආනන්ද, මගධක්ඛෙත්තං අච්චිබද්ධං පාළිබද්ධං මරියාදබද්ධං සිඞ්ඝාටකබද්ධ”න්ති. “එවං භන්තෙ”ති. “උස්සහසි ත්වං ආනන්ද, භික්ඛූනං එවරූපානි චීවරානි සංවිදහිතු” න්ති. “උස්සහාමි භගවා”ති.

37. අථ ඛො භගවා දක්ඛිණාගිරිස්මිං යථාභිරන්තං විහරිත්වා පුනදෙව රාජගහං පච්චාගඤ්ඡි. අථ ඛො ආයස්මා ආනන්දො සම්බහුලානං භික්ඛූනං චීවරානි සංවිදහිත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: “පස්සතු මෙ භන්තෙ, භගවා චීවරානි සංවිදහිතානී”ති.[4] අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: “පණ්ඩිතො භික්ඛවෙ, ආනන්දො; මහාපඤ්ඤො භික්ඛවෙ, ආනන්දො යත්‍ර හි නාම මයා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානිස්සති, කුසිම්පි නාම කරිස්සති, අඩ්ඪකුසිම්පි නාම කරිස්සති, මණ්ඩලම්පි නාම කරිස්සති, අඩ්ඪමණ්ඩලම්පි නාම කරිස්සති, විවට්ටම්පි නාම කරිස්සති, අනුවිවට්ටම්පි නාම කරිස්සති, ගීවෙය්‍යකම්පි නාම කරිස්සති, ජඞ්ඝෙය්‍යකම්පි නාම කරිස්සති, බාහන්තම්පි නාම කරිස්සති. ඡින්නකඤ්ච[5] භවිස්සති සත්ථලූඛං සමණසාරුප්පං පච්චත්ථිකානඤ්ච අනභිජ්ඣිතං.[6] අනුජානාමි භික්ඛවෙ, ඡින්නකං සඞ්ඝාටිං, ඡින්නකං උත්තරාසඞ්ගං, ඡින්නකං අන්තරවාසක”න්ති.

38. අථ ඛො භගවා රාජගහෙ යථාභිරන්තං විහරිත්වා යෙන **වෙසාලි** තෙන චාරිකං පක්කාමි. අද්දසා[7] ඛො භගවා අන්තරා ච රාජගහං අන්තරා ච වෙසාලිං අද්ධානමග්ගපටිපන්නො සම්බහුලෙ භික්ඛූ චීවරෙහි උබ්භණ්ඩිතෙ[8] සීසෙපි චීවරභිසිං කරිත්වා ඛන්ධෙපි චීවරභිසිං කරිත්වා කටියාපි චීවරභිසිං කරිත්වා ආගච්ඡන්තෙ. දිස්වාන භගවතො එතදහොසි: “අති ලහුං ඛො ඉමෙ මොඝපුරිසා චීවරබාහුල්ලාය[9] ආවත්තා. යන්නූනාහං භික්ඛූනං චීවරෙ සීමං බන්ධෙය්‍යං. මරියාදං ඨපෙය්‍ය”න්ති.

---

1. “චීවරානි ධාරෙන්ති” ම ඡ සං.
2. “මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති සෙය්‍යථාපිනාම ගිහී කාමභොගිනොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. න භික්ඛවෙ අච්ඡින්නකානි චීවරානි ධාරෙතබ්බානි. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්සාති” ති පාඨො සීහලක්ඛර පොත්ථකෙසු.”
3. “අච්චිබන්ධං” ම ඡ සං. PTS. 4. “සංවිහිතානි” ම නු ප.
5. “ඡින්නකං” ම ඡ සං. 6. “අනභිච්ඡිතං” ම ඡ සං
7. “අද්දස” ම ඡ සං. PTS 8. උබ්භණ්ඩිකතෙ” සී.
9. “චීවරෙ බාහුල්ලාය” ම ඡ සං. PTS.

35. එකල්හි භික්ෂූහු කඩ නො කැපූ, දත් මෙන් කහට පැහැති, සිවුරු දරත්. මිනිස්සු "(මොහු) කාමභොගී වූ ගිහින් සේ" යි අවමන් කෙරෙත්. නින්‍දා කෙරෙත්. දොස් කියත්. "මහණෙනි, නො කැපූ සිවුරු නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුළා ඇවැත්වේය" යි වදාළසේක.

36. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කැමැති තාක් කල් වැඩ වාසය කොට දක්ෂිණාගිරිය බලා චාරිකාවෙහි වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ සතරැස් ලියදි බැන්ද වූ දිගින් හා පළලින් මහමියර බැන්ද වූ අතරතුර කුඩාමියර බැන්ද වූ සතරහන්දි බැන්ද වූ මගධක්ෂෙත්‍රය දුටුසේක. දැක, "ආනන්‍දය, තෙපි සතරැස් ලියදි බැන්ද වූ දිගින් හා පළලින් බැඳි මහමියර ඇත්තා වූ අතරතුර බැඳි කුඩා මියර ඇත්තා වූ බඳනා ලද සතරහන්දි ඇත්තා වූ මගධක්ෂෙත්‍රය දුටුහු දැ" යි ආයුෂ්මත් ආනන්‍ද තෙරුන් විචාළ සේක. "ස්වාමීනි, එසේ ය". "ආනන්‍දය, තෙපි භික්ෂූන්ට මෙබඳු වූ සිවුරු (සිවුරු මෙසේ කපා මැසීම) විධාන කරන්නට උත්සාහවත් වනු ද ?" "භාග්‍යවතුන් වහන්ස, උත්සාහවත් වෙමි"යි පිළිවදන් දුන්හ.

37. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දක්ෂිණාගිරියෙහි කැමැති තාක් කල් වැඩ වාසය කොට නැවත රජගහනුවරට පෙරළා වැඩි සේක. එකල්හි ආයුෂ්මත් ආනන්‍දස්ථවිරයන් වහන්සේ බොහෝ භික්ෂූන්ට සිවුරු විධාන කොට දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මා විසින් විධාන කරණ ලද සිවුරු බලා වදාරණ සේක්වා"යි සැලකළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදාන-යෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් අමතා "මහණෙනි, යමෙක් මා විසින් සැකෙවින් කියන ලද කාරණයෙහි අර්ථය විස්තර වශයෙන් දන්නේ ද, දිග පළල නුවා කෙළේ ද, හරස් නුවා කෙළේ ද, මහමැඩිලි කෙළේ ද, කුඩා මැඩිලි කෙළේ ද, වස් අත්ත කෙළේ ද, ඇල අතු කෙළේ ද, ගෙලපටි ඇල්ලීම කෙළේ ද, කෙණ්ඩපටි ඇල්ලීම කෙළේ ද, නුවා අතු නොහොත් බාහුව මත සිටින නුවා කෙළේ ද, (මෙසේ කිරීමෙන් සිවුර) කපන ලද්දේත් සැතින් රළු වූයේත් පැවිද්දන්ට සුදුසු වූයේත් පසමිතුරන් විසින් නො පතනලද්දේත් වූයේ ද, මහණෙනි, ඒ ආනන්‍ද තෙමේ පණ්ඩිත වේ. ඒ ආනන්‍ද තෙමේ මහ නුවණැත්තේ වේ. මහණෙනි, කඩ කැපූ සඟළසිවුර ද කඩ කැපූ උතුරු සඟසිවුර ද කඩ කැපූ අඳනා සිවුර ද අනුදනිමි" යි වදාළ සේක.

38. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කැමැති තාක් කල් වැඩ වාසය කොට වෙසාලි නගරය බලා චාරිකාවෙහි වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ රජගහනුවරටත් විසාලාමහනුවරටත් අතර වූ දීඝමාර්ගයට පිළිපන් සේක් සිවුරුපොදි ඔසොවා ගත් හිසෙහි ද සිවුරුබිසි කොට කරෙහි ද සිවුරුබිසි කොට උකුළෙහි ද සිවුරුබිසි කොට එන්නා වූ බොහෝ භික්ෂූන් දුටු සේක. දැක භාග්‍යවතුන් වහන්සේට "මේ හිස් පුරුෂයෝ ඉතා වහා චීවර බහුලත්වය පිණිස හැරුණාහු ය. මම භික්ෂූන්ට සිවුරෙහි සීමාවක් බඳින්නෙම් නම්, සිවුරෙහි මායිම් තබන්නෙම් නම්, යෙහෙකැ" යි සිත් වි ය

39. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන **වෙසාලී** තදවසරි. තත්‍ර සුදං භගවා වෙසාලියං විහරති **ගොතමකෙ චෙතියෙ.** තෙන ඛො පන සමයෙන භගවා සීතාසු හෙමන්තිකාසු රත්තීසු අන්තරට්ඨකාසු හිමපාතසමයෙ රත්තිං අජ්ඣොකාසෙ එකචීවරො නිසීදි. න භගවන්තං සීතං අහොසි. නික්ඛන්තෙ පඨමෙ යාමෙ සීතං භගවන්තං අහොසි. දුතියං භගවා චීවරං පාරුපි. න භගවන්තං සීතං අහොසි. නික්ඛන්තෙ මජ්ඣිමෙ යාමෙ සීතං භගවන්තං අහොසි. තතියං භගවා චීවරං පාරුපි. න භගවන්තං සීතං අහොසි. නික්ඛන්තෙ පච්ඡිමෙ යාමෙ උද්ධස්තෙ[1] අරුණෙ නන්දිමුඛියා රත්තියා සීතං භගවන්තං අහොසි. චතුත්ථං භගවා චීවරං පාරුපි. න භගවන්තං සීතං අහොසි. අථ ඛො භගවතො එතදහොසි: "යෙපි ඛො තෙ කුලපුත්තා ඉමස්මිං ධම්මවිනයෙ පබ්බජිතා සීතාලුකා සීතභීරුකා, තෙපි සක්කොන්ති තිචීවරෙන යාපෙතුං. යන්නූනාහං භික්ඛූනං චීවරෙ සීමං බන්ධෙය්‍යං, මරියාදං ඨපෙය්‍යං, තිචීවරං අනුජානෙය්‍ය" න්ති.

40. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "ඉධාහං භික්ඛවෙ, අන්තරා ච රාජගහං අන්තරා ච වෙසාලිං අද්ධානමග්ගපටිපන්නො අද්දසං සම්බහුලෙ භික්ඛූ චීවරෙහි උබ්භණ්ඩිතෙ සීසෙපි චීවරභිසිං කරිත්වා ඛන්ධෙපි චීවරභිසිං කරිත්වා කටියාපි චීවරභිසිං කරිත්වා ආගච්ඡන්තෙ. දිස්වාන මෙ එතදහොසි: 'අතිලහුං ඛො ඉමෙ මොඝපුරිසා චීවරබාහුල්ලාය ආවත්තා. යන්නූනාහං භික්ඛූනං චීවරෙ සීමං බන්ධෙය්‍යං, මරියාදං ඨපෙය්‍ය' න්ති.

41. "ඉධාහං භික්ඛවෙ, සීතාසු හෙමන්තිකාසු රත්තීසු අන්තරට්ඨකාසු හිමපාතසමයෙ රත්තිං අජ්ඣොකාසෙ එකචීවරො නිසීදිං. න මං සීතං අහොසි. නික්ඛන්තෙ පඨමෙ යාමෙ සීතං මං අහොසි. දුතියාහං චීවරං පාරුපිං. න මං සීතං අහොසි. නික්ඛන්තෙ මජ්ඣිමෙ යාමෙ සීතං මං අහොසි. තතියාහං චීවරං පාරුපිං. න මං සීතං අහොසි. නික්ඛන්තෙ පච්ඡිමෙ යාමෙ උද්ධස්තෙ අරුණෙ නන්දිමුඛියා රත්තියා සීතං මං අහොසි. චතුත්ථාහං චීවරං පාරුපිං. න මං සීතං අහොසි. තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි: 'යෙපි ඛො තෙ කුලපුත්තා ඉමස්මිං ධම්මවිනයෙ පබ්බජිතා සීතාලුකා[2] සීතභීරුකා, තෙපි සක්කොන්ති තිචීවරෙන යාපෙතුං. යන්නූනාහං භික්ඛූනං චීවරෙ සීමං බන්ධෙය්‍යං. මරියාදං ඨපෙය්‍යං. තිචීවරං අනුජානෙය්‍ය'න්ති. අනුජානාමි භික්ඛවෙ, තිචීවරං: දිගුණං සඞ්ඝාටිං, එකච්චියං උත්තරාසඞ්ගං, එකච්චියං අන්තරවාසක"න්ති.

42. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා** භික්ඛූ "භගවතා තිචීවරං අනුඤ්ඤාත"න්ති අඤ්ඤෙනෙව තිචීවරෙන ගාමං පවිසන්ති. අඤ්ඤෙනෙව තිචීවරෙන ආරාමෙ අච්ඡන්ති. අඤ්ඤෙනෙව තිචීවරෙන නහානං ඔතරන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ අතිරෙකචීවරං ධාරෙස්සන්තී"ති.

1. "උද්ධතෙ" P T S.   1 "ධම්මවිනයෙ සීතාලුකා" ම ඡ සං. P T S.

39. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් චාරිකා කරණ සේක් **විසාලාමහනුවරට** වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ එහි විසාලා මහනුවර **ගොතමක චෛත්‍යයෙහි** වැඩ වාසය කරත්. එකල්හි භාග්‍යවතුන් වහන්සේ හෙමන්ත ඍතුවෙහි නවම් මැදින් දෙමස අතර අට දිනයෙහි ශීතරාත්‍රීන්හි හිම වැටෙන කාලයෙහි රාත්‍රියෙහි එළිමහනෙහි එක් සිවුරක් ඇති සේක් හුන් සේක. භාග්‍යවතුන් වහන්සේට සීත නො වී ය. පෙරයම නික්ම ගිය කල්හි භාග්‍යවතුන් වහන්සේට සීත වී ය. භාග්‍යවතුන් වහන්සේ දෙවන සිවුරක් පෙරවූ සේක. භාග්‍යවතුන් වහන්සේට සීත නො වී ය. මැදියම නික්ම ගිය කල්හි භාග්‍යවතුන් වහන්සේට සීත වී ය. භාග්‍යවතුන් වහන්සේ තෙවන සිවුරක් පෙරවූ සේක. භාග්‍යවතුන් වහන්සේට සීත නො වී ය. පශ්චිම යාමය නික්ම ගිය කල්හි අරුණ නැගි කල්හි රාත්‍රිය පාන් වූ කල භාග්‍යවතුන් වහන්සේට සීත වී ය. භාග්‍යවතුන් වහන්සේ සිවුවන සිවුරක් පෙරවූ සේක. භාග්‍යවතුන් වහන්සේට සීත නො වී ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට "මේ ශාසනයෙහි පැවිදි වූ යම් ඒ කුලපුත්‍රයෝ ශීතප්‍රකෘතික (=පියෙවින් ම ශීතයෙන් පෙළෙන්නෝ) වූවාහු සීතයට බිය වන සුලු වෙත් ද, ඔහු ද තුන්-සිවුරෙන් යැපෙන්නට පොහොසත් වෙති. මම භික්ෂූන්ට සිවුරෙහි සීමාවක් බඳින්නෙම් නම්, සිවුරෙහි ඉමක් තබන්නෙම් නම්, තුන් සිවුරක් අනුදන්නෙම් නම්, යෙහෙකැ" යි සිත් වී ය.

40. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, මම මෙහි රජගහ-නුවරටත් විසාලාමහනුවරටත් අතර දීඝමාර්ගයට පිළිපන්නෙම්, සිවුරු පොදි ඔසොවා ගත් හිසෙහි ද සිවුරුබිසි කොට, කරෙහි ද සිවුරුබිසි කොට, උකුළෙහි ද සිවුරුබිසි කොට, එන්නා වූ බොහෝ භික්ෂූන් දිටිමි. දැකීමෙන් මට 'මේ හිස් පුරුෂයෝ ඉතා වහා චීවරබහුලත්වය පිණිස හැරුණාහු ය. මම භික්ෂූන්ට සිවුරෙහි සීමාවක් බඳින්නෙම් නම්, සිවුරෙහි ඉමක් තබන්නෙම් නම්, යෙහෙකැ"යි සිත් වී ය.

41. "මහණෙනි, මම මෙහි හෙමන්තඍතුවෙහි නවම් මැදින් දෙමස අතර අටදිනයෙහි ශීතරාත්‍රීන්හි හිම වැටෙන කාලයෙහි රාත්‍රියෙහි එළි-මහනෙහි එක් සිවුරක් ඇති ව හුන්නෙමි. මට සීත නො වී ය. පෙරයම ඉක්ම ගිය කල්හි මට සීත වී ය. මම දෙවන සිවුරක් පෙරවීමි. මට සීත නො වී ය. මැදියම ඉක්ම ගිය කල්හි මට සීත වී ය. මම තෙවන සිවුරක් පෙරවීමි. මට සීත නො වී ය. පශ්චිමයාමය නික්ම ගිය කල්හි අරුණ නැගි කල්හි රෑ එළි වූ කල මට සීත වී ය. මම සිවුවන සිවුරක් පෙරවීමි. මට සීත නො වී ය. මහණෙනි, ඒ මට 'මේ සාසනයෙහි පැවිදි වූ යම් ඒ කුලපුත්‍රයෝ ශීත-ප්‍රකෘතික වූවාහු සීතයට බිය වන සුලු වෙත් ද, ඔහු ද තුන්සිවුරෙන් යැපෙන්නට පොහොසත් වෙති. මම භික්ෂූන්ට සිවුරෙහි සීමාවක් බඳින්නෙම් නම්, සිවුරෙහි ඉමක් තබන්නෙම් නම්, තුන් සිවුරක් අනුදන්නෙම් නම්, යෙහෙකැ'යි සිත් වී ය. මහණෙනි, මම දෙපටක් ඇති සඟලසිවුර ද, එක් පටක් ඇති උතුරුසඟසිවුර ද, එක් පටක් ඇති අඳනා සිවුර ද අනුදනිමි"යි වදාළසේක.

42. එකල්හි **සවග** මහණහු "භාග්‍යවතුන් වහන්සේ විසින් තුන් සිවුරක් අනුදන්නා ලද"යි අන් තුන්සිවුරකින් ම ගමට වදිත්. අන් තුන් සිවුරකින් ම ආරාමයෙහි සිටිත්. අන් තුන්සිවුරකින් ම නැමට බසිත්. අල්පෙච්ඡ වූ යම් ඒ භික්ෂූහු වෙත් ද, ඒ භික්ෂූහු "කෙසේ නම් සවග මහණහු වැඩි සිවුරු දරත් ද"යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්.

43. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ අතිරෙකචීවරං ධාරෙතබ්බං. යො ධාරෙය්‍ය, යථා ධම්මො කාරෙතබ්බො" ති.

44. තෙන ඛො පන සමයෙන ආයස්මතො **ආනන්දස්ස** අතිරෙකචීවරං උප්පන්නං හොති. ආයස්මා ච ආනන්දො තං චීවරං ආයස්මතො **සාරිපුත්තස්ස** දාතුකාමො හොති. ආයස්මා ච සාරිපුත්තො **සාකෙතෙ** විහරති. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි: "භගවතා පඤ්ඤත්තං: 'න අතිරෙක චීවරං ධාරෙතබ්බ'න්ති. ඉදං ච මෙ අතිරෙකචීවරං උප්පන්නං. අහඤ්චිමං චීවරං ආයස්මතො සාරිපුත්තස්ස දාතුකාමො. ආයස්මා ච සාරිපුත්තො සාකෙතෙ විහරති. කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බ" න්ති. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි. "කීව චිරං පනානන්ද, සාරිපුත්තො ආගච්ඡිස්සතී" ති. "නවමං වා භගවා, දිවසං දසමං වා" ති.

45. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, දසාහපරමං අතිරෙකචීවරං ධාරෙතු" න්ති.

46. තෙන ඛො පන සමයෙන භික්ඛූනං අතිරෙකචීවරං උප්පජ්ජති. අථ ඛො භික්ඛූනං එතදහොසි: "කථන්නු ඛො අතිරෙකචීවරෙ පටිපජ්ජිතබ්බ" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අතිරෙකචීවරං විකප්පෙතු" න්ති.

47. අථ ඛො භගවා **වෙසාලියං** යථාභිරන්තං විහරිත්වා යෙන **බාරාණසී** තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන බාරාණසී තදවසරි. තත්‍ර සුදං භගවා බාරාණසියං විහරති **ඉසිපතනෙ මිගදායෙ**.

48. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො අන්තරවාසකො ඡිද්දො හොති. අථ ඛො තස්ස භික්ඛුනො එතදහොසි: "භගවතා තිචීවරං අනුඤ්ඤාතං: දිගුණා සඞ්ඝාටි, එකච්චියො උත්තරාසඞ්ගො, එකච්චියො අන්තරවාසකො. අයඤ්ච මෙ අන්තරවාසකො ඡිද්දො. යන්නූනාහං අග්ගළං අච්ඡුපෙය්‍යං, සමන්තතො දුපට්ටං භවිස්සති මජ්ඣෙ එකච්චිය" න්ති. අථ ඛො සො භික්ඛු අග්ගළං අච්ඡුපෙසි. අද්දසා ඛො භගවා සෙනාසන චාරිකං ආහිණ්ඩන්තො තං භික්ඛුං අග්ගළං අච්ඡුපෙන්තං. දිස්වාන යෙන සො භික්ඛු, තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොච: "කිං ත්වං භික්ඛු කරොසී" ති. "අග්ගළං භගවා, අච්ඡුපෙමී" ති. "සාධු, සාධු, භික්ඛු, සාධු ඛො ත්වං භික්ඛු, අග්ගළං අච්ඡුපෙසී" ති.

49. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, අහතානං දුස්සානං අහතකප්පානං දිගුණං සඞ්ඝාටිං, එකච්චියං උත්තරාසඞ්ගං, එකච්චියං අන්තරවාසකං, උතුද්ධටානං දුස්සානං චතුග්ගුණං සඞ්ඝාටිං, දිගුණං උත්තරාසඞ්ගං, දිගුණං අන්තරවාසකං, පංසුකූලෙ යාවදත්ථං. පාපණිකෙ උස්සාහො කරණීයො. අනුජානාමි භික්ඛවෙ අග්ගළං, තුන්නං, ඔවට්ටිකං, කණ්ඩුසකං, දළ්හීකම්ම" න්ති.

43. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූසේක: "මහණෙනි, අතිරේක සිවුරක් (නො ඉටූ නො විකැප්පූ සිවුරක්) නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, ඇවැත් පරිදි කරවිය යුතු ය."

44. එකල්හි ආයුෂ්මත් **ආනන්ද** ස්ථවිරයන් වහන්සේට අතිරේක සිවුරක් ලැබුනේ වේ. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද ඒ සිවුර ආයුෂ්මත් **ශාරීපුත්‍ර** ස්ථවිරයන් වහන්සේට දෙනු කැමැත්තේ වේ. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ද **සාකේත**නුවර වසත්. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'අතිරේක සිවුරක් නො දැරිය යුතු ය' යි පණවන ලද්දේ ය. මට ද මේ අතිරේක සිවුරක් ලැබුනේ ය. මම ද මේ සිවුර ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේට දෙනු කැමැත්තේ වෙමි. ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ ද සාකේතනුවර වසත්. මා විසින් කෙසේ පිළිපැදිය යුතු දැ" යි මේ සිත් වි ය. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "ආනන්දය, කෙතෙක් දවසකින් ශාරීපුත්‍ර තෙමේ එන්නේ ද ?" "භාග්‍යවතුන් වහන්ස, නවවැනි හෝ දසවැනි දිනයෙහි එන්නේ ය".

45. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් ඇමතූසේක: "මහණෙනි, දස දිනක් අවසන් කොට ඇති කාලයක් අතිරේක (වැඩි) සිවුරක් දරන්ට අනුදනිමි".

46 **එසමයෙහි** භික්ෂූන්ට අතිරේක සිවුරක් ලැබේ. එකල්හි භික්ෂූන්ට "අතිරේක සිවුරෙහි කෙසේ නම් පිළිපැදිය යුතු දැ" යි සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, අතිරේක සිවුර විකපන්නට (අනෙකකු හට භාරදෙන්නට) අනුදනිමි".

47. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **විසාලා**මහනුවර කැමැති තාක් කල් වැඩ වාසය කොට **බරණැස්**නුවර බලා චාරිකාවෙහි වැඩිසේක. පිළිවෙළින් චාරිකා කරණසේක් බරණැස්නුවරට පැමිණිසේක. භාග්‍යවතුන් වහන්සේ එහි බරණැස්නුවර **මෘගදාය** නම් වූ **ඉසිපතනයෙහි** වැඩ වාසය කරත්.

48. එකල්හි එක්තරා මහණකුගේ අඳනය සිදුරු වූයේ වේ. එවිට ඒ මහණහුට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'දෙපටක් ඇති සඟළසිවුර එක් පටක් ඇති උතුරුසඟසිවුර එක්පටක් ඇති අඳනා සිවුර' ය යි තුන් සිවුරක් අනුදන්නා ලද්දේ ය. මාගේ මේ අඳනා සිවුර සිදුරු වි ය. මම අණ්ඩ ලන්නෙම් නම්, හාත්පස (වටේ) දෙපට වන්නේ ය. මැද එක්පට වන්නේ ය" යි සිත් වි ය. එකල්හි ඒ මහණතෙමේ අණ්ඩයක් ඇල්ලී ය. සෙනාසන චාරිකාවෙහි වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේ අණ්ඩය ලන්නා වූ ඒ මහණහු දුටු සේක. දැක ඒ මහණහු වෙතට එළඹියහ. එළඹ "මහණ, තෝ කුමක් කෙරෙහි දැ" යි ඒ මහණහු විචාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, අණ්ඩයක් ලමි". "මහණ ඉතා මැනවි. මහණ, ඔබ අණ්ඩයක් ලන්නේ යහපත් ය" වදාළහ.

49. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට "මහණෙනි, අළුත් වස්ත්‍රයෙන් හා වරක් සේදූ වස්ත්‍රයෙන් කළ දෙපටක් ඇති සඟළසිවුර, එක් පටක් ඇති උතුරුසඟසිවුර, එක් පටක් ඇති අඳනා සිවුර ද, පුරාණවස්ත්‍රයෙන් කළ සිවුපටක් ඇති සඟළසිවුර, දෙපටක් ඇති උතුරුසඟසිවුර, දෙපටක් ඇති අඳනා සිවුර ද, පංසුකූලයෙහි කැමැති පමණ පට ඇති සිවුර ද, අනුදනිමි. කඩ පිලෙන් අවුලා ගත් වස්ත්‍රයෙන් කළ සිවුරු දැරීමෙහි උත්සාහය කට යුතු ය. මහණෙනි, අණ්ඩ ලීම, නූලෙන් එලලීම, වැටි කොට මැසීම, මුදුපත් මැසීම (කැලි පිට කැලි ඇල්ලීම), දැඩි කිරීම අනුදනිමි".

50. අථ ඛො භගවා බාරාණසියං යථාභිරන්තං විහරිත්වා යෙන **සාවත්ථි** තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි තදවසරි. තත්‍ර සුදං භගවා සාවත්ථියං විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ.

51. අථ ඛො **විසාඛා මිගාරමාතා** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො විසාඛං මිගාරමාතරං භගවා ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි.

52. අථ ඛො විසාඛා මිගාරමාතා භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා භගවන්තං එතදවොච: "අධිවාසෙතු මෙ භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා" ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො විසාඛා මිගාරමාතා භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

53. තෙන ඛො පන සමයෙන තස්සා රත්තියා අච්චයෙන චාතුද්දීපිකො මහාමෙඝො පාවස්සි. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "යථා භික්ඛවෙ, ජෙතවනෙ වස්සති, එවං චතුසු දීපෙසු වස්සති. ඔවස්සාපෙථ භික්ඛවෙ, කායං. අයං පච්ඡිමකො චාතුද්දීපිකො මහාමෙඝො" ති. "එවං භන්තෙ" ති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා නික්ඛිත්තචීවරා කායං ඔවස්සාපෙන්ති.

54. අථ ඛො විසාඛා මිගාරමාතා පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා දාසිං ආණාපෙසි: "ගච්ඡ ජෙ, ආරාමං ගන්ත්වා කාලං ආරොචෙහි: කාලො භන්තෙ, නිට්ඨිතං භත්ත" න්ති. "එවං අය්‍යෙ" ති ඛො සා දාසී විසාඛාය මිගාරමාතුයා පටිස්සුත්වා ආරාමං ගන්ත්වා අද්දස භික්ඛූ නික්ඛිත්තචීවරෙ කායං ඔවස්සාපෙන්තෙ. දිස්වාන "නත්ථි ආරාමෙ භික්ඛූ. ආජීවකා කායං ඔවස්සාපෙන්තී"ති යෙන විසාඛා මිගාරමාතා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා විසාඛං මිගාරමාතරං එතදවොච: "නත්ථය්‍යෙ, ආරාමෙ භික්ඛූ. ආජීවකා කායං ඔවස්සාපෙන්තී" ති.

55. අථ ඛො විසාඛාය මිගාරමාතුයා පණ්ඩිතාය වියත්තාය මෙධාවිනියා එතදහොසි: "නිස්සංසයං ඛො අය්‍යා නික්ඛිත්තචීවරා කායං ඔවස්සාපෙන්ති. සායං බාලා මඤ්ඤිත්ථ: නත්ථි ආරාමෙ භික්ඛූ. ආජීවකා කායං ඔවස්සාපෙන්තී" ති. පුන දාසිං ආණාපෙසි: "ගච්ඡ ජෙ, ආරාමං ගන්ත්වා කාලං ආරොචෙහි: කාලො භන්තෙ, නිට්ඨිතං භත්ත" න්ති.

56. අථ ඛො තෙ භික්ඛූ ගත්තානි සීතිං කරිත්වා[1] කල්ලකායා චීවරානි ගහෙත්වා යථාවිහාරං පවිසිංසු.

57. අථ ඛො සා දාසී ආරාමං ගන්ත්වා භික්ඛූ අපස්සන්තී "නත්ථි ආරාමෙ භික්ඛූ. සුඤ්ඤො ආරාමො" ති යෙන විසාඛා මිගාරමාතා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා විසාඛං මිගාරමාතරං එතදවොච: "නත්ථය්‍යෙ, ආරාමෙ භික්ඛූ. සුඤ්ඤො ආරාමො" ති.

1. "සීතීකරිත්වා" සී.

50. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **බරණැස්**නුවර කැමැති තාක් කල් වැඩ වාසය කොට **සැවැත්**නුවර බලා චාරිකාවෙහි වැඩි සේක. පිළිවෙළින් චාරිකා කරණ සේක් සැවැත්නුවරට වැඩියාහ. භාග්‍යවතුන් වහන්සේ එහි සැවැත්නුවර **ජේතවන**යෙහි වූ **අනේපිඬු**සිටුහුගේ ආරාමයෙහි වැඩ වාසය කෙරෙත්.

51. එකල්හි **මෘගාරිමාතෘ** වූ **විශාඛා** තොමෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියා ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නී ය. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන්නා වූ මෘගාරිමාතෘ විශාඛාවට දැහැමිකතාවෙන් කරුණු දැක්වූහ. (ඈය එහි) සමාදන් කරවූහ. තියුණු කරවූහ. සතුටු කරවූහ.

52. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විසින් කරුණු දක්වන ලද සමාදන් කරවන ලද තියුණු කරවන ලද සතුටු කරවන ලද මෘගාරිමාතෘ විශාඛා තොමෝ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා සමග හෙටට මාගේ බත ඉවසන සේක්වා" යි කීවා ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූ සේක. ඉක්බිති මෘගාරිමාතෘ විශාඛා තොමෝ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට නික්ම ගියා ය.

53. එකල්හි ඒ රැය ඉක්ම ගිය පසු සිව්දිවයිනට එක පැහැර වස්නා වූ මහත් මෙඝයෙක් වැස්සේ ය. ඒ වේලෙහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, ජේතවනයට වසින්නා සේ සිව්දිවයිනෙහි වසියි. මහණෙනි, කය තෙමවූ. මේ සිව්දිවයිනට එකපැහැර වස්නා වූ අන්තිම මහාමෙඝය"යි වදාළ සේක. "ස්වාමීනි, එසේ ය" යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී බහා තැබූ සිවුරු ඇත්තෝ කය තෙමත්.

54. ඉක්බිති මෘගාරිමාතෘ විශාඛාතොමෝ ප්‍රණීත වූ කෑ යුතු බිදිය යුතු දෙය පිළියෙළ කරවා "කෙල්ල, යව. ආරාමයට ගොස් 'ස්වාමීනි, කල් පැමිණ තිබේ. බත් නිමියේ' යි කල් දන්වා ලව" යි දැසියට අණ කළා ය. "ආර්යාවෙනි, එසේ ය" යි ඒ දැසිය මෘගාරිමාතෘ විශාඛාවට පිළිවදන් දී ආරාමයට ගොස් බැහැර කළ සිවුරු ඇති ව කය තෙමන්නා වූ භික්ෂූන් දුටුවා ය. දැක "ආරාමයෙහි භික්ෂූහු නැත. ආජීවකයෝ කය තෙමති" යි (සිතා) මෘගාරිමාතෘ විශාඛාව වෙත ගියා ය. ගොස් 'ආර්යාවෙනි, ආරාමයෙහි භික්ෂූහු නැත. ආජීවකයෝ කය තෙමති" යි මෘගාරිමාතෘ විශාඛාවට කීවා ය.

55. එකල්හි පණ්ඩිත වූ ව්‍යක්ත වූ නුවණැති මෘගාරිමාතෘ විශාඛාවට නිසැකයෙන් ම ආර්යයන් වහන්සේලා බැහැර කළ සිවුරු ඇති ව කය තෙමත්. ඒ මේ මෝඩ ගෑණි 'ආරාමයෙහි භික්ෂූහු නැත. ආජීවකයන් වැස්සෙන් කය තෙමති'යි සිතුවා ය" යි අදහස් වි ය. නැවත, "කෙල්ල, යව. ආරාමයට ගොස් 'ස්වාමීනි, කල් පැමිණ තිබේ. බත් නිමියේ' යි කල් දන්වා ලව" යි දැසියට අණ කළා ය.

56. ඉක්බිති ඒ භික්ෂූහු සිරුරු සිහිල් කොට සුවපත් සිරුරු ඇත්තාහු සිවුරු ගෙණ තමතමන් වසන වෙහෙරට පිවිසියාහු ය.

57. නැවත ඒ දැසිය ආරාමයට ගොස් භික්ෂූන් නො දක්නී "ආරාමයෙහි භික්ෂූහු නැත. ආරාමය සිස් ය" යි (සිතා) මෘගාරිමාතෘ විශාඛාව වෙත ගියා ය. ගොස් මෘගාරිමාතෘ විශාඛාවට "ආර්යාවෙනි, ආරාමයෙහි භික්ෂූහු නැත. ආරාමය සිස් ය" යි කීවා ය.

58. අථ ඛො විසාඛාය මිගාරමාතුයා පණ්ඩිතාය වියත්තාය මෙධාවිනියා එතදහොසි: "නිස්සංසයං ඛො අය්‍යා ගත්තානි සීතිං කරිත්වා කල්ලකායා චීවරානි ගහෙත්වා යථාවිහාරං පවිට්ඨා. සායං බාලා මඤ්ඤිත්ථ: නත්ථි ආරාමෙ භික්ඛූ. සුඤ්ඤො ආරාමො" ති. පුන දාසිං ආණාපෙසි, "ගච්ඡ ජෙ, ආරාමං ගන්ත්වා කාලං ආරොචෙහි: කාලො භන්තෙ නිට්ඨිතං භත්ත"න්ති.

59. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "සන්නහථ[1] භික්ඛවෙ පත්තචිවරං. කාලො භත්තස්සා" ති. "එවං භන්තෙ" ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං.

60. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙව **ජෙතවනෙ** අන්තරහිතො විසාඛාය මිගාරමාතුයා කොට්ඨකෙ පාතුරහොසි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ සද්ධිං භික්ඛුසඞ්ඝෙන.

61. අථ ඛො විසාඛා මිගාරමාතා "අච්ඡරියං වත භො! අබ්භුතං වත භො! තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා. යත්‍ර හි නාම ජණ්ණුකමත්තෙසුපි ඔඝෙසු වත්තමානෙසු[2] කටිමත්තෙසුපි ඔඝෙසු වත්තමානෙසු න හි නාම එකභික්ඛුස්සපි පාදානි වා[3] චීවරානි වා අල්ලානි භවිස්සන්ති"ති හට්ඨා උදග්ගා බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං එකමන්තං නිසීදි.

62. එකමන්තං නිසින්නා ඛො විසාඛා මිගාරමාතා භගවන්තං එතදවොච: "අට්ඨාහං භන්තෙ භගවන්තං වරානි යාචාමී" ති. "අතික්කන්තවරා ඛො විසාඛෙ, තථාගතා" ති. "යානි ච භන්තෙ කප්පියානි යානි ච අනවජ්ජානී" ති. "වදෙහි විසාඛෙ" ති. "ඉච්ඡාමහං භන්තෙ සඞ්ඝස්ස යාවජීවං වස්සිකසාටිකං දාතුං, ආගන්තුකභත්තං දාතුං, ගමිකභත්තං දාතුං, ගිලානභත්තං දාතුං, ගිලානුපට්ඨාකභත්තං දාතුං, ගිලානභෙසජ්ජං දාතුං, ධුවයාගුං දාතුං, භික්ඛුනීසඞ්ඝස්ස උදකසාටිකං දාතු" න්ති.

63. "කිං පන ත්වං විසාඛෙ, අත්ථවසං සම්පස්සමානා තථාගතං අට්ඨ වරානි යාචසී" ති. "ඉධාහං භන්තෙ දාසිං ආණාපෙසිං: 'ගච්ඡ ජෙ, ආරාමං. ගන්ත්වා කාලං ආරොචෙහි: කාලො භන්තෙ, නිට්ඨිතං භත්ත' න්ති. අථ ඛො සා භන්තෙ දාසී ආරාමං ගන්ත්වා අද්දස භික්ඛූ නික්ඛිත්තචීවරෙ කායං ඔවස්සාපෙන්තෙ. දිස්වාන 'නත්ථි ආරාමෙ භික්ඛූ. ආජීවකා කායං ඔවස්සාපෙන්ති' ති යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං එතදවොච: 'නත්ථය්‍ය, ආරාමෙ භික්ඛූ. ආජීවකා කායං ඔවස්සාපෙන්ති'ති. අසුචි භන්තෙ නග්ගියං. ජෙගුච්ඡං. පටික්කූලං. ඉමාහං භන්තෙ අත්ථවසං සම්පස්සමානා ඉච්ඡාමි සඞ්ඝස්ස යාවජීවං වස්සිකසාටිකං දාතුං.

64. "පුන ච පරං භන්තෙ ආගන්තුකො භික්ඛු න වීථිකුසලො න ගොචරකුසලො කිලන්තො පිණ්ඩාය චරති. සො මෙ ආගන්තුකභත්තං භුඤ්ජිත්වා වීථිකුසලො ගොචරකුසලො අකිලන්තො පිණ්ඩාය චරිස්සති. ඉමාහං භන්තෙ අත්ථවසං සම්පස්සමනා ඉච්ඡාමි සඞ්ඝස්ස යාවජීවං ආගන්තුකභත්තං දාතුං.

1. "සන්නහථ" ම ඡ සං. 2. "පවත්තමානෙසු" ම ඡ සං. PTS.
3. "පාදවා" ම ඡ සං. PTS

58. එකල්හි පණ්ඩිත වූ ව්‍යක්ත වූ නුවණැති මෘගාරිමාතෘ විශාඛාවට "නිසැකයෙන් ම ආර්‍ය්‍යයන් වහන්සේලා සිරුරු සිහිල් කොට සුව පත් සිරුරු ඇත්තාහු සිවුරු ගෙණ තමතමන් වසන වෙහෙරට පිවිසියෝ ය. ඒ මේ මෝඩ ගෑණිය 'ආරාමයෙහි භික්ෂූහු නැත. ආරාමය සි ස්ය' යි සිතූ ය" යි අදහස් වි ය. නැවත "කෙල්ල යව, ආරාමයට ගොස් 'ස්වාමීනි, කල් පැමිණ තිබේ. බත් නිමියේ ය' යි කල් දන්වා ලව" යි දාසියට අණ කළා ය.

59. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, බතට කාලය යි. සිවුරු සකස් කර ගණිවු" යි වදාළ සේක. "ස්වාමීනි, එසේය"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

60. අනතුරු ව භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැද පොරොවා පාසිවුරු ගෙණ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන්නා සේ දිගු කළ අතක් හකුළන්නා සේ ජේතවනයෙහි නො පෙණී ගිය සේක් මෘගාරි-මාතෘ විශාඛාවගේ වාහල්කඩ පහළ වූ සේක. භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා සමග පැණවූ අසුනෙහි වැඩහුන් සේක.

61. ඉක්බිති මෘගාරිමාතෘ විශාඛා තොමෝ "පින්වත්නි, තථාගතයන් වහන්සේගේ ඒ මහත් සෘද්ධි ඇති බව මහත් තෙදැති බව ආශ්චර්‍ය්‍යයෙක. පුදුමයෙක. දණ පමණ ජල ගැල්ම පවත්නා කල්හි ද උකුළ පමණ ජලගැල්ම පවත්නා කල්හි ද එක් භික්ෂුනමකගේත් පාදයෝ හෝ සිවුරු හෝ නො තෙමුනාහු වෙත් ය" යි සතුටු වූවා ඔදවැඩි වූවා බුද්ධප්‍රමුඛභික්ෂුසඞ්ඝයා ප්‍රණීත වූ කෑ යුතු දෙයින් බිදිය යුතු දෙයින් සියතින් සතප්පා පවරා වළඳා අවසන් කළ පාත්‍රයෙන් බැහැර කළ අත් ඇති භාග්‍යවතුන් වහන්සේ වෙත පසෙක හුන්නී ය.

62. පසෙක හුන්නා වූ මෘගාරිමාතෘ විශාඛා තොමෝ "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ වෙතින් වර අටක් ඉල්ලමි" යි භාග්‍යවතුන් වහන්සේට සැළ කළා ය. "විශාඛාව, තථාගතයෝ (සත්‍රීන්ට දිය යුතු) වර ඉක්මවූවෝ ය." "ස්වාමීනි, යමක් කැප ද, යමක් නිදෙස් ද (එබඳු වර අටක් ඉල්ලමි.)" විශාඛාවෙනි, කියව". "ස්වාමීනි, මම දිවිහිමි කොට සඞ්ඝයාහට වැසිසළු දෙන්නට, ආගන්තුකබත් දෙන්නට, ගමිකබත් දෙන්නට, ගිලන්බත් දෙන්නට, ගිලානොපස්ථායකබත් දෙන්නට, ගිලන්බෙහෙත් දෙන්නට, නිතිකැඳ දෙන්නට, මෙහෙණසඞනට දියසළු දෙන්නට, කැමැත්තෙමි" යි සැළකළා ය.

63. "විශාඛාවෙනි, තී කිනම් කරුණක් දක්නී තථාගතයන් වෙතින් වර අටක් ඉල්වහි ද ?". "ස්වාමීනි, මම මෙහි 'කෙල්ල, යව, ආරාමයට ගොස් 'ස්වාමීනි, කල් පැමිණ තිබේ. බත් නිමියේ' යි කල් දන්වා ලව' යි දාසියට අණ කෙළෙමි. ඉක්බිති ස්වාමීනි, ඒ දාසිය අරාමයට ගොස් බැහැර කළ සිවුරු ඇති ව වැසිදියෙන් කය තෙමන්නා වූ භික්ෂූන් දුටුවා ය. දැක 'ආරමයෙහි භික්ෂූහු නැත. ආජීවකයන් කය තෙමති' යි (සිතා) මා වෙත පැමිණියා ය. පැමිණ 'ආර්‍ය්‍යාවෙනි, ආරාමයෙහි භික්ෂූහු නැත. ආජීවකයන් කය තෙමති' යි මට සැළකළා ය. ස්වාමීනි, නග්නභාවය නො හොබී. ලජ්ජා සහිත ය. පිළිකුල් ය. ස්වාමීනි, මම මේ කරුණ දක්නී දිවි හිමි කොට සඞ්ඝයාහට වැසිසළු දෙන්නට කැමැත්තෙමි.

64. "නැවත ද, ස්වාමීනි, ආගන්තුකභික්ෂු තෙමේ (මෙහි) වීථින්හි දක්ෂ නො වූයේ ගොචරස්ථානයන්හි දක්ෂ නො වූයේ විඩා පත් වූයේ පිඬු පිණිස හැසිරේ. ඒ භික්ෂු තෙමේ මාගේ ආගන්තුකබත වළඳා වීථින්හි දක්ෂ (පුරුදු) වූයේ ගොචරස්ථානයන්හි දක්ෂ වූයේ (යා යුතු නො යා යුතු තැන් දන්නේ) විඩාපත් නො වූයේ පිඬු පිණිස හැසිරෙන්නේ ය. ස්වාමීනි, මම මේ කාරණය දක්නී දිවි ඇති තාක් සඞ්ඝයාහට ආගන්තුකබත් දෙන්නට කැමැත්තෙමි.

65. “පුන ච පරං භන්තෙ, ගමිකො භික්ඛු අත්තනො භත්තං පරියෙසමානො සත්ථා වා විහායිස්සති. යත්ථ වා වාසං ගන්තුකාමො භවිස්සති, තත්ථ විකාලෙ උපගච්ඡිස්සති. කිලන්තො අද්ධානං ගමිස්සති. සො මෙ ගමිකභත්තං භුඤ්ජිත්වා සත්ථා න විහායිස්සති. යත්ථ වාසං ගන්තුකාමො භවිස්සති, තත්ථ කාලෙන[1] උපගච්ඡිස්සති. අකිලන්තො අද්ධානං ගමිස්සති. ඉමාහං භන්තෙ, අත්ථවසං සම්පස්සමානා ඉච්ඡාමි සඞ්ඝස්ස යාවජීවං ගමිකභත්තං දාතුං.

66. “පුන ච පරං භන්තෙ, ගිලානස්ස භික්ඛුනො සප්පායානි භොජනානි අලභන්තස්ස ආබාධො වා අභිවඩ්ඪිස්සති. කාලකිරියා වා භවිස්සති. තස්ස මෙ ගිලානභත්තං භුත්තස්ස ආබාධො නාභිවඩ්ඪිස්සති. කාලකිරියා න භවිස්සති. ඉමාහං භන්තෙ, අත්ථවසං සම්පස්සමානා ඉච්ඡාමි සඞ්ඝස්ස යාවජීවං ගිලානභත්තං දාතුං.

67. “පුන ච පරං භන්තෙ, ගිලානුපට්ඨාකො භික්ඛු අත්තනො භත්තං පරියෙසමානො ගිලානස්ස උස්සූරෙ භත්තං නීහරිස්සති. භත්තච්ඡෙදං කරිස්සති. සො මෙ ගිලානුපට්ඨාකභත්තං භුඤ්ජිත්වා ගිලානස්ස කාලෙන භත්තං නීහරිස්සති. භත්තච්ඡෙදං න කරිස්සති. ඉමාහං භන්තෙ, අත්ථවසං සම්පස්සමානා ඉච්ඡාමි සඞ්ඝස්ස යාවජීවං ගිලානුපට්ඨාකභත්තං දාතුං.

68. “පුන ච පරං භන්තෙ ගිලානස්ස භික්ඛුනො සප්පායානි භෙසජ්ජානි අලභන්තස්ස ආබාධො වා අභිවඩ්ඪිස්සති. කාලකිරියා වා භවිස්සති. තස්ස මෙ ගිලානභෙසජ්ජං පරිභුත්තං ආබාධො නාභිවඩ්ඪිස්සති. කාලකිරියා න භවිස්සති. ඉමාහං භන්තෙ ? අත්ථවසං සම්පස්සමානා ඉච්ඡාමි සඞ්ඝස්ස යාවජීවං ගිලානභෙසජ්ජං දාතුං.

69. “පුන ච පරං භන්තෙ භගවතා **අන්ධකවින්දෙ** දසානිසංසෙ සම්පස්සමානෙන යාගු අනුඤ්ඤාතා. ත්‍යාහං භන්තෙ, ආනිසංසෙ සම්පස්සමානා ඉච්ඡාමි සඞ්ඝස්ස යාවජීවං ධුවයාගුං දාතුං.

70. “ඉධ භන්තෙ භික්ඛුනියො **අචිරවතියා** නදියා වෙසියාහි සද්ධිං නග්ගා එකතිත්ථෙ නහායන්ති. තා භන්තෙ වෙසියො භික්ඛුනියො උප්පණ්ඩෙසුං: කිං නු ඛො නාම තුම්හාකං අය්‍යෙ, දහරානං දහරානං[2] බ්‍රහ්මචරියං චිණ්ණෙන ? නනු නාම කාමා පරිභුඤ්ජිතබ්බා. යදා ජිණ්ණා භවිස්සථ[3], තදා බ්‍රහ්මචරියං චරිස්සථ. එවං තුම්හාකං උභො අත්ථා පරිග්ගහිතා භවිස්සන්තී’ ති. තා භන්තෙ, භික්ඛුනියො වෙසියාහි උප්පණ්ඩියමානා මඞ්කු අහෙසුං. අසුචි භන්තෙ, මාතුගාමස්ස නග්ගියං ජෙගුච්ඡං. පටික්කූලං. ඉමාහං භන්තෙ අත්ථවසං සම්පස්සමානා ඉච්ඡාමි භික්ඛුනීසඞ්ඝස්ස යාවජීවං උදකසාටිකං දාතු” න්ති.

1. “කාලෙ” ම ඡ සං. 2. “දහරානං” ම ඡ සං. 3. “භවිස්සන්ති” P T S.

65. "නැවත ද ස්වාමීනි, ගමිකභික්ෂු තෙමේ තමාගේ බත සොයන්නේ සත්වායෙන් (=තවලම් තඩයෙන්) හෝ අත්හැරෙන්නේ ය. යම් තැනෙක විසීමට යනු කැමැත්තේ හෝ වන්නේ ද, එතැනට නො කල්හි පැමිණෙන්නේ ය. විඩා පත් වූයේ මග යන්නේ ය. ඒ භික්ෂු තෙමේ මාගේ ගමිකබත වළඳා සත්වායෙන් නො වෙන් වන්නේ ය. යම්තැනක විසිමට යනු කැමැති වන්නේ ද, එතැනට සුදුසු කාලයෙහි පැමිණෙන්නේ ය. විඩා පත් නො වූයේ මග යන්නේ ය. ස්වාමීනි, මම මේ කරුණ දක්නී දිවි ඇති තාක් සඞ්ඝයාහට ගමිකබත් දෙන්නට කැමැත්තෙමි.

66. "නැවත ද ස්වාමීනි, හිත වූ බොජුන් නො ලබන්නා වූ ගිලන් මහණහුගේ ආබාධය හෝ වැඩෙන්නේ ය. කලුරිය කිරීම හෝ වන්නේ ය. මගේ ගිලන්බත වැළඳූ ඒ භික්ෂුහුගේ ආබාධය නො වැඩෙන්නේ ය. කලුරිය කිරීම නො වන්නේ ය. ස්වාමීනි, මම මේ කාරණය දක්නී දිවි ඇති තාක් සඞ්ඝායාහට ගිලන්බත් දෙන්නට කැමැත්තෙමි.

67. "නැවත ද ස්වාමීනි, ගලානොපසථායකභික්ෂු තෙමේ තමාගේ බත සොයන්නේ ගිලනහුට ඉර නැගි කල්හි බත් ගෙණ යන්නේ ය. බත් සිඳීම කරන්නේ ය. ඒ ගලානොපසථායකභික්ෂු තෙමේ මාගේ ගලානොපසථායක බත වළඳා ගිලනහුට සුදුසු කාලයෙහි බත් ගෙණ යන්නේ ය. බත් සිඳීම නො කරන්නේ ය. ස්වාමීනි, මම මේ කාරණය දක්නී දිවි-ඇති තාක් සඞ්ඝයාහට ග්ලානොපසථායකබත් දෙනු කැමැත්තෙමි.

68. "නැවත ද ස්වාමීනි, හිත වූ බෙහෙත් නො ලබන්නා වූ ගිලන් වූ මහණහුගේ ආබාධය හෝ වැඩෙන්නේ ය. කලුරිය කිරීම හෝ වන්නේ ය. මාගේ ගිලන්බෙහෙත් වැළඳූ ඒ භික්ෂුහුගේ ආබාධය නො වැඩෙන්නේ ය. කලුරිය කිරීම නො වන්නේ ය. ස්වාමීනි, මම මේ කාරණය දක්නී දිවි ඇති තාක් සඞ්ඝාහට ගිලන්බෙහෙත් දෙනු කැමැත්තෙමි.

69. "නැවත ද ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් අන්ධකවින්ද නගරයෙහි දී අනුසස්දසයක් දකිමින් කැඳ අනුදන්නා ලද්දේ ය. ස්වාමීනි, මම මේ අනුසස් දක්නී දිවි ඇති තාක් සඞ්ඝයාට නිතිකැඳ දෙනු කැමැත්තෙමි.

70. "ස්වාමීනි, මෙහි මෙහෙණහු අචිරවතීනදියෙහි වෙසඟනන් සමග නග්න ව එක් තොටෙහි සනානය කෙරෙත්. ස්වාමීනි, ඒ වෙසඟනෝ මෙහෙණන්ට 'ආයසීාවෙනි, ඉතා තරුණ වූ ඔබ ට බඹසර පුරුදු කිරීමෙන් කිනම් ප්‍රයොජනයෙක් ද ? කාමයෝ පරිභොග කළ යුත්තෝ නො වෙත් ද ? යම් කලෙක දිරුණාහු වන්නහු ද, එකල්හි බඹසරෙහි හැසිරෙවු. එසේ ඇති කල්හි ඔබ විසින් උභයාඪියෝ ම ප්‍රයොජන ගන්නා ලද්දෝ වන්නාහු ය' යි වෙහෙසූහ. ස්වාමීනි, වෙසඟනන් විසින් වෙහෙසනු ලබන ඒ මෙහෙණහු මංකු (ලජ්ජිත) වූහ. ස්වාමීනි, නග්න භාවය මාගමට නො හොබී. ලජ්ජා සහිත ය. පිළිකුල් ය. ස්වාමීනි, මම මේ කාරණය දක්නී දිවි තෙක් මෙහෙණ සඟනට දියසළු දෙනු කැමැත්තෙමි" යි කීවා ය.

71. "කිං පන ත්වං විසාඛෙ, ආනිසංසං සම්පස්සමානා තථාගතං අට්ඨ වරානි යාචසී" ති. "ඉධ භන්තෙ දිසාසු වස්සං වුත්ථා භික්ඛූ සාවත්ථිං ආගච්ඡිස්සන්ති භගවන්තං දස්සනාය. තෙ භගවන්තං උපසඞ්කමිත්වා පුච්ඡිස්සන්ති: 'ඉත්ථන්නාමො භන්තෙ භික්ඛු කාලකතො. තස්ස කා ගති? කො අභිසම්පරායො?' ති. තං භගවා ව්‍යාකරිස්සති සොතාපත්තිඵලෙ වා සකදාගාමිඵලෙ වා අනාගාමිඵලෙ වා අරහත්තෙ වා[1]. ත්‍යාහං උපසඞ්කමිත්වා පුච්ඡිස්සාමි: 'ආගතපුබ්බා නු ඛො භන්තෙ, තෙන අය්‍යෙන සාවත්ථී' ති. සචෙ මෙ වක්ඛන්ති: 'ආගතපුබ්බා තෙන භික්ඛුනා සාවත්ථී' ති. නිට්ඨමෙත්ථ ගච්ඡිස්සාමි: 'නිස්සංසයං මෙ පරිභුත්තං[2] තෙන අය්‍යෙන වස්සිකසාටිකා වා ආගන්තුකභත්තං වා ගමිකභත්තං වා ගිලානභත්තං වා ගිලානුපට්ඨාකභත්තං වා ගිලානභෙසජ්ජං වා ධුවයාගු වා' ති. තස්සා මෙ තදනුස්සරන්තියා පාමුජ්ජං ජායිස්සති. පමුදිතාය පීතී ජායිස්සති. පීතිමනාය කායො පස්සම්භිස්සති. පස්සද්ධකායා සුඛං වෙදයිස්සාමි[3]. සුඛිනියා චිත්තං සමාධියිස්සති. සා මෙ භවිස්සති ඉන්ද්‍රියභාවනා, බලභාවනා, බොජ්ඣඞ්ගභාවනා. ඉමාහං භන්තෙ ආනිසංසං සම්පස්සමානා තථාගතං අට්ඨ වරානි යාචාමි" තී.

72. "සාධු සාධු විසාඛෙ, සාධු ඛො ත්වං විසාඛෙ, ඉමං ආනිසංසං සම්පස්සමානා තථාගතං අට්ඨ වරානි යාචසි. අනුජානාමි තෙ විසාඛෙ, අට්ඨ වරානි" ති.

73. අථ ඛො භගවා විසාඛං මිගාරමාතරං ඉමාහි ගාථාහි අනුමොදි:

"යා අන්නපානං දදතී පමොදිතා සීලූපපන්නා සුගතස්ස සාවිකා,
දදාති දානං අභිභුය්‍ය මච්ඡරං[4] සොවග්ගිකං සොකනුදං සුඛාවහං.

දිබ්බං සා ලභතෙ ආයුං ආගම්ම මග්ගං විරජං අනඞ්ගණං,
සා පුඤ්ඤකාමා[5] සුඛිනී අනාමයා සග්ගම්හි කායම්හි චිරං පමොදතී" ති.

74. අථ ඛො භගවා විසාඛං මිගාරමාතරං ඉමාහි ගාථාහි අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ අමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, වස්සිකසාටිකං ආගන්තුකභත්තං ගමිකභත්තං ගිලානභත්තං ගිලානුපට්ඨාකභත්තං ගිලාන-භෙසජ්ජං ධුවයාගුං භික්ඛුනීසඞ්ඝස්ස උදකසාටික" න්ති.

**විසාඛභාණවාරං නිට්ඨිතං.**

---

1. "අරහත්තඵලෙ වා" P T S. 2. "නිස්සංසයං පරිභුත්තං" සී මු.
3. "වෙදියිස්සාමි" 4 "අභිභුය මච්ඡෙරං" P T S.
5. "දිබ්බං බලං සා ලභතෙ" සි. ජ වි. අ වි. තො වි

71. "විශාඛාවෙනි, තී කිනම් අනුසසක් දක්නී තථාගතයන් වහන්සේ වෙතින් වර අට ඉල්වන්නෙහි ද ?" යි අසා වදාළ සේක. "ස්වාමීනි, මෙහි දිසාවන්හි වස් වැස නිම කළ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දක්නු පිණිස **සැවැත්**නුවරට පැමිණෙන්නාහු ය. ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ 'ස්වාමීනි, මෙනම් ඇති මහණ තෙමේ කළුරිය කෙළේ ය. ඔහුගේ ගතිය කවරී ද ? පරලොව කවරේ ද ?' යි විචාරන්නාහු ය. භාග්‍යවතුන් වහන්සේ (ඒ භික්ෂූනම) සොතාපත්තිඵලයෙහි හෝ සකෘදාගාමිඵලයෙහි හෝ අනාගාමි-ඵලයෙහි හෝ අරහත්තඵලයෙහි හෝ යි ඔහු ගැණ ප්‍රකාශ කරණ සේක. මම ඒ භික්ෂූන් වෙත එළඹ 'ස්වාමීනි, ඒ ආයුෂ්මතුන් වහන්සේ පෙර සැවැත්නුවරට පැමිණි විරූ ද' යි විචාරන්නෙමි. ඉදින් ඒ මහණහු 'සැවැත් නුවරට පැමිණි විරූ ය' යි මට කියන්නාහු නම්, 'නිසැකයෙන් ඒ ආයුෂ්මතුන් වහන්සේ විසින් මාගේ වැසිසළු හෝ ආගන්තුකබත් හෝ ගමිකබත් හෝ ගිලන්බත් හෝ ගිලානොපස්ථායකබත් හෝ ගිලන්බෙහෙත් හෝ නිති කැඳ හෝ වළඳන ලද' යි මෙහි නිශ්චයට යන්නෙමි. එය සිහි කරන්නා වූ ඒ මට ප්‍රමොදය උපදින්නේ ය. ප්‍රමුදිත වූ මට ප්‍රීතිය උපදින්නේ ය. ප්‍රීත සිත් ඇති මාගේ කය සන්සිඳෙන්නේ ය. සන්සිඳුනු කය ඇත්තී සුව විඳින්නෙමි. සුව ඇත්තා වූ මාගේ සිත එකඟ වන්නේ ය. එය මට ඉන්ද්‍රියභාවනාව, බලභාවනාව, බොධ්‍යඞ්ගභාවනාව වන්නේ ය. ස්වාමීනි, මම මේ අනුසස් දක්නෙමි තථාගතයන් වහන්සේගෙන් වර අට ඉල්ලමි" යි කීවූ ය.

72. "විශාඛාව, ඉතා යහපති. විශාඛාව, තී මේ අනුසස් දක්නී තථාගතයන් වහන්සේගෙන් වර අට ඉල්වන්නෙහි ද, ඒ යහපති. විශාඛාව, තිට වර අට අනුදනිමි" යි වදාළසේක.

73. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෘගාරිමාතෘ විශාඛාවට මේ ගාථාවන්ගෙන් අනුමෝදන් කළ සේක:

"සුගතයන් වහන්සේගේ සීලසම්පන්න වූ යම් ශ්‍රාවිකාවක් ප්‍රමුදිත වූවා ආහාරපාන දේ ද, මසුරුමල මැඩ ස්වර්ගයට හිත වූ ශොක දුරු කරන්නා වූ සුව ඵලවත්නා වූ දන් දේ ද-

ඕ තොමෝ දිව්‍යමය වූ ආයුෂ ලබයි. පහ වූ රාගාදිරජස් ඇති පව් නැති මාර්ගයට පැමිණ පින් කැමැති ඕ තොමෝ සුවපත් ව රොග රහිත ව ස්වර්ගලොකයෙහි බොහෝ කලක් සතුටු වෙයි."

74. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෘගාරිමාතෘ විශාඛාවට මේ ගාථා-වන්ගෙන් අනුමොදනා කොට හුනස්නෙන් නැගිට වැඩි සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දහැමි කතා කොට භික්ෂූන් අමතා "මහණෙනි, වැසිසළු, ආගන්තුකබත, ගමිකබත, ගිලන්බත, ගිලානොපස්ථායකබත, ගිලන්බෙහෙත්, නිතිකැඳ, මෙහෙණසඟනට දියසළු අනුදනිමි" යි වදාළ සේක.

**විසාඛාණවර නිමි.**

---

1. තෙන ඛො පන සමයෙන භික්ඛූ පණීතානි භොජනානි භුඤ්ජිත්වා මුට්ඨස්සතී අසම්පජානා නිද්දං ඔක්කමන්ති. තෙසං මුට්ඨස්සතීනං අසම්පජානානං නිද්දං ඔක්කමන්තානං සුපිනන්තෙන අසුචි මුච්චති. සෙනාසනං අසුචිනා මක්ඛියති.

2. අථ ඛො භගවා ආයස්මතා **ආනන්දෙන** පච්ඡාසමණෙන සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො අද්දස සෙනාසනං අසුචිනා මක්ඛිතං. දිස්වාන ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: “කිං එතං ආනන්ද, සෙනාසනං මක්ඛිත” න්ති. “එතරහි භන්තෙ, භික්ඛූ පණීතානි භොජනානි භුඤ්ජිත්වා මුට්ඨස්සතී අසම්පජානා නිද්දං ඔක්කමන්ති. තෙසං මුට්ඨස්සතීනං අසම්පජානානං නිද්දං ඔක්කමන්තානං සුපිනන්තෙන අසුචි මුච්චති. තයිදං භගවා, සෙනාසනං අසුචිනා මක්ඛිත” න්ති. “එවමෙතං ආනන්ද, එවමෙතං ආනන්ද, මුච්චති හි ආනන්ද, මුට්ඨස්සතීනං අසම්පජානානං නිද්දං ඔක්කමන්තානං සුපිනන්තෙන අසුචි. යෙ තෙ ආනන්ද, භික්ඛූ උපට්ඨිතසතී සම්පජානා නිද්දං ඔක්කමන්ති, තෙසං අසුචි න මුච්චති. යෙපි තෙ ආනන්ද, පුථුජ්ජනා කාමෙසු වීතරාගා, තෙසම්පි අසුචි න මුච්චති. අට්ඨානමෙතං ආනන්ද අනවකාසො යං අරහතො අසුචි මුච්චෙය්‍යා” ති.

3. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: “ඉධාහං භික්ඛවෙ, ආනන්දෙන පච්ඡාසමණෙන සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො අද්දසං සෙනාසනං අසුචිනා මක්ඛිතං. දිස්වාන, ආනන්දං ආමන්තෙසිං: ‘කිං එතං ආනන්ද, සෙනාසනං මක්ඛිත’න්ති ‘එතරහි භන්තෙ, භික්ඛූ පණීතානි භොජනානි භුඤ්ජිත්වා මුට්ඨස්සතී අසම්පජානා නිද්දං ඔක්කමන්ති. තෙසං මුට්ඨස්සතීනං අසම්පජානානං නිද්දං ඔක්කමන්තානං සුපිනන්තෙන අසුචි මුච්චති. තයිදං භගවා, සෙනාසනං අසුචිනා මක්ඛිත’ න්ති. ‘එවමෙතං ආනන්ද, එවමෙතං ආනන්ද, මුච්චති හි ආනන්ද, මුට්ඨස්සතීනං අසම්පජානානං නිද්දං ඔක්කමන්තානං සුපිනන්තෙන අසුචි. යෙ තෙ ආනන්ද, භික්ඛූ උපට්ඨිතසතී සම්පජානා නිද්දං ඔක්කමන්ති, තෙසං අසුචි න මුච්චති. යෙපි තෙ ආනන්ද, පුථුජ්ජනා කාමෙසු වීතරාගා, තෙසම්පි අසුචි න මුච්චති. අට්ඨානමෙතං ආනන්ද, අනවකාසො යං අරහතො අසුචි මුච්චෙය්‍යා” ති.

4. “පඤ්චිමෙ භික්ඛවෙ, ආදීනවා මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස නිද්දං ඔක්කමතො: දුක්ඛං සුපති. දුක්ඛං පටිබුජ්ඣති. පාපකං සුපිනං පස්සති. දෙවතා න රක්ඛන්ති. අසුචි මුච්චති. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස නිද්දං ඔක්කමතො.

5. “පඤ්චිමෙ භික්ඛවෙ, ආනිසංසා උපට්ඨිතසතිස්ස සම්පජානස්ස නිද්දං ඔක්කමතො: සුඛං සුපති. සුඛං පටිබුජ්ඣති. න පාපකං සුපිනං පස්සති. දෙවතා රක්ඛන්ති. අසුචි න මුච්චති. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ආනිසංසා උපට්ඨිතසතිස්ස සම්පජානස්ස නිද්දං ඔක්කමතො. අනුජානාමි භික්ඛවෙ, කායගුත්තියා චීවරගුත්තියා සෙනාසනගුත්තියා නිසීදන” න්ති.

1. එකල්හි භික්ෂූහු පිණ්ඩබොජුන් වළඳා මුළා වූ සිහි ඇත්තාහු සම්‍යක් ප්‍රඥා නැත්තාහු නින්දට බසිත්. මුළා වූ සිහි ඇති ව යහපත් නුවණින් තොර වූ නින්දට යන්නා වූ ඔවුන්ට සිහිනෙන් අසුචි (ශුක්‍ර) මිදේ (නික්මේ). සෙනසුන ශුක්‍රයෙන් කිලිටි වේ.

2. භාග්‍යවතුන් වහන්සේ (තමන් වහන්සේ) පසු ව යන මහණහු වූ ආයුෂ්මත් වූ අනඳ තෙරුන් සමග සෙනාසනචාරිකාවෙහි වඩිනා සේක් ශුක්‍රයෙන් කිලිටි වූ සෙනසුන් දුටු සේක. දැක, "ආනන්දය, මේ සෙනසුන කුමකින් වැකුනේ දැ" යි ආයුෂ්මත් අනඳ තෙරුන් අසා වදාළ සේක. "ස්වාමීනි, දැන් භික්ෂූහු පිණ්ඩබොජුන් වළඳා මුළාසිහි ඇත්තාහු සම්‍යක්ප්‍රඥා නැත්තාහු නින්දට බසිත්. මුළා වූ සිහි ඇති ව සම්‍යක් ප්‍රඥා නැති ව නින්දට බසින්නා වූ ඔවුන්ට සිහිනෙන් ශුක්‍ර මොචනය වේ. භාග්‍යවතුන් වහන්ස, ඒ මේ සෙනසුන් ශුක්‍රයෙන් කිලිටි වූයේ ය" යි සැළකළහ. "ආනන්දය, ඒ එසේ ය. ආනන්දය, ඒ එසේ ය. ආනන්දය, මුළා වූ සිහි ඇති ව සම්‍යක් ප්‍රඥාවෙන් තොර ව නින්දට බසින්නවුන්ට සිහිනෙන් ශුක්‍ර මිදේ ම ය. ආනන්දය, එළඹ සිටි සිහි ඇති යහපත් නුවණ ඇති යම් ඒ භික්ෂූහු නින්දට බසිත් ද, ඔවුන්ට ශුක්‍ර නො මිදේ. ආනන්දය, යම් ඒ පුහුදුන් කෙනෙක් කාමයන්හි පහ වූ ඇලුම් ඇත්තෝ වෙත් ද, ඔවුන්ට ද ශුක්‍ර නො මිදේ. ආනන්දය, රහතුන් වහන්සේට ශුක්‍ර මිදෙන්නේ ය යනු නො විය හැකි ය. ඊට අවකාශ (හෙතු) නැතැ" යි වදාළහ.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් අමතා "මහණෙනි, මම මෙහි පසු මහණහු වූ ආනන්දයන් සමග සෙනාසනචාරිකාවෙහි ඇවිදින්නෙම් ශුක්‍රයෙන් කිලිටි වූ සෙනසුන් දුටුවෙමි. දැක "මේ සෙනසුන් කුමක් නිසා ශුක්‍රයෙන් කිලිටි වූයේ දැ" යි ආනන්දයන් විචාළෙමි. "ස්වාමීනි, දැන් භික්ෂූහු පිණ්ඩබොජුන් වළඳා මුළාසිහි ඇති ව සම්‍යක්ප්‍රඥාවෙන් තොර ව නින්දට බසිත්. මුළාසිහි ඇති ව යහපත් නුවණින් තොර ව නින්දට බසින්නා වූ ඔවුන්ට සිහිනෙන් ශුක්‍ර මිදේ. භාග්‍යවතුන් වහන්ස, මේ සෙනසුන ඒ අසුචියෙන් කිලිටි වී ය" යි හේ කී ය. "ආනන්දය, ඒ එසේ ය. ආනන්දය, ඒ එසේ ය. ආනන්දය, මුළාසිහි ඇති ව සම්‍යක්ප්‍රඥාවෙන් තොර ව නින්දට බසින්නවුන්ට සිහිනෙන් ශුක්‍ර මිදේ ම ය. ආනන්දය, එළඹ සිටි සිහි ඇති සම්‍යක්ප්‍රඥා ඇති යම් ඒ භික්ෂූහු නින්දට බසිත් ද, ඔවුන්ට ශුක්‍ර නො මිදේ. ආනන්දය, යම් ඒ පුහුදුන් කෙනෙක් කාමයන්හි පහ වූ ඇලුම් ඇත්තාහු ද, ඔවුන්ට ද ශුක්‍ර නො මිදේ. ආනන්දය, රහතුන් වහන්සේට ශුක්‍ර මිදෙන්නේ ය යනු නො විය හැකි ය. ඊට හෙතු නැතැ" යි කීවෙමි.

4. "මහණෙනි, මුළා වූ සිහි ඇති ව සම්‍යක්ප්‍රඥා නැති ව නින්දට බසින්නාහට මේ දොස් පසෙක් වේ: දුක සේ නිදයි. දුක සේ පිබිදෙයි. පව්ටු සිහින දකියි. දෙවියෝ නො රකිත්. ශුක්‍ර මිදේ. මහණෙනි, මුළා සිහි ඇති ව සම්‍යක්ප්‍රඥා නැති ව නින්දට බසින්නහුට මේ දොස් පස වේ.

5. "මහණෙනි, එළඹ සිටි සිහි ඇති ව සම්‍යක් ප්‍රඥා ඇති ව නින්දට බසින්නහුට මේ අනුසස් පසෙක් වේ: සුව සේ නිදයි. සුව සේ පිබිදෙයි. පව්ටු සිහින නො දකියි. දෙවියෝ රකිත්. ශුක්‍ර නො මිදේ. මහණෙනි, එළඹ සිටි සිහි ඇති ව සම්‍යක්ප්‍රඥා ඇති ව නින්දට බසින්නහුට මේ අනුසස් පස වේ. මහණෙනි, කය රක්නා පිණිස සිවුරු රක්නා පිණිස සෙනසුන් රක්නා පිණිස නිසීදනය (හිඳිනා ඇතිරිය) අනුදනිමි" යි වදාළහ.

6. තෙන ඛො පන සමයෙන අතිඛුද්දකං නිසීදනං න සබ්බං සෙනාසනං ගොපෙති[1]. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, යාව මහන්තං පච්චත්ථරණං ආකඞ්ඛති, තාව මහන්තං පච්චත්ථරණං කාතු" න්ති.

7. තෙන ඛො පන සමයෙන ආයස්මතො ආනන්දස්ස උපජ්ඣායස්ස ආයස්මතො බෙලට්ඨසීසස්ස ථුල්ලකච්ඡාබාධො හොති. තස්ස ලසිකාය චීවරානි කායෙ ලග්ගන්ති. තානි භික්ඛූ උදකෙන තෙමෙත්වා තෙමෙත්වා අපකඩ්ඪන්ති.

8. අද්දසා ඛො භගවා සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො තෙ භික්ඛූ තානි චීවරානි උදකෙන තෙමෙත්වා තෙමෙත්වා අපකඩ්ඪන්තෙ. දිස්වාන යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: "කිං ඉමස්ස භික්ඛවෙ, භික්ඛුනො ආබාධො" ති. "ඉමස්ස භන්තෙ, ආයස්මතො ථුල්ලකච්ඡාබාධො. ලසිකාය චීවරානි කායෙ ලග්ගන්ති. තානි මයං උදකෙන තෙමෙත්වා තෙමෙත්වා අපකඩ්ඪාමා" ති.

9. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, යස්ස කණ්ඩු වා පිළකා වා අස්සාවො වා ථුල්ලකච්ඡු වා ආබාධො, කණ්ඩුප්පටිච්ඡාදි" න්ති.

10. අථ ඛො විසාඛා මිගාරමාතා මුඛපුඤ්ඡනචොළකං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නා ඛො විසාඛා මිගාරමාතා භගවන්තං එතදවොච: "පටිග්ගණ්හාතු මෙ භන්තෙ, භගවා මුඛපුඤ්ඡනචොළකං, යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායා" ති. පටිග්ගහෙසි භගවා මුඛපුඤ්ඡනචොළකං.

11. අථ ඛො භගවා විසාඛං මිගාරමාතරං ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි. අථ ඛො විසාඛා මිගාරමාතා භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

12. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ, මුඛපුඤ්ඡනචොළක" න්ති.

13. තෙන ඛො පන සමයෙන රොජො මල්ලො ආයස්මතො ආනන්දස්ස සහායො හොති. රොජස්ස මල්ලස්ස ඛොමපිලොතිකා ආයස්මතො ආනන්දස්ස හත්ථෙ නික්ඛිත්තා හොති. ආයස්මතො ච ආනන්දස්ස ඛොමපිලොතිකාය අත්ථො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස විස්සාසං ගහෙතුං: සන්දිට්ඨො ච හොති, සම්භත්තො, ආලපිතො ච, ජීවති ච, ජානාති ච - ගහිතෙ මෙ අත්තමනො භවිස්සතී"ති. අනුජානාමි භික්ඛවෙ, ඉමෙහි පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස විස්සාසං ගහෙතු" න්ති.

1. "සංගොපෙති" ම ඡ සං

6. එකල්හි ඉතා කුඩා වූ නිසීදනය මුළු සෙනසුන නො රකියි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, යම් පමණ මහත් වූ පසතුරණු කැමැති වේ නම්, එපමණ මහත් වූ පසතුරණු කරන්නට අනුදනිමි" යි

7. එකල්හි ආයුෂ්මත් අනඳතෙරුන්ගේ උපාධ්‍යාය වූ අයුෂ්මත් **බෙලට්ඨසීස** ස්ථවිරයන් වහන්සේට මහත් පිළිකාරොගයෙක් වේ. උන්වහන්සේගේ සිවුරු සඳම්දුලෙන් ශරීරයෙහි ඇලෙගෙන් භික්ෂූහු ඒ සිවුරු දියෙන් තෙමතෙමා ඉවත් කෙරෙත්.

8. භාග්‍යවතුන් වහන්සේ සෙනාසනචාරිකාවෙහි වඩිනා සේක් ඒ සිවුරු දියෙන් තෙමතෙමා ඉවත් කරන්නා වූ භික්ෂූන් දුටු සේක. දැක ඒ භික්ෂූන් වෙත එළඹි සේක. එළඹ, "මහණෙනි, මේ මහණහුගේ ආබාධය කිමැ" යි ඒ භික්ෂූන්ගෙන් ඇසූහ. "ස්වාමීනි, මේ ආයුෂ්මත්හුහට මහ පිළිකාරොගය වේ. සඳම්දුලෙන් සිවුරු සිරුරෙහි ඇලෙයි. අපි ඒ සිවුරු දියෙන් තෙම තෙමා ඉවත් කරමු" යි කීහ.

9. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමි කතා කොට භික්ෂූන් අමතා "මහණෙනි, යම් මහණකුහට කැසීමෙක් හෝ ලේගඩුවක් හෝ භගන්දරාදි සැරව් වැගිරෙණ ආබාධයක් හෝ මහ පිළිකා ආබාධයෙක් හෝ වේ ද, කස්පිළිසනක් (වණ වැසුමක්) අනුදනිමි" යි වදාළ සේක.

10. එකල්හි මෘගාරිමාතෘ **විශාඛා** තොමෝ මුව පිස්නා රෙදිකඩක් ගෙණ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියා ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නී ය. පසෙක හුන්නා වූ මෘගාරිමාතෘ විශාඛා තොමෝ "භාග්‍යවතුන් වහන්සේ මාගේ මුවපිස්නා රෙදිකඩ පිළිගන්නා සේක්වා. එය මට බොහෝ කලක් හිත පිණිස සැප පිණිස වන්නේ ය" යි භාග්‍යවතුන් වහන්සේට සැලකළා ය. භාග්‍යවතුන් වහන්සේ මුවපිස්නා රෙදිකඩ පිළිගත්හ.

11. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෘගාරිමාතෘ විශාඛාව දැහැමි කතාවෙන් කරුණු දැක්වූහ. (ඇය එහි) සමාදන් කරවූ හ. තියුණු කරවූහ. සතුටු කරවූහ. භාග්‍යවතුන් වහන්සේ විසින් කරුණු දක්වන ලද සමාදන් කරවන ලද තියුණු කරවන ලද සතුටු කරවන ලද මෘගාරිමාතෘ විශාඛා තොමෝ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ගියා ය.

12. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි දැහැමිකතා කොට භික්ෂූන් අමතා "මහණෙනි, මුවපිස්නා රෙදිකඩක් අනුදනිමි" යි වදාළ සේක.

13. එකල්හි **රොජමල්ල**තෙමේ ආයුෂ්මත් වූ අනඳතෙරුන්ගේ යහළුවෙක් වේ. රොජමල්ලයා විසින් කොමුපිළියක් ආයුෂ්මත් අනඳ තෙරුන් අත තබන ලද්දේ වේ. ආයුෂ්මත් අනඳතෙරුන්ට ද කොමු පිළියකින් ප්‍රයොජන වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, අඞ්ග පසකින් යුක්ත වූවෙකුගේ දෙයක් විශ්වාසයෙන් ගැණීමට අනුදනිමි: දුටු මිතුරු වේ ද, දැඩි මිතුරු වේ ද, කථාමාත්‍රයෙන් මිතුරු වූයේ ද, ජීවත් වේ ද, 'මා විසින් ගත් කල සතුටු වන්නේ ය' යි දනී ද, මහණෙනි, මේ පසගින් යුක්ත වූවහු පිළිබඳ දෙය විශ්වාසයෙන් ගැණීමට අනුදනිමි".

14. තෙන ඛො පන සමයෙන භික්ඛූනං පරිපුණ්ණං හොති තිචීවරං. අත්ථො ච හොති පරිස්සාවනෙහිපි ථවිකාහිපි. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, පරික්ඛාරචොළක" න්ති.

15. අථ ඛො භික්ඛූනං එතදහොසි: "යානි තානි භගවතා අනුඤ්ඤාතානි තිචීවරන්ති වා වස්සිකසාටිකාති[1] වා නිසීදනන්ති වා පච්චත්ථරණන්ති වා කණ්ඩුප්පටිච්ඡාදීති වා මුඛපුඤ්ඡනචොළකන්ති වා පරික්ඛාරචොළකන්ති වා, සබ්බානි තානි අධිට්ඨාතබ්බානි නු ඛො? උදාහු විකප්පෙතබ්බානී ?" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, තිචීවරං අධිට්ඨාතුං, න විකප්පෙතුං. වස්සිකසාටිකං වස්සානං චතුමාසං අධිට්ඨාතුං, තතො පරං විකප්පෙතුං. නිසීදනං අධිට්ඨාතුං න විකප්පෙතුං. පච්චත්ථරණං අධිට්ඨාතුං, න විකප්පෙතුං. කණ්ඩුප්පටිච්ඡාදිං යාව ආබාධා අධිට්ඨාතුං, තතොපරං විකප්පෙතුං, මුඛපුඤ්ඡනචොළකං අධිට්ඨාතුං, න විකප්පෙතුං. පරික්ඛාරචොළකං අධිට්ඨාතුං, න විකප්පෙතු" න්ති. අථඛො භික්ඛූනං එතදහොසි: "කිත්තකං පච්ඡිමං නු ඛො චීවරං විකප්පෙතබ්බ" න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ආයාමෙන අට්ඨඞ්ගුලං සුගතඞ්ගුලෙන චතුරඞ්ගුලවිත්ථතං පච්ඡිමං චීවරං විකප්පෙතු" න්ති.

16. තෙන ඛො පන සමයෙන් ආයස්මතො **මහාකස්සපස්ස** පංසුකූලකතො ගරුකො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සුත්තලූඛං කාතු" න්ති. විකණ්ණො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, විකණ්ණං උද්ධරිතු" න්ති. සුත්තා ඔකිරීයන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අනුවාතං පරිභණ්ඩං ආරොපෙතු" න්ති. තෙන ඛො පන සමයෙන සඞ්ඝාටියා පත්තා ලුජ්ජන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අට්ඨපදකං කාතු" න්ති.

17. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො තිචීවරෙ කයිරමානෙ සබ්බං ඡින්නකං නප්පහොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ද්වෙ ඡින්නකානි, එකං අච්ඡින්නක" න්ති. ද්වෙ ඡින්නකානි එකං අච්ඡින්නකං නප්පහොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ද්වෙ අච්ඡින්නකානි. එකං ඡින්නක" න්ති. ද්වෙ අච්ඡින්නකානි එකං ඡින්නකං නප්පහොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, අන්වාධිකම්පි ආරොපෙතුං. න ච භික්ඛවෙ, සබ්බං අච්ඡින්නකං ධාරෙතබ්බං. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

18. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො බහුං චීවරං උප්පන්නං හොති. සො ච තං චීවරං මාතාපිතූනං[2] දාතුකාමො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "මාතාපිතරොති ඛො[3] භික්ඛවෙ, වදමානෙ[4] කිං වදෙය්‍යාම. අනුජානාමි භික්ඛවෙ, මාතාපිතූනං දාතුං. න ච භික්ඛවෙ සද්ධාදෙය්‍යං විනිපාතෙතබ්බං. යො විනිපාතෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

---

1. "සාටිකානි" ජ වි. තො වි. 1. "සාටකානි" අ වි.
2. "මාතාපිතුනං" ම ජ සං. අ වි. තො වි.
3. "මාතාපිතුනං ඛො" ති දිස්සතෙ එකාචෙචසු සීහලක්ඛරපොත්ථකෙසු.
4 "දදමානෙ" ම ජ සං. P T S. තො වි.
4 "දදමානො ජ වි. "වදමානො" සාත්වි

14. එකල්හි භික්ෂූන්ට තුන්සිවුරු සම්පූර්ණ වේ. පෙරහන්වලින් ද පසුම්බිවලින් ද ප්‍රයොජන වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, පිරිකර රෙදිකඩක් අනුදනිමි".

15. "භාග්‍යවතුන් වහන්සේ විසින් - තුන් සිවුර ය යි ද, වැසිසළු ය යි ද, නිසීදන ය යි ද, පසතුරුණ ය යි ද, කස්පිළිසන යි ද මුවපිස්නාවත ය යි ද, පිරිකරසොළ ය යි ද යම් ඒ සිවුරු (වස්ත්‍ර) අනුදන්නා ලද ද, ඒ සියල්ල ඉටිය යුතු ද ? නොහොත් විකැපිය යුතු දැ" යි භික්ෂූන්ට සිත් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, තුන් සිවුර ඉටන්නට නො විකපන්නට, වැසිසළුව වස් සාරමස ඉටන්නට ඉන් පසු විකපන්නට, නිසීදනය ඉටන්නට නො විකපන්නට, පසතුරුණ ඉටන්නට නො විකපන්නට, කස්පිළිසන ආබාධ ඇති තෙක් ඉටන්නට ඉන් පසු විකපන්නට, මුවපිස්නාවත ඉටන්නට නො විකපන්නට, පිරිකරසොළ ඉටන්නට, නො විකපන්නට අනුදනිමි". අනතුරු ව භික්ෂූන්ට "කොපමණ දිග පළල ඇති පශ්චිමචීවරය (කුඩා ම සිවුර) විකැපිය යුතු දැ" යි අදහස් වි ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, දිගින් සුගත් අඟලෙන් අටඟුලක් (වඩුරියනක්) වූ, සතරඟුලක් (වඩුවියතක්) පමණ පළල් වූ පශ්චිමචීවරය විකපන්නට අනුදනිමි".

16. එකල්හි ආයුෂමත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ පංසුකූලයෙන් කළ සිවුර (දිරූ තැන් අණ්ඩ ලීමෙන්) බර වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, නූලෙන් (පමණක්) රළු කරන්නට (එළ ලන්ට) අනුදනිමි". සම නො වූ කොන් ඇත්තේ වේ. එක් කොණක් (පරණ් මැහුම් නූල් නො කපා මැහීමෙන්) දික් වූයේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, දික් වූ සිවුරුකොණ කපන්නට අනුදනිමි." කැපූ කොණින් නූල් වැගිරෙයි. (විසිරී යයි.) භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, නුවාව හා පිරිබඩ (උඩුනුවාකඩ) ඇල්ලීම අනුදනිමි". එකල්හි සඟලසිවුරෙහි පත් (කැබලි නූල් හීමෙන්) නැසෙයි. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, දම්පෝරුවේ මඩුලු මෙන් පත් (මැඩිලි) මුව මහන්නට අනුදනිමි".

17. එකල්හි එක්තරා මහණකුගේ තුන්සිවුර කරණු ලබන කල සියල්ල කපනලද්දේ (තුන් සිවුර ම කඩ කපා ප්‍රමාණ වන සේ මැහීමට) නො පොහොනේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, එසේනම් කැපූ දෙකක් (සිවුරු දෙකක් කපා මැහීමට) ද නො කැපූ එකක් (එක සිවුරක් නො කපා මැහීමට) ද අනුදනිමි". කැපූ දෙක ද නො කැපූ එක ද (ප්‍රමාණයට) නො පොහොනේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, නො කැපූ දෙකක් ද කැපූ එකක් ද අනුදනිමි". නො කැපූ දෙක ද කැපූ එක ද නො පොහොනේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ "මහණෙනි, අමුතු රෙදිකඩක් අල්ලන්නට අනුදනිමි. සියල්ල ම නො කැපූ (එකකුදු නො කපා මැහූ) තුන් සිවුරු නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුළා ඇවැත් වේ".

18. එකල්හි එක්තරා මහණකුහට බොහෝ සිවුරු (වස්ත්‍ර) ලැබුනේ ය. ඒ මහණ තෙමේ ද ඒ සිවුරු මවුපියන්ට දෙනු කැමැත්තේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මවුපියෝ යි කියන කල්හි කුමක් කියන්නෙමු ද ? මහණෙනි, මවුපියන්ට දෙන්නට අනුදනිමි. මහණෙනි, සැදැහැයෙන් දුන් දෙය වරදි තැන නො යෙදිය යුතු ය. යමෙක් යොදන්නේ නම්, දුකුළාඇවැත් වේ".



Free Distribution www.aathaapi.org

19. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අන්ධවනෙ චීවරං නික්ඛිපිත්වා සන්තරුත්තරෙන ගාමං පිණ්ඩාය පාවිසි. චොරා තං චීවරං අවහරිංසු. සො භික්ඛු දුච්චොළො හොති ලූඛචීවරො. භික්ඛූ එවමාහංසු: "කිස්ස ත්වං ආවුසො, දුච්චොළො ලූඛචීවරො" ති. ඉධාහං[1] ආවුසො, අන්ධවනෙ චීවරං නික්ඛිපිත්වා සන්තරුත්තරෙන ගාමං පිණ්ඩාය පාවිසිං. චොරා තං චීවරං අවහරිංසු. තෙනාහං දුච්චොළො ලූඛචීවරො" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ, සන්තරුත්තරෙන ගාමො පවිසිතබ්බො. යො පවිසෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති.

20. තෙන ඛො පන සමයෙන ආයස්මා ආනන්දො අසතියා සන්තරුත්තරෙන ගාමං පිණ්ඩාය පාවිසි. භික්ඛූ ආයස්මන්තං ආනන්දං එතදවොචුං: "නනු ඛො ආවුසො ආනන්ද, භගවතා පඤ්ඤත්තං 'න සන්තරුත්තරෙන ගාමො පවිසිතබ්බො' ති. කිස්ස ත්වං ආවුසො සන්තරුත්තරෙන ගාමං පවිට්ඨො ?" ති. "සච්චං ආවුසො, භගවතා පඤ්ඤත්තං 'න සන්තරුත්තරෙන ගාමො පවිසිතබ්බො'ති. අපි චාහං අසතියා පවිට්ඨො" ති.

21. භගවතො එතමත්ථං ආරොචෙසුං "පඤ්චිමෙ භික්ඛවෙ, පච්චයා සඞ්ඝාටියා නික්ඛෙපාය: ගිලානො වා හොති. වස්සිකසඞ්කෙතං වා හොති. නදීපාරගතං[2] වා හොති. අග්ගළගුත්තිවිහාරො වා හොති. අත්ථතකඨිනං වා හොති. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච පච්චයා සඞ්ඝාටියා නික්ඛෙපාය.

22. "පඤ්චිමෙ භික්ඛවෙ, පච්චයා උත්තරාසඞ්ගස්ස නික්ඛෙපාය: ගිලානො වා හොති. වස්සිකසඞ්කෙතං වා හොති. නදීපාරගතං වා හොති. අග්ගළගුත්තිවිහාරො වා හොති. අත්ථතකඨිනං වා හොති. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච පච්චයා උත්තරාසඞ්ගස්ස නික්ඛෙපාය.

23. "පඤ්චිමෙ භික්ඛවෙ, පච්චයා අන්තරවාසකස්ස නික්ඛෙපාය: ගිලානො වා හොති. වස්සිකසඞ්කෙතං වා හොති. නදීපාරගතං වා හොති. අග්ගළගුත්තිවිහාරො වා හොති. අත්ථතකඨිනං වා හොති. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච පච්චයා අන්තරවාසකස්ස නික්ඛෙපාය.

24. "පඤ්චිමෙ භික්ඛවෙ, පච්චයා වස්සිකසාටිකාය නික්ඛෙපාය: ගිලානො වා හොති. නිස්සීමගතං[3] වා හොති. නදීපාරගතං වා හොති. අග්ගළගුත්ති විහාරො වා හොති. වස්සිකසාටිකා අකතා වා හොති විප්පකතා වා. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච පච්චයා වස්සිකසාටිකාය නික්ඛෙපායා"ති.

25. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු එකො වස්සං වසි. තත්ථ මනුස්සා "සඞ්ඝස්ස දෙමා"ති චීවරානි අදංසු. අථ ඛො තස්ස භික්ඛුනො එතදහොසි: "භගවතා පඤ්ඤත්තං චතුවග්ගො පච්ඡිමො සඞ්ඝො ති. අහඤ්චම්හි එකකො. ඉමෙ ච මනුස්සා 'සඞ්ඝස්ස දෙමා' ති චීවරානි අදංසු. යන්නූනාහං ඉමානි සඞ්ඝිකානි චීවරානි සාවත්ථිං හරෙය්‍ය" න්ති. අථ ඛො සො භික්ඛු තානි චීවරානි ආදාය සාවත්ථිං ගන්ත්වා භගවතො එතමත්ථං ආරොචෙසි. "තුය්හෙව භික්ඛු, තානි චීවරානි යාව කඨිනස්ස උබ්භාරායා" ති.

1. "පංසාහත්ථි කාළිච්" 
2. "නදිපාරං ගන්තුං වා" ම ඡ සං. P T S. 3 "නිස්සීමං ගන්තුං" ම ඡ සං. P T S.

19. එකල්හි එක්තරා මහණෙක් අන්ධවනයෙහි සිවුර බහා තබා උතුරුසඟසිවුර හා අඳනාසිවුරෙන් යුක්ත ව පිඬු පිණිස ගමට පිවිසියේ ය. සොරු ඒ සිවුර පැහැර ගත්හ. ඒ මහණ තෙමේ කිලිටි සිවුරු ඇත්තේ රළු සිවුරු ඇත්තේ වේ. භික්ෂූහු "ඇවැත, තෝ කුමක් හෙයින් කිලිටි සිවුරු ඇත්තේ රළු සිවුරු ඇත්තේ වෙහි දැ" යි මෙසේ ඇසූහ. "ඇවැත්නි, මම මෙහි අන්ධවනයෙහි සිවුර බහා තබා උතුරුසඟසිවුර හා අඳනාසිවුරෙන් යුක්ත ව පිඬු පිණිස ගමට පිවිසියෙමි. සොරු ඒ සිවුර පැහැර ගත්හ. එයින් මම කිලිටි සිවුරු ඇත්තෙම් රළු සිවුරු ඇත්තෙම් වෙමි" යි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, උතුරුසඟසිවුර හා අඳනාසිවුරෙන් යුක්ත ව ගම් නො වැදිය යුතු ය. යමෙක් ගම් වදින්නේ නම්, දුකුළා ඇවැත් වේ".

20. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සිහි පත් නො කිරීමෙන් උතුරුසඟසිවුර හා අඳනාසිවුරෙන් යුක්ත ව පිඬු පිණිස ගමට පිවිසියහ. භික්ෂූහු "ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ විසින් 'උතුරුසඟසිවුර හා අඳනාසිවුරෙන් යුක්ත ව ගම් නො වැදිය යුතු ය' යි පණවන ලද්දේ නො වේ ද ? ඇවැත්නි, කුමක් හෙයින් තෙපි උතුරුසඟසිවුර හා අඳනාසිවුරෙන් යුක්ත ව ගමට පිවිසියහු දැ" යි ආයුෂ්මත් අනඳ තෙරුන්ගෙන් ඇසූහ. "ඇවැත්නි, සැබව. භාග්‍යවතුන් වහන්සේ විසින් 'උතුරුසඟසිවුර හා අඳනාසිවුරෙන් යුක්ත ව ගම් නො වැදිය යුතු ය' යි පණවන ලද්දේ ය. එහෙත් මම අසතියෙන් ගමට පිවිසියෙමි" යි කී ය.

21. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සඟළසිවුර බහා තැබීමට මේ කරුණු පසෙක් වේ: ගිලන් හෝ වේ ද, වැසිලකුණක් හෝ වේ ද, ගඟකින් එතෙර ගමනක් හෝ වේ ද, අගුලෙන් ආරක්‍ෂා කළ (යතුරු ලූ දොර ඇති) විහාරයෙක් හෝ වේ ද, අතුල කඨිනය හෝ වේ ද, මහණෙනි, මේ පස සඟළසිවුර බහා තැබීමට කරුණු ය.

22. "මහණෙනි, උතුරුසඟසිවුර බහා තැබීමට මේ කරුණු පසෙක් වේ: ගිලන් හෝ වේ ද, වැසිලකුණක් හෝ වේ ද, ගඟින් එතෙර ගමනක් හෝ වේ ද, අගුලෙන් ආරක්‍ෂා කළ විහාරයෙක් හෝ වේ ද, අතුල කඨිනය හෝ වේ ද, මහණෙනි, මේ පස උතුරුසඟසිවුර බහා තැබීමට කරුණු ය.

23. "මහණෙනි, අඳනාසිවුර බහා තැබීමට මේ කරුණු පසෙක් වේ: ගිලන් හෝ වේ ද, වැසි ලකුණක් හෝ වේ ද, ගඟින් එතෙර ගමනක් හෝ වේ ද, අගුලෙන් ආරක්‍ෂා කළ විහාරයෙක් හෝ වේ ද, අතුල කඨිනය හෝ වේ ද, මහණෙනි, මේ පස අඳනාසිවුර බහා තැබීමට කරුණු ය.

24. "මහණෙනි, වැසිසළුව බහා තැබීමට මේ කරුණු පසෙක් වේ: ගිලන් හෝ වේ ද, සීමාවෙන් බැහැර ගමනක් හෝ වේ ද, ගඟින් එතර ගමනක් හෝ වේ ද, අගුලෙන් ආරක්‍ෂා කළ විහාරයෙක් හෝ වේ ද, වැසිසළුව නො කරණ ලද්දේ හෝ අඩාල කරණ ලද්දේ හෝ වේ ද, මහණෙනි, මේ පස වැසිසළුව බහා තැබීමට කරුණු ය" යි වදාළ සේක.

25. එකල්හි එක්තරා මහණෙක් තෙමේ තනි ව වස් විසී ය. එහි මිනිස්සු "සඞ්ඝයාට දෙමු" යි සිවුරු දුන්හ. එකල්හි "භාග්‍යවතුන් වහන්සේ විසින් චතුර්වර්ගීය (සිවු දෙන) පශ්චිම (අඩු ම ගණනින්) සඞ්ඝයා යි පණවන ලද්දේ ය. මම ද එකලා වෙමි. මේ මිනිස්සු ද 'සඞ්ඝයාට දෙමු' යි සිවුරු දුන්හ. මම මේ සඟසතුසිවුරු සැවැත්නුවරට ගෙණ යන්නෙම් නම්, යෙහෙකැ" යි ඒ මහණහුට අදහස් වී ය. ඉක්බිති ඒ මහණ තෙමේ ඒ සිවුරු ගෙණ සැවැත්නුවරට ගොස් භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැල-කෙළේ ය. "මහණ, කඨිනය ඉදිරීම තෙක් ඒ සිවුරු තට ම අයත් ය" යි වදාළසේක.

26. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු එකකො වස්සං වසති. තත්ථ මනුස්සා 'සඞ්ඝස්ස දෙමා' ති චීවරානි දෙන්ති. අනුජානාමි භික්ඛවෙ, තස්සෙව තානි චීවරානි යාව කඨිනස්ස උබ්භාරායා" ති.

27. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු උතුකාලං එකකො වසි. තත්ථ මනුස්සා "සඞ්ඝස්ස දෙමා" ති චීවරානි අදංසු. අථ ඛො තස්ස භික්ඛුනො එතදහොසි: "භගවතා පඤ්ඤත්තං 'චතුවග්ගො පච්ඡිමො සඞ්ඝො' ති. අහඤ්චම්හි එකකො. ඉමෙ ච මනුස්සා 'සඞ්ඝස්ස දෙමා' ති චීවරානි අදංසු. යන්නූනාහං ඉමානි සඞ්ඝිකානි චීවරානි සාවත්ථිං හරෙය්‍යං" න්ති. අථ ඛො සො භික්ඛු තානි චීවරානි ආදාය සාවත්ථිං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, සම්මුඛීභූතෙන සඞ්ඝෙන භාජෙතුං."

28. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු උතුකාලං එකකො වසති. තත්ථ මනුස්සා 'සඞ්ඝස්ස දෙමා' ති චීවරානි දෙන්ති. අනුජානාමි භික්ඛවෙ, තෙන භික්ඛුනා තානි චීවරානි 'අධිට්ඨාතුං මය්හං ඉමානි චීවරානී' ති. තස්ස චෙ භික්ඛවෙ, භික්ඛුනො තං චීවරං අනධිට්ඨිතෙ අඤ්ඤො භික්ඛු ආගච්ඡති, සමකො දාතබ්බො භාගො. තෙහි චෙ භික්ඛවෙ, භික්ඛූහි තං චීවරං භාජියමානෙ අපාතිතෙ කුසෙ අඤ්ඤො භික්ඛු ආගච්ඡති, සමකො දාතබ්බො භාගො. තෙහි චෙ භික්ඛවෙ, භික්ඛූහි තං චීවරං භාජියමානෙ පාතිතෙ කුසෙ අඤ්ඤො භික්ඛු ආගච්ඡති, න අකාමා දාතබ්බො භාගො" ති.

29. තෙන ඛො පන සමයෙන ද්වෙ භාතුකා[1] ථෙරා ආයස්මා ච **ඉසිදාසො** ආයස්මා ච **ඉසිභද්දො** සාවත්ථියං වස්සං වුත්ථා අඤ්ඤතරං ගාමකාවාසං අගමංසු. මනුස්සා "චිරස්සාපි ථෙරා ආගතා" ති සචීවරානි භත්තානි අදංසු[2]. ආවාසිකා භික්ඛූ ථෙරෙ පුච්ඡිංසු: "ඉමානි භන්තෙ සඞ්ඝිකානි චීවරානි ථෙරෙ ආගම්ම උප්පන්නානි. සාදියිස්සන්ති ථෙරා භාගං" න්ති. ථෙරා එවමාහංසු: "යථා ඛො මයං ආවුසො භගවතා ධම්මං දෙසිතං ආජානාම, තුම්හාකංයෙවෙතානි[3] චීවරානි යාව කඨිනස්ස උබ්භාරායා" ති.

30. තෙන ඛො පන සමයෙන තයො භික්ඛූ **රාජගහෙ** වස්සං වසන්ති. තත්ථ මනුස්සා "සඞ්ඝස්ස දෙමා" ති චීවරානි දෙන්ති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "භගවතා පඤ්ඤත්තං 'චතුවග්ගො පච්ඡිමො සඞ්ඝො' ති. මයඤ්චම්හා තයො ජනා. ඉමෙ ච මනුස්සා 'සඞ්ඝස්ස දෙමා' ති චීවරානි දෙන්ති. කථන්නු ඛො අම්හෙහි පටිපජ්ජිතබ්බ" න්ති.

31. තෙන ඛො පන සමයෙන සම්බහුලා ථෙරා ආයස්මා ච **නීලවාසී**, ආයස්මා ච **සාණවාසී**, ආයස්මා ච **ගොපකො**, ආයස්මා ච **භගු**, ආයස්මා ච **ඵලිකසන්දානො පාටලිපුත්තෙ** විහරන්ති **කුක්කුටාරාමෙ**. අථ ඛො තෙ භික්ඛූ පාටලිපුත්තං ගන්ත්වා ථෙරෙ පුච්ඡිංසු. ථෙරා එවමාහංසු: "යථා ඛො මයං ආවුසො, භගවතා ධම්මං දෙසිතං ආජානාම, තුම්හාකංයෙව තානි චීවරානි යාව කඨිනස්ස උබ්භාරායා" ති.

1. "භාතිකා" ම ඡ සං. 2. "අදංසු" ම ඡ සං. PTS.
3. "තුම්හාකං යෙව තානි" ම ඡ සං. PTS

26. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ එකලා ව වස් වසයි. එහි මිනිස්සු 'සඞ්ඝයාට දෙමු' යි සිවුරු දෙත්. මහණෙනි, ඒ සිවුරු කඨිනය ඉදිරීම තෙක් ඒ මහණහුට ම අයත් ය යි අනුදනිමි."

27. එකල්හි එක්තරා මහණෙක් තෙමේ සෘතුකාලයෙහි (වස්සානයෙන් අන්‍යකාලයෙහි) එකලා ව විසී ය. එහි මිනිස්සු "සඞ්ඝයාට දෙමු" යි සිවුරු දුන්හ. ඉක්බිති ඒ මහණහුට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'චතුර්වර්ගීය පශ්චිමසඞ්ඝයා' යි පණවන ලද්දේ ය. මම ද එකලා වෙමි. මේ මිනිස්සු ද 'සඞ්ඝයාට දෙමු' යි සිවුරු දුන්හ. මම මේ සඟසතු සිවුරු **සැවැත්**නුවරට ගෙණ යන්නෙම් නම් යෙහෙකැ" යි අදහස් වී ය. අනතුරු ව ඒ මහණ තෙමේ ඒ සිවුරු ගෙණ සැවැත්නුවරට ගොස් මේ කරුණ භික්ෂූන්ට සැලකෙළේ ය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, හමු වූ සඞ්ඝයා විසින් බෙදන්නට අනුදනිමි."

28. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ සෘතුකාලයෙහි එකලා ව වසයි. එහි මිනිස්සු 'සඞ්ඝයාට දෙමු' යි සිවුරු දෙත්. මහණෙනි, ඒ මහණහු විසින් 'මේ සිවුරු මා සතු ය' යි ඒ සිවුරු ඉටන්නට අනුදනිමි. මහණෙනි, ඒ මහණහුගේ ඒ සිවුරු නො ඉටූ කල්හි අන් මහණෙක් එයි නම්, සම කොටසක් දිය යුතු ය. මහණෙනි, ඒ මහණුන් විසින් ඒ සිවුරු බෙදනු ලබන කල්හි කුසපත් නො හෙළූ කල්හි අන් මහණෙක් එයි නම්, සම කොටසක් දිය යුතු ය. මහණෙනි, ඒ භික්ෂූන් විසින් ඒ සිවුරු බෙදනු ලබන කල්හි කුසපත් හෙළූ කල්හි අන් මහණෙක් එයි නම්, නො කැමැත්තෙන් කොටසක් නො දිය යුතු ය" යි වදාළ සේක..

29. එකල්හි ආයුෂ්මත් **ඉසිදාස** ආයුෂ්මත් **ඉසිභද්ද** යන සහෝදර තෙරවරු දෙනම සැවැත්නුවර වස් වසා නිම කළාහු එක්තරා ගමක පිහිටි ආවාසයකට ගියහ. මිනිස්සු "බොහෝ කලකින් තෙරවරු ආහ" යි සිවුරු සහිත ව බත් පිළියෙළ කළහ. ආවාසික භික්ෂූහු "ස්වාමීනි, මේ සඟසතුසිවුරු තෙරුන් නිසා ලැබුනේ ය. ස්ථවිරයන් වහන්සේලා කොටස ඉවසන්නාහු ද" යි තෙරුන් විචාළාහු ය. "ඇවැත්නි, අපි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ විනයදහම් යම් ලෙසකින් දනිමු ද, (එ ලෙසින්) කඨිනය ඉදිරීම තෙක් ඒ සිවුරු ඔබ වහන්සේලාට ම අයත් ය" යි ඒ ස්ථවිරයන් වහන්සේලා මෙසේ කීහ.

30. එකල්හි තෙනමක් භික්ෂූහු **රජගහ**නුවර වස් වසත්. එහි මිනිස්සු "සඞ්ඝයාට දෙමු" යි සිවුරු දෙත්. එකල්හි ඒ භික්ෂූන්ට "භාග්‍යවතුන් වහන්සේ විසින් 'චතුර්වර්ගීය පශ්චිමසඞ්ඝයා' යි පණවන ලද්දේ ය. අපි ද තිදෙනෙක් වෙමු. මේ මිනිස්සු ද 'සඞ්ඝයාට දෙමු' යි සිවුරු දෙත්. අප විසින් කෙසේ කළ යුතු ද" යි අදහස් වී ය.

31. එකල්හි ආයුෂ්මත් **නීලවාසී** තෙමේ ද ආයුෂ්මත් **සාණවාසී** තෙමේ ද ආයුෂ්මත් **ගොපක** තෙමේ ද ආයුෂ්මත් **භගු** තෙමේ ද ආයුෂ්මත් **ඵළිකසන්දන** තෙමේ ද යන බොහෝ-ස්ථවිරයන් වහන්සේලා **පාටලිපුත්‍ර** නගරයෙහි වූ **කුක්කුටාරාමයෙහි** වාසය කෙරෙත්. ඉක්බිති ඒ භික්ෂූහු පාටලිපුත්‍රනගරයට ගොස් තෙරුන් විචාළාහු ය. ස්ථවිරයන් වහන්සේලා "ඇවැත්නි, අපි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ විනයදහම් යම් ලෙසකින් දනිමු ද, (එ ලෙසින්) කඨිනය ඉදිරීම තෙක් ඒ සිවුරු ඔබ වහන්සේලාට ම අයත් ය" යි මෙසේ කීහ.

32. තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො සාවත්ථියං වස්සං වුත්ථො අඤ්ඤතරං ගාමකාවාසං අගමාසි. තත්ථ භික්ඛූ[1] චීවරං භාජෙතුකාමා සන්නිපතිංසු. තෙ එවමාහංසු: "ඉමානි ඛො ආවුසො සඞ්ඝිකානි චීවරානි භාජියිස්සන්ති. සාදියිස්සසි භාග ? න්ති." "ආමාවුසො සාදියිස්සාමී" ති. තතො චීවරභාගං ගහෙත්වා අඤ්ඤං ආවාසං අගමාසි. තත්ථපි භික්ඛූ චීවරං භාජෙතුකාමා සන්නිපතිංසු. තෙපි එවමාහංසු: "ඉමානි ඛො ආවුසො සඞ්ඝිකානි චීවරානි භාජියිස්සන්ති. සාදියිස්සසි භාග න්ති ?" "ආමාවුසො සාදියිස්සාමී"ති තතොපි චීවරභාගං ගහෙත්වා අඤ්ඤං ආවාසං අගමාසි. තත්ථපි භික්ඛූ චීවරං භාජෙතුකාමා සන්නිපතිංසු. තෙපි එවමාහංසු: "ඉමානි ඛො ආවුසො සඞ්ඝිකානි චීවරානි භාජියිස්සන්ති. සාදියිස්සසි භාගන්ති ?" "ආමාවුසො සාදියිස්සාමී" ති තතොපි චීවරභාගං ගහෙත්වා මහන්තං චීවරභණ්ඩිකං[2] ආදාය පුනදෙව සාවත්ථිං පච්චාගඤ්ඡි.

33. භික්ඛූ එවමාහංසු: "මහාපුඤ්ඤොසි ත්වං ආවුසො උපනන්ද, බහුං තෙ චීවරං උප්පන්නන්ති." "කුතො මෙ ආවුසො පුඤ්ඤං ? ඉධාහං ආවුසො සාවත්ථියං වස්සං වුත්ථො අඤ්ඤතරං ගාමකාවාසං අගමාසිං. තත්ථ භික්ඛූ චීවරං භාජෙතුකාමා සන්නිපතිංසු. තෙ මං[3] එවමාහංසු: 'ඉමානි ඛො ආවුසො සඞ්ඝිකානි චීවරානි භාජියිස්සන්ති. සාදියිස්සසි භාග න්ති.' 'ආමාවුසො සාදියිස්සාමී' ති තතො චීවරභාගං ගහෙත්වා අඤ්ඤං ආවාසං අගමාසිං. තත්ථපි භික්ඛූ චීවරං භාජෙතුකාමා සන්නිපතිංසු. තෙපි මං එවමාහංසු: 'ඉමානි ඛො ආවුසො සඞ්ඝිකානි චීවරානි භාජියිස්සන්ති. සාදියිස්සසි භාගන්ති.' 'ආමාවුසො සාදියිස්සාමී"ති තතොපි චීවරභාගං ගහෙත්වා අඤ්ඤං ආවාසං අගමාසිං. තත්ථපි භික්ඛූ චීවරං භාජෙතුකාමා සන්නිපතිංසු. තෙපි මං එවමාහංසු: 'ඉමානි ඛො ආවුසො සඞ්ඝිකානි චීවරානි භාජියිස්සන්ති. සාදියිස්සසි භාගන්ති.' 'ආමාවුසො සාදියිස්සාමී' ති තතොපි චීවරභාගං අග්ගහෙසිං. එවං මෙ බහුං චීවරං උප්පන්න"න්ති.

34. "කිං පන ත්වං ආවුසො උපනන්ද, අඤ්ඤත්‍ර වස්සං වුත්ථො අඤ්ඤත්‍ර චීවරභාගං සාදියී"ති[4] "එවමාවුසො" ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති. ඛීයන්ති. විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො අඤ්ඤත්‍ර වස්සං වුත්ථො අඤ්ඤත්‍ර චීවරභාගං සාදියිස්සතී"ති.

35. භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර ත්වං උපනන්ද, අඤ්ඤත්‍ර වස්සං වුත්ථො අඤ්ඤත්‍ර චීවරභාගං සාදියී" ති. "සච්චං භගවා". විගරහි බුද්ධො භගවා: "කථං හි නාම ත්වං මොඝපුරිස, අඤ්ඤත්‍ර වස්සං වුත්ථො අඤ්ඤත්‍ර චීවරභාගං සාදියිස්සසි, නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: න භික්ඛවෙ අඤ්ඤත්‍ර වස්සං වුත්ථෙන අඤ්ඤත්‍ර චීවරභාගො සාදිතබ්බො. යො සාදි- යෙය්‍ය ආපත්ති දුක්කටස්සා" ති.

36. තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො එකො ද්වීසු ආවාසෙසු වස්සං වසි "එවං මෙ බහුං චීවරං උප්පජ්ජිස්සතී" ති. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "කථන්නු ඛො ආයස්මතො උප- නන්දස්ස සක්‍යපුත්තස්ස චීවරපටිවිංසො දාතබ්බො" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "දෙථ භික්ඛවෙ, මොඝපුරිසස්ස එකාධිප්පායං."

---

1. "තත්ථ ච භික්ඛූ" ම ඡ සං. 2. "භණ්ඩිකං" ම ඡ සං. PTS.
3. "තෙපිමං" PTS. අ වි. ජ වි. තො වි.
4. "සාදියිස්සති" තො වි. ම නුප. ජ වි.

32. එකල්හි ශාක්‍යපුත්‍රීය වූ ආයුෂ්මත් **උපනන්ද** ස්ථවිර තෙමේ **සැවැත්**නුවර වස් වැස නිම කෙළේ එක්තරා ගමක පිහිටි ආවාසයකට ගියේ ය. එහි භික්ෂූහු සිවුරු බෙදනු කැමැති ව රැස් වූහ. ඒ භික්ෂූහු "ඇවැත, සඟසතු වූ මේ සිවුරු බෙදනු ලැබේ. කොටස ඉවසන්නෙහි දැ" යි (උපනන්ද තෙරුන්) විචාළාහු ය. "ඇවැත්නි, එසේ ය. ඉවසන්නෙමි" යි එතැනින් සිවුරුකොටස ගෙණ අන් ආවාසයකට ගියේ ය. එහි ද භික්ෂූහු සිවුරු බෙදනු කැමැති ව රැස් වූහ. ඒ භික්ෂූහු ද "ඇවැත, සඟසතු වූ මේ සිවුරු බෙදනු ලැබේ. කොටස ඉවසන්නෙහි දැ" යි මෙසේ ඇසූහ. "ඇවැත්නි, එසේ ය. ඉවසන්නෙමි" යි එතැනින් ද සිවුරු කොටස ගෙණ අන් ආවාසයකට ගියේ ය. එහි ද භික්ෂූහු සිවුරු බෙදනු කැමැති ව රැස් වූහ. ඒ භික්ෂූහු ද ඇවැත, සඟසතු වූ මෙ සිවුරු බෙදනු ලැබේ. කොටස ඉවසන්නෙහි දැ" යි මෙසේ ඇසූහ. "ඇවැත්නි, එසේ ය. ඉවසන්නෙමි" යි එතැනින් ද සිවුරුකොටස පිළිගෙණ මහත් සිවුරුපොදියක් ගෙණ නැවැත සැවැත්නුවරට පෙරළා ආයේ ය.

33. භික්ෂූහු "ඇවැත, උපනන්දය, තෝ මහපිණැත්තෙහිය. ඔබට බොහෝ සිවුරු ලැබී තිබේ" යි මෙසේ කීහ. "ඇවැත්නි, මට පින් කොයින් ද? ඇවැත්නි, මම මෙහි සැවැත්නුවර වස් වැස නිම කෙළෙමි එක්තරා ගමක පිහිටි ආවාසයකට ගියෙමි. එහි භික්ෂූහු සිවුරු බෙදනු කැමැති ව රැස් වූහ. ඒ භික්ෂූහු 'ඇවැත්නි, මේ සඟසතු වූ සිවුරු බෙදනු ලැබේ. කොටස ඉවසන්නෙහි දැ' යි මාගෙන් මෙසේ ඇසූහ. 'ඇවැත්නි, එසේ ය. ඉවසන්-නෙමි' යි එතැනින් සිවුරුකොටස ගෙණ අන් ආවාසයකට ගියෙමි. එහි ද භික්ෂූහු සිවුරු බෙදනු කැමැති ව රැස් වූහ. ඒ භික්ෂූහු ද 'ඇවැත්නි, මේ සඟසතුසිවුරු බෙදනු ලැබේ. කොටස ඉවසන්නෙහි දැ' යි මාගෙන් මෙසේ ඇසූහ. 'ඇවැත්නි, එසේ ය. ඉවසන්නෙමි' යි එතැනින් ද සිවුරු කොටස ගෙණ අන් ආවාසයකට ගියෙමි. එහි ද භික්ෂූහු සිවුරු බෙදනු කැමති ව රැස් වූහ. ඒ භික්ෂූහු ද 'ඇවැත, මේ සඟසතුසිවුරු බෙදනු ලැබේ. කොටස ඉවසන්නෙහි දැ' යි මාගෙන් මෙසේ ඇසූහ. 'ඇවැත්නි, එසේ ය. ඉවසන්නෙමි" යි එතැනින් ද සිවුරුකොටස ගත්තෙමි. මට බොහෝ සිවුරු ලැබුනේ මෙසේ ය" යි කී ය.

34. "ඇවැත, උපනන්දය, කිම? තෝ අන් තැනෙක වස් වැස නිම කෙළෙහි අන් තැනෙක සිවුරු කොටස ඉවසූයෙහි දැ" යි ඇසූහ. "ඇවැත්නි, එසේ" යි කී ය. අල්පෙච්ඡ වූ -පෙ- යම් ඒ භික්ෂූහු වෙත් ද, ඒ භික්ෂූහු "ශාක්‍යපුත්‍රීය වූ ආයුෂ්මත් උපනන්ද තෙමේ කෙසේ නම් අන් තැනෙක වස් වැස නිම කෙළේ අන් තැනෙක සිවුරු කොටස ඉවසී දැ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්.

35. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "උපනන්දය, සැබෑ ද? තෝ අන් තැනෙක වස් වැස නිම කෙළෙහි අන් තැනෙක සිවුරු කොටස ඉවසූයෙහි ද?" "භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය." භාග්‍යවත් බුදුරජා-නන් වහන්සේ ගැරහූ සේක. "හිස් පුරුෂය, අන් තැනෙක වස් වැස නිම කෙළෙහි අන් තැනෙක සිවුරු කොටස කෙසේ නම් ඉවසූයෙහි ද? හිස් පුරුෂය, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ. -පෙ- ගරහා දැහැමි කතා කොට "මහණෙනි, අන් තැනෙක වස් වැස නිම කළහු විසින් අන් තැනෙක සිවුරු කොටස නො ඉවසිය යුතු ය. යමෙක් ඉවසන්නේ නම්, දුකුළාඇවැත් වේ" යි වදාළ සේක.

36. එකල්හි ශාක්‍යපුත්‍රීය වූ ආයුෂ්මත් උපනන්ද ස්ථවිර තෙමේ "මෙසේ ඇති කල්හි මට බොහෝ සිවුරු ලැබෙන්නේ ය" යි හුදකලා වූයේ ආවාස දෙකක වස් විසී ය. එකල්හි ඒ භික්ෂූන්ට "ශාක්‍යපුත්‍රීය වූ ආයුෂ්මත් උපනන්ද තෙරුන්ට කෙසේ නම් සිවුරුකොටස දිය යුතු දැ" යි අදහස් වී ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, හිස් පුරුෂයාහට එක් (පුද්ගලයෙකුගේ) කොටසක් දෙවු" යි වදාළ සේක.

37. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු එකො ද්වීසු ආවාසෙසු වස්සං වසති 'එවං මෙ බහුං චීවරං උප්පජ්ජිස්සතී' ති. සචෙ අමුත්‍ර උපඩ්ඪං වසති, අමුත්‍ර උපඩ්ඪං වසති, අමුත්‍ර උපඩ්ඪො, අමුත්‍ර උපඩ්ඪො චීවරපටිවිංසො දාතබ්බො. යත්‍ථ වා පන බහුතරං වසති, තතො චීවරපටිවිංසො දාතබ්බො" ති.

38. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො කුච්ඡිවිකාරාබාධො හොති. සො සකෙ මුත්තකරීසෙ පලිපන්නො සෙති. අථ ඛො භගවා ආයස්මතා ආනන්දෙන පච්ඡාසමණෙන සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො යෙන තස්ස භික්ඛුනො විහාරො තෙනුපසඞ්කමි.

39. අද්දසා ඛො භගවා තං භික්ඛුං සකෙ මුත්තකරීසෙ පලිපන්නං සෙමානං[1]. දිස්වාන යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොච: "කිං තෙ භික්ඛු, ආබාධො" ති. "කුච්ඡිවිකාරො මෙ භගවා" ති. "අත්‍ථි පන තෙ භික්ඛු, උපට්ඨාකො" ති. "නත්‍ථි භගවා" ති. "කිස්ස තං භික්ඛූ න උපට්ඨෙන්තී" ති.[2] "අහං ඛො භන්තෙ භික්ඛූනං අකාරකො. තෙන මං භික්ඛූ න උපට්ඨෙන්තී" ති.

40. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "ගච්ඡානන්ද, උදකං ආහර. ඉමං භික්ඛුං නහාපෙස්සාමා" ති. "එවං භන්තෙ" ති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා උදකං ආහරි. භගවා උදකං ආසිඤ්චි. ආයස්මා ආනන්දො පරිධොවි. භගවා සීසතො අග්ගහෙසි. ආයස්මා ආනන්දො පාදතො. උච්චාරෙත්වා මඤ්චකෙ නිපාතෙසුං.

41. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි: "අත්‍ථි භික්ඛවෙ, අමුකස්මිං විහාරෙ භික්ඛු ගිලානො" ති. "අත්‍ථි භගවා" ති. "කිං තස්ස භික්ඛවෙ, භික්ඛුනො ආබාධො" ති. "තස්ස භන්තෙ ආයස්මතො කුච්ඡිවිකාරාබාධො" ති. "අත්‍ථි පන භික්ඛවෙ, තස්ස භික්ඛුනො උපට්ඨාකො" ති. "නත්‍ථි භගවා" ති. "කිස්ස තං භික්ඛූ න උපට්ඨෙන්තී" ති. "එසො භන්තෙ, භික්ඛු භික්ඛූනං අකාරකො. තෙන තං භික්ඛූ න උපට්ඨෙන්තී" ති.

42. "නත්‍ථි වො භික්ඛවෙ, මාතා, නත්‍ථි පිතා, යෙ වො උපට්ඨහෙය්‍යුං. තුම්හෙ චෙ භික්ඛවෙ, අඤ්ඤමඤ්ඤං න උපට්ඨහිස්සථ, අථ කො චරහි උපට්ඨහිස්සති. යො භික්ඛවෙ, මං උපට්ඨහෙය්‍ය, සො ගිලානං උපට්ඨහෙය්‍ය. සචෙ උපජ්ඣායො හොති, උපජ්ඣායෙන යාවජීවං උපට්ඨාතබ්බො. වුට්ඨානමස්ස ආගමෙතබ්බං. සචෙ ආචරියො හොති, ආචරියෙන යාවජීවං උපට්ඨාතබ්බො. වුට්ඨානමස්ස ආගමෙතබ්බං. සචෙ සද්ධිවිහාරිකො හොති, සද්ධිවිහාරිකෙන යාවජීවං උපට්ඨාතබ්බො. වුට්ඨානමස්ස ආගමෙතබ්බං. සචෙ අන්තෙවාසිකො හොති, අන්තෙවාසිකෙන යාවජීවං උපට්ඨාතබ්බො. වුට්ඨානමස්ස ආගමෙතබ්බං. සචෙ සමානුපජ්ඣායකො හොති, සමානුපජ්ඣායකෙන යාවජීවං උපට්ඨාතබ්බො. වුට්ඨානමස්ස ආගමෙතබ්බං. සචෙ සමානාචරියකො හොති, සමානාචරියකෙන යාවජීවං උපට්ඨාතබ්බො. වුට්ඨානමස්ස ආගමෙතබ්බං. සචෙ න හොති උපජ්ඣායො වා ආචරියො වා සද්ධිවිහාරිකො වා අන්තෙවාසිකො වා සමානුපජ්ඣායකො වා සමානාචරියකො වා, සඞ්ඝෙන උපට්ඨාතබ්බො. නො චෙ උපට්ඨහෙය්‍ය, ආපත්ති දුක්කටස්ස.

1. "සයමානං" මජසං. PTS    2. "උපට්ඨහන්ති" මජසං.

37. “මහණෙනි, මෙහි මහණෙක් තෙමේ ‘මෙසේ ඇති කල්හි මට බොහෝ සිවුරු ලැබෙන්නේ ය’ යි හුදකලා ව ආවාස දෙකෙක වස් වසයි. ඉදින් අසවල් තැන අඩක් වෙසේ ද, අසවල් තැන අඩක් වෙසේ ද, අසවල් තැන භාගයක් ද, අසවල් තැන භාගයක් දැ යි (මෙසේ) සිවුරුකොටස දිය යුතු ය. යම් තැනෙක වැඩියක් වෙසේ නම්, එතැනින් (එක් පුද්ගලයකු ලබන සම්පූර්ණ) සිවුරු කොටස දිය යුතු ය” යි වදාළහ.*

38. එකල්හි එක්තරා මහණකුහට කුසරුජාවක් වේ. හෙ තෙමේ සිය මලමූත්‍රයෙහි වැතිරී හොවි යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් පසු ව යන මහණහු කොට සෙනාසනචාරිකාවෙහි වඩිනා සේක් ඒ මහණහුගේ විහාරයට වැඩියහ.

39. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ස්වකීයමලමූත්‍රයෙහි වැතිරී නිදන ඒ මහණහු දුටු සේක. දැක ඒ මහණහු වෙතට වැඩි සේක. වැඩ “මහණ තාගේ ආබාධය කිමැ” යි ඒ මහණහු විචාළ සේක. “භාග්‍යවතුන් වහන්ස, මට කුසරුජාවක් වේ”. “මහණ, තට උපස්ථායකයෙක් ඇත්තේ ද ?” “භාග්‍යවතුන් වහන්ස, නැත”. කුමක් හෙයින් භික්ෂූහු තට උවැටන් නො කෙරෙත් ද ?” “ස්වාමීනි, මම භික්ෂූන්ට (උවැටන්) නො කරන්නෙක් වෙමි. එහෙයින් භික්ෂූහු මට උවැටන් නො කෙරෙත්”.

40. එකල්හි භාග්‍යවතුන් වහන්සේ “ආනන්දය, යව. දිය ගෙණ එව. මේ මහණ නාවමු” යි ආයුෂ්මත් අනඳ තෙරුන්ට වදාළ සේක. “ස්වාමීනි, එසේ ය” යි ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී දිය ගෙණ ආයේ ය. භාග්‍යවතුන් වහන්සේ දිය වක් කළහ. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ සේදූයේ ය. භාග්‍යවතුන් වහන්සේ හිසින් ගත් සේක. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ දෙපසින් ගත්තේ ය. (මෙසේ) ඔසොවා ඇඳෙහි හොවා ලූහ.

41. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ කාරණයෙහි භික්ෂුසඞ්ඝයා රැස් කරවා “මහණෙනි, අසවල් විහාරයෙහි ගිලන් මහණෙක් ඇත්තේ දැ” යි භික්ෂූන් විචාළ සේක. “භාග්‍යවතුන් වහන්ස, ඇත්තේ ය”. “මහණෙනි, ඒ මහණහුගේ ආබාධය කිම ?” “ස්වාමීනි, ඒ ආයුෂ්මත්හුහට කුසරුජාවක් වේ”. “මහණෙනි, ඒ මහණහුට උවැටන් කරන්නෙක් වේ ද ?” “භාග්‍යවතුන් වහන්ස, නැත්තේ ය”. “කුමක් හෙයින් භික්ෂූහු ඔහුට උවැටන් නො කරත් ද ?” “ස්වාමීනි, මේ මහණ තෙමේ භික්ෂූන්ට උවැටන් නො කරන්නෙක් වේ. එහෙයින් භික්ෂූහු ඔහුට උවැටන් නො කෙරෙත්” යි කීහ.

42. “මහණෙනි, යම් කෙනෙක් තොපට උවැටන් කරන්නාහු ද, තොපට එබඳු මවක් නැත. පියෙක් නැත. මහණෙනි, තෙපි ඔවුනොවුන්ට උවැටන් නො කරන්නාහු නම් එකල්හි කවරෙක් උවැටන් කරන්නේ ද ? **මහණෙනි, යමෙක් මාගේ අවවාදය කරන්නේ නම්, හෙ තෙමේ ගිලනහුට උවැටන් කරන්නේ ය.** උපාධ්‍යායයෙක් වේ නම්, උපාධ්‍යායයා විසින් ජීවත් වන තෙක් උවැටන් කළ යුතු ය. ඔහුගේ ලෙඩින් නැඟී සිටීම බලාපොරොත්තු විය යුතු ය. ඇදුරෙක් වේ නම්, ඇදුරා විසින් ජීවත් වන තෙක් උවැටන් කළ යුතු ය. ඔහුගේ ලෙඩින් නැඟී සිටීම බලාපොරොත්තු විය යුතු ය. සද්ධිවිහාරිකයෙක් වේ නම්, සද්ධිවිහාරිකයා විසින් ජීවත් වන තෙක් උවැටන් කළ යුතු ය. ඔහුගේ ලෙඩින් නැඟී සිටීම බලාපොරොත්තු විය යුතු ය. අතැවැසියෙක් වේ නම්, අතැවැසියා විසින් ජීවත් වන තෙක් උවැටන් කළ යුතු ය. ඔහුගේ ලෙඩින් නැඟී සිටීම බලපොරොත්තු විය යුතු ය. සමානොපාධ්‍යායයෙක්* වේ නම්, සමානොපාධ්‍යායයා විසින් ජීවත් වන තෙක් උවැටන් කළ යුතු ය. ඔහුගේ ලෙඩින් නැඟී සිටීම බලාපොරොත්තු විය යුතු ය. සමානාචාර්‍ය්‍යයෙක්* වේ නම් සමානාචාර්‍ය්‍යයා විසින් ජීවත් වන තුරු උවැටන් කළ යුතු ය. ඔහුගේ ලෙඩින් නැඟී සිටීම බලාපොරොත්තු විය යුතු ය. උපාධ්‍යායයෙක් හෝ ආචාර්‍ය්‍යයෙක් හෝ සද්ධිවිහාරිකයෙක් හෝ අතැවැසියෙක් හෝ සමානොපාධ්‍යායයෙක් හෝ සමානාචාර්‍ය්‍යයෙක් හෝ නො වේ නම්, සඞ්ඝයා විසින් උවැටන් කළ යුතු ය. උවැටන් නො කරන්නේ නම්, දුකුලාඇවැත් වේ.

* උපග්‍රන්ථය බලනු.

Free Distribution www.aathaapi.org

43. "පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො ගිලානො දුපට්ඨො හොති: අසප්පායකාරී හොති, සප්පායෙ මත්තං න ජානාති, භෙසජ්ජං න පටිසෙවිතා හොති, අත්ථකාමස්ස ගිලානුපට්ඨාකස්ස යථාභූතං ආබාධං නාවිකත්තා හොති අභික්කමන්තං වා අභික්කමතීති පටික්කමන්තං වා පටික්කමතීති ඨිතං වා ඨිතොති, උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං[1] ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අනධිවාසකජාතිකො හොති, ඉමෙහි බො භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො ගිලානො දුපට්ඨො හොති.

44. "පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො ගිලානො සුපට්ඨො හොති: සප්පායකාරී හොති, සප්පායෙ මත්තං ජානාති, භෙසජ්ජං පටි-සෙවිතා හොති, අත්ථකාමස්ස ගිලානුපට්ඨාකස්ස යථාභූතං ආබාධං ආවිකත්තා හොති අභික්කමන්තං වා අභික්කමතීති පටික්කමන්තං වා පටික්කමතීති ඨිතං වා ඨිතො'ති, උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසකජාතිකො හොති, ඉමෙහි බො භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො ගිලානො සුපට්ඨො හොති.

45. "පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො ගිලානුපට්ඨාකො නාලං ගිලානං උපට්ඨාතුං: න පටිබලො හොති භෙසජ්ජං සංවිධාතුං, සප්පායාසප්පායං න ජානාති අසප්පායං උපනාමෙති සප්පායං අපනාමෙති, ආමිසන්තරො ගිලානං උපට්ඨාති නො මෙත්තචිත්තො, ජෙගුච්ඡී හොති උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා වන්තං වා නීහාතුං, න පටිබලො හොති ගිලානං කාලෙන කාලං ධම්මියා කථාය සන්දස්සෙතුං සමාදපෙතුං සමුත්තෙජෙතුං සම්පහංසෙතුං, ඉමෙහි බො භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො ගිලානුපට්ඨාකො නාලං ගිලානං උපට්ඨාතුං.

46. "පඤ්චහි භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතො ගිලානුපට්ඨාකො අලං ගිලානං උපට්ඨාතුං: පටිබලො හොති භෙසජ්ජං සංවිධාතුං, සප්පායාසප්පායං ජානාති අසප්පායං අපනාමෙති සප්පායං උපනාමෙති, මෙත්තචිත්තො ගිලානං උපට්ඨාති නො ආමිසන්තරො, අජෙගුච්ඡී හොති උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා වන්තං වා නීහාතුං, පටිබලො හොති ගිලානං කාලෙන කාලං ධම්මියා කථාය සන්දස්සෙතුං සමාදපෙතුං සමුත්තෙජෙතුං සම්පහංසෙතුං, ඉමෙහි බො භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො ගිලානුපට්ඨාකො අලං ගිලානං උපට්ඨාතු" න්ති.

47. තෙන බො පන සමයෙන ද්වෙ භික්ඛූ **කොසලෙසු** ජනපදෙසු අද්ධානමග්ගපටිපන්නා හොන්ති. තෙ අඤ්ඤතරං ආවාසං උපගච්ඡිංසු. තත්ථ අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති. අථ බො තෙසං භික්ඛූනං එතදහොසි: "භගවතා බො ආවුසො ගිලානුපට්ඨානං වණ්ණිතං. හන්ද මයං ආවුසො ඉමං භික්ඛුං උපට්ඨෙමා" ති[2] තෙ තං උපට්ඨහිංසු. සො තෙහි උපට්ඨියමානො[3] කාලමකාසි.

1 "තිබ්බානං" මජසං PTS. තො වි. ම නු ප.
2. "උපට්ඨහෙමාති" මජසං. PTS. 3. "උපට්ඨියමානො" මජසං. PTS.

Free Distribution www.aathaapi.org

43. "මහණෙනි, කරුණු පසකින් යුත් ගිලන් තෙමේ උවටැන් නො කට හැකි වේ: (යම් ගිලනෙක්) අහිතදෙය කරන්නේ ද, හිතදෙයෙහි පමණ නො දන්නේ ද, බෙහෙත් නැවැත නැවැත සෙවනය නො කරන්නේ ද, වැඩෙන්නා වූ රෝගය වැඩේ ය සි ද දුරු වන්නා වූ රෝගය දුරු වේ යසි ද පවත්නා වූ රෝගය පවතී යි ද වැඩ කැමැත්තා වූ ගිලන්උවැටන් කරන්නහුට ඇති සැටියෙන් ආබාධය ප්‍රකාශ කොට නො කියන්නේ ද, උපන්නා වූ සිරුරෙහි වූ දුක් වූ තියුණු වූ රළු වූ කටුක වූ අමිහිරි වූ මන නො වඩන්නා වූ දිවි හැරගන්නා වූ වෙදනාවන් නො ඉවසන සවභාව ඇත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් ගිලන් තෙමේ උවටන් කළහැකි නො වේ.

44. "මහණෙනි, කරුණු පසකින් යුත් ගිලන් තෙමේ පහසුවෙන් උවටන් කළ හැකි වේ: (යම් ගිලනෙක්) හිතදෙය කරන්නේ ද, හිතදෙයෙහි පමණ දන්නේ ද, බෙහෙත් නැවත නැවැත සෙවනය කරන්නේ ද, වැඩෙන්නා වූ රොගය වැඩේ ය සි ද දුරු වන්නා වූ රොගය දුරු වේ ය සි ද පවත්නා වූ රොගය පවතී යි ද වැඩ කැමැත්තා වූ ගිලන්උවැටන් කරන්නහුට ඇති සැටියෙන් ආබාධය ප්‍රකාශ කොට කියන්නේ ද, උපන්නා වූ සිරුරෙහි වූ දුක් වූ තියුණු වූ රළු වූ කටුක වූ අමිහිරි වූ මන නො වඩන්නා වූ දිවි හැර ගන්නා වූ වෙදනාවන් ඉවසන සවභාව ඇත්තේ වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් ගිලන් තෙමේ ඉතා පහසුවෙන් උවැටන් කළ හැක්කේ ය.

45. "මහණෙනි, කරුණු පසකින් යුත් ගිලානුපට්ඨාක තෙමේ ගිලනහුට උවැටන් කරන්නට නො සුදුසු ය: (යමෙක්) බෙහෙත් යොදන්නට සමර්ථ නො වේ ද, හිතඅහිතදෙය නො දනී ද අහිතදෙය ළං කරයි ද හිතදෙය බැහැර කරයි ද, ආමිෂයක් (ලාභයක්) කැමැත්තේ ගිලනහුට උවැටන් කරයි ද මෙත් සිත් ඇත්තේ උවැටන් නො කරයි ද, මලමූ හෝ කෙළ හෝ වමනය හෝ බැහැර කරන්නට පිළිකුල් ඇත්තේ ද, කලින් කල දැහැමි කතාවෙන් ගිලනහුට කරුණු දක්වන්නට (එහි ඔහු) සමාදන් කරවන්නට තියුණු කරවන්නට සමර්ථ නො වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් ගිලානුපට්ඨාක තෙමේ ගිලනහුට උවැටන් කරන්නට සුදුසු නො වේ.

46. "මහණෙනි, කරුණු පසකින් යුත් ගිලානුපට්ඨාක තෙමේ ගිලනහුට උවැටන් කරන්නට සුදුසු ය: (යමෙක්) බෙහෙත් යොදන්නට සමර්ථ වේ ද, හිතඅහිතදෙය දනියි ද අහිතදෙය බැහැර කෙරෙයි ද හිතදෙය ළං කෙරෙයි ද, ආමිෂයක් නො කැමැත්තේ මෙත් සිත් ඇති ව ගිලනහුට උවැටන් කෙරෙයි ද, මලමූ හෝ කෙළ හෝ වමනය හෝ බැහැර කරන්නට පිළිකුල් ඇත්තේ නො වේ ද, කලින් කල දැහැමිකතාවෙන් ගිලනහුට කරුණු දක්වන්නට (එහි ඔහු) සමාදන් කරවන්නට උත්සාහවත් කර-වන්නට සතුටු කරවන්නට සමර්ථ වේ ද, මහණෙනි, මේ කරුණු පසින් යුත් ගිලානුපට්ඨාක තෙමේ ගිලනහුට උවැටන් කරන්නට සුදුසු වේ."

47. එකල්හි දෙනමක් භික්ෂූහු කොසොල් දනව්වෙහි දීර්ඝමාර්ගයට පිළිපන්නාහු වෙත්. ඔහු එක්තරා ආවාසයකට එළඹියහ. එහි එක්තරා මහණෙක් ගිලන් වූයේ වේ. එකල්හි ඒ භික්ෂූන්ට "ඇවැත්නි, ගිලන් උවැටන භාග්‍යවතුන් වහන්සේ විසින් වර්ණනා කරණ ලද්දේ ය. ඇවැ-ත්නි, එහෙයින් අපි මේ මහණහට උවැටන් කරමු" යි අදහස් වී ය. ඔහු ඒ මහණහුට උවැටන් කළහ. ඔවුන් විසින් උවැටන් කරණු ලබන ඒ මහණ තෙමේ කලුරිය කෙළේ ය.

48. අථ ඛො තෙ භික්ඛූ තස්ස භික්ඛුනො පත්තචීවරං ආදාය සාවත්ථිං ගන්ත්වා භගවතො එතමත්ථං ආරොචෙසුං. භික්ඛුස්ස භික්ඛවෙ, කාලකතෙ සඞ්ඝො සාමි පත්තචීවරෙ. අපි ච ගිලානුපට්ඨාකා බහුකාරා. අනුජානාමි භික්ඛවෙ සඞ්ඝෙන තිචීවරං ච පත්තං ච ගිලානුපට්ඨාකානං දාතුං.

49. "එවඤ්ච පන භික්ඛවෙ, දාතබ්බං: තෙන ගිලානුපට්ඨාකෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: 'ඉත්ථන්නාමො භන්තෙ භික්ඛු කාලකතො. ඉදං තස්ස තිචීවරං ච පත්තො චා' ති. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමො භික්ඛු කාලකතො. ඉදං තස්ස තිචීවරඤ්ච පත්තො ච. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉමං තිචීවරඤ්ච පත්තඤ්ච ගිලානුපට්ඨාකානං දදෙය්‍ය. එසා ඤත්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමො භික්ඛු කාලකතො. ඉදං තස්ස තිචීවරඤ්ච පත්තො ච. සඞ්ඝො ඉමං තිචීවරඤ්ච පත්තඤ්ච ගිලානුපට්ඨාකානං දෙති. යස්සායස්මතො ඛමති ඉමස්ස තිචීවරස්ස ච පත්තස්ස ච ගිලානුපට්ඨාකානං දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය. දින්නං ඉදං සඞ්ඝෙන තිචීවරඤ්ච පත්තො ච ගිලානුපට්ඨාකානං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

50. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො සාමණෙරො කාලකතො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "සාමණෙරස්ස භික්ඛවෙ, කාලකතෙ සඞ්ඝො සාමි පත්තචීවරෙ. අපි ච ගිලානුපට්ඨාකා බහුකාරා. අනුජානාමි භික්ඛවෙ, සඞ්ඝෙන චීවරඤ්ච පත්තං ච ගිලානුපට්ඨාකානං දාතුං."

51. "එවඤ්ච පන භික්ඛවෙ, දාතබ්බං: තෙන ගිලානුපට්ඨාකෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: 'ඉත්ථන්නාමො භන්තෙ, සාමණෙරො කාලකතො. ඉදං තස්ස චීවරඤ්ච පත්තො චා' ති. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: 'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමො සාමණෙරො කාලකතො. ඉදං තස්ස චීවරඤ්ච පත්තො ච. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉමං චීවරඤ්ච පත්තඤ්ච ගිලානුපට්ඨාකානං දදෙය්‍ය. එසා ඤත්ති. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමො සාමණෙරො කාලකතො. ඉදං තස්ස චීවරඤ්ච පත්තො ච. සඞ්ඝො ඉමං චීවරඤ්ච පත්තඤ්ච ගිලානුපට්ඨාකානං දෙති. යස්සායස්මතො ඛමති ඉමස්ස චීවරස්ස ච පත්තස්ස ච ගිලානුපට්ඨාකානං දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය. දින්නං ඉදං සඞ්ඝෙන චීවරඤ්ච පත්තො ච ගිලානුපට්ඨාකානං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී" ති.

52. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ච සාමණෙරො ච ගිලානං උපට්ඨහිංසු. සො තෙහි උපට්ඨියමානො කාලමකාසි. අථ ඛො තස්ස ගිලානුපට්ඨාකස්ස භික්ඛුනො එතදහොසි: "කථං නු ඛො ගිලානුපට්ඨාකස්ස සාමණෙරස්ස චීවරපටිවිංසො දාතබ්බො" ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ, ගිලානුපට්ඨාකස්ස සාමණෙරස්ස සමකං පටිවිංසං දාතු" න්ති.

48. ඉක්බිති ඒ භික්ෂූහු ඒ කලුරිය කළ මහණහුගේ පාසිවුරු ගෙණ සැවැත්නුවරට ගොස් භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මහණකු කලුරිය කළ කල්හි සඞ්ඝතෙමේ පාසිවුරෙහි හිමියා වේ. එහෙත් ගිලානුපට්ඨාකයෝ බොහෝ උපකාර ඇත්තෝ වෙති. මහණෙනි, සඞ්ඝයා විසින් තුන් සිවුර ද පත්‍රය ද ගිලානුපට්ඨාකයන්ට දෙන්නට අනුදනිමි.

49. "මහණෙනි, මෙසේ දිය යුතු ය: ඒ ගිලානුපට්ඨාක මහණහු විසින් සඞ්ඝයා වෙත එළඹ 'ස්වාමීනි, මෙනම් ඇති මහණ තෙමේ කලුරිය කෙළේ ය. මේ ඒ මහණහුගේ තුන් සිවුර ය. මේ පාත්‍රය' යි මෙසේ කිය යුතු වන්නේ ය. ව්‍යක්ත ප්‍රතිබල වූ මහණකු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය: ස්වාමීනි, 'සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙනම් ඇති මහණ තෙමේ කලුරිය කෙළේ ය. මේ ඔහුගේ තුන් සිවුර ද පත්‍රය ද වේ. ඉදින් සඞ්ඝයාහට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ මේ තුන් සිවුර ද පාත්‍රය ද ගලානොපසථායකයන්ට දෙන්නේ ය. මේ දැන්වීම ය. ස්වාමීනි, සඞ්ඝතෙමේ මාගේ වචනය අසාවා. මෙනම් ඇති මහණ තෙමේ කලුරිය කෙළේ ය. මේ ඔහුගේ තුන් සිවුර ද පාත්‍රය ද වේ. සඞ්ඝ තෙමේ මේ තුන් සිවුර ද පාත්‍රය ද ගිලානුපට්ඨාකයන්ට දෙයි. යම් ආයුෂ්මතකුහට මේ තුන් සිවුරත් පාත්‍රයත් ගිලානුපට්ඨාකයන්ට දීම රුචි වේ නම්, හෙ තෙමේ තුෂ්ණීම්භූත වේවා. යමකුට රුචි නො වේ නම්, හෙ තෙමේ කියාවා. සඞ්ඝයා විසින් මේ තුන් සිවුර ද පාත්‍රය ද ගිලානුපට්ඨාකයන්ට දෙන ලද්දේ ය. සඞ්ඝයාට රුචි වේ. එහෙයින් තුෂ්ණීම්භූත වේ. මෙය මෙසේ දරමි" යි.

50. එකල්හි එක්තරා හෙරණෙක් කලුරිය කෙළේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, හෙරණකු කලුරිය කළ කල්හි සඞ්ඝ තෙමේ පාසිවුරෙහි හිමියා වේ. එහෙත් ගිලානුපට්ඨාකයෝ බොහෝ උපකාර ඇත්තාහු ය. මහණෙනි, සඞ්ඝයා විසින් සිවුර ද පාත්‍රය ද ගිලානු-පට්ඨාකයන්ට දෙන්නට අනුදනිමි."

51. "මහණෙනි, මෙසේ දිය යුතු ය: ඒ ගිලානුපට්ඨාක මහණහු විසින් සඞ්ඝයා වෙත එළඹ 'ස්වාමීනි, මෙනම් ඇති හෙරණ තෙමේ කලුරිය කෙළේ ය. මේ ඔහුගේ සිවුර ද පාත්‍රය ද වේ' යි මෙසේ කිය යුතු වන්නේ ය. ව්‍යක්ත ප්‍රතිබල වූ මහණකු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය: ස්වාමීනි, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. මෙනම් ඇති හෙරණ තෙමේ කලුරිය කෙළේ ය. මේ ඔහුගේ සිවුර ද පාත්‍රය ද වේ. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ මේ සිවුර ද පාත්‍රය ද ගිලානුපට්ඨාකයන්ට දෙන්නේ ය. මේ දැන්වීම ය. ස්වාමීනි, සඞ්ඝතෙමේ මාගේ වචනය අසාවා. මෙනම් ඇති හෙරණ තෙමේ කලුරිය කෙළේ ය. මේ ඔහුගේ සිවුර ද පාත්‍රය ද වේ. සඞ්ඝ තෙමේ මේ සිවුර ද පාත්‍රය ද ගිලානුපට්ඨාකයන්ට දෙයි. යම් ආයුෂ්මතකුහට මේ සිවුරත් පාත්‍රයත් ගිලානුපට්ඨාකයන්ට දීම රුචි වේ නම්, හෙ තෙමේ තුෂ්ණීම්භූත වේවා. යමකුහට රුචි නො වේ නම්, හෙ තෙමේ කියාවා. සඞ්ඝයා විසින් මේ සිවුර ද පාත්‍රය ද ගිලානුපට්ඨාකයන්ට දෙන ලද්දේ ය. සඞ්ඝයාට රුචි වේ. එහෙයින් තුෂ්ණීම්භූත වේ. මෙය මෙසේ දරමි" යි.

52. එකල්හි එක්තරා උපසපන් මහණෙක් ද හෙරණෙක් ද ගිලනකුට උවැටන් කළහ. ඔවුන් විසින් උවැටන් කරණු ලබන හෙ තෙමේ කලුරිය කෙළේ ය. එකල්හි ඒ ගිලන් උවැටන් කරණ මහණහුට "ගිලානුපට්ඨාක සාමණේරයාහට සිවුරු කොටස කෙසේ දිය යුතු දැ" යි සිත් වී ය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි ගිලානුපට්ඨාක සාමණේරයාහට සම කොටසක් දෙන්නට අනුදනිමි" යි.

53. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු බහුභණ්ඩො බහුපරික්ඛාරො කාලකතො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "භික්ඛුස්ස භික්ඛවෙ, කාලකතෙ සඞ්ඝො සාමී පත්තචීවරෙ. අපි ච ගිලානුපට්ඨාකා බහුකාරා. අනුජානාමි භික්ඛවෙ, සඞ්ඝෙන තිචීවරඤ්ච පත්තඤ්ච ගිලානුපට්ඨාකානං දාතුං. යං තත්ථ ලහුභණ්ඩං ලහුපරික්ඛාරං, තං සම්මුඛීභූතෙන සඞ්ඝෙන භාජෙතුං. යං තත්ථ ගරුභණ්ඩං ගරුපරික්ඛාරං, තං ආගතානාගතස්ස චාතුද්දිසස්ස සඞ්ඝස්ස අවිස්සජ්ජිකං අවෙභඞ්ගික"න්ති.

54: තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු නග්ගො හුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: "භගවා භන්තෙ අනෙකපරියායෙන අප්පිච්ඡස්ස සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස වණ්ණවාදී. ඉදං භන්තෙ නග්ගියං අනෙකපරියායෙන අප්පිච්ඡතාය සන්තුට්ඨියා[1] සල්ලෙඛාය ධුතත්තාය[2] පාසාදිකතාය අපචයාය විරියාරම්භාය සංවත්තති. සාධු භන්තෙ, භගවා භික්ඛූනං නග්ගියං අනුජානාතූ"ති. විගරහි බුද්ධො භගවා: "අනනුච්ඡවියං මොඝපුරිස, අනනුලොමිකං. අප්පතිරූපං. අස්සාමණකං. අකප්පියං. අකරණීයං. කථං හි නාම ත්වං මොඝපුරිස, නග්ගියං තිත්ථියසමාදානං සමාදියිස්සසි ?. නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, නග්ගියං තිත්ථියසමාදානං සමාදියිතබ්බං. යො සමාදියෙය්‍ය, ආපත්ති ථුල්ලච්චයස්සා"ති.

55. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු කුසචීරං නිවාසෙත්වා -පෙ- වාකචීරං නිවාසෙත්වා -පෙ- ඵලකචීරං නිවාසෙත්වා -පෙ- කෙසකම්බලං නිවාසෙත්වා -පෙ- වාලකම්බලං නිවාසෙත්වා -පෙ- උලූකපක්ඛං නිවාසෙත්වා -පෙ- අජිනක්ඛිපං නිවාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: "භගවා භන්තෙ අනෙකපරියායෙන අප්පිච්ඡස්ස සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස වණ්ණවාදී. ඉදං භන්තෙ, අජිනක්ඛිපං අනෙකපරියායෙන අප්පිච්ඡතාය සන්තුට්ඨියා සල්ලෙඛාය ධුතත්තාය පාසාදිකතාය අපචයාය විරියාරම්භාය සංවත්තති. සාධු භන්තෙ, භගවා භික්ඛූනං අජිනක්ඛිපං අනුජානාතූ"ති. විගරහි බුද්ධො භගවා: "අනනුච්ඡවියං මොඝපුරිස, අනනුලොමිකං. අප්පතිරූපං. අස්සාමණකං. අකප්පියං අකරණීයං. කථං හි නාම ත්වං මොඝපුරිස, අජිනක්ඛිපං තිත්ථියද්ධජං ධාරෙස්සසි. නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, අජිනක්ඛිපං තිත්ථියද්ධජං ධාරෙතබ්බං. යො ධාරෙය්‍ය, ආපත්ති ථුල්ලච්චයස්සා"ති

1. "සන්තුට්ඨිතාය" ම ඡ සං. 2. "ධුතතාය" ම ඡ සං.

51. එකල්හි බොහෝ බඩු ඇති බොහෝ පිරිකර ඇති එක්තරා මහණෙක් කලුරිය කෙළේ වේ. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, මහණකු කලුරිය කළ කල්හි සඞ්ඝ තෙමේ පාසිවුරට හිමියා වේ. එහෙත් ගිලානුපට්ඨාකයෝ බොහෝ උපකාර ඇත්තාහු වෙත්. මහණෙනි, සඞ්ඝයා විසින් තුන් සිවුර ද පාත්‍රය ද ගිලානුපට්ඨාකයන්ට දෙන්නට ද, එහි යම් ලඝුභාණ්ඩයක් වේ නම්, ලඝුපරිෂ්කාරයක් වේ නම්, එය හමු වූ සඞ්ඝයා විසින් බෙදන්නට ද, එහි යම් ගරුභාණ්ඩයක් වේ නම්, ගරු පරිෂ්කාරයක් වේ නම්, එය පැමිණි නො පැමිණි සිවුදිසාවැසි සඞ්ඝයාට අයත්, නො දිය යුතු, නො බෙදිය යුතු දෙය කොට තබන්නට ද අනුදනිමි".

52. එකල්හි එක්තරා මහණෙක් තෙමේ නග්න ව භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ක්‍රමයෙන් අල්පෙච්ඡ වූවහුගේ, ලද දෙයකින් සතුටු වූවහුගේ, කෙලෙස් ලියන පැවතුම් ඇත්තහුගේ, කෙලෙස් සලන පැවතුම් ඇත්තහුගේ, පහදවන සුලු පැවතුම් ඇත්තහුගේ, කෙලෙස් නසන පැවතුම් ඇත්තහුගේ, වීර්‍ය්‍ය ඇත්තහුගේ ගුණ කියන සේක. ස්වාමීනි, මේ නග්න භාවය නොයෙක් ක්‍රමයෙන් අල්පෙච්ඡභාවය පිණිස, ලද පමණින් සතුටු වීම පිණිස, කෙලෙස් ලියන පැවතුම් පිණිස, කෙලෙස් සලන පැවතුම් පිණිස, පහදවන සුලු පැවතුම් පිණිස, කෙලෙස් නසනු පිණිස, වීර්‍ය්‍යාරම්භය පිණිස, පවතී. ස්වාමීනි, මැනවි. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට නග්න භාවය අනුදන්නා සේක්වා" යි සැලකෙළේ ය. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ "හිස්පුරුෂය, නො සුදුස්සෙක. අනුලොම් නො වූවෙක. නො ගැලපෙන්නෙක. මහණකමට නො සරිලන්නෙක. නො කැප වූවෙක. නො කට යුත්තෙකැ" යි ගැරහූ සේක. "හිස්පුරුෂය, තීර්ථකව්‍රතයක් වූ නග්නභාවය කෙසේ නම් සමාදන් වූයෙහි ද ? හිස්පුරුෂය, මේ නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ. -පෙ- ගරහා දැහැමි කතා කොට "මහණෙනි, තීර්ථකව්‍රතයක් වූ නග්නභාවය සමාදන් නො විය යුතු ය. යමෙක් සමාදන් වන්නේ නම්, තුලඝි ඇවැත් වේ" යි භික්ෂූන්ට වදාළ සේක.

53. එකල්හි එක්තරා මහණෙක් කුසවැහැරි ඇඳ -පෙ- වාවැහැරි ඇඳ -පෙ- පෝරුවැහරි ඇඳ -පෙ- කෙහෙකම්බිලි ඇඳ -පෙ- සැඩමුවලොමින් කළ කම්බිලි ඇඳ -පෙ- බකමූණුපියාපත් ඇඳ -පෙ- අඳුන්දිවිසම් ඇඳ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ක්‍රමයෙන් අල්පෙච්ඡ වූවහුගේ, ලදදෙයින් සතුටු වූවහුගේ, කෙලෙස් ලියන පැවතුම් ඇත්තහුගේ, කෙලෙස් සලන පැවතුම් ඇත්තහුගේ, පහදවනසුලු පැවතුම් ඇත්තහුගේ, කෙලෙස් නසන පැවතුම් ඇත්තහුගේ, වීර්‍ය්‍යාරම්භය කරන්නහුගේ ගුණ කියන සේක. ස්වාමීනි, මේ අඳුන්දිවිසම නොයෙක් ක්‍රමයෙන් අල්පෙච්ඡභාවය පිණිස, ලද පමණින් සතුටු වීම පිණිස, කෙලෙස් ලියන පැවතුම් පිණිස, කෙලෙස් සලන පැවතුම් පිණිස, පහදවනසුලු පැවතුම් පිණිස, කෙලෙස් නැසීම පිණිස, වීර්‍ය්‍යාරම්භය පිණිස පවතී. ස්වාමීනි, මැනවි. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට අඳුන්දිවිසම අනුදන්නා සේක්වා" යි සැලකෙළේ ය. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ "හිස්පුරුෂය, නො සුදුස්සෙක. අනුලොම් නො වූවෙක. නො ගැලපෙන්නෙක. මහණකමට නො සරිලන්නෙක. නො කැප වූවෙක. නො කට යුත්තෙකැ" යි ගැරහූ සේක. "හිස්පුරුෂය, කෙසේ නම් තෝ තීර්ථකධ්වජය වූ අඳුන්දිවිසම දරුයෙහි ද ? හිස්පුරුෂය, මේ නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස නො වේ. -පෙ- ගරහා දැහැමි කතා කොට "මහණෙනි, තීර්ථකධ්වජය වූ අඳුන්දිවිසම නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, තුලඝිඇවැත් වේ" යි වදාළ සේක.

54. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අක්කනාලං නිවාසෙත්වා -පෙ- පොත්ථකං නිවාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: "භගවා භන්තෙ, අනෙකපරියායෙන අප්පිච්ඡස්ස සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස වණ්ණවාදී. අයං භන්තෙ පොත්ථකො අනෙකපරියායෙන අප්පිච්ඡතාය සන්තුට්ඨියා සල්ලෙඛාය ධුතත්තාය පාසාදිකතාය අපචයාය විරියාරම්භාය සංවත්තති. සාධු භන්තෙ, භගවා භික්ඛූනං පොත්ථකං අනුජානාතූ"ති. විගරහි බුද්ධො භගවා "අනනුච්ඡවියං මොඝපුරිස, අනනුලොමිකං. අප්පතිරූපං. අස්සාමණකං. අකප්පියං. අකරණීයං. කථං හි නාම ත්වං මොඝපුරිස, පොත්ථකං නිවාසෙස්සසි. නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, පොත්ථකො නිවාසෙතබ්බො. යො නිවාසෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

55. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සබ්බනීලකානි චීවරානි ධාරෙන්ති. -පෙ- සබ්බපීතකානි චීවරානි ධාරෙන්ති. -පෙ- සබ්බලොහිතකානි චීවරානි ධාරෙන්ති. -පෙ- සබ්බමඤ්ජෙට්ඨිකානි චීවරානි ධාරෙන්ති -පෙ- සබ්බකණ්හානි චීවරානි ධාරෙන්ති. -පෙ- සබ්බමහාරඞ්ගරත්තානි චීවරානි ධාරෙන්ති. -පෙ- සබ්බමහානාමරත්තානි චීවරානි ධාරෙන්ති. -පෙ- අච්ඡින්නදසානි චීවරානි ධාරෙන්ති. -පෙ- දීඝදසානි චීවරානි ධාරෙන්ති. -පෙ- පුප්ඵදසානි චීවරානි ධාරෙන්ති. -පෙ- ඵණදසානි චීවරානි ධාරෙන්ති. -පෙ- කඤ්චුකං ධාරෙන්ති. -පෙ- තිරීටකං ධාරෙන්ති. -පෙ- වෙඨනං ධාරෙන්ති. මනුස්සා උජ්ඣායන්ති. ඛීයන්ති. විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා වෙඨනං ධාරෙස්සන්ති, සෙය්‍යථාපි ගිහී කාමභොගිනො" ති.

56. භගවතො එතමත්ථං ආරොචෙසුං. "න භික්ඛවෙ සබ්බනීලකානි චීවරානි ධාරෙතබ්බානි. න සබ්බපීතකානි චීවරානි ධාරෙතබ්බානි. න සබ්බලොහිතකානි චීවරානි ධාරෙතබ්බානි. න සබ්බමඤ්ජෙට්ඨිකානි චීවරානි ධාරෙතබ්බානි. න සබ්බකණ්හානි චීවරානි ධාරෙතබ්බානි. න සබ්බමහාරඞ්ගරත්තානි චීවරානි ධාරෙතබ්බානි. න සබ්බමහානාමරත්තානි චීවරානි ධාරෙතබ්බානි. න අච්ඡින්නදසානි චීවරානි ධාරෙතබ්බානි. න දීඝදසානි චීවරානි ධාරෙතබ්බානි. න පුප්ඵදසානි චීවරානි ධාරෙතබ්බානි. න ඵණදසානි චීවරානි ධාරෙතබ්බානි. න කඤ්චුකං ධාරෙතබ්බං. න තිරීටකං ධාරෙතබ්බං. න වෙඨනං ධාරෙතබ්බං. යො ධාරෙය්‍ය, ආපත්ති දුක්කටස්සා"ති.

57. තෙන ඛො පන සමයෙන වස්සං වුත්ථා භික්ඛූ අනුප්පන්නෙ චීවරෙ පක්කමන්තිපි. විබ්භමන්තිපි. කාලම්පි කරොන්ති. සාමණෙරාපි පටිජානන්ති. සික්ඛං පච්චක්ඛාතකාපි පටිජානන්ති. අන්තිමවත්ථුං අජ්ඣාපන්නකාපි පටිජානන්ති. උම්මත්තකාපි පටිජානන්ති. ඛිත්තචිත්තාපි පටිජානන්ති. වෙදනට්ටාපි පටිජානන්ති. ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකාපි පටිජානන්ති. ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකාපි පටිජානන්ති. පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකාපි පටිජානන්ති. පණ්ඩකාපි පටිජානන්ති. ථෙය්‍යසංවාසකාපි පටිජානන්ති. තිත්ථියපක්කන්තකාපි පටිජානන්ති. තිරච්ඡානගතාපි පටිජානන්ති. මාතුඝාතකාපි පටිජානන්ති. පිතුඝාතකාපි පටිජානන්ති. අරහන්තඝාතකාපි පටිජානන්ති. භික්ඛුනීදූසකාපි පටිජානන්ති. සඞ්ඝභෙදකාපි පටිජානන්ති. ලොහිතුප්පාදකාපි පටිජානන්ති. උභතොබ්‍යඤ්ජනකාපි පටිජානන්ති.

54. එකල්හි එක්තරා මහණෙක් තෙමේ වරාහුයෙන් කළ වතක්* ඇඳ -පෙ- නියදවැහැරියෙන් කළ වතක් ඇඳ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ක්‍රමයෙන් අල්පේච්ඡ වූවහුගේ, ලද දෙයින් සතුටු වූවහුගේ, කෙලෙස් ලියන පැවතුම් ඇත්තහුගේ, කෙලෙස් සලන පැවතුම් ඇත්තහුගේ, පහදවන සුලු පැවතුම් ඇත්තහුගේ, කෙලෙස් නසන පැවතුම් ඇත්තහුගේ, වීර්‍ය්‍යාරම්භය කරන්නහුගේ ගුණ කියන සේක. ස්වාමීනි, මේ නියදවැහරියෙන් කළ වත නොයෙක් ක්‍රමයෙන් අල්පේච්ඡභාවය පිණිස, ලද පමණින් සතුටු වීම පිණිස, කෙලෙස් ලියන පැවතුම් පිණිස, කෙලෙස් සලන පැවතුම් පිණිස, පහදවන සුලු පැවතුම් පිණිස, කෙලෙස් නැසීම පිණිස, වීර්‍ය්‍යාරම්භය පිණිස පවතී. ස්වාමීනි, මැනවි. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ භික්ෂූන්ට නියදවැහැරියෙන් කළ වත අනුදන්නා සේක්වා" යි සැලකෙළේ ය. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ "හිස්පුරුෂය, නොසුදුස්සේක. අනුලොම් නො වූයේක. නො ගැලපෙන්නක. මහණකමට නොසරි ලන්නෙක. නො කැප වූයේක. නො කටයුත්තෙකැ"යි ගැරහූ සේක. "හිස්පුරුෂය, කෙසේ නම් තෝ නියදවැහැරියෙන් කළ වතක් හැඳියෙහි ද, හිස්පුරුෂය, මේ නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස නො වේ. -පෙ- ගරහා දැහැමි කතා කොට "මහණෙනි, නියදවැහැරියෙන් කළ වත නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුලාඇවැත් වේ" යි වදාළ සේක.

55. එකල්හි සවගමහණෝ සියල්ල නිල් වූ සිවුරු දරත්. -පෙ- සියල්ල රන්වන් වූ සිවුරු දරත්. -පෙ- සියල්ල රතු වූ සිවුරු දරත්. -පෙ- සියල්ල මදටියවන් වූ සිවුරු දරත්. -පෙ- සියල්ල කළු වූ සිවුරු දරත්. -පෙ- සියල්ල රත්වැපිටපැහැති සිවුරු දරත්. -පෙ- සියල්ල මුසුපැහැති සිවුරු දරත්. -පෙ- නො සිඳූ දවලු ඇති සිවුරු දරත්. -පෙ- දික් දවලු ඇති සිවුරු දරත්. -පෙ- මල්කම් කළ දවලු ඇති සිවුරු දරත්. -පෙ- පෙණ සේ ගෙතූ දවලු ඇති සිවුරු දරත්. -පෙ- අහිය (සැට්ට) දරත්. -පෙ- තිහිරිපිළී දරත්. -පෙ- හිස්වෙළුම් දරත්. මිනිස්සු "කාමභෝගී ගිහිත් සේ ශ්‍රමණශාක්‍යපුත්‍රියයෝ කෙසේ නම් හිස්වෙළුම් දරත් දැ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්.

56. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සියල්ල නිල්පැහැති සිවුරු නො දැරිය යුතු ය. සියල්ල රන්වන් වූ සිවුරු නො දැරිය යුතු ය. සියල්ල රතුපැහැති සිවුරු නො දැරිය යුතු ය. සියල්ල මදටියපැහැති සිවුරු නො දැරිය යුතු ය. සියල්ල කළුපැහැති සිවුරු නො දැරිය යුතු ය. සියල්ල රත්වැපිටපැහැති සිවුරු නො දැරිය යුතු ය. සියල්ල මුසුපැහැති සිවුරු නො දැරිය යුතු ය. නො සිඳි දවලු ඇති සිවුරු නො දැරිය යුතු ය. දික් දවලු ඇති සිවුරු නො දැරිය යුතු ය. මල්දවලු ඇති සිවුරු නො දැරිය යුතු ය. පෙණදවලු ඇති සිවුරු නො දැරිය යුතු ය. අහිය නො දැරිය යුතු ය. තිහිරිපිළී නො දැරිය යුතු ය. හිස්වෙළුම් නො දැරිය යුතු ය. යමෙක් දරන්නේ නම්, දුකුලාඇවැත් වේ".

57. එකල්හි වස් වැස නිම කළ භික්ෂූහු සිවුරු නූපන් කල්හි බැහැර ද යෙත්. සිවුරු ද හරිත්. කලුරිය ද කෙරෙත්. හෙරණුම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. ශික්ෂාව බැහැර කළම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. අන්තිමවස්තුවට පැමිණියම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. උන්මත්තකයම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. යක්ෂොන්මාද ඇත්තම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. වේදනාවෙන් පෙළෙන්නම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. ඇවැත් නො දැක්මෙහි උබෙව්නීකම් (තහනම්) කරණ ලද්දම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. ඇවතට පිළියම් නො කිරීමෙහි තහනම් කරණ ලද්දම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. ලාමක දෘෂ්ටිය අත් නො හැරීමෙහි තහනම් කරණ ලද්දම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. පණ්ඩකයම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. ථෙය්‍යසංවාසකයම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. තීර්ථික ශාසනයට ගියම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. තිරච්ඡානගතයම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. මාතෘඝාතකයම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. පිතෘඝාතකයම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. අරහන්තඝාතකයම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. භික්ඛුනීදූසකයම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. සඞ්ඝභෙදකයම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. ලොහිතුප්පාදකයම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්. උභතොව්‍යඤ්ජනකයම්හ යි ද ප්‍රතිඥා කෙරෙත්.

* උපග්‍රන්ථය බලනු.



Free Distribution www.aathaapi.org

58. භගවතො එතමත්ථං ආරොචෙසුං. "ඉධ පන භික්ඛවෙ, වස්සං වුත්ථො භික්ඛු අනුප්පන්නෙ චීවරෙ පක්කමති, සන්තෙ පතිරූපෙ ගාහකෙ දාතබ්බං.

59. "ඉධ පන භික්ඛවෙ, වස්සං වුත්ථො භික්ඛු අනුප්පන්නෙ චීවරෙ විබ්භමති, කාලං කරොති, සාමණෙරො පටිජානාති, සික්ඛං පච්චක්ඛාතකො පටිජානාති, අන්තිමවත්ථුං අජ්ඣාපන්නකො පටිජානාති, සඞ්ඝො සාමී.

60. "ඉධ පන භික්ඛවෙ, වස්සං වුත්ථො භික්ඛු අනුප්පන්නෙ චීවරෙ උම්මත්තකො පටිජානාති, ඛිත්තචිත්තො පටිජානාති, වෙදනට්ටො පටිජානාති, ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකො පටිජානාති, ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකො පටිජානාති, පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකො පටිජානාති, සන්තෙ පතිරූපෙ ගාහකෙ දාතබ්බං.

61. "ඉධ පන භික්ඛවෙ, වස්සං වුත්ථො භික්ඛු අනුප්පන්නෙ චීවරෙ පණ්ඩකො පටිජානාති, ථෙය්‍යසංවාසකො පටිජානාති, තිත්ථියපක්කන්තකො පටිජානාති, තිරච්ඡානගතො පටිජානාති, මාතුඝාතකො පටිජානාති, පිතුඝාතකො පටිජානාති, අරහන්තඝාතකො පටිජානාති, භික්ඛුනිදූසකො පටිජානාති, සඞ්ඝභෙදකො පටිජානාති, ලොහිතුප්පාදකො පටිජානාති, උභතොබ්‍යඤ්ජනකො පටිජානාති, සඞ්ඝො සාමී.

62. "ඉධ පන භික්ඛවෙ, වස්සං වුත්ථො භික්ඛු උප්පන්නෙ චීවරෙ අභාජිතෙ පක්කමති, සන්තෙ පතිරූපෙ ගාහකෙ දාතබ්බං.

63. "ඉධ පන භික්ඛවෙ, වස්සං වුත්ථො භික්ඛු උප්පන්නෙ චීවරෙ අභාජිතෙ විබ්භමති, කාලං කරොති, සාමණෙරො පටිජානාති, සික්ඛං පච්චක්ඛාතකො පටිජානාති, අන්තිමවත්ථුං අජ්ඣාපන්නකො පටිජානාති, සඞ්ඝො සාමී.

64. "ඉධ පන භික්ඛවෙ, වස්සං වුත්ථො භික්ඛු උප්පන්නෙ චීවරෙ අභාජිතෙ උම්මත්තකො පටිජානාති, ඛිත්තචිත්තො පටිජානාති, වෙදනට්ටො පටිජානාති, ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකො පටිජානාති, ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තකො පටිජානාති, පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තකො පටිජානාති, සන්තෙ පතිරූපෙ ගාහකෙ දාතබ්බං.

65. "ඉධ පන භික්ඛවෙ, වස්සං වුත්ථො භික්ඛු උප්පන්නෙ චීවරෙ අභාජිතෙ පණ්ඩකො පටිජානාති, ථෙය්‍යසංවාසකො පටිජානාති, තිත්ථියපක්කන්තකො පටිජානාති, තිරච්ඡානගතො පටිජානාති, මාතුඝාතකො පටිජානාති, පිතුඝාතකො පටිජානාති, අරහන්තඝාතකො පටිජානාති, භික්ඛුනිදූසකො පටිජානාති, සඞ්ඝභෙදකො පටිජානාති, ලොහිතුප්පාදකො පටිජානාති, උභතොබ්‍යඤ්ජනකො පටිජානාති, සඞ්ඝො සාමී."

58. භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. "මහණෙනි, මෙහි වස් වැස නිම කළ මහණ තෙමේ සිවුරු නූපන් කල්හි බැහැර යේ ද, සුදුසු වූ ගන්නකු ඇති කල්හි දිය යුතු ය.

59. "මහණෙනි, මෙහි වස් වැස නිම කළ මහණ තෙමේ සිවුරු නූපන් කල්හි සිවුරු හරියි, කලුරිය කෙරෙයි, හෙරණෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, ශික්ෂාව බැහැර කළ එකෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, අන්තිමවස්තුවට පැමිණියෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, සඞ්ඝ තෙමේ (ඔහුගේ කොටසට) හිමියා වේ.

60. "මහණෙනි, මෙහි වස් වැස නිම කළ මහණ තෙමේ සිවුරු නූපන් කල්හි උමතු වූවෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, යක්ෂෝන්මාද ඇත්තෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, වේදනාවෙන් පෙළෙන්නෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, ඇවැත් නො දැක්මෙහි තහනම් කරණ ලද්දෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, ඇවැතට පිළියම් නො කිරීමෙහි තහනම් කරණ ලද්දෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, ලාමක දෘෂ්ටිය අත් නො හැරීමෙහි තහනම් කරණ ලද්දෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, සුදුසු වූ ගන්නකු ඇති කල්හි (කොටස) දිය යුතු ය.

61. "මහණෙනි, මෙහි වස් වැස නිම කළ මහණ තෙමේ සිවුරු නූපන් කල්හි පණ්ඩකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, ථෙය්‍යසංවාසකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, තිත්ථියපක්කන්තකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, තිරච්ඡානගත යෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, මාතෘඝාතකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, පිතෘඝාතකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, අරහන්තඝාතකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, භික්ඛුනීදූසකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, සඞ්ඝභෙදකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, ලොහිතුප්පාදකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, උභතොබ්‍යඤ්ජනකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, ඔහුගේ කොටසට සඞ්ඝ තෙමේ හිමියා වේ.

62. "මහණෙනි, මෙහි වස් වැස නිම කළ මහණ තෙමේ උපන් සිවුරු නො බෙදූ කල්හි බැහැර යෙයි, සුදුසු වූ ගන්නකු ඇති කල්හි (කොටස) දිය යුතු ය.

63. "මහණෙනි, මෙහි වස් වැස නිම කළ මහණ තෙමේ උපන් සිවුරු නො බෙදූ කල්හි සිවුරු හරියි, කලුරිය කෙරෙයි, හෙරණෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, ශික්ෂාව බැහැර කෙළෙමි යි ප්‍රතිඥ කෙරෙයි, අන්තිමවස්තුවට පැමිණියෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, සඞ්ඝ තෙමේ හිමියා වේ.

64. "මහණෙනි, මෙහි වස් වැස නිම කළ මහණ තෙමේ උපන් සිවුරු-නො බෙදූ කල්හි උන්මත්තකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, යක්ෂෝන්මාද ඇත්තෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, වේදනාවෙන් පෙළෙන්නෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, ඇවැත් නො දැක්මෙහි තහනම් කරණ ලද්දෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, ඇවැතට පිළියම් නො කිරීමෙහි තහනම් කරණ ලද්දෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, ලාමකදෘෂ්ටිය අත් නො හැරීමෙහි තහනම් කරණ ලද්දෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, සුදුසු වූ ගන්නකු ඇති කල්හි (කොටස) දිය යුතු ය.

65. "මහණෙනි, මෙහි වස් වැස නිම කළ මහණෙක් තෙමේ උපන් සිවුරු නො බෙදූ කල්හි පණ්ඩකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, ථෙය්‍යසංවාසක යෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, තිත්ථියපක්කන්තකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, තිරච්ඡානගතයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, මාතෘඝාතකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, පිතෘඝාතකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, අරහන්තඝාතකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, භික්ඛුනීදූසකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, සඞ්ඝභෙදක-යෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, ලොහිතුප්පාදකයෙක්මි යි ප්‍රතිඥ කෙරෙයි, උභතොබ්‍යඤ්ජනකයෙක් මි යි ප්‍රතිඥ කෙරෙයි, සඞ්ඝතෙමේ හිමියා වේ."

66. "ඉධ පන භික්ඛවෙ, වස්සං වුත්ථානං භික්ඛූනං අනුප්පන්නෙ චීවරෙ සඞ්ඝො භිජ්ජති, තත්ථ මනුස්සා එකස්මිං පක්ඛෙ උදකං දෙන්ති, එකස්මිං පක්ඛෙ චීවරං දෙන්ති 'සඞ්ඝස්ස දෙමා'ති, සඞ්ඝස්සෙවෙතං.

67. "ඉධ පන භික්ඛවෙ, වස්සං වුත්ථානං භික්ඛූනං අනුප්පන්නෙ චීවරෙ සඞ්ඝො භිජ්ජති, තත්ථ මනුස්සා එකස්මිං පක්ඛෙ උදකං දෙන්ති, තස්මිංයෙව පක්ඛෙ චීවරං දෙන්ති 'සඞ්ඝස්ස දෙමා'ති, සඞ්ඝස්සෙවෙතං.

68. "ඉධ පන භික්ඛවෙ, වස්සං වුත්ථානං භික්ඛූනං අනුප්පන්නෙ චීවරෙ සඞ්ඝො භිජ්ජති, තත්ථ මනුස්සා එකස්මිං පක්ඛෙ උදකං දෙන්ති, එකස්මිං පක්ඛෙ චීවරං දෙන්ති 'පක්ඛස්ස දෙමා'ති, පක්ඛස්සෙවෙතං.

69. "ඉධ පන භික්ඛවෙ, වස්සං වුත්ථානං භික්ඛූනං අනුප්පන්නෙ චීවරෙ සඞ්ඝො භිජ්ජති, තත්ථ මනුස්සා එකස්මිං පක්ඛෙ උදකං දෙන්ති, තස්මිංයෙව පක්ඛෙ චීවරං දෙන්ති 'පක්ඛස්ස දෙමා'ති, පක්ඛස්සෙවෙතං.

70. "ඉධ පන භික්ඛවෙ, වස්සං වුත්ථානං භික්ඛූනං උප්පන්නෙ චීවරෙ අභාජිතෙ සඞ්ඝො භිජ්ජති, සබ්බෙසං සමකං භාජෙතබ්බ"න්ති.

71. තෙන ඛො පන සමයෙන ආයස්මා **රෙවතො** අඤ්ඤතරස්ස භික්ඛුනො හත්ථෙ ආයස්මතො **සාරිපුත්තස්ස** චීවරං පාහෙසි: "ඉමං චීවරං ථෙරස්ස දෙහී"ති. අථ ඛො සො භික්ඛු අන්තරාමග්ගෙ ආයස්මතො රෙවතස්ස විස්සාසා තං චීවරං අග්ගහෙසි. අථ ඛො ආයස්මා රෙවතො ආයස්මතා සාරිපුත්තෙන සමාගන්ත්වා පුච්ඡි: "අහං භන්තෙ, ථෙරස්ස චීවරං පාහෙසිං. සම්පත්තං තං චීවර"න්ති. "නාහං පස්සාමි ආවුසො චීවර"න්ති. අථ ඛො ආයස්මා රෙවතො තං භික්ඛුං එතදවොච: "අහං ආවුසො ආයස්මතො හත්ථෙ ථෙරස්ස චීවරං පාහෙසිං. කහං තං චීවර"න්ති. "අහං භන්තෙ, ආයස්මතො විස්සාසා තං චීවරං අග්ගහෙසි"න්ති.

72. භගවතො එතමත්ථං ආරොචෙසුං. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු භික්ඛුස්ස හත්ථෙ චීවරං පහිණාති: 'ඉමං චීවරං ඉත්ථන්නාමස්ස දෙහී'ති. සො අන්තරාමග්ගෙ යො පහිණාති, තස්ස විස්සාසා ගණ්හාති, සුග්ගහිතං. යස්ස පහීයති, තස්ස විස්සාසා ගණ්හාති, දුග්ගහිතං.

73. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු භික්ඛුස්ස හත්ථෙ චීවරං පහිණාති: 'ඉමං චීවරං ඉත්ථන්නාමස්ස දෙහී'ති. සො අන්තරාමග්ගෙ යස්ස පහීයති, තස්ස විස්සාසා ගණ්හාති, දුග්ගහිතං. යො පහිණාති, තස්ස විස්සාසා ගණ්හාති, සුග්ගහිතං.

66. "මහණෙනි, මෙහි වස් වැස නිම කළ භික්ෂූන්ට සිවුරු නූපන් කල්හි සඞ්ඝ තෙමේ බිඳෙයි, එහි මිනිස්සු එක් පක්ෂයකට දිය දෙත්, එක් පක්ෂයකට 'සඞ්ඝයාට දෙමු' යි සිවුරු දෙත්, ඒ සිවුරු සඞ්ඝයාට ම වේ.

67. "මහණෙනි, මෙහි වස් වැස නිම කළ භික්ෂූන්ට සිවුරු නූපන් කල්හි සඞ්ඝ තෙමේ බිඳෙයි, එහි මිනිස්සු එක් පක්ෂයක දිය දෙත්, 'සඞ්ඝයාට දෙමු' යි ඒ පක්ෂයට ම සිවුරු දෙත්, ඒ සිවුරු සඞ්ඝයාට ම වේ.

68. "මහණෙනි, මෙහි වස් වැස නිම කළ භික්ෂූන්ට සිවුරු නූපන් කල්හි සඞ්ඝ තෙමේ බිඳෙයි, එහි මිනිස්සු එක් පක්ෂයකට දිය දෙත්, 'පක්ෂයට දෙමු' යි එක් පක්ෂයකට සිවුරු දෙත්, ඒ සිවුරු පක්ෂයට ම වේ.

69. "මහණෙනි, මෙහි වස් වැස නිම කළ භික්ෂූන්ට සිවුරු නූපන් කල්හි සඞ්ඝ තෙමේ බිඳෙයි, එහි මිනිස්සු එක් පක්ෂයකට දිය දෙත්, ඒ පක්ෂයට ම 'පක්ෂයට දෙමු' යි සිවුරු දෙත්, ඒ සිවුරු පක්ෂයට ම අයත් වේ.

70. "මහණෙනි, මෙහි වස් වැස නිම කළ භික්ෂූන්ට උපන් සිවුරු නො බෙදූ කල්හි සඞ්ඝ තෙමේ බිඳෙයි, සියල්ලන්ට සම ව බෙදිය යුතු ය".

71. එකල්හි ආයුෂ්මත් **රෙවත** ස්ථවිර තෙමේ එක්තරා මහණකු අත ආයුෂ්මත් **ශාරීපුත්‍ර** ස්ථවිරයන් වහන්සේට "මේ සිවුර තෙරුන්ට දෙව"යි සිවුරක් යැවී ය. ඉක්බිති ඒ මහණ තෙමේ අතරමග දී ආයුෂ්මත් රෙවත තෙරුන් කෙරෙහි විශ්වාසයෙන් ඒ සිවුර ගත්තේ ය. එකල්හි ආයුෂ්මත් රෙවත ස්ථවිර තෙමේ ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙරුන් හමු වී "ස්වාමීනි, මම තෙරුන් වහන්සේට සිවුරක් යැවීමි. ඒ සිවුර ලැබුනේ දැ" යි විචාළේ ය. "ඇවැත්නි, මම ඒ සිවුර නො දකිමි." ඉක්බිති ආයුෂ්මත් රෙවත ස්ථවිර තෙමේ ඒ මහණහු "ඇවැත්නි, මම ආයුෂ්මතුන්ගේ අත තෙරුන් වහන්සේට සිවුරක් යැවීමි. ඒ සිවුර කොහි දැ"යි විචාළේ ය. "ස්වාමීනි, මම ආයුෂ්මතුන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් ඒ සිවුර ගත්තෙමි" යි කී ය.

72. භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ 'මේ සිවුර මෙනම් ඇත්තහුට දෙව' යි මහණකු අත සිවුරක් යවයි, ඒ මහණ තෙමේ අතරමග දී යමෙක් යවා නම්, ඔහු කෙරෙහි විශ්වාසයෙන් ගණියි, එය නිවරැදි ගැණීමෙකි. එය යමකු සඳහා යවනු බැබේ ද, ඔහු කෙරෙහි විශ්වාසයෙන් ගණියි, එය වැරදි ගැණීමෙකි.

73. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ 'මේ සිවුර මෙනම් ඇති මහණහුට දෙව' යි මහණකු අත සිවුරක් යවයි, හෙතෙමේ අතරමග දී යම්කුට යවනු ලැබේ ද, ඔහු කෙරෙහි විශ්වාසයෙන් ගණියි. වැරදි ගැණීමෙක් වේ. යමෙක් යවා ද, ඔහු කෙරෙහි විශ්වාසයෙන් ගණියි. නිවරැදි ගැණීමෙක් වේ.

74. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු භික්ඛුස්ස හත්ථෙ චීවරං පහිණාති: 'ඉමං චීවරං ඉත්ථන්නාමස්ස දෙහී'ති. සො අන්තරාමග්ගෙ සුණාති: 'යො පහිණාති, සො කාලකතො'ති, තස්ස මතකචීවරං අධිට්ඨාති, ස්වාධිට්ඨිතං. යස්ස පහීයති, තස්ස විස්සාසා ගණ්හාති, දුග්ගහිතං.

75. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු භික්ඛුස්ස හත්ථෙ චීවරං පහිණාති: 'ඉමං චීවරං ඉත්ථන්නාමස්ස දෙහී'ති. සො අන්තරාමග්ගෙ සුණාති: 'යස්ස පහීයති, සො කාලකතො'ති, තස්ස මතකචීවරං අධිට්ඨාති, දුරධිට්ඨිතං. යො පහිණාති, තස්ස විස්සාසා ගණ්හාති, සුග්ගහිතං.

76. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු භික්ඛුස්ස හත්ථෙ චීවරං පහිණාති: 'ඉමං චීවරං ඉත්ථන්නාමස්ස දෙහී'ති. සො අන්තරාමග්ගෙ සුණාති: 'උභො කාලකතා'ති, යො පහිණාති, තස්ස මතකචීවරං අධිට්ඨාති, ස්වාධිට්ඨිතං. යස්ස පහීයති, තස්ස මතකචීවරං අධිට්ඨාති, දුරධිට්ඨිතං.

77. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු භික්ඛුස්ස හත්ථෙ චීවරං පහිණාති: 'ඉමං චීවරං ඉත්ථන්නාමස්ස දම්මී'"ති. සො අන්තරාමග්ගෙ යො පහිණාති, තස්ස විස්සාසා ගණ්හාති, දුග්ගහිතං. යස්ස පහීයති, තස්ස විස්සාසා ගණ්හාති, සුග්ගහිතං.

78. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු භික්ඛුස්ස හත්ථෙ චීවරං පහිණාති: 'ඉමං චීවරං ඉත්ථන්නාමස්ස දම්මී'ති. සො අන්තරාමග්ගෙ යස්ස පහීයති, තස්ස විස්සාසා ගණ්හාති, සුග්ගහිතං. යො පහිණාති, තස්ස විස්සාසා ගණ්හාති, දුග්ගහිතං.

79. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු භික්ඛුස්ස හත්ථෙ චීවරං පහිණාති: 'ඉමං චීවරං ඉත්ථන්නාමස්ස දම්මී'ති. සො අන්තරාමග්ගෙ සුණාති: 'යො පහිණාති, සො කාලකතො'ති, තස්ස මතකචීවරං අධිට්ඨාති, දුරධිට්ඨිතං. යස්ස පහීයති, තස්ස විස්සාසා ගණ්හාති, සුග්ගහිතං.

80. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු භික්ඛුස්ස හත්ථෙ චීවරං පහිණාති: 'ඉමං චීවරං ඉත්ථන්නාමස්ස දම්මී'ති. සො අන්තරාමග්ගෙ සුණාති: "යස්ස පහීයති, සො කාලකතො'ති, තස්ස මතකචීවරං අධිට්ඨාති, ස්වාධිට්ඨිතං. යො පහිණාති, තස්ස විස්සාසා ගණ්හාති, දුග්ගහිතං.

81. "ඉධ පන භික්ඛවෙ, භික්ඛු භික්ඛුස්ස හත්ථෙ චීවරං පහිණාති: 'ඉමං චීවරං ඉත්ථන්නාමස්ස දම්මී'ති. සො අන්තරාමග්ගෙ සුණාති: 'උභො කාලකතා'ති, යො පහිණාති, තස්ස මතකචීවරං අධිට්ඨාති, දුරධිට්ඨිතං. යස්ස පහීයති, තස්ස මතකචීවරං අධිට්ඨාති, ස්වාධිට්ඨිතං."

82. "අට්ඨිමා භික්ඛවෙ, මාතිකා චීවරස්ස උප්පාදාය: සීමාය දෙති. කතිකාය දෙති. භික්ඛාපඤ්ඤත්තියා දෙති. සඞ්ඝස්ස දෙති. උභතො සඞ්ඝස්ස දෙති. වස්සං වුත්ථසඞ්ඝස්ස දෙති. ආදිස්ස දෙති. පුග්ගලස්ස දෙති."

74. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ මහණකු අත 'මේ සිවුර මෙනම් ඇත්තහුට දෙව' යි සිවුරක් යවයි, හෙතෙමේ අතරමග දී 'යමෙක් යවා ද, හෙතෙමේ කලුරිය කෙළේ ය' යි අසයි, එය ඔහුගේ මතක සිවුරක් කොට ඉටයි, නිවැරැදි ඉටීමෙක් වේ. යමකුට යවනු ලැබේ ද, ඔහු කෙරෙහි විශ්වාසයෙන් ගණියි, වැරදි ගැණීමෙක් වේ.

75. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ මහණකු අත 'මේ සිවුර මෙනම් ඇත්තහුට දෙව'යි සිවුරක් යවයි, හෙතෙමේ අතරමග දී 'යමකුට යවනු ලැබේ ද, හෙතෙමේ කලුරිය කෙළේ ය' යි අසයි, එය ඔහුගේ මතක සිවුරක් කොට ඉටයි, වැරදි ඉටීමෙක් වේ. යමෙක් යවා ද, ඔහු කෙරෙහි විශ්වාසයෙන් ගණියි, නිවැරැදි ගැණීමෙක් වේ.

76. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ මහණකු අත 'මේ සිවුර මෙනම් ඇත්තහුට දෙව'යි සිවුරක් යවයි, හෙතෙමේ අතරමග දී ,දෙදෙන ම කලුරිය කළහ' යි අසයි. යමෙක් යවා ද, එය ඔහුගේ මතක සිවුරක් කොට ඉටයි, නිවැරදි ඉටීමෙකි. යමකුට යවනු ලැබේ ද, එය ඔහුගේ මතකසිවුරක් කොට ඉටයි, වැරදි ඉටීමෙකි.

77. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ මහණකු අත 'මේ සිවුර මෙනම් ඇත්තහුට දෙමි'යි සිවුරක් යවයි, හෙතෙමේ අතරමග දී යමෙක් යවා ද, ඔහු කෙරෙහි විශ්වාසයෙන් ගණියි, වැරදි ගැණීමෙකි. යමකුට යවනු ලැබේ ද, ඔහු කෙරෙහි විශ්වාසයෙන් ගණියි, නිවරැදි ගැණීමෙකි.

78. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ මහණකු අත 'මේ සිවුර මෙනම් ඇත්තහුට දෙමි' යි සිවුරක් යවයි, හෙතෙමේ අතරමග දී යමකුට යවනු ලැබේ ද, ඔහු කෙරෙහි විශ්වාසයෙන් ගණියි, නිවැරැදි ගැණීමෙකි. යමෙක් යවා ද, ඔහු කෙරෙහි විශ්වාසයෙන් ගණියි, වැරදි ගැණීමෙකි.

79. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ මහණුකු අත 'මේ සිවුර මෙනම් ඇත්තහුට දෙමි' යි සිවුරක් යවයි, හෙතෙමේ අතරමග දී 'යමෙක් යවා ද, හෙතෙමේ කලුරිය කෙළේ ය' යි අසයි, එය ඔහුගේ මතක සිවුරක් කොට ඉටයි, වැරදි ඉටීමෙකි. යමකුට යවනු ලැබේ ද, ඔහු කෙරෙහි විශ්වාස යෙන් ගණියි, නිවැරැදි ගැණීමෙකි.

80. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ මහණකු අත 'මේ සිවුර මෙනම් ඇත්තහුට දෙමි" යි සිවුරක් යවයි, හෙතෙමේ අතරමග දී 'යමකුට යවනු ලැබේ ද, හෙතෙමේ කලුරිය කෙළේ ය' යි අසයි, එය ඔහුගේ මතක සිවුරක් කොට ඉටයි, නිවැරැදි ඉටීමෙකි. යමෙක් යවා ද, ඔහු කෙරෙහි විශ්වාසයෙන් ගණියි, වැරදි ගැණීමෙකි.

81. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ මහණකු අත 'මේ සිවුර මෙනම් ඇත්තහුට දෙමි' යි සිවුරක් යවයි, හෙතෙමේ අතරමග දී 'දෙදෙන කලුරිය කළහ' යි අසයි, යමෙක් යවා ද, එය ඔහුගේ මතක සිවුරක් කොට ඉටයි, වැරදි ඉටීමෙකි. යමකුට යවනු ලැබේ ද, ඔහුගේ මතක සිවුරක් කොට ඉටයි, නිවැරදි ඉටීමෙකි."

82. මහණෙනි, සිවුරු ලැබීමට මේ මාතෘකා අටෙකි: සීමාවෙහි දෙයි. කතිකාවෙන් දෙයි. භික්ෂාප්‍රඥප්තියෙන් දෙයි. සඞ්ඝයාට දෙයි. උභතො-සඞ්ඝයාට දෙයි. වස් වැස නිම කළ සඞ්ඝයාට දෙයි. නියම කොට දෙයි. පුද්ගලයකුහට දෙයි යන අට ය*."

උපග්‍රන්ථය බලනු.

83. “සීමාය දෙති, යාවතිකා භික්ඛූ අන්තොසීමගතා, තෙහි භාජෙතබ්බං.

84. “කතිකාය දෙති, සම්බහුලා ආවාසා සමානලාභා හොන්ති, එකස්මිං ආවාසෙ දින්නෙ සබ්බත්ථ දින්නං හොති.

85. “භික්ඛාපඤ්ඤත්තියා දෙති, යත්ථ සඞ්ඝස්ස ධුවකාරා කරීයන්ති, තත්ථ දෙති.

86. “සඞ්ඝස්ස දෙති, සම්මුඛීභූතෙන සඞ්ඝෙන භාජෙතබ්බං.

87. “උභතො සඞ්ඝස්ස දෙති, බහුකාපි භික්ඛූ හොන්ති, එකා භික්ඛුනී හොති, උපඩ්ඪං දාතබ්බං. බහුකාපි භික්ඛුනියො හොන්ති, එකො භික්ඛු හොති, උපඩ්ඪං දාතබ්බං.

88. “වස්සං වුත්ථසඞ්ඝස්ස දෙති, යාවතිකා භික්ඛූ තස්මිං ආවාසෙ වස්සං වුත්ථා, තෙහි භාජෙතබ්බං.

89. “ආදිස්ස දෙති, යාගුයා වා භත්තෙ වා ඛාදනීයෙ වා චීවරෙ වා සෙනාසනෙ වා භෙසජ්ජෙ වා.

90. “පුග්ගලස්ස දෙති: ‘ඉමං චීවරං ඉත්ථන්නාමස්ස දම්මී’ති”.

**චීවරක්ඛන්ධකො නිට්ඨිතො අට්ඨමො.**

---

83. "සීමාවෙහි දෙයි ද, යම් පමණ භික්ෂූහු සීමාව තුළට පිවිසියෝ ද, ඔවුන් විසින් බෙදිය යුතු ය.

84. "කතිකාවෙන් (සමානලාභසම්මුතියෙන්) දෙයි ද, බොහෝ ආවාසයෝ සමානලාභ ඇත්තාහු වෙත් ද, එක් ආවාසයකට දුන් කල්හි කතිකානුරූප ව සියලු ආවාසයන්ට දෙන ලද්දේ වේ.

85. "භික්ෂාප්‍රඥප්තියෙන් දෙයි ද, යම් තැනෙක්හි සඞ්ඝයාට නිති සත්කාරකරණු ලැබෙත් ද, ඒ ආවාසයන්ට දෙයි.

86. "සඞ්ඝයාට දෙයි ද, හමු වූ සඞ්ඝයා විසින් බෙදිය යුතු ය.

87. "උභතොසඞ්ඝයාට දෙයි ද, බොහෝ භික්ෂූහු වෙත් ද, එක් භික්ෂුණියක් වේ ද, අඩක් දිය යුතු ය. බොහෝ භික්ෂුණීහු වෙත් ද, එක් භික්ෂුනමක් වේ ද, අඩක් දිය යුතු ය.

88. "වස් වැස නිම කළ සඞ්ඝයාට දෙයි ද, යම් පමණ භික්ෂූහු ඒ ආවාසයෙහි වස් වැස නිම කළාහු ද, ඔවුන් විසින් බෙදිය යුතු ය.

89. "නියම කොට දෙයි ද, කැඳ හෝ බත් හෝ කෑයුතු දෙය හෝ සිවුරු හෝ සෙනසුන් හෝ බෙහෙත් හෝ පිළිගත්තවුන්ට එය අයත් වෙයි.

90. "පුද්ගලයකුහට දෙයි 'මේ සිවුරු මේනම් ඇත්තහුට දෙමි' යි."

**අටවැනි චීවරක්ඛන්ධකය නිමි.**

## ඉමම්හි ඛන්ධකෙ වත්ථූ ඡන්නවුති.

තස්ස උද්දානං:

1. රාජගහකො නෙගමො දිස්වා වෙසාලියං ගණිකං,
පුන රාජගහං ගන්ත්වා රඤ්ඤො තං පටිවෙදයි.

2. පුත්තො **සාලවතිකාය** **අභයස්ස** හි අත්‍රජො,
ජීවතීති කුමාරෙන සඞ්ඛාතො **ජීවකො** ඉති.

3. සො හි **තක්කසිලං**[1] ගන්ත්වා උග්ගහෙත්වා මහාභිසො,
සත්තවස්සිකආබාධං නත්ථුකම්මෙන නාසයි.

4. රඤ්ඤො භගන්දලාබාධං ආලෙපෙන අපාකරි[2],
මමඤ්ච ඉත්ථාගාරඤ්ච බුද්ධසඞ්ඝඤ්චුපට්ඨහ[3].

5. රාජගහිකො ච සෙට්ඨි අන්තගණ්ඨිං තිකිච්ඡිතං[4],
පජ්ජොතස්ස මහ රොගං ඝතපානෙන නාසයි.

6. අධිකාරඤ්ච සිවෙය්‍යං[5] අභිසන්නං සිනෙහයි,[6]
තීහි[7] උප්පලහත්ථෙහි සමත්තිංසවිරෙචනං.

7. පකතත්තං වරං යාචි සිවෙය්‍යඤ්ච පටිග්ගහි,
චීවරඤ්ච ගිහිදානං අනුඤ්ඤාසි තථාගතො.

8. රාජගහෙ ජනපදෙ බහුං උප්පජ්ජි චීවරං,
පාවාරො කොසියඤ්චෙව කොජවො අඩ්ඪකාසියං.

9. උච්චාවචා ච සන්තුට්ඨි නාගමෙ සාගමෙසු ච[8]
පඨමං පච්ඡා සදිසා කතිකා ච පටිහරුං.

10. භණ්ඩාගාරං අගුත්තඤ්ච වුට්ඨාපෙන්ති තථෙව ච,
උස්සන්නං කොලාහලඤ්ච කථං භාජෙ කථං දදෙ.

11. සකාතිරෙකභාගෙන පටිබිංසො කථං දදෙ,
ඡකණෙන සීතුදකී ච[9] උත්තරිතුං[10] න ජානරෙ.

12. ඔරොපෙන්තා භාජනඤ්ච පාතියා ච ඡමාය ච,
උපචිකා මජ්ඣෙ ජීරන්ති එකතො පත්ථින්නෙන ච.

13. ඵරුසාච්ඡින්නච්චිබද්ධා අද්දසාසි උබ්භණ්ඩිතෙ,
වීමංසිත්වා සක්‍යමුනී අනුඤ්ඤාසි තිචීවරං.

---

1. "තක්කසිලායං" ම නු ප. 2. "අපාකසී" ම ජ සං. "අපාකඩ්ඪී" P T S. 3. "උපට්ඨහි" ම ජ සං. 4. "අන්තගණ්ඨි තිකිච්ඡිතං" ම ජ සං. "අන්තරගණ්ඨි තිකිච්ඡිතං" තොපි. ම නු ප P T S. 5. "සිවෙය්‍යං" ම ජ සං. P T S 6. "සිනෙහති" ම ජ සං. P T S. 7. "තීනි" P T S. තොපි. ම නු ප. 8. "නාගමෙ සාගමෙසුං ච" ම ජ සං. 9. "සිතුදකා" ම ජ සං. "සීතුංසිව" P T S 10 "උත්තරිතු" ම ජ සං.

Free Distribution www.aathaapi.org

## මේ ඛන්ධකයෙහි වස්තු සංග්‍රහයෙකි.

එහි උද්දානය (වස්තුනාමාවලිය) මෙසේ ය:

1. රජගහනුවර වැසි සෙලම්භීත තෙමේ විසාලාමහනුවර වැසි ගණිකාව දැක නැවත රජගහනුවරට ගොස් රජුට එකරුණ දැන් වී ය.

2. අභයකුමරුගේ අත්‍රජ වූ, **සාලවතී** නම් ගණිකාවගේ පුත්‍ර තෙමේ කුමරුන් විසින් "ජීවත් වේ" නු යි **ජීවක** ය යි කියන ලද්දේ ය.

3. හෙතෙමේ **තක්සලාවට** ගොස් උගෙණ මහ වෙදෙක් වූයේ සත් අවුරුද්දක් පැවති හිසරුදාව නස්‍යකර්මයෙන් නැසී ය.

4. බිම්සරරජුගේ භගන්දලාබාධය ආලේපයක් දීමෙන් ඉවත් කෙළේ ය. මාහට ද අන්තඃපුරයට ද බුදුරජුන්ට ද භික්ෂුසඞ්ඝයාට ද උවටැන් කරව යි (රජතෙමේ තනතුරු දුන්නේ ය.)

5. රජගහසිටු තෙමේ සුව පත් කරණ ලද්දේ ය. (බරණැස්සිටුපුත්හුගේ) අන්තගණ්ඨි ආබාධයට පිළියම් කරණ ලදී. **පජ්ජෝතරජුගේ** මහා රෝගය ගිතෙල් පෙවීමෙන් නැසූයේ ය.

6. අධිකාරය ද, සිවෙය්‍යපරිත්‍යාගය ද, දොස් කිපුනු ශරීරය මොලොක් කිරීම ද, උපුල්මල්මිටි තුණෙකින් සමතිස් විරේචනය –

7. ප්‍රකෘතිස්වභාව ඇති බුදුරජුගෙන් වරයක් ඉල්ලී ය. සිවෙය්‍යවස්ත්‍ර පිළිගත්හ. තථාගතයන් වහන්සේ ගැහැවියන් දෙන සිවුරු පිළිගැණීම අනුදත් සේක.

8. රජගහනුවර ද ජනපදයෙහි ද බොහෝ සිවුරු උපන. උතුරුසළුව ද, කොසෙය්‍යපාවාරය ද, කොඳුපලස ද පන්සියයක් අගනා කම්බිලිය ද,

9. කුදුමහත් සිවුරු, සතුටුවීම, අනපෙක්‍ෂා සාපෙක්‍ෂාවන්හි (අකැමැත්තෙන් කොටස නො දීම, අකැමැත්තෙන් කොටස දීම), පළමු පැමිණීම, පසු ව පැමිණීම, එස් ව සොහොනට පැමිණීම, කතිකා කොට පැමිණීම, ආරාමයට ගෙණ ආ සිවුරු ආපසු ගෙණ ගියහ.

10. භාණ්ඩාගාරය, සිවුරු ආරක්‍ෂා නො වීම, (භාණ්ඩාගාරිකයා) බැහැර කරවත්. භාණ්ඩාගාරය සිවුරුවලින් පිරීම, සිවුරු බෙදන තැන කොලාහලය, කෙසේ බෙදන්නේ ද කෙසේ දෙන්නේ ද –

11. ගමනට සූදානම් වූ භික්ෂුහුගේ කොටස දීම, අතිරෙක භාගය දීම, පිරිකර කොටස කෙසේ දෙන්නේ ද, ගොම හා නො නැම්බූ පඬු, පඬු ඉතිරීම, පඬු පැසීම පඬු නො පැසීම ද නො දනිත්.

12. පඬු බාන්නෝ, පඬු වක්කිරීමට බඳුන, තලියෙහි, බිම සිවුරු ඇතිරීම, (වේයෝ තණ ඇතිරිය කැහ.) සිවුර මැද (පඬු ගැලීම), කොන් දිරත්. එක් පසකින් පඬු වැගිරේ. සිවුර දැඩි වීම,

13. සිවුර රළුවීම, කඩ නො කැපීම, ලියදි බැඳි කුඹුර, සිවුරුපොදි ඔසවා ගත් භික්ෂූන් ද දුටු සේක. භාග්‍යවතුන් වහන්සේ පරීක්‍ෂා කොට තුන් සිවුර අනුදත් සේක.

14. අඤ්ඤෙන අතිරෙකෙන උප්පජ්ජි ඡිද්දමෙව ච,
චාතුද්දීපො වරං යාචි දාතුං වස්සිකසාටිකං.

15. ආගන්තුගමිගිලානං උපට්ඨාකඤ්ච භෙසජං[1]
ධුවං උදකසාටිකඤ්ච පණීතං අතිඛුද්දකං.

16. ථුල්ලකච්ඡු මුඛං ඛොමං පරිපුණ්ණං අධිට්ඨානං[2],
පච්ඡිමං[3] කතො ගරුකො විකණ්ණො සුත්තමොකිරි[4].

17. ලුජ්ජන්ති නප්පහොන්ති ච අන්වාධිකං බහූනි ච,
අන්ධවනෙ අසතියා එකො වස්සං උතුම්හි ච.

18. ද්වෙ භාතුකා රාජගහෙ උපනන්දො පුන ද්විසු,
කුච්ඡිවිකාරො ගිලානො උභො චෙව ගිලානකා[5].

19. නග්ගා කුසා වාකචීරං ඵලකො කෙසකම්බලං,
වාලඋලූකපක්ඛඤ්ච අජිනං අක්කනාළ ච[6].

20. පොත්ථකං නීලපීතඤ්ච ලොහිතං මඤ්ජෙට්ඨෙන ච[7],
කණ්හා මහාරඞ්ගනාමා[8] අච්ඡින්නදසිකා තථා.

21. දීඝපුප්ඵඵණදසා කඤ්චුතිරීටවෙඨනං,
අනුප්පන්නෙ පක්කමති සඞ්ඝො භිජ්ජති තාවදෙ.

22. පක්ඛෙ දදන්ති සඞ්ඝස්ස ආයස්මා රෙවතො පහි,
විස්සාසගාහාධිට්ඨාති අට්ඨ චීවරමාතිකාති.

---

1. "භෙසජ්ජං" ම ඡ සං. P T S. ම නු ප. අ වි.
2. "අධිට්ඨානං" ම ඡ සං. P T S. අ වි. තො වි. 3. "පච්ඡිමං" තො වි. ම නු ප
4. "සුත්තමොකාරි" තො වි. ජ වි. ම නු ප. 5. ගිලායනා P T S තො වි.
6. "අක්කනාලකං" ම ඡ සං. 7. "මඤ්ජෙට්ඨෙන ච" ම ඡ සං.
8. "මහාරඞ්ගනාමං" ම ඡ සං. P T S. තො වි. ම නු ප.

14. අතික් අතික් අතිරේක සිවුරෙන් යුක්තවීම, ආනන්ද තෙරුන්ට සිවුරක් ලැබුනේ ය. අඳනය සිදුරුවීම, චාතුද්දීපිකාමහාමෙඝය, වර ඉල්වී ය. වැසිසළු දීම,

15. ආගන්තුක, ගමික, ගිලාන, උපට්ඨාක, බෙහෙත් දීම, නිති කැඳ දීම, දියසළු දීම, පිණ්ඩි බොජුන් වැලදීම, කුඩා පසතුරුණ නානනම් කිරීම,

16. ථුල්ලකච්ඡුආබාධය, මුව පිස්නා රෙදිකඩ, කොමුයෙන් කළ පැරණි වත, පිරිපුන් තුන් සිවුරු, ඉරීම, පැසුළු සිවුර, කරණ ලද බර වූ පාංසුකූල චීවරය, සිවුරෙහි කොන් දික්වීම, නූල් ඉදිරීම,

17. සිවුරු පත් නැසේ. කඩ කැපීමට නො පොහොනේ ය. අමුතු පටියක් ඇල්ලීම, බොහෝ සිවුරු ලැබීම, අන්ධවනයෙහි තුබූ සිවුර නැතිවීම, අසනියෙන් සඟලසිවුරෙන් වෙන් ව ගම් වැදීම, තනි ව වස් විසීම, වස්සානයෙන් අන් කාලයෙහි එකලා ව විසීම -

18. සහෝදරයෝ දෙදෙන රජගහනුවර වස් වුසූහ. උපනන්ද තෙරුන් සැවැත්නුවර වස් විසීම, දෙපළක එකලා ව වස් විසීම, කුච්ඡිවිකාරය ඇති ගිලනා, ගිලන්හු දෙදෙන, ගිලන් උවටැනට සුදුසු නො සුදුසු අය -

19. නග්න ව පැමිණීම, කුසවැහරි දැරීම, වාකවැහරි, ඵලකවැහරි, කෙහෙකම්බිලි, වාලකම්බිලි, මහමූණු පියාපත්, අඳුන් දිවිසම්, වරාහුයෙන් කළ වැහරි,

20. නියඳින් කළ වැහරි, නිල්වන් වත්, රන්වන් වත්, රතුවත්, මදටිය පැහැ ඇති වත් හා කළු වත්, පත්තැපිටපැහැති වත්, කන්වැපිටපැහැති වත්, නො සිඳූ දැවලු ඇති සිවුරු, එසේම -

21. දික් දැවලු ඇති සිවුරු, මල්දැවලු ඇති සිවුරු, පෙණදැවලු ඇති සිවුරු, සැට්ටය, රුක්සුඹුලු, හිස්වෙළුම්, සිවුරු නූපන් කල්හි බැහැර යයි. සිවුරු උපන් කෙණෙහි සඞ්ඝ තෙමේ බිඳේ.

22. පක්ෂයකට දෙත්. සඞ්ඝයාට දෙත්. ආයුෂ්මත් රේවත තෙමේ (ශාරිපුත්‍ර තෙරුන්ට සිවුරක්) යැවී ය. විශ්වාසයෙන් ගැණීම, ඉරීම, සිවුරු ලැබිමේ මාතෘකා අටෙක යන මොහු වෙත්.

# 9

# චම්පෙය්‍යක්ඛන්ධකං

---

1. තෙන ඛො පන සමයෙන බුද්ධො භගවා **චම්පායං** විහරති **ගග්ගරාය** පොක්ඛරණියා තීරෙ. තෙන ඛො පන සමයෙන **කාසීසු** ජනපදෙසු **වාසභගාමො** නාම හොති. තත්ථ **කස්සපගොත්තො** නාම භික්ඛු ආවාසිකො හොති තන්තිබද්ධො උස්සුක්කං ආපන්නො "කින්ති අනාගතා ච පෙසලා භික්ඛූ ආගච්ඡෙය්‍යුං, ආගතා ච පෙසලා භික්ඛූ ඵාසු[1] විහරෙය්‍යුං, අයඤ්ච ආවාසො වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍යා"ති.

2. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ කාසීසු චාරිකං චරමානා යෙන **වාසභගාමො** තදවසරුං. අද්දසා ඛො කස්සපගොත්තො භික්ඛු තෙ භික්ඛූ දූරතොව ආගච්ඡන්තෙ. දිස්වාන ආසනං පඤ්ඤපෙසි. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපි. පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙසි. පානීයෙන ආපුච්ඡි. නහානෙ උස්සුක්කං අකාසි. උස්සුක්කම්පි අකාසි යාගුයා ඛාදනීයෙ භත්තස්මිං.

3. අථ ඛො තෙසං ආගන්තුකානං භික්ඛූනං එතදහොසි: "භද්දකො ඛො අයං ආවුසො, ආවාසිකො භික්ඛු. නහානෙ උස්සුක්කං කරොති. උස්සුක්කම්පි කරොති යාගුයා ඛාදනීයෙ භත්තස්මිං. හන්ද මයං ආවුසො ඉධෙව වාසභගාමෙ නිවාසං කප්පෙමා"ති. අථ ඛො තෙ ආගන්තුකා භික්ඛූ තත්ථෙව වාසභගාමෙ නිවාසං කප්පෙසුං.

4. අථ ඛො කස්සපගොත්තස්ස භික්ඛුනො එතදහොසි: "යො ඛො ඉමෙසං ආගන්තුකානං භික්ඛූනං ආගන්තුකකිලමථො සො පටිප්පස්සද්ධො. යෙපිමෙ ගොචරෙ අප්පකතඤ්ඤුනො, තෙ දානිමෙ ගොචරෙ පකතඤ්ඤුනො. දුක්කරං ඛො පන පරකුලෙසු යාවජීවං උස්සුක්කං කාතුං. විඤ්ඤත්ති ච මනුස්සානං අමනාපා. යන්නූනාහං න උස්සුක්කං කරෙය්‍යං යාගුයා ඛාදනීයෙ භත්තස්මි"න්ති. සො න උස්සුක්කං අකාසි යාගුයා ඛාදනීයෙ භත්තස්මිං.

5. අථ ඛො තෙසං ආගන්තුකානං භික්ඛූනං එතදහොසි: "පුබ්බෙ ඛ්වායං ආවුසො ආවාසිකො භික්ඛු නහානෙ උස්සුක්කං අකාසි. උස්සුක්කම්පි අකාසි යාගුයා ඛාදනීයෙ භත්තස්මිං. සො දානායං න උස්සුක්කං කරොති යාගුයා ඛාදනීයෙ භත්තස්මිං. දුට්ඨොදානායං ආවුසො, ආවාසිකො භික්ඛු. හන්ද මයං ආවුසො, ආවාසිකං[2] භික්ඛුං උක්ඛිපාමා"ති.

6. අථ ඛො තෙ ආගන්තුකා භික්ඛූ සන්නිපතිත්වා කස්සපගොත්තං භික්ඛුං එතදවොචුං: "පුබ්බෙ ඛො ත්වං ආවුසො නහානෙ උස්සුක්කං කරොසි. උස්සුක්කම්පි කරොසි යාගුයා ඛාදනීයෙ භත්තස්මිං. සොදානි ත්වං න උස්සුක්කං කරොසි යාගුයා ඛාදනීයෙ භත්තස්මිං. ආපත්තිං ත්වං ආවුසො ආපන්නො. පස්සසෙතං ආපත්ති"න්ති. "නත්ථි මෙ ආවුසො ආපත්ති, යමහං පස්සෙය්‍ය"න්ති.

---

1. "ඵාසු" PTS. නො වි.  2. "ඉමං ආවාසිකං" සී.

# 9

# චම්පෙය්‍යක්ඛන්ධකය

1. එකල්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ **චම්පානුවර ගග්ගරා** පොකුණුතෙර වැඩ වසන සේක. **එකල්හි කාසිදනව්වෙහි වාසභගාම** නම් ගමෙක් වේ. එහි **කාශ්‍යපගොත්‍ර** නම් මහණ තෙමේ ආවාසික වූයේ කටයුතු පරම්පරාවෙහි නිති බැඳුනේ "කෙසේ නම් නො පැමිණි ප්‍රියශීල භික්ෂූහු පැමිණෙන්නාහු ද, පැමිණියා වූ ප්‍රියශීල භික්ෂූහු සැප සේ වසන්නාහු ද, මේ ආවාසයත් වැඩීමට දියුණුවට මහත් බවට පැමිණෙන්නේ ද" යි උත්සාහයට පැමිණියේ වේ.

2. එකල්හි බොහෝ භික්ෂූහු කාසිජනපදයෙහි චාරිකා කරන්නාහු වාසභගමට පැමිණියාහු ය. කාශ්‍යපගොත්‍රභික්ෂු තෙමේ එන්නා වූ ඒ භික්ෂූන් දුර දී ම දුටුයේ ය. දැක අසුන් පැණවී ය. පා දෝනා දිය පාපුටුව පා තබන පුවරුව එළවා තැබී ය. ඉදිරියට ගොස් පාසිවුරු පිළිගත්තේ ය. පැනින් පිවාළේ ය. නැමෙහි උනන්දු කෙළේ ය. කැඳෙහි කැවිලියෙහි බතෙහි ද උනන්දු කෙළේ ය.

3. එකල්හි ඒ ආගන්තුකභික්ෂූන්ට "ඇවැත්නි, මේ ආවාසිකභික්ෂු තෙමේ යහපත් ය. නැමට උනන්දු කරයි. කැඳෙහි කැවිලියෙහි බතෙහි ද උනන්දු කරයි. ඇවැත්නි, එබැවින් අපි මෙහි ම වාසභගමෙහි වසමු" යි සිත් වී ය. ඉක්බිති ඒ ආගන්තුකභික්ෂූහු එහි ම වාසභගමෙහි වාසය කළහ.

4. එකල්හි කාශ්‍යපගොත්‍රභික්ෂුහුහට "මේ ආගන්තුකභික්ෂූන්ගේ යම් ආගන්තුකවෙහෙසක් වේ ද, එය සන්සිඳුනේ ය. යම් මේ පැවිද්දෝ ගොදුරු ගමෙහි නො දන්නී ඇත්තාහු ද, ඒ මේ පැවිද්දෝ දැන් ගොදුරුගමෙහි දන්නී ඇත්තෝ වූහ. අන්‍යකුලයන් දිවි තෙක් උනන්දු කිරීම දුෂ්කර ය. විණවීම (ඉල්ලීම) ද මිනිසුන්ගේ මන නො වඩන්නේ ය. (එහෙයින්) මම කැඳෙහි කැවිලියෙහි බතෙහි උනන්දු නො කරන්නෙම් නම් යෙහෙකැ"යි අදහස් වී ය. හෙතෙමේ කැඳෙහි කැවිලියෙහි බතෙහි (ඔවුන්) උනන්දු නො කෙළේ ය.

5. එකල්හි ඒ ආගන්තුකභික්ෂූන්ට "ඇවැත්නි, පෙර මේ ආවාසික භික්ෂු තෙමේ නැමෙහි (අප) උනන්දු කෙළේ ය. කැඳෙහි කැවිලියෙහි බතෙහි ද උනන්දු කෙළේ ය. හෙතෙමේ දැන් කැඳෙහි කැවිලියෙහි බතෙහි උනන්දු නො කරයි. ඇවැත්නි, දැන් මේ ආවාසිකභික්ෂු තෙමේ දුෂ්ට ය. ඇවැත්නි, එබැවින් අපි ආවාසිකභික්ෂුහුහට උත්ක්ෂේපණීයකර්ම කරමු"යි අදහස් වී ය.

6. ඉක්බිති ආගන්තුකභික්ෂූහු රැස් වී කාශ්‍යපගොත්‍රභික්ෂුහුහට "ඇවැත්නි, තෝ පෙර නැමෙහි (අප) උනන්දු කෙරෙහි. කැඳෙහි කැවිලියෙහි බතෙහි ද උනන්දු කෙරෙහි. ඒ තෝ දැන් කැඳෙහි කැවිලියෙහි බතෙහි උනන්දු නො කෙරෙහි. ඇවැත්නි, තෝ ඇවැතට පැමිණියෙහි ය. ඒ ඇවැත දක්නෙහි දැ" යි කීහ. "ඇවැත්නි, මම යම් ඇවැතක් දක්නෙම් ද, මට එබඳු ඇවැතක් නැතැ"යි කී ය.

7. අථ ඛො තෙ ආගන්තුකා භික්ඛූ **කස්සපගොත්තං** භික්ඛුං ආපත්තියා අදස්සනෙ උක්ඛිපිංසු. අථ ඛො කස්සපගොත්තස්ස භික්ඛුනො එතදහොසි: "අහං ඛො එතං න ජානාමි - ආපත්ති වා එසා අනාපත්ති වා ? ආපන්නො වම්හි අනාපන්නො වා ? උක්ඛිත්තො වම්හි අනුක්ඛිත්තො වා ධම්මිකෙන වා අධම්මිකෙන වා කුප්පෙන වා අකුප්පෙන වා ඨානාරහෙන වා අට්ඨානාරහෙන වා ? යන්නූනාහං **චම්පං** ගන්ත්වා භගවන්තං එතමත්ථං පුච්ඡෙය්‍යන්"ති.

8. අථ ඛො කස්සපගොත්තො භික්ඛු සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය යෙන චම්පා තෙන පක්කාමි. අනුපුබ්බෙන යෙන චම්පා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

9. ආචිණ්ණං ඛො පනෙතං බුද්ධානං භගවන්තානං ආගන්තුකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදිතුං. අථ ඛො භගවා කස්සපගොත්තං භික්ඛුං එතදවොච: "කච්චි භික්ඛු ඛමනීයං ? කච්චි යාපනීයං ? කච්චිසි[1] අප්පකිලමථෙන අද්ධානං ආගතො ? කුතො ච ත්වං භික්ඛු ආගච්ඡසී ?"ති.

10. "ඛමනීයං භගවා. යාපනීයං භගවා. අප්පකිලමථෙන චාහං භන්තෙ අද්ධානං ආගතො. අත්ථි භන්තෙ **කාසීසු** ජනපදෙසු **වාසභගාමො** නාම. තත්ථාහං ආවාසිකො තන්තිබද්ධො උස්සුක්කං ආපන්නො: "කින්ති අනාගතා ච පෙසලා භික්ඛූ ආගච්ඡෙය්‍යුං. ආගතා ච පෙසලා භික්ඛූ ඵාසුං විහරෙය්‍යුං. අයඤ්ච ආවාසො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍යා"ති.

11. "අථ ඛො භන්තෙ සම්බහුලා භික්ඛූ කාසීසු චාරිකං චරමානා යෙන වාසභගාමො තදවසරුං. අද්දසං ඛො අහං භන්තෙ, තෙ භික්ඛූ දූරතොව ආගච්ඡන්තෙ. දිස්වාන ආසනං පඤ්ඤපෙසිං. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිං. පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙසිං. පානීයෙන ආපුච්ඡිං. නහානෙ උස්සුක්කං අකාසිං. උස්සුක්කම්පි අකාසිං යාගුයා ඛාදනීයෙ භත්තස්මිං.

12. "අථ ඛො තෙසං භන්තෙ, ආගන්තුකානං භික්ඛූනං එතදහොසි: "භද්දකො ඛො අයං ආවුසො ආවාසිකො භික්ඛු. නහානෙ උස්සුක්කං කරොති. උස්සුක්කම්පි කරොති යාගුයා ඛාදනීයෙ භත්තස්මිං. හන්ද මයං ආවුසො ඉධෙව වාසභගාමෙ නිවාසං කප්පෙමා"ති. අථ ඛො තෙ භන්තෙ, ආගන්තුකා භික්ඛූ තත්ථෙව වාසභගාමෙ නිවාසං කප්පෙසුං.

13. "තස්ස මය්හං භන්තෙ, එතදහොසි: "යො ඛො ඉමෙසං ආගන්තුකානං භික්ඛූනං ආගන්තුකකිලමථො සො පටිප්පස්සද්ධො. යෙපිමෙ ගොචරෙ අප්පකතඤ්ඤුනො, තෙ'දානි'මෙ ගොචරෙ පකතඤ්ඤුනො. දුක්කරං ඛො පන පරකුලෙසු යාවජීවං උස්සුක්කං කාතුං. විඤ්ඤත්ති ච මනුස්සානං අමනාපා. යන්නූනාහං න උස්සුක්කං කරෙය්‍යං යාගුයා ඛාදනීයෙ භත්තස්මි"න්ති. සො ඛො අහං භන්තෙ, න උස්සුක්කං අකාසිං යාගුයා ඛාදනීයෙ භත්තස්මිං.

1. "කච්චිත්ථ" ම ඡ සං.

7. එකල්හි ඒ ආගන්තුකභික්ෂූහු කාශ්‍යපගොත්‍රභික්ෂුහුහට ඇවැත් නො දක්මෙහි උත්ක්ෂෙපණීයකර්මය කළහ. ඉක්බිති කාශ්‍යපගොත්‍රභික්ෂුහුහට “මම මෙය - ඇවැත් යි හෝ නො ඇවැත් යි හෝ පැමිණියේ වෙමි යි හෝ නො පැමිණියේ වෙමි යි හෝ ධාර්මික වූ හෝ අධාර්මික වූ හෝ කොප්‍ය වූ හෝ අකොප්‍ය වූ හෝ සසුනට සුදුසු වූ හෝ සසුනට නො සුදුසු වූ හෝ කර්මයකින් උත්ක්ෂිප්ත වෙමි යි හෝ අනුත්ක්ෂිප්ත වෙමි යි හෝ නො දනිමි. මම **චම්පා**නුවරට ගොස් මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට සැළකරන්නෙම් නම් යෙහෙකැ”යි අදහස් වී ය.

8. අනතුරු ව කාශ්‍යපගොත්‍රභික්ෂුතෙමේ සෙනසුන් තැන්පත් කොට තබා පාසිවුරු ගෙණ චම්පාව බලා නික්ම ගියේ ය. පිළිවෙළින් චම්පාවට ගොස් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය.

9. ආගන්තුකභික්ෂූන් සමග මේ පිළිසඳරකතා කිරීම භාග්‍යවත් බුදුවරුන්ගේ පුරුද්ද ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ කාශ්‍යපගොත්‍රභික්ෂු “මහණ, කිම ඉවසිය හැකි ද? කිම යැපිය හැකි ද? වෙහෙසක් නැති ව දීර්ඝමාර්ගයෙහි ආයේ වෙහි ද? මහණ තෝ කොහි සිට එහි දැ” යි විචාළ සේක.

10. “භාග්‍යවතුන් වහන්ස, ඉවසිය හැකි ය. යැපිය හැකි ය. ස්වාමීනි, මම වැඩි වෙහෙසක් නැති ව දික්මග ආවෙමි. ස්වාමීනි, **කසීදනව්වෙහි වාසභ** නම් ගමෙක් ඇත්තේ ය. මම එහි ආවාසික වෙමි. කටයුතු පරම්පරාවෙන් බැඳුනෝ වෙමි. “කෙසේ නම් නො පැමිණියා වූ ප්‍රියශීල භික්ෂූහු පැමිණෙන්නාහු ද පැමිණියා වූ ප්‍රියශීල භික්ෂූහු සැප සේ වසන්නාහු ද මේ ආවාසයත් වැඩීමට දියුණුවට මහත්බවට පැමිණෙන්නේ දැ” යි උත්සාහයට පැමිණියෙමි.

11. “ස්වාමීනි, ඒ අතර බොහෝ භික්ෂූහු කසීදනව්වෙහි චාරිකා කරන්නාහු වාසභගමට පැමිණියාහු ය. ස්වාමීනි, මම එන්නා වූ ඒ භික්ෂූන් දුර දී ම දුටුවෙමි. දැක අසුන් පැණවීමි. පා ධෝනා දිය පාපුටුව පා තබන පුවරුව එළවා තැබීමි. ඉදිරියට ගොස් පාසිවුරු පිළිගතිමි. පැනින් විචාළෙමි. නැමෙහි උනන්දු කෙළෙමි. කැඳෙහි කැවිලියෙහි බතෙහි ද උනන්දු කෙළෙමි.

12. “ස්වාමීනි, එකල්හි ඒ ආගන්තුකභික්ෂූන්ට ‘ඇවැත්නි, මේ ආවාසික භික්ෂු තෙමේ යහපත් ය. නැමෙහි උනන්දු කරයි. කැඳෙහි කැවිලියෙහි බතෙහි ද උනන්දු කරයි. ඇවැත්නි, එබැවින් අපි මෙහි වාසභගමෙහි ම වාසය කරමු’යි අදහස් වි ය. ස්වාමීනි, ඉන් පසු ඒ ආගන්තුකභික්ෂූහු එහි වාසභගමෙහි ම වාසය කළහ.

13. “ස්වාමීනි, ඒ මට ‘ආගන්තුකභික්ෂූන්ගේ යම් අමුතු වෙහෙසක් වී ද, එය සන් සිඳුනේය. යම් මේ පැවිද්දෝ ගොදුරුගමෙහි තතු නො දන්නෝ ද ඒ මේ පැවිද්දෝ දැන් ගොදුරුගමෙහි තතු දන්නෝ ය. අන්‍යකුලයන් දිවිහිමි කොට උනන්දු කිරීම දුෂ්කර ය. පිණවීම ද මිනිසුන්ගේ මන නො වඩන්නේ ය. (එහෙයින්) මට ‘කැඳෙහි කැවිලියෙහි බතෙහි උනන්දු නො කරන්නෙම් නම් යෙහෙකැ’යි අදහස් වී ය. ස්වාමීනි, ඒ මම කැඳෙහි කැවිලියෙහි බතෙහි උනන්දු නො කෙළෙමි” යි සැළ කෙළේ ය.

14. "අථ ඛො තෙසං භන්තෙ, ආගන්තුකානං භික්ඛූනං එතදහොසි: 'පුබ්බෙ ඛ්වායං ආවුසො ආවාසිකො භික්ඛු නහානෙ උස්සුක්කං කරොති. උස්සුක්කම්පි කරොති යාගුයා ඛාදනීයෙ භත්තස්මිං. සො'දානායං න උස්සුක්කං කරොති යාගුයා ඛාදනීයෙ භත්තස්මිං. දුට්ඨොදා'නායං ආවුසො, ආවාසිකො භික්ඛු. හන්ද මයං ආවුසො, ආවාසිකං භික්ඛුං උක්ඛිපාමා'ති.

15. "අථ ඛො තෙ භන්තෙ, ආගන්තුකා භික්ඛූ සන්නිපතිත්වා මං එතදවොචුං: 'පුබ්බෙ ඛො ත්වං ආවුසො, නහානෙ උස්සුක්කං කරොසි. උස්සුක්කම්පි කරොසි යාගුයා ඛාදනීයෙ භත්තස්මිං. සො'දානි ත්වං න උස්සුක්කං කරොසි යාගුයා ඛාදනීයෙ භත්තස්මිං. ආපත්තිං ත්වං ආවුසො ආපන්නො.' පස්සසෙතං ආපත්ති'න්ති. 'නත්ථි මෙ ආවුසො ආපත්ති, යමහං පස්සෙය්‍ය'න්ති.

16. "අථ ඛො තෙ භන්තෙ, ආගන්තුකා භික්ඛූ මං ආපත්තියා අදස්සනෙ උක්ඛිපිංසු. තස්ස මය්හං භන්තෙ එතදහොසි: 'අහං ඛො එතං න ජානාමි: ආපත්ති වා එසා අනාපත්ති වා, ආපන්නො වම්හි අනාපන්නො වා, උක්ඛිත්තො වම්හි අනුක්ඛිත්තො වා ධම්මිකෙන වා අධම්මිකෙන වා කුප්පෙන වා අකුප්පෙන වා ඨානාරහෙන වා අට්ඨානාරහෙන වා. යන්නූනාහං **චම්පං** ගන්ත්වා භගවන්තං එතමත්ථං පුච්ඡෙය්‍ය'න්ති. තතොහං භගවා ආගච්ඡාමී"ති.

17. "අනාපත්ති එසා භික්ඛු. නෙසා ආපත්ති. අනාපන්නොසි. නසි ආපන්නො. අනුක්ඛිත්තොසි. නසි උක්ඛිත්තො. අධම්මිකෙනාසි කම්මෙන උක්ඛිත්තො කුප්පෙන අට්ඨානාරහෙන. ගච්ඡ ත්වං භික්ඛු, තත්ථෙව **වාසභ-ගාමෙ** නිවාසං කප්පෙහී"ති. "එවං භන්තෙ"ති ඛො **කස්සපගොත්තො** භික්ඛු භගවතො පටිස්සුත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන **වාසභගාමො** තෙන පක්කාමි.

18. අථ ඛො තෙසං ආගන්තුකානං භික්ඛූනං අහුදෙව කුක්කුච්චං. අහු විප්පටිසාරො: "අලාභා වත නො, න වත නො ලාභා, දුල්ලද්ධං වත නො, න වත නො සුලද්ධං, යෙ මයං සුද්ධං භික්ඛුං අනාපත්තිකං අවත්ථුස්මිං අකාරණෙ උක්ඛිපිම්හ. හන්ද මයං ආවුසො, **චම්පං** ගන්ත්වා භගවතො සන්තිකෙ අච්චයං අච්චයතො දෙසෙමා"ති.

19. අථ ඛො තෙ ආගන්තුකා භික්ඛූ සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන **චම්පා** තෙන පක්කමිංසු. අනුපුබ්බෙන යෙන චම්පා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

20. ආචිණ්ණං ඛො පනෙතං බුද්ධානං භගවන්තානං ආගන්තුකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදිතුං. අථ ඛො භගවා තෙ භික්ඛූ එතදවොච: "කච්චි භික්ඛවෙ, ඛමනීයං? කච්චි යාපනීයං? කච්චිත්ථ අප්පකිලමථෙන අද්ධානං ආගතා? කුතො ච තුම්හෙ භික්ඛවෙ, ආගච්ඡථා"ති. "ඛමනීයං භගවා. යාපනීයං භගවා. අප්පකිලමථෙන ච මයං භන්තෙ, අද්ධානං ආගතා. අත්ථි භන්තෙ **කාසීසු** ජනපදෙසු **වාසභගාමො** නාම. තතො මයං භගවා ආගච්ඡාමා"ති. "තුම්හෙ භික්ඛවෙ, ආවාසිකං භික්ඛුං උක්ඛිපිත්ථා"ති. "එවං භන්තෙ"ති. "කිස්මිං භික්ඛවෙ, වත්ථුස්මිං කිස්මිං කාරණෙ"ති. "අවත්ථුස්මිං භගවා අකාරණෙ"ති.

14. "අනතුරු ව ස්වාමීනි, ඒ ආගන්තුකභික්ෂූන්ට 'ඇවැත්නි, පෙර මේ ආවාසිකභික්ෂු තෙමේ නැමෙහි උනන්දු කරයි. කැඳෙහි කැවිලියෙහි බතෙහි උනන්දු ද කරයි. හෙතෙමේ දැන් කැඳෙහි කැවිලියෙහි බතෙහි උනන්දු නො කරයි. ඇවැත්නි, දැන් මේ ආවාසිකභික්ෂු තෙමේ දුෂ්ට ය. ඇවැත්නි, එබැවින් අපි ආවාසිකභික්ෂු නම උත්ක්ෂෙපණීයකර්මයෙන් බැහැර කරමු' යි අදහස් වී ය.

15. "ස්වාමීනි, නැවැත ඒ ආගන්තුකභික්ෂූහු රැස් වී 'ඇවැත්නි, තෝ පෙර නැමෙහි උනන්දු කෙළෙහි. කැඳෙහි කැවිලියෙහි බතෙහි උනන්දු කෙළෙහි. දැන් තෝ කැඳෙහි කැවිලියෙහි බතෙහි උනන්දු නො කෙරෙහි. ඇවැත්නි, තෝ ඇවැතට පැමිණියෙහි. මේ ඇවැත දක්නෙහි දැ' යි මට මෙසේ කීහ. ඇවැත්නි, 'මම යම් ඇවැතක් දක්නෙම් ද (එබඳු) ඇවැතක් මට නැතැ' යි කීමි."

16. "ඉක්බිති ස්වාමීනි, ඒ ආගන්තුකභික්ෂූහු ඇවැත් නො දක්මෙහි මා උත්ක්ෂෙපණීයකර්මයෙන් බැහැර කළහ. ස්වාමීනි, මම මෙය 'ඇවැත් යි හෝ, නො ඇවැත් යි හෝ, පැමිණියේ වෙමි යි හෝ, නො පැමිණියේ වෙමි යි හෝ, ධාර්මික වූ හෝ අධාර්මික වූ හෝ කොප්‍ය වූ හෝ අකොප්‍ය වූ හෝ සසුනට සුදුසු වූ හෝ සසුනට නො සුදුසු වූ හෝ කර්මයකින් උත්ක්ෂිප්ත වෙමි යි හෝ අනුත්ක්ෂිප්ත වෙමියි හෝ, නො දනිමි. මම **චම්පාවට** ගොස් භාග්‍යවතුන් වහන්සේගෙන් මේ කාරණය විචාරන්නෙම් නම් යෙහෙකැ'යි මට අදහස් වී ය. භාග්‍යවතුන් වහන්ස, මම චම්පානුවර සිට එමි' යි හෙතෙමේ කී ය.

17. "මහණ, මෙය අනාපත්තියකි. මෙය ආපත්තියක් නො වේ. ඇවැතට නො පැමිණියෙහි ය. ඇවැතට පැමිණියේ නො වෙහි ය. අනුත්ක්ෂිප්ත වෙහි ය. උත්ක්ෂිප්ත නො වෙහි ය. අධාර්මික වූ කොප්‍ය වූ සසුනට නො සුදුසු වූ කර්මයකින් උත්ක්ෂිප්ත වෙහි ය. මහණ, තෝ යව. එහි **වාසභගාමෙහි** ම වාසය කරව" යි. වදාළ සේක. "ස්වාමීනි, එසේ ය" යි **කාශ්‍යපගොත්‍රභික්ෂු** තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට වාසභගම බලා නික්ම ගියේ ය.

18. එකල්හි ඒ ආගන්තුකභික්ෂූන්ට "යම් අපි ඒ පිරිසිදු, ඇවැත් රහිත, මහණකු වස්තු නැත්තෙහි නිකරුණෙහි උත්ක්ෂෙපණීයකර්මයෙන් බැහැර කෙළෙමු ද, එය අපට අලාභයෙකි. අපට ලාභයෙක් නො වේ. අපට වූයේ නපුරෙකි. අපට වූයේ යහපතෙක් නො වේ" යි කුකුසෙක් වී ය. විපිළිසරෙක් වී ය. "ඇවැත්නි, එබැවින් අපි **චම්පාවට** ගොස් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි වරද වරද හැටියට දෙසමු" යි සිතූහ.

19. ඉක්බිති ඒ ආගන්තුකභික්ෂූහු සෙනසුන් තැන්පත් කොට තබා පාසිවුරු ගෙණ **චම්පාවට** ගියහ. පිළිවෙළින් චම්පාවට ගොස් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්හ.

20. ආගන්තුකභික්ෂූන් සමග මේ පිළිසඳර කතා කිරීම භාග්‍යවත් බුදුවරුන්ගේ පුරුද්දෙකි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, කිම ඉවසිය හැකි ද ? කිම යැපිය හැකි ද? කිම වෙහෙස නැති ව දිග්මග ආවහු ද ? මහණෙනි, තෙපි කොහි සිට ආවහු දැ ?" යි ඒ භික්ෂූන් විචාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, ඉවසිය හැකි ය. භාග්‍යවතුන් වහන්ස, යැපිය හැකි ය. ස්වාමීනි, අපි වෙහෙස නැති ව දිග්මග ආවෝ වෙමු. ස්වාමීනි, **කාසි**-දනව්වෙහි **වාසභ** නම් ගමෙක් ඇත්තේ ය. භාග්‍යවතුන් වහන්ස, අපි එහි සිට එන්නෙමු" කීහ. "මහණෙනි, තෙපි ආවාසිකභික්ෂුනම උත්ක්ෂෙපණීය කර්මයෙන් බැහැර කළහු ද ?" "ස්වාමීනි, එසේ ය." "මහණෙනි, කිනම් වස්තුවෙක්හි කිනම් කරුණෙක්හි දැ" යි විචාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, වස්තු නැත්තෙහි නිකරුණෙහි ය". යි කීහ.

21. විගරහි බුද්ධො භගවා. "අනනුච්ඡවියං මොඝපුරිසා, අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම තුම්හෙ මොඝපුරිසා, සුද්ධං භික්ඛුං අනාපත්තිකං අවත්ථුස්මිං අකාරණෙ උක්ඛිපිස්සථ? නෙතං මොඝපුරිසා, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "න භික්ඛවෙ, සුද්ධො භික්ඛු අනාපත්තිකො අවත්ථුස්මිං අකාරණෙ උක්ඛිපිතබ්බො. යො උක්ඛිපෙය්‍ය, ආපත්ති දුක්කටස්සා" ති.

22. අථ ඛො තෙ භික්ඛූ උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොචුං: "අච්චයො නො භන්තෙ, අච්චගමා යථා බාලෙ යථා මූළ්හෙ යථා අකුසලෙ, යෙ මයං සුද්ධං භික්ඛුං අනාපත්තිකං අවත්ථුස්මිං අකාරණෙ උක්ඛිපිම්හ. තෙසං නො භන්තෙ භගවා අච්චයං අච්චයතො පතිගණ්හාතු ආයතිං සංවරායා" ති. "තග්ඝ තුම්හෙ භික්ඛවෙ, අච්චයො අච්චගමා යථා බාලෙ යථා මූළ්හෙ යථා අකුසලෙ, යෙ තුම්හෙ සුද්ධං භික්ඛුං අනාපත්තිකං අවත්ථුස්මිං අකාරණෙ උක්ඛිපිත්ථ. යතො ච ඛො තුම්හෙ භික්ඛවෙ, අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොථ, තං වො මයං පතිගණ්හාම. වුද්ධි හෙසා භික්ඛවෙ, අරියස්ස විනයෙ යො අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති, ආයතිඤ්ච සංවරං ආපජ්ජතී" ති.

23. තෙන ඛො පන සමයෙන චම්පායං භික්ඛූ එවරූපානි කම්මානි කරොන්ති: අධම්මෙන වග්ගකම්මං කරොන්ති. අධම්මෙන සමග්ගකම්මං කරොන්ති. ධම්මෙන වග්ගකම්මං කරොන්ති. ධම්මපතිරූපකෙන වග්ගකම්මං කරොන්ති. ධම්මපතිරූපකෙන සමග්ගකම්මං කරොන්ති. එකොපි එකං උක්ඛිපති. එකොපි ද්වෙ උක්ඛිපති. එකොපි සම්බහුලෙ උක්ඛිපති. එකොපි සඞ්ඝං උක්ඛිපති. ද්වෙපි එකං උක්ඛිපන්ති. ද්වෙපි ද්වෙ උක්ඛිපන්ති. ද්වෙපි සම්බහුලෙ උක්ඛිපන්ති. ද්වෙපි සඞ්ඝං උක්ඛිපන්ති. සම්බහුලාපි එකං උක්ඛිපන්ති. සම්බහුලාපි ද්වෙ උක්ඛිපන්ති. සම්බහුලාපි සම්බහුලෙ උක්ඛිපන්ති. සම්බහුලාපි සඞ්ඝං උක්ඛිපන්ති. සඞ්ඝොපි සඞ්ඝං උක්ඛිපති.

24. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම චම්පායං භික්ඛූ එවරූපානි කම්මානි කරිස්සන්ති? අධම්මෙන වග්ගකම්මං කරිස්සන්ති? අධම්මෙන සමග්ගකම්මං කරිස්සන්ති? ධම්මෙන වග්ගකම්මං කරිස්සන්ති? ධම්මපතිරූපකෙන වග්ගකම්මං කරිස්සන්ති? ධම්මපතිරූපකෙන සමග්ගකම්මං කරිස්සන්ති? එකොපි එකං උක්ඛිපිස්සති? එකොපි ද්වෙ උක්ඛිපිස්සති? එකොපි සම්බහුලෙ උක්ඛිපිස්සති? එකොපි සඞ්ඝං උක්ඛිපිස්සති? ද්වෙපි එකං උක්ඛිපිස්සන්ති? ද්වෙපි ද්වෙ උක්ඛිපිස්සන්ති? ද්වෙපි සම්බහුලෙ උක්ඛිපිස්සන්ති? ද්වෙපි සඞ්ඝං උක්ඛිපිස්සන්ති? සම්බහුලාපි එකං උක්ඛිපිස්සන්ති? සම්බහුලාපි ද්වෙ උක්ඛිපිස්සන්ති? සම්බහුලාපි සම්බහුලෙ උක්ඛිපිස්සන්ති? සම්බහුලාපි සඞ්ඝං උක්ඛිපිස්සන්ති? සඞ්ඝොපි සඞ්ඝං උක්ඛිපිස්සතී" ති.

21. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ "භික්ෂුවෙනි, නො සුදුස්සෙක. නො ගැළපෙන්නක. අනුලොම් නො වූවෙක. මහණකමට නො සරි ලන්නෙක. නො කැප වූවෙක. නො කටයුත්තෙක. භික්ෂුවෙනි, කෙසේ නම් තෙපි පිරිසිදු වූ ඇවැත් රහිත වූ මහණකු වස්තු නැත්තෙහි නිකරුණෙහි බැහැර කළහු ද? භික්ෂුවෙනි, මෙය නො පැහැදුන-වුන්ගේ පැහැදීම පිණිස හෝ නො වේ -පෙ- ගරහා දැහැමි කතා කොට මහණෙනි, පිරිසිදු වූ ඇවැත් රහිත වූ මහණ තෙමේ වස්තු නැත්තෙහි නිකරුණෙහි බැහැර නො කළ යුතු ය. යමෙක් බැහැර කරන්නේ නම්, දුකුළා ඇවැත් වේ" යි වදාළ සේක.

22. ඉක්බිති ඒ භික්ෂූහු හුනස්නෙන් නැගිට උතුරුසඟසිවුර එකස් කොට භාග්‍යවතුන් වහන්සේගේ පාමුල්හි හිසින් වැටී භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, යම් ඒ අපි ඇවැත් නැත්තෙහි නිකරුණෙහි පිරිසිදු වූ ඇවැත් රහිත වූ මහණකු බැහැර කෙළෙමු ද, අඥයන් යම් සේ ද මුළාවූවන් යම් සේ ද අදක්ෂයන් යම් සේ ද එසේ වරද අප ඉක්මවා (අබිබවා) ගියේ ය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මතු හික්මීම පිණිස ඒ අපගේ වරද වරද වසයෙන් පිළිගන්නා සේක්වා" යි සැලකළහ. "මහණෙනි, යම් ඒ තෙපි පිරිසිදු වූ ඇවැත් රහිත වූ මහණකු වස්තු නැත්තෙහි නිකරුණෙහි බැහැර කළහු ද, එබැවින් අඥයන් යම් සේ ද මුළා වූවන් යම් සේ ද අදක්ෂයන් යම් සේ ද එසේ වරද තොප ඉක්මවා ගියේ ය. මහණෙනි, යම් හෙයකින් තෙපි වරද වරද වසයෙන් දැක දහම් පරිදි පිළියම් කරවු ද, අපි තොපගේ ඒ ප්‍රතිකර්මය පිළිගණිමු. යමෙක් වරද වරද වසයෙන් දැක දහම් පරිදි පිළියම් කෙරේ ද, මත්තෙහි හික්මීමට පැමිණේ ද, මහණෙනි, මේ ආය්‍යීවිනයයෙහි වැඩීමෙක් ම වේ."

23. එකල්හි චම්පානුවර භික්ෂූහු මෙබඳු කර්ම කෙරෙත්: අධර්මයෙන් ව්‍යග්‍රකර්ම කෙරෙත්. අධර්මයෙන් සමග්‍රකර්ම කෙරෙත්. ධර්මයෙන් ව්‍යග්‍රකර්ම කෙරෙත්. ධර්මප්‍රතිරූපකයෙන් ව්‍යග්‍රකර්ම කෙරෙත්. ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍රකර්ම කෙරෙත්. එකෙක් ද එකකු බැහැර කෙරෙයි. එකෙක් ද දෙදෙ-නකුන් බැහැර කෙරෙයි. එකෙක් ද බොහෝ දෙනකුන් බැහැර කෙරෙයි. එකෙක් ද සඞ්ඝයා බැහැර කෙරෙයි. දෙදෙනෙක් ද එකකු බැහැර කෙරෙත්. දෙදෙනෙක් ද දෙදෙනකුන් බැහැර කෙරෙත්. දෙදෙනෙක් ද බොහෝ දෙනකුන් බැහැර කෙරෙත්. දෙදෙනෙක් ද සඞ්ඝයා බැහැර කෙරෙත්. බොහෝ දෙන ද එකකු බැහැර කෙරෙත්. බොහෝ දෙන ද දෙදෙනකුන් බැහැර කෙරෙත්. බොහෝ දෙන ද බොහෝ දෙනකුන් බැහැර කෙරෙත්. බොහෝ දෙන ද සඞ්ඝයා බැහැර කෙරෙත්. සඞ්ඝ තෙමේ ද සඞ්ඝයා බැහැර කෙරෙයි.

24. අල්පෙච්ඡ වූ -පෙ- යම් ඒ භික්ෂූහු වෙත් ද ඔහු "කෙසේ නම් චම්පානුවර භික්ෂූහු මෙබඳු කර්ම කරත් ද? අධර්මයෙන් ව්‍යග්‍රකර්ම කරත් ද? අධර්මයෙන් සමග්‍රකර්ම කරත් ද? ධර්මයෙන් ව්‍යග්‍රකර්ම කරත් ද? ධර්මප්‍රතිරූපක-යෙන් ව්‍යග්‍රකර්ම කරත් ද? ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍රකර්ම කරත් ද, එකෙක් ද එකකු බැහැර කෙරේ ද? එකෙක් ද දෙදෙනකුන් බැහැර කෙරේ ද? එකෙක් ද බොහෝ දෙනකුන් බැහැර කෙරේ ද? එකෙක් ද සඞ්ඝයා බැහැර කෙරේ ද, දෙදෙනෙක් ද එකකු බැහැර කරත් ද? දෙදෙනෙක් ද දෙදෙනකුන් බැහැර කරත් ද, දෙදෙනෙක් ද බොහෝ දෙනකුන් බැහැර කරත් ද? දෙදෙනෙක් ද සඞ්ඝයා බැහැර කරත් ද? බොහෝ දෙන ද එකකු බැහැර කරත් ද? බොහෝ දෙන ද දෙදෙනකුන් බැහැර කරත් ද? බොහෝ දෙන ද බොහෝ දෙනකුන් බැහැර කරත් ද? බොහෝ දෙන ද සඞ්ඝයා බැහැර කරත් ද? සඞ්ඝ තෙමේ ද සඞ්ඝයා බැහැර කෙරේ දැ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්.

25. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ, **චම්පායං** භික්ඛූ එවරූපානි කම්මානි කරොන්ති? අධම්මෙන වග්ගකම්මං කරොන්ති? -පෙ- සඞ්ඝොපි සඞ්ඝං උක්ඛිපතී" ති. "සච්චං භගවා."

26. විගරහි බුද්ධො භගවා "අනනුච්ඡවියං භික්ඛවෙ, තෙසං මොඝ-පුරිසානං අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා එවරූපානි කම්මානි කරිස්සන්ති? අධම්මෙන වග්ගකම්මං කරිස්සන්ති? -පෙ- සඞ්ඝොපි සඞ්ඝං උක්ඛිපිස්සති.?

27. "නෙතං භික්ඛවෙ, අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අධම්මෙන වෙ භික්ඛවෙ, වග්ග-කම්මං අකම්මං. න ච කරණීයං. අධම්මෙන[1] සමග්ගකම්මං අකම්මං. න ච කරණීයං. ධම්මෙන වග්ගකම්මං අකම්මං. න ච කරණීයං. ධම්මපතිරූපකෙන වග්ගකම්මං අකම්මං. න ච කරණීයං. ධම්මපතිරූපකෙන සමග්ගකම්මං අකම්මං. න ච කරණීයං. එකොපි එකං උක්ඛිපති, අකම්මං න ච කරණීයං. එකොපි ද්වෙ උක්ඛිපති, අකම්මං. න ච කරණීයං. එකොපි සම්බහුලෙ උක්ඛිපති, අකම්මං. න ච කරණීයං. එකොපි සඞ්ඝං උක්ඛිපති, අකම්මං. න ච කරණීයං. ද්වෙපි එකං උක්ඛිපන්ති, අකම්මං. න ච කරණීයං. ද්වෙපි ද්වෙ උක්ඛිපන්ති, අකම්මං. න ච කරණීයං. ද්වෙපි සම්බහුලෙ උක්ඛිපන්ති, අකම්මං. න ච කරණීයං. ද්වෙපි සඞ්ඝං උක්ඛිපන්ති, අකම්මං. න ච කරණීයං. සම්බහුලාපි එකං උක්ඛිපන්ති, අකම්මං. න ච කරණීයං. සම්බහුලාපි ද්වෙ උක්ඛිපන්ති, අකම්මං. න ච කරණීයං. සම්බහුලාපි සම්බහුලෙ උක්ඛිපන්ති, අකම්මං. න ච කරණීයං. සම්බහුලාපි සඞ්ඝං උක්ඛිපන්ති අකම්මං. න ච කරණීයං. සඞ්ඝොපි සඞ්ඝං උක්ඛිපති, අකම්මං. න ච කරණීයං.

28. "චත්තාරිමානි, භික්ඛවෙ, කම්මානි: අධම්මෙන වග්ගකම්මං. අධම්මෙන සමග්ගකම්මං. ධම්මෙන වග්ගකම්මං. ධම්මෙන සමග්ගකම්මං.

29. "තත්‍ර භික්ඛවෙ, යමිදං අධම්මෙන වග්ගකම්මං, ඉදං භික්ඛවෙ, කම්මං අධම්මත්තා වග්ගත්තා කුප්පං අට්ඨානාරහං. න භික්ඛවෙ, එවරූපං කම්මං කාතබ්බං. න ච මයා එවරූපං කම්මං අනුඤ්ඤාතං.

30. "තත්‍ර භික්ඛවෙ, යමිදං[2] අධම්මෙන සමග්ගකම්මං, ඉදං භික්ඛවෙ කම්මං අධම්මත්තා කුප්පං අට්ඨානාරහං. න භික්ඛවෙ, එවරූපං කම්මං කාතබ්බං. න ච මයා එවරූපං කම්මං අනුඤ්ඤාතං.

31. "තත්‍ර භික්ඛවෙ, යමිදං ධම්මෙන වග්ගකම්මං, ඉදං භික්ඛවෙ, කම්මං වග්ගත්තා කුප්පං අට්ඨානාරහං. න භික්ඛවෙ, එවරූපං කම්මං කාතබ්බං. න ච මයා එවරූපං කම්මං අනුඤ්ඤාතං.

---

1. "අධම්මෙන වෙ භික්ඛවෙ" සී.  2. "යදිදං" ම ජ සං

25. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, චම්පානුවර වැසි භික්ෂූහු අධර්මයෙන් ව්‍යග්‍රකර්ම කෙරෙත්. -පෙ- සඞ්ඝ තෙමේ ද සඞ්ඝයා බැහැර කෙරේ යන මෙබඳු වූ කර්ම කෙරෙත් ල යනු සැබෑ ද" ? "භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය."

26. භාග්‍යවත් බුදුරජානන් වහන්සේ "මහණෙනි, ඒ හිස්පුරුෂයන්ගේ (මේ ක්‍රියාව) නො සුදුසු ය. අනුලෝම නො වූවෙක. නො ගැලපෙන්නෙක. මහණපිළිවෙතට නො සරි ලන්නෙක. නො කැප වූවෙක. නො කටයුත්තෙක. මහණෙනි, කෙසේ නම් ඒ හිස්පුරුෂයෝ අධර්මයෙන් ව්‍යග්‍රකර්ම කරත් ද -පෙ- සඞ්ඝතෙමේත් සඞ්ඝයා බැහැර කෙරේ ද යන මෙබඳු වූ කර්ම කරත් ද."

27. මහණෙනි, මෙය නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස නො වේ. -පෙ- ගරහා දැහැමි කථා කොට මහණෙනි, අධර්මයෙන් ව්‍යග්‍රකර්මයෙක් වේ නම්, (ඒ) කර්ම නො වේ. ඒ නො කට යුතු ය. අධර්මයෙන් සමග්‍රකර්මයෙක් වේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. ධර්මයෙන් ව්‍යග්‍රකර්මයෙක් වේ නම් කර්ම නො වේ. ඒ නො කට යුතු ය. ධර්මප්‍රතිරූපකයෙන් ව්‍යග්‍රකර්මයක් වේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍රකර්මයෙක් වේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. එකෙක් ද එකකු බැහැර කෙරේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. එකෙක් ද දෙදෙනකුන් බැහැර කෙරේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. එකෙක් ද බොහෝ දෙනකුන් බැහැර කෙරේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. එකෙක් ද සඞ්ඝයා බැහැර කෙරේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. දෙදෙනෙක් ද එකකු බැහැර කෙරෙත් නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. දෙදෙනෙක් ද දෙදෙනකුන් බැහැර කෙරෙත් නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. දෙදෙනෙක් ද බොහෝ දෙනකුන් බැහැර කෙරෙත් නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. දෙදෙනෙක් ද සඞ්ඝයා බැහැර කෙරෙත් නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. බොහෝ දෙන ද එකකු බැහැර කෙරෙත් නම්, කර්ම නො වේ. ඒ නො කටයුතු ය. බොහෝ දෙන ද දෙදෙනකුන් බැහැර කෙරෙත් නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. බොහෝ දෙන ද බොහෝ දෙනකුන් බැහැර කෙරෙත් නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. බොහෝ දෙන ද සඞ්ඝයා බැහැර කෙරෙත් නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. සඞ්ඝ තෙමේ ද සඞ්ඝයා බැහැර කෙරේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය යි වදාළ සේක.

28. "මහණෙනි, අධර්මයෙන් ව්‍යග්‍රකර්ම ය, අධර්මයෙන් සමග්‍රකර්ම ය, ධර්මයෙන් ව්‍යග්‍රකර්ම ය, ධර්මයෙන් සමග්‍රකර්ම ය යි මේ කර්ම සතරෙක් වේ.

29. "මහණෙනි, එහි යම් මේ අධර්මයෙන් ව්‍යග්‍රකර්මයෙක් වේ ද, මහණෙනි, මේ කර්මය අධර්ම බැවින් ව්‍යග්‍ර බැවින් කොප්‍ය වේ. සසුනට සුදුසු නො වේ. මහණෙනි, එබඳු වූ කර්මය නො කට යුතු ය. මා විසින් එබඳු කර්මයෙක් නො අනුදන්නා ලද ය.

30. "මහණෙනි, එහි යම් මේ අධර්මයෙන් සමග්‍රකර්මයෙක් වේ ද, මහණෙනි, මේ කර්මය අධර්ම බැවින් කොප්‍ය වේ. සසුනට නො සුදුසු වේ. මහණෙනි, එබඳු වූ කර්මය නො කට යුතු ය. මා විසින් එබඳු කර්මයක් නො අනුදන්නා ලද ය.

31. "මහණෙනි, එහි යම් මේ ධර්මයෙන් ව්‍යග්‍රකර්මයෙක් වේ ද, මහණෙනි, මේ කර්මය ව්‍යග්‍ර බැවින් කොප්‍ය වේ. සසුනට නො සුදුසු වේ. මහණෙනි එබඳු වූ කර්මය නො කට යුතු ය. මා විසින් එබඳු කර්මයෙක් නො අනුදන්නා ලද ය."

32. "තත්‍ර භික්ඛවෙ, යමිදං ධම්මෙන සමග්ගකම්මං, ඉදං භික්ඛවෙ කම්මං ධම්මත්තා සමග්ගත්තා අකුප්පං ඨානාරහං. එවරූපං භික්ඛවෙ, කම්මං කාතබ්බං. එවරූපඤ්ච මයා කම්මං අනුඤ්ඤාතං. තස්මාතිහ භික්ඛවෙ, එවරූපං කම්මං කරිස්සාම 'යදිදං ධම්මෙන සමග්ග'න්ති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බ" න්ති.

33. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා භික්ඛූ** එවරූපානි කම්මානි කරොන්ති: අධම්මෙන වග්ගකම්මං කරොන්ති. අධම්මෙන සමග්ගකම්මං කරොන්ති. ධම්මෙන වග්ගකම්මං කරොන්ති. ධම්මපතිරූපකෙන වග්ගකම්මං කරොන්ති. ධම්මපතිරූපකෙන සමග්ගකම්මං කරොන්ති. ඤත්තිවිපන්නම්පි කම්මං කරොන්ති අනුසාවනසම්පන්නං. අනුසාවනවිපන්නම්පි කම්මං කරොන්ති ඤත්තිසම්පන්නං. ඤත්තිවිපන්නම්පි අනුසාවනවිපන්නම්පි කම්මං කරොන්ති. අඤ්ඤත්‍රාපි ධම්මා කම්මං කරොන්ති. අඤ්ඤත්‍රාපි විනයා කම්මං කරොන්ති. අඤ්ඤත්‍රාපි සත්ථුසාසනා කම්මං කරොන්ති. පටිකුට්ඨකතම්පි[1] කම්මං කරොන්ති අධම්මිකං කුප්පං අට්ඨානාරහං.

34. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ එවරූපානි කම්මානි කරිස්සන්ති: අධම්මෙන වග්ගකම්මං කරිස්සන්ති? අධම්මෙන සමග්ගකම්මං කරිස්සන්ති? ධම්මෙන වග්ගකම්මං කරිස්සන්ති? ධම්මපතිරූපකෙන වග්ගකම්මං කරිස්සන්ති? ධම්මපතිරූපකෙන සමග්ගකම්මං කරිස්සන්ති? ඤත්තිවිපන්නම්පි කම්මං කරිස්සන්ති අනුසාවනසම්පන්නං? අනුසාවනවිපන්නම්පි කම්මං කරිස්සන්ති ඤත්තිසම්පන්නං? ඤත්තිවිපන්නම්පි අනුසාවනවිපන්නම්පි කම්මං කරිස්සන්ති? අඤ්ඤත්‍රාපි ධම්මා කම්මං කරිස්සන්ති? අඤ්ඤත්‍රාපි විනයා කම්මං කරිස්සන්ති? අඤ්ඤත්‍රාපි සත්ථුසාසනා කම්මං කරිස්සන්ති? පටිකුට්ඨකතම්පි කම්මං කරිස්සන්ති අධම්මිකං කුප්පං අට්ඨානාරහ" න්ති.

35. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. "සච්චං කිර භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛූ එවරූපානි කම්මානි කරොන්ති? අධම්මෙන වග්ගකම්මං කරොන්ති? -පෙ- පටිකුට්ඨකතම්පි කම්මං කරොන්ති අධම්මිකං කුප්පං අට්ඨානාරහ" න්ති.

36. "සච්චං භගවා" -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අධම්මෙන චෙ භික්ඛවෙ, වග්ගකම්මං අකම්මං. න ච කරණීයං. අධම්මෙන සමග්ගකම්මං අකම්මං. න ච කරණීයං, ධම්මෙන වග්ගකම්මං අකම්මං. න ච කරණීයං. ධම්මපතිරූපකෙන වග්ගකම්මං අකම්මං. න ච කරණීයං. ධම්මපතිරූපකෙන සමග්ගකම්මං අකම්මං. න ච කරණීයං. ඤත්තිවිපන්නං චෙ භික්ඛවෙ, කම්මං අනුසාවනසම්පන්නං අකම්මං. න ච කරණීයං. අනුසාවනවිපන්නං චෙ භික්ඛවෙ, කම්මං ඤත්තිසම්පන්නං අකම්මං. න ච කරණීයං. ඤත්තිවිපන්නං චෙ භික්ඛවෙ, කම්මං අනුසාවනවිපන්නං ච අකම්මං. න ච කරණීයං. අඤ්ඤත්‍රාපි ධම්මා කම්මං අකම්මං. න ච කරණීයං. අඤ්ඤත්‍රාපි විනයා කම්මං අකම්මං. න ච කරණීයං. අඤ්ඤත්‍රාපි සත්ථුසාසනා කම්මං අකම්මං. න ච කරණීයං. පටිකුට්ඨකතඤ්චෙ භික්ඛවෙ, කම්මං අධම්මිකං කුප්පං අට්ඨානාරහං අකම්මං. න ච කරණීයං."

1. "පටිකුට්ඨකතම්පි" ම ඡ සං. PTS

Free Distribution www.aathaapi.org

32. "මහණෙනි, එහි යම් මේ ධර්මයෙන් සමග්‍රකර්මයෙක් වේ ද, මහණෙනි, මේ කර්මය ධර්ම බැවින් සමගි බැවින් කොප්‍ය නො වේ. සසුනට සුදුසු වේ. මහණෙනි, එබඳු වූ කර්මය කට යුතු ය. මා විසින් එබඳු කර්මය අනුදන්නා ලද ය. මහණෙනි, එහෙයින් මෙහි ධර්මයෙන් යම් සමග්‍රකර්මයෙක් වේ ද, එබඳු කර්මය කරන්නෙමු යි මහණෙනි, තොප විසින් හික්මිය යුතු ම ය."

33. එකල්හි **සවග මහණෝ** මෙබඳු වූ කර්ම කෙරෙත්: අධර්මයෙන් ව්‍යග්‍ර කර්ම කෙරෙත්. අධර්මයෙන් සමග්‍රකර්ම කෙරෙත්. ධර්මයෙන් ව්‍යග්‍රකර්ම කෙරෙත්. ධර්මප්‍රතිරූපකයෙන් ව්‍යග්‍රකර්ම කෙරෙත්. ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍රකර්ම කෙරෙත්. ඥප්තිසම්පත්තිය නැති අනුශ්‍රාවණසම්පත්තිය ඇති කර්ම කෙරෙත්. අනුශ්‍රාවණසම්පත්තිය නැති ඥප්තිසම්පත්තිය ඇති කර්ම කෙරෙත්. ඥප්ති-සම්පත්තිය නැති අනුශ්‍රාවණසම්පත්තිය නැති කර්ම කෙරෙත්. විද්‍යමාන වස්තුන් හැර කර්ම කෙරෙත්. චොදනා සිහි කිරීම් හැර කර්ම කෙරෙත්. ඥප්තිඅනුශ්‍රාවණසම්පත්තීන් හැර කර්ම කෙරෙත්. අනුන් ප්‍රතික්‍රොශ (ප්‍රති-බාහන) කරද්දී කරණ ලද නො දැහැමි වූ කොප්‍ය වූ කරුණට නො සුදුසු කර්ම කෙරෙත්.

34. අල්පෙච්ඡ වූ -පෙ- යම් ඒ භික්ෂූහු වෙත් ද, ඔහු "කෙසේ නම් සවග මහණෝ මෙබඳු වූ කර්ම කරත් ද: අධර්මයෙන් ව්‍යග්‍රකර්ම කරත් ද ? අධර්මයෙන් සමග්‍රකර්ම කරත් ද ? ධර්මයෙන් ව්‍යග්‍රකර්ම කරත් ද ? ධර්මප්‍රතිරූපකයෙන් ව්‍යග්‍රකර්ම කරත් ද ? ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍රකර්ම කරත් ද ? ඥප්තිසම්පත්තිය නැති අනුශ්‍රාවණ සම්පත්තිය ඇති කර්ම කරත් ද? අනුශ්‍රාවණසම්පත්තිය නැති ඥප්තිසම්පත්තිය ඇති කර්ම කරත් ද ? ඥප්තිසම්පත්තිය නැති අනුශ්‍රාවණ-සම්පත්තිය නැති කර්ම කරත් ද? ධර්මයෙන් (විද්‍යමානවස්තුවෙන් තොර) කර්ම කරත් ද ? චොදනාවෙන් හා සිහිපත් කිරීමෙන් තොර කර්ම කරත් ද ? ඥප්තිඅනුශ්‍රාවණසම්පත්තීන්ගෙන් තොර කර්ම කරත් ද ? අනුන් ප්‍රතික්‍රොශ කරද්දී කරණ ලද නො දැහැමි වූ කොප්‍ය වූ කරුණට නො සුදුසු කර්ම කරත් දැ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දොස් කියත්.

35. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සවගමහණෝ මෙබඳු වූ කර්ම කෙරෙත් ල යනු සැබෑ ද? අධර්මයෙන් ව්‍යග්‍රකර්ම කෙරෙත් -පෙ- අනුන් ප්‍රතික්‍රොශ කරද්දී කරණ ලද නො දැහැමි වූ කොප්‍ය වූ කරුණට නො සුදුසු කර්ම කෙරෙත් ද ?"

36. "භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය -පෙ- ගරහා දැහැමි කතා කොට "මහණෙනි, අධර්මයෙන් ව්‍යග්‍රකර්මයෙක් වේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. අධර්මයෙන් සමග්‍රකර්මයෙක් වේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. ධර්මයෙන් ව්‍යග්‍රකර්මයෙක් වේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. ධර්මප්‍රතිරූපකයෙන් ව්‍යග්‍රකර්මයෙක් වේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍රකර්මයෙක් වේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. මහණෙනි, ඥප්තිසම්පත්තිය නැති අනුශ්‍රාවණ-සම්පත්තිය ඇති කර්මයෙක් වේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. මහණෙනි, අනුශ්‍රාවණසම්පත්තිය නැති ඥප්තිසම්පත්තිය ඇති කර්මයෙක් වේ නම්, කර්ම නො වේ. ඒ නො කටයුතු ය. මහණෙනි, ඥප්තිසම්පත්තිය නැති අනුශ්‍රාවණසම්පත්තිය නැති කර්මයෙක් වේ නම්, කර්ම නො වේ. ඒ නො කට යුතු ය. විද්‍යමානවස්තුවෙන් තොර වූ කර්මය කර්ම නො වේ. ඒ නො කට යුතු ය. චොදනා සිහිපත් කිරීමෙන් තොර වූ කර්මය කර්ම නො වේ. ඒ නො කටයුතු ය. ඥප්තිඅනුසාවනසම්පත්තියෙන් තොර වූ කර්මය කර්ම නො වේ. ඒ නො කට යුතු ය. මහණෙනි, අනුන් ප්‍රතික්‍රොශ කරද්දී කරණ ලද නො දැහැමි වූ කොප්‍ය වූ කරුණට නො සුදුසු වූ කර්මය කර්ම නො වේ. ඒ නො කට යුතු වේ.

37. "ඡයිමානි භික්ඛවෙ, කම්මානි: අධම්මකම්මං, වග්ගකම්මං, සමග්ගකම්මං, ධම්මපතිරූපකෙන වග්ගකම්මං, ධම්මපතිරූපකෙන සමග්ගකම්මං, ධම්මෙන සමග්ගකම්මං.

38. "කතමඤ්ච භික්ඛවෙ, අධම්මකම්මං? ඤත්තිදුතියෙ චෙ භික්ඛවෙ කම්මෙ එකාය ඤත්තියා කම්මං කරොති, න ච කම්මවාචං අනුස්සාවෙති, අධම්මකම්මං.

39. "ඤත්තිදුතියෙ චෙ භික්ඛවෙ, කම්මෙ ද්වීහි ඤත්තීහි කම්මං කරොති, න ච කම්මවාචං අනුස්සාවෙති, අධම්මකම්මං.

40. "ඤත්තිදුතියෙ චෙ භික්ඛවෙ, කම්මෙ එකාය කම්මවාචාය කම්මං කරොති, න ච ඤත්තිං ඨපෙති, අධම්මකම්මං.

41. "ඤත්තිදුතියෙ චෙ භික්ඛවෙ, කම්මෙ ද්වීහි කම්මවාචාහි කම්මං කරොති, න ච ඤත්තිං ඨපෙති, අධම්මකම්මං.

42. "ඤත්තිචතුත්ථෙ චෙ භික්ඛවෙ, කම්මෙ එකාය ඤත්තියා කම්මං කරොති, න ච කම්මවාචං අනුස්සාවෙති, අධම්මකම්මං.

43. "ඤත්තිචතුත්ථෙ චෙ භික්ඛවෙ, කම්මෙ ද්වීහි ඤත්තීහි කම්මං කරොති, න ච කම්මවාචං අනුස්සාවෙති, අධම්මකම්මං.

44. "ඤත්තිචතුත්ථෙ චෙ භික්ඛවෙ, කම්මෙ තීහි ඤත්තීහි කම්මං කරොති, න ච කම්මවාචං අනුස්සාවෙති, අධම්මකම්මං.

45. "ඤත්තිචතුත්ථෙ චෙ භික්ඛවෙ, කම්මෙ චතූහි ඤත්තීහි කම්මං කරොති, න ච කම්මවාචං අනුස්සාවෙති, අධම්මකම්මං.

46. "ඤත්තිචතුත්ථෙ චෙ භික්ඛවෙ, කම්මෙ එකාය කම්මවාචාය කම්මං කරොති, න ච ඤත්තිං ඨපෙති, අධම්මකම්මං.

47. "ඤත්තිචතුත්ථෙ චෙ භික්ඛවෙ, කම්මෙ ද්වීහි කම්මවාචාහි කම්මං කරොති, න ච ඤත්තිං ඨපෙති, අධම්මකම්මං.

48. "ඤත්තිචතුත්ථෙ චෙ භික්ඛවෙ, කම්මෙ තීහි කම්මවාචාහි කම්මං කරොති, න ච ඤත්තිං ඨපෙති, අධම්මකම්මං.

49. "ඤත්තිචතුත්ථෙ චෙ භික්ඛවෙ, කම්මෙ චතූහි කම්මවාචාහි කම්මං කරොති, න ච ඤත්තිං ඨපෙති, අධම්මකම්මං. ඉදං වුච්චති භික්ඛවෙ, අධම්මකම්මං.

50. "කතමඤ්ච භික්ඛවෙ, වග්ගකම්මං? ඤත්තිදුතියෙ චෙ භික්ඛවෙ, කම්මෙ යාවතිකා භික්ඛූ කම්මප්පත්තා, තෙ අනාගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො අනාහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති, වග්ගකම්මං.

51. "ඤත්තිදුතියෙ චෙ භික්ඛවෙ, කම්මෙ යාවතිකා භික්ඛූ කම්මප්පත්තා, තෙ ආගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො අනාහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති, වග්ගකම්මං.

52. "ඤත්තිදුතියෙ චෙ භික්ඛවෙ, කම්මෙ යාවතිකා භික්ඛූ කම්මප්පත්තා, තෙ ආගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො ආහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති, වග්ගකම්මං.

37. "මහණෙනි, අධර්මකර්මය, ව්‍යග්‍රකර්මය, සමග්‍රකර්මය, ධර්මප්‍රතිරූපකයෙන් ව්‍යග්‍රකර්මය, ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍රකර්මය, ධර්මයෙන් සමග්‍රකර්මය යි මේ කර්ම සයෙක් වේ.

38. "මහණෙනි, අධර්මකර්මය කිම ? මහණෙනි, ඥප්තිද්විතියකර්මයෙහි දී එක් ඥප්තියකින් කර්මය කෙරේ නම්, කර්මවාක්‍යය නො අස්වා නම්, ඒ අධර්මකර්ම යි.

39. "මහණෙනි, ඥප්තිද්විතියකර්මයෙහි දී ඥප්ති දෙකකින් කර්මය කෙරේ නම්, කර්මවාක්‍යය නො අස්වා නම්, ඒ අධර්මකර්ම යි.

40. "මහණෙනි, ඥප්තිද්විතියකර්මයෙහි දී එක් කර්මවාක්‍යයකින් කර්මය කෙරේ නම්, ඥප්තිය නො තබා නම්, ඒ අධර්මකර්ම යි.

41. "මහණෙනි, ඥප්තිද්විතියකර්මයෙහි දී කර්මවාක්‍ය දෙකකින් කර්මය කෙරේ නම් ඥප්තිය නො තබා නම්, ඒ අධර්මකර්ම යි.

42. "මහණෙනි, ඥප්තිචතුර්ථකර්මයෙහි දී එක් ඥප්තියකින් කර්මය කෙරේ නම්, කර්මවාක්‍යය නො අස්වා නම්, ඒ අධර්මකර්ම යි.

43. "මහණෙනි, ඥප්තිචතුර්ථකර්මයෙහි දී ඥප්ති දෙකකින් කර්මය කෙරේ නම්, කර්මවාක්‍යය නො අස්වා නම්, ඒ අධර්මකර්ම යි.

44. "මහණෙනි, ඥප්තිචතුර්ථකර්මයෙහි දී ඥප්ති තුනකින් කර්මය කෙරේ නම්, කර්මවාක්‍යය නො අස්වා නම්, ඒ අධර්මකර්ම යි.

45. "මහණෙනි, ඥප්තිචතුර්ථකර්මයෙහි දී ඥප්ති සතරකින් කර්මය කෙරේ නම්, කර්මවාක්‍යය නො අස්වා නම්, ඒ අධර්මකර්ම යි.

46. "මහණෙනි, ඥප්තිචතුර්ථකර්මයෙහි දී එක් කර්මවාක්‍යයකින් කර්මය කෙරේ නම්, ඥප්තිය නො තබා නම්, ඒ අධර්මකර්ම යි.

47. "මහණෙනි, ඥප්තිචතුර්ථකර්මයෙහි දී කර්මවාක්‍ය දෙකකින් කර්මය කෙරේ නම්, ඥප්තිය නො තබා නම් නම්, ඒ අධර්මකර්ම යි.

48. "මහණෙනි, ඥප්තිචතුර්ථකර්මයෙහි දී කර්මවාක්‍ය තුනකින් කර්මය කෙරේ නම්, ඥප්තිය නො තබා නම්, ඒ අධර්මකර්ම යි.

49. "මහණෙනි, ඥප්තිචතුර්ථකර්මයෙහි දී කර්මවාක්‍ය සතරකින් කර්මය කෙරේ නම්, ඥප්තිය නො තබා නම්, ඒ අධර්මකර්ම යි. මහණෙනි, මෙය අධර්මකර්ම ය යි කියනු ලැබේ.

115. මහණෙනි, මෙහි මහණෙක් තෙමේ සඞ්ඝයා විසින් ඇවැත් නො දැක්මෙහි උත්ක්ෂෙපණීයකම් කරණ ලද්දේ මනා කොට පවතී. අනුලොම් ව පවතී. වරදින් නිදහස් වීමට සුදුසු සේ පවතී. ඇවැත් නො දැක්මෙහි (කළ) උත්ක්ෂෙපණීයකම්යාගේ සන්සිඳීම ඉල්ලයි. එකල්හි භික්ෂූන්ට "ඇවැත්නි, මේ මහණ තෙමේ සඞ්ඝයා විසින් ඇවැත් නො දැක්මෙහි උත්ක්ෂෙපණීයකම් කරණ ලද්දේ මනා කොට පවතී. අනුලොම් ව පවතී. වරදින් නිදහස් වීමට සුදුසු සේ පවතී. ඇවැත් නො දැක්මෙහි (කළ) උත්ක්ෂෙපණීයකම්යාගේ සන්සිඳීම ඉල්ලයි. එබැවින් අපි මොහුගේ ඇවැත් නො දැක්මෙහි (කළ) උත්ක්ෂෙපණීයකම්ය සන්සිඳුවමු" යි මෙසේ අදහස් වේ. ඔහු අධර්මයෙන් ව්‍යග්‍ර වූවාහු -පෙ- අධර්මයෙන් සමග්‍ර වූවාහු -පෙ- ධර්මයෙන් ව්‍යග්‍ර වූවාහු -පෙ- ධර්මප්‍රතිරූපකයෙන් ව්‍යග්‍ර වූවාහු -පෙ- ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍ර වූවාහු ඔහුගේ ඇවැත් නො දැක්මෙහි (කළ) උත්ක්ෂෙපණීයකර්මය සන්සිඳුවත්. එහි සිටි සඞ්ඝ තෙමේ "අධර්මයෙන් ව්‍යග්‍රකර්මය යි. අධර්මයෙන් සමග්‍රකර්මය යි. ධර්මයෙන් ව්‍යග්‍රකර්මය යි. ධර්මප්‍රතිරූපකයෙන් ව්‍යග්‍රකර්මය යි. ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍රකර්මය යි. කර්මය නො කරණ ලදී. කර්මය වැරදි සේ කරණ ලදී. කර්මය නැවැත කළ යුතු ය" යි විවාද කෙරෙයි. මහණෙනි, එහි යම් ඒ භික්ෂූහු "ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍රකර්මය" යි මෙසේ කීහු ද, යම් ඒ භික්ෂූහු "කර්මය නො කරණ ලදී. කර්මය වැරදි සේ කරණ ලදී. කර්මය නැවැත කළ යුතු ය" යි මෙසේත් කීහු ද, එහි මේ මහණහු ධර්මවාදී වෙත්. මේ පස්වර සංක්ෂෙප කරණ ලදී.

116. මහණෙනි, මෙහි මහණෙක් තෙමේ සඞ්ඝයා විසින් ඇවැතට පිළියම් නො කිරීමෙහි උත්ක්ෂෙපණීයකම් කරණ ලද්දේ මනා කොට පවතී. අනුලොම් ව පවතී. වරදින් නිදහස් වීමට සුදුසු සේ පවතී. ඇවැතට පිළියම් නො කිරීමෙහි (කළ) උත්ක්ෂෙපණීයකම්යාගේ සන්සිඳීම ඉල්ලයි. එහි භික්ෂූන්ට "ඇවැත්නි, මේ මහණ තෙමේ සඞ්ඝයා විසින් ඇවැතට පිළියම් නො කිරීමෙහි උත්ක්ෂෙපණීයකම් කරණ ලද්දේ මනා කොට පවතී. අනුලොම් ව පවතී. වරදින් නිදහස් වීමට සුදුසු සේ පවතී. ඇවැතට පිළියම් නො කිරීමෙහි (කළ) උත්ක්ෂෙපණීයකම්යාගේ සන්සිඳීම ඉල්ලයි. එබැවින් අපි මොහුගේ ඇවැතට පිළියම් නො කිරීමෙහි (කළ) උත්ක්ෂෙපනීයකර්මය සන්සිඳුවමු" යි මෙසේ අදහස් වේ. ඔහු අධර්මයෙන් ව්‍යග්‍ර වූවාහු -පෙ- අධර්මයෙන් සමග්‍ර වූවාහු -පෙ- ධර්මයෙන් ව්‍යග්‍ර වූවාහු -පෙ- ධර්මප්‍රතිරූපකයෙන් ව්‍යග්‍ර වූවාහු -පෙ- ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍ර වූවාහු ඔහුගේ ඇවැතට පිළියම් නො කිරීමෙහි උත්ක්ෂෙපණීයකර්මය සන්සිඳුවත්. එහි සිටි සඞ්ඝ තෙමේ "අධර්මයෙන් ව්‍යග්‍රකර්මය යි. අධර්මයෙන් සමග්‍රකර්මය යි. ධර්මයෙන් ව්‍යග්‍රකර්මය යි. ධර්මප්‍රතිරූපකයෙන් ව්‍යග්‍රකර්මය යි. ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍රකර්මය යි. කර්මය නො කරණ ලදී. කර්මය වැරදි සේ කරණ ලදී. කර්මය නැවැත කළ යුතු ය" යි විවාද කෙරෙයි. මහණෙනි, එහි යම් ඒ භික්ෂූහු "ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍රකර්මය" යි මෙසේ කීහු ද, යම් ඒ භික්ෂූහු "කර්මය නො කරණ ලදී. කර්මය වැරදි සේ කරණ ලදී. කර්මය නැවැත කළ යුතු ය" යි මෙසේත් කීහු ද, එහි මේ භික්ෂූහු ධර්මවාදී වෙත්. මේ පස්වර සංක්ෂෙප කරණ ලදී.

117. ඉධ පන භික්ඛවෙ භික්ඛු සඞ්ඝෙන පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්මකතො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. තත්‍ර ච භික්ඛූනං එවං හොති: “අයං ඛො ආවුසො භික්ඛු සඞ්ඝෙන පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්මකතො සම්මා වත්තති. ලොමං පාතෙති. නෙත්ථාරං වත්තති. පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචති. හන්දස්ස මයං පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්මං පටිප්පස්සම්භෙමා”ති තෙ තස්ස පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්මං පටිප්පස්සම්භෙන්ති අධම්මෙන වග්ගා. --පෙ-- අධම්මෙන සමග්ගා. --පෙ-- ධම්මෙන වග්ගා. --පෙ-- ධම්මපතිරූපකෙන වග්ගා. --පෙ-- ධම්මපතිරූපකෙන සමග්ගා. තත්‍රට්ඨො සඞ්ඝො විවදති: “අධම්මෙන වග්ගකම්මං. අධම්මෙන සමග්ගකම්මං. ධම්මෙන වග්ගකම්මං. ධම්මපතිරූපකෙන වග්ගකම්මං. ධම්මපතිරූපකෙන සමග්ගකම්මං. අකතං කම්මං. දුක්කතං කම්මං. පුන කාතබ්බං කම්ම”න්ති. තත්‍ර භික්ඛවෙ, යෙ තෙ භික්ඛූ එවමාහංසු: “ධම්මපතිරූපකෙන සමග්ගකම්ම”න්ති, යෙ ච තෙ භික්ඛූ එවමාහංසු: “අකතං කම්මං. දුක්කතං කම්මං. පුන කාතබ්බං කම්ම”න්ති, ඉමෙ තත්‍ර භික්ඛූ ධම්මවාදිනො. ඉමෙ පඤ්ච වාරා සංඛිත්තා.

**චම්පෙය්‍යක්ඛන්ධකො නිට්ඨිතො නවමො**

---

**ඉමම්හි ඛන්ධකෙ වත්ථූනි ඡත්තිංස.**

තස්ස උද්දානං:-

1. **චම්පායං** භගවා ආසි වත්ථු **වාසභගාමකෙ**,
ආගන්තුකානං උස්සුක්කං අකාසි ඉච්ඡිතබ්බකෙ[1].

2. පකතඤ්ඤුනොති ඤත්වා උස්සුක්කං න කරී තදා,
උක්ඛිත්තො න කරොතීති සාගමා[2] ජිනසන්තිකෙ.

3. අධම්මෙන වග්ගකම්මං සමග්ගං අධම්මෙන ච,
ධම්මෙන වග්ගකම්මඤ්ච පතිරූපකෙන වග්ගකං.

4. පතිරූපකෙන සමග්ගං එකො උක්ඛිපතෙකකං,
එකො ච ද්වෙ සම්බහුලෙ සඞ්ඝං උක්ඛිපතෙකකො.

---

1. “ඉච්ඡිතබ්බකො” සී මු. 2 “අගමා” P T S තො. නු.

117. මහණෙනි, මෙහි මහණෙක් තෙමේ සඞ්ඝයා විසින් පවිටු මිසදිටු අත් නො හැරීමෙහි උත්ක්ෂෙපණීයකම් කරණ ලද්දේ මනා කොට පවතී. අනුලොම් ව පවතී. වරදින් නිදහස් වීමට සුදුසු සේ පවතී. පවිටු මිසදිටු අත් නො හැරීමෙහි උත්ක්ෂෙපණීයකර්මයාගේ සන්සිඳීම ඉල්ලයි. එකල්හි භික්ෂූන්ට "ඇවැත්නි, මේ මහණ තෙමේ සඞ්ඝයා විසින් පවිටු මිසදිටු අත් නො හැරීමෙහි උත්ක්ෂෙපණීයකම් කරණ ලද්දේ මනා කොට පවතී. අනුලොම් ව පවතී. වරදින් නිදහස් වීමට සුදුසු සේ පවතී. පවිටු මිසදිටු අත් නො හැරීමෙහි (කළ) උත්ක්ෂෙපණීයකර්මයාගේ සන්සිඳීම ඉල්ලයි. එබැවින් අපි මොහුගේ පවිටු මිසදිටු අත් නො හැරීමෙහි උත්ක්ෂෙපණීයකර්මය සන්සිඳුවමු" යි මෙසේ අදහස් වේ. ඔහු අධර්මයෙන් ව්‍යග්‍ර වූවාහු -පෙ- අධර්මයෙන් සමග්‍ර වූවාහු -පෙ- ධර්මයෙන් ව්‍යග්‍ර වූවාහු -පෙ- ධර්මප්‍රතිරූපක-යෙන් ව්‍යග්‍ර වූවාහු -පෙ- ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍ර වූවාහු ඔහුගේ පවිටු මිසදිටු අත් නො හැරීමෙහි කළ උත්ක්ෂෙපණීයකර්මය සන්සිඳුවත්. එහි සිටි සඞ්ඝ තෙමේ "අධර්මයෙන් ව්‍යග්‍රකර්මය යි. අධර්මයෙන් සමග්‍රකර්මය යි. ධර්මයෙන් ව්‍යග්‍රකර්මය යි. ධර්මප්‍රතිරූපකයෙන් ව්‍යග්‍රකර්මය යි. ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍රකර්මය යි. කර්මය නො කරණ ලදී. කර්මය වැරදි සේ කරණ ලදී. කර්මය නැවැත කළ යුතු ය" යි විවාද කෙරෙයි. මහණෙනි, එහි යම් ඒ භික්ෂූහු "ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍රකර්මය" යි මෙසේ කීහු ද, යම් ඒ භික්ෂූහු "කර්මය නො කරණ ලදී. කර්මය වැරදි සේ කරණ ලදී. කර්මය නැවත කළ යුතු ය" යි මෙසේත් කීහු ද, එහි මේ භික්ෂූහු ධර්මවාදී වෙත්. මේ පස්වර සංක්ෂෙප කරණලදි.

**නවවැනි චම්පෙය්‍යක්ඛන්ධකය නිමි.**

---

**මේ ඛන්ධකයෙහි වස්තු සතිසෙකි.**

එහි උද්දානය (වස්තුනාමාවලිය) මෙසේ යː-

1. භාග්‍යවතුන් වහන්සේ **චම්පාවෙහි** විසූ සේක. මේ වස්තුව **වසභ ගාමයෙහි** වී ය. **කාශ්‍යපගොත්‍ර** භික්ෂු තෙමේ ආගන්තුකයන් කැමැති දෙය සපයා දීමෙහි උත්සාහය කෙළේ ය.

2. ගොදුරුගම දන්නෝ යි දැන එකල්හි (හෙතෙමේ) උත්සාහය නො කෙළේ ය. උවැටන් නො කෙරේ ය යි උත්ක්ෂෙපණීයකම් කරණ ලද හෙතෙමේ බුදුරජුන් වෙත ගියේ ය.

3. අධර්මයෙන් ව්‍යග්‍රකර්මය, අධර්මයෙන් සමග්‍රකර්මය, ධර්මයෙන් ව්‍යග්‍ර-කර්මය, ධර්මප්‍රතිරූපකයෙන් ව්‍යග්‍රකර්මය.

4. ධර්මප්‍රතිරූපකයෙන් සමග්‍රකර්මය, එකෙක් එකකු බැහැර කෙරෙයි. එකෙක් දෙදෙනකුන් ද බොහෝ දෙනකුන් ද, එකෙක් සඞ්ඝයා ද බැහැර කෙරෙයි.

5. ද්වෙපි සම්බහුලාපි සඞ්ඝා සඞ්ඝඤ්ච උක්ඛිපි,
සබ්බඤ්ඤූ පවරො සුත්වා අධම්මන්ති පටික්ඛිපි.

6 ඤත්තිවිපන්නං යං කම්මං සම්පුණ්ණං අනුසාවනං,
අනුසාවනවිපන්නං සම්පුණ්ණං ඤත්තියා ච යං.

7. උභයෙන විපන්නඤ්ච අඤ්ඤත්‍ර ධම්මමෙව ච,
විනා සත්ථු පටිකුට්ඨං කුප්පං අට්ඨානාරහිකං.

8 අධම්මවග්ගං සාමග්ගං[1] පතිරූපානි යෙ දුවෙ,
ධම්මෙනෙව ච සාමග්ගිං අනුඤ්ඤාසි තථාගතො.

9. චතුවග්ගො පඤ්චවග්ගො දසවග්ගො ච වීසති,
පරො වීසතිවග්ගො ච[2] සඞ්ඝා පඤ්චවිධො තථා.

10. ඨපෙත්වා උපසම්පදං යඤ්ච කම්මං පවාරණං,
අබ්භානකම්මෙන සහ චතුවග්ගෙහි කම්මිකො.

11. දුවෙ කම්මෙ ඨපෙත්වාන මජ්ඣදෙසූපසම්පදං[3],
අබ්භානං පඤ්චවග්ගිකො සබ්බකම්මෙසු කම්මිකො.

12. අබ්භානෙකං ඨපෙත්වාන යෙ භික්ඛූ දසවග්ගිකා[4],
සබ්බකම්මකරො සඞ්ඝො වීසො සබ්බත්ථ කම්මිකො.

13. භික්ඛුනී සික්ඛමානා ච සාමණෙරො සාමණෙරිකා[5],
පච්චක්ඛාතන්තිමවත්ථු[6] උක්ඛිත්තාපත්තිදස්සනෙ.

14 අප්පටිකම්මෙ දිට්ඨියා පණ්ඩකථෙය්‍යසංවාසකං[7],
තිත්ථියතිරච්ඡානගතං[8] මාතු ච පිතුඝාතකං[9].

15. අරහං භික්ඛුනීදූසිං[10] භෙදකං ලොහිතුප්පාදකං[11],
බ්‍යඤ්ජනං නානාසංවාසං[12] නානාසීමාය ඉද්ධියා.

16. යස්ස සඞ්ඝො කරෙ කම්මං හොන්තෙතෙ චතුවීසති.
සම්බුද්ධෙන පටික්ඛිත්තා[13] න හෙතෙ ගණපූරකා.

17. පාරිවාසිකචතුත්ථො පරිවාසං දදෙය්‍ය වා,
මූලා මානත්තං අබ්භෙය්‍ය අකම්මං න ච කාරණං[14].

18. මූලා අරහමානත්තා අබ්භානාරහමෙව ච,
න කම්මකාරකා[15] පඤ්ච සම්බුද්ධෙන පකාසිතා.

19. භික්ඛුනී සික්ඛමානා ච සාමණෙරො සාමණෙරිකා,
පච්චක්ඛන්තිම උම්මත්තා ඛිත්තාවෙදනදස්සනෙ[16].

---

1. "සමග්ගං" ම ඡ සං. P T S. 2. "අතිරෙකවීසතිවග්ගො" සී
3. "මජ්ඣිදෙසූපසම්පදා" P T S. ම නු ප. තො වි. ජ වි 4 "දසවග්ගිකො," අ වි. ජ වි
5. "සාමණෙරී" ම ඡ සං. 6. "වත්ථුං" P T S.
7 "පණ්ඩකො ථෙය්‍යසංවාසකං" ම ඡ සං. 8. "තිරච්ඡානගතං" ම ඡ සං.
9. "මාතු පිතු ච ඝාතකං" ම ඡ සං P T S.
10. "භික්ඛුනීදූසී" ම ඡ සං. 11 "ලොහිතුප්පාදං" ම ඡ සං. P T S.
12. "සංවාසකො" P T S. 13. "පටික්ඛිත්තං" තො වි. ම නු ප. අ වි ජ වි.
14 "කාරණං" ම ඡ සං. P T S තො වි
15 "කම්මකාරණා" සී මු. අ වි. ජ වි. P T S
16. "ඛිත්තාවෙදනාදස්සනා" ම ඡ සං. තො වි.

Free Distribution www.aathaapi.org

5. දෙදෙනෙක් දෙදෙනකු ද, බොහෝ දෙන බොහෝ දෙනකු ද, බැහැර කළහ. සඞ්ඝ තෙමේ සඞ්ඝයා බැහර කෙළේ ය. ප්‍රවර වූ සර්‍වඥයන් වහන්සේ ඒ අසා අධර්‍මී යි බැහැර කළහ.

6. ඤත්තියෙන් විපතට පත් යම් කර්‍මයක් අනුශ්‍රාවණසම්පත්තියෙන් යුක්ත ද ඒ කර්‍මය ද, අනුශ්‍රාවණයෙන් විපත් වූ යම් කර්‍මයක් ඤත්තියෙන් යුක්ත ද ඒ කර්‍මය ද-

7. ඤත්තිඅනුසාවණදෙකින් විපත් වූ කර්‍මය ද, ධර්‍මයෙන් තොර වූ කර්‍මය ද, විනය හැර සිටි කර්‍මය ද, ශාස්තෘශාසනයෙන් බැහර වූ කර්‍මය ද, ප්‍රතික්‍රොශ ලැබූ කර්‍මය ද, කොප්‍ය වූ කර්‍මය ද, කරුණට නො ගැළපෙන කර්‍මය ද-

8. අධර්‍මයෙන් ව්‍යග්‍රකර්‍ම, අධර්‍මයෙන් සමග්‍රකර්‍ම, ධර්‍මප්‍රතිරූපකව්‍යග්‍රකර්‍ම ධර්‍මප්‍රතිරූපකසමග්‍රකර්‍ම දෙක ද (යන මේ කර්‍ම නො කටයුතු ය). තථාගතයන් වහන්සේ ධර්‍මයෙන් සමග්‍ර වූ කර්‍මය අනුදත් සේක.

9. චතුවග්ග, පඤ්චවග්ග, දසවග්ග, වීසතිවග්ග, අතිරෙකවීසතිවග්ග යි සඞ්ඝ තෙමේ පස් වැරදෑම් ය.

10. උපසම්පදාකර්‍මය ද, අබ්භානකර්‍මය හා යම් පවාරණකර්‍මයක් වේ ද එද හැර සෙසු සඞ්ඝකර්‍ම චතුවග්ගසඞ්ඝයා විසින් කටයුතු ය.

11. මධ්‍යදෙශයෙහි උපසම්පදාව අබ්භානකර්‍මය යන කර්‍ම දෙක හැර පංචවග්ගිකසඞ්ඝ තෙමේ සියලු කර්‍මයන්හි කර්‍මාර්හ වේ.

12. දසවග්ගික වූ යම් භික්ෂූහු වෙත් නම් ඔහු අබ්භානය හැර සෙසු සියලු තන්හි කර්‍මාර්හ වෙති. සියලු කර්‍ම කරන්නා වූ වීසතිවග්ගික සඞ්ඝ තෙමේ සියලු තැන්හි කර්‍මාර්හ වේ.

13. භික්ඛුණී, සික්ඛමානා, සාමණේර, සාමණේරී, සික්ඛං පච්චක්ඛාතක, අන්තිමවත්ථු අජ්ඣාපන්නක, ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තක-

14. ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛිත්තක, පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛිත්තක, පණ්ඩක, ථෙය්‍යසංවාසක, තිත්ථියපක්කන්තක, තිරච්ඡානගත, මාතුඝාතක, පිතුඝාතක-

15. අරහන්තඝාතක, භික්ඛුණීදූසක, සංඝභෙදක, ලොහිතුප්පාදක, උභතොව්‍යඤ්ජනක, නානාසංවාසක, නානාසීමායඨිත ඉද්ධියා වෙහාසෙ ඨිත -

16. සඞ්ඝ තෙමේ යමකුට කර්‍ම කෙරේ ද, මොහු සූවිසි දෙනෙක් වෙති. එතැන මොහු ගණපූරක නො වෙති යි බුදුරජුන් විසින් බැහැර කරණ ලදහ.

17. පිරිවෙස් පුරණ මහණ සිවුවැනි කොට සිටියේ පිරිවෙස් දෙන්නේ ද, මූලායපටිකස්සනය කෙරේ ද, මානත දෙන්නේ ද, ඔහු විසිවැනි කොට අබ්භානය කෙරේද, ඒ කර්‍මයන් නො වේ. නො කටයුතු ය.

18. පිරිවෙස් පුරන්නහු, මූලායපටිකස්සනයට සුදුස්සහු, මානතට සුදුස්සහු, මානත නැසිරෙන්නහු, අබ්භානයට සුදුස්සහු, යන පස් දෙන කර්‍මකාරක නො වෙති යි බුදුරජුන් විසින් දක්වන ලදහ.

19. භික්ඛුණී, සික්ඛමානා, සාමණේර, සාමණේරී, සික්ඛං පච්චක්ඛාතක, අන්තිම වස්තුවට පැමිණියහු, උම්මත්තක, ඛිත්තචිත්තක, වෙදනට්ට, ඇවැත ඇවැත යයි නො දක්නහු-

20. අප්පටිකම්මෙ දිට්ඨියා පණ්ඩකා චෙව[1] බ්‍යඤ්ජනා,
නානාසංවාසිකා සීමා වෙහාසං යස්ස කම්ම ච.

21. අට්ඨාරසන්නං එතෙසං පටික්කොසං න රූහති,
භික්ඛුස්ස පකතත්තස්ස රූහති පටික්කොසනා.

22. සුද්ධස්ස දූනනිස්සාරිතො බාලො හි සුනිස්සාරිතො,
පණ්ඩකො ථෙය්‍යසංවාසො පක්කන්තො තිරච්ඡානගතො.

23. මාතු පිතු අරහන්ත දූසකො සඞ්ඝභෙදකො,
ලොහිතුප්පාදකො චෙව උභතොබ්‍යඤ්ජනො ච යො.

24. එකාදසන්නං එතෙසං ඔසාරණං න යුජ්ජති,
හත්ථපාදං[2] තදුභයං 'කණ්ණනාසං' තදුභයං.

25. අඞ්ගුලි අළකණ්ඩරං ඵණං ඛුජ්ජා ච වාමනො,
ගණ්ඩි ලක්ඛණකසා ච ලිඛිතකො ච සීපදී.

26. පාපපරිස කාණො ච[3] කුණී ඛඤ්ජො හතොපි ච,
ඉරියාපථදුබ්බලො අන්ධො මූගො ච බාධිරො[4].

27. අන්ධමූගො අන්ධබධිරො[5] මූගබධිරමෙව ච,
අන්ධමූගබධිරො ච ද්වත්තිංසෙතෙ අනූනකා[6].

28. තෙසං ඔසාරණං හොති සම්බුද්ධෙන පකාසිතං,
දට්ඨබ්බා පටිකාතබ්බා නිස්සජ්ජෙතා[7] න විජ්ජති.

29. තස්ස උක්ඛෙපනා කම්මා සත්ත හොන්ති අධම්මිකා,
ආපන්නං අනුවත්තන්තං සත්තෙතෙපි[8] අධම්මිකා.

30. ආපන්නං නානුවත්තන්තං සත්ත කම්මා සුධම්මිකා[9],
සම්මුඛා පටිපුච්ඡා ච පටිඤ්ඤාය ච කාරණා.

31. සති අමූළ්හ පාපිකා තජ්ජනීය නියස්සෙන ච,
පබ්බාජනීය පටිසාරො උක්ඛෙපපරිවාස ච.

32. මූලමානත්ත අබ්භානා තථෙව උපසම්පදා,
අඤ්ඤං කරෙය්‍ය අඤ්ඤස්ස සොළසෙතෙ අධම්මිකා.

33. තං තං කරෙය්‍ය තං තස්ස සොළසෙතෙ සුධම්මිකා,
පච්චාරොපෙය්‍ය අඤ්ඤමඤ්ඤං[10] සොළසෙතෙ අධම්මිකා.

34. ද්වෙ ද්වෙ තම්මූලකන්තස්ස[11] තෙපි සොළසධම්මිකා,
එකෙකමූලකං චක්කං අධම්මන්ති ජිනො බ්‍රවී.

---

1. "පණ්ඩකාපිච" ම ඡ සං. PTS.
2. "හත්ථපාද" PTS 3. "නත්ථපාද" ම ඡ සං. තො වි.
,, "හත්ථපාද" තො වි. ම නු ප.
4 "බධිරො" ම ඡ සං. PTS. ජ වි. අ වි. ම නු ප. තො වි.
5. "අන්ධමූගබධිරො" ම ඡ සං. ම නු ප. තො වි.
6. "අන්ධමූගබධිරො ච මූගබධිරං එව ච අන්ධබධිරමූගො ච-
ද්වත්තිංසෙතෙ අනූනකා" PTS.
7. "නිස්සජ්ජෙතං" PTS. තො වි. අ වි. ජ වි. 8. "සත්තාතෙපි" ම ඡ සං. PTS.
9. "සත්තකාම්මසු ධම්මිකා" PTS 10. "අඤ්ඤ අඤ්ඤං" ම ඡ සං
,, "අඤ්ඤඤ්ඤ" PTS.
11. "ද්වෙ ද්වෙ මූලාකාතා තස්ස" සි

20. ඇවැතට පිළියම් නො කළහු, දෘෂ්ටිය බැහර නො කළහු, පණ්ඩක, උභතොව්‍යඤ්ජනක, නානාසංවාසක, යන මොහු ද, නානා සීමාවන්හි සිටියහු ද, සෘද්ධියෙන් අහස සිටියහු ද, යමකුගේ කර්මය වේ ද, ඔහු ද-

21. මේ අටළොස් දෙනාගේ පටික්කොසනය (විරුද්ධ ව කරුණු කීම) නො නැගේ. පකතත්තභික්ෂුහුගේ පටික්කොසනය නගියි.

22. අනාපත්තිකභික්ෂුහුගේ බැහැර කිරීම, වැරදි සේ බැහැර කිරීමෙකි. අඬ තෙමේ මනා කොට බැහැර කරණ ලද්දේ වේ. පණ්ඩක, ථෙය්‍යසංවාසක, තිත්ථියපක්කන්තක, තිරච්ඡානගත-

23. මාතුඝාතක, පිතුඝාතක, අරහන්තඝාතක, භික්ඛුණිදූසක, සඞ්ඝභෙදක, ලොහිතුප්පාදක, උභතොව්‍යඤ්ජනක යන-

24. මේ එකොළොස් දෙනාගේ ඔසාරණය නො යෙදේ. හත්ථච්ඡින්න, පාදච්ඡින්න, හත්ථපාදච්ඡින්න, කණ්ණච්ඡින්න, නාසච්ඡින්න, කණ්ණනාසච්ඡින්න-

25. අඞ්ගුලිච්ඡින්න, අළච්ඡින්න, කණ්ඩරච්ඡින්න, ඵණහත්ථක, ඛුජ්ජ, වාමන, ගලගණ්ඩී, ලක්ඛණාහත, කසාහත, ලිඛිතක, සීපදී-

26. පාපරොගී, පරිසදූසක, කාණ, කුණී, ඛඤ්ජ, පක්ඛහත, ඡින්නිරියාපථ, ජරාදුබ්බල, අන්ධ, මූග, බධිර-

27. අන්ධමූග, අන්ධබධිර, මූගබධිර, අන්ධමූගබධිර යන මොහු නො අඩු දෙතිස් දෙනෙක් වෙති.

28. ඔවුන්ගේ ඔසාරණය මේ ය යි බුදුරජුන් විසින් ප්‍රකාශ කරණ ලදී. දක්ක යුතු වූ ද, පිළියම් කටයුතු වූ ද, දුරු කළයුතු වූ ද ඇවැතක් නො වේ.

29. ඒ මහණහුට අධාර්මික වූ උත්ක්ෂෙපණීයකර්මයෝ සතක් වෙත්. ඇවැතට පැමිණියහුට ද, උත්ක්ෂෙපණීයකර්මය කළවුන්ට අනුවර්තීකවූවහුට ද මේ අධාර්මික වූ උත්ක්ෂෙපණීයකර්මයෝ සතක් වෙත්.

30. ඇවතට පැමිණියහුට ද, උත්ක්ෂෙපණීයකර්මය කළවුන්ට අනුව නො යන භික්ෂූන්ට කළයුතු වූ ධාර්මිකකර්ම සතෙකි. හමුයෙහි ද පිළිවිසීමෙන් ද ප්‍රතිඥාවෙන් ද කිරීම් වශයෙන්-

31. සතිවිනය, අමූළ්හවිනය, තස්සපාපියසිකාකර්මය, තජ්ජනීයකර්මය, නියස්සකර්මය, පබ්බාජනීයකර්මය, පටිසාරණීයකර්මය, උක්ඛෙපනීයකර්මය, පරිවාසයට සුදුස්සහු-

32. මූලායපටිකස්සනයට සුදුස්සහු, මානත්තට සුදුස්සහු, අබ්භානයට සුදුස්සහු, උපසම්පදාවට සුදුස්සහු - අනෙකකුට කටයුතු කර්මය අනෙකකුට කෙරේ ද, මේ සොළස අධාර්මිකකර්ම වෙති.

33. ඒ ඒ කර්මයට සුදුසු වූවාහුට ඒ ඒ කර්මය කෙරේ ද- මේ ධාර්මිකකර්ම සොළොසෙකි. ඔද්නොවුන්ට නැවත අරොපණය කෙරේ ද- මේ අධාර්මිකකර්ම සොළොසෙකි.

34. දෙකක් දෙකක් මුල් කොට ඇති ඒ කර්මයට ද ධාර්මිකකර්ම සොළොසෙක් ම ය. එකක් එකක් මුල් වූ චක්‍ර අධර්මය යි සර්වඥයන් වහන්සේ වදාළ සේක.


Free Distribution www.aathaapi.org

35. අකාසි තජ්ජනීයං කම්මං සඞ්ඝො භණ්ඩනකාරකෙ,
අධම්මෙන වග්ගකම්මං අඤ්ඤං ආවාසං ගච්ඡි සො.

36. තත්ථාධම්මෙන සමග්ගා තස්ස තජ්ජනීයං කරුං,
අඤ්ඤත්ථ වග්ගා ධම්මෙන තස්ස තජ්ජනීයං කරුං.

37. පතිරූපෙන වග්ගාපි සමග්ගාපි තථා කරුං,
අධම්මෙන සමග්ගා ච ධම්මෙන වග්ගමෙව ච.

38. පතිරූපෙන වග්ගා ච සමග්ගා ච ඉමෙ පදා,
එකෙකමූලං කත්වා චක්කං බන්ධෙ විචක්ඛණො.

39. බාලාව්‍යත්තස්ස නියස්සං පබ්බාජෙ කුලදූසකං,
පටිසාරණීයං කම්මං කරෙ අක්කොසකස්ස ච.

40. අදස්සනාප්පටිකම්මෙ යො ච දිට්ඨිං න නිස්සජෙ,
තෙසං උක්ඛෙපනියකම්මං[1] සත්ථවාහෙන භාසිතං.

41. උපරිනයකම්මානං[2] පඤ්ඤො[3] තජ්ජනීයං නයෙ,
තෙසංයෙව අනුලොමං සම්මා වත්තති යාචිතො[4].

42. පස්සද්ධිං[5] තෙසං කම්මානං හෙට්ඨා කම්මනයෙන ච,
තස්මිං තස්මිං තු කම්මෙසු තත්‍රට්ඨො ච විවාදති[6].

43. අකතං දුක්කතඤ්චෙව පුන කාතබ්බකන්ති ච,
කම්මෙ පස්සද්ධියා චාපි තෙ භික්ඛූ ධම්මවාදිනො.

44. විපත්තිබ්‍යාධිතෙ දිස්වා කම්මප්පත්තෙ මහාමුනි,
පටිප්පස්සද්ධිමක්ඛාසි සල්ලකත්තොව ඔසධන්ති.

---

1. "උක්ඛෙපනං" සී මු. 2. "උපවිනායකම්මානං" සී.
3. "පඤ්ඤා" ම ජ සං 4. "යාචති" සී
,, "සම්මාවත්තනායාචිතෙ" PTS. මනුප
5. "පස්සද්ධි" ම ජ සං. අ වි. නො වි. PTS. 6. "විවදති" ම ජ සං. PTS.

35. සඞ්ඝ තෙමේ භණ්ඩනකාරක භික්‍ෂුහුහට තජ්ජනීයකර්මය කෙළේ ය. ඒ භණ්ඩනකාරක තෙමේ අන් ආවාසයකට ගියේ ය. (එහි දී) අධර්මයෙන් ව්‍යග්‍රකර්ම කෙළේ ය.

36. එහි අධර්මයෙන් සමග්‍ර වූවාහු ඒ මහණහුට තජ්ජනීයකර්මය කළාහු ය. අන් තැනෙක ධර්මයෙන් ව්‍යග්‍ර වූවාහු ඔහුට තජ්ජනීයකර්මය කළහ.

37. ප්‍රතිරූපකයෙන් ව්‍යග්‍ර වූවාහු ද, සමග්‍ර වූවාහු ද එසේ ම කළහ. අධර්මයෙන් සමග්‍ර සඞ්ඝයා ද, ධර්මයෙන් ව්‍යග්‍ර සඞ්ඝයා ද-

38. ප්‍රතිරූපක වශයෙන් ව්‍යග්‍ර සඞ්ඝයා හා සමග්‍ර සඞ්ඝයා ද මේ පද. එක එක මුල් කොට නුවණැත්තෝ චක්‍රබන්ධනය කරන්නෝ ය.

39. අඥ වූ අව්‍යක්තයාහට නියස්සකර්මය ද, කුලදූෂකයාහට පබ්බාජනීයකර්මය ද, ආක්‍රොශ කරන්නහුට පටිසාරණීයකර්මය ද කරන්නෝ ය.

40. ඇවැත් නො දක්මෙහි, ඇවැතට පිළියම් නො කිරීමෙහි, පවිටු දිටු නො හැරීමෙහි යන මේ තුණෙහි බුදුරජුන් විසින් උත්ක්‍ෂෙපණීයකර්මය (කළ යුතු ය යි) වදාරණ ලදී.

41. මත්තෙහි කර්මයන්ගේ ක්‍රමය පිළිබඳ ප්‍රශ්නයෙහි තජ්ජනීයකර්මයෙහි මෙන් වේ. ඒ ඒ කර්මයන්ට අනුලෝම ව යාවක්‍කු කරණලද්දේ මිනා කොට පවතී.

42-43. යට කී කර්මයන්ගේ ක්‍රමයෙන් ඒ ඒ කර්මයන්ගේ සන්සිඳීම ද, ඒ ඒ කර්මයන්හි, එහි සිටියේ කර්මය "නො කරණ ලද්දේ ය. කර්මය වැරදි සේ කරණ ලද්දේ ය. කර්මය නැවත කට යුතු ය" යි කර්මප්‍රශ්‍රබ්ධියෙහි මෙසේ විවාද කෙරේ. ඒ ඒ භික්‍ෂූහු ධර්මවාදී වෙත්.

44. ශල්‍යකර්ම කරන්නාකු වෙනෙත් කියන්නා සේ මහාමුනි තෙමේ කර්මවිපත්තියෙන් පීඩිත වූ කර්මප්‍රාප්තයන් දැක ඔවුන්ගේ සන්සිඳීම වදාළේ ය.

# 10

# කොසම්බක්ඛන්ධකං

---

1. තෙන සමයෙන බුද්ධො භගවා **කොසම්බියං** විහරති **ඝොසිතා-රාමෙ**. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ආපත්තිං ආපන්නො. සො තස්සා ආපත්තියා ආපත්තිදිට්ඨී හොති. අඤ්ඤෙ භික්ඛූ තස්සා ආපත්තියා අනාපත්තිදිට්ඨිනො හොන්ති.

2. සො අපරෙන සමයෙන තස්සා ආපත්තියා අනාපත්තිදිට්ඨී හොති. අඤ්ඤෙ භික්ඛූ තස්සා ආපත්තියා ආපත්තිදිට්ඨිනො හොන්ති.

3. අථ ඛො තෙ භික්ඛූ තං භික්ඛුං එතදවොචුං: "ආපත්තිං ත්වං ආවුසො, ආපන්නො. පස්සසෙතං ආපත්ති"න්ති. "නත්ථි මෙ ආවුසො, ආපත්ති, යමහං පස්සෙය්‍යා"ති.

4. අථ ඛො තෙ භික්ඛූ සාමග්ගිං ලභිත්වා තං භික්ඛුං ආපත්තියා අදස්සනෙ උක්ඛිපිංසු.

5. සො ච භික්ඛු බහුස්සුතො හොති ආගතාගමො ධම්මධරො විනය-ධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො.

6. අථ ඛො සො භික්ඛු සන්දිට්ඨෙ සම්භත්තෙ භික්ඛූ උපසඞ්කමිත්වා එතදවොච: "අනාපත්ති එසා ආවුසො. නෙසා ආපත්ති. අනාපන්නොම්හි. නම්හි ආපන්නො. අනුක්ඛිත්තොම්හි. නම්හි උක්ඛිත්තො. අධම්මිකෙනම්හි කම්මෙන උක්ඛිත්තො කුප්පෙන අට්ඨානාරහෙන. හොථ මෙ ආයස්මන්තො ධම්මතො විනයතො පක්ඛා"ති. අලභි ඛො සො භික්ඛු සන්දිට්ඨෙ සම්භත්තෙ භික්ඛූ පක්ඛෙ.

7. ජානපදානම්පි සන්දිට්ඨානං සම්භත්තානං භික්ඛූනං සන්තිකෙ දූතං පාහෙසි: "අනාපත්ති එසා ආවුසො. නෙසා ආපත්ති. අනාපන්නොම්හි. නම්හි ආපන්නො. අනුක්ඛිත්තොම්හි. නම්හි උක්ඛිත්තො. අධම්මිකෙනම්හි කම්මෙන උක්ඛිත්තො කුප්පෙන අට්ඨානාරහෙන. හොන්තු මෙ ආයස්මන්තො ධම්මතො විනයතො පක්ඛා" ති. අලභි ඛො සො භික්ඛු ජානපදෙපි සන්දිට්ඨෙ සම්භත්තෙ භික්ඛූ පක්ඛෙ.

8. අථ ඛො තෙ උක්ඛිත්තානුවත්තකා භික්ඛූ යෙන උක්ඛෙපකා භික්ඛූ තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා උක්ඛෙපකෙ භික්ඛූ එතදවොචුං: "අනාපත්ති එසා ආවුසො. නෙසා ආපත්ති. අනාපන්නො එසො භික්ඛු. නෙසො භික්ඛු ආපන්නො. අනුක්ඛිත්තො එසො භික්ඛු. නෙසො භික්ඛු උක්ඛිත්තො. අධම්මිකෙන කම්මෙන උක්ඛිත්තො කුප්පෙන අට්ඨානාරහෙනා" ති

# 10

# කොසම්බක්ඛන්ධකය

1. එකල්හි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ **කොසඹෑනුවර ඝොසිතාරාමයෙහි** වැඩ වසන සේක. එකල්හි එක්තරා මහණෙක් ඇවැතකට පැමිණියේ වේ. හෙතෙමේ ඒ ඇවැතෙහි ආපත්ති දෘෂ්ටි (ඇවැත් යන ලබ්ධි) ඇත්තේ වේ. සෙසු භික්ෂූහු ඒ ඇවැතෙහි අනාපත්තිදෘෂ්ටි (ඇවැත් නැතැ යි යන ලබ්ධි) ඇත්තෝ වෙති.

2. හෙතෙමේ මෑත කාලයෙහි ඒ ඇවැතෙහි අනාපත්ති දෘෂ්ටි ඇත්තේ වේ. සෙසු භික්ෂූහු ඒ ඇවතෙහි ආපත්තිදෘෂ්ටි ඇත්තෝ වෙති.

3. ඉක්බිති ඒ භික්ෂූහු "ඇවැත, තෝ ඇවැතකට පැමිණියෙහි ය. තෙල ඇවැත දකුව" යි ඒ මහණහුට කීහ. "ඇවැත්නි, මම යම් ඇවැතක් දක්නෙම් ද, මට එබඳු ඇවැතක් නැතැ" යි හෙතෙමේ කීය.

4. එකල්හි ඒ භික්ෂූහු සමගිය ලබා ඒ භික්ෂුනම ඇවැත් නො දක්මෙහි තහනම් කළහ.

5. ඒ මහණ තෙමේ ද බොහෝ ඇසූපිරූතැන් ඇත්තේ ය. ආගම පුහුණු කෙළේ වේ. ධර්මධර ය. විනයධර ය. උභයමාතෘකා (ප්‍රාතිමොක්ෂ) ධර ය. පණ්ඩිත ය. ව්‍යක්ත ය. නුවණැත්තේ ය. ලජ්ජා ඇත්තේ ය. කුකුස් කරන්නේ ය. ශික්ෂාකාමී ය.

6. ඉක්බිති ඒ භික්ෂු තෙමේ දුටුමිතුරු දැඩිමිතුරු භික්ෂූන් වෙත එළඹ "ඇවැත්නි, මෙය අනාපත්ති වේ. මෙය ඇවැතක් නො වේ. ඇවැතට නො පැමිණියේ වෙමි. පැමිණියෙක් නො වෙමි. තහනම් නො කරණ ලද්දේ වෙමි. තහනම් කරණ ලද්දෙක් නො වෙමි. කොප්‍ය වූ (ආක්‍රොශ කටයුතු බවට පැමිණි) සසුනට නො ගැලපෙන්නා වූ අධාර්මිකකර්මයෙන් තහනම් කරණ ලද්දේ වෙමි. (එහෙයින්) ආයුෂ්මත්හු ධර්මයෙන් විනයයෙන් මට පක්ෂ වවූ" යි මෙය කීයේ ය. ඒ භික්ෂු තෙමේ දුටුමිතුරු වූ දැඩිමිතුරු වූ (තමහට) පක්ෂ වූ භික්ෂූන් ලැබී ය.

7. "ඇවැත්නි, මෙය අනාපත්ති වේ. මෙය ඇවැතක් නො වේ. ඇවැතට නො පැමිණියෙම් වෙමි. පැමිණියෙම් නො වෙමි. තහනම් නො කරණ ලද්දේ වෙමි. තහනම් කරණ ලද්දේ නො වෙමි. කොප්‍ය වූ සසුනට නො ගැලපෙන්නා වූ අධාර්මිකකර්මයෙන් තහනම් කරණ ලද්දේ වෙමි. (එහෙයින්) ආයුෂ්මත්හු ධර්මයෙන් විනයයෙන් මට පක්ෂ-වවූ" යි මෙසේ කියා දනවූ වැසි දුටුමිතුරු වූ දැඩිමිතුරු වූ භික්ෂූන් වෙත ද දූතයකු යැවී ය. ඒ භික්ෂු තෙමේ දනවුවැසි දුටුමිතුරු වූ දැඩිමිතුරු වූ පක්ෂ වූ භික්ෂූන් ද ලැබි ය.

8. ඉක්බිති ඒ උක්ඛිත්තානුවර්තක (තහනම් කරණු ලැබූවහුට අනුව පවතින) භික්ෂූහු තහනම් කළ භික්ෂූන් වෙත එළඹියහ. එළඹ "ඇවැත්නි, මෙය අනාපත්ති වේ. මෙය ඇවැතක් නො වේ. මේ මහණ තෙමේ ඇවැතට නො පැමිණියේ වේ. මේ මහණ තෙමේ ඇවැතට පැමිණියෙක් නො වේ. මේ මහණ තෙමේ බැහැර නො කරණ ලද්දේ වේ. මේ මහණ තෙමේ බැහැර කරණ ලද්දෙක් නො වේ. කොප්‍ය වූ සසුනට නො ගැලපෙන්නා වූ අධාර්මිකකර්මයෙන් බැහැර කරණ ලද්දේ ය" යි බැහැර කළ භික්ෂූන්ට මෙය කීහ.

9. එවං වුත්තෙ උක්ඛෙපකා භික්ඛූ උක්ඛිත්තානුවත්තකෙ භික්ඛූ එතදවොචුං: “ආපත්ති එසා ආවුසො. නෙසා අනාපත්ති. ආපන්නො එසො භික්ඛු. නෙසො භික්ඛු අනාපන්නො. උක්ඛිත්තො එසො භික්ඛු. නෙසො භික්ඛු අනුක්ඛිත්තො. ධම්මිකෙන කම්මෙන උක්ඛිත්තො අකුප්පෙන ඨානාරහෙන. මා ඛො තුම්හෙ ආයස්මන්තො එතං උක්ඛිත්තකං භික්ඛුං අනුවත්තිත්ථ, අනුපරිවාරෙථා” ති.

10. එවම්පි ඛො තෙ උක්ඛිත්තානුවත්තකා භික්ඛූ උක්ඛෙපකෙහි භික්ඛූහි වුච්චමානා තථෙව තං උක්ඛිත්තකං භික්ඛුං අනුවත්තිංසු. අනුපරිවාරෙසුං.

11. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: “ඉධ භන්තෙ අඤ්ඤතරො භික්ඛු ආපත්තිං ආපන්නො අහොසි. සො තස්සා ආපත්තියා ආපත්තිදිට්ඨී අහොසි. අඤ්ඤෙ භික්ඛූ තස්සා ආපත්තියා අනාපත්තිදිට්ඨිනො අහෙසුං.

12. “සො අපරෙන සමයෙන තස්සා ආපත්තියා අනාපත්තිදිට්ඨී අහොසි. අඤ්ඤෙ භික්ඛූ තස්සා ආපත්තියා ආපත්තිදිට්ඨිනො අහෙසුං.

13. “අථ ඛො තෙ භන්තෙ භික්ඛූ තං භික්ඛුං එතදවොචුං: ‘ආපත්තිං ත්වං ආවුසො ආපන්නො. පස්සසෙතං ආපත්ති’ න්ති. ‘නත්ථි මෙ ආවුසො ආපත්ති, යමහං පස්සෙය්‍ය’ න්ති.

14. “අථ ඛො තෙ භන්තෙ භික්ඛූ සාමග්ගිං ලභිත්වා තං භික්ඛුං ආපත්තියා අදස්සනෙ උක්ඛිපිංසු.

15. “සො ච භන්තෙ භික්ඛු බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො.

16. “අථ ඛො සො භන්තෙ භික්ඛු සන්දිට්ඨෙ සම්භත්තෙ භික්ඛූ උපසඞ්කමිත්වා එතදවොච: ‘අනාපත්ති එසා ආවුසො. නෙසා ආපත්ති. අනාපන්නොම්හි. නම්හි ආපන්නො. අනුක්ඛිත්තොම්හි. නම්හි උක්ඛිත්තො. අධම්මිකෙනම්හි කම්මෙන උක්ඛිත්තො කුප්පෙන අට්ඨානාරහෙන. හොථ මෙ ආයස්මන්තො ධම්මතො විනයතො පක්ඛා’ ති.

17. “අලභි ඛො සො භන්තෙ භික්ඛු සන්දිට්ඨෙ සම්භත්තෙ භික්ඛූ පක්ඛෙ.

18. “ජානපදානම්පි සන්දිට්ඨානං සම්භත්තානං භික්ඛූනං සන්තිකෙ දූතං පාහෙසි: ‘අනාපත්ති එසා ආවුසො. නෙසා ආපත්ති. අනාපන්නොම්හි. නම්හි ආපන්නො. අනුක්ඛිත්තොම්හි. නම්හි උක්ඛිත්තො. අධම්මිකෙනම්හි කම්මෙන උක්ඛිත්තො කුප්පෙන අට්ඨානාරහෙන. හොන්තු මෙ ආයස්මන්තො ධම්මතො විනයතො පක්ඛා’ ති.

9. මෙසේ කී කල්හි උත්ක්ෂේපකභික්ෂූහු "ඇවැත්නි, මෙය ඇවතකි. මෙය අනාපත්ති නො වේ. මේ මහණ තෙමේ ඇවැත් අවන් ය. මේ මහණ තෙමේ ඇවැතට අවන් නො වූ යේ නො වේ. මේ මහණ තෙමේ උත්ක්ෂිප්ත ය. මේ මහණ තෙමේ උත්ක්ෂිප්ත නො වූයේ නො වේ. අකොප්‍ය වූ සසුනට ගැළපෙන්නා වූ ධාර්මිකකර්මයෙන් උත්ක්ෂිප්ත ය. (එහෙයින්) ආයුෂ්මත්හු මේ උත්ක්ෂිප්ත භික්ෂුහුහට අනුවර්තීක නො වවු. අනුගමනය නො කරවු" යි උත්ක්ෂිප්තානුවර්තික භික්ෂූන්ට මෙය කීහ.

10. උත්ක්ෂේපකභික්ෂූන් විසින් මෙසේත් කියනු ලබන්නා වූ ඒ උත්ක්ෂිප්තානුවර්තිකභික්ෂූහු ඒ උත්ක්ෂිප්ත වූ මහණහු අනු ව පැවැත්-තාහු ය. පිරිවැරූහ.

11. ඒ අතර එක්තරා මහණෙක් තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේ ය. "ස්වාමීනි, මෙහි එක්තරා මහණෙක් ඇවැත් අවන්නේ වේ. හෙතෙමේ ඒ ඇවතෙහි ඇවැත් යි ලබ්ධි ඇත්තේ වී ය. සෙසු භික්ෂූහු ඒ ඇවැතෙහි ඇවැත් නැතැ යි ලබ්ධි ඇත්තෝ වූහ.

12. "හෙතෙමේ මෑත කාලයෙහි ඒ ඇවතෙහි ඇවැත් නැතැ යි ලබ්ධි ඇත්තේ වි ය. සෙසු භික්ෂූහු ඒ ඇවතෙහි ඇවැත් යි ලබ්ධි ඇත්තෝ වූහ.

13. "ස්වාමීනි, අනතුරු ව ඒ භික්ෂූහු 'ඇවැත්නි, තෝ ඇවැතට පැමිණියෙහි ය. තොප ඇවැත දකුව" යි ඒ මහණහුට මෙය කීහ. 'මම යම් ඇවැතක් දක්නෙම් ද, මට එබඳු ඇවැතක් නැතැ' යි (ඒ මහණ කී ය)

14. "එවිට ස්වාමීනි, ඒ භික්ෂූහු සමගිය ලබා ඒ මහණහු ඇවැත් නො දක්මෙහි නහනම් කළහ.

15. "ස්වාමීනි, ඒ භික්ෂු තෙමේත් බොහෝ ඇසූපිරූ තැන් ඇත්තේ ය. පුහුණු කළ නිකාය ඇත්තේ ය. ධර්මධර ය. විනයධර ය. මාතෘකාධර ය. පණ්ඩිත ය. ව්‍යක්ත ය. නුවණැත්තේ ය. ලජ්ජා ඇත්තේ ය. කුකුස් කරන්නේ ය. හික්මෙනු කැමැත්තේ ය.

16. "ස්වාමීනි, ඉක්බිති ඒ භික්ෂු තෙමේ දුටු පමණින් මිතුරු වූ ආශ්‍රය-යෙන් මිතුරු වූ භික්ෂූන් වෙත එළඹ 'ඇවැත්නි, මෙය අනාපත්ති වේ. මෙය ඇවැත් නො වේ. ඇවැත් අවන් වූයෙම් නො වෙමි. ඇවැතට පැමිණියෙම් නො වෙමි. නහනම් නො කරණ ලද්දෙම් වෙමි. බැහැර කරණ ලද්දෙම් නො වෙමි. කොප්‍ය වූ සසුනට නො ගැළපෙන්නා වූ අධාර්මික කර්මයෙන් නහනම් කරණ ලද්දේ වෙමි. (එහෙයින්) ආයුෂ්මත්හු මට ධර්මයෙන් විනයයෙන් පක්ෂ වවු' යි මෙය කී ය.

17. "ස්වාමීනි, ඒ භික්ෂු තෙමේ දුටුමිතුරු වූ දැඩි මිතුරු වූ පක්ෂ වූ භික්ෂූන් ලැබී ය.

18. 'ඇවැත්නි, මෙය අනාපත්ති වේ. මෙය ඇවැත් නො වේ. ඇවැතට නො පැමිණියෙම් වෙමි. ඇවැතට පැමිණියේ නො වෙමි. බැහැර නො කරණ ලද්දේ වෙමි. බැහැර කරණ ලද්දෙම් නො වෙමි. කොප්‍ය වූ සසුනට නො ගැළපෙන්නා වූ අධාර්මිකකර්මයෙන් බැහැර කරණ ලද්දෙම් වෙමි. (එහෙයින්) ආයුෂ්මත්හු මට ධර්මයෙන් විනයයෙන් පක්ෂ වවු' යි දනවුවැසි දුටුමිතුරු වූ දැඩිමිතුරු වූ භික්ෂූන් වෙත ද දූතයකු යැවී ය.

19. "අලභි බො සො භන්තෙ භික්ඛු ජානපදෙපි සන්දිට්ඨෙ සම්භත්තෙ භික්ඛු පක්ඛෙ.

20. "අථ බො තෙ භන්තෙ උක්ඛිත්තානුවත්තකා භික්ඛූ යෙන උක්ඛෙපකා භික්ඛූ තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා උක්ඛෙපකෙ භික්ඛූ එතදවොචුං: 'අනාපත්ති එසා ආවුසො. නෙසා ආපත්ති. අනාපන්නො එසො භික්ඛු. නෙසො භික්ඛු ආපන්නො. අනුක්ඛිත්තො එසො භික්ඛු. නෙසො භික්ඛු උක්ඛිත්තො. අධම්මිකෙන කම්මෙන උක්ඛිත්තො කුප්පෙන අට්ඨානාරහෙනා' ති.

21. "එවං වුත්තෙ තෙ භන්තෙ උක්ඛෙපකා භික්ඛූ උක්ඛිත්තානුවත්තකෙ භික්ඛූ එතදවොචුං: 'ආපත්ති එසා ආවුසො. නෙසා අනාපත්ති. ආපන්නො එසො භික්ඛු. නෙසො භික්ඛු අනාපන්නො. උක්ඛිත්තො එසො භික්ඛු. නෙසො භික්ඛු අනුක්ඛිත්තො. ධම්මිකෙන කම්මෙන උක්ඛිත්තො අකුප්පෙන ඨානාරහෙන. මා බො තුම්හෙ ආයස්මන්තො එතං උක්ඛිත්තකං භික්ඛුං අනුවත්තිත්ථ. අනුපරිවාරෙථා' ති.

22. "එවම්පි බො තෙ භන්තෙ උක්ඛිත්තානුවත්තකා භික්ඛූ උක්ඛෙපකෙහි භික්ඛූහි වුච්චමානා තථෙව තං උක්ඛිත්තකං භික්ඛුං අනුවත්තන්ති. අනුපරිවාරෙන්තී" ති.

23. අථ බො භගවා "භින්නො භික්ඛුසඞ්ඝො. භින්නො භික්ඛුසඞ්ඝො" ති උට්ඨායාසනා යෙන උක්ඛෙපකා භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

24. නිසජ්ජ බො භගවා උක්ඛෙපකෙ භික්ඛූ එතදවොච: "මා බො තුම්හෙ භික්ඛවෙ 'පටිභාති නො. පටිභාති නො' ති යස්මිං වා තස්මිං වා භික්ඛුං උක්ඛිපිතබ්බං මඤ්ඤිත්ථ.

25. 'ඉධ පන භික්ඛවෙ භික්ඛු ආපත්තිං ආපන්නො හොති. සො තස්සා ආපත්තියා අනාපත්තිදිට්ඨි හොති. අඤ්ඤෙ භික්ඛූ තස්සා ආපත්තියා ආපත්තිදිට්ඨිනො හොන්ති.

26. "තෙ චෙ භික්ඛවෙ භික්ඛූ තං භික්ඛුං එවං ජානන්ති. 'අයං බො ආයස්මා බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො. සචෙ මයං ඉමං භික්ඛුං ආපත්තියා අදස්සනෙ උක්ඛිපිස්සාම, න මයං ඉමිනා භික්ඛුනා සද්ධිං උපොසථං කරිස්සාම, විනා ඉමිනා භික්ඛුනා උපොසථං කරිස්සාම, භවිස්සති සඞ්ඝස්ස තතොනිදානං භණ්ඩනං කලහො විග්ගහො විවාදො, සඞ්ඝභෙදො සඞ්ඝරාජි සඞ්ඝවවත්ථානං සඞ්ඝනානාකරණ' න්ති.

27. "භෙදගරුකෙහි භික්ඛවෙ භික්ඛූහි න සො භික්ඛු ආපත්තියා අදස්සනෙ උක්ඛිපිතබ්බො."

19. "ස්වාමීනි, ඒ භික්ෂු තෙමේ දත්වූවැසි දුටුමිතුරු වූ දෘඪමිතුරු වූ (තමහට) පක්ෂ වූ භික්ෂූන් ලැබී ය.

20. "ස්වාමීනි, ඉක්බිති ඒ උත්ක්ෂිප්තානුවර්තකභික්ෂූහු උත්ක්ෂේපක භික්ෂූන් වෙත ගියහ. ගොස් 'ඇවැත්නි, මෙය අනාපත්ති වේ. මෙය ඇවැත් නො වේ. මේ භික්ෂු තෙමේ ඇවැතට නො පැමිණියේ වේ. මේ භික්ෂු තෙමේ පැමිණියේ නො වේ. මේ භික්ෂු තෙමේ බැහැර නො කරණ ලද්දේ ය. මේ භික්ෂු තෙමේ බැහැර කරණ ලද්දේ නො වේ. කෝප්‍ය වූ සසුනට නො ගැලපෙන්නා වූ අධාර්මිකකර්මයෙන් බැහැර කරණ ලද්දේ වේ' යි උත්ක්ෂේපකභික්ෂූන්ට මෙය කීහ.

21. "ස්වාමීනි, මෙසේ කී කල්හි ඒ උත්ක්ෂේපකභික්ෂූහු 'ඇවැත්නි, මෙය ඇවැත් වේ. මෙය අනාපත්ති නො වේ. මේ භික්ෂු තෙමේ ඇවැතට පැමිණියේ වේ. මේ භික්ෂු තෙමේ නො පැමිණියේ නො වේ. මේ භික්ෂු තෙමේ බැහැර කරණ ලද්දේ වේ. මේ භික්ෂු තෙමේ බැහැර නො කරණ ලද්දේ නො වේ. අකෝප්‍ය වූ සසුනට ගැලපෙන්නා වූ ධාර්මික කර්මයෙන් බැහැර කරණ ලද්දේ වේ. ආයුෂ්මත්නි, තෙපි බැහැර කරණ ලද මේ මහණහුට අනුවර්තක නො වවු. අනුගමනය නො කරවු' යි උත්ක්ෂිප්තා-නුවර්තකභික්ෂූන්ට කීහ.

22. "ස්වාමීනි, උත්ක්ෂේපකභික්ෂූන් විසින් මෙසේත් කියනු ලබන්නා වූ උත්ක්ෂිප්තානුවර්තකභික්ෂූහු උත්ක්ෂිප්ත වූ ඒ මහණ ඒ ලෙසින් ම පිරිවරත්".

23. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "භික්ෂුසඞ්ඝ තෙමේ බිඳුනේ ය. භික්ෂුසඞ්ඝ තෙමේ බිඳුනේ ය" යි හුනස්නෙන් නැගිට උත්ක්ෂේපකභික්ෂූන් වෙත වැඩිසේක. වැඩ පැණ වූ අසුනෙහි වැඩහුන් සේක.

24. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ උත්ක්ෂේපකභික්ෂූන්ට මෙය වදාළ සේක: "මහණෙනි, තෙපි 'අපට වැටහෙයි. අපට වැටහේ ය' යි යම් ඒ කරුණෙක්හි මහණෙක් බැහැර කළ යුතු ය" යි නහමක් සලකවු.

25. "මහණෙනි, මෙහි මහණෙක් ඇවැතට පැමිණියේ වේ. හෙතෙමේ ඒ ඇවැත ඇවැත් නො වෙ ය යි දැකුම් ඇත්තේ වේ. සෙසු භික්ෂූහු ඒ ඇවැත ඇවැත් ය යි දැකුම් ඇත්තෝ වෙති.

26. "මහණෙනි, ඒ භික්ෂූහු ඒ මහණහු ගැණ "මේ ආයුෂ්මත් තෙමේ බොහෝ ඇසූපිරූතැන් ඇත්තේ ය. පුහුණු කළ නිකාය ඇත්තේ ය. ධර්ම-ධර ය. විනයධර ය. මාතෘකාධර ය. පණ්ඩිත ය. ව්‍යක්ත ය. නුවණැත්තේ ය. ලජ්ජා ඇත්තේ ය. කුකුස් කරන්නේ ය. හික්මෙනු කැමැත්තේ ය. අපි මේ මහණහු ඇවැත් නො දක්මෙහි බැහැර කරන්නෙමු නම්, අපි මේ මහණහු සමග පොහෝ නො කරන්නෙමු නම්, මේ මහණහු හැර පොහොය කරන්නෙමු නම්, ඒ හෙතුවෙන් සඞ්ඝයාගේ ඩබරයක් කලහයක් විග්‍රහයක් විවාදයක් සඞ්ඝයාගේ බිඳීමක් සඞ්ඝයාගේ භෙදයට ඉරි වැටීමක් සඞ්ඝයා වෙත් කිරීමක් සඞ්ඝයාගේ වෙනස් බවක් වන්නේ ය යි දනිත් ද ?

27 මහණෙනි, බිඳීම බරපතල කොට සලකන භික්ෂූන් විසින් ඒ මහණ තෙමේ ඇවැත් නො දක්මෙහි බැහැර නො කට යුතු ය.

28. "ඉධ පන භික්ඛවෙ භික්ඛු ආපත්තිං ආපන්නො හොති. සො තස්සා ආපත්තියා අනාපත්තිදිට්ඨි හොති. අඤ්ඤෙ භික්ඛූ තස්සා ආපත්තියා ආපත්තිදිට්ඨිනො හොන්ති.

29. "තෙ චෙ භික්ඛවෙ භික්ඛූ තං භික්ඛුං එවං ජානන්ති: 'අයං ඛො ආයස්මා බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො. සචෙ මයං ඉමං භික්ඛුං ආපත්තියා අදස්සනෙ උක්ඛිපිස්සාම, න මයං ඉමිනා භික්ඛුනා සද්ධිං පවාරෙස්සාම. විනා ඉමිනා භික්ඛුනා පවාරෙස්සාම, න මයං ඉමිනා භික්ඛුනා සද්ධිං සඞ්ඝකම්මං කරිස්සාම, විනා ඉමිනා භික්ඛුනා සඞ්ඝකම්මං කරිස්සාම, න මයං ඉමිනා භික්ඛුනා සද්ධිං ආසනෙ නිසීදිස්සාම, විනා ඉමිනා භික්ඛුනා ආසනෙ නිසීදිස්සාම, න මයං ඉමිනා භික්ඛුනා සද්ධිං යාගුපානෙ නිසීදිස්සාම, විනා ඉමිනා භික්ඛුනා යාගුපානෙ නිසීදිස්සාම, න මයං ඉමිනා භික්ඛුනා සද්ධිං භත්තග්ගෙ නිසීදිස්සාම, විනා ඉමිනා භික්ඛුනා භත්තග්ගෙ නිසීදිස්සාම, න මයං ඉමිනා භික්ඛුනා සද්ධිං එකච්ඡන්නෙ වසිස්සාම, විනා ඉමිනා භික්ඛුනා එකච්ඡන්නෙ වසිස්සාම, න මයං ඉමිනා භික්ඛුනා සද්ධිං යථාවුඩ්ඪං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කරිස්සාම, විනා ඉමිනා භික්ඛුනා යථාවුඩ්ඪං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කරිස්සාම, භවිස්සති සඞ්ඝස්ස තතොනිදානං භණ්ඩනං කලහො විග්ගහො විවාදො සඞ්ඝභෙදො සඞ්ඝරාජි සඞ්ඝවවත්ථානං සඞ්ඝනානාකරණ'න්ති.

30. "භෙදගරුකෙහි භික්ඛවෙ භික්ඛූහි න සො භික්ඛු ආපත්තියා අදස්සනෙ උක්ඛිපිතබ්බො" ති.

31. අථ ඛො භගවා උක්ඛෙපකානං භික්ඛූනං එතමත්ථං භාසිත්වා උට්ඨායාසනා යෙන උක්ඛිත්තානුවත්තකා භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

32. නිසජ්ජ ඛො භගවා උක්ඛිත්තානුවත්තකෙ භික්ඛූ එතදවොච: "මා ඛො තුම්හෙ භික්ඛවෙ ආපත්තිං ආපජ්ජිත්වා 'නම්හ ආපන්නා. නම්හ ආපන්නා' ති ආපත්තිං[1] න පටිකාතබ්බං මඤ්ඤිත්ථ.

33. "ඉධ පන භික්ඛවෙ භික්ඛු ආපත්තිං ආපන්නො හොති. සො තස්සා ආපත්තියා අනාපත්තිදිට්ඨි හොති. අඤ්ඤෙ භික්ඛූ තස්සා ආපත්තියා ආපත්තිදිට්ඨිනො හොන්ති.

34. "සො චෙ භික්ඛවෙ භික්ඛු තෙ භික්ඛූ එවං ජානාති: 'ඉමෙ ඛො ආයස්මන්තා[2] බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා නාලං මමං වා කාරණා අඤ්ඤෙසං වා කාරණා ඡන්දා දොසා මොහා භයා අගතිං ගන්තුං. සචෙ මං ඉමෙ භික්ඛූ ආපත්තියා අදස්සනෙ උක්ඛිපිස්සන්ති, න මයා සද්ධිං උපොසථං කරිස්සන්ති, විනා මයා උපොසථං කරිස්සන්ති, භවිස්සති සඞ්ඝස්ස තතොනිදානං භණ්ඩනං කලහො විග්ගහො විවාදො සඞ්ඝභෙදො සඞ්ඝරාජි සඞ්ඝවවත්ථානං සඞ්ඝනානාකරණ' න්ති

1. "ආපන්න" මජසං 2. 'ආයස්මන්තො' සාජ්චි.

28. "මහණෙනි, මෙහි මහණෙක් ඇවතට පැමිණියේ වේ. හෙතෙමේ ඒ ඇවත ඇවැත් නො වෙයි යන දැකුම් ඇත්තේ වේ. සෙසු භික්ෂූහු ඒ ඇවත ඇවැත් ය යන ලබ්ධි ඇත්තෝ වෙත්.

29. "මහණෙනි, ඒ භික්ෂූහු ඒ මහණහු පිළිබඳ ව 'මේ ආයුෂ්මත් තෙමේ බොහෝ ඇසූපිරූතැන් ඇත්තේ ය. පුහුණු කළ නිකාය ඇත්තේ ය. ධම්මධර ය. විනයධර ය. මාතෘකාධර ය. පණ්ඩිත ය. ව්‍යක්ත ය. නුවණැත්තේ ය. ලජ්ජා ඇත්තේ ය. කුකුස් කරන්නේ ය. හික්මෙනු කැමැත්තේ ය. අපි මේ මහණහු ඇවැත් නො දක්මෙහි බැහැර කරන්නෙමු නම් අපි මේ මහණහු හා නො පවරන්නෙමු නම්, මේ මහණහු හැර පවරන්නෙමු නම්, අපි මේ මහණහු සමග සඞ්ඝකම් නො කරන්නෙමු නම්, මේ මහණහු හැර සඞ්ඝකම් කරන්නෙමු නම්, අපි මේ මහණහු සමග එක් අසුනෙහි නො හිඳින්නෙමු නම්, මේ මහණහු හැර අසුනෙහි හිඳින්නෙමු නම්, අපි මේ මහණහු සමග යාගුපානයෙහි (කැඳ බීමට) නො හිඳින්නෙමු නම්, මේ මහණහු හැර කැඳ බීමට හිඳින්නෙමු නම්, අපි මේ මහණහු සමග බත්හලෙහි නො හිඳින්නෙමු නම්, මේ මහණහු හැර බත්හලෙහි හිඳින්නෙමු නම්, අපි මේ මහණ සමග එක් පියසි ඇති ගෙයි නො වසන්නෙමු නම්, මේ මහණහු හැර එක් පියසි ඇති ගෙයි වසන්නෙමු නම්; අපි මේ මහණහු සමග වැඩිමහල් පිළිවෙළට වැඳීම නැඟීසිටීම ඇඳිලි කිරීම සැලකිලි කිරීම (සුදුසු ගෞරවය) නො කරන්නෙමු නම්, මේ මහණ හැර වැඩිමහල් පිළිවෙළට වැඳීම නැඟී සිටීම ඇඳිලි කිරීම සැලකිලි කිරීම කරන්නෙමු නම්, ඒ හෙතුවෙන් සඞ්ඝයාගේ ඩබරයක් කලහයක් විග්‍රහයක් විවාදයක් සඞ්ඝභෙදයක් සඞ්ඝරාජියක් සඞ්ඝවවත්ථානයක් සඞ්ඝනානාකරණයක් වන්නේ ය' යි මෙසේ දනිත් ද ?

30. "මහණෙනි, සඞ්ඝභෙදය බරපතළ කොට සලකන භික්ෂූන් විසින් ඒ මහණ තෙමේ ඇවැත් නො දක්මෙහි නහමක් බැහැර කළ යුතු" යි.

31. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උත්ක්ෂෙපක භික්ෂූන්ට මේ කරුණ වදාරා හුනස්නෙන් නැගිට උත්ක්ෂිප්තානුවර්තක භික්ෂූන් වෙත වැඩි සේක. වැඩ පැණවූ අසුනෙහි හුන්සේක.

32. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ උත්ක්ෂිප්තානුවර්තක භික්ෂූන්ට මෙය වදාළ සේක: "මහණෙනි, තෙපි ඇවැතට පැමිණ 'නො පැමිණියමෝ වෙමු. පැමිණියමෝ නො වෙමු' යි ඇවැතට පිළියම් නො කට යුතු ය යි සැලකුවහුය».

33. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ ඇවැතට පැමිණියේ වේ. හෙතෙමේ ඒ ඇවැත ඇවැත් නො වෙයි යන ලබ්ධි ඇත්තේ වේ. සෙසු භික්ෂූහු ඒ ඇවැත ඇවැත් ය යන ලබ්ධි ඇත්තෝ වෙති.

34. "මහණෙනි, ඒ මහණතෙමේ ඒ මහණුන් ගැණ 'මේ ආයුෂ්මත්හු බොහෝ ඇසූපිරූතැන් ඇත්තාහ. පුහුණු වූ නිකාය ඇත්තාහ. ධම්මධරයහ. විනයධරයහ. මාතෘකාධරයහ. පණ්ඩිතයහ. ව්‍යක්තායහ. නුවණැත්තාහ. ලජ්ජා ඇත්තාහ. කුකුස් කරන්නාහ. හික්මෙනු කැමැත්තාහ. මා නිසා හෝ අනුන් නිසා හෝ ඡන්දයෙන් හෝ ද්වෙෂයෙන් හෝ මොහයෙන් හෝ බියෙන් හෝ අගතියට යන්ට සුදුසු නො වෙත්. මේ භික්ෂූහු මා ඇවැත් නො දක්මෙහි බැහැර කරන්නාහු නම්, මා හා පොහොය නො කරන්නාහු නම්, මා හැර පොහොය කරන්නාහු නම්, ඒ හෙතුවෙන් සඞ්ඝයාගේ ඩබරයක් කලහයක් විග්‍රහයක් විවාදයක් සඞ්ඝභෙදයක් සඞ්ඝරාජියක් සඞ්ඝවවත්ථානයක් සඞ්ඝනානාකරණයක් වන්නේ ය යි මෙසේ දනී ද ?

35. "භෙදගරුකෙන භික්ඛවෙ භික්ඛුනා පරෙසම්පි සද්ධාය[1] සා ආපත්ති දෙසෙතබ්බා.

36. "ඉධ පන භික්ඛවෙ භික්ඛු ආපත්තිං ආපන්නො හොති. සො තස්සා ආපත්තියා අනාපත්තිදිට්ඨී හොති. අඤ්ඤෙ භික්ඛූ තස්සා ආපත්තියා ආපත්තිදිට්ඨිනො හොන්ති.

37. "සො චෙ භික්ඛවෙ, භික්ඛු තෙ භික්ඛූ එවං ජානාති: 'ඉමෙ ඛො ආයස්මන්තො බහුස්සුතා. ආගතාගමා. ධම්මධරා. විනයධරා. මාතිකාධරා. පණ්ඩිතා. ව්‍යත්තා. මෙධාවිනො. ලජ්ජිනො. කුක්කුච්චකා. සික්ඛාකාමා, නාලං මමං වා කාරණා අඤ්ඤස්සං වා කාරණා ඡන්දා දොසා මොහා භයා අගතිං ගන්තුං. සචෙ මං ඉමෙ භික්ඛූ ආපත්තියා අදස්සනෙ උක්ඛිපිස්සන්ති, න මයා සද්ධිං පවාරෙස්සන්ති, විනා මයා පවාරෙස්සන්ති, න මයා සද්ධිං සඞ්ඝකම්මං කරිස්සන්ති, විනා මයා සඞ්ඝකම්මං කරිස්සන්ති, න මයා සද්ධිං ආසනෙ නිසීදිස්සන්ති, විනා මයා ආසනෙ නිසීදිස්සන්ති, න මයා සද්ධිං යාගුපානෙ නිසීදිස්සන්ති, විනා මයා යාගුපානෙ නිසීදිස්සන්ති, න මයා සද්ධිං භත්තග්ගෙ නිසීදිස්සන්ති, විනා මයා භත්තග්ගෙ නිසීදිස්සන්ති, න මයා සද්ධිං එකච්ඡන්නෙ වසිස්සන්ති, විනා මයා එකච්ඡන්නෙ වසිස්සන්ති, න මයා සද්ධිං යථාවුඩ්ඪං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කරිස්සන්ති, විනා මයා යථාවුඩ්ඪං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කරිස්සන්ති, භවිස්සති සඞ්ඝස්ස තතොනිදානං භණ්ඩනං කලහො විග්ගහො විවාදො, සඞ්ඝභෙදො, සඞ්ඝරාජි සඞ්ඝවවත්ථානං සඞ්ඝනානාකරණ' න්ති,

38. "භෙදගරුකෙන භික්ඛවෙ, භික්ඛුනා පරෙසම්පි සද්ධාය සා ආපත්ති දෙසෙතබ්බා" ති.

39. අථ ඛො භගවා උක්ඛිත්තානුවත්තකානං භික්ඛූනං එතමත්ථං භාසිත්වා උට්ඨායාසනා පක්කාමි.

40. තෙන ඛො පන සමයෙන උක්ඛිත්තානුවත්තකා භික්ඛූ තත්ථෙව අන්තොසීමායං උපොසථං කරොන්ති. සඞ්ඝකම්මං කරොන්ති.

41. උක්ඛෙපකා පන භික්ඛූ නිස්සීමං ගන්ත්වා උපොසථං කරොන්ති. සඞ්ඝකම්මං කරොන්ති.

42. අථ ඛො අඤ්ඤතරො උක්ඛෙපකො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: "එතෙ භන්තෙ, උක්ඛිත්තානුවත්තකා භික්ඛූ තත්ථෙව අන්තොසීමාය උපොසථං කරොන්ති. සඞ්ඝකම්මං කරොන්ති. මයං පන භන්තෙ, උක්ඛෙපකා භික්ඛූ නිස්සීමං ගන්ත්වා උපොසථං කරොම. සඞ්ඝකම්මං කරොමා" ති.

43. "තෙ චෙ භික්ඛු, උක්ඛිත්තානුවත්තකා භික්ඛූ තත්ථෙව අන්තොසීමාය උපොසථං කරිස්සන්ති, සඞ්ඝකම්මං කරිස්සන්ති, යථා මයා ඤත්ති ච අනුසාවණා ච පඤ්ඤත්තා, තෙසං තානි කම්මානි ධම්මිකානි[2] භවිස්සන්ති අකුප්පානි ඨානාරහානි. තුම්හෙ චෙ භික්ඛු උක්ඛෙපකා භික්ඛූ තත්ථෙව අන්තොසීමායං උපොසථං කරිස්සථ, සඞ්ඝකම්මං කරිස්සථ, යථා මයා ඤත්ති අනුසාවණා ච පඤ්ඤත්තා, තුම්හාකම්පි තානි කම්මානි ධම්මිකානි භවිස්සන්ති අකුප්පානි ඨානාරහානි. තං කිස්ස හෙතු? නානාසංවාසකා එතෙ[3] භික්ඛූ තුම්හෙහි, තුම්හෙ ච තෙහි නානාසංවාසකා.

1. "සඞ්ඝාය" PTS. 2 "ධම්මිකානි කම්මානි' ම ඡ සං. 3. "තෙ" සි.

Free Distribution www.aathaapi.org

35. "මහණෙනි, බිඳීම බරපතල කොට සලකන මහණහු විසින් අනුන් පිළිබඳ විශ්වාසයෙන් ද ඒ ඇවැත දෙසිය යුතු ය.

36. "මහණෙනි, මෙහි මහණෙක් තෙමේ ඇවැතට පැමිණියේ වේ. හෙතෙමේ ඒ ඇවැත ඇවැත් නො වේ යන ලබ්ධි ඇත්තේ වේ. සෙසු භික්ෂූහු ඒ ඇවත ඇවැත් ය යන ලබ්ධි ඇත්තෝ වෙත්.

37. "මහණෙනි, ඒ මහණ තෙමේ ඒ මහණුන් ගැණ 'මේ ආයුෂ්මත්හු බොහෝ ඇසූපිරූතැන් ඇත්තාහ. පුහුණු කළ නිකාය ඇත්තාහ. ධම්ධරයහ. විනයධරයහ. මාතෘකාධරයහ. පණ්ඩිතයහ. ව්‍යක්තයහ. නුවණැත්තාහ. ලජ්ජා ඇත්තාහ. කුකුස් කරන්නාහ. හික්මෙන්නට කැමැත්තාහ. මා නිසා හෝ අනුන් නිසා හෝ ඡන්දයෙන් හෝ ද්වේෂයෙන් හෝ මෝහයෙන් හෝ භයෙන් හෝ අගතියට යන්ට සුදුසු නො වෙත්. මේ භික්ෂූහු මා ඇවැත් නො දැක්මෙහි බැහැර කරන්නාහු නම්, මා සමග නො පවරන්නාහු නම්, මා හැර පවරන්නාහු නම්, මා සමග සඞ්ඝකම් නො කරන්නාහු නම්, මා හැර සඞ්ඝකම් කරන්නාහු නම්, මා සමග එක් ආසනයෙහි නො හිඳින්නාහු නම්, මා හැර ආසනයෙහි හිඳින්නාහු නම්, මා සමග යාගු-පානයෙහි නො හිඳින්නාහු නම්, මා හැර යාගුපානයෙහි හිඳින්නාහු නම්, මා සමග බත්හලෙහි නො හිඳින්නාහු නම්, මා හැර බත්හලෙහි හිඳින්නාහු නම්, මා සමග එක් පියසි ඇති ගෙයි නො වසන්නාහු නම්, මා හැර එක් පියසි ඇති ගෙයි වසන්නාහු නම්, මා සමග වැඩිමහලු පිළිවෙළට වැඳීම නැගීසිටිම ඇඳිලිකිරීම සැලකිලිකිරීම නො කරන්නාහු නම්, මා හැර වැඩිමහලු පිළිවෙළට වැඳීම නැගීසිටීම ඇඳිලිකිරීම සැලකිලිකිරීම කරන්නාහු නම්, ඒ හෙතුවෙන් සඞ්ඝයාගේ ඹබරයක් කලහයක් විග්‍රහයක් විවාදයක් සඞ්ඝභෙදයක් සඞ්ඝරාජියක් සඞ්ඝවවත්ථානයක් සඞ්ඝනානා-කරණයක් වන්නේ ය' යි දනී ද ?

38. "මහණෙනි, බිඳීම බරපතල කොට සලකන මහණහු විසින් අනුන් පිළිබඳ විශ්වාසයෙන් ද ඒ ඇවැත දෙසිය යුතු" යි.

39. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උත්ක්ෂිප්තානුවර්තිකභික්ෂූන්ට මේ කරුණ වදුරා හුනස්නෙන් නැගිට වැඩි සේක.

40. එකල්හි උත්ක්ෂිප්තානුවර්තිකභික්ෂූහු එහි සීමාව තුළ ම පොහොය කෙරෙත්. සඞ්ඝකම් කෙරෙත්.

41. උත්ක්ෂෙපකභික්ෂූහු සීමාවෙන් බැහැරට ගොස් පොහොය කෙරෙත්. සඞ්ඝකම් කෙරෙත්.

42. එකල්හි එක්තරා උත්ක්ෂෙපක වූ මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, මේ උත්ක්ෂිප්තානුවර්තිකභික්ෂූහු එහි ම සීමාව තුළ පොහොය කරත්. සඞ්ඝ-කම් කරත්. ස්වාමීනි, උත්ක්ෂෙපකභික්ෂූහු වූ අපි සීමාවෙන් බැහැරට ගොස් පොහොය කරමු සඞ්ඝකම් කරමු" යි මෙය සැළ කළේ ය.

43. "මහණ, ඒ උත්ක්ෂිප්තානුවර්තිකභික්ෂූහු එහි ම සීමාව තුළ මා විසින් පැණ වූ ඤප්තියත් අනුසාවණයත් යම් සේ ද, (එසේ) පොහොය කරන්-නාහු නම්, සඞ්ඝකම් කරන්නාහු නම්, ඔවුන්ගේ ඒ කම්යෝ අකොප්‍ය ද සසුනට සුදුසු ද ධාර්මික ද වෙති. මහණ, තෙපි උත්ක්ෂෙපකභික්ෂූහු එහි ම සීමාව තුළ මා පැණ වූ ඤප්තියත් අනුසාවණයත් පරිදි පොහොය කරන්නාහු නම්, සඞ්ඝකම් කරන්නාහු නම්, තොපගේ ද ඒ කම්යෝ අකොප්‍ය ද සසුනට සුදුසු ද ධාර්මික ද වෙති. කිනම් හෙතුවකින් ද ? යත්: ඒ භික්ෂූහු තොප හා නානාසංවාසක වෙති. තෙපි ද ඔවුන් හා නානාසංවාසක වවු. (එහෙයිනි.)

44. “ද්වෙමා භික්ඛු, නානාසංවාසකභූමියො: අත්තනා වා අත්තානං නානාසංවාසකං කරොති, සමග්ගො වා නං සඞ්ඝො උක්ඛිපති අදස්සනෙ වා අප්පටිකම්මෙ වා අප්පටිනිස්සග්ගෙ වා, ඉමා ඛො භික්ඛු, ද්වෙ නානාසංවාසකභූමියො.

45. “ද්වෙමා භික්ඛු, සමානසංවාසකභූමියො: අත්තනා වා අත්තානං සමානසංවාසකං කරොති, සමග්ගො වා නං සඞ්ඝො උක්ඛිත්තං ඔසාරෙති අදස්සනෙ වා අප්පටිකම්මෙ වා අප්පටිනිස්සග්ගෙ වා, ඉමා ඛො භික්ඛු, ද්වෙ සමානසංවාසකභූමියො” ති.

46. තෙන ඛො පන සමයෙන භික්ඛූ භත්තග්ගෙ අන්තරඝරෙ භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං අනනුලොමිකං කායකම්මං වචීකම්මං උපදංසෙන්ති. හත්ථපරාමාසං කරොන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: “කථං හි නාම සමණා සක්‍යපුත්තියා භත්තග්ගෙ අන්තරඝරෙ භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං අනනුලොමිකං කායකම්මං වචීකම්මං උපදංසෙස්සන්ති. හත්ථපරාමාසං කරිස්සන්තී” ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති “කථං හි නාම භික්ඛූ භත්තග්ගෙ අන්තරඝරෙ භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං අනනුලොමිකං කායකම්මං වචීකම්මං උපදංසෙස්සන්ති? හත්ථපරාමාසං කරිස්සන්තී?” ති.

47. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං: “සච්චං කිර භික්ඛවෙ,” -පෙ- “සච්චං භගවා” -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: “භින්නෙ භික්ඛවෙ, සඞ්ඝෙ අධම්මියමානෙ[1] අසම්මොදිකාය වත්තමානාය[2] ‘එත්තාවතා න අඤ්ඤමඤ්ඤං අනනුලොමිකං කායකම්මං වචීකම්මං උපදංසෙස්සාම, හත්ථපරාමාසං කරිස්සාමා’ ති. ආසනෙ නිසීදිතබ්බං. භින්නෙ භික්ඛවෙ, සඞ්ඝෙ ධම්මියමානෙ සම්මොදිකාය වත්තමානාය ආසනන්තරිකාය නිසීදිතබ්බ” න්ති.

48. තෙන ඛො පන සමයෙන භික්ඛූ සඞ්ඝමජ්ඣෙ භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති. තෙ න සක්කොන්ති තං අධිකරණං වූපසමෙතුං. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: “ඉධ භන්තෙ, භික්ඛූ සඞ්ඝමජ්ඣෙ භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති. තෙ න සක්කොන්ති තං අධිකරණං වූපසමෙතුං. සාධු භන්තෙ භගවා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා” ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

---

1. “අධම්මියායමානෙ” ම ඡ සං.
2. “අසම්මොදිකා වත්තමානායාති - අසම්මොදිකාය වත්තමානාය; අයමෙව වා පාඨො” ඉති අට්ඨකථායං දිස්සති.

Free Distribution www.aathaapi.org

44. "මහණ, නානාසංවාසකභූමි දෙකෙකි: තෙමේ හෝ තමා නානාසංවාසක කරයි. සමගි වූ සඞ්ඝ තෙමේ ඇවැත් නො දැක්මෙහි හෝ ඇවැතට පිළියම් නො කිරීමෙහි හෝ ලාමක මිසදිටු අත් නො හැරීමෙහි හෝ ඔහු බැහැර කෙරේ යනුයි. මහණ, මේ නානාසංවාසකභූමි දෙක ය.

45. "මහණ, සමානසංවාසකභූමි දෙකෙකි: තෙමේ හෝ තමන් සමානසංවාසක කෙරෙයි. සමගි වූ සඞ්ඝ තෙමේ හෝ ඇවැත් නො දැක්මෙහි හෝ ඇවැතට පිළියම් නො කිරීමෙහි හෝ ලාමක මිසදිටු අත් නො හැරීමෙහි හෝ බැහැර කරණ ලද්දහු ඇතුළත් කෙරේ යනුයි. මහණ, මේ සමානසංවාසකභූමි දෙක ය" යි.

46. එකල්හි භික්ෂූහු බත්හලෙහි ද ඇතුලු ගම්හි ද හටගත් ඩබර ඇත්තෝ හටගත් කලහ ඇත්තෝ විවාදයට පැමිණියෝ ඔවුනොවුන්ට නො සුදුසු වූ කායකර්ම වාක්කර්ම දක්වත්. අතින් ගසා ගණිත්. එකල්හි මිනිස්සු "කෙසේ නම් ශ්‍රමණශාක්‍යපුත්‍රීයයෝ බත්හලෙහි ඇතුලුගමෙහි හටගත් ඩබර ඇත්තෝ හටගත් කලහ ඇත්තෝ විවාදයට පැමිණියෝ ඔවුනොවුන්ට නො සුදුසු වූ කායකර්ම වාක්කර්ම දක්වත් ද ? අතින් ගසා ගණිත්ද" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්. භික්ෂූහු අවමන් කරණ නින්දා කරණ දෙස් කියන ඒ මිනිසුන්ගේ කතාව ඇසූහ. අල්පෙච්ඡ වූ යම් ඒ භික්ෂූහු වෙත් ද, ඔහු "කෙසේ නම් භික්ෂූහු බත්හලෙහි ඇතුලුගමෙහි හටගත් ඩබර ඇත්තෝ හටගත් කලහ ඇත්තෝ විවාදයට පැමිණියෝ ඔවුනොවුන්ට නො සුදුසු වූ කායකර්ම වාක්කර්ම දක්වත් ද ? අතින් ගසා ගණිත් දැ" යි අවමන් කෙරෙත්. නින්දා කෙරෙත්. දෙස් කියත්.

47. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. "මහණෙනි, සැබෑ ද?" -පෙ- "භාග්‍යවතුන් වහන්ස, සැබෑ ය" -පෙ- ගරහා දැහැමි කතා කොට භික්ෂූන් අමතා "මහණෙනි, සඞ්ඝයා බිඳුනු කල්හි අධර්මකර්ම කරණ කල්හි නො සතුට උපදවන ක්‍රියා කරණ කල්හි (සතුටු නො විය හැකි කතා පවත්නා කල්හි) 'මෙපමණකින් ඔවුනොවුන්ට අනුලොම් නො වූ කායකර්ම වාක්කර්ම නො දක්වන්නෙමු. අතින් ගසා නො ගන්නෙමු" යි සමීප ආසනයෙහි නො හිඳිය යුතු ය. මහණෙනි, සඞ්ඝයා බිඳුනු කල්හි ධර්මකර්ම කරණ කල්හි සතුටු විය හැකි කතා පවත්නා කල්හි අසුනක් හැර හිඳිය යුතු ය" යි වදාළ සේක.

48. එකල්හි භික්ෂූහු සඟමැද හටගත් ඩබර ඇත්තාහු හටගත් කලහ ඇත්තාහු විවාදයට පැමිණියාහු ඔවුනොවුන්ට මුවසැත්වලින් (වචන නැමැති අඩයටිවලින්) විදිමින් වෙසෙත්. ඔහු ඒ අධිකරණය සන්සිඳවීමට නො හැකිවෙත්. ඒ අතර එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. ගොස් භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක සිටියේ ය. පසෙක සිටියා වූ ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, මෙහි භික්ෂූහු සඟ මැද හටගත් ඩබර ඇත්තාහු හටගත් කලහ ඇත්තාහු විවාදයට පැමිණියාහු ඔවුනොවුන්ට මුවසැත්වලින් විදිමින් වෙසෙත්. ඔහු ඒ අධිකරණය සන්සිඳවීමට නො හැකි වෙත්. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා උපදවා ඒ භික්ෂූන් වෙතට වඩින සේක් නම්, මැනවැ" යි සැල කළේ ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් (එය) ඉවසා වදාළ සේක.

49. අථ ඛො භගවා යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා තෙ භික්ඛූ එතදවොච: "අලං භික්ඛවෙ, මා භණ්ඩනං. මා කලහං. මා විග්ගහං. මා විවාද" න්ති. එවං වුත්තෙ අඤ්ඤතරො අධම්මවාදී භික්ඛු භගවන්තං එතදවොච: "ආගමෙතු භන්තෙ, භගවා ධම්මස්සාමී. අප්පොස්සුක්කො භන්තෙ, භගවා දිට්ඨධම්මසුඛවිහාරං අනුයුත්තො විහරතු. මයමෙතෙන භණ්ඩනෙන කලහෙන විග්ගහෙන විවාදෙන පඤ්ඤායිස්සාමා" ති. දුතියම්පි ඛො භගවා තෙ භික්ඛූ එතදවොච: "අලං භික්ඛවෙ, මා භණ්ඩනං. මා කලහං. මා විග්ගහං. මා විවාද" න්ති. දුතියම්පි ඛො සො අධම්මවාදී භික්ඛු භගවන්තං එතදවොච. "ආගමෙතු භන්තෙ, භගවා ධම්මස්සාමී. අප්පොස්සුක්කො භන්තෙ භගවා දිට්ඨධම්මසුඛවිහාරං අනුයුත්තො විහරතු. මයමෙතෙන භණ්ඩනෙන කලහෙන විග්ගහෙන විවාදෙන පඤ්ඤායිස්සාමා" ති.

50. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "භූතපුබ්බං භික්ඛවෙ, බාරාණසියං බ්‍රහ්මදත්තො නාම කාසිරාජා අහොසි අඩ්ඪො මහද්ධනො මහාභොගො මහබ්බලො මහාවාහනො මහාවිජිතො පරිපුණ්ණකොසකොට්ඨාගාරො.

51. "දීඝීති නාම කොසලරාජා අහොසි දලිද්දො අප්පධනො අප්පභොගො අප්පබලො අප්පවාහනො අප්පවිජිතො අපරිපුණ්ණකොසකොට්ඨාගාරො.

52. "අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා දීඝීතිං කොසලරාජානං අබ්භුය්‍යාසි.

53. "අස්සොසි ඛො භික්ඛවෙ, දීඝීති කොසලරාජා 'බ්‍රහ්මදත්තො කිර කාසිරාජා චතුරඞ්ගිනිං සෙනං සන්නය්හිත්වා මමං අබ්භුය්‍යාතො' ති.

54. "අථ ඛො භික්ඛවෙ, දීඝීතිස්ස කොසලරඤ්ඤො එතදහොසි: 'බ්‍රහ්මදත්තො ඛො කාසිරාජා අඩ්ඪො මහද්ධනො මහාභොගො මහබ්බලො මහාවාහනො මහාවිජිතො පරිපුණ්ණකොසකොට්ඨාගාරො. අහම්පනම්හි දලිද්දො අප්පධනො අප්පභොගො අප්පබලො අප්පවාහනො අප්පවිජිතො අපරිපුණ්ණකොසකොට්ඨාගාරො. නාහං පටිබලො බ්‍රහ්මදත්තෙන කාසිරඤ්ඤා එකසඞ්ඝාතම්පි සහිතුං. යන්නූනාහං පටිගච්චෙව නගරම්හා නිප්පතෙය්‍ය' න්ති.

55. "අථ ඛො භික්ඛවෙ, දීඝීති කොසලරාජා මහෙසිං ආදාය පටිගච්චෙව නගරම්හා නිප්පති.

56. "අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා දීඝීතිස්ස කොසලරඤ්ඤො බලං ච වාහනං ච ජනපදං ච කොසං ච කොට්ඨාගාරං ච අභිවිජිය අජ්ඣාවසි.[1]

1. "අජ්ඣාවසති" ම ඡ සං. P T S.

Free Distribution www.aathaapi.org

49. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන් වෙත වැඩිසේක. වැඩ පැණවූ අසුනෙහි වැඩ හුන් සේක. වැඩහිඳ, භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ට 'මහණෙනි, කම් නැත. ඩබර නො කරවු. කලහ නො කරවු. විග්‍රහ (විරුද්ධග්‍රහණ) නො කරවු. විවාද නො කරවු'' යි වදාළසේක. මෙසේ වදාළ කල්හි එක්තරා අධර්මවාදී මහණෙක් තෙමේ භාග්‍යවතුන් වහන්සේට ''ස්වාමීනි, ධර්මස්වාමී වූ භාග්‍යවතුන් වහන්සේ (තිසි කල් එන තෙක්) ඉවසා වදාරණ සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ උත්සාහ රහිත ව මෙලොව සුවපහසුවෙහි එක්වන් යෙදී වසන සේක්වා. අපි මේ ඩබරයෙන් කලහයෙන් විග්‍රහයෙන් විවාදයෙන් ප්‍රකට වන්නෙමු'' යි දන්වා සිටියේ ය. දෙවනු ද භාග්‍යවතුන් වහන්සේ ''මහණෙනි, කම් නැත. ඩබර නො කරවු. කලහ නො කරවු. විග්‍රහ නො කරවු. විවාද නො කරවු'' යි වදාළ සේක. දෙවනු ද ඒ අධර්මවාදී මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට ''ස්වාමීනි, ධර්මස්වාමී වූ භාග්‍යවතුන් වහන්සේ ඉවසා වදාරණ සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ උත්සාහ රහිත ව මෙලොව සුවපහසුවෙහි එක්වන් යෙදී වසන සේක්වා. අපි මේ ඩබරයෙන් මේ කලහයෙන් මේ විග්‍රහයෙන් මේ විවාදයෙන් ප්‍රකට වන්නෙමු'' යි සැළකෙළේ ය.

50. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක: ''මහණෙනි, පෙර **බරණැස්** නුවර ධනයෙන් සමෘද්ධ වූ නිදන්ගත මහත් ධන ඇති මහත් උපභොග පරිභොගසම්පත් ඇති මහත් බල ඇති මහත් වාහන ඇති මහත් රට ඇති පිරිපුන් කොටුගුල් ඇති **බ්‍රහ්මදත්ත** නම් **කසීරජෙක්** විය.

51. ''එසේම දිළිඳු වූ ස්වල්ප ධන ඇති ස්වල්ප උපභොග පරිභොග සම්පත් ඇති ස්වල්ප බල ඇති ස්වල්ප වාහන ඇති ස්වල්ප වූ රට ඇති හිස් වූ කොටුගුල් ඇති **දීඝිති** නම් **කොසොල්** රජෙක් වී ය.

52. ''මහණෙනි, එකල්හි **බ්‍රහ්මදත්ත කසීරජ** තෙමේ සිවුරඟසෙන් සන්නද්ධ කොට (යුදට සරසා ගෙණ) දීඝිති කොසොල් රජු කරා යුද පිණිස ගියේ ය.

53. ''දීඝිතිකොසොල් රජතෙමේ බ්‍රහ්මදත්තකසීරජ තෙමේ සිවුරඟසෙන් සරසා ගෙණ මා වෙත යුද පිණිස එන්නේ ල' යි ඇසී ය.

54. ''මහණෙනි, එකල්හි දීඝිති කොසෙල් රජුට 'බ්‍රහ්මදත්තකසීරජ තෙමේ ධනයෙන් සමෘද්ධ ය. නිදන්ගත මහත් ධන ඇත්තේ ය. මහත් උපභොග පරිභොගසම්පත් ඇත්තේ ය. මහත්බල ඇත්තේ ය. මහත් වාහන ඇත්තේ ය. මහත් රට ඇත්තේ ය. පරිපූර්ණකොෂකොෂ්ඨාගාර ඇත්තේ ය. මම දිළිඳු වෙමි. ස්වල්ප ධන ඇත්තෙමි. ස්වල්ප උපභොග-පරිභොගසම්පත් ඇත්තෙම් වෙමි. ස්වල්ප බල ඇත්තෙම් වෙමි. ස්වල්ප වාහන ඇත්තෙම් වෙමි. ස්වල්ප රට ඇත්තෙම් වෙමි. අපරිපූර්ණකොෂකොෂ්ඨාගාර ඇත්තේ වෙමි. එහෙයින් මම බ්‍රහ්මදත්තකසීරජුගෙන් එක යුදපහරකුත් ඉවසන්නට අපොහොසත් වෙමි. මම පළමු කොට ම නුවරින් නික්ම යන්නෙම් නම්, යෙහෙකැ' යි සිත් විය.

55. ''මහණෙනි, ඉක්බිති දීඝිතිකොසොල්රජ තෙමේ මෙහෙසිය ගෙණ කලින් ම නුවරින් නික්ම ගියේ ය.

56. ''මහණෙනි, ඉන් පසු බ්‍රහ්මදත්තකසීරජ තෙමේ දීඝිතිකොසොල් රජුගේ සෙනාව ද වාහන ද ජනපදය ද ධනාගාරය ද ධාන්‍යාගාරය ද දිනාගෙණ විසී ය.

57. අථ ඛො භික්ඛවෙ, **දීඝීති කොසලරාජා** සපජාපතිකො යෙන **බාරාණසී** තෙන පක්කාමි. අනුපුබ්බෙන යෙන බාරාණසී තදවසරි. තත්‍ර සුදං භික්ඛවෙ, දීඝීති කොසලරාජා සපජාපතිකො බාරාණසියං අඤ්ඤතරස්මිං පච්චන්තිමෙ ඔකාසෙ කුම්භකාරනිවෙසනෙ අඤ්ඤාතකවෙසෙන පරිබ්බාජකච්ඡන්නෙන පටිවසති.

58. අථ ඛො භික්ඛවෙ, දීඝීතිස්ස කොසලරඤ්ඤො මහෙසී න චිරස්සෙව ගබ්භිනී අහොසි. තස්සා එවරූපො දොහළො උප්පන්නො හොති[1]: ඉච්ඡති සුරියස්ස උග්ගමනකාලෙ චතුරඞ්ගිනිං සෙනං සන්නද්ධං වම්මිතං[2] සුභූමියං[3] ඨිතං පස්සිතුං, ඛග්ගානඤ්ච ධොවනං[4] පාතුං.

59. අථ ඛො භික්ඛවෙ, දීඝීතිස්ස කොසලරඤ්ඤො මහෙසී දීඝීතිං කොසලරාජානං එතදවොච: "ගබ්භිනීම්හි දෙව, තස්සා මෙ එවරූපො දොහළො උප්පන්නො: ඉච්ඡාමි සුරියස්ස උග්ගමනකාලෙ චතුරඞ්ගිනිං සෙනං සන්නද්ධං වම්මිතං සුභූමියං ඨිතං පස්සිතුං, ඛග්ගානඤ්ච ධොවනං පාතු"න්ති. "කුතො දෙවි, අම්හාකං දුග්ගතානං චතුරඞ්ගිනී සෙනා සන්නද්ධා වම්මිතා සුභූමියං ඨිතා. ඛග්ගානඤ්ච ධොවන"න්ති[5]. "සචාහං දෙව, න ලභිස්සාමි, මරිස්සාමී"ති.

60. තෙන ඛො පන සමයෙන භික්ඛවෙ, බ්‍රහ්මදත්තස්ස[6] කාසිරඤ්ඤො පුරොහිතො බ්‍රාහ්මණො දීඝීතිස්ස කොසලරඤ්ඤො සහායො හොති.

61. අථ ඛො භික්ඛවෙ, දීඝීති කොසලරාජා යෙන බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො පුරොහිතො බ්‍රාහ්මණො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො පුරොහිතං බ්‍රාහ්මණං එතදවොච: "සඛී[7] තෙ සම්ම ගබ්භිනී. තස්සා එවරූපො දොහළො උප්පන්නො: ඉච්ඡති සුරියස්ස උග්ගමනකාලෙ චතුරඞ්ගිනිං සෙනං සන්නද්ධං වම්මිතං සුභූමියං ඨිතං පස්සිතුං, ඛග්ගානඤ්ච ධොවනං පාතු"න්ති. "තෙන හි දෙව, මයම්පි දෙවිං පස්සාමා"ති.

62. අථ ඛො භික්ඛවෙ, දීඝීතිස්ස කොසලරඤ්ඤො මහෙසී යෙන බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො පුරොහිතො බ්‍රාහ්මණො තෙනුපසඞ්කමි. අද්දසා ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො පුරොහිතො බ්‍රාහ්මණො දීඝීතිස්ස කොසලරඤ්ඤො මහෙසිං දූරතොව ආගච්ඡන්තිං. දිස්වාන උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන දීඝීතිස්ස කොසලරඤ්ඤො මහෙසී තෙනඤ්ජලිම්පණාමෙත්වා තික්ඛත්තුං උදානං උදානෙසි: "කොසලරාජා වත භො කුච්ඡිගතො. කොසලරාජා වත භො කුච්ඡිගතො. කොසලරාජා වත භො කුච්ඡිගතො"ති "අවිමනා[8] දෙවී හොහි. ලච්ඡසි සුරියස්ස උග්ගමනකාලෙ චතුරඞ්ගිනිං සෙනං සන්නද්ධං වම්මිතං සුභූමියං ඨිතං පස්සිතුං, ඛග්ගානඤ්ච ධොවනං පාතු"න්ති.

63. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො පුරොහිතො බ්‍රාහ්මණො යෙන බ්‍රහ්මදත්තො කාසිරාජා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා බ්‍රහ්මදත්තං කාසිරාජානං එතදවොච: "තථා දෙව, නිමිත්තානි දිස්සන්ති[9]: සුවෙ සුරියස්ස උග්ගමනකාලෙ චතුරඞ්ගිනී සෙනා සන්නද්ධා වම්මිතා සුභූමියං තිට්ඨතු. ඛග්ගා ච ධොපියන්තූ"ති.

1. "දොහළො හොති" සී මු. 1.
2. "වම්මිකං" ම ඡ සං. PTS. සී මු. 2. 3 "සුභූමෙ" ම ඡ සං
4 "ධොවනං" ම ඡ සං.
5. "ධොවනං පාතුන්ති" ම ඡ සං. 6 "සමයෙන බ්‍රහ්මදත්තස්ස" ම ඡ සං. තො වි
7. "සඛී" ම ඡ සං. PTS.
8. "අත්තමනා" ම ඡ සං. 9. "නිමිත්තානි දිස්සති" සී මු, 1.

57. මහණෙනි, අනතුරු ව **දීඝීතිකොසොල්රජ** තෙමේ බිරිඳ හා එක් ව **බරණැසට** ගියේ ය. පිළිවෙළින් ගොස් බරණැසට පැමිණියේ ය. මහණෙනි, දීඝිති කොසොල්රජ තෙමේ බිරිඳ හා එක් ව එහි එක්තරා පසල්දෙසක කුඹල්ගෙයක අප්‍රකටවෙශයෙන් පිරිවැජියකු සේ වාසය කරයි.

58. මහණෙනි, ඉක්බිති දීඝිති කොසොල්රජුගේ මෙහෙසි තොමෝ නොබෝ දිනකින් ම ගැබිනී වූ ය. ඇට මෙබඳු වූ දොළදුකෙක් උපන්නේ වේ: ඉරු උදා වන වේලෙහි යුදඇඳුමෙන් සැරසුනු කවච දරු මනා බිම්හි සිටි සිවුරඟසෙන් දක්මට ද, කඩු සේදූ දිය බොන්නට ද කැමැති වේ.

59. මහණෙනි, ඉක්බිති දීඝිති කොසොල්රජුගේ මෙහෙසි තොමෝ දීඝිති කොසොල්රජුට "දෙවයන් වහන්ස, මම ගැබිනී වෙමි. මට මෙබඳු දොළදුකෙක් උපනා: ඉරු උදා වන වේලේ යුදඇඳුමෙන් සැරසුනු කවච දරු මනා බිම්හි සිටි සිවුරඟසෙන් දක්මටත් කඩු සේදූ දිය බොන්නටත් කැමැත්තෙමි" යි කීවා ය. "දෙවිය, දුප්පත් වූ අපට යුදඇඳුමෙන් සැරසුනු කවච දරු මනා බිම්හි සිටි සිවුරඟසෙන් කොයින් ද? කඩු සේදූ දිය කොයින් ද" යි රජතෙමේ කී ය. "දේවයන් වහන්ස, නො ලබන්නෙම් නම්, මම මැරෙන්නෙමි" යි දේවිය කීවා ය.

60. මහණෙනි, එකල්හි **බ්‍රහ්මදත්ත**කසීරජුගේ පෙරෙවි බමුණු තෙමේ දීඝිති කොසොල්රජුගේ යහළුවෙක් වේ.

61. මහණෙනි, ඉක්බිති දීඝිති කොසොල්රජ තෙමේ බ්‍රහ්මදත්ත නම් කසීරජුගේ පෙරෙවි බමුණා වෙත ගියේ ය. ගොස් බ්‍රහ්මදත්තකසීරජුගේ පෙරෙවි බමුණාට "යහළුව, ඔබගේ යෙහෙළිය ගැබිනී වූ ය. ඇයට මෙබඳු දොළදුකෙක් ඉපැද තිබේ: හිරු උදා වන වේලේ යුදඇඳුමෙන් සැරසුනු කවච දරු මනා බිම්හි සිටි සිවුරඟසෙන් දක්මටත් කඩු සේදූ දිය බොන්නටත් කැමැති වේ" යි කීයේ ය. "දේවයන් වහන්ස, එසේ නම්, අපි දු දේවිය දක්නෙමු" යි බමුණු තෙමේ කී ය.

62. මහණෙනි, ඉක්බිති දීඝිතිකොසොල්රජුගේ මෙහෙසි තොමෝ බ්‍රහ්මදත්තකසීරජුගේ පෙරෙවි බමුණා වෙත ගියා ය. මහණෙනි, බ්‍රහ්මදත්ත-කසීරජුගේ පෙරෙවි බමුණු තෙමේ එන්නා වූ දීඝිති කොසොල්රජුගේ මෙහෙසිය දුර දී ම දුටුයේ ය. දැක හුනස්නෙන් නැගිට උතුරුසළුව එකස් කොට දීඝිති කොසොල්රජුගේ මෙහෙසිය දිසාවට ඇඳිලි බැඳ "පින්වත්නි, එකැතින් කොසොල්රජෙක් කුසට පැමිණියේ ය. පින්වත්නි, එකැතින් කොසොල්රජෙක් කුසට පැමිණියේ ය. පින්වත්නි, එකැතින් කොසොල්-රජෙක් කුසට පැමිණියේ ය" යි තෙවරක් උදන් ඇනී ය. "දේවිය, දුර්මුඛ නො ව. ඉරු උදා වන වේලේ යුදඇඳුමෙන් සැරසුනු කවච දරු මනා බිම්හි සිටි සිවුරඟසෙන් දක්නටත් කඩු සේදූ දිය බොන්නටත් ලබව" යි කීය..

63. මහණෙනි, ඉක්බිති බ්‍රහ්මදත්තකසීරජුගේ පෙරෙවි බමුණු තෙමේ බ්‍රහ්මදත්තකසීරජු වෙත ගියේ ය. ගොස් බ්‍රහ්මදත්තකසීරජුට "දෙවයන් වහන්ස, හෙට ඉරු උදා වන වේලේ යුදඇඳුමෙන් සැරසුනු කවච දරු සිවුරඟසෙනාව මනා බිම්හි සිටීවා. කඩු ද **සෝදනු ලැබෙත්වා** එබඳු **නිමිති දක්නා ලැබෙත්ය**" යි මෙසේ කී ය.

64. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා මනුස්සෙ ආණාපෙසි: "යථා භණෙ, පුරොහිතො බ්‍රාහ්මණො ආහ, තථා කරොථා" ති.

65. අලභි ඛො භික්ඛවෙ, දීඝීතිස්ස කොසලරඤ්ඤො මහෙසී සුරියස්ස උග්ගමනකාලෙ චතුරඞ්ගිනිං සෙනං සන්නද්ධං වම්මිතං සුභුමියං ඨිතං පස්සිතුං, ඛග්ගානඤ්ච ධොවනං පාතුං.

66. අථ ඛො භික්ඛවෙ, දීඝීතිස්ස කොසලරඤ්ඤො මහෙසී තස්ස ගබ්භස්ස පරිපාකමන්වාය පුත්තං විජායි. තස්ස දීඝාවූති නාමං අකංසු. අථ ඛො භික්ඛවෙ, දීඝාවුකුමාරො න චිරස්සෙව විඤ්ඤුතං පාපුණි.

67. අථ ඛො භික්ඛවෙ, දීඝීතිස්ස කොසලරඤ්ඤො එතදහොසි: "අයං ඛො බ්‍රහ්මදත්තො කාසිරාජා බහුනො අම්හාකං අනත්ථස්ස කාරකො. ඉමිනා අම්හාකං බලඤ්ච වාහනඤ්ච ජනපදො ච කොසො ච කොට්ඨාගාරඤ්ච අච්ඡින්නං. සචායං අම්හෙ ජානිස්සති, සබ්බෙව තයො ඝාතාපෙස්සති. යන්නූනාහං දීඝාවුං කුමාරං බහිනගරෙ වාසෙය්‍ය"න්ති.

68. අථ ඛො භික්ඛවෙ, දීඝීති කොසලරාජා දීඝාවුං කුමාරං බහි නගරෙ වාසෙසි. අථ ඛො භික්ඛවෙ, දීඝාවුකුමාරො බහිනගරෙ පටිවසන්තො න චිරස්සෙව සබ්බසිප්පානි සික්ඛි.

69. තෙන ඛො පන සමයෙන, භික්ඛවෙ, දීඝීතිස්ස කොසලරඤ්ඤො කප්පකො බ්‍රහ්මදත්තෙ කාසිරඤ්ඤෙ පටිවසති. අද්දසා ඛො භික්ඛවෙ, දීඝීතිස්ස කොසලරඤ්ඤො කප්පකො දීඝීතිං කොසලරාජානං සපජාපතිකං බාරාණසියං අඤ්ඤතරස්මිං පච්චන්තිමෙ ඔකාසෙ කුම්භකාරනිවෙසනෙ අඤ්ඤාතකවෙසෙන පරිබ්බාජකච්ඡන්නෙන පටිවසන්තං. දිස්වාන යෙන බ්‍රහ්මදත්තො කාසිරාජා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා බ්‍රහ්මදත්තං කාසිරාජානං එතදවොච: "දීඝීති දෙව, කොසලරාජා සපජාපතිකො බාරාණසියං අඤ්ඤතරස්මිං පච්චන්තිමෙ ඔකාසෙ කුම්භකාරනිවෙසනෙ අඤ්ඤාතකවෙසෙන පරිබ්බාජකච්ඡන්නෙන පටිවසතී"ති

70. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා මනුස්සෙ ආණාපෙසි: "තෙන හි භණෙ, දීඝීතිං කොසලරාජානං සපජාපතිකං ආනෙථා"ති. "එවං දෙවා" ති ඛො භික්ඛවෙ, තෙ මනුස්සා බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො පටිස්සුත්වා දීඝීතිං කොසලරාජානං සපජාපතිකං ආනෙසුං.

71. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා මනුස්සෙ ආණාපෙසි: "තෙන හි භණෙ, දීඝීතිං කොසලරාජානං සපජාපතිකං දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා ඛරස්සරෙන පණවෙන රථියා රථියං[1] සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා දක්ඛිණෙන ද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස චතුධා ඡින්දිත්වා චතුද්දිසා බිලානි නික්ඛිපථා"ති.

72. "එවං දෙවා"ති ඛො භික්ඛවෙ, තෙ මනුස්සා බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො පටිස්සුත්වා දීඝීතිං කොසලරාජානං සපජාපතිකං දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා ඛරස්සරෙන පණවෙන රථියා රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙන්ති.

73. අථ ඛො භික්ඛවෙ, දීඝාවුස්ස කුමාරස්ස[2] එතදහොසි: "චිරදිට්ඨා ඛො මෙ මාතාපිතරො. යන්නූනාහං මාතාපිතරො පස්සෙය්‍ය"න්ති.

---

1. "රථිකාය රථිකං" ජ. ම. සං 2. "දීඝාවුකුමාරස්ස" තො වි. ජ වි ම නු ජ.

64. මහණෙනි, ඉක්බිති බ්‍රහ්මදත්තකසීරජ තෙමේ "සගයෙනි, පෙරෙවි බමුණා යමක් කියා ද, එය එසේ කරවූ" යි මිනිසුන්ට අණ කෙළේ ය.

65. මහණෙනි, දීඝිති කොසොල්රජුගේ මෙහෙසි නොමෝ ඉරු උදාවන වේලේ යුදඇඳුමෙන් සැරසුනු කවච දරූ මනා බිම්හි සිටි සිවුරඟසෙන් දක්නටත් කඩු සේදූ දිය බොන්නටත් ලැබූ ය.

66. මහණෙනි, ඉක්බිති දීඝිති කොසොල්රජුගේ මෙහෙසි නොමෝ ඒ ගැබ මේරීමට පැමිණීමෙන් පුතකු වැදූ ය. ඔහුට "දීඝාවු" යි නම් කළහ. මහණෙනි, ඉක්බිති දීඝාවුකුමාර තෙමේ නොබෝ කලකින් ම නුවණැතිබවට පැමිණියේ ය.

67. මහණෙනි, ඉක්බිති දීඝිති කොසොල්රජුට "මේ බ්‍රහ්මදත්ත කසී රජ තෙමේ අපට බොහෝ අවැඩ කෙළේ ය. මොහු විසින් අපගේ සෙනා ද වාහන ද ජනපදය ද ධනාගාරය ද ධාන්‍යාගාරය ද අසිද (පැහැර) ගන්නා ලද්දේ ය. මෙතෙමේ අප දුටුයේ නම්, තිදෙනා ම මරවන්නේ ය. එහෙයින් මම දීඝාවු කුමරු නුවරින් පිටත වාසය කරවන්නෙම් නම්, යෙහෙකැ"යි සිත් වී ය.

68. මහණෙනි, ඉක්බිති දීඝිති කොසොල් රජතෙමේ දීඝාවු කුමරු නුවරින් පිටත වාසය කරවී ය. මහණෙනි, දීඝාවු කුමාර තෙමේ බිහිනුවර වසන්නේ නොබෝ කලකින් ම සියලු සිප් උගත්තේ ය.

69. මහණෙනි, එකල්හි දීඝිති කොසොල්රජුගේ කරනැවැමි තෙමේ බ්‍රහ්මදත්තකසීරජු වෙත වෙසෙයි. මහණෙනි, දීඝිති කොසොල්රජුගේ කරනැවැමි තෙමේ බරණැස් නුවර එක්තරා පසල්දෙසක කුඹල්කරු ගෙදරක අප්‍රකටවෙශයෙන් පිරිවැජියකු සේ බිරිඳ හා එක් ව වසන දීඝිති කොසොල්රජු දුටුයේ ය. දැක බ්‍රහ්මදත්තකසීරජු වෙත ගියේ ය. ගොස් බ්‍රහ්මදත්ත කසීරජුට "දේවයන් වහන්ස, දීඝිති කොසොල්රජ තෙමේ බිරිඳ හා එක් ව බරණැස් නුවර එක්තරා පසල්දෙසක කුඹල්කරුගෙදරක අප්‍රකටවෙශයෙන් පිරිවැජියකු සේ වාසය කෙරේ ය"යි දැන්වී ය.

70. මහණෙනි, එකල්හි බ්‍රහ්මදත්තකසීරජ තෙමේ "කොල, එසේ නම් බිරිඳ සහිත වූ දීඝිති කොසොල්රජු අල්ලා ගෙණෙවු" යි මිනිසුන්ට අණ කෙළේ ය. මහණෙනි, ඒ මිනිස්සු "දෙවයන් වහන්ස, එසේ ය" යි බ්‍රහ්මදත්ත කසීරජුට පිළිවදන් දී බිරිඳ සහිත වූ දීඝිති කොසොල්රජු අල්ලා ගෙණ ආහ.

71. මහණෙනි, අනතුරු ව බ්‍රහ්මදත්තකසීරජ තෙමේ "කොල, එසේ නම් බිරිඳ සහිත වූ දීඝිති කොසොල්රජු දළ රැහැනකින් දෙඅත් පිටිතල හයා දැඩි ව බැඳ හිස මුඩු කොට රළුහඬ ඇති වදබෙරහඬින් යුක්ත ව වීථියෙන් වීථියට සිවුමංහන්දියෙන් සිවුමංහන්දියට පමුණුවා දකුණුදිගදොරින් බැහැර කරවා නුවර දකුණුදිග දී සිවුකඩක් කොට සිඳ සිවුදිග කැබැලි බහාලවු"යි මිනිසුන් ඇණවී ය.

72. මහණෙනි, ඒ මිනිස්සු "දෙවයන් වහන්ස, එසේ ය" යි බ්‍රහ්මදත්ත කසීරජුට පිළිවදන් දී බිරිඳ සහිත වූ දීඝිති කොසොල්රජු දළ රැහැනකින් පිටිතල හයා දැඩි ව බැඳ හිස මුඩු කොට රළුහඬ ඇති වදබෙරයෙන් යුක්ත ව වීථියෙන් වීථියට සිවුමංහන්දියෙන් සිවුමංහන්දියට ගෙණ යෙත්.

73. මහණෙනි, එකල්හි දීඝාවුකුමාරයාහට "මා විසින් බොහෝ කලකට පෙර මවුපියෝ දක්නා ලදහ. මම මවුපියන් දකින්නෙම් නම්, යෙහෙකැ"යි සිත් වී ය.

74. අථ බො භික්ඛවෙ, දීඝාවුකුමාරො බාරාණසිං[1] පවිසිත්වා අද්දස මාතාපිතරො දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා ඛරස්සරෙන පණවෙන රථියා රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙන්තෙ. දිස්වාන යෙන මාතාපිතරො තෙනුපසඞ්කමි.

75. අද්දසා බො භික්ඛවෙ, දීඝීතිකොසලරාජා දීඝාවුං කුමාරං දූර-තොව ආගච්ඡන්තං. දිස්වාන දීඝාවුං කුමාරං එතදවොච: "මා බො ත්වං තාත, දීඝාවු, දීඝං පස්ස. මා රස්සං. න හි තාත දීඝාවු, වෙරෙන වෙරා සම්මන්ති. අවෙරෙන හි තාත, දීඝාවු, වෙරා සම්මන්තී" ති.

76. එවං වුත්තෙ භික්ඛවෙ, තෙ මනුස්සා දීඝීතිං කොසලරාජානං එතදවොචුං: "උම්මත්තකො අයං දීඝීති කොසලරාජා විප්පලපති. කො ඉමස්ස දීඝාවු? කං අයං එවමාහ: මා බො ත්වං තාත දීඝාවු, දීඝං පස්ස, මා රස්සං. න හි තාත, දීඝාවු, වෙරෙන වෙරා සම්මන්ති, අවෙරෙන හි තාත, දීඝාවු, වෙරා සම්මන්තී ?"ති. "නාහං භණෙ, උම්මත්තකො. න විප්පලපාමි. අපි ච යො විඤ්ඤූ, සො විභාවෙස්සතී"ති.

77. දුතියම්පි බො භික්ඛවෙ, -පෙ- තතියම්පි බො භික්ඛවෙ, දීඝීති කොසලරාජා දීඝාවුං කුමාරං එතදවොච: "මා බො ත්වං තාත දීඝාවු, දීඝං පස්ස, මා රස්සං. න හි තාත දීඝාවු, වෙරෙන වෙරා සම්මන්ති. අවෙරෙන හි තාත, දීඝාවු, වෙරා සම්මන්තී"ති. තතියම්පි බො භික්ඛවෙ, තෙ මනුස්සා දීඝීතිං කොසලරාජානං එතදවොචුං: "උම්මත්තකො අයං දීඝීති කොසලරාජා විප්පලපති. කො ඉමස්ස දීඝාවු? කං අයං එවමාහ: මා බො ත්වං තාත දීඝාවු, දීඝං පස්ස මා රස්සං. න හි තාත, දීඝාවු, වෙරෙන වෙරා සම්මන්ති. අවෙරෙන හි තාත, දීඝාවු, වෙරා සම්මන්තී"ති. "නාහං භණෙ, උම්මත්තකො .න විප්පලපාමි. අපි ච යො විඤ්ඤූ, සො විභාවෙස්සතී"ති.

78. අථ බො භික්ඛවෙ, තෙ මනුස්සා දීඝීතිං කොසලරාජානං සපජා-පතිකං රථියා රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා දක්ඛිණෙන ද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස චතුධා ඡින්දිත්වා චතුද්දිසා බිලානි නික්ඛිපිත්වා ගුම්බං ඨපෙත්වා පක්කමිංසු.

79. අථ බො භික්ඛවෙ, දීඝාවුකුමාරො බාරාණසිං පවිසිත්වා සුරං නීහරිත්වා ගුම්බියෙ පායෙසි. යදා තෙ මත්තා අහෙසුං පතිතා, අථ කට්ඨානි සංකඩ්ඪිත්වා චිතකං කරිත්වා මාතාපිතූනං සරීරං චිතකං ආරොපෙත්වා අග්ගිං දත්වා පඤ්ජලිකො තික්ඛත්තුං චිතකං පදක්ඛිණං අකාසි.

80. තෙන බො පන සමයෙන භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා උපරිපාසාදවරගතො හොති. අද්දසා බො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා දීඝාවුං කුමාරං පඤ්ජලිකං තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කරොන්තං. දිස්වානස්ස එතදහොසි: "නිස්සංසයං බො සො මනුස්සො දීඝීතිස්ස කොසලරඤ්ඤො ඤාති වා සාලොහිතො වා. අහො මෙ අනත්ථකො[2]. න හි නාම මෙ කොචි ආරොචෙස්සතී"ති.

1. "බාරාණසියං" තො. වි. ජ වි. ම නු ප. 2. අනත්ථතො. සී මු.

74. මහණෙනි, ඉක්බිති දීඝාවුකුමාර තෙමේ බරණැසට පිවිස දූඛි රැකැතිත් පිටිතල හයා දැඛි ව බැඳ හිස මුඩු කොට රළුහඩ ඇති වදබෙරයකින් යුක්ත ව වීපියෙන් වීපියට සිවුමංහත්දියෙන් සිවුමංහත්දියට ගෙණ යන මවු පියන් දුටුයේ ය. දැක මවුපියන් වෙත ගියේ ය.

75. මහණෙනි, දීඝිති කොසොල්රජ තෙමේ එන්නා වූ දීඝාවුකුමාරයා දුර දී ම දුටුයේ ය. දැක දීඝාවු කුමාරයාහට "පුත, දීඝාවු, ඔබ ඉක්මන් නො වව. දුර බලව. ලඟ නො බලව. පුත, දීඝාවු, වෛරයෙන් වෛරයෝ නො සන්සිඳෙත් ම ය. පුත, දීඝාවු, අවෛරයෙන් ම වෛරයෝ සන්සිඳෙත් මය"සි කී ය.

76. මහණෙනි, මෙසේ කී කල්හි ඒ මිනිස්සු දීඝිති කොසොල්රජුට "මේ දීඝිති කොසොල්රජ තෙමේ උමතු ව නත් දෙඩයි. මොහුගේ දීඝාවු කවරෙක් ද ? මෙතෙමේ පුත, දීඝාවු, ඉක්මන් නො වව. දුර බලව. ලඟ නො බලව. පුත, දීඝාවු, වෛරයෙන් වෛරයෝ නො සන්සිඳෙත් ම ය. පුත, දීඝාවු, අවෛරයෙන් වෛරයෝ සන්සිඳෙත් මය'සි කවරකුට කියා ද"සි කීහ. "සගයෙනි, මම උමතු නො වෙමි. නත් නො දෙඩමි. වැලි, යමෙක් නුවණැත්තේ නම් හෙතෙමේ සලකන්නේ ය" යි රජ තෙමේ කී ය.

77. දෙවනු ද මහණෙනි, -පෙ- තෙවනු ද මහණෙනි, දීඝිති කොසොල් රජ තෙමේ දීඝාවු කුමාරයාහට "පුත, දීඝාවු, ඔබ ඉක්මන් නො වව, දුර බලව, ලඟ නො බලව, පුත දීඝාවු, වෛරයෙන් වෛරයෝ නො සන්සිඳෙත් ම ය. පුත, දීඝාවු, අවෛරයෙන් වෛරයෝ සන්සිඳෙත් ම ය"සි කී ය. තෙවනු ද මහණෙනි, මිනිස්සු දීඝිතිකොසොල්රජුට "මේ දීඝිති කොසොල් රජ තෙමේ උමතු ව නත් දෙඩයි. මොහුගේ දීඝාවු කවරෙක් ද, මෙතෙමේ 'පුත, දීඝාවු, ඔබ ඉක්මන් නො වව. දුර බලව. , ලඟ නො බලව. පුත, දීඝාවු, වෛරයෙන් වෛරයෝ නො සන්සිඳෙත් ම ය. පුත, දීඝාවු, අවෛරයෙන් වෛරයෝ සන්සිඳෙත් ම ය"සි කවරකුට මෙසේ කියා ද"සි කීහ. "සගයෙනි, මම උමතු නො වෙමි. නත් නො දෙඩමි. වැලි, යමෙක් නුවණැත්තේ නම්, හෙතෙමේ සලකන්නේ ය"සි කී ය.

78. මහණෙනි, ඉක්බිති ඒ මිනිස්සු බිරිඳ සහිත වූ දීඝිතිකොසොල්රජු වීපියෙන් වීපියට සිවුමංහත්දියෙන් සිවුමංහත්දියට ගෙණ ගොස් දකුණු දෙරින් බැහැර කරවා නුවරට දකුණෙහි සිවු කඩ කොට සිඳ සිවු දිග කැබැලි බහා රැකවල් තබා නික්ම ගියහ.

79. එකල්හි මහණෙනි, දීඝාවු කුමාර තෙමේ බරණැසට පිවිස සුරා ගෙණවුත් රැකවල සිටියවුන්ට පෙවී ය. යම් විටෙක ඔහු මත් වී වැටුනාහු ද, එවිට දරකඩ රැස් කොට දරසෑයක් කොට මවුපියන්ගේ සිරුරු දරසෑයට තගා ගිනි දල්වා බඳුඇදිලි ඇත්තේ තෙවරක් සෑය පැදකුණු කෙළේ ය.

80. මහණෙනි, එවේලෙහි බ්‍රහ්මදත්තකසීරජ තෙමේ පහය මතුමහලට නැගී සිටියේ වේ. මහණෙනි, බ්‍රහ්මදත්තකසීරජ තෙමේ බඳුඇදිලි ව තෙවරක් සෑය පැදකුණු කරණ දීඝාවු කුමාරයා දුටුයේ ය. දැකීමෙන් ඔහුට "ඒ මිනිසා නිසැකයෙන් ම දීඝිතිකොසොල්රජුගේ නෑයෙක් හෝ සහලේ නෑයෙක් හෝ වන්නේ ය. හා! මට නපුරෙක. කිසිවෙක් මට නො දන්වන්නේ ය"සි මෙසේ සිත් වි ය.

81. අථ ඛො භික්ඛවෙ, දීඝාවුකුමාරො අරඤ්ඤං ගන්ත්වා යාවදත්ථං කන්දිත්වා රොදිත්වා බප්පං[1] පුඤ්ඡිත්වා බාරාණසිං පවිසිත්වා අන්තොපුරස්ස සාමන්තා හත්ථිසාලං ගන්ත්වා හත්ථාචරියං එතදවොච: "ඉච්ඡාමහං ආචරිය, සිප්පං සික්ඛිතු"න්ති. තෙන හි භණෙ, මාණවක, සික්ඛස්සූ" ති.

82. අථ ඛො භික්ඛවෙ, දීඝාවුකුමාරො රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය හත්ථිසාලායං මඤ්ජුනා සරෙන ගායි. වීණඤ්ච වාදෙසි.

83. අස්සොසි ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා රත්තියා පච්චූස සමයං පච්චුට්ඨාය හත්ථිසාලායං මඤ්ජුනා සරෙන ගීතං වීණඤ්ච වාදිතං. සුත්වාන මනුස්සෙ පුච්ඡි: "කො භණෙ, රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය හත්ථිසාලායං මඤ්ජුනා සරෙන ගායි ? වීණඤ්ච වාදෙසී ?"ති.

84. "අමුකස්ස දෙව, හත්ථාචරියස්ස අන්තෙවාසී මාණවකො රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය හත්ථිසාලායං මඤ්ජුනා සරෙන ගායි. වීණඤ්ච වාදෙසී"ති. තෙන හි භණෙ, තං මාණවකං ආනෙථා"ති. "එවං දෙවා"ති ඛො භික්ඛවෙ, තෙ මනුස්සා බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො පටිස්සුත්වා දීඝාවුං කුමාරං ආනෙසුං.

85. "ත්වං භණෙ, මාණවක, රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය හත්ථිසාලායං මඤ්ජුනා සරෙන ගායි. වීණඤ්ච වාදෙසී" ති. "එවං දෙවා" ති. "තෙන හි ත්වං භණෙ, මාණවක, ගායස්සු වීණඤ්ච වාදෙහී"ති. "එවං දෙවා"ති ඛො භික්ඛවෙ, දීඝාවුකුමාරො බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො ආරාධනාපෙඛො[2] මඤ්ජුනා සරෙන ගායි. වීණඤ්ච වාදෙසි. "ත්වං භණෙ, මාණවක, මං උපට්ඨහා"ති. "එවං දෙවා"ති ඛො භික්ඛවෙ, දීඝාවුකුමාරො බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො පච්චස්සොසි.

86. අථ ඛො භික්ඛවෙ, දීඝාවුකුමාරො බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො පුබ්බුට්ඨායී අහොසි පච්ඡා නිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදී.

87. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා දීඝාවුං කුමාරං න චිරස්සෙව අබ්භන්තරිකෙ[3] විස්සාසිකට්ඨානෙ ඨපෙසි.

88. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා දීඝාවුං කුමාරං එතද- වොච:"තෙන හි භණෙ, මාණවක, රථං යොජෙහි. මිගවං ගමිස්සාමා"ති. "එවං දෙවා"ති ඛො භික්ඛවෙ, දීඝාවුකුමාරො බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො පටිස්සුත්වා රථං යොජෙත්වා බ්‍රහ්මදත්තං කාසිරාජානං එතදවොච: "යුත්තො ඛො තෙ දෙව, රථො. යස්සදානි කාලං මඤ්ඤසී"ති.

89. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා රථං අභිරුහි. දීඝාවු කුමාරො රථං පෙසෙසි. තථා තථා රථං පෙසෙසි, යථා[4] අඤ්ඤෙනෙව සෙනා අගමාසි, අඤ්ඤෙනෙව රථො.

90. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා දූරං ගන්ත්වා දීඝාවුං කුමාරං එතදවොච: තෙන හි භණෙ, මාණවක, රථං මුඤ්චස්සු. කිලන්තොම්හි. නිපජ්ජිස්සාමී"ති.

---

1. "බප්පං" ම ජ සං.
2 "පටිස්සුත්වා ආරාධාපෙක්ඛො" ජ ම සං. 3. "අබ්භන්තරිමෙ" ම ජ සං.
4. "යථා යථා" ම ජ. සං.

81. මහණෙනි, අනතුරුව දීඝාවු කුමාර තෙමේ වනයට ගොස් හැකි තාක් විලාප කියා හඬා බාෂප(=කඳුලු) පිස දමා බරණැසට පිවිස ඇතුළු- නගරය සමීපයෙහි වූ ඇත්හලට ගොස් ඇතැදුරාට "ඇදුර, මම සිප් ඉගෙණීමට කැමැත්තෙමි"යි කියා සිටියේ ය. "සගය මාණවකය, එසේ නම් උගණුව" යි හෙතෙමේ කී ය.

82. මහණෙනි, ඉක්බිති දිසාවුකුමාර තෙමේ රෑ අලුයම නැගිට ඇත්හලෙහි මිහිරිහඬින් ගායනා කෙළේ ය. වීණාව ද වැයී ය.

83. මහණෙනි, බ්‍රහ්මදත්තකසී රජතෙමේ රෑ අලුයම නැගිට ඇත්හලෙහි මිහිරිහඬින් ගැයීම හා වැයූ වෙණහඬ ද ඇසී ය. අසා "සගයෙනි, කවරෙක් රෑ අලුයම නැගිට ඇත්හලෙහි මිහිරිහඬින් ගැයී ද? වෙණ වැයී ද?"යි මිනිසුන් විචාළේ ය.

84 "දෙවයන් වහන්ස, අසවල් ඇතැදුරාගේ අතැවැසි වූ මාණවක තෙමේ රෑ අලුයම නැගිට ඇත්හලෙහි මිහිරිහඬින් ගැයී ය. විණාව ද වැයී ය" යි ඔහු කී හ. "සගයෙනි, එසේ නම් ඒ මාණවකයා ගෙණ එවූ"යි රජතෙමේ කී ය. මහණෙනි, ඒ මිනිස්සු "දෙවයන් වහන්ස, එසේ ය"යි බ්‍රහ්මදත්ත කසීරජුට පිළිවදන් දී දීඝාවු කුමරු ගෙණ ආහ.

85. "සගය, මාණවකය, රෑ අලුයම නැගිට ඇත්හලෙහි මිහිරිහඬින් ගායනා කෙළෙහි ද ? වෙණ වැයූයෙහි ද ?". "දෙවයන් වහන්ස, එසේය". "සගය, මාණවකය, එසේ නම් ගයව. වෙණ ද වයව". මහණෙනි, දීඝාවු කුමාර තෙමේ "දෙවයන් වහන්ස, එසේ ය"යි බ්‍රහ්මදත්තකසීරජු සතුටු කිරීම බලාපොරොත්තු වන්නේ මිහිරිහඬින් ගැයී ය. වෙණ ද වැයීය. "සගය, මාණවකය, තෝ මට උවැටන් කරව". මහණෙනි, දීඝාවු කුමාර තෙමේ "දෙවයන් වහන්ස, එසේ ය"යි බ්‍රහ්මදත්තකසීරජුට පිළිවදන් දුන්නේ ය.

86. මහණෙනි, එතැන් සිට දිසාවු කුමාර තෙමේ බ්‍රහ්මදත්තකසීරජුට පෙරාතු ව නින්දෙන් නැගී සිටිනුයේ පසු ව නිදන්නේ 'කුම් කෙරෙම් දැ'යි පිළිවිස කරන්නේ මනාප වූ හැසිරීම් ඇත්තේ පියවදන් කියන්නේ වි ය.

87 මහණෙනි, ඉක්බිති බ්‍රහ්මදත්තකසීරජ තෙමේ දීඝාවු කුමරු නොබෝ කලකින් ම ඇතුලත්හි විශ්වාසිකස්ථානයෙහි තැබී ය.

88. මහණෙනි, එකල බ්‍රහ්මදත්තකසීරජ තෙමේ දීඝාවු කුමරුට "සගය, මාණවකය, එසේ නම් රිය යොදව, මුවදඩයමට යන්නෙමු"යි කීයේ ය. මහණෙනි, දීඝාවු කුමාර තෙමේ "දෙවයන් වහන්ස, එසේ ය" යි බ්‍රහ්මදත්ත කසීරජුට පිළිවදන් දී රිය යොදා, බ්‍රහ්මදත්තකසීරජුට "දෙවයන් වහන්ස, යම් ගමනකට සුදුසු කලැ යි සලකන සේක් නම්, ඒ ගමනට නුඹවහන්සේට රිය යොදන ලද්දේ" ය යි කී ය.

89. මහණෙනි, ඉන් පසු බ්‍රහ්මදත්තකසීරජ තෙමේ රියට නැංගේ ය. දීඝාවු කුමාර තෙමේ රිය පැදවී ය. යම් සේ අන් පසෙකින් සෙනාවත් අන් පසෙකින් රියත් ගියේ ද, එලෙසින් රිය පැදවී ය.

90. මහණෙනි, ඉක්බිති බ්‍රහ්මදත්තකසීරජ තෙමේ දුරක් ගොස් දීඝාවු කුමරුට "සගය, මාණවකය, රිය මුදව. විඩාපත් වීමි. නිදන්නෙමි"යි කීයේ ය.

91. "එවං දෙවා"ති බො භික්ඛවෙ, දීඝාවුකුමාරො බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො පටිස්සුත්වා රථං මුඤ්චිත්වා පඨවියං පල්ලඞ්කෙන නිසීදි.

92. අථ බො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා දීඝාවුස්ස කුමාරස්ස උච්ඡඞ්ගෙ සීසං කත්වා සෙය්‍යං කප්පෙසි. තස්ස කිලන්තස්ස මුහුත්තකෙනෙව නිද්දා ඔක්කමි.

93. අථ බො භික්ඛවෙ, දීඝාවුස්ස කුමාරස්ස එතදහොසි: "අයං බො බ්‍රහ්මදත්තො කාසිරාජා බහුනො අම්හාකං අනත්ථස්ස කාරකො. ඉමිනා අම්හාකං බලඤ්ච වාහනඤ්ච ජනපදො ච කොසො ච කොට්ඨාගාරඤ්ච අච්ඡින්නං. ඉමිනා ච මෙ මාතාපිතරො හතා. අයඛ්වස්ස කාලො, ය්වාහං වෙරං අප්පෙය්‍ය"න්ති කොසියා ඛග්ගං නිබ්බාහි.

94. අථ බො භික්ඛවෙ, දීඝාවුස්ස කුමාරස්ස එතදහොසි: "පිතා බො මෙ මං[1] මරණකාලෙ අවච: 'මා බො ත්වං තාත, දීඝාවු, දීඝං පස්ස, මා රස්සං. න හි තාත, දීඝාවු, වෙරෙන වෙරා සම්මන්ති. අවෙරෙන හි තාත, දීඝාවු, වෙරා සම්මන්තී'ති. න බො මෙතං පතිරූපං, ය්වාහං පිතුවචනං අතික්කමෙය්‍ය"න්ති කොසියං ඛග්ගං පවෙසෙසි.

95. දුතියම්පි බො භික්ඛවෙ, -පෙ- තතියම්පි බො භික්ඛවෙ, දීඝාවුස්ස කුමාරස්ස එතදහොසි: "අයං බො බ්‍රහ්මදත්තො කාසිරාජා බහුනො අම්හාකං අනත්ථස්ස කාරකො. ඉමිනා අම්හාකං බලඤ්ච වාහනඤ්ච ජනපදො ච කොසො ච කොට්ඨාගාරඤ්ච අච්ඡින්නං. ඉමිනා ච මෙ මාතාපිතරො හතා. අයඛ්වස්ස කාලො, ය්වාහං වෙරං අප්පෙය්‍ය"න්ති කොසියා ඛග්ගං නිබ්බාහි. තතියම්පි බො භික්ඛවෙ, දීඝාවුස්ස කුමාරස්ස එතදහොසි: "පිතා බො මෙ මං මරණකාලෙ අවච: 'මා බො ත්වං තාත, දීඝාවු, දීඝං පස්ස. මා රස්සං. න හි තාත, දීඝාවු, වෙරෙන වෙරා සම්මන්ති. අවෙරෙන හි තාත, දීඝාවු, වෙරා සම්මන්තී'ති. න බො මෙතං පතිරූපං, ය්වාහං පිතුවචනං අතික්කමෙය්‍ය"න්ති පුනදෙව කොසියං ඛග්ගං පවෙසෙසි.

96 අථ බො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා භීතො උබ්බිග්ගො උස්සඞ්කී උත්‍රස්තො සහසා උට්ඨාසි.

97. අථ බො භික්ඛවෙ, දීඝාවුකුමාරො බ්‍රහ්මදත්තං කාසිරාජානං එතදවොච: "කිස්ස ත්වං දෙව, භීතො උබ්බිග්ගො උස්සඞ්කී උත්‍රස්තො සහසා වුට්ඨාසී" ති. "ඉධ මං භණෙ, මාණවක, දීඝීතිස්ස කොසලරඤ්ඤො පුත්තො දීඝාවු කුමාරො සුපිනන්තෙන ඛග්ගෙන පරිපාතෙසි. තෙනාහං භීතො උබ්බිග්ගො උස්සඞ්කී උත්‍රස්තො සහසා වුට්ඨාසි"න්ති.

98. අථ බො භික්ඛවෙ, දීඝාවුකුමාරො වාමෙන හත්ථෙන බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො සිරං පරාමසිත්වා දක්ඛිණෙන හත්ථෙන ඛග්ගං නිබ්බාහෙත්වා බ්‍රහ්මදත්තං කාසිරාජානං එතදවොච: "අහං බො සො දෙව, දීඝීතිස්ස කොසලරඤ්ඤො පුත්තො දීඝාවුකුමාරො. බහුනො ත්වං අම්හාකං අනත්ථස්ස කාරකො. තයා අම්හාකං බලඤ්ච වාහනඤ්ච ජනපදො ච කොසො ච කොට්ඨාගාරඤ්ච අච්ඡින්නං. තයා ච මෙ මාතාපිතරො හතා. අයඛ්වස්ස කාලො, ය්වාහං වෙරං අප්පෙය්‍ය"න්ති.

---

1. "පිතා බො මං" ජ ම සං,

91. මහණෙනි, දීඝාවු කුමාර තෙමේ "දෙවයන් වහන්ස, එසේ ය"යි බ්‍රහ්මදත්තකසීරජුට පිළිවදන් දී රිය මුදා බිම හසරම්ණිය හොතා හුන්නේ ය.

92. මහණෙනි, ඉක්බිති බ්‍රහ්මදත්තකසීරජ තෙමේ දීඝාවු කුමාරයාගේ ඇකයෙහි හිස තබා සයනය කෙළේ ය. වෙහෙසට පත් ව සිටි ඔහුට මොහොතකින් ම නින්ද ගියේ ය.

93. මහණෙනි, එකල්හි දීඝාවුකුමාරයාහට මේ සිත් වි ය: "මේ බ්‍රහ්මදත්තකසීරජ තෙමේ අපට බොහෝ අවැඩ කෙළේ ය. මොහු විසින් අපගේ සෙනා ද වාහන ද ජනපදය ද ධනාගාරය ද ධාන්‍යාගාරය ද අසිද ගන්නා ලද්දේ ය. මොහු විසින් මාගේ මවුපියෝ ද නසන ලදහ. මම පලි ගන්නෙම් නම්, ඊට මේ කාලය"යි. (මෙසේ සිතා) කොපුවෙන් කඩුව ඇද ගත්තේ ය.

94. මහණෙනි, ඉක්බිති දීඝාවුකුමාරයාහට "මාගේ පියා මැරෙණ වේලෙහි මට 'පුත, දීඝාවු, ඉක්මන් නො වව. දුර බලව. ලඟ නො බලව. පුත, දීඝාවු, වෛරයෙන් වෛරයෝ නො සන්සිඳෙත් ම ය. පුත, දීඝාවු, අවෛරයෙන් වෛරයෝ සන්සිඳෙත් ම ය"යි කීයේ ය. මම පියාගේ වචනය ඉක්මවන්නෙම් නම්, එය මට සුදුසු නො වේ"යි කඩුව කොපුවෙහි බැහී ය.

95. දෙවනු ද මහණෙනි, -පෙ- තෙවනු ද මහණෙනි, දීඝාවු කුමාරයා-හට මේ සිත් වි ය: "මේ බ්‍රහ්මදත්ත කසීරජ තෙමේ අපට බොහෝ අවැඩ කෙළේ ය. මොහු විසින් අපගේ සෙනා ද වාහන ද ජනපදය ද ධනාගාරය ද ධාන්‍යාගාර ය ද අසිඳ ගන්නා ලද්දේ ය. මොහු විසින් මාගේ මවුපියෝ නසන ලදහ. මම පලි ගන්නෙම් නම්, ඊට මේ කාලය" යි මෙසේ සිතා කඩුව කොපුවෙන් ඇද්දේ ය. තෙවනු ද මහණෙනි, දීඝාවුකුමාරයාහට මේ සිත් වි ය: "මාගේ පියා මැරෙණ වේලේ මට 'පුත, දීඝාවු, ඉක්මන් නො වව. දුර බලව. ලඟ නො බලව. පුත, දීඝාවු, වෛරයෙන් වෛරයෝ නො සන්සිඳෙත් ම ය. පුත, දීඝාවු, අවෛරයෙන් වෛරයෝ සන්සිඳෙත් ම ය" යි කීයේ ය. මම පියාගේ වචනය ඉක්මවන්නෙම් නම් මට ඒ නො සුදුසු ය"යි මෙසේ සිතා නැවතත් කඩුව කොපුවෙහි බැහී ය.

96. මහණෙනි, ඒ අතර බ්‍රහ්මදත්තකසීරජ තෙමේ බිය පත් වූයේ තැති ගත්තේ මහත් සැක ඇත්තේ වෙවුලන්නේ වහා නැගී සිටියේ ය.

97. මහණෙනි, එකල්හි දීඝාවුකුමාර තෙමේ බ්‍රහ්මදත්ත කසීරජුගෙන් "දෙවයන් වහන්ස, බියපත් වූවෙහි තැති ගත්තෙහි සැක ඇත්තෙහි වෙවුලන්නෙහි වහා නැගී සිටියෙහි කුමක් හෙයින් දැ?"යි ඇසී ය. "සගය, මාණවකය, මෙහි දී දීඝීතිකොසොල්රජුගේ පුත් වූ දීඝාවුකුමාර තෙමේ සිනෙන් මා කඩුවෙන් කපා හෙළී ය. එයින් මම බියපත් වීමි. තැති ගත්තෙමි. සැක ඇත්තේ වීමි. සැලුනේ වීමි. වහා නැගී සිටියෙමි"

98. මහණෙනි, ඉක්බිති දීඝාවු කුමාර තෙමේ වම්අතින් බ්‍රහ්මදත්ත කසීරජුගේ හිස අල්වා දකුණු අතින් කඩුව ඇද බ්‍රහ්මදත්ත කසීරජුට "දෙවයන් වහන්ස, දීඝීතිකොසොල්රජුගේ පුත්‍ර වූ දීඝාවුකුමාරයා මම වෙමි. යුෂ්මතා අපට බොහෝ අවැඩ කෙළෙහි ය. ඔබ විසින් අපගේ සෙනා ද වාහන ද ජනපදය ද ධනාගාරය ද ධාන්‍යාගාරය ද අසිද ගන්නා ලද්දේ ය. ඔබ විසින් මාගේ මවුපියෝ නසන ලද්දහ. මම පලි ගන්නෙම් නම්, ඊට මේ කාලය"යි කී ය.

99. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා දීඝාවුස්ස කුමාරස්ස පාදෙසු සිරසා නිපතිත්වා දීඝාවුං කුමාරං එතදවොච: "ජීවිතං මෙ තාත, දීඝාවු, දෙහි. ජීවිතං මෙ තාත, දීඝාවු, දෙහී"ති. "ක්‍යාහං උස්සහාමි දෙවස්ස ජීවිතං දාතුං ? දෙවො ඛො මෙ ජීවිතං දදෙය්‍යා"ති. "තෙන හි තාත, දීඝාවු, ත්වං ච මෙ ජීවිතං දෙහි. අහඤ්ච තෙ ජීවිතං දම්මී"ති.

100. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො ච කාසිරාජා දීඝාවු ච කුමාරො අඤ්ඤමඤ්ඤස්ස ජීවිතං අදංසු. පාණිඤ්ච අග්ගහෙසුං. සපථඤ්ච අකංසු අදුභාය.[1]

101. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා දීඝාවුං කුමාරං එතදවොච: "තෙන හි තාත, දීඝාවු, රථං යොජෙහි. ගමිස්සාමා"ති. "එවං දෙවා"ති ඛො භික්ඛවෙ, දීඝාවුකුමාරො බ්‍රහ්මදත්තස්ස කාසිරඤ්ඤො පටිස්සුත්වා රථං යොජෙත්වා බ්‍රහ්මදත්තං කාසිරාජානං එතදවොච: "යුත්තො ඛො තෙ දෙව, රථො. යස්සදානි කාලං මඤ්ඤසී"ති.

102. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා රථං අභිරුහි. දීඝාවු කුමාරො රථං පෙසෙසි. තථා තථා රථං පෙසෙසි, යථා න චිරස්සෙව සෙනාය සමාගච්ඡි.

103. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා බාරාණසිං පවිසිත්වා අමච්චෙ පාරිසජ්ජෙ සන්නිපාතාපෙත්වා එතදවොච: "සචෙ භණෙ, දීඝීතිස්ස කොසලරඤ්ඤො පුත්තං දීඝාවුං කුමාරං පස්සෙය්‍යාථ, කින්ති තං කරෙය්‍යාථා"ති.

104. එකච්චෙ එවමාහංසු: "මයං දෙව, හත්ථෙ ඡින්දෙය්‍යාම. මයං දෙව, පාදෙ ඡින්දෙය්‍යාම. මයං දෙව, හත්ථපාදෙ ඡින්දෙය්‍යාම. මයං දෙව, කණ්ණෙ ඡින්දෙය්‍යාම. මයං දෙව, නාසං ඡින්දෙය්‍යාම. මයං දෙව, කණ්ණනාසං ඡින්දෙයාම. මයං දෙව, සීසං ඡින්දෙය්‍යාමා"ති.

105. "අයං ඛො සො භණෙ, දීඝීතිස්ස කොසලරඤ්ඤො පුත්තො දීඝාවු කුමාරො, නායං ලබ්භා කිඤ්චි කාතුං. ඉමිනා ච මෙ ජීවිතං දින්නං. මයා ච ඉමස්ස ජීවිතං දින්න"න්ති.

106. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා දීඝාවුං කුමාරං එතදවොච: "යං ඛො තෙ තාත, දීඝාවු, පිතා මරණකාලෙ අවච: 'මා ඛො ත්වං තාත, දීඝාවු, දීඝං පස්ස. මා රස්සං. න හි තාත, දීඝාවු, වෙරෙන වෙරා සම්මන්ති. අවෙරෙන හි තාත, දීඝාවු, වෙරා සම්මන්තී'ති. කිං තෙ පිතා සන්ධාය අවචා" ති.

107. "යං ඛො මෙ දෙව, පිතා මරණකාලෙ අවච: **'මා දීඝ'න්ති** – මා 'චිරං වෙරං අකාසී'ති. ඉමං ඛො මෙ දෙව, පිතා මරණකාලෙ අවච 'මා දීඝ'න්ති. යං ඛො මෙ දෙව, පිතා මරණකාලෙ අවච: **'මා රස්ස'න්ති** – 'මා ඛිප්පං මිත්තෙහි භිජ්ජිත්ථා'ති. ඉමං ඛො මෙ දෙව, පිතා මරණකාලෙ අවච 'මා රස්ස'න්ති. යං ඛො මෙ දෙව, පිතා මරණකාලෙ අවච: **'න හි තාත, දීඝාවු, වෙරෙන වෙරා සම්මන්ති. අවෙරෙන හි තාත, දීඝාවු, වෙරා සම්මන්තී'ති**. – 'දෙවෙන මෙ මාතාපිතරො හතා'ති සචාහං දෙවං ජීවිතා වොරොපෙය්‍යං, යෙ දෙවස්ස අත්ථකාමා, තෙ මං ජීවිතා වොරොපෙය්‍යුං. යෙ මෙ අත්ථකාමා, තෙ තෙ ජීවිතා වොරොපෙය්‍යුං. එවං තං වෙරං වෙරෙන න වූපසමෙය්‍ය. ඉදානි ච පන මෙ දෙවෙන ජීවිතං දින්නං. මයා ච දෙවස්ස ජීවිතං දින්නං. එවං තං වෙරං අවෙරෙන වූපසන්තං. ඉමං ඛො මෙ දෙව, පිතා මරණකාලෙ අවච 'න හි තාත, දීඝාවු, වෙරෙන වෙරා සම්මන්ති. අවෙරෙන හි තාත දීඝාවු, වෙරා සම්මන්තී'ති.

1. "අදදූභාය" ජ ම සං, "අදුබ්භාය" ඉත්‍යපි දිස්සතෙ

99. මහණෙනි, එකල්හි බ්‍රහ්මදත්ත කසීරජ තෙමේ දීඝාවුකුමාරයාගේ පාමුල හිසින් වැටී දීඝාවුකුමාරයාහට "පුත, දීඝාවු, මට දිවි දෙව. පුත, දීඝාවු, මට දිවි දෙව"යි කී ය. "කිම, මම දෙවයන් වහන්සේට දිවි දීමට උත්සාහ කෙරෙම් ද ? දෙවයන් වහන්සේ මට දිවි දෙත්වා." "පුත, දීඝාවු, එසේ නම් තෝ මට දිවි දෙව. මමත් තට දිවි දෙමි"යි රජතෙමේ කී ය.

100. මහණෙනි, එකල්හි බ්‍රහ්මදත්ත කසීරජ තෙමේත් දීඝාවුකුමාරයාත් ඔවුනොවුන්ට දිවි දුන්හ. අතින් අත ගත්හ. ද්‍රොහ නො කරණු සඳහා දිවුලහ.

101. මහණෙනි, අනතුරු ව බ්‍රහ්මදත්ත කසීරජ තෙමේ දීඝාවු කුමාරයාහට "පුත, දීඝාවු, එසේ නම් රිය යොදව. යන්නෙමු"යි කී ය. මහණෙනි, දීඝාවු කුමාර තෙමේ "දෙවයන් වහන්ස, එසේ ය"යි බ්‍රහ්මදත්ත කසීරජුට පිළිවදන් දී රිය යොදා බ්‍රහ්මදත්තකසීරජුට "දෙවයන් වහන්ස, ඔබවහන්සේට රිය යොදන ලද්දේ ය. දැන් ගමනට කල් දන්නා සේක්වා"යි සැලකෙළේ ය.

102. මහණෙනි, ඉක්බිති බ්‍රහ්මදත්තකසීරජ තෙමේ රියට නැංගේ ය. දීඝාවුකුමාර තෙමේ රිය පැදවී ය. නොබෝවේලාවකින් සේනාව හා එක් වන ලෙසට රිය පැදවී ය.

103. මහණෙනි, නැවැත බ්‍රහ්මදත්තකසීරජ තෙමේ බරණැසට පිවිස ඇමැතිපිරිස රැස් කරවා "සගයෙනි, දීඝීතිකොසොල්රජුගේ පුත් වූ දීඝාවු කුමරු දක්නහු නම්, ඔහුට කුමක් කරන්නහු ද ?"යි පිළිවිසී ය.

104. ඇතැම් කෙනෙක් "දෙවයන් වහන්ස, අපි අත් සිඳින්නෙමු. දෙවයන් වහන්ස, අපි පා සිඳින්නෙමු. දෙවයන් වහන්ස, අපි අත්පා සිඳින්නෙමු. දෙවයන් වහන්ස, අපි කන් සිඳින්නෙමු. දෙවයන් වහන්ස, අපි නාසය සිඳින්නෙමු. දෙවයන් වහන්ස, අපි කන්නාස් සිඳින්නෙමු. දෙවයන් වහන්ස, අපි හිස සිඳින්නෙමු"යි මෙසේ කීහ.

105. "සගයෙනි, මේ ඒ දීඝීතිකොසොල්රජුගේ පුත් වූ දීඝාවු කුමාරයා ය. මේ තෙමේ කිසි දඬුවමක් කිරීම නො ලබයි. මොහු විසින් මට දිවි දෙන ලද්දේ ය. මා විසිනුත් මොහුට දිවි දෙන ලද්දේ ය"

106. ඉක්බිති මහණෙනි, බ්‍රහ්මදත්ත කසීරජ තෙමේ දීඝාවු කුමාරයාගෙන් "දරුව, දීඝාවු, තාගේ පියා මැරෙණ වේලේ "පුත දීඝාවු, ඉක්මන් නො වව. දුර බලව. ලඟ නො බලව. පුත, දීඝාවු, වෛරයෙන් වෛරයෝ නො සන්සිඳෙත් ම ය. පුත, දීඝාවු, මෛත්‍රියෙන් වෛරයෝ සන්සිඳෙත් ම ය"යි යමක් කියේ ද, තාගේ පියා කුමක් සඳහා (ඒ) කියේ දැ"යි ඇසී ය.

107. "දෙවයන් වහන්ස, මාගේ පියා මැරෙණ කල්හි **'මා දීඝං'** යි යමක් කියේ ද, (එයින්) 'බොහෝ කල් වෛර නො කරව' යනු කියේ ය. දෙවයන් වහන්ස, මාගේ පියා මැරෙණ කල්හි මේ සඳහා ම 'මා දීඝං' යනු කියේ ය. දෙවයන් වහන්ස, මාගේ පියා මැරෙණ කල්හි **'මා රස්සං'** යි යමක් කියේ ද, (එයින්) 'වහා මිත්‍රයන් හා නො බිඳෙව' යනු කියේ ය. දේවයන් වහන්ස, මාගේ පියා මැරෙණ කල්හි මේ සඳහා ම "මා රස්සං" යනු කියේ ය. දෙවයන් වහන්ස, මාගේ පියා මැරෙණ කල්හි **'න හි තාත, දීඝාවු, වෙරෙන වෙරා සම්මන්ති. අවෙරෙන හි තාත, දීඝාවු, වෙරා සම්මන්ති"** යි යමක් කියේ ද, (එයින්) 'දෙවයන් වහන්සේ විසින් මාගේ මවුපියෝ නසන ලද්දහ'යි මම දෙවයන් වහන්සේ ජීවිතයෙන් තොර කරන්නෙම් නම්, දෙවයන් වහන්සේට වැඩ කැමැති වූ යම් කෙනෙක් වෙත් නම්, ඔහු මා ජීවිතයෙන් තොර කරන්නාහු ය. මට වැඩ කැමැති වූ යම් කෙනෙක් වෙත් නම්, ඔහු ඔවුන් ජීවිතයෙන් තොර කරන්නාහු ය. මෙසේ ඒ වෛරය වෛරයෙන් නො සන්සිඳෙන්නේ ය. දැන් දේවයන් වහන්සේ විසින් මට දිවි දෙන ලද්දේ ය. මා විසිනුත් දෙවයන් වහන්සේට දිවි දෙන ලද්දේ ය. මෙසේ ඒ වෛරය අවෛරයෙන් සන්සිඳුනේය' යනු කියේ ය. දෙවයන් වහන්ස, මාගේ පියා මැරෙණ කල්හි මේ සඳහා ම 'න හි තාත, දීඝාවු, වෙරෙන වෙරා සම්මන්ති. අවෙරෙන හි වෙරා සම්මන්ති' යනු කියේ ය."

108. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මදත්තො කාසිරාජා. "අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, යාව පණ්ඩිතො අයං දීඝාවුකුමාරො යත්‍ර හි නාම පිතුනො සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානිස්සතී"ති පෙත්තිකං බලඤ්ච වාහනඤ්ච ජනපදඤ්ච කොසඤ්ච කොට්ඨාගාරඤ්ච පටිපාදෙසි. ධීතරඤ්ච අදාසි.

109. තෙසං හි නාම භික්ඛවෙ, රාජූනං ආදින්නදණ්ඩානං ආදින්නසත්ථානං එවරූපං ඛන්තිසොරච්චං භවිස්සති. ඉධ ඛො පන තං භික්ඛවෙ, සොභෙථ "යං තුම්හෙ එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිතා සමානා ඛමා ච භවෙය්‍යාථ සොරතා චා"ති.

110. තතියම්පි ඛො භගවා තෙ භික්ඛූ එතදවොච: "අලං භික්ඛවෙ, මා භණ්ඩනං. මා කලහං. මා විග්ගහං. මා විවාද"න්ති.

111. තතියම්පි ඛො සො අධම්මවාදී භික්ඛු භගවන්තං එතදවොච: "ආගමෙතු භන්තෙ, භගවා ධම්මස්සාමි. අප්පොස්සුක්කො භන්තෙ, භගවා දිට්ඨධම්මසුඛවිහාරමනුයුත්තො විහරතු. මයමෙතෙන භණ්ඩනෙන කලහෙන විග්ගහෙන විවාදෙන පඤ්ඤායිස්සාමා"ති.

112. අථ ඛො භගවා "පරියාදින්නරූපා ඛො ඉමෙ මොඝපුරිසා. නයිමෙ සුකරා සඤ්ඤාපෙතු"න්ති උට්ඨායාසනා පක්කාමි.

**දීඝාවුභාණවාරො නිට්ඨිතො පඨමො**

108. ඉක්බිති මහණෙනි, බ්‍රහ්මදත්ත කසීරජ තෙමේ "පින්වත්නි, අරුම යකි. පින්වත්නි, පුදුමයකි. යමෙක් පියා විසින් සැකෙවින්. කියූ වචනයෙහි අර්ථය විස්තරවශයෙන් දන්නේ ද, ඒ මේ දීඝාවුකුමාර තෙමේ අතිශයින් පණ්ඩිත ය"යි පියසතු වූ සෙනා ද වාහන ද ජනපදය ද ධනාගාරය ද ධාන්‍යාගාරයද නැවැත දුන්නේ ය. දුව ද දුන්නේ ය.

109. මහණෙනි, දඬු ගත් අවි ගත් ඒ රජුන්ගේත් මෙබඳු වූ ඉවසීමෙක් හා සුරත බවෙක් වන්නේ ය. මහණෙනි, තෙපි මනා කොට දෙසූ මෙබඳු සසුන්හි පැවිදි වූවහු කමා ඇත්තෝ සුරත වූවෝ වහු නම්, ඒ තෙපි මේ සස්න හොබවන්නහු ය යි වදාළසේක.

110. තෙවනු ද භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ට "මහණෙනි, වැඩෙක් නැත. ඩබර නො කරවු. කලහ නො කරවු. විග්‍රහ නො කරවු. විවාද නො කරවු"යි වදාළහ.

111. තෙවනු ද ඒ අධර්මවාදී මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, ධර්මස්වාමී වූ භාග්‍යවතුන් වහන්සේ ඉවසා වදාරණ සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ උත්සාහ රහිත ව සමවත් සුවවිහරණයෙහි යෙදී වෙසෙන සේක්වා. අපි මේ ඩබරයෙන් කලහයෙන් විග්‍රහයෙන් විවාදයෙන් ප්‍රසිද්ධ වන්නෙමු"යි කීයේ ය.

112. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "මේ හිස් පුරුෂයෝ විනාශයට ලං ව සිටියාහ. මොහු (කරුණු) හඟවන්නට පහසු වූවෝ නො වෙති. (මොවුන් සන්හිඳුවීම පහසු නො වේ.) යි හුනස්නෙන් නැගිට වැඩි සේක.

**පළමු දීඝාවු බණවර නිමියේ ය.**

---

1. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය කොසම්බිං පිණ්ඩාය පාවිසි. කොසම්බියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය ඨිතකොව සඞ්ඝමජ්ඣෙ ඉමා ගාථායො අභාසි:

2. පුථුසද්දො සමජනො න බාලො කොචි මඤ්ඤථ,
සඞ්ඝස්මිං භිජ්ජමානස්මිං නාඤ්ඤං භිය්‍යො අමඤ්ඤරුං.

3. පරිමුට්ඨා පණ්ඩිතාභාසා වාචාගොචරභාණිනො,
යාවිච්ඡන්ති මුඛායාමං[1] යෙන නීතා න තං විදූ.

4. අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ,
යෙ තං[2] උපනය්හන්ති වෙරං තෙසං න සම්මති.

5. අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ,
යෙ තං න උපනය්හන්ති වෙරං තෙසූපසම්මති.

6. න හි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනං,
අවෙරෙන ච සම්මන්ති එස ධම්මො සනන්තනො.

7. පරෙ ච න විජානන්ති මයමෙත්ථ යමාමසෙ,
යෙ ච තත්ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා.

8. අට්ඨිච්ඡින්නා[3] පාණහරා ගවාස්සධනහාරිනො,
රට්ඨං විලුම්පමානානං තෙසම්පි හොති සඞ්ගති.
කස්මා තුම්හාක නො සියා ?

9. සචෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධුවිහාරි ධීරං,
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි
චරෙය්‍ය තෙනත්තමනො සතීමා.

10. නො චෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධුවිහාරි ධීරං,
රාජාව රට්ඨං විජිතං පහාය
එකො චරෙ මාතඞ්ගරඤ්ඤෙව නාගො.

11. එකස්ස චරිතං සෙය්‍යො
නත්ථි බාලෙ සහායතා,
එකො චරෙ න ච පාපානි කයිරා
අප්පොස්සුක්කො මාතඞ්ගරඤ්ඤෙව නාගොති.

12. අථ ඛො භගවා සඞ්ඝමජ්ඣෙ ඨිතකොව ඉමා ගාථායො භාසිත්වා යෙන බාලකලොණකාරගාමො[4] තෙනුපසඞ්කමි.

13. තෙන ඛො පන සමයෙන ආයස්මා භගු බාලකලොණකාරගාමෙ විහරති.

1. "මුඛායාමා" තො වි. 2. "යෙ ච තං" ම ඡ සං.
3 "අට්ඨිච්ඡිදා" අ වි. ජ වි. තො වි. P T S.
4. "බාලකලොණකාගාමො" ම ඡ සං. බාලකලොණකාරාම - කොසම්බියජාතකට්ඨකථා.

1. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පොරොවා පාසිවුරු ගෙණ පිඬු පිණිස කොසඹෑ නුවරට පිවිසිසේක. කොසඹෑනුවර පිඬු පිණිස හැසිර පස්වරු පිණ්ඩපාතයෙන් හැරී ආ සේක් සෙනසුන් තැන්පත් කොට පා සිවුරු ගෙණ සඟමැද සිටිසේක් ම මේ ගාථාවන් වදාළසේක:

2. මේ එක සමාන (කලහකාරී) ජන තෙමේ මහහඬ ඇත්තේ ය. (පණ්ඩිතමානී වූ) ඔවුනතුරෙන් කිසිවෙක් "මම අඥ වෙමි" යි නො සිතී ය. තව ද, සඞ්ඝයා බිඳෙන කල්හි අනෙක් එකෙක් වත් (=" මා නිසා සඞ්ඝයා බිඳේ ය" යි මේ කරුණ) නො සිතී ය.

3. මුළාසිහි ඇති පණ්ඩිතමමන්‍ය වූ වචන ම ගොචර කොට ඇත්තාහු හැකි තාක් මුව අයා (නො නවත්වා) බණනසුළු වෙත් මැයි. (ඔහු) යම් කලහයකින් නිර්ලජ්ජභාවයට පමුණුවන ලද්දාහු ද, එය (මෙබඳු දෙස් සහිත ය යි) නො දන්හ.

4. "මට ජාත්‍යාදියෙන් ගටා බැන්නේ ය. මා පහළේ ය. මා දිනී ය. මා සතු වස්තුව පැහැර ගත්තේ ය" යි යම් ගිහි පැවිදි කෙනෙක් ඒ වෛරය සිත බඳිත් ද, ඔවුන්ගේ වෛරය නො සන්සිඳේ.

5. "මට ජාත්‍යාදියෙන් ගටා බැන්නේ ය. මා පහළේ ය. මා දිනී ය. මා සතු දෙය පැහැර ගත්තේ ය" යි යම් ගිහි පැවිදි කෙනෙක් ඒ වෛරය සිත නො බඳිත් ද, ඔවුන්ගේ වෛරය සන්සිඳේ.

6. මේ සත්ත්වලොකයෙහි කිසි කලෙකත් වෛරයෝ වෛරයෙන් නො සන්සිඳෙත්. අවෛරයෙන් (මෛත්‍රියෙන්) ම සන්සිඳෙත්. අවෛරයෙන් වෛරය සන්සිඳෙයි යන මේ ධර්මය පැරණිදහමෙකි.

7. (පණ්ඩිතයන් හැර) අන්‍ය වූ කලහකාරකජනයෝ මෙහි (සඟමැද) කලහ කරන්නෝ "අපි නැසෙමු (මරු වෙත යමු)" යි නො දනිත්. ඔවුන් අතුරෙහි යම් කෙනෙක් එය දනිත් ද, එයින් කලහයෝ සන්සිඳෙත්.

8. (යම්කෙනෙකුන්ගේ මවුපියන්ගේ) ඇට සිඳින ලද ද, (යම් කෙනෙක්) ප්‍රාණය පැහැර ගණිත් (=දිවි තොර කෙරෙත්) ද, ගව-අශ්ව-ධනයන් පැහැර ගන්නා සුලු වෙත් ද, (එබඳු වූ) රට වොලෝ ගන්නා වූ ඒ රජුන්ගේ ද සමගිය වේ. කුමක් හෙයින් තොපගේ සමගිය නො වන්නේ ද ?

9. සර්වානොවිතප්‍රඥ ඇති සමග හැසිරීමට සුදුසු වූ මනා විහරණ ඇති නුවණැති යහළුවකු ලබන්නේ නම්, ප්‍රකට අප්‍රකට හැම උවදුරු මැඩ ඔහු සමග සතුටු සිත් ඇත්තේ සිහි ඇත්තේ හැසිරෙන්නේ ය.

10. සර්වානොවිතප්‍රඥ ඇති සමග හැසිරීමට සුදුසු වූ මනා විහරණ ඇති ධෘතිසම්පන්න වූ යහළුවකු නො ලබන්නේ නම්, දිනූ රට හැර ගියා වූ (මහාජනක අරින්දමාදී) රජුන් මෙන් ද වනයෙහි (=සීලව හෝ පාරිලෙය්‍යක) ශ්‍රෙෂ්ඨහස්තියා මෙන් ද එකලා ව හැසිරෙන්නේ ය.

11. එකලා වූ වහුගේ හැසිරීම උතුම් ය. අඥයා කෙරෙහි යහළුබවෙක් නැත. වනයෙහි ශ්‍රෙෂ්ඨ හස්තියා මෙන් (ගණයා සමග එක් වීමේ) උත්සාහ රහිත ව එකලා ව හැසිරෙන්නේ ය. පව් නො කරන්නේ ය.

12. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සඟ මැද සිටි සේක් ම මේ ගාථාවන් වදාරා බාලකලොණකාරගමට වැඩිසේක.

13. එකල්හි ආයුෂ්මත් භගු ස්ථවිර තෙමේ බාලකලොණකාරගමෙහි වාසය කෙරෙයි.


Free Distribution www.aathaapi.org

14. අද්දසා ඛො ආයස්මා භගු භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන ආසනං පඤ්ඤපෙසි. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපි. පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙසි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ පාදෙ පක්ඛාලෙසි.

15. ආයස්මාපි ඛො භගු භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං භගුං භගවා එතදවොච: "කච්චි භික්ඛු, ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි පිණ්ඩකෙන න කිලමසී"ති. "ඛමනීයං භගවා. යාපනීයං භගවා. න චාහං භන්තෙ පිණ්ඩකෙන කිලමාමී"ති.

16. අථ ඛො භගවා ආයස්මන්තං භගුං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා යෙන පාචීනවංසදායො තෙනුපසඞ්කමි.

17. තෙන ඛො පන සමයෙන ආයස්මා ච අනුරුද්ධො ආයස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො[1] පාචීනවංසදායෙ විහරන්ති.

18. අද්දසා ඛො දායපාලො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන භගවන්තං එතදවොච: "මා සමණ, එතං දායං පාවිසි. සන්තෙත්ථ තයො කුලපුත්තා අත්තකාමරූපා විහරන්ති. මා තෙසං අඵාසුමකාසී"ති.

19. අස්සොසි ඛො ආයස්මා අනුරුද්ධො දායපාලස්ස භගවතා සද්ධිං මන්තයමානස්ස. සුත්වාන දායපාලං එතදවොච: "මා ආවුසො දායපාල, භගවන්තං වාරෙසි. සත්ථා නො භගවා අනුප්පත්තො"ති.

20. අථ ඛො ආයස්මා අනුරුද්ධො යෙනායස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ච නන්දියං ආයස්මන්තඤ්ච කිම්බිලං එතදවොච: "අභික්කමථායස්මන්තො. අභික්කමථායස්මන්තො. සත්ථා නො භගවා අනුප්පත්තො"ති.

21. අථ ඛො ආයස්මා ච අනුරුද්ධො ආයස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො භගවන්තං පච්චුග්ගන්ත්වා එකො භගවතො පත්තචීවරං පටිග්ගහෙසි. එකො ආසනං පඤ්ඤපෙසි. එකො පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ පාදෙ[2] පක්ඛාලෙසි.

22. තෙපි ඛො ආයස්මන්තො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං අනුරුද්ධං භගවා එතදවොච: "කච්චි වො අනුරුද්ධා ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි පිණ්ඩකෙන න කිලමථා"ති.

"ඛමනීයං භගවා. යාපනීයං භගවා. න ච මයං භන්තෙ පිණ්ඩකෙන කිලමාමා"ති.

"කච්චි පන වො අනුරුද්ධා සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරථා"ති.

"තග්ඝ මයං භන්තෙ සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරාමා"ති.

"යථා කථම්පන තුම්හෙ අනුරුද්ධා සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරථා"ති.

1. "කිම්මිලො" ම ඡ සං. ක්‍රිමිල-සෞන්දරනන්ද කාව්‍ය, 16-87
2. "නිසජ්ජ ඛො භගවා පාදෙ" ම. ඡ. සං.

14. ආයුෂ්මත් භගු ස්ථවිර තෙමේ වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේ දුර දී ම දුටු සේක. දැක අසුනක් පැණවී ය. පාදෝදකාදිය පාපුටුව පාපුවරුව එළවා තැබී ය. ඉදිරියට ගොස් පාසිවුරු පිළිගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ පැණවූ අසුනෙහි වැඩ හුන් සේක. වැඩ හිඳ පා සේදූහ.

15. ආයුෂ්මත් භගු ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් භගු තෙරුන්ගෙන් "මහණ, කිම, ඉවසිය හැකි ද ? කිම යැපිය හැකි ද ? කිම, ආහාරයෙන් පිඬාපත් නො වූයෙහි ද"යි අසා වදාළ සේක. "භාග්‍යවතුන් වහන්ස, ඉවසිය හැකි ය. භාග්‍යවතුන් වහන්ස, යැපිය හැකි ය. ස්වාමීනි, මම ආහාරයෙන් ද වෙහෙසට නො පත් වූයෙමි" යි තෙරහු කී හ.

16. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් භගුතෙරුන් දැහැමි කතාවෙන් කරුණු දක්වා සමාදන් කරවා තියුණු කරවා සතුටු කරවා හුනස්නෙන් නැගිට **පාචීනවංස** නම් වනයට වැඩි සේක.

17. එකල්හි ආයුෂ්මත් **අනුරුද්ධ**ස්ථවිරතෙමේ ද ආයුෂ්මත් **නන්දිය** ස්ථවිර තෙමේ ද ආයුෂ්මත් **කිම්බිල** ස්ථවිර තෙමේ ද පාචීනවංස මුවවනයෙහි වෙසෙත්.

18. උයන්පල් තෙමේ වඩින්නා වූ භාග්‍යවතුන් වහන්සේ දුර දී ම දුටුයේ ය. දැක "ශ්‍රමණය, මේ උයනට නහමක් පිවිසෙව. මෙහි කුලපුත්‍රයෝ තිදෙනෙක් වෙත්. ඔහු තමහට හිත කැමැත්තාහු වෙසෙත්. උන්වහන්සේලාට කරදර නො කළ මැනැවැ"යි කී ය.

19. ආයුෂ්මත් අනුරුද්ධස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ හා කතා කරණ උයන්පල්ලාගේ ඒ කතාව ඇසී ය. අසා උයන්පල්ලාට "ඇවැත, උයන්පල්ල, භාග්‍යවතුන් වහන්සේ නො වළකුව. අපගේ ශාස්තෘ වූ භාග්‍යවතුන් වහන්සේ වැඩිසේකැ"යි කී ය.

20. ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධස්ථවිරතෙමේ ආයුෂ්මත් නන්දිය තෙරුන් වෙත ද ආයුෂ්මත් කිම්බිලතෙරුන් වෙත ද ගියේ ය. ගොස් ආයුෂ්මත් නන්දිය තෙරුන්ට ද ආයුෂ්මත් කිම්බිල තෙරුන්ට ද "ආයුෂ්මත්නි, මෙහි පැමිණෙවු. ඉදිරියට එවු. අපගේ ශාස්තෘ වූ භාග්‍යවතුන් වහන්සේ වැඩිසේකැ"යි දැන්වී ය.

21. ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධස්ථවිර තෙමේ ද ආයුෂ්මත් නන්දිය ස්ථවිර තෙමේ ද ආයුෂ්මත් කිම්බිලස්ථවිර තෙමේ ද භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට ගොස් එක් නමක් භාග්‍යවතුන් වහන්සේගේ පාසිවුරු පිළිගත්තේ ය. එක් නමක් අසුන් පැණවී ය. එක් නමක් පාදෝදකාදිය පාපුටුව පාපුවරුව එළවා තැබී ය. භාග්‍යවතුන් වහන්සේ පැණවූ අසුනෙහි වැඩ හුන් සේක. වැඩ හිඳ පා සේදූහ.

22. ඒ ආයුෂ්මත්හු ද භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පසෙක හුන්හ. භාග්‍යවතුන් වහන්සේ පසෙක හුන් ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ගෙන් "අනුරුද්ධයෙනි, කිම, තොපට ඉවසිය හැකි ද ? කිම, යැපිය හැකි ද ? කිම, ආහාරයෙන් වෙහෙසට පත් නො වහු දැ"යි ඇසූහ.

"භාග්‍යවතුන් වහන්ස, ඉවසිය හැකි ය. භාග්‍යවතුන් වහන්ස, යැපිය හැකි ය. ස්වාමීනි, අපි ආහාරයෙන් වෙහෙසට පත් නො වම්හ".

"අනුරුද්ධයෙනි, කිම තෙපි සමගි ව සතුටු ව විවාද නො කරමින් කිරි හා ජලය සේ හැනී එක් ව සිටියහු ඔවුනොවුන් පියඇසින් බලමින් වසවු ද ?"

"ස්වාමීනි, එසේ ය. අපි සමගි ව සතුටු ව විවාද නො කරමින් කිරි හා ජලය සේ හැනී එක් ව සිටියමෝ ඔවුනොවුන් පියඇසින් බලමින් වසමු".

"අනුරුද්ධයෙනි, තෙපි කෙසේ නම් සමගි ව සතුටු ව විවාද නො කරමින් කිරි හා ජලය සේ හැනී එක් ව සිටියහු ඔවුනොවුන් පියඇසින් බලමින් වසවු ද ?"

23. “ඉධ මය්හං භන්තෙ එවං හොති: ‘ලාභා වත මෙ. සුලද්ධං වත මෙ. යොහං එවරූපෙහි සබ්‍රහ්මචාරීහි සද්ධිං විහරාමී’ති. තස්ස මය්හං භන්තෙ, ඉමෙසු ආයස්මන්තෙසු මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං ආවී චෙව රහො ච. මෙත්තං වචීකම්මං -පෙ- මෙත්තං මනොකම්මං පච්චුපට්ඨිතං ආවී චෙව රහො ච. තස්ස මය්හං භන්තෙ, එවං හොති: ‘යන්නූනාහං සකං චිත්තං නික්ඛිපිත්වා ඉමෙසං යෙව ආයස්මන්තානං චිත්තස්ස වසෙන වත්තෙය්‍ය’න්ති. සො ඛො අහං භන්තෙ, සකං චිත්තං නික්ඛිපිත්වා ඉමෙසං යෙව ආයස්මන්තානං චිත්තස්ස වසෙන වත්තාමි. නානා හි ඛො නො භන්තෙ කායා. එකඤ්ච පන මඤ්ඤෙ චිත්ත’’න්ති.

24. ආයස්මාපි ඛො නන්දියො -පෙ- ආයස්මාපි ඛො කිම්බිලො භගවන්තං එතදවොච. “මය්හම්පි ඛො භන්තෙ, එවං හොති: ‘ලාභා වත මෙ. සුලද්ධං වත මෙ. යොහං එවරූපෙහි සබ්‍රහ්මචාරීහි සද්ධිං විහරාමී’ති. තස්ස මය්හං භන්තෙ, ඉමෙසු ආයස්මන්තෙසු මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං ආවී චෙව රහො ච. මෙත්තං වචීකම්මං -පෙ- මෙත්තං මනොකම්මං පච්චුපට්ඨිතං ආවී චෙව රහො ච. තස්ස මය්හං භන්තෙ, එවං හොති: ‘යන්නූනාහං සකං චිත්තං නික්ඛිපිත්වා ඉමෙසං යෙව ආයස්මන්තානං චිත්තස්ස වසෙන වත්තෙය්‍ය’න්ති. සො ඛො අහං භන්තෙ, සකං චිත්තං නික්ඛිපිත්වා ඉමෙසං යෙව ආයස්මන්තානං චිත්තස්ස වසෙන වත්තාමි. නානා හි ඛො නො භන්තෙ, කායා. එකඤ්ච පන මඤ්ඤෙ චිත්ත’න්ති. එවං ඛො මයං භන්තෙ, සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරාමා’’ති.

25. “කච්චි පන වො අනුරුද්ධා, අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරථා?’’ති. “තග්ඝ මයං භන්තෙ, අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරාමා’’ති.

26. “යථා කථම්පන තුම්හෙ අනුරුද්ධා අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරථා?’’ති.

27. “ඉධ භන්තෙ, අම්හාකං යො පඨමං ගාමතො පිණ්ඩාය පටික්කමති, සො ආසනං පඤ්ඤපෙති. පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපති. අවක්කාරපාතිං ධොවිත්වා උපට්ඨාපෙති. පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. යො පච්ඡා ගාමතො පිණ්ඩාය පටික්කමති, සචෙ හොති භුත්තාවසෙසො, සචෙ ආකඞ්ඛති, භුඤ්ජති. නො චෙ ආකඞ්ඛති, අප්පහරිතෙ වා ඡඩ්ඩෙති. අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙති. සො ආසනං උද්ධරති. පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙති. අවක්කාරපාතිං ධොවිත්වා පටිසාමෙති. පානීයං පරිභොජනීයං පටිසාමෙති. භත්තග්ගං සම්මජ්ජති. යො පස්සති පානීයඝටං වා පරිභොජනීයඝටං වා වච්චඝටං වා රිත්තං තුච්ඡං, සො උපට්ඨාපෙති. සචස්ස හොති අවිසය්හං, හත්ථවිකාරෙන දුතියං ආමන්තෙත්වා හත්ථවිලඞ්ඝකෙන උපට්ඨාපෙති[1]. නත්වෙව මයං භන්තෙ, තප්පච්චයා වාචං භින්දාම. පඤ්චාහිකං ඛො පන මයං භන්තෙ, සබ්බරත්තියා ධම්මියා කථාය සන්නිසීදාම. එවං ඛො මයං භන්තෙ අප්පමත්තා ආතාපිනො පහිතත්තා විහරාමා’’ති.

1. “උපට්ඨාපෙම” මජ සං. P T S.

23. "ස්වාමීනි, මෙහි දී මට 'යම් මම මෙබඳු වූ සබ්‍රහ්මචාරීන් හා එක් ව වෙසෙම් ද, මට (එය) ලාභයෙකි. මා ලත් යහපත් ලැබීමෙකැ'යි සිත් වෙයි. 'ස්වාමීනි, මේ ආයුෂ්මතුන් කෙරෙහි ඒ මාගේ මෛත්‍රීකායකර්මය ප්‍රකට වත් අප්‍රකට වත් එළඹ සිටියේ ය. මෛත්‍රීවාක්කර්මය -පෙ- මෛත්‍රී-මනඃකර්මය ප්‍රකට වත් අප්‍රකට වත් එළඹ සිටියේ ය. ස්වාමීනි, ඒ මට 'මම සිය සිත බහා තබා මේ ආයුෂ්මතුන්ගේ ම සිත් වශයෙන් පවතින්නෙම් නම් යෙහෙකැ'යි සිත් වේ. ස්වාමීනි, ඒ මම සිය සිත බහා තබා මේ ආයුෂ්මතුන් ගේ ම සිත් වශයෙන් පවතිමි. ස්වාමීනි, අපගේ ශරීරයෝ වෙන් ව පවත්නෝ ම වෙති. අපගේ සිත නම් එකක් ම යයි සිතමි."

24. ආයුෂ්මත් නන්දියසථ්විරතෙමේ ද -පෙ- ආයුෂ්මත් කිම්බිලසථ්විර තෙමේ ද භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, මටත් 'යම් මම මෙබඳු වූ සබ්‍රහ්ම-සරුන් හා එක් ව වෙසෙම් ද, මට (එය) ලාභයෙකි. මා ලත් යහපත් ලැබීමෙකැ' යි සිත් වෙයි. ස්වාමීනි, මේ ආයුෂ්මතුන් කෙරෙහි ඒ මාගේ මෛත්‍රීකායකර්මය ප්‍රකට වත් අප්‍රකට වත් එළඹ සිටියේ ය. මෛත්‍රීවාක්කර්මය -පෙ- මෛත්‍රීමනඃකර්මය ප්‍රකට වත් අප්‍රකට වත් එළඹ සිටියේ ය. ස්වාමීනි, ඒ මට 'මම සිය සිත තබා මේ ආයුෂ්මතුන්ගේ ම සිත් වශයෙන් පවතින්-නෙම් නම් යෙහෙකැ'යි සිත් වේ. ස්වාමීනි, ඒ මම සිය සිත තබා මේ ආයුෂ්මතුන්ගේ ම සිත් වශයෙන් පවතිමි. ස්වාමීනි, අපගේ ශරීරයෝ වෙන් ව පවත්නෝ ම වෙති. අපගේ සිත නම් එකක් ම යයි සිතමි. ස්වාමීනි, අපි මෙසේ සමගි ව සතුටු ව විවාද නො කරමින් කිරි හා දිය සේ එකතු ව ඔවුනොවුන් පියඇසින් බලමින් වෙසෙමු".

25. "අනුරුද්ධයෙනි, කිම, තෙපි අප්‍රමත්තවූවහු කෙලෙස් තවන වැර ඇත්තහු භාවනාවට යැවූ සිත් ඇත්තහු වසවු ද" ? "ස්වාමීනි, එසේය. අපි අප්‍රමත්ත වූවමෝ කෙලෙස් තවන වැර ඇත්තමෝ භාවනාවට යැවූ සිත් ඇත්තමෝ වසන්නෙමු".

26. "අනුරුද්ධයෙනි, තෙපි කෙසේ අප්‍රමත්ත වූවාහු කෙලෙස් තවන වැර ඇත්තාහු භාවනාවට යැවූ සිත් ඇත්තාහු වසවු ද ?"

27. "ස්වාමීනි, මෙහි අපගෙන් යමෙක් පළමු කොට ගමෙහි පිඬු පිණිස හැසිර පෙරළා ඒ ද, හෙතෙමේ අසුන් පණවයි. පානීයපාදිය පාපුටුව පා තබන පුවරුව එළවා තබයි. ඉඳුල් ලන බඳුන සෝදා තබයි. පැන් හා පිරිබෝදිය එළවයි. යමෙක් පසු ව ගමෙහි පිඬු සිඟා හැසිර පෙරළා ඒ ද, වළඳා ඉතිරි වූවක් වේ නම්, කැමැත්තේ නම්, වළඳයි. නො කැමැත්තේ නම්, නිල්තණ නැති තැන හෝ බහයි. සතුන් නැති දියෙහි හෝ පා කොට හරියි. හෙතෙමේ අසුන් ඔසොවා තබයි. පානීයපාදිය පාපුටුව පාපුවරුව තැන්පත් කරයි. ඉඳුල් ලන බඳුන සෝදා තැන්පත් කරයි. පැන් හා පිරිබෝදිය තැන් පත් කරයි. බත්හල හමදියි. යමෙක් හිස් වූ පැන්කළය හෝ පිරිබෝදිය-කළය හෝ වැසිකිළිදියකළය හෝ දකී ද, හෙතෙමේ එය එළවා තබයි. ඔහුට නො ඉසිලිය හැකි නම් හස්තසංඥාවෙන් දෙවැන්නකු අමතා අත්විලඟුවෙන් එළවා තබයි. ස්වාමීනි, ඒ හෙතුවෙන් අපි වචන නො බිඳින්නෙමු. (කතා නො කරන්නෙමු.) ස්වාමීනි, පස් දවසකට වරක් සියලු රෑ දැහැමිකතාවෙන් යුක්ත ව හිඳිමු. ස්වාමීනි, මෙසේ අපි අප්‍රමත්ත ව කෙලෙස් තවන වැර ඇති ව භාවනාවට යැවූ සිත් ඇති ව වාසය කරමු"යි.

28. අථ ඛො භගවා ආයස්මන්තඤ්ච අනුරුද්ධං ආයස්මන්තඤ්ච නන්දියං ආයස්මන්තඤ්ච කිම්බිලං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා යෙන පාරිලෙය්‍යකං තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන පාරිලෙය්‍යකං තදවසරි. තත්‍ර සුදං භගවා පාරිලෙය්‍යකෙ විහරති රක්ඛිතවනසණ්ඩෙ භද්දසාලමූලෙ.

29. අථ ඛො භගවතො රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "අහං ඛො පුබ්බෙ ආකිණ්ණො න ඵාසුං විහාසිං තෙහි කොසම්බකෙහි[1] භික්ඛූහි භණ්ඩනකාරකෙහි කලහකාරකෙහි විවාදකාරකෙහි භස්සකාරකෙහි සඞ්ඝෙ අධිකරණකාරකෙහි. සොම්හි එතරහි එකො අදුතියො සුඛං ඵාසුං විහරාමි අඤ්ඤත්‍රෙව තෙහි කොසම්බකෙහි භික්ඛූහි භණ්ඩනකාරකෙහි කලහකාරකෙහි විවාදකාරකෙහි භස්සකාරකෙහි සඞ්ඝෙ අධිකරණකාරකෙහී"ති.

30. අඤ්ඤතරොපි ඛො හත්ථිනාගො ආකිණ්ණො විහරති හත්ථීහි හත්ථිනීහි හත්ථිකලභෙහි හත්ථිච්ඡාපෙහි. ඡින්නග්ගානි චෙව තිණානි ඛාදති. ඔභග්ගොභග්ගඤ්චස්ස සාඛාභඞ්ගං ඛාදන්ති. ආවිලානි ච පානීයානි පිවති. ඔගාහා චස්ස උත්තිණ්ණස්ස[2] හත්ථිනියො කායං උපනිඝංසන්තියො ගච්ඡන්ති.

31. අථ ඛො තස්ස හත්ථිනාගස්ස එතදහොසි: "අහං ඛො ආකිණ්ණො විහරාමි හත්ථීහි හත්ථිනීහි හත්ථිකලභෙහි හත්ථිච්ඡාපෙහි. ඡින්නග්ගානි චෙව තිණානි ඛාදාමි. ඔභග්ගොභග්ගඤ්ච මෙ සාඛාභඞ්ගං ඛාදන්ති. ආවිලානි ච පානීයානි පිවාමි. ඔගාහා ච මෙ උත්තිණ්ණස්ස හත්ථිනියො කායං උපනිඝංසන්තියො ගච්ඡන්ති. යන්නූනාහං එකොව ගණම්හා වූපකට්ඨො විහරෙය්‍ය"න්ති.

32. අථ ඛො සො හත්ථිනාගො යූථා අපක්කම්ම යෙන පාරිලෙය්‍යකං රක්ඛිතවනසණ්ඩො භද්දසාලමූලං යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සොණ්ඩාය භගවතො පානීයං පරිභොජනීයං උපට්ඨාපෙති. අප්පහරිතඤ්ච කරොති.

33. අථ ඛො තස්ස හත්ථිනාගස්ස එතදහොසි: "අහං ඛො පුබ්බෙ ආකිණ්ණො න ඵාසුං විහාසිං හත්ථීහි හත්ථිනීහි හත්ථිකලභෙහි හත්ථිච්ඡාපෙහි. ඡින්නග්ගානි චෙව තිණානි ඛාදිං. ඔභග්ගොභග්ගඤ්ච මෙ සාඛාභඞ්ගං ඛාදිංසු. ආවිලානි ච පානීයානි අපාසිං. ඔගාහා ච මෙ උත්තිණ්ණස්ස හත්ථිනියො කායං උපනිඝංසන්තියො අගමංසු. සොම්හි එතරහි එකො අදුතියො සුඛං ඵාසුං විහරාමි අඤ්ඤත්‍රෙව හත්ථීහි හත්ථිනීහි හත්ථිකලභෙහි හත්ථිච්ඡාපෙහී"ති.

34. අථ ඛො භගවා අත්තනො ච පවිවෙකං විදිත්වා තස්ස ච හත්ථිනාගස්ස චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය තායං වෙලායං ඉමං උදානං උදානෙසි:

"එතං[3] නාගස්ස නාගෙන ඊසාදන්තස්ස හත්ථිනො,
සමෙති චිත්තං චිත්තෙන යදෙකො රමතී වනෙ"ති.

1. "කොසම්බිකෙහි" සී. අ වි. ජ වි. තො වි.
2. "ඔගාහඤ්චස්ස ඔතිණ්ණස්ස" සී.
"ඔගාහන්තස්ස ඔතිණ්ණස්ස" ම ජු ප. P T S.
3. "එවං" ම ජු ප. P T S.

28. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් ද ආයුෂ්මත් නන්දිය තෙරුන් ද ආයුෂ්මත් කිම්බිල තෙරුන් ද දැහැමි කතාවෙන් කරුණු දක්වා සමාදන් කරවා තියුණු කරවා සතුටු කරවා හුනස්නෙන් නැගිට **පාරිලෙය්‍යකවනය** බලා චාරිකාවෙහි වැඩි සේක. පිළිවෙළින් චාරිකා කරණසේක් පාරිලෙය්‍යකවනයට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ එහි පාරිලෙය්‍යකවනයෙහි **රක්ඛිත** වනලැහැබෙහි මැනැවින් වැඩුනු මහත් සල් රුකක් මුල වසන සේක.

29. ඉක්බිති එකලා ව විවෙකයට පැමිණ හුන් භාග්‍යවතුන් වහන්සේගේ සිත්හි "මම පෙර ඩබර කරන්නා වූ කලහ කරන්නා වූ විවාද කරන්නා වූ කලහ උපදවන කතා කරන්නා වූ සඞ්ඝයා වෙත පැමිණිලි කරන්නා වූ කොසඹෑ නුවර වැසි භික්ෂූන් හා එක් වූයෙම් පහසුවෙන් නො විසූයෙමි. ඒ මම දැන් එකලා වූයෙම් දෙවැන්නෙක් නැත්තෙම් ඩබර කරන්නා වූ කලහ කරන්නා වූ විවාද කරන්නා වූ කලහ උපදවන කතා කරන්නා වූ සඞ්ඝයා වෙත පැමිණිලි කරන්නා වූ ඒ කොසඹෑනුවර වැසි භික්ෂූන් හැර සුව සේ පහසුවෙන් වෙසෙමි"යි පරිවිතර්කයෙක් උපන.

30. එක්තරා මහත් ඇතෙක් ද ඇතුන් හා ඇතිනියන් හා තරුණ ඇතුන් හා ඇත්පැටවුන් හා එක් වූයේ ඔවුන් විසින් සිඳ දැමූ අක් ඇති තණ කයි. ඔහු විසින් (උස් තැනින් බිඳ හෙළූ) අතුකැබලි (අනික් ඇත්තු) කත්. කැලඹුනු දිය බොයි. ඇතිනියෝ දියෙහි ගැලීමෙන් නොහොත් තොටින් ගොඩ නැංගා වූ ඔහුගේ සිරුර ගටා යෙත්.

31. එකල්හි ඒ මහ ඇතුට "මම ඇතුන් හා ඇතිනියන් හා තරුණ ඇතුන් හා ඇත්පැටවුන් හා එක් ව වසමි. (ඔවුන් විසින්) සිඳ දැමූ අග ඇති තණ ද කමි. මා විසින් බිඳි අතු කැබලි ඔහු කත්. කැලඹුනු දිය ද බොමි. දියට බස්නා ඇතිනියෝ දියෙන් ගොඩ වූ මාගේ කය ගටා යෙත්. එහෙයින් මම එකලා ව ම සමූහයාගෙන් වෙන් වූයේ ම වසන්නෙම් නම් යෙහෙකැ"යි සිත් වි ය.

32. ඉක්බිති ඒ මහඇත් තෙමේ රැළෙන් ඉවත් ව පාරිලෙය්‍යකවනයෙහි රක්ඛිත වනලැහැබෙහි විසල්සල්රුක්මුල හුන් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ සොඬින් භාග්‍යවතුන් වහන්සේට පැන් පිරිබෝදිය එළවයි. තණ ද බැහැර කරයි.

33. එකල්හි ඒ මහඇතුට "මම පෙර ඇතුන් හා ඇතිනියන් හා තරුණ ඇතුන් හා ඇත්පැටවුන් හා එක් වූයෙම් පහසුවෙන් නො විසීමි. සිඳ දැමූ අක් ඇති තණ ද කැවෙමි. මා විසින් කඩා දැමූ අතුකැබලි ඔහු කැහ. කැලඹුනු දිය ද බීමි. දියට බස්නා ඇතින්නෝ දියෙන් ගොඩ වූ මාගේ කය ගටා ගියහ. ඒ මම දැන් එකලා ව දෙවැන්නෙකු නැති ව ඇතුන් ඇතින්නන් තරුණඇතුන් ඇත්පැටවුන් හැර සැප සේ පහසුවෙන් වසමි"යි සිත් වි ය.

34. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේගේ පවිවෙකය ද දැන ඒ මහඇතුගේ සිතෙහි අදහස ද දැන ඒ වේලෙහි මේ ප්‍රීතිවාක්‍යය පැවැත්වූහ:

"යම් හෙයකින් එකලා වූයේ වනයෙහි සිත් අලවා වෙසේ ද, එහෙයින් (ඒ විවෙකරතියෙන්) රියඉස් වැනි (හේරිය කඳ මෙන් දික් වූ) දළ ඇති හස්තිනාගයාගේ සිත බුද්ධනාගයාගේ සිත හා සම වේ" යී.

35. අථ ඛො භගවා **පාරිලෙය්‍යකෙ** යථාභිරන්තං විහරිත්වා යෙන **සාවත්ථි** තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන සාවත්ථි තදවසරි. තත්‍ර සුදං භගවා සාවත්ථියං විහරති **ජෙතවනෙ අනාථ-පිණ්ඩිකස්ස** ආරාමෙ.

36. අථ ඛො කොසම්බකා උපාසකා "ඉමෙ ඛො අය්‍යා කොසම්බකා භික්ඛූ බහුනො අම්හාකං අනත්ථස්ස කාරකා. ඉමෙහි උබ්බාළ්හො භගවා පක්කන්තො. හන්ද මයං අය්‍යෙ කොසම්බකෙ භික්ඛූ නෙව අභිවාදෙය්‍යාම, න පච්චුට්ඨෙය්‍යාම, න අඤ්ජලිකම්මං සාමීචිකම්මං කරෙය්‍යාම, න සක්කරෙය්‍යාම, න ගරුං කරෙය්‍යාම, න මානෙය්‍යාම, න පූජෙය්‍යාම[1], උපගතානම්පි පිණ්ඩකං[2] න දදෙය්‍යාම[3], එවං ඉමෙ අම්හෙහි අසක්කරියමානා අගරුකරිය-මානා අමානියමානා අපූජියමානා අසක්කාරපකතා පක්කමිස්සන්ති වා විබ්භමිස්සන්ති වා භගවන්තං වා පසාදෙස්සන්තී"ති.

37. අථ ඛො කොසම්බකා උපාසකා කොසම්බකෙ භික්ඛූ නෙව අභිවාදෙසුං. න පච්චුට්ඨෙසුං. න අඤ්ජලිකම්මං සාමීචිකම්මං අකංසු. න සක්කරිංසු. න ගරුං කරිංසු. න මානෙසුං. න පූජෙසුං. උපගතානම්පි පිණ්ඩකං න අදංසු.

38. අථ ඛො කොසම්බකා භික්ඛූ කොසම්බකෙහි උපාසකෙහි අසක්කරියමානා අගරුකරියමානා අමානියමානා අපූජියමානා අසක්කාර-පකතා එවමාහංසු: "හන්ද මයං ආවුසො, සාවත්ථිං ගන්ත්වා භගවතො සන්තිකෙ ඉමං අධිකරණං වූපසමෙය්‍යාමා"ති.

39. අථ ඛො කොසම්බකා භික්ඛූ සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන සාවත්ථි තෙනුපසඞ්කමිංසු.

40. අස්සොසි ඛො ආයස්මා **සාරිපුත්තො** "තෙ කිර කොසම්බකා භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා සාවත්ථිං ආගච්ඡන්තී"ති.

41. අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: "තෙ කිර භන්තෙ, කොසම්බකා භික්ඛූ භණ්ඩනකාරකා -පෙ- සඞ්ඝෙ අධිකරණ-කාරකා සාවත්ථිං ආගච්ඡන්ති. කථාහං භන්තෙ, තෙසු භික්ඛූසු පටිපජ්ජාමී"ති. "තෙන හි ත්වං සාරිපුත්ත, යථා ධම්මො තථා තිට්ඨාහී"ති. "කථාහං භන්තෙ, ජානෙය්‍යං ධම්මං වා අධම්මං වා?"ති.

1. "න භජෙය්‍යාම, න පූජෙය්‍යාම" ම ඡ සං.
2. "පිණ්ඩපාතං" P T S. 3. "දජ්ජෙය්‍යාම" ම ඡ සං. P T S.

35. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ **පාරිලෙය්‍යක**වනයෙහි කැමැති තාක් කල් වාසය කොට **සැවැත්නුවර** බලා චාරිකාවෙහි වැඩි සේක. පිළිවෙළින් චාරිකාවෙහි වඩිනා සේක් සැවැත්නුවරට වැඩියාහ. භාග්‍යවතුන් වහන්සේ එහි සැවැත්නුවර **ජේතවනයෙහි** වූ **අනේපිඩුසිටුහු**ගේ ආරාමයෙහි වැඩ වසන සේක.

36. එකල්හි **කොසඹෑනුවර** වැසි උපාසකයෝ "කොසඹෑනුවර වැසි ආයසී වූ මේ භික්ෂූහු අපට බොහෝ අවැඩ කළෝ ය. මොවුන් විසින් පෙළනු ලැබූ භාග්‍යවතුන් වහන්සේ වනයට වැඩි සේක. එබැවින් අපි ආයසී වූ කොසඹෑනුවර වැසි භික්ෂූන් නො වඳින්නෙමු නම්, දැක හුනස්නෙන් නො නැගිටින්නෙමු නම්, ඇඳිලි කිරීම් ගෞරව කිරීම් නො කරන්නෙමු නම්, සත්කාර නො කරන්නෙමු නම්, ගරු නො කරන්නෙමු නම්, බුහුමන් නො කරන්නෙමු නම්, නො පුදන්නෙමු නම්, අප වෙත එළඹියවුන්ට ද ආහාර නො දෙන්නෙමු නම්, මෙසේ අප විසින් සත්කාර නො කරණු ලබන ගරු නො කරණු ලබන බුහුමන් නො කරණු ලබන නො පුදනු ලබන මොහු අසත්කාරයෙන් මැඩුනෝ බැහැර යන්නාහු හෝ වෙති. සිවුරු හරින්නාහු හෝ වෙති. භාග්‍යවතුන් වහන්සේ හෝ පහදවන්නාහු වෙති"යි (සිතූහ.)

37. ඉක්බිති කොසඹෑ නුවර වැසි උපාසකයෝ කොසඹෑනුවර වැසි භික්ෂූන් නො වැන්දූහ. දැක හුනස්නෙන් නො නැගිට්ටාහ. ඇඳිලි කිරීම් ගෞරව කිරීම් නො කළහ. සත්කාර නො කළහ. ගරු නො කළහ. බුහුමන් නො කළහ. නො පිදූහ. වෙත පැමිණියවුන්ට ආහාර ද නො දුන්හ.

38. ඉක්බිති කොසඹෑනුවර වැසි උපාසකයන් විසින් සත්කාර නො කරණු ලබන ගරු නො කරණු ලබන බුහුමන් නො කරණු ලබන නො පුදනු ලබන කොසඹෑනුවර වැසි භික්ෂූහු අසත්කාරයෙන් මැඩුනෝ "ඇවැත්නි, එසේ නම්, අපි සැවැත්නුවරට ගොස් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ආරාවුල සන්සිඳුවන්නෙමු"යි මෙසේ කීහ.

